මහණෙනි, එහි මරණින්මතු නෙවසංඥානාසංඥවාද ඇත්තාවූ යම් ඒ මහණබමුණුකෙනෙක් මරණින්මතු නෙවසංඥනාසංඥඇති ආත්මය අටකාරණයකින් පණවද්ද, එයද ස්පර්ශය හෙතුකොටගෙණ වන්නේය. මහණෙනි, එහි උච්ඡෙදවාද ඇත්තාවූ යම් ඒ මහණබමුණුකෙනෙක් විද්‍යමානසත්වයාගේ සිඳීමද, විනාසයද, අනුත්පත්තියද, කරුණු සතකින් පණවද්ද, එයද ස්පර්ශය හෙතුකොටගෙණ වන්නේය. මහණෙනි, එහි ඉහාත්මභාවයෙහි නිර්වාණවාද ඇත්තාවූ යම් ඒ මහණබමුණුකෙනෙක් විද්‍යමාන සත්වයා සම්බන්ධව උත්තමදෘෂ්ට ධර්මනිර්වාණය කරුණු පසකින් පණවද්ද, එයද ස්පර්ශයහෙතුකොට ගෙණ වන්නේය. මහණෙනි, එහි අනාගත කොට්ඨාසය පිළිබඳ කල්පනා ඇති එහෙයින්ම අනාගතයපිළිබඳ ලබ්ධි ඇත්තාවූ යම් ඒ මහණ බමුණුකෙනෙක් අනාගතකොට්ඨාසය අරබයා නානාවිධවූ දෘෂ්ටි ප්‍රකාශකවචනයන් සිව්සාළිස් කාරණයකින් කියද්ද, එයද ස්පර්ශය හෙතුකොටගෙණ වන්නේය. මහණෙනි, එහි පූර්වකොට්ඨාසය පිළිබඳ කල්පනා ඇත්තාවූද, අනාගත කොට්ඨාසය පිළිබඳ කල්පනා ඇත්තාවූද, පූර්වාන්තඅපරාන්තදෙක පිළිබඳ කල්පනා ඇත්තාවූද, අතීතානාගතදෙක පිළිබඳ ලබ්ධි ඇත්තාවූද, යම් ඒ මහණබමුණුකෙනෙක් පූර්වාන්තය හා අපරාන්තය අරබයා නානාවිධවූ දෘෂ්ටිප්‍රකාශකවචනයන් දෙසැට කාරණයකින් කියද්ද, හෙද ස්පර්ශය හෙතුකොටගෙණ වන්නේය.

තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා සස්සතවාදා සස්සතං අත්තානඤ්ච ලොකඤ්ච පඤ්ඤපෙන්ති චතූහි වත්ථූහි. තෙ වත අඤ්ඤත්‍ර ඵස්සා පටිසංවෙදිස්සන්තීති නෙතං ඨානං විජ්ජති. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා එකච්චසස්සතිකා එකච්චාසස්සතිකා එකච්චං සස්සතං එකච්චං අසස්සතං අත්තානඤ්ච ලොකඤ්ච පඤ්ඤපෙන්ති චතූහි වත්ථූහි, තෙ වත අඤ්ඤත්‍ර ඵස්සා පටිසංවෙදිස්සන්තීති නෙතං ඨානං විජ්ජති. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා අන්තානන්තිකා අන්තානන්තං ලොකස්ස පඤ්ඤපෙන්ති චතූහි වත්ථූහි, තෙ වත අඤ්ඤත්‍ර ඵස්සා පටිසංවෙදිස්සන්තීති නෙතං ඨානං විජ්ජති. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා අමරාවික්ඛෙපිකා තත්ථ තත්ථ පඤ්හං පුට්ඨා සමානා වාචාවික්ඛෙපං ආපජ්ජන්ති අමරාවික්ඛෙපං චතූහි වත්ථූහි.

මහණෙනි, එහි සදකාලිකය යන ලබ්ධි ඇත්තාවූ යම් ඒ මහණබමුණු කෙනෙක් නිත්‍යවශයෙන් ආත්මයද, ලොකයද, කරුණුසතරකින් පණවද්ද,ඒ මහණබමුණෝ ඒකාන්තයෙන් ස්පර්ශයෙන් තොරවූ දෘෂ්ටි වෙදනාව විඳින්නාහුය යන මේ කාරණය නැත්තේය. මහණෙනි, එහි කොටසක් නිත්‍යය යන ලබ්ධි ඇත්තාවූද කොටසක් අනිත්‍යය යන ලබ්ධි ඇත්තාවූද යම් ඒ මහණබමුණුකෙනෙක් කොටසක් නිත්‍යවශයෙන්ද, කොටසක් අනිත්‍යවශයෙන්ද; ආත්මයද, ලොකයද, කරුණු සතරකින් පණවද්ද, ඔව්හු ඒකාන්තයෙන් ස්පර්ශයෙන් තොරවූ දෘෂ්ටි වෙදනාව විඳින්නාහුය යන මේ කාරණය නැත්තේය. මහණෙනි, එහි ප්‍රතිභාගනිමිත්ත සක්වල කෙළවරකොට නොවඩා එපමණක් ලොකයයි ගෙණ අන්තසංඥාඇති වීමෙන් හා සක්වල කෙළවරකොට ප්‍රතිභාගනිමිත්ත වඩා අනන්තසංඥාඇතිවීමෙන්ද අන්තානන්තවාද ඇත්තාවූ යම් ඒ මහණබමුණුකෙනෙක් අන්තානන්තය ලොවට කරුණු සතරකින් පණවද්ද, ඔව්හු ඒකාන්තයෙන් ස්පර්ශයෙන් තොරවූ දෘෂ්ටිවෙදනාව විඳින්නාහුය යන මේ කරුණ නැත්තේය.මහණෙනි,එහි අල්වාගැන්මට නොහැකි අමරානම් මසුන් මෙන් වාග්වික්ෂෙපකරණහෙයින් අමරාවික්ෂෙපවාද ඇත්තාවූ යම් ඒ මහණබමුණුකෙනෙක් ඒ ඒ තන්හි කුශලාදිවශයෙන් ප්‍රශ්නවිචාරණලද්දේ වචනදමාගැසීමඇති කෙළවරක්නැති වික්ෂෙපය කරුණු සතරකින් පණවද්ද,

තෙ වත අඤ්ඤත්‍ර ඵස්සා පටිසංවෙදිස්සන්තීති නෙතං ඨානං විජ්ජති. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා අධිච්චසමුප්පන්නිකා අධිච්චසමුප්පන්නං අත්තානඤ්ච ලොකඤ්ච පඤ්ඤපෙන්ති ද්වීහි වත්ථූහි තෙ වත අඤ්ඤත්‍ර ඵස්සා පටිසංවෙදිස්සන්තීති නෙතං ඨානං විජ්ජති. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා පුබ්බන්තකප්පිකා පුබ්බන්තානුදිට්ඨිනො පුබ්බන්තං ආරබ්භ අනෙකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති අට්ඨාරසහි වත්ථූහි තෙ වත අඤ්ඤත්‍ර ඵස්සා පටිසංවෙදිස්සන්තීති නෙතං ඨානං විජ්ජති. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා උද්ධමාඝාතනිකා සඤ්ඤීවාදා උද්ධමාඝාතනං සඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති සොළසහි වත්ථූහි තෙ වත අඤ්ඤත්‍ර ඵස්සා පටිසංවෙදිස්සන්තීති නෙතං ඨානං විජ්ජති. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා උද්ධමාඝාතනිකා අසඤ්ඤීවාදා උද්ධමාඝාතනං අසඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අට්ඨහි වත්ථූහි තෙ වත අඤ්ඤත්‍ර ඵස්සා පටිසංවෙදිස්සන්තීති නෙතං ඨානං විජ්ජති.

ඔව්හු එකාන්තයෙන් ස්පර්ශයෙන් තොරවූ දෘෂ්ටිවෙදනාව විඳින්නාහුය යන මේ කාරණය නැත්තේය. මහණෙනි, එහි අසංඥාතලයෙන් චුතවූවන්මෙන් අකාරණොත්පත්තිවාද ඇත්තාවූ යම් ඒ මහණ බමුණුකෙනෙක් අකාරණොත්පන්නවශයෙන් ආත්මයද, ලොකයද, කරුණු දෙකකින් පණවද්ද, ඔව්හු එකාන්තයෙන් ස්පර්ශයෙන් තොරවූ දෘෂ්ටිවෙදනාව විඳින්නාහුය යන මේ කරුණ නැත්තේය. මහණෙනි, එහි පූර්වාන්තකල්පනා ඇත්තාවූ පූර්වාන්තයපිළිබඳ දෘෂ්ටිඇත්තාවූ යම් ඒ මහණබමුණුකෙනෙක් පූර්වාන්තය අරබයා නානාවිධවූ දෘෂ්ටිප්‍රකාශකවචනයන් අටලොස් කාරණයකින් කියද්ද, ඔව්හු එකාන්තයෙන් ස්පර්ශයෙන් තොරවූ දෘෂ්ටිවෙදනාව විඳින්නාහුය යන මේ කාරණය නැත්තේය. මහණෙනි, එහි මරණින් මත්තෙහිවූ සංඥවාදඇති යම් ඒ මහණබමුණුකෙනෙක් මරණින් මත්තෙහිවූ සංඥාඇති ආත්මය සොළොස් කරුණකින් පණවද්ද, ඔව්හු එකාන්තයෙන් ස්පර්ශයෙන් තොරවූ සොම්නසක් විඳින්නාහුය යන මේ කාරණය නැත්තේය. මහණෙනි, එහි මරණින්මත්තු අසංඥ වාදඇති යම ඒ මහණබමුණුකෙනෙක් මරණින් මත්තෙහිවූ අසංඥ ඇති ආත්මය කරුණු අටකින් පණවද්ද, ඔව්හු එකාන්තයෙන් ස්පර්ශයෙන් තොරවූ සොම්නස විඳින්නාහුය යන මේ කාරණය නැත් තේය.

තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා උද්ධමාඝාතනිකා නෙවසඤ්ඤීනාසඤ්ඤීවාදා උද්ධමාඝාතනං නෙවසඤ්ඤීනාසඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අට්ඨහි වත්ථූහි තෙ වත අඤ්ඤත්‍ර ඵස්සා පටිසංවෙදිස්සන්තීති නෙතං ඨානං විජ්ජති. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා උච්ඡෙදවාදා සතො සත්තස්ස උච්ඡෙදං විනාසං විභවං පඤ්ඤාපෙන්ති සත්තහි වත්ථූහි තෙ වත අඤ්ඤත්‍ර ඵස්සා පටිසංවෙදිස්සන්තීති නෙතං ඨානං විජ්ජති. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා දිට්ඨධම්මනිබ්බාණවාදා සතො සත්තස්ස පරමදිට්ඨධම්මනිබ්බාණං පඤ්ඤපෙන්ති පඤ්චහි වත්ථූහි තෙ වත අඤ්ඤත්‍ර ඵස්සා පටිසංවෙදිස්සන්තීති නෙතං ඨානං විජ්ජති. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා අපරන්තකප්පිකා අපරන්තානුදිට්ඨිනො අපරන්තං ආරබ්භ අනෙකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති චතුචත්තාරීසාය වත්ථූහි තෙ වත අඤ්ඤත්‍ර ඵස්සාපටිසංවෙදිස්සන්තීති නෙතං ඨානං විජ්ජති.

මහණෙනි, එහි මරණින්මතු නෙවසංඥානාසංඥවාදඇති යම් ඒ මහණබමුණුකෙනෙක් මරණින්මතු නෙවසංඥනාසංඥඇති ආත්මය අටකාරණයකින් පණවද්ද, ඔව්හු එකාන්තයෙන් ස්පර්ශයෙන් තොරවූ දෘෂ්ටිවෙදනාව විඳින්නාහුය යන මේ කාරණය නැත්තේය. මහණෙනි, එහි උච්ඡෙදවාද ඇත්තාවූ යම් ඒ මහණබමුණුකෙනෙක් විද්‍යමානසත්වයා පිළිබඳව සිඳීමද, විනාසයද, අනුත්පත්තියද, කරුණු සතකින් පණවද්ද, ඔව්හු එකාන්තයෙන් ස්පර්ශයෙන් තොරවූ දෘෂ්ටිවෙදනාව විඳින්නාහුය යන මේ කාරණයනැත්තේය. මහණෙනි, එහි මේ අත්බැව්හි සැපවිඳීමම නිවනැයි ගත්හෙයින් දෘෂ්ටධර්මනිර්වාණවාද ඇත්තාවූ යම් ඒ මහණබමුණකෙනෙක් විද්‍යමාන සත්වයාසම්බන්ධව උත්තම දෘෂ්ටධර්මනිර්වාණය කරුණු පසකින් පණවද්ද, ඔව්හු එකාන්තයෙන් ස්පර්ශයෙන් තොරවූ දෘෂ්ටිවෙදනාව විඳින්නාහුය යන මේ කාරණය නැත්තේය. මහණෙනි, එහි අපරාන්තකල්පනා ඇත්තාවූ අපරාන්තය පිළිබඳ දෘෂ්ටි ඇත්තාවූ යම් ඒ මහණබමුණුකෙනෙක් අපරාන්තය අරබයා නානාවිධවූ දෘෂ්ටිප්‍රකාශකවචනයන් සුසාළිස් වස්තුවකින් පණවද්ද, ඔව්හු එකාන්තයෙන් ස්පර්ශයෙන් තොරවූ දෘෂ්ටිවෙදනාව විඳින්නාහුය යන මේ කාරණය නැත්තේය.

තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා පුබ්බන්තකප්පිකා ච අපරන්තකප්පිකා ච පුබ්බන්තාපරන්තකප්පිකා ච පුබ්බන්තාපරන්තානුදිට්ඨිනො පුබ්බන්තාපරන්තං ආරබ්භ අනෙකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති ද්වාසට්ඨියා වත්ථූහි තෙ වත අඤ්ඤත්‍ර ඵස්සා පටිසංවෙදිස්සන්තීති නෙතං ඨානං විජ්ජති. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා සස්සතවාදා සස්සතං අත්තානං ච ලොකඤ්ච පඤ්ඤපෙන්ති චතූහි වත්ථූහි යෙපි තෙ සමණබ්‍රාහ්මණා එකච්චසස්සතිකා. යෙපි තෙ සමණබ්‍රාහ්මණා අන්තානන්තිකා. යෙපි තෙ සමණබ්‍රාහ්මණා අමරාවික්ඛෙපිකා. යෙපි තෙ සමණබ්‍රාහ්මණා අධිච්චසමුප්පන්නිකා. යෙපි තෙ සමණබ්‍රාහ්මණා පුබ්බන්තකප්පිකා. යෙපි තෙ සමණබ්‍රාහ්මණා උද්ධමාඝාතනිකා සඤ්ඤීවාදා. යෙපි තෙ සමණබ්‍රාහ්මණා උද්ධමාඝාතනිකා අසඤ්ඤීවාදා. යෙපි තෙ සමණබ්‍රාහ්මණා උද්ධමාඝාතනිකා නෙවසඤ්ඤීනාසඤ්ඤීවාදා.

මහණෙනි, එහි පූර්‍වාන්තය පිළිබඳ කල්පනා ඇත්තාවූද අපරාන්තය පිළිබඳ කල්පනා ඇත්තාවූද පූර්‍වාන්ත අපරාන්ත දෙකපිළිබඳ කල්පනා ඇත්තාවූද පූර්‍වාන්ත අපරාන්ත ලබ්ධි ඇත්තාවූ යම් ඒ මහණබමුණුකෙනෙක් පූර්‍වාන්තය හා අපරාන්තය අරබයා නානාවිධවූ දෘෂ්ටි ප්‍රකාශකවචනයන් දෙසැටකරුණකින් කියද්ද, ඔව්හු ඒකාන්තයෙන් ස්පර්‍ශයෙන් තොරවූ සොම්නස විඳින්නාහුය යන මේ කරුණ නැත්තේය. මහණෙනි, එහි ශාශ්වතවාද ඇත්තාවූ යම් ඒ මහණබමුණුකෙනෙක් ශාශ්වතවශයෙන් ආත්මය හා ලොකයද කරුණු සතරකින් පණවද්ද, මහණෙනි, කොටසක් ශාශ්වතය යන ලබ්ධි ඇත්තාවූ යම් ඒ මහණබමුණුකෙනෙක් වෙද්ද, අන්තානන්තවාද ඇත්තාවූ යම් ඒ මහණබමුණුකෙනෙක් වෙද්ද, අමරවික්ෂෙපවාද ඇත්තාවූ යම් ඒ මහණබමුණුකෙනෙක් වෙද්ද, අකාරණොත්පත්තිවාද ඇත්තාවූ යම් ඒ මහණබමුණුකෙනෙක් වෙද්ද, පූර්‍වාන්තකල්පිකවූ යම් ඒ මහණබමුණුකෙණෙක් වෙද්ද, මරණින්මතු සංඥවාදඇති යම් ඒ මහණබමුණුකෙනෙක් වෙද්ද, මරණින් මත්තෙහි අසංඥවාදඇති යම් ඒ මහණබමුණුකෙනෙක් වෙද්ද, මරණින්මතු නෙවසංඥනාසංඥවාදඇති යම් ඒ මහණබමුණුකෙනෙක් වෙද්ද,

යෙපි තෙ සමණබ්‍රාහමණා උච්ඡෙදවාදා. යෙපි තෙ සමණබ්‍රාහමණා දිට්ඨධම්මනිබ්බාණවාදා. යෙපි තෙ සමණබ්‍රාහමණා අපරන්තකප්පිකා. යෙපි තෙ සමණබ්‍රාහමණා පුබ්බන්තකප්පිකා ච අපරන්තකප්පිකා ච පුබ්බන්තාපරන්තකප්පිකා ච පුබ්බන්තාපරන්තානුදිට්ඨිනො පුබ්බන්තාපරන්තං ආරබ්භ අනෙකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති වාසට්ඨියා වත්ථූහි සබ්බෙ තෙ ඡහි ඵස්සායතනෙහි ඵුස්සඵුස්ස පටිසංවෙදියන්ති තෙසං වෙදනාපච්චයා තණ්හා තණ්හාපච්චයා උපාදානං උපාදානපච්චයා භවො භවපච්චයා ජාති ජාතිපච්චයා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති. යතො ඛො භික්ඛවෙ භික්ඛු ඡන්නං ඵස්සායතනානං සමුදයං ච අත්ථඞ්ගමං ච අස්සාදං ච ආදිනවං ච නිස්සරණං ච යථාභූතං පජානාති අයං ඉමෙහි සබ්බෙහෙව උත්තරිතරං පජානාති.

උච්ඡෙදවාදඇති යම්ඒමහණබමුණුකෙනෙක් වෙද්ද, දෘෂ්ටධර්මනිර්වාණවාදඇති යම් ඒ මහණබමුණුකෙනෙක් වෙද්ද, අපරාන්තකල්පිකවූ යම් ඒ මහණබමුණුකෙනෙක්වෙද්ද. අතීතකොඨාසයකල්පනාකොට ඇත්තාවූද අනාගතකොඨාසය කල්පනාකොට ඇත්තාවූද පූර්වාන්ත අපරාන්ත කල්පනා ඇත්තාවූද අතීතානාගත ලබ්ධි ඇත්තාවූ යම් ඒමහණබමුණු කෙනෙක් අතීත අනාගත දෙක අරබයා නානාවිධවූ දෘෂ්ටිප්‍රකාශකවචනයන් දෙසැට කරුණකින් කියද්ද, ඔව්හුසියල්ලෝ චක්ෂුස්පර්ශාදි ආයතනසයින් ස්පර්ශකරමින් දෘෂ්ටිවෙදනාව විඳින්නාහුය. ඒ දෘෂ්ටිගතිකයන්ට වෙදනාව හෙතුකොටගෙණ එකසිය අටක් ප්‍රභෙදඇති තෘෂ්ණාවද ඒ තෘෂ්ණා ප්‍රත්‍යයෙන් සිවුඋපාදානයද චතුර්විධඋපාදානය හෙතුකොටගෙණ එකුන්තිස් වැදෑරුම්වූ කර්මභවය හා නවවිධවූ උත්පත්තිභවයද කර්මභවය හෙතුකොට ගෙණ සත්වයන්ගේ ඉපදීමයයි කියනලද ජාතියද, ඉපදීම හෙතුකොට ගෙණ දෙවදෑරුම් දිරීමහා මරණයද, ඇතුළත වියළීම ලක්ෂණකොට ඇති ශොකය, වැලපීමය, කයේ හටගන්නාදුක්ය, සිතේහටගන්නා දුක්ය, දැඩි ආයාසය, යන මොව්හු ලැබෙත්. මහණෙනි, මහණතෙම යම් කලෙක (යථොක්ත) ස්පර්ශායතනයන් සදෙනාගේ උත්පත්තියද, විනාශයද, ආශ්වාදයද, ප්‍රහාණයද, තත්වූපරිද්දෙන් දනීද, මේ මහණතෙම මේ සියල්ලන්ටම වඩා දෘෂ්ටිගතික දෘෂ්ටිමාත්‍රයක්ම දන්නේය. මේ යොගාවචරතෙම දෘෂ්ටියහා ඊට වැඩිවූ ශීලසමාධි ආදියහා අර්හත්ඵලඥානය අවසන්කොට ඇති සියල්ලදනී. මේ සියල්ල රහත් අනාගැමි සෙදගැමි සෝවාන් මහණහුද බහුශ්‍රැත ග්‍රන්ථධර විශිෂ්ටවත්භික්ෂූහුද දනිත්.

යෙ හි කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා පුබ්බන්තකප්පිකා වා අපරන්තකප්පිකා වා පුබ්බන්තා පරන්තකප්පිකා වා පුබ්බන්තාපරන්තානුදිට්ඨිනො පුබ්බන්තාපරන්තං ආරබ්භ අනෙකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති සබ්බෙ තෙ ඉමෙහෙව ද්වාසට්ඨියා වත්ථූහි අන්තොජාලීකතා එත්ථ සිතාව උම්මුජ්ජමානා උම්මුජ්ජන්ති එත්ථ පරියාපන්නා අන්තොජාලීකතා උම්මුජ්ජමානා උම්මුජ්ජන්ති. සෙය්‍යථාපි භික්ඛවෙ දක්ඛො කෙවට්ටො වා කෙවට්ටන්තෙවාසී වා සුඛුමච්ඡිද්දකෙන ජාලෙන පරිත්තං උදකදහං ඔත්ථරෙය්‍ය තස්ස එවමස්ස යෙ ඛො කෙචි ඉමස්මිං උදකදහෙ ඔළාරිකා පාණා සබ්බෙ තෙ අන්තොජාලීකතා එත්ථ සිතාව උම්මුජ්ජමානා උම්මුජ්ජන්ති, එත්ථ පරියාපන්නා අන්තොජාලීකතාව උම්මුජ්ජමානා උම්මුජ්ජන්ති එවමෙව ඛො භික්ඛවෙ යෙ හි කෙචි සමණා වා බ්‍රාහ්මණා වා පුබ්බන්තකප්පිකා වා අපරන්තකප්පිකා වා පුබ්බන්තාපරන්තකප්පිකා වා පුබ්බන්තාපරන්තානුදිට්ඨිනො පුබ්බන්තාපරන්තං ආරබ්භ අනෙකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති.

මහණෙනි, පූර්වාන්තය කල්පනා කරන්නාවූ හෝ අපරාන්තය කල්පනාකරන්නාවූ හෝ පූර්වාන්තාපරාන්ත දෙක කල්පනාකරන්නාවූ හෝ පූර්වාන්ත අපරාන්ත ලබ්ධිඇත්තාවූ හෝ යම්කිසි මහණබමුණු කෙනෙක් අතීත අනාගත දෙක අරබයා නානාවිධවූ දෘෂ්ටිප්‍රකාශ වචනයන් කියද්ද, ඒ සියල්ලෝ මේ දෙසැට දෘෂ්ටි කාරණයෙන්ම මාගේදෙශනා නැමැති දැලෙහි ඇතුළත් කරණලදහ. මේ දෙශනා දැලෙහි නිශ්‍රිතවූවාහුම ගැලී ඉල්පෙන්නාහු ගැලී ඉල්පෙත්. මේ දෙශනානැමති දැලෙහි ඇතුළත්වූවාහු ජාලාභ්‍යන්තරගතවම ගැලී ඉල්පෙන්නාහු ගැලී ඉල්පෙත්. මහණෙනි යම්සේ, සමර්ථවූ කෙවුලෙක්හෝ කෙවුලෙකුගේ අතවැස්සෙක් හෝ සියුම්(ඇස්) සිදුරුඇති දැලක්ගෙණ ස්වල්ප ජලයඇතිවිලකටහෝ වළකටබසින්නේද නොහොත්. වළටබැස එක්තැනකුත්ඉතිරි නොකොට දැල්ගාන්නේද ඕහට මෙබඳු අදහසක්වේ. යම්කිසි ඖදාරික මහත් මත්ස්‍යජාතිහුවෙද්ද ඒ සියල්ලෝම මාගේදැලෙහි ඇතුළත්කරණලද්දාහු මගේදැලෙහි බැඳුනාහුම ඉල්පෙන්නො ඉල්පෙත්. මාගේදැලෙහි ඇතුළත්වූවාහු දැලතුළට පැමිණියෝවමා ගැලීඉල්පෙත්යයි ඕහට. මෙබඳු අදහසක්වේද. එපරිද්දෙන්ම මහණෙනි, අතීතයකල්පනා කරන්නාවූහෝ අනාගතය කල්පනා කරන්නාවූහෝ අතීතානාගතදෙක කල්පනාකරන්නාවූහෝ පූර්වාන්ත අපරාන්තදෘෂ්ටිඇත්තාවූ යම්කිසි මහණෙක් හෝ බමුණෙක් අතීතානාගතදෙක අරබයා නානාවිධවූ දෘෂ්ටිප්‍රකාශ වචනයන් කියද්ද,

සබ්බෙ තෙ ඉමෙහෙව ද්වාසට්ඨියා වත්ථූහි අන්තොජාලීකතා. එත්ථ සිතාව උම්මුජ්ජමානා උම්මුජ්ජන්ති එත්ථ පරියාපන්නා අන්තොජාලීකතාව උම්මුජ්ජමානා උම්මුජ්ජන්ති. උච්ඡින්නභවනෙත්තිකො භික්ඛවෙ තථාගතස්ස කායො තිට්ඨති. යාවස්ස කායො ඨස්සති තාව නං දක්ඛින්ති දෙවමනුස්සා කායස්ස භෙදා උද්ධං ජීවිතපරියාදානා න නං දක්ඛින්ති දෙවමනුස්සා සෙය්‍යථාපි භික්ඛවෙ අම්බපිණ්ඩියා වණ්ටච්ඡින්නාය යානි කානිචි අම්බානි වණ්ටූපනිබන්ධානි සබ්බානි තානි තදන්වයානි භවන්ති. එවමෙව ඛො භික්ඛවෙ උච්ඡින්නභවනෙත්තිකො තථාගතස්ස කායො තිට්ඨති. යාවස්ස කායො ඨස්සති තාව නං දක්ඛින්ති දෙව මනුස්සා කායස්ස භෙදා උද්ධං ජීවිතපරියාදානා න නං දක්ඛින්ති දෙවමනුස්සාති.

ඒ සියල්ලෝ මේ දෙසැට දෘෂ්ටිකාරණයෙන් මාගේදෙශනා නැමති දැලෙහි ඇතුළත්කරණලද්දාහු මෙහිම බැඳුනාහු ඉල් පෙන්නෝ ඉල්පෙත්. මාගේදෙශනානැමැති දැලෙහිඇතුළත්ව මෙසින් බැඳී දැලතුළට පැමිණියෝවම ගැලිඉල්පෙන්නාහු ගැලිඉල්පෙත්. (මෙහිසඞ්ග්‍රහ නොකරණලද දෘෂ්ටියෙක් නැතැයි සේයි)මහණෙනි, තථාගතයානන්ගේ ශරීරයතෙම අර්හත්මාර්ගඥාන නැමති ශස්ත්‍රයෙන් ශෙෂනොකොට සිඳිනලද භවතෘෂ්ණා නැමති බන්ධනඇතිව සිටි. ඒ තථාගතයානන්ගේ ශරීරය යම්තාක්කල් සිටින්නේද, ඒ තාක්කල් ඒ තථාගතයානන් දිව්‍යමනුෂ්‍යයෝ දක්නාහුය. කායභෙදයයි කියනලද මරණින්මත්තෙහි ජීවිතයතමා සර්වප්‍රකාරයෙන් පරික්ෂීණහෙයින් හෙවත් ප්‍රතිසන්ධිරහිත බවට පැමිණීමෙන් දිව්‍යමනුෂ්‍යයෝ ඒ තථාගතයානන් නොදක්නාහ. (අනුපාදපරිනිර්වාණයෙන් පිරිනිවියේයසේයි) මහණෙනි, යම්සේ අඹකැණ තුවටුවෙන් ගිලිහිගිය කල්හි යම්කිසිඅඹඵලකෙනෙක් නටුවහා එක්වබැඳීසිටිත්නම් ඒ සියලුඅඹඵලයෝ ඒ නටුවඅනුව පැවැත්නාහුවෙද්ද, මහණෙනි, එපරිද්දෙන්ම තථාගතයානන්ගේ ශරීරය නිරවශෙෂයෙන් සිඳිනලද භවබන්ධනඇතිව සිටීද, ඒ තථාගතයානන්ගේ ශරීරය යම්තාක්කල්සිටින්නේද ඒ තාක්කල් දිව්‍යමනුෂ්‍යයෝ ඒ තථාගතයානන් දක්නාහුය. දිවිදුරුනැසීමෙන් මත්තෙහි සර්වප්‍රකාරයෙන් ජීවිතක්ෂයට පැමිණීමෙන් ප්‍රතිසන්ධිරහිත බවට පැමිණිහෙයින් දිව්‍යමනුෂ්‍යයෝ ඒ තථාගතයානන් නොදක්නාහයි වදාළසේක.

එවං වුත්තෙ ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච. අච්ඡරියං භන්තෙ අබ්භුතං භන්තෙ. කො නාමො අයං භන්තෙ ධම්මපරියායොති. තස්මා තිහ ත්වං ආනන්ද ඉමං ධම්මපරියායං අත්ථජාලන්තිපි නං ධාරෙහි. ධම්මජාලන්තිපි නං ධාරෙහි. බ්‍රහ්මජාලන්තිපි නං ධාරෙහි. දිට්ඨිජාලන්තිපි නං ධාරෙහි. අනුත්තරො සඞ්ගාමවිජයොතිපි නං ධාරෙහීති. ඉදමවොච භගවා අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති, ඉමස්මිං ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානෙ සහස්සිලොකධාතු අකම්පිත්ථාති.

බ්‍රහ්මජාලසුත්තං නිට්ඨිතං පඨමං.

සර්වඥයන්වහන්සේවිසින් මේ සූත්‍රධර්මය වදාළකල්හි ආනන්ද ආයුෂ්මතුන්වහන්සේ ස්වාමීන්වහන්ස, අසිරිමත් දහමෙක. ස්වාමීන් වහන්ස පෙරනොවූ දහමෙක. ස්වාමීනි, මේ ධර්මක්‍රමය කවරනම් ඇත්තේදැයි භාග්‍යවතුන්වහන්සේට මේ වචනය සැළකෙළේය. ආනන්දය (යම්හෙයකින් මේ ධර්මය මෙහලෞකිකාර්‍ථයන් විභාගකරණලදද) ඒ කාරණය හෙතුකොටගෙණ මෙහි තෝ ඒ මේ ධර්මක්‍රමය අර්‍ථජාලයයි දරව. බොහෝ පාලිධර්මඇත්තෙන් ධර්මජාලයකියාද එය දරව. බ්‍රහ්මනම්ලද සර්වඥතාඥනය විභාගකළහෙයින් බ්‍රහ්මජාලය කියාද එය දරව. දෘෂ්ටිවිභාගය කළහෙයින් දෘෂ්ටිජාලය කියාද එය දරව. දෙව්පුත්‍රමාරාදීන්මඩනාටසමර්‍ථහෙයින් ශ්‍රෙෂ්ඨවූසඞ්ග්‍රාමවිජයයි කියාද එය දරාගණුව. භාග්‍යවතුන්වහන්සේ මෙසේ මේ බ්‍රහ්මජාල සූත්‍රධර්මය වදාළසේක. සතුටුසිත්ඇත්තාවූ ඒ භික්‍ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ ධර්මදෙශනාව සතුටින් පිළිගත්හ. නිර්‍ගෘඨකහෙයින් වෛය්‍යාකරණනම්ලද මේ සූත්‍රධර්මය වදාරණකල්හි දෙසැටතැනෙක් හිඳී (දශ) සහශ්‍රීලොකධාතුව කම්පිතවිය.

පළමුවෙනිවූ බ්‍රහ්මජාලසූත්‍රාර්‍ථව්‍යාඛ්‍යාව

නිමියේයි.

II. සාමඤ්ඤඵලසුත්තං.

1. එවං මෙ සුතං. එකං සමයං භගවා රාජගහෙ විහරති ජීවකස්ස කොමාරභච්චස්ස අම්බවනෙ මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං අඩ්ඪතෙළසෙහි භික්ඛුසතෙහි. තෙන ඛො පන සමයෙන රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො තදහුපොසථෙ පණ්ණරසෙ කොමුදියා චාතුමාසිනියා පුණ්ණාය පුණ්ණමාය රත්තියා රාජාමච්චපරිවුතො උපරිපාසාදවරගතො නිසින්නො හොති. අථ ඛො රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො තදහුපොසථෙ උදානං උදානෙසි රමණීයා වත භො දොසිනා රත්ති. අභිරූපා වත භො දොසිනා රත්ති.

සාමඤ්ඤඵලසූත්‍රාර්ථව්‍යාඛ්‍යා.

1 මාවිසින් මේ සූත්‍රාර්ථය මෙසේ අසනලදී. එක්කාලයෙක්හි භාග්‍යවතුන්වහන්සේ රජගහනුවර සමීපයෙහිවූ කොමාරභච්චනම් ලද ජීවකයාවිසින් කරවා පිළිගන්වනලද අඹවනවෙහෙර එක්දහස් දෙසියපණසක් භික්ෂූන්වූ මහද්භික්ෂුසඞ්ඝයාසමග වාසයකරණසේක. ඒ කාලයෙහිදී මගධෙශ්වරවූ (නුවණැතිකොසොල්රජදූවගේපුත්වූ) වෙදෙහිපුත්‍රවූ අජාසත්රජතෙම එදවස්පැමිණි පසළොස්වක් පොහෝ දිනයෙහි සුපිපිකුමුදු ඇත්තාවූ සාරමසක්හුගේ අවසානය ඇත්තාවූ එහෙයින්ම මාසාදීන්ගේ පිරීම ඇත්තාවූ සම්පූර්ණ චන්ද්‍රකාන්තියෙන් බබලන රාත්‍රියෙහි රජඇමතියන්විසින් පිරිවරණලදුව උත්තම ප්‍රාසාද්මස්තකයට පැමිණියේ සිංහාසනයෙහි උන්නේ වේ. ඉක්බිත්තෙන් මගධෙශ්වරවූ වෙදෙහිපුත්‍රවූ අජාසත්රජතෙම එදවස් පැමිණි පොහෝදිනයෙහි ප්‍රීතිවාක්‍යයක් ප්‍රකාශකෙළේය. කෙසේද යත්, පින්වත්නි, අභ්‍රමහිකාදිදොෂාපගතවූ රාත්‍රිතොමෝ එකාන්තයෙන් අභිරමණයට සුදුසුයි. පින්වත්නි, දොෂාපගතහෙයින් චන්ද්‍රකාන්තියෙන් බබලන රාත්‍රිතොමෝ එකාන්තයෙන් විශිෂ්ට රූඇත්තීය.

දස්සනීයා වත භො දෙසිනා රත්ති. පාසාදිකා වත භො දෙසිනා රත්ති. ලක්ඛඤ්ඤා වත භො දෙසිනා රත්ති. කන්නුඛ්වජ්ජ සමණංවා බ්‍රාහ්මණංවා පයිරුපාසෙය්‍යාම, යන්නොපයිරුපාසතො චිත්තං පසීදෙය්‍යාති.

2. එවං වුත්තෙ අඤ්ඤතරො රාජාමච්චො රාජානං මාගධං අජාතසත්තුං වෙදෙහිපුත්තං එතදවොච. අයං දෙව පූරණො කස්සපො සඞ්ඝී චෙව ගණී ච ගණාචරියො ච ඤාතො යසස්සී තිත්ථකරො සාධුසම්මතො බහුජනස්ස රත්තඤ්ඤූ චිරපබ්බජිතො අද්ධගතො වයො අනුප්පත්තො, තං දෙවො පූරණං කස්සපං පයිරුපාසතු අප්පෙවනාම දෙවස්ස පූරණං කස්සපං පයිරුපාසතො චිත්තං පසීදෙය්‍යාති, එවං වුත්තෙ රාජා මාගධො අජාතසත්තු වෙදෙහි පුත්තො තුණ්හී අහොසි.

පින්වත්නි, දෝෂාපගතරාත්‍රිතොමෝ ඒකාන්තයෙන් දක්මට සුදුසුයි. පින්වත්නි, දෝෂාපගතරාත්‍රිතොමෝ ඒකාන්තයෙන් ප්‍රසාද එලවන්නීය. පින්වත්නි, දෝෂාපගතරාත්‍රිතොමෝ ඒකාන්තයෙන් දිවසාදිවශයෙන් ලකුණුකටයුත්තීය. යම්හෙයකින් අද යමෙකු පර්‍ය්‍යුපාසනය කරන්නාවූ අපගේ සිත පහදින්නේද, එබදුවූ කවරනම් සංසිඳුවනලද පව්ඇති ශ්‍රමණයෙකු හෝ බහාතබනලද පව්ඇති බ්‍රාහ්මණයෙකු හෝ පර්‍ය්‍යුපාසනය කරන්නෙමුදැයි කියායි.

2 මෙසේ ප්‍රීතිවාක්‍යප්‍රකාශකළකල්හි එක්තරාරජඇමතියෙක් දේවයන්වහන්ස, පූරණනම්ලද මේ. කාශ්‍යපතෙමේ ප්‍රවෘජිතසමූහයා ඇත්තේය. ගෘහස්ථසමූහයාඇත්තේය. ආචාරයෙහි හික්මවීම්වශයෙන් ගණාචාර්‍ය්‍යද වෙයි. ප්‍රසිද්ධය. පතළකීර්ති ඇත්තේය. ලබ්ධි උපදවන්නේය. බොහෝදෙනාවිසින් සත්පුරුෂයයි සම්මත කරණලද්දේය. අන්ධබාලපෘථග්ජනයාගේ පැවිද්දෙහි පටන් අතික්‍රාන්තරාත්‍රීන්දන්නේය. පැවිදිවූ බොහෝකල් ඇත්තේය. ඉක්මගිය දෙතුන්රජපරපුරකල් ඇත්තේය. පැසුලුවයසට පැමිණියේය. දේවයන්වහන්සේ, ඒ පූරණකාශ්‍යපයා පර්‍ය්‍යුපාසනයකරණසේක්වා. පූරණකාශ්‍යපයා පර්‍ය්‍යුපාසනයකරන්නාවූ දේවයන්වහන්සේගේ සිත පහදින්නේනම් ඉතා යෙහෙකැයි මගධෙශ්වරවූ වෛදෙහි පුත්‍ර අජසත්රජහට මේ කාරණය සැලකෙළේය. මෙසේ කීයූකල්හි මගධෙශ්වරවූ වෛදෙහි පුත්‍ර අජසත්රජතෙම නිශ්ශබ්දවිය.

3. අඤ්ඤතරෙපිඛො රාජාමච්චොරාජානංමාගධංඅජාතසත්තුංවෙදෙහි පුත්තං එතදවොච. අයං දෙව මක්ඛලිගොසාලො සඞ්ඝීචෙව ගණීච ගණාචරියොච ඤාතො යසස්සී තිත්ථකරො සාධුසම්මතො බහුජනස්ස රත්තඤ්ඤූ චිරපබ්බජිතො අද්ධගතො වයො අනුප්පත්තො, තං දෙවො මක්ඛලිගොසාලං පයිරුපාසතු අප්පෙවනාම දෙවස්ස මක්ඛලිගොසාලං පයිරුපාසතො චිත්තං පසීදෙය්‍යාති. එවං වුත්තෙ රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො තුණ්හී අහොසි.

4. අඤ්ඤතරෙ පිඛො රාජාමච්චො රාජානං මාගධං අජාත සත්තුං වෙදෙහි පුත්තං එතදවොච. අයං දෙව අජිතො කෙසකම්බලො සඞ්ඝීචෙව ගණී ච ගණාචරියො ච ඤාතො යසස්සී තිත්ථකරො සාධු සම්මතො බහුජනස්ස රත්තඤ්ඤූ චිර පබ්බජිතො අද්ධගතො වයොඅනුප්පත්තො.

---

3 අන්රජ ඇමැත්තෙක්ද දේවයන්වහන්ස, ගවහලඋපන්හෙයින් ගොසාලනම්ලද මේ මක්ඛලිතෙමේ ප්‍රව්‍රජිතසමූහයා ඇත්තේය. ගෘහස්ථසමූහයා ඇත්තේය. ආචාරයෙහි හික්මවීම්වශයෙන් ගණාචාර්‍යයිද වෙයි. ප්‍රසිද්ධය. පතළකීර්ති ඇත්තේය. ලබ්ධි උපදවන්නේය. බොහෝදෙනාවිසින් සත්පුරුෂයයි සම්මතකරණලද්දේය. අන්ධබාලපෘථග්ජනයාගේ පැවිද්දෙහි පටන් අතික්‍රාන්තරාත්‍රීන් දන්නේය. පැවිදිවූ බොහෝකල් ඇත්තේය. ඉක්මගිය දෙතුන්රජ පරපුරකල් ඇත්තේය. පැසුලුවයසට පැමිණියේය. දේවයන්වහන්සේ ඒ මක්ඛලිගොසාලයා පර්‍යුපාසනාය කරණසේක්වා. මක්ඛලිගොසාලයා පර්‍යුපාසනාය කරන්නාවූ දේවයන්වහන්සේගේ සිත පහදින්නේනම් ඉතා යෙහෙකැයි, මගධෙශ්වරවූ වෙදෙහිපුත්‍රවූ අජාසත්මහරජහට මේ කාරණය සැලකොළේය. මෙසේ කියූකල්හි මගධෙශ්වරවූ වෙදෙහිපුත්‍රවූ අජාසත්රජතෙම නිශ්ශබ්දවිය.

4 අන්රජඇමැත්තෙක්ද දේවයන්වහන්ස, කෙශකම්බලවස්ත්‍රයක්දරණහෙයින් කෙශකම්බලනම්ලද මේ අජිතතෙමේ ප්‍රව්‍රජිත සමූහයාඇත්තේය. ගෘහස්ථසමූහයා ඇත්තේය. ආචාරයෙහි හික්මවීම්වශයෙන් ගණාචාර්‍යයිද වෙයි. ප්‍රසිද්ධය. පතළකීර්තිඇත්තේය. ලබ්ධි උපදවන්නේය. බොහෝදෙනාවිසින් සත්පුරුෂයයි සම්මතකරණලද්දේය. අන්ධබාලපෘථග්ජනයාගේ පැවිද්දෙහි පටන් අතික්‍රාන්තරාත්‍රීන් දන්නේය. පැවිදිවූ බොහෝකල්ඇත්තේය. ඉක්මගිය දෙතුන්රජ පරපුරකල්ඇත්තේය. පැසුලුවයසට පැමිණියේය.

තං දෙවො අජිතං කෙසකම්බලං පයිරුපාසතු,අප්පෙවනාම දෙවස්ස අජිතං කෙසකම්බලං පයිරුපාසතො චිත්තං පසීදෙය්‍යාති. එවං වුත්තෙ රාජාමාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො තුණ්හී අහොසි.

5. අඤ්ඤතරො පිඛො රාජාමච්චො රාජානං මාගධං අජාතසත්තුං වෙදෙහිපුත්තං එතදවොච.අයං දෙව පකුධො කච්චායනො සඞ්ඝී චෙව ගණීච ගණාචරියොච ඤාතො යසස්සී තිත්ථකරො සාධුසම්ම තො බහුජනස්ස රත්තඤ්ඤූ චිරපබ්බජිතො අද්ධගතො වයො අනුප්පත්තො තං දෙවො පකුධං කච්චායනං පයිරුපාසතු, අප්පෙව නාම දෙවස්ස පකුධං කච්චායනං පයිරුපාසතො චිත්තං පසීදෙ ය්‍යාති. එවං වුත්තෙ රාජා මාගධො අජාත සත්තු වෙදෙහි පුත්තො තුණ්හී අහොසි.

දෙවයන්වහන්සේ ඒ අජිතකෙශකම්බලයා පර්යුපාසනය කරණසේක්වා. අජිතකෙශකම්බලයා පර්යුපාසනය කරන්නාවූ දේවයන් වහන්සේගේ සිත පහදින්නේනම් ඉතායෙහෙකැයි මගධෙශ්වරවූ වෛදෙහිපුත්‍රවූ අජාසත්මහරජහට මේ කාරණය සැලකෙළේය. මෙසේ කියූකල්හි මගධෙශ්වරවූ වෛදෙහිපුත්‍රවූ අජාසත්මහරජ තෙමේ නිශ්ශබ්දවිය.

5 අන්‍රජඇමැත්තෙක්ද දේවයන්වහන්ස, කච්චායනගොත්‍ර ඇත්තාවූ මේ පකුධතෙමේ ප්‍රව්‍රජිතසමූහයා ඇත්තේය. ගෘහස්ථ සමූහයා ඇත්තේය.ආචාරයෙහි හික්මවීම්වශයෙන් ගණාචාර්‍ය්‍යද වෙයි.ප්‍රසිද්ධය. පතළකීර්ති ඇත්තේය. ලබ්ධිඋපදවන්නේය. බොහෝදෙනාවිසින් සත්පුරුෂයයි සම්මත කරණලද්දේය. අන්ධබාලපෘථග්ජන යාගේ පැවිද්දෙහි පටන් අතික්‍රාන්තරාත්‍රින්දත්තේය. පැවිදිවූ බොහෝ කල්ඇත්තේය.ඉක්මගිය දෙතුන්රජපරපුරකල්ඇත්තේය. පැසුලු වයසට පැමිණියේය.දේවයන්වහන්සේ ඒ පකුධකච්චායනයා පර්යුපාසනය කරණසේක්වා. පකුධකච්චායනයා පර්යුපාසනය කරන්නාවූ දේයන්වහන්සේගේ සිත පහදින්නේනම් ඉතාඈහෙකයි මගධෙශ්වරවූ වෛදෙහිපුත්‍රවූ අජාසත්රජහට මේ කාරණය සැලකෙළේය. මෙසේ කියූකල්හි මගධෙශ්වරවූ වෛදෙහිපුත්‍රවූ අජාසත්රජතෙමේ නිශ්ශබ්දවිය.

6. අඤ්ඤතරො පි ඛො රාජාමච්චො රාජානං මාගධං අජාතසත්තුං වෙදෙහි පුත්තං එතදවොච. අයං දෙව සඤ්ජයො බෙලට්ඨි පුත්තො සඞ්ඝීචෙව ගණී ච ගණාචරියො ච ඤාතො යසස්සී තිත්ථකරො සාධු සම්මතො බහුජනස්ස රත්තඤ්ඤූ චිරපබ්බජිතො අද්ධගතො වයො අනුප්පත්තො තං දෙවො සඤ්ජයං බෙලඨිපුත්තං පයිරුපාසතු, අප්පෙවනාම දෙවස්ස සඤ්ජයං බෙලඨි පුත්තං පයිරුපාසතො චිත්තං පසීදෙය්‍යාති. එවං වුත්තෙ රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො තුණ්හී අහොසි.

7. අඤ්ඤතරො පි ඛො රාජාමච්චො රාජානං මාගධං අජාතසත්තුං වෙදෙහිපුත්තං එතදවොච. අයං දෙව නිගණ්ඨො නාථපුත්තො සඞ්ඝීචෙව ගණී ච ගණාචරියො ච ඤාතො යසස්සී තිත්ථකරො සාධුසම්මතො බහුජනස්ස රත්තඤ්ඤූ චිර පබ්බජිතො.

---

6. අන්‍යරාජඇමැත්තෙක්ද දේවයන්වහන්ස, බෙලඨිපුත්‍රනම්ලද මේ සඤ්ජයතෙමේ ප්‍රව්‍රජිතසමූහයා ඇත්තේය, ගෘහස්ථසමූහයා ඇත්තේය, ආචාරයෙහි හික්මවීම් වශයෙන් ගණාචාර්‍ය්‍යද වෙයි. ප්‍රසිද්ධය, පතළකීර්ති ඇත්තේය, ලබ්ධිඋපදවන්නේය, බොහෝදෙනාවිසින් සත්පුරුෂයයි සම්මතකරණලද්දේය, අන්ධබාලපෘථග්ජනයාගේ පැවිද්දෙහි පටන් අතික්‍රාන්තරාත්‍රීන් දන්නේය, පැවිදිවූ බොහෝකල් ඇත්තේය, ඉක්මගිය දෙතුන්රජපරපුර කල්ඇත්තේය, පැසුලුවයසට පැමිණියේය, දේවයන්වහන්සේ ඒ සඤ්ජය බෙලඨිපුත්‍රයා පර්‍ය්‍යුපාසනය කරණසේක්වා. සඤ්ජයබෙලඨිපුත්‍රයා පර්‍ය්‍යුපාසනය කරන්නාවූ දේවයන්වහන්සේගේ සිත පහදින්නේනම් ඉතා යෙහෙකැයි මගධෙශ්වරවූ වෙදෙහිපුත්‍රවූ අජාසත්රජහට මේ කාරණය සැලකෙළේය. මෙසේ කියූකල්හි මගධෙශ්වරවූ වෙදෙහිපුත්‍රවූ අජාසත්රජතෙමේ නිශ්ශබ්දවිය.

7. අන්‍යරාජඇමැත්තෙක්ද දේවයන්වහන්ස, ක්ලෙශග්‍රන්ථරහිතයයි කියූහෙයින් නිගණ්ඨනම්ලද මේ නාථපුත්තෙමේ ප්‍රව්‍රජිතසමූහයා ඇත්තේය, ගෘහස්ථසමූහයා ඇත්තේය, ආචාරයෙහි හික්මවීම් වශයෙන් ගණාචාර්‍ය්‍යද වෙයි. ප්‍රසිද්ධය, පතළකීර්ති ඇත්තේය, ලබ්ධිඋපදවන්නේය, බොහෝදෙනාවිසින් සත්පුරුෂයයි සම්මතකරණලද්දේය, අන්ධබාලපෘථග්ජනයාගේ පැවිද්දෙහි පටන් අතික්‍රාන්තරාත්‍රීන් දන්නේය, පැවිදිවූ බොහෝකල් ඇත්තේය.

අඬගතො වයො අනුප්පත්තො තං දෙවො නිගණ්ඨං නාථපුත්තං පයිරුපාසතු, අප්පෙවනාම දෙවස්ස නිගණ්ඨං නාථ පුත්තං පයිරු පාසතො චිත්තං පසීදෙය්‍යාති. එවං වුත්තෙ රාජා මාගධො අජාත සත්තු වෙදෙහි පුත්තො තුණ්හි අහොසි.

8. තෙන ඛො පන සමයෙන ජීවකො කොමාරභච්චො රඤ්ඤො මාගධස්ස අජාතසත්තුස්ස වෙදෙහිපුත්තස්ස අවිදූරෙ තුණ්හි භූතො නිසින්නො හොති. අථඛො රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො ජීවකං කොමාරභච්චං එතදවොච ත්වං පන සම්ම ජීවං කිං තුණ්හිතික, අයං දෙව භගවා අරහං සම්මා සම්බුද්ධො අම්හාකං අම්බවනෙ විහරති මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං අඩ්ඪතෙළසෙහි භික්ඛුසතෙහි. තං ඛො පන භගවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො ඉතිපි සො භගවා අරහං සම්මා සම්බුද්ධො,

---

ඉක්මගිය දෙතුන්රජපරපුරකල්ඇත්තේය, පැසුලුවයසට පැමිණියේය, දේවයන්වහන්සේ ඒ නිගණ්ඨනාථපුත්‍රයා පර්යුපාසනය කරණසේක්වා. නිගණ්ඨනාථපුත්‍රයා පර්යුපාසනය කරන්නාවූ දේවයන්වහන්සේගේ සිත පහදින්නේ නම් ඉතා යෙහෙකැයි මගධෙශ්වරවූ වෙදෙහිපුත්‍රවූ අජාසත්රජහට මේ කාරණය සැල කෙළේය. මෙසේ කියූකල්හි මගධෙශ්වරවූ වෙදෙහිපුත්‍ර අජාසත් රජතෙමෙ නිශ්ශබ්දවිය.

8 ඒකාලයෙහිදී කොමාරභච්චනම්ලද ජීවකතෙමේ නිශ්ශබ්ද වූයේ මගධෙශ්වරවූ වෙදෙහිපුත්‍රවූ අජාසත්මහරජහට නුදුරුතන්හි (සමීපයෙහි) උන්නේ වේ. ඉක්බිති මගධෙශ්වරවූ වෙදෙහිපුත්‍රවූ අජාසත්රජතෙමේ සගය ජීවකය, නුඹවූ කලී කවර කරුණකින් නිශ්ශබ්දවූයෙහිදැයි කොමාරභච්චනම්ලද ජීවකයාට මේ කාරණය කියේය. (ජීවකයා විචාළේය.) දේවයන්වහන්ස, අර්හත්වූ සම්‍යක් සම්බුඬවූ මේ භාග්‍යවතුන්වහන්සේ එක්දහස්දෙසියපණසක් භික්ෂූන්වූ මහබික්සඟන සමග අපගේ අඹවනවෙහෙර වාසය කරණසේක. ඒ භගවත් ගෞතමයානන්වහන්සේ සම්බන්ධව මෙසේ යහපත්වූ කීර්තිශබ්දයක් වෙසෙසින් උස්වනැංගේය, කෙසේද. ඒ භාග්‍යවතුන්වහන්සේ සියලු කෙලෙසුන් කෙරෙන් දුරුවූයේය සියල්ලන්ගේ පූජාවට සුදුසුය යනමේ කාරණයන්ගෙන් අර්හත් සේක. මනාකොට තමන්වහන්සේ සියලු දහම් අවබොධ කෙළේය යන මේ ආදිකාරණයන්ගෙන් සම්‍යක්සම්බුඬසේක.

විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති, තං දෙවො භගවන්තං පයිරුපාසතු අප්පෙවනාම දෙවස්ස භගවන්තං පයිරුපාසතො චිත්තං පසීදෙය්‍යාති, තෙනහි සම්ම ජීවක හත්ථියානානි කප්පාපෙහීති.

9. එවං දෙවාති ඛො ජීවකො කොමාරභච්චො රඤ්ඤො මාගධස්ස අජාතසත්තුස්ස වෙදෙහිපුත්තස්ස පටිස්සුත්වා පඤ්චමත්තානි හත්ථිනිකාසතානි කප්පාපෙත්වා රඤ්ඤො ච ආරොහනියං නාගං, රඤ්ඤො මාගධස්ස අජාතසත්තුස්ස වෙදෙහිපුත්තස්ස පටිවෙදෙසි කප්පිතානි ඛො තෙ දෙව හත්ථියානානි යස්ස දානි කාලං මඤ්ඤසීති.

ත්‍රිවිද්‍යා අෂ්ටවිද්‍යා පසළොස්චරණ ධර්‍මයන්ගෙන් සම්පූර්ණය යන මෙ කාරණයන්ගෙන් විජ්ජාචරණසම්පන්නසේක. සොඳුරු ගමන්ඇති බැවින්හා සුදුරුතැනට ගියබැවින්ය යන මේ ආදි කාරණයන්ගෙන් සුගතසේක. සියලුඅයුරින්ලොවදන්නාහන්නේය යන මේකාරණයෙන් ලොකවිදූසේක. තමන්වහන්සේට ශ්‍රේෂ්ඨ කෙනෙක් නැත්තේය යන මේ කාරණයෙන් අනුත්තරසේක. දමනයකටයුතු (හික්මවියයුතු) පුරුෂයන්දමනයකෙරෙයි හෝ ඔවුන් දමනයකිරීමෙහි රථාචාය්‍ය්‍යයෙක් සමානය යන මේ කාරණයෙන් පුරිසදම්මසාරථිසේක. දෙවිමිනිසුන්ට අනුසාසනා කෙරෙති යන මෙ ආදී කාරණයන්ගෙන් සත්ථුසේක. චතුසත්‍යධර්‍මයන් අවබොධකෙළේය යන මේ ආදී කාරණයෙන් බුද්ධසේක. (භග්න) විනාසකරණලද රාගාදීකෙලෙසුන් ඇත්තේය යන මේ ආදී කාරණයෙන් භගවත්සේකැයි කියායි. දේවයන්වහන්සේ ඒ භාග්‍යවතුන්වහන්සේ පර්‍ය්‍යුපාසනය කරණසේක්වා. භාග්‍යවතුන්වහන්සේ පර්‍ය්‍යුපාසනය කරන්නාවූ දේවයන්වහන්සේගේ සිත පහදින්නේනම් ඉතායෙහෙක. සගය ජීවකය එහෙනම් (යව) ඇත්යානාවන් සරසවයි කීයේය.

9. දේවයන්වහන්ස, එසේයයි කොමාරභච්චනම්ලද ජීවකතෙමේ මගධෙශ්වරවූ වෛදෙහිපුත්‍රවූ අජාසත්මහරජහට පිළිවදන්දී පන්සියයක් ඇතින්යන්ද රජහට නැගීමට සුදුසුවූ ඇතෙක්ද සරසවා දේවයන්වහන්ස, නුඹවහන්සේට ඇත්යානාවෝ සරසනලද්දාහුමය. යම්යාමක් හෝ ඊමක් පිළිබඳව ඔබවහන්සේ කල්දන්නාසේක්නම් එයම කරණු මැනවැයි මගධෙශ්වරවූ වෛදෙහිපුත්‍රවූ අජාසත්මහරජහට දැන්වූයේය.

අථඛො රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො පඤ්චසු හත්ථිනිකාසතෙසු පච්චෙකා ඉත්ථියො ආරොපෙත්වා ආරොහනීයං නාගං අභිරූහිත්වා උක්කාසු ධාරියමානාසු රාජගහම්හා නීය්‍යාසි මහච්චා රාජානුභාවෙන යෙන ජීවකස්ස කොමාරභච්චස්ස අම්බවනං තෙන පායාසි.

10 අථඛො රඤ්ඤො මාගධස්ස අජාතසත්තුස්ස වෙදෙහිපුත්තස්සඅවිදූරෙ අම්බවනස්ස අහුදෙව භයං අහු ඡම්භිතත්තං අහු ලොමහංසො. අථඛො රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො භීතො සංවිග්ගො ලොමහඨජාතො ජීවකං කොමාරභච්චං එතදවොච කච්චිමං සම්ම ජීවක න වඤ්චෙසි කච්චිමං සම්ම ජීවක න පලම්භෙසි,කච්චි මං සම්ම ජීවක න පච්චත්ථිකානං දෙසි. කථංහි නාම තාව මහතො භික්ඛුසඞ්ඝස්ස අඩ්ඪතෙළසානං භික්ඛුසතානං නෙව ඛිපිතසද්දො භවිස්සති න උක්කාසිතසද්දො න නිග්ඝොසොති

ඉක්බිත්තෙන් මගධෙශ්වරවූ වෛදෙහිපුත්‍රවූ අජාසත්මහරජතෙම හස්තිනි වාහනපන්සියය මත්තෙහි එක් ඇතිනියක්පිට එක්සත්‍රියක් බැගින් නංවා තමහට යාමට සුදුසුවූ ඇතෙකුපිටට නැගී දඬුවැටපහන්දරණුලබනකල්හි මහත්වූ රාජානුභාවයෙන් යුක්තව රජගහ නුවරින් පිටත්විය. කොමාරභච්චනම්ලද ජීවකයාගේ අඹවනවෙහෙර යම්තැනෙක්හිද එතනට ගියේය.

10. එකල්හිදී මගධෙශ්වරවූ වෛදෙහිපුත්‍රවූ අජාසත්මහරජහට අඹවන වෙහෙරට නුදුරුතන්හිදී චිත්තොත්‍රාසභීතියක්වූයේමය. තැතිගැන්මක් විය, ලොමුදූහැගැන්මක් විය, ඉක්බිත්තෙන් බියපත්වූ සංවෙගයට පැමිණියාවූ හටගත් ලොමුදූහැගැණුම් ඇත්තාවූ මගධෙශ්වරවූ වෛදෙහිපුත්‍රවූ අජාසත්මහරජතෙමේ කිමෙක්ද, සගය ජීවකය, මා වඤ්චානොකලෙහිද, සගය ජීවකය, කිමෙක්ද මා අහිත යෙන් නොරැවටූයෙහිද, සගයජීවකය, කිමෙක්ද පසමිතුරන්ට නොදෙන්නෙහිද, කෙසේනම් එක්දහස්දෙසියපණසක් භික්ෂූන්වූ එපමණ මහද්භික්ෂුසඞ්ඝයාගේ නාසාවාත (කිඹිසුම්) ශබ්දයක් නොවන්නේය, උක්කාසිත (කැරුම්) ශබ්දයක් නොවන්නේය, නික්මුණු ඝොෂාවක් නොවන්නේය, ඊට කරුණු කිම්දැයි කොමාර භච්ච නම්ලද ජීවකයා විචාළේය.

මාභා සි මහාරාජ, මා භායි මහාරාජ න තං දෙව වඤ්චෙමි, න තං දෙව පලම්භාමි, න තං දෙව පච්චත්ථිකානං දෙමි. අභික්කම මහාරාජ, අභික්කම මහාරාජ, එතෙ මණ්ඩලමාලෙ දීපා ඣායන්තීති.

11 අථඛො රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො යාවතිකා නාගස්ස භූමි නාගෙන ගන්ත්වා නාගා පච්චොරොහිත්වා පත්තිකොව යෙන, මණ්ඩලමාලස්ස ද්වාරං තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා ජීවකං කොමාරභච්චං එතදවොච. කහං පන සම්ම ජීවක භගවාති එසො මහාරාජ භගවා, එසො මහාරාජ භගවා, මජ්ඣිමං ථම්භං නිස්සාය පුරත්ථාභිමුඛො නිසින්නො පුරක්ඛතො භික්ඛුසඞ්ඝස්සාති.

12 අථඛො රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා එකමන්තං අට්ඨාසි, එක මන්තං ඨිතොඛො රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො තුණ්හීභූතං තුණ්හීභූතං භික්ඛුසඞ්ඝං අනුවිලොකෙත්වා රහදම්ව විප්පසන්නං,

---

මහරජ බියනොවෙව. මහරජ බියනොවෙව. දේවයන්වහන්ස, ඔබ වඤ්චානොකරමි. දේවයන්වහන්ස, ඔබබොරුවෙන් නොරවටමි. දේවයන්වහන්ස, ඔබ පසමිතුරන්ට නොදෙමි. මහරජ, ඉදිරි නික්මුණුමැනව, මහරජ ඉදිරි නික්මුණමැනව. නිසීදන ශාලාවෙහි මේ ප්‍රදීපයෝ දිලියෙත් දැල්වෙත්යයි කියේය.

11. ඉක්බිත්තෙන් මගධෙශ්වරවූ වෙදෙහිපුත්‍රවූ අජාසත්රජ තෙමේ හස්ත්‍යාරූඪව යාහැකි භූමිය සම්පමණ වේද, එතාක් ඇතුපිටින් ගොස් ඇතුපිටින් බැස පයින්ම නිසිදන ශාලාව යම් තැනෙක්හිද එතනට එලඹියේය. එලඹ සගය ජීවකය, භාග්‍යවතුන් වහන්සේ කොතැන්හිදැයි කොමාරභච්චනම්ලද ජීවකයා විචාළේය. මහරජ, මධ්‍යයෙහිවූ කණුව අසුරුකොට පෙරදිගට අභිමුඛවූයේ භික්ෂුසඞ්ඝයාවිසින් පෙරටුකරණලදුව මේ වැඩහුන්නේ භාග්‍යවතුන් වහන්සේය. මහරජ, මේ භාග්‍යවතුන්වහන්සේයයි කියේය.

12. ඉක්බිත්තෙන් මගධෙශ්වරවූ වෙදෙහිපුත්‍රවූ අජාසත්රජතෙමේ භාග්‍යවතුන්වහන්සේ යම්තැනෙක්හිද එතනට එලඹියේය. එලඹ එකත්පසෙක සිටියේය. එකත්පසෙක උන්නාමවූ මගධෙශ්වරවූ වෙදෙහිපුත්‍රවූ අජාසත් මහරජතෙමේ සංසුන්ව සියලුදිගුන්හිම නිශ්ශබ්දව උන්නාවූ නිම්ලවිලක්මෙන් විශෙෂයෙන් ප්‍රසන්නඉන්ද්‍රියයන් ඇති බික්සඟන නැවත නැවත බලා

උදානං උදානෙසි ඉමිනා මෙ උපසමෙන උදයි භද්දෙ කුමාරො සමන්නාගතො හොතු යෙන එතරහි උපසමෙන භික්ඛුසඞ්ඝො සමන්නාගතොති අගමාඛො ත්වං මහාරාජ යථාපෙමන්ති පියො මෙ භන්තෙ උදයි භද්දෙකුමාරො ඉමිනාමෙ භන්තෙ උපසමෙන උදයි භද්දෙකුමාරො සමන්නාගතො හොතු යෙනෙතරහි උපසමෙන භික්ඛුසඞ්ඝො සමන්නාගතොති

13. අථඛො රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො භගවන්තං අභිවාදෙත්වා භික්ඛුසඞ්ඝස්ස අඤ්ජලිම්පණාමෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො භගවන්තං එතදවොච. පුච්ඡෙය්‍යාමහං භන්තෙ භගවන්තං කඤ්චිදෙව දෙසං, සචෙ මෙ භගවා ඔකාසං කරොති පඤ්හස්ස වෙය්‍යාකරණායාති, පුච්ඡ මහාරාජ යදාකඞ්ඛසීති,

14. යථානුඛො ඉමානි භන්තෙ පුථු සිප්පායතනානි සෙය්‍යථීදං, හත්ථාරොහා අස්සාරොහා රථිකා ධනුග්ගාහා චෙලකා චලකා පිණ්ඩදායිකා උග්ගාරාජපුත්තා පක්ඛන්දිනො

දූන් යම් සංසිඳීමකින් මේ භික්‍ෂුසඞ්ඝතෙමේ යුක්තවේද,මේ කායිකාදි ව්‍යපසමනයෙන් මාගේ උදයිභද්ද කුමාරතෙමේද යුක්තවේවයි ප්‍රීති වාක්‍යයක් පැවැත්විය. මහරජ, බික්සඟන යම්බඳු ප්‍රේමයකින් යුක්ත වූයෙද එහෙයින් තෝ බලාපොරොත්තුවෙව ස්වාමීන්වහන්ස, උදයි භද්දකුමාරතෙමේ මට ප්‍රියය. ස්වාමීන්වහන්ස,දූන් භික්ඛුසඞ්ඝතෙමේ යම් ව්‍යපසමනයකින් යුක්තවීද මේ ව්‍යපසමයෙන් උදයිභද්දකුමාර තෙමේ යුක්තවේවායි කීයේය.

13 ඉක්බිත්තෙන් මගධෙශ්වරවූ අජාසත්රජතෙම භාග්‍යවතුන්වහන්සේ සකසාවැඳ භික්‍ෂුසඞ්ඝයාට අඤ්ජලිප්‍රණාමයකොට එකත්පසෙක උන්නේය. එකත්පසෙක උන්නාවූ මගධෙශ්වරවූ වෛදෙහිපුත්‍රවූ අජාසත්රජතෙම ඉදින් භාග්‍යවතුන්වහන්සේ ප්‍රශ්නවිසර්ජනය පිළිගෙණ අවසරදෙනසේක්නම් ස්වාමීන්වහන්ස, මම භාග්‍යවතුන්වහන්සේ කිසියම්ලෙශමාත්‍රයක් විචාරන්නෙමියි භාග්‍යවතුන්වහන්සේට මෙය සැළකෙළේය. මහරජ ඉදින් (යමක්) කැමැත්තෙහිනම් එය විචාරවයි වදාළේය.

14 ස්වාමීන්වහන්ස, යම්සේ සත්වයන්ගේ දිවිපැවැත්මටහෙතුවූ මේ බොහෝ ශිල්පයෝ වෙද්ද, ඔව්හු කවරහුදයත්. සියලු හස්ත්‍යාචාර්‍ය්‍යාදීහුය. සියලු අශ්වාචාර්‍ය්‍යාදීහුය. රියනැගීයුද්‍ධකරණ සියලු රථාචාර්‍ය්‍යයෝය. දුනුගෙණ යුද්‍ධකරණ ධන්වාචාර්‍ය්‍යයෝය. යුද්‍ධයෙහි ජයධ්වජගෙණ පෙරටුවයන්නෝය. රාජාදීන්ට ස්ථානනියාමවශයෙන් සෙනාවිධානකරන්නෝය. මස්පිඩුමෙන් පරසෙන් සිඳහරින සාහසික මහායොධයෝය. නොහොත් යුද්‍ධමධ්‍යයට පැමිණි යෝධයන්ට බත්වඩන්නෝය. ජවපරාක්‍රමාදියෙන් උඩට නැගී සඞ්ග්‍රාමයටබැසගත් රාජපුත්‍රයෝය. යුද්‍ධමැදටපැණ සතුරන්ගේ හිස්ආදිය ගෙණඑන්නෝය.

මහානාගාසූරා චම්මයොධිනො දාසකපුත්තා ආලාරිකා කප්පකා නහාපකා සූද මාලාකාරා රජකා පෙසකාරා නළකාරා කුම්භකාරා ගණකා මුද්දිකා. යානි වා පනඤ්ඤානිපි එවං ගතිකානි පුථුසිප්පායතනානි තෙ දිට්ඨෙව ධම්මෙ සන්දිට්ඨිකං සිප්පඵලං උපජීවන්ති, තෙ තෙන අත්තානං සුඛෙන්ති පීණෙන්ති, මාතාපිතරො සුඛෙන්ති පීණෙන්ති, පුත්තදාරං සුඛෙන්ති පීණෙන්ති, මිත්තාමච්චෙ සුඛෙන්ති පීණෙන්ති සමණබ්‍රාහ්මණෙසු උද්ධග්ගිකං දක්ඛිණං පතිට්ඨාපෙන්ති සොවග්ගිකං සුඛවිපාකං සග්ගසංවත්තනිකං. සක්කා නු ඛො භන්තෙ එවමෙවං දිට්ඨෙව ධම්මෙ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පඤ්ඤපෙතුන්ති.

15. අභිජානාසි නො ත්වං මහාරාජ ඉමං පඤ්හං අඤ්ඤෙ සමණබ්‍රාහ්මණෙ පුච්ඡිත්තාති. අභිජානාමහං භන්තෙ ඉමං පඤ්හං අඤ්ඤෙ සමණබ්‍රාහ්මණෙ පුච්ඡිත්තාති.

හස්ත්‍යාදීන් අභිමුඛව එනකල්හි නොනවත්නා මහඇතුන්වැනි යොධයෝය. හුදකලාව යුද්ධකරන්නෝය. සම් පසුම්බියක් ගෙණ හෝ පලිහක් ගෙණ යුද්ධකරන්නෝය. බලවත් සෙනගඇතිගෘහදාස යොධයෝය. බත්කරන්නෝය. මනුෂ්‍යයන්ගේ අලඞ්කාර විධිය කරන්නාවූ කපුවෝය. පිලවුන්ආදියගැල්විමෙන් නහවන්නෝය. අරක්කැමියෝය. මාලාකාරයෝය. රදව්ය. පිළිවියන්නෝය. කුළුපොත්තෝය. කුඹල්ලුය. ගණකයෝය. හස්තමුද්‍රාගණනිසා ජීවත්වන්නෝය යනමොහුයි. මෙයින් අන්‍යවූද මෙසේ පැවැත්තාවූ චිත්‍රකාරාදි යම් ඒ බොහෝ ශිල්පයෝවෙද්ද, ඒ හස්ත්‍යාරොහාදීහු මේ ඇත්බැව්හිම තමාවිසින්ම දක්කයුතුවූහෝ අනුභව කටයුතුවූ ශිල්ප ඵලයනිසා ජීවිකාව කෙරෙද්ද, ඔව්හු ඒ ශිල්පඵලයෙන් තමා සුවපත් කෙරෙත්. පිණවත්. හෙවත් බලසම්පන්න කෙරෙත්. මව්පියන් සුවපත් කෙරෙත්. පිණවත්, හෙවත් බලසම්පන්න කෙරෙත්. අඹුදරුවන් සුවපත් කෙරෙත්. පිණවත්, මිත්‍රාමාත්‍යයන් සුවපත් කෙරෙත්. පිණවත්, හෙවත් බලසම්පන්න කෙරෙත්. මහණ බමුණන් කෙරෙහි මත්තෙහි ඵල උපදවන්නාවූ ස්වර්ගයට සුදුසුවූ සැපවිපාකඇති රූපශබ්දාදිදශධර්ම්ලාභයපිණිස පවත්නාවූ දක්ෂිණාව (දානය) පිහිටුවද්ද, ස්වාමීන්වහන්ස එපරිද්දෙන්ම මේ අත්බැව්හිම දක්කයුතුවූ විපාකඇති ශ්‍රාමණ්‍යගුණය හෙවත් ආර්‍ය්‍යමාර්ගඵලය පණවන්ට කිමෙක හැක්කේදැයි විචාළේය.

15. මහරජ තෝ මේ ප්‍රශ්නය අන් මහණබමුණන් කිමෙක විචාළෙහිද, ඒ විචාලබව හා එපරිද්ද කිමෙකදන්නෙහිද, ස්වාමීන්වහන්ස, මේප්‍රශ්නය අන් මහණබමුණන් විචාළෙම් දනිම්මය.

යථාකථං පන තෙ මහාරාජ ව්‍යාකරිංසු, සචෙ තෙ අගරු භාසස්සූති, නාඛො මෙ භන්තෙ ගරු යත්ථස්ස භගවා නිසින්නො භගවන්තරූපො වාති, තෙනහි මහාරාජ භාසස්සූති.

16. එකමිදාහං භන්තෙ සමයං යෙන පූරණො කස්සපො තෙනුපසඞ්කමිං. උපසඞ්කමිත්වා පූරණෙන කස්සපෙන සද්ධිං සම්මොදිං සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිං. එකමන්තං නිසින්නොඛො අහං භන්තෙ පූරණං කස්සපං එතදවොචං යථානුඛො ඉමානි භො කස්සප පුථුසිප්පායතනානි, සෙය්‍යථීදං, හත්ථාරොහා අස්සාරොහා රථිකා ධනුග්ගාහා චෙලකා චලකා පිණ්ඩදායිකා උග්ගා රාජපුත්තා පක්ඛන්දිනො මහානාගා සූරා චම්මයොධිනො දාසකපුත්තා ආළාරිකා කප්පකා

මහරජ, ඒ මහණබමුණෝ ඒ කෙසේනම් තට ප්‍රකාශකළෝද, ඉදින් තට බැරෑරුම් නොවේනම් හෙවත් අපහසුනොවේනම් කියවයි වදාළේය. ස්වාමීන්වහන්ස පින්වත් ස්වරූපඇති භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙක්හි වැඩහුන්නේද එහෙයින් ඒ කථාප්‍රකාශයෙහිමට අපහසුවක් නැත්තේය. එහෙනම් මහරජ කියවයි වදාළේය.

16 ස්වාමීන්වහන්ස මම එක්කාලයෙක්හි පූරණකාශ්‍යපතෙම යම් තැනෙක්හිද එතනට එළඹියෙමි. එළඹ පූරණකාශ්‍යපයා සමග සතුටුවූයෙමි. සතුටුවියයුතුවූ සිහිකටයුතුවූ කථාව කොටනිමවා එකත් පසෙක උන්නෙමි. ස්වාමීන්වහන්ස එකත්පසෙක උන්නාවූ මම පූරණකාශ්‍යපයාහට මෙය දැන්වූයෙමි. පින්වත, කාශ්‍යපය යම්සේ මේ බොහෝ ශිල්පයෝ වෙද්ද, ඒ නම් සියළු හස්ත්‍යාචාර්‍ය්‍යාදීහුය, සියළු අශ්වාචාර්‍ය්‍යාදීහුය, රියනැගීයුදකරණ සියළු රථාචාර්‍ය්‍යයෝය. දුනුගෙණයුදකරණ ධන්වාචාර්‍ය්‍යයෝය. යුධයෙහි ජයධ්වජ ගෙණ පෙරටුවයන්නෝය. රාජාදීන්ට ස්ථානනියාමවශයෙන් සෙනාවිධාන කරන්නෝය. මස්පිඩුමෙන් පරසෙන් සිඳහරින සාහසික මහායොධයෝය. නොහොත් යුධමධ්‍යයට පැමිණියොධයන්ට බත් වඩන්නේය. ජවපරාක්‍රමාදියෙන් උඩවනැගී සංග්‍රාමයට බැසගත් රාජපුත්‍රයෝය. යුදමැදට පැණ සතුරන්ගේ හිස්ආදිය ගෙණඑන්නෝය. හස්ත්‍යාදීන් අභිමුඛව එනකල්හි නොනවත්නා මහඇතුන්වැනි යොධයෝය. හුදකලාව යුධකරන්නෝය. සම්පසුම්බියක් ගෙණහෝ පලිහයක්ගෙණ යුධකරන්නෝය. බලවත්සෙනගඇති ගෘහදාස යොධයෝය. බත්කරන්නෝය. මනුෂ්‍යයන්ගේ අලඞ්කාර විධියකරන්නාවූ කපුවෝය.

නහාපකා සූදමාලාකාරා රජකා පෙසකාරා නළකාරා කුම්භකාරා ගණකා මුද්දිකා යානිවාපනඤ්ඤානිපි එවං ගතානි පුථුසිප්පායතනානි තෙ දිට්ඨෙව ධම්මෙ සන්දිට්ඨිකං සිප්පඵලං උපජීවන්ති, තෙ තෙන අත්තානං සුඛෙන්ති, පිණෙන්ති මාතාපිතරො සුඛෙන්ති පීණෙන්ති, පුත්තදාරං සුඛෙන්ති පීණෙන්ති මිත්තාමච්චෙ සුඛෙන්ති පිණෙන්ති සමණබ්‍රාහ්මණෙසු උද්ධග්ගිකං දක්ඛිණං පතිට්ඨාපෙන්ති සො වග්ගිකං සුඛවිපාකං සග්ගසංවත්තනිකං, සක්කානුඛො භො කස්සප එවමෙව දිට්ඨෙව ධම්මෙ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පඤ්ඤපෙතුන්ති,

17. එවං වුත්තෙහන්තෙ පූරණො කස්සපො මං එතදවොච කාරො තෙ ඛො මහාරාජ කාරයතො ඡින්දතො ඡේදාපයතො පචතො පාචයතො

විලවුන්ආදිය ගැල්වීමෙන් නහවත්තෝය, අරක්කැමියෝය. මාලාකාරයෝය. රදවිය. රෙදිවියන්නෝය. කුළුපොත්තෝය. කරගල්ලුය. ගණකයෝය. හස්තමුද්‍රාගණනනිසා ජීවත්වත්තෝය. යනමොහු මෙසින් අන්‍යවූද මෙසේ පැවැත්තාවූ චිත්‍රකාරාදී යම් ඒ බොහෝ ශිල්පීහුවෙද්ද, ඒ හස්ත්‍යාරොහාදිහු මේ අත්බැව්හිම විසිම්තාන්ම දක්කයුතුවූහෝ අනුභවකටයුතුවූ ශිල්පඵලයනිසා ජීවිකාවකෙරෙත්ද. ඔව්හු ඒ ශිල්පඵලයෙන් තමාසුවපත් කෙරෙත්, පිණවත්,හෙවත්බලසම්පන්නකෙරෙත්. මව්පියන් සුවපත්කෙරෙත්. පිණවත්, හෙවත්බලසම්පන්න කෙරෙත්. අඹුදරුවන් සුවපත්කෙරෙත්. පිණවත් මිත්‍රාමාත්‍යයන් සුවපත්කෙරෙත්. පිණවත්, හෙවත් බලසම්පන්න කෙරෙත්. මහණබමුණනන් කෙරෙහි මත්තෙහි ඵලඋපදවන්නාවූ ස්වර්ගයටසුදුසුවූ සැපවිපාකඇති රූපශබ්දාදි දශධර්මලාභය පිණිස පවත්නාවූ දක්ෂිණාව(දානය)පිහිටුවද්ද. ස්වාමීන්වහන්ස, එපරිද්දෙන්ම මේ අත්බැව්හිම දක්කයුතුවූ විපාකඇති ශ්‍රාමාණ්‍යගුණය (මාර්ග ඵලය) පණවන්ට කිමෙක්හැක්කේද්දයි විචාළේය.

17. ස්වාමීන්වහන්ස, මෙසේ විචාළකල්හි පූරණකාශ්‍යපතෙමේ මට මේ කාරණය කීයේය. එනම්, මහරජ, සියතින් කරන්නාහටද අණකොට කරවන්නාහටද, අනුන්ගේ අත්ආදිය කපන්නාහටද, කප්පවන්නාහටද,අනුන් දඬුවමින් පීඩාකරන්නාහටද, පරපීඩා කරවන්නාහටද,

සොචයතො කිලමතො කිලමාපයතො ඵන්දතො ඵන්දාපයතො පාණමතිමාපයතො අදින්නං ආදියතො සන්ධිං ඡින්දතො නිල්ලොපං හරතො එකාගාරිකං කරොතො පරිපන්ථෙ තිට්ඨතො පරදාරං ගච්ඡතො මුසා භණතො, කරොතො නකරියතිපාපං ඛුරපරියන්තෙන චෙපි චක්කෙන යො ඉමිස්සා පඨවියා පාණෙ එකමංසඛලං එකමංසපුඤ්ජං, කරෙය්‍ය. නත්ථි තතොනිදානං පාපං. නත්ථිපාපස්සආගමො. දක්ඛිණඤ්චෙපි ගඞ්ගාතීරං ගච්ඡෙය්‍ය හනන්තො ඝාතෙන්තො. ඡින්දන්තො ඡෙදාපෙන්තො පචන්තො පාචෙන්තො නත්ථි තතො නිදානං පාපං නත්ථි පාපස්ස ආගමො.

අනුන්ගේ බඩු පැහැරගැන්මාදියෙන් සොක කරන්නාහටද, අනුන්ලවා සොකකරවන්නාහටද, දඬගෙයි ලෑවීම් ආදියෙන් ක්ලාන්ත කරන්නාහටද, අනුන්ලවා ක්ලාන්ත කරවන්නාහටද, අනුන් කම්පා කරන්නාහටද, අනුන්ලවා කම්පා කරවන්නාහටද, හිංසාකරන්නාහටද, එසේම අනුන්ලවා හිංසා කරවන්නාහටද, නුදුන්දෙයගන්නාහටද, ගෘහසන්ධිය සිඳින්නාහටද, මහාවිලොපය හෙවත් ගෘහභික්ති ආදිය බිඳ කිසිවක් ශෙෂනොකට හැරගන්නාහටද, එක්ගෙයක්වටකොට කරන්නාවූ මහාඋවදුරු කරන්නාහටද, සියලු අයුරින් මාර්ගයෙහි සැඟවී සිටින්නාහටද, පරඅඹුවන් වෙත යන්නාහටද, බොරුකියන්නාහටද, කිසියම්පවක් කරම්යන අදහසින් පවක්කළකල්හිද, පවක්නොකරණලද්දේවේ පවක් නැත්තේය. සත්වයෝවූකලි පව්කරම්යන අදහස්ඇත්තෝ වෙත්. (සත්වයන්ගේ සදාකාලික භාවයෙන් මේ හිංසාදි ක්‍රියාවෝ ඔහු වෙතට නොපැමිණෙත්. සිරුරවනාහි සිත්රහිතදඬුකඩක් වැනිබැවින් එය වැනසූකල්හිද කිසිපවක් නොමැත්තේය යනුයි.) තියුණුවූ ක්ෂුරනම් ආයුධයෙන් කරණලද නිම්වලලුඇති නොහොත් ක්ෂුරධාරාවක් සමාන නිම්වලලුඇති චක්‍රයකින්ද, යමෙක් මේ පොළෝ තෙලෙහි වසනසතුරන්මරා එක්මස්රැසක් එක් මස්පිඬක් කරන්නේද, ඒ සත්වහිංසාව හෙතුකොටගෙණ පවක් නැත්තේය. පාපයාගේ පැමිණීමක් නැත්තේය. හිංසාකරමින්ද, හිංසාකරවමින්ද, සිඳිමින්ද, සින්දවමින්ද, පීඩාකරමින්ද, පීඩාකරවමින්ද, දක්ෂිණගඞ්ගාතීරයට යන්නේද, ඒ හෙතුකොටගෙණ පවක්නැත්තේය. පාපයාගේ පැමිණීමක් නැත්තේය.

උත්තරඤ්චෙපි ගඞ්ගාතීරං ගච්ඡෙය්‍ය දදන්තො දාපෙන්තො යජ
න්තො ජාපෙන්තො නත්ථි තතො නිදානං පුඤ්ඤං, නත්ථි පුඤ්ඤස්ස
ආගමො.

18 දානෙන දමෙන සංයමෙන සච්චවජ්ජෙන නත්ථිපුඤ්ඤං, නත්ථි
පුඤ්ඤස්ස ආගමොති. ඉත්ථංඛො මෙභන්තෙ පූරණො කස්සපො
සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුට්ඨො සමානො අකිරියං ව්‍යාකාසි.
සෙය්‍යථාපි භන්තෙ අම්බං වා පුට්ඨො ලබුජං ව්‍යාකරෙය්‍ය, ලබු
ජංවා පුට්ඨො අම්බං ව්‍යාකරෙය්‍ය එවමෙව ඛො මේ භන්තෙ පූරණො
කස්සපො සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුට්ඨො සමානො අකිරියං ව්‍යා
කාසි. තස්ස මය්හං භන්තෙ එතදහොසි කථංහි නාම මාදිසො
සමණං වා බ්‍රාහ්මණං වා විජිතෙ වසන්තං අපසාදෙතබ්බං මඤ්
ඤෙය්‍යාති, සොඛො අහං භන්තෙ පූරණස්ස කස්සපස්ස භාසිතං
නෙවඅභිනන්දිං න පටික්කොසිං, අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා
අනත්තමනො අනත්තමනවාචං අනිච්ඡාරෙත්වා තමෙව වාචං
අනුගණ්හන්තො අනික්කුජ්ජන්තො උට්ඨායාසනා පක්කාමිං.

දෙමින්ද, දෙවමින්ද, යාගකරමින්ද, යාගකරවමින්ද, උත්තර ගඞ්ගා
තීරයට යන්නේ වේද, ඒ හෙතුකොටගෙණ පිණක් නොමැත්තේය.
පුණ්‍යයාගේ පැමිණීමක් නොමැත්තේය.

18 දීමෙන්ද, ඉන්ද්‍රියදමනයෙන්ද, නොහොත් උපොසථයෙන්ද,
කායිකාදි සංයමයෙන්ද, සත්‍යකථාවෙන්ද, පිණක් නොමැත්තේය.
පින්පැමිණීමක්ද. නොමැත්තේය. ස්වාමීන්වහන්ස, මෙසේම පූරණ
කාශ්‍යපතෙමේ මා විසින් මේ අත්බැව්හි තමාවිසින්ම දැක්කයුතුවූ
ශ්‍රාමාණ්‍ය ඵලයයි කියනලද ආර්‍ය මාර්ගඵලය විචාරණලද්දේම නො
කිරීමම ප්‍රකාශකෙළේය. ස්වාමීන්වහන්ස, අඹරුක කෙබඳුදැයි විචා
රණලද්දේ හෝ දෙල්රුක මෙබඳුයයි ප්‍රකාශකරන්නේද, දෙල්
රුක හෝ කෙබඳුදැයි විචාරණලද්දේම අඹරුකමෙබඳුයයි
ප්‍රකාශකරන්නේද, ස්වාමීන්වහන්ස, එපරිද්දෙන්ම මාවිසින් සාංදෘ
ෂ්ටිකවූ ශ්‍රාමාණ්‍යභාවය විචාරණලද්දේම පූරණකාශ්‍යපතෙමේ
නොකිරීමම ප්‍රකාශකෙළේය. ස්වාමීන්වහන්ස, මාවැනි රජකෙනෙක්
අණපවත්නා සියපෙදෙසෙහි වසන්නාවූ මහණෙකු හෝ බමුණෙකු
වෙහෙසියයුතු කොට රටින්බැහැර කටයුතුකොට කෙසේ සිතන්නේ
දැයි ඒමටමේඅදහසවීය. ස්වාමීන්වහන්ස, ඒ මමවූකලී පූරණකාශ්‍යප
යාගේකථාවට සතුටුනොවූයෙමි. ආක්‍රොශද නොකෙළෙමි. මැනවයි
අභිනන්දනයදනොකොට අභූතයයනාදින් ආක්‍රොශත්නොකොට
නොසතුටුසිත්ඇත්තේ නොසතුටු වදන් නොකියා ඒ වචනයම
මැඩනොලමින් එයම සාරවශයෙන් නොගණිමින් මේසාරමාර්ගයයි
සිතෙහි නොපිහිටුවමින් හුනස්නෙන්නැගිට ගියෙමි.

19 එකමිදාහං භන්තෙ සමයං යෙන මක්ඛලිගොසාලො තෙනුප සං කමිං උපසංකමිත්වා මක්ඛලිගොසාලෙන සද්ධිං සම්මොදිං සම්මො දනියං කථං සාරාණියං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිං එකමන්තං නිසින්නො ඛො අහං භන්තෙ මක්ඛලිගොසාලං එතදවොචං යථානු ඛො ඉමානි භො ගොසාල පුථුසිප්පායතනානි සෙය්‍යථීදං හත්ථා රොහා-පෙ-සක්කානුඛො භොගොසාල එවමෙව දිට්ඨෙව ධම්මෙ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පඤ්ඤපෙතුන්ති.

20 එවං වුත්තො භන්තෙ මක්ඛලිගොසාලො මං එතදවොච නත්ථි මහරාජ හෙතු නත්ථිපච්චයො සත්තානං සංකිලෙසාය, අහෙතූ අප්ප ච්චයා සත්තාසංකිලිස්සන්ති නත්ථිහෙතු නත්ථි පච්චයො සත්තානං විසුද්ධියා අහෙතූ අප්පච්චයා සත්තා විසුජ්ඣන්ති. නත්ථි අත්තකාරෙ නත්ථි පරකාරෙ.

---

19 ස්වාමීන්වහන්ස, මම එක්කාලයෙක්හි මක්ඛලිගොසාලතෙමේ සම්පතැනෙක්හිද එතැනට එළඹියෙමි. එසේ එළඹ මක්ඛලිගොසාලයා සමග සතුටුවූයෙමි. සතුටුවියයුතුවූ සිහිකටයුතුවූ කථා කොට නිමවා එකත්පසෙක උන්නෙමි. ස්වාමීන්වහන්ස, එකත්පසෙක උන්නාවූ. මම මක්ඛලිගොසාලයාට මේ කාරණය කීයෙමි. පින්වත් ගොසාලය යම්සේ මේ බොහෝ ශිල්පයෝ වෙද්ද, ඒනම් සියලු හස්ත්‍යාචාර්‍ය්‍යාදිහුය. සෙස්සක්‍රමයෙන් දතයුතු. පින්වත් ගොසාලය එපරිද්දෙන්ම මේ අත්බැව්හිම තමන්කෙරෙහි දැක්කයුතුවූ මාගීඵලය පණවන්ට කිමෙක පිළිවන්දැයි විචාළේය.

20 මෙසේ විචාළකල්හි මක්ඛලිගොසාලතෙමේ මහරජ, සත්ව යන්ගේ කෙලෙසීමපිණිස හෙතුවක් නොමැත්තේය. ප්‍රත්‍යයක් නොමැත්තේය. හෙතුරහිතව ප්‍රත්‍යයරහිතව සත්වයෝ කෙලෙසෙන් නාහ. සත්වයන්ගේ පිරිසිදුබවලැබීමපිණිස හෙතුවක් නොමැත් තේය. ප්‍රත්‍යයක් නොමැත්තේය. හෙතුරහිතව ප්‍රත්‍යයරහිතව සත්ව යෝපිරිසිදුවෙත්.(කායදුශ්චරිතාදියහෙතුකොටගෙණකෙලෙසීමක්ද, කායසුචරිතාදිය හෙතුකොට පිරිසිදුබවක්ද නැතැයිසේසි.) තමා විසින් කරණලද කර්‍මයෙහි විපාකනැත්තේය. අනුන්ගේ අවවා දානුශාසනාපරිද්දෙන් කරණලදකර්‍මයෙහිවිපාකනැත්තේය. (මෙයින් මහණෙනි, පාපකර්‍මයෙහි විපාකඇතැයි වදාලධර්‍මචක්‍රයට පහරදෙයි.

නත්‍ථි පුරිසකාරෙ නත්‍ථි බලං නත්‍ථි විරියං නත්‍ථි පුරිසථාමො නත්‍ථි පුරිසපරක්කමො. සබ්බෙ සත්තා සබ්බෙ පාණා සබ්බෙ භූතා සබ්බෙජීවා අවසා අබලා අවිරියා නියති සඞ්ගතිභාවපරිණතා ඡසෙවාභිජාතිසු සුඛදුක්ඛං පටිසංවෙදෙන්ති. චුද්දස ඛො පනිමානි යොනිපමුඛසතසහස්සානි සට්ඨිච සතානි ඡච සතානි, පඤ්චච කම්මුනො සතානි පඤ්චචකම්මානි තීණිච කම්මානි කම්මෙච අඩ්ඪකම්මෙච වසට්ඨිපටිපදා, වසට්ඨන්තරකප්පා, ඡලාභිජාතියො, අට්ඨපුරිසභූමියො, එකූනපඤ්ඤාස ආජීවසතෙ, එකූනපඤ්ඤාස පරිබ්බාජකසතෙ, එකූනපඤ්ඤාස නාගාවාසසතෙ, විසෙඉන්‍ද්‍රියසතෙ, තිංසෙ නිරයසතෙ, ඡත්තිංස රජොධාතුයො, සත්තසඤ්ඤීගබ්භා, සත්තඅසඤ්ඤීගබ්භා.

තමතමන්පිළිබඳ පුරුෂ වියඹියෙහි ඵලනැත්තේය. සත්වයෝ යම්බලයක් නිසා සැපතට පැමිණෙත්නම් ඒ බලයනැත්තේය. සූරවීරභාවය ඵලවන්නාවූ වීයඹිය නැත්තේය. බලවත් සූරභාවාදියෙන් ධුරවාහනය කටයුතුවූ පුරුෂශක්තිය නැත්තේය. පුරුෂයා සම්බන්ධපරාක්‍රමය නැත්තේය. ඔටුවන්ආදිසකලසත්වයෝද, එකින්ද්‍රියාදිසකල ප්‍රාණීහුද, අණ්ඩකොෂවස්තිකොෂාදියෙහි හටගන්නා සකලභූතයෝද, හැල්ආදිසියලුජීවනෙන්ද්‍රියඇත්තෝද, යන මේසියල්ලෝ වසහනැත්තෝය. බලනැත්තෝය. වීයඹි නැත්තෝය. නියමපැවැත්මඇති බැවින්ද ෂඩ්විධ ශ්‍රෙෂ්ඨජාතින්අතුරෙහි ඒ ඒ ගතිවලට පැමිණීමෙන්ද, ස්වභාවයෙන්ද, පිරිනමනලද්දාහු නොහොත් නා නා ප්‍රකාරබවටපැමිණියාහු ෂඩ්විධ ශ්‍රෙෂ්ඨජාතියෙහිම සුවදුක් විඳින්. (අන්‍යවූ සුඛදුඃඛභූමියෙක් නැතැයි සේයි) යම්බඳුවූ බාලයෝද, පණ්ඩිතයෝද, බොහෝ සේ හැසිර දුක්කෙළවර කරන්නාහුද, ක්‍ෂත්‍රිය බ්‍රාහ්මණාදී උත්තමයොනින් සම්බන්ධතුදුස්ලක්‍ෂෂට්දහස්සසියයක්ද, කර්ම පන්සියයක්ද, කර්මපසක්දකර්මතුණක්ද, කායකර්මවචීකර්මදෙකක්ද මනොකර්මයයි කියූ අර්ධකර්මයද, දෙසැටක් ප්‍රතිපදාවෝද, සූසැටක් අන්තරකල්පයෝමද, කෘෂ්ණාභිජාතිආදිශ්‍රෙෂ්ඨජාති සයක්ද, උපන්නැන්පටන් සත්දවසදක්වාපවත්නා කාලයපීඩාස්ථානයෙන් මිදුනුහෙයින් මන්‍දභූමියසනාදීනම්ලද පුරිසභූමිඅටද ආජීවකවෘත්ති එකසියසතළිස්නවයක්ද, පරිව්‍රාජක ප්‍රව්‍රජ්‍යා එකසියසතළිස්නවයක්ද, නාගමණ්ඩලඑකසියසතළිස්නවයක්ද, ඉන්‍ද්‍රිය එකසියවිස්සක්ද, නිරයතුන්සියයක්ද, අත්පාපිටුආදිවූ රජොධාතු තිස්හයක්ද, ඔටුගොන්ආදී සංඥිගර්භ සතක්ද, හැල්ආදිඅසංඥගර්භසතක්ද,

සත්තනිගණ්ඨිගබ්භා, සත්තදෙවා, සත්තමානුසා, සත්තපෙසාචා සත්ත සාරා, සත්තපවුටා, සත්තපවුටසතානි සත්තපපාතා සත්තපපාතසතානි සත්තසුපිනා සත්තසුපිනසතානි, චුල්ලාසීතිමහාකප්පුනො සතසහස්සානි යානි බාලෙච පණ්ඩිතෙච සන්ධාවිත්වා සංසරිත්වා දුක්ඛස්සන්තං කරිස්සන්ති. තත්ථ නත්ථි ඉමිනාහං සීලෙනවා වතෙනවා තපෙනවා බ්‍රහ්මචරියෙන වා අපරිපක්කං වා කම්මං පරිපාචෙස්සාමි පරිපක්කංවා කම්මං ඵුස්ස ඵුස්ස ව්‍යන්තිංකරිස්සාමීති. හෙවං නත්ථි දොණමිතෙ සුඛ දුක්ඛෙ පරියන්තකතෙ සංසාරෙ, නත්ථිහායනවඩ්ඪනෙ නත්ථි උක්කංසාවකංසෙ. සෙය්‍යථාපිනාම සුත්තගුළෙ ඛිත්තෙ නිබ්බෙඨියමානමෙව පලෙති, එවමෙව බාලෙච පණ්ඩිතෙච සන්ධාවිත්වා සංසරිත්වා දුක්ඛස්සන්තං කරිස්සන්තීති.

21. ඉත්ථංඛො මෙභන්තෙමක්ඛලිගොසාලොසන්දිට්ඨිකංසාමඤ්ඤඵලං පුට්ඨො සමානොසංසාරසුද්ධිං ව්‍යාකාසි. සෙය්‍යථාපි භන්තෙ අම්බංවා පුට්ඨො ලබුජංව්‍යාකරෙය්‍ය ලබුජංවා පුට්ඨො අම්බං ව්‍යාකරෙය්‍ය,

---

උක්ආදිනිගණ්ඨිගර්භසතක්ද, දිව්‍යනිකායසතක්ද, නොහොත් බොහෝදෙවියෝද මනුෂ්‍යයොනිසතක්ද පිසාචයොනිසතක්ද, විල්සතක්ද, ගැටසතක්ද, ස්වප්නඑකසියසතක්ද, මහාප්‍රපාතසතක්ද, කුඩාප්‍රපාත එකසියසතක්ද, මහසීනසතක්ද, කුඩාසීනඑකසියසතක්ද, චූලාසීති මහාකල්පසම්බන්ධවූ ලක්‍ෂයක්ද වෙත් එහි මම මේඅචෙලකසීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ තපසින් හෝ බඹසරින් හෝ මුහුකිරීමට නොපැමිණියාවූ කර්‍මයවත්නෙමි යි කියාහෝ නැත්තේය. මුහුකුරාගිය කර්‍මය හෝ ස්පර්‍ශකරමින් ගෙවීමකරන්නෙමියි කියාද, නැත්තේය. ද්‍රෝණයෙන්මැණප්‍රමාණකරණලද්දවුන් මෙන් සුවදුක් කියූ ප්‍රමාණකාලයෙන් කෙළවරකළකල්හි සසරෙහි අඩුවීමක් හෝ වැඩිවීමක් නොමැත්තේය. බාලයාට සසරවැඩිමහා ගෙවීමක් නැත්තේයයි සේයි. හීනබවක් හෝ උසස්බවක්නැත්තේය. යම්සේ හුයින් වෙලාකරණලද සූත්‍රගුලයක් වෘක්‍ෂාග්‍රයෙක්හි හෝ සිට විසිකරන්නේ නොපැකිලයේද, හුය අවසන්වූකල්හි නොයේද, එපරිද්දෙන්ම බාලයෝද පණ්ඩිතයෝද භවයෙන් භවයට ගමන්කොට හැසිර දුක් කෙළවර කෙරෙත්.

21 ස්වාමින්වහන්ස, මෙසේ වනාහි මාවිසින් සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍යඵලය විචාරණලද්දවූ මක්ඛලිගොසාලතෙමේ සංසාරයෙන් ශුද්ධිය ප්‍රකාශකෙළේය. ස්වාමින්වහන්ස, යම්සේ අඹරුක කෙසේදැයි විචාරණ ලද්දේ හෝ දෙල්රුක මෙබඳුයයි ප්‍රකාශකරන්නේද, දෙල්රුක හෝ කෙබඳු දැයි විචාරණලද්දේම අඹරුක හෝ මෙසේයයි ප්‍රකාශ කරන්නේද,

එවමෙව ඛො භන්තෙ මක්ඛලිගොසාලො සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුට්ඨො සමානො සංසාරසුද්ධිං ව්‍යාකාසි. තස්ස මය්හං භන්තෙ එතදහොසි කථංහි නාම මාදිසො සමණං වා බ්‍රාහ්මණං වා විජිතෙ වසන්තං අපසාදෙතබ්බං මඤ්ඤෙය්‍යාති. සො ඛො අහං භන්තෙ මක්ඛලිස්ස ගොසාලස්ස භාසිතං නෙව අභිනන්දිං න පටික්කොසිං අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා අනත්තමනො අනත්තමනවාචං අනිච්ඡාරෙත්වා තමෙව වාචං අනුග්ගණ්හන්තො අනික්කුජ්ජන්තො උට්ඨායාසනා පක්කාමිං.

22. එකමිදාහං භන්තෙ සමයං යෙන අජිතො කෙසකම්බලී තෙනුපසඞ්කමිං උපසඞ්කමිත්වා අජිතෙන කෙසකම්බලිනා සද්ධිං සම්මොදිං සම්මොදනීයං කථං සාරානීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිං. එකමන්තං නිසින්නො ඛො අහං භන්තෙ අජිතං කෙසකම්බලිං එතදවොචං යථා නු ඛො ඉමානි භො අජිත පුථු සිප්පායතනානි, සෙය්‍යථිදං හත්ථාරොහා ...පෙ... සක්කා නු ඛො අජිත එවමෙව දිට්ඨෙව ධම්මෙ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පඤ්ඤපෙතුන්ති.

ස්වාමීන්වහන්ස, එපරිද්දෙන් මේ අත්බැව්හි මතමත්කෙරෙහි දක්කයුතුවූ ශ්‍රාමණ්‍යඵලය මාවිසින් විචාරණලද්දාවූ මක්ඛලිගොසාල තෙමේ සංසාරශුද්ධිය ප්‍රකාශකෙළේය. ස්වාමීන්වහන්ස, මාවැනිරජෙක් සියරටෙහි වසන්නාවූ මහණෙකු හෝ බමුණෙකු ගැටියයුතුකොට නොහොත් රටින් බැහැරකිරීමෙන් වෙහෙසකටයුතුකොට කෙසේනම් සිතන්නේදැයි මට මේඅදහස විය. ස්වාමීන්වහන්ස, ඒ මම මක්ඛලිගොසාලයාගේ කථාවට අභිනන්දනයද, නොකෙළෙමි, ආක්‍රොශද, නොකෙළෙමි. අභිනන්දනයද, නොකොට ප්‍රතික්‍රොශද, නොකොට, නොසතුටු සිත්ඇත්තේ නොසතුටුවදන් නොකියා ඒ කථාවම සාරවශයෙන් නොගණිමින් නොකොට හුනස්නෙන්නැගිට ගියෙමි.

22 ස්වාමීන්වහන්ස, මම එක්කාලයෙක්හිදී කේශකම්බලවස්ත්‍ර ධාරිවූ අජිතතෙමේ යම්තැනෙක්හිද එතනටඑළඹියෙමි. එළඹ අජිත කෙසකම්බලියාසමග සතුටුවූයෙමි. සතුටුවියයුතුවූ සිහිකටයුතුවූ කථාව කොටනිමවා එකත්පසෙක උන්නෙමි. ස්වාමීන්වහන්ස, එකත් පසෙක උන්නාවූ මම අජිතකෙසකම්බලියාට මේකාරණය දැන්වූයෙමි. පින්වත, අජිතය, යම්සේ මේ බොහෝ ශිල්පයෝවෙද්ද, ඒනම් හස්ත්‍යාචාර්‍ය්‍යාදිහුය. සෙස්ස කීනයින්දතයුතු. පින්වත, අජිතය, එපරිද්දෙන්ම මේ අත්බැව්හිම තමතමන්කෙරහි දක්කයුතුවූ ශ්‍රාමණ්‍යඵලය පණවන්ට කිමෙක පිළිවන්දැයි විචාළෙමි.

23. එවං වුත්තෙ භන්තෙ අජිතො කෙසකම්බලී මං එතදවොච. නත්ථි මහාරාජ දින්නං, නත්ථි යිට්ඨං, නත්ථි හුතං, නත්ථි සුකට දුක්කටානං කම්මානං ඵලං විපාකො, නත්ථි අයං ලොකො, නත්ථි පරො ලොකො, නත්ථි මාතා, නත්ථි පිතා, නත්ථි සත්තා ඔපපාතිකා, නත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මා පටිපන්නා යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්ති. චාතුම්මහාභූතිකො අයං පුරිසො, යදා කාලං කරොති පඨවි පඨවිකායං අනුපෙති අනුපි(ප)ගච්ඡති, ආපො ආපොකායං අනුපෙති අනුපිගච්ඡති, තෙජො තෙජොකායං අනුපෙති අනුපගච්ඡති, වායො වායොකායං අනුපෙති අනුපි ගච්ඡති, ආකාසං ඉන්ද්‍රියානි සංකමන්ති. ආසන්දිපඤ්චමා පුරිසාප මතං ආදය ගච්ඡන්ති යාව ආලාහනා

---

23 ස්වාමීන්වහන්ස, මෙසේ විචාලකල්හි කෙශකම්බලි අජිත තෙමේ මට මෙය කියේය. මහරජ. දෙනලද්ද පිළිබඳ ඵල නැත්තේය. යාගසම්බන්ධි ඵල නැත්තේය. හෝමසම්බන්ධි ඵල නැත්තේය. කුශලාකුශලකර්මයන්ගේ ඵලවිපාකනැත්තේය. පරලොව සිටියා හට මේලොව නැත්තේය. මෙලොව සිටියාහට පරලොව නැත් තේය. සියල්ලෝ ඒ ඒ තන්හි වැනසෙත්. මව්පියන්කෙරෙහි යහපත් අයහපත් ප්‍රතිපත්තීන්ගේ ඵලනැත්තේය. ඔපපාතික යෝ හෙවත් චුතව උපදනා සත්ත්වයෝ නැත්තාහුය. යම් කෙනෙක් මේලොවද, පරලොවද, තෙමේ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශකෙරෙත්ද, එබඳුවූ ආර්‍ය්‍යමාර්ගයට පැමිණියාවූ මනාකොට පිළිපන්නාවූ මහණබමුණෝ ලෙව්හි නැත්තාහුය. සතරමහාභූතයන්ගෙන් හටගත්තාවූ මේ පුරුෂතෙම යම්කලෙක්හි කලුරිය කෙරේද, එකල්හි ආධ්‍යාත්මිකවූ පෘථිවිතොමෝ බාහිරවූ පෘථිවිධාතුවට පැමිණේයි. ඇතුලත්වෙයි. ආධ්‍යාත්මිකවූ ආපො ධාතුව බාහිරවූ ආපොධාතුවට පැමිණේයි. ඇතුළත්වෙයි. ආධ්‍යා ත්මිකවූ තෙජොධාතුව බාහිරතෙජොධාතුවට පැමිණේයි. ඇතු ළත්වෙයි. ආධ්‍යාත්මිකවූ වායොධාතුව බාහිරවූ වායොධාතුවට පැමිණේයි. ඇතුළත්වෙයි. ෂඩින්ද්‍රියයෝ අහසෙහි හැසිරෙත්. හොත් තාවූ ඇඳපස්වෙනිකොට ඇත්තෝ නොහොත් ඇඳේපාසතර ගෙණ සිටිපුරුෂයෝ සතරදෙනද, සොහොනදක්වා මළසිරුර ගෙණයෙත්.

පඤ්ඤත්තිපඤ්ඤපෙන්ති, කාපොතකානි අට්ඨීනි භවන්ති, භස්සන්තා ආහුතියො දත්තුපඤ්ඤත්තං යදිදං දානං, තෙසං තුච්ඡං මුසාවිලාපො යෙකෙචි අත්ථිකවාදං වදන්ති. බාලෙ ච පණ්ඩිතෙ ච කායස්සභෙදා උච්ඡිජ්ජන්ති. විනස්සන්ති. න හොන්ති පරම්මරණාති.

24. ඉත්ථං ඛො මෙ භන්තෙ අජිතො කෙසකම්බලී සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුට්ඨො සමානො උච්ඡෙදං ව්‍යාකාසි. සෙය්‍යථාපි භන්තෙ අම්බං වා පුට්ඨො ලබුජං ව්‍යාකරෙය්‍ය ලබුජං වා පුට්ඨො අම්බං ව්‍යාකරෙය්‍ය, එවමෙව ඛො භන්තෙ අජිතො කෙසකම්බලී සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුට්ඨො සමානො උච්ඡෙදං ව්‍යාකාසි. තස්ස මය්හං භන්තෙ එතදහොසි කථංහි නාම මාදිසො සමණං වා බ්‍රාහ්මණං වා විජිතෙ වසන්තං අපසාදෙතබ්බං මඤ්ඤෙය්‍යාති.

ගුණාගුණ පදයෝ පණවත්. පරෙවිපියාපත්වණි ඇට ඇතිවෙත්. හෝමවශයෙන් දෙනලද සියලුදානයෝ අලු කෙලවරකොට ඇත් තාහුය. ඉන්මතු ඵලදායකනොවේ. යම් මේ දීමක්විනම් එය අඹ යත් විසින් පණවනලද්දේය. යම් කිසිකෙනෙක් ඇතැයියන වාදය කියත්ද, ඒ ඔවුන්ගේ හිස්වූ මුළාවෙත් කියත විප්‍රලාපයකි. බාල යෝද, පණ්ඩිතයෝද, ශරීරභෙදයෙන් මරණින්මතු සහ මුලින් සිඳෙත්. වැනසෙත්. භවයෙහි විද්‍යමාන නොවෙත්. (එහි ප්‍රථමවාද යෙහි පූරණකාශ්‍යපතෙමේ කර්මය ප්‍රතිබාහනයකෙරේ. අජිතතෙමේ විපාකය ප්‍රතිබාහනය කෙරේ. මක්ඛලිතෙමේ කර්මය විපාකය යන දෙකම ප්‍රතිබාහනයකෙරේ. මෙසේ මේ සියල්ලෝ අහෙතුකවාද යද, අක්‍රියාවාදයද, නාස්තිකවාදයද පණවත්.)

24. ස්වාමීන්වහන්ස, මෙසේ. කෙශකම්බලවස්ත්‍ර දරන්නාවූ අජිත තෙමේ මා විසින් සාන්දෘෂ්ටිකශ්‍රාමණ්‍යඵලය විචාරණලද්දේම. උච්ඡෙදවාදය ප්‍රකාශකෙළේය. ස්වාමීන්වහන්ස, යම්සේ අඹරුක කෙබඳුදැයි විචාරණලද්දේම දෙල්රුක මෙබඳුයයි ප්‍රකාශකෙරේද, දෙල් රුක කෙබඳුදැයි විචාරණලද්දේම. අඹරුක මෙබඳුයයි ප්‍රකාශකෙරේද ස්වාමීන්වහන්ස, එපරිද්දෙන්ම මේ අත්බැව්හි දක්කයුතුගුණඇති ආයුෂ්මාගිජ්ලය විචාරණලද්දවූ කෙශකම්බලී අජිතතෙමේ උච්ඡෙදවා දය ප්‍රකාශකෙළේය. ස්වාමීන්වහන්ස, මාවැනිරජෙක් කෙසේනම් සියරටෙහි වසන්නාවූ මහණෙකු හෝ බමුණෙකු ගැටියයුතුකොට හෙවත් රටින්බැහැරකිරීමෙන් වෙහෙසකටයුතු කොට කෙසේනම් සිතන්නේද යන මේ අදහස මට ඇතිවිය.

සො බො අහං භන්තෙ අජිතස්ස කෙසකම්බලිස්ස භාසිතං නෙව අභිනන්දිං නප්පටික්කොසිං අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා අනත්තමනො අනත්තමනවාචං අනිච්ඡාරෙත්වා තමෙව වාචං අනුග්ගණ්හන්තො අනික්කුජ්ජන්තො උට්ඨායාසනා පක්කාමිං.

25. එකමිදාහං භන්තෙ සමයං යෙන පකුධො කච්චායනො තෙනුපසඞ්කමිං, උපසඞ්කමිත්වා පකුධෙන කච්චායනෙන සද්ධිං සම්මොදිං. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිං. එකමන්තං නිසින්නො බො අහං භන්තෙ පකුධං කච්චායනං එතදවොචං යථා නු ඛො ඉමානි භො කච්චායන පුථුසිප්පායතනානි සෙය්‍යථිදං හත්ථාරොහා ...පෙ... සක්කා නු ඛො භො කච්චායන එවමෙව දිට්ඨෙව ධම්මෙ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පඤ්ඤපෙතුන්ති.

26. එවං වුත්තෙ භන්තෙ පකුධො කච්චායනො මං එතදවොච. සත්තිමෙ මහාරාජ, කායා අකටා අකටවිධා.

ස්වාමීන්වහන්ස, ඒ මමවූකලි කෙසකම්බලීඅජිතයාගේ කථාවට අභිනන්දනය නොකළෙම්මය. ආක්‍රොශද නොකළෙමි. අභිනන්දනය නොකොට ආක්‍රොශද නොකොට. නොසතුටුසිත්ඇත්තේ නොසතුටු වදන් නොකියා ඒ කථාවට අනුග්‍රහකරමින් සාරවශයෙන් ලයෙහි නොපිහිටුවමින් හුනස්නෙන් නැගිට ගියෙමි.

25. ස්වාමීන්වහන්ස, මම එක්කාලයෙක්හි කච්චායනගොත්‍ර ඇත්තාවූ පකුධතෙමේ යම් තැනෙක්හිද එතනට එළඹියෙමි. එළඹ පකුධකච්චායනයා සමග සතුටුවූයෙමි. සතුටුවියයුතුවූ සිහිකටයුතුවූ කථාව කොට නිමවා එකත්පසෙක උන්නෙමි. ස්වාමීන්වහන්ස, එකත්පසෙක්උන්තාවූ මම පකුධකච්චායනායාට මෙය දැන්වූයෙමි. පින්වත කාත්‍යායනය, යම්සේ බොහෝ ශිල්පයෝවෙද්ද, ඒ නම හස්ත්‍යාචාර්‍ය්‍යාදිහුය. සෙස්ස යටකීනයින්දතයුතු. පින්වත කාත්‍යායනය එපරිද්දෙන්ම මේ අත්බැව්හිම දක්කයුතු ඵලඇති. මාගී ඵලය පණවන්ට කිමෙක හැක්කේද‘යි කියායි.

26. ස්වාමීන්වහන්ස,මෙසේ දැන්වූකල්හි පකුධකාත්‍යායන තෙමේ මට මෙය කීයේය. මහරජ කිසිහෙතුවකින් නොකරණලද්දවූද, නොකරණලද විධානඇත්තාවූ නොහොත් මෙසේකරවයි කිසිවෙකුලවා නොකරණලද්දවූද,

අනිම්මිතා අනිම්මාපිතා වඤ්ඣා කූටට්ඨා එසිකට්ඨායිට්ඨිතා. තෙ න ඉඤ්ජන්ති න විපරිණාමෙන්ති න අඤ්ඤමඤ්ඤං ව්‍යාබාධෙන්ති නාලං අඤ්ඤමඤ්ඤස්ස සුඛාය වා දුක්ඛාය වා සුඛදුක්ඛාය වා. කතමෙ සත්ත පඨවිකායො ආපොකායො තෙජොකායො වායොකායො සුඛෙ දුක්ඛෙ ජීවෙ සත්තමෙ. ඉමෙ සත්තකායා අකටා අකටවිධා අනිම්මිතා අනිම්මාතා වඤ්ඣා කූටට්ඨා එසිකට්ඨායිට්ඨිතා. තෙ න ඉඤ්ජන්ති න විපරිණාමෙන්ති න අඤ්ඤමඤ්ඤං ව්‍යාබාධෙන්ති නාලං අඤ්ඤමඤ්ඤස්ස සුඛාය වා දුක්ඛාය වා සුඛදුක්ඛාය වා තත්ථ නත්ථි හන්තා වා ඝාතෙතා වා සොතා වා සාවෙතා වා විඤ්ඤාතා වා විඤ්ඤාපෙතා වා යොපි තිණ්හෙන සත්ථෙන සීසං ඡින්දති න කොචි කඤ්චි ජීවිතා වොරොපෙති සත්තන්නංයෙව කායානමන්තරෙන සත්ථං විවරමනුපතතීති.

සෘද්ධිසම්පන්න කිසිවෙකුගේ සෘද්ධියෙන් නොමවණ ලද්දාවූ කිසිවෙකුලවා නොමවණලද්දාවූද, වඳවූ හෙවත් කිසිවෙකු නූපදවන්නාවූද (මෙයින් පෘථිවිකායාදීන් සම්බන්ධව රූපාදිය උපදවනබව වළක්වයි) පර්වතකූටකයක්මෙන් නිශ්චලව සිටින්නාවූද, එසිකාස්තම්භයක් මෙන් නොසෙල්වී සිටින්නාවූද, ඒ සත්වයෝ කම්පානොවෙත්. විපර්‍යාසයට නොපැමිණෙන්නාවූද, ඔවුනොවුන් පීඩානොකරන්නාවූද, ඔවුනොවුන්ගේ සැපයපිණිස හෝ දුක් පිණිස හෝ සුවදුක් පිණිස හෝ සමර්ථනොවන්නාවූද, මේ සමූහ සතක් වෙත්. ඒසතකවරහුදයත්. පෘථිවි ධාතුය නොහොත් පෘථිවි සමූහය ආපොධාතුය, තෙජොධාතුය, වායොධාතුය, සැපය දුකය සත්වෙනිකොටඇති ජීවයයනමොහුයි. ඔව්හු කිසිහෙතුවකින් නොකරණලද්දෝ වෙත්. නොකරණලද විධානඇත්තෝ නොහොත් මෙසේ කරවයි කිසිවෙකු ලවා නොකරවනලද්දෝ වෙත්. සෘද්ධිසම්පන්නයෙකුගේ සෘද්ධියකින් නොමවණලද්දෝම වෙත්. කිසිවෙකුලවා නොමවන ලද්දෝමවෙත්. වඳයි හෙවත් කිසිවෙකු නූපදවන්නෝ වෙත්. පර්වතකූටයක්මෙන් ස්ථිරවසිටින්නෝ වෙත්. එසිකාස්තම්භයක් මෙන් නොසෙල්වී සිටින්නෝ වෙත්. කම්පානොවන්නෝ වෙත්. විපර්‍යාසයට නොපැමිණෙන්නෝ වෙත්. ඔවුනොවුන්ට පීඩා නොකරන්නෝ වෙත්. ඔවුනොවුන්ගේ සැපයපිණිස හෝ දුකපිණිස හෝ සුවදුක්පිණිස හෝ සමර්ථ නොවන්නෝ වෙත්. ජීවයසත්වැනිකොට ඇති ඒ කායයන්හි හිංසාකරන්නෙක් හෝ හිංසාකරවන්නෙක් හෝ අස්වන්නෙක් හෝ දන්නෙක් හෝ දන්වන්නෙක් හෝ නැත්තේය. යමෙක් තියුණුවූ ආයුධයකින් හිසකපාද, කිසිවෙක් කිසිවක් ජීවිතයෙන් තොරනොකෙරේ. පෘථිවිආදී සත්වැදෑරුම් කායයන්ගේ අතරින් හෙවත් සිදුරෙන් ශස්ත්‍රය ප්‍රවිෂ්ටවේ.

27. ඉත්ථංඛො මෙ භන්තෙ පකුධො කච්චායනො සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුට්ඨො සමානො අඤ්ඤෙන අඤ්ඤං ව්‍යාකාසි. සෙය්‍යථාපි භන්තෙ අම්බං වා පුට්ඨො ලබුජං ව්‍යාකරෙය්‍ය ලබුජං වා පුට්ඨො අම්බං ව්‍යාකරෙය්‍ය. එවමෙව ඛො මෙ භන්තෙ පකුධො කච්චායනො සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුට්ඨො සමානො අඤ්ඤෙන අඤ්ඤං ව්‍යාකාසි. තස්ස මය්හං භන්තෙ එතදහොසි කථං හි නාම මාදිසො සමණං වා බ්‍රාහ්මණං වා විජිතෙ වසන්තං අපසාදෙතබ්බං මඤ්ඤෙය්‍යාති. සො ඛො අහං භන්තෙ පකුධස්ස කච්චායනස්ස භාසිතං නෙව අභිනන්දිං න පටික්කොසිං අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා අනත්තමනො අනත්තමනවාචං අනිච්ඡාරෙත්වා තමෙව වාචං අනුග්ගණ්හන්තො අනික්කුජ්ජන්තො උට්ඨායාසනා පක්කාමිං.

28. එකම්දාහං භන්තෙ සමයං යෙන නිගණ්ඨො නාථපුත්තො තෙනුපසඞ්කමිං. උපසඞ්කමිත්වා නිගණ්ඨෙන නාථපුත්තෙන සද්ධිං සම්මොදිං.

---

27. ස්වාමීන්වහන්ස, මෙසේ වනාහි මාවිසින් මේ අත්බැව්හි දක්කයුතුවූ ශ්‍රාමාණ්‍යඵලය විචාරණලද්දාවූ පකුධකාත්‍යායනතෙමේ අනිකකින් අනිකක්ප්‍රකාශකෙළේය. ස්වාමීන්වහන්ස, යම්සේ අඹරුක කෙබඳුදැයි විචාරණලද්දේම දෙල්රුක මෙබඳුයයි ප්‍රකාශකරන්නේද, දෙල්රුක කෙබඳුදැයි විචාරණලද්දේම අඹරුක මෙබඳුයයි ප්‍රකාශකරන්නේද, ස්වාමීන්වහන්ස, එපරිද්දෙන්ම මාවිසින් සාංදෘෂ්ටිකවූ ශ්‍රාමාණ්‍යඵලය විචාරණලද්දාවූ කාත්‍යායනතෙමේ අනිකකින් අනිකක් ප්‍රකාශකෙළේය. ස්වාමීන්වහන්ස, මාවැනි රජෙක් සියරටෙහි වසන්නාවූ මහණෙකු හෝ බමුණෙකු ගැටිය යුතුකොට හෙවත් රටින් නෙරපීම්වශයෙන් වෙහෙස කටයුතු කොට කෙසේනම්සිතන්නේදැයිඒමටමේඅදහස විය. ස්වාමීන්වහන්ස, ඒ මම පකුධකාත්‍යායනයාගේ භාෂිතය සතුටින් පිළිනොගතිමි. ආක්‍රොශද නොකෙළෙමි. අභිනන්දනය නොකොට ප්‍රතික්‍රොශත් නොකොට නොසතුටු සිත්ඇත්තේ නොසතුටුවදන් නොකියා ඒ කථාව නොගණිමින් එයම සාරවශයෙන් සිතෙහි නොපිහිටුවමින් හුනස්නැගිට ගියෙමි.

28 ස්වාමීන්වහන්ස, මම එක්කාලයෙක්හි නිගණ්ඨනාථපුත්‍ර තෙමේ යම්තැනෙක්හිද, එතනට එළඹියෙමි. එළඹ නිගණ්ඨනාථපුත්‍රයා සමග සතුටුවූයෙමි.

සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිං එකමන්තං නිසින්නො ඛො අහං භන්තෙ නිගණ්ඨං නාථපුත්තං එතදවොචං යථානුඛො ඉමානි භො අග්ගිවෙස්සන පුථුසිප්පායතනානි සෙය්‍යථිදං හත්ථාරොහා ....පෙ.... සක්කානු ඛො භො අග්ගිවෙස්සන එවමෙව දිට්ඨෙව ධම්මෙ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පඤ්ඤපෙතුන්ති.

29. එවං වුත්තෙ භන්තෙ නිගණ්ඨො නාථපුත්තො මං එතදවොච. ඉධ මහාරාජ නිගණ්ඨො චාතුයාම් සංවරසංවුතො හොති, කථඤ්ච මහාරාජ නිගණ්ඨො චාතුයාම සංවරසංවුතො හොති, ඉධ මහාරාජ නිගණ්ඨො සබ්බවාරි වාරිතොච හොති, සබ්බවාරි යුතොනාච, සබ්බවාරිධුතොච, සබ්බවාරිපුට්ඨොච, එවං ඛො මහාරාජ නිගණ්ඨො චාතුයාමසංවරසංවුතො හොති. යතො ඛො මහාරාජ නිගණ්ඨො එවං චාතුයාමසංවරසංවුතො හොති. අයං වුච්චති මහාරාජ නිගණ්ඨො ගතත්තොච යතත්තොච ඨිතත්තොචාති.

සතුටුවියයුතුවූ සිහිකටයුතුවූ කථාවකොටනිමවා එකත්පසෙක උන්නෙමි. ස්වාමීන්වහන්ස, සම්පවූඑක්පෙදෙසෙක්හි උන්නාවූ මම නිගණ්ඨනාථපුත්‍රයාට මේකාරණය දැන්වූයෙමි. පින්වත අග්නිපූජකය යම්සේ මේ බොහෝවූ ශිල්පයෝවෙද්ද, ඒනම් හස්ත්‍යාචාර්‍ය්‍යාදිහුය. සෙස්සකීනයින්දතයුතු පින්වත අග්නිවෙස්සනය එපරිද්දෙන්ම දෘෂ්ටධර්මයෙහිම තමතමන්කෙරෙහි දැක්ක යුතුවූ මාර්ගඵලය පණවන්ට කිමෙක හැක්කෙහිදැයි කියායි.

29. ස්වාමීන්වහන්ස, මෙසේ විචාළකල්හි නිගණ්ඨනාථපුත්‍ර තෙමේ මට මෙය කීයේය. මහරජ මේ ලොකයෙහි නිගණ්ඨතෙමේ සිව්කොටසක්වූ සංවරයෙන් වසනලද්දේ වේ. මහරජ කෙසේනම් නිගණ්ඨතෙමේ චාතුයාමසංවරයෙන් වසනලද්දේ වේද, මහරජ මේ ලොකයෙහි නිගණ්ඨතෙමේ සීතොදකයෙහි සත්වසංඥාඇති බැවින් සියලු සීතජලය වළක්වනලද්දේ වේ. සර්වප්‍රකාරසංවරලක්ෂණයෙන් පව් වැළැක්විමෙන් යුක්තවේ. සියලු පව්වැළැක්මෙන් නසනලද පව් ඇත්තේය. සියලු පාපපවාරණයෙන් පහස්නා ලද්දේය. මහරජ මෙසේ නිගණ්ඨතෙමේ චාතුයාමසංවරයෙන් වසනලද්දේ වේ මහරජ යම්හෙයකින් නිගණ්ඨතෙමේ මෙසේ චාතුයාමසංවරයෙන් වසනලද්දේ වේද, මහරජ මේ නිගණ්ඨතෙමේ කෙළපැමිණිසින් ඇත්තේද සංයම කරණලද සිත්ඇත්තේද මොනවට නිශ්ඨාකරණලද සිත්ඇත්තේද වෙයි.

30. ඉත්ථං ඛො මෙ භන්තෙ නිගණ්ඨො නාථපුත්තො සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුට්ඨො සමානො චාතුයාමසංවරං ව්‍යාකාසි. සෙය්‍යථාපි භන්තෙ අම්බං වා පුට්ඨො ලබුජං ව්‍යාකරෙය්‍ය ලබුජං වා පුට්ඨො අම්බං ව්‍යාකරෙය්‍ය, එවමෙව ඛො භන්තෙ නිගණ්ඨො නාථපුත්තො සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුට්ඨො සමානො චාතුයාමසංවරං ව්‍යාකාසි. තස්ස මය්හං භන්තෙ එතදහොසි. කථංහි නාම මාදිසො සමණං වා බ්‍රාහ්මණං වා විජිතෙ වසන්තං අපසාදෙතබ්බං මඤ්ඤෙය්‍යාති. සො ඛො අහං භන්තෙ නිගණ්ඨස්ස නාථපුත්තස්ස භාසිතං නෙව අභිනන්දිං, න පටික්කොසිං අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා අනත්තමනො අනත්තමනවාචං අනිච්ඡාරෙත්වා තමෙව වාචං අනුග්ගණ්හන්තො අනික්කුජ්ජන්තො උට්ඨායාසනා පක්කාමිං.

31. එකමිදහං භන්තෙ සමයං යෙන සඤ්ජයො බෙලට්ඨිපුත්තො තෙනුපසඞ්කමිං, උපසඞ්කමිත්වා සඤ්ජයෙන බෙලට්ඨිපුත්තෙන සද්ධිං සම්මොදිං. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිං.

---

30. ස්වාමීන්වහන්ස, මෙසේම මාවිසින් සාන්දෘෂ්ටිකවූ මාගීඵලය විචාරණලද්දාවූ නිගණ්ඨනාථපුත්‍රතෙමේ චාතුයාමසංවරය ප්‍රකාශ කෙළේය. ස්වාමීන්වහන්ස, යම්සේ නම් අඹරුක කෙබඳුදැයි විචාරණලද්දේම දෙල්රුක මෙබඳුයයි ප්‍රකාශකෙරේද, දෙල්රුක කෙබඳු දැයි විචාරණලද්දේම. අඹරුක මෙබඳුයයි ප්‍රකාශකරන්නේද, ස්වාමීන්වහන්ස, එපරිද්දෙන්ම මේ අත්බැව්හි දැක්කයුතුගුණඇති මාගීඵලය විචාරණලද්දාවූ නිගණ්ඨනාථපුත්‍රතෙමේ චාතුයාමසංවරය ප්‍රකාශකෙළේය. ස්වාමීන්වහන්ස, මාවැනිරජෙක් කෙසේනම් සියරටෙහි වසන්නාවූ මහණෙකු හෝ බමුණෙකු ගැටියයුතුකොට හෙවත් රටින්බැහැර කිරීමෙන් වෙහෙසකටයුතුකොට කෙසේනම් සිතන්නේද, යනමේ අදහස මට ඇතිවිය. ස්වාමීන්වහන්ස, ඒ මම වූකලි නිගණ්ඨනාථපුත්‍රයාගේ කථාවට අභිනන්දනය නොකෙළෙම්මය. ආක්‍රෝශද නොකෙළෙම්. අභිනන්දනය නොකොට. ආක්‍රෝශද නොකොට නොසතුටුසිත් ඇත්තේ නොසතුටුවදන් නොකියා. ඒ කථාව නොගණිමින් එයම සාරවශයෙන් සිතෙහි නොපිහිටුවමින් හුනස්නෙන් නැගිට ගියෙමි.

31 ස්වාමීන්වහන්ස, මම එක්කාලයෙක්හි බෙලට්ඨිපුත්‍රනම්වූ සඤ්ජයතෙමේ යම් තැනෙක්හිද, එතනට එළඹියෙමි. එළඹ සඤ්ජයනම්ලද බෙලට්ඨිපුත්‍රයා සමග සතුටුවූයෙමි. සතුටු වියයුතුවූ සිහිකටයුතුවූ කථාවකොටනිමවා එකත්පසෙක උන්නෙමි.

එකමන්තං නිසින්නො ඛො අහංභන්තෙ සඤ්ජයං බෙලට්ඨි පුත්තං එතදවොච. යථානුඛො ඉමානි භො සඤ්ජය පුථුසිප්පායතනානි සෙය්‍යථිදං හත්ථාරොහා—පෙ—සක්කානුඛො භොසඤ්ජය එවමෙව දිට්ඨෙව ධම්මෙ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පඤ්ඤපෙතුන්ති.

32. එවං වුත්තෙ භන්තෙ සඤ්ජයො බෙලට්ඨිපුත්තො මං එතදවොච. අත්ථි පරෙ ලොකොති. ඉතිචෙතං පුච්ඡසි, අත්ථිපරො ලොකොති. ඉතිචෙ මෙ අස්ස, අත්ථිපරො ලොකොති. ඉති තෙ නං ව්‍යාකයෙය්‍යං. එවම්පි මෙ නො. තථාතිපි මෙ නො. අඤ්ඤථා තිපි මෙ නො. නො තිපි මෙ නො. නො නො තිපි මෙ නො. අත්ථි පරෙ ලොකොති නත්ථිපරෙලොකො. අත්ථිච නත්ථිච පරෙලොකො. නෙවත්ථි න නත්ථි පරෙලොකො. අත්ථි සත්තා ඔපපාතිකා. නත්ථි සත්තා ඔපපාතිකා. අත්ථිච නත්ථිච සත්තා ඔපපාතිකා. නෙවත්ථි න නත්ථි සත්තා ඔපපාතිකා. අත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො.

ස්වාමින්වහන්ස, සම්පවූ එක්පෙදෙසෙක්හි උන්නාවූ මම සඤ්ජය බෙලට්ඨිපුත්‍රයාහට මෙ කාරණය දැන්වූයෙමි. පින්වත සඤ්ජය, යම්සේ මේ බොහෝවූ ශිල්පීහු වෙද්ද, ඒනම් හස්ත්‍යාචාය්‍යාදිහුය. සෙස්ස කීනසින් දතයුතු. පින්වත සඤ්ජය, එපරිද්දෙන්ම දෘෂ්ටධර්‍මයෙහිම තමන්කෙරෙහි දක්කයුතුවූ මාගීඵලය පණවන්ට කිමෙක හැක්කෙහිද්දයි කියාසි.

32 ස්වාමින්වහන්ස, මෙසේ විචාළකල්හි බෙලට්ඨිපුත්‍රනම්වූද සඤ්ජයතෙමේ මට මෙය දැන්වූයේය.පරලොව ඇත්තේදැයි විචාළකල්හිපරලොව ඇතැයි මෙසේත්මට අදහස්වන්නේනම් පරලොව ඇත්තේයයි මෙසේ තට එය ප්‍රකාශ කරන්නෙමි.මට එසේත්නොවෙයි.මට එපරිද්දෙනුත් නොවෙයි මට අන්පරිද්දෙකිනුත් නොවෙයි. මට නැත්තේත් නොවෙයි.මට නැත්තේ නොවන්නේත් නොවෙයි කියාද,සෙස්ස කීනසින්දතයුතු. පරලොවක් නැතැයි කියාද, පරලොවක් ඇතැයි නැතැයිකියාද,පරලොවක් නැතැයි කියාද,නැත්තේ නොවෙයි කියාද, ඔපපාතිකසත්වයෝ ඇතැයි කියාද, ඔපපාතික සත්වයෝ නැතැයි කියාද, ඔපපාතිකසත්වයෝ ඇතැයි කියාද, නැතැයිකියාද, ඔපපාතිකසත්වයෝ නැතැයි කියාද, නැත්තේ නොවෙයි කියාද, කුශලාකුශලකර්‍මයන්ගේ ඵලහා අනුසස් ඇතැයි කියාද.

නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො. අත්ථිච නත්ථිච සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො. නෙවත්ථි න නත්ථි සුකට දුක්කටානං කම්මානං ඵලං විපාකො. හොති තථාගතො පරම්මරණා න හොති තථාගතො පරම්මරණා හොතිච න හොතිච තථාගතො පරම්මරණා නෙවහොති. න නහොති තථාගතො පරම්මරණාති. ඉතිචෙ මං පුච්ඡසි නෙව හොති න නහොති. තථාගතො පරම්මරණාති. ඉතිචෙ මෙ අස්ස නෙව හොති. න නහොති. තථාගතො පරම්මරණාති ඉති තෙ නං ව්‍යාකරෙය්‍යං. එවම්පි මෙ නො. තථාතිපි මෙ නො අඤ්ඤථාතිපි මෙ නො. නොතිපි මෙ නො. නො නො තිපි මෙනොති.

33. ඉත්ථං ඛො මෙ භන්තෙ සඤ්ජයො බෙලට්ඨිපුත්තො සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුට්ඨො සමානො.

කුශලාකුශලකර්මයන්ගේ ඵලහා අනුසස්නැතැයි කියාද,කුශලාකුශල කර්මයන්ගේ ඵල හා අනුසස්ඇතැයි කියාද,කුශලාකුශලකර්මයන්ගේ ඵල හා අනුසස් නැතැයි කියාද,කුශලාකුශල කර්මයන්ගේ ඵලානිසංස ඇතැයි කියාද, නැතැයි කියාද,කුශලාකුශලකර්මයන්ගේ ඵල හා අනුසස් නැතැයි කියාද, නැත්තේනොවෙයි කියාද, සත්‍වතෙමේ මරණින් මතු වන්නේයයි කියාද, සත්වතෙමේ මරණින්මතු නොවන්නේයයි කියාද, සත්වතෙමේ මරණින්මතු වන්නේයයි කියාද, නොවන්නේ යයි කියාද, සත්වතෙමේ මරණින්මතු නොවෙයි කියාද, මෙසේ මා විචාළෙහිනම් සත්වතෙමේ මරණින්මතු නොවන්නේය කියාද, නොවන්නේත් නොවෙයි කියාද, ඉදින් මෙසේ මට අදහස්විනම් සත්වතෙමේ මරණින්මතු නොවන්නේය කියාද, නොවන්නේත් නොවෙයි කියාද, මෙසේ තට එය ප්‍රකාශකරමි. එහෙයින් මට එසේත් නොවෙයි. එපරිද්දෙකිනැයි කියාත් මට නොවෙයි. අන් පරිද්දෙකිනැයි කියාත් මට නොවෙයි. නැතකියාත් මට නොවෙයි. නැත්තේ නොවන්නේත් නොවෙයි කියාද මට නොවෙයි කියයි.

33. ස්වාමින්වහන්ස, මෙසේ මාවිසින් සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍යඵලය විචාරණලද්දවූම බෙලට්ඨිපුත්‍රනම්වූ සඤ්ජයතෙමේ.

විකෙඛපං ව්‍යාකාසි. සෙය්‍යථාපි භන්තෙ අම්බංවා පුඪො ලබුජං ව්‍යාකරෙය්‍ය,ලබුජංවා පුඪො අම්බං ව්‍යාකරෙය්‍ය,එවමෙව ඛො භන්තෙ සඤ්ජයො බෙලඪිපුත්තො සන්දිඨිකං සාමඤ්ඤඵලං පුඪො සමානො විකෙඛපං ව්‍යාකාසි.තස්ස මය්හං භන්තෙ එතදහොසි අයඤ්ච ඉමෙසං සමණබ්‍රාහ්මණානං සබ්බබාලො සබ්බමූල්හො. කථංහි නාම සන්දිඨිකං සාමඤ්ඤඵලං පුඪො සමානො විකෙඛපං ව්‍යාකරිස්සතීති, තස්ස මය්හං භන්තෙ එතදහොසි කථංහි නාම මාදිසො සමණං වා බ්‍රාහ්මණං වා විජිතෙ වසන්තං අපසාදෙතබ්බං මඤ්ඤෙය්‍යාති. සොඛො අහං භන්තෙ සඤ්ජයස්ස බෙලඪිපුත්තස්ස භාසිතං නෙව අභිනන්දිං න පටික්කොසිං අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා අනත්තමනො අනත්තමනවාචං අනිච්ඡාරෙත්වා තමෙවවාචං අනුග්ගන්හන්තො අනික්කුජ්ජන්තො උඨායාසනා පක්කාමිං

34. සොහංභන්තෙ භගවන්තම්පි පුච්ඡාමි යථානුඛො ඉමානි භන්තෙ පුථුසිප්පායතනානි සෙය්‍යථීදං.

(වාග්වික්ෂෙපය) වචනදමාගැසීම ප්‍රකාශකෙළේය. ස්වාමීන්වහන්ස, යම්සේ අඹරුක කෙබඳුදැයි විචාරණලද්දේම දෙල්රුක මෙබඳුයයි ප්‍රකාශ කරන්නේද,දෙල්රුක කෙබඳුදැයි විචාරණලද්දේම අඹරුක මෙබඳුයයි ප්‍රකාශකරන්නේද, ස්වාමීන්වහන්ස, එපරිද්දෙන්ම බෙලඪිපුත්‍රනම්ලද සඤ්ජයතෙමේ තමන්කෙරෙහි දැක්කයුතුවූ මාගීඵලය විචාරණලද්දේම වික්ෂෙපය ප්‍රකාශකෙළේය. ස්වාමීන්වහන්ස, ඒ මට මේ අදහසවිය. මේ සඤ්ජයතෙමේද මේ මහණබමුණන් අතුරෙන් සියල්ලන්ට වඩා අඥනය. සියල්ලටවඩා මූඪය. කෙසේනම් සාන්‍දෘෂ්ටික ශ්‍රාමාණ්‍යඵලය විචාරණලද්දේම වික්ෂෙපය ප්‍රකාශකරන්නේදැයි කියායි. ස්වාමීන්වහන්ස, මාවැනි රජෙක් කෙසේනම් සියරටෙහි වසන්නාවූ මහණෙකු හෝ බමුණෙකු ගැටියයුතුකොට ගහවත් රටින් නෙරපීමෙන් වෙහෙසකටයුතුකොට කෙසේනම් සිතන්නේදැයි මට මේ අදහසවීය. ස්වාමීන්වහන්ස, ඒ මම බෙලඪිපුත්‍රනම්ලද සඤ්ජයයාගේ කථාවට සතුටුනොවූයෙමි. ආක්‍රොශද නොකෙළෙමි. අභිනන්‍දනය නොකොට ප්‍රතික්‍රොශත් නොකොට නොසතුටුසිත් ඇත්තේ නොසතුටු වදන් නොකියා ඒ වචනය නොගණිමින් සාරවශයෙන් සිතෙහි නොපිහිටුවමින් හුනස්නෙන් නැගිට ගියෙමි.

34. ස්වාමීන්වහන්ස, ඒ මම භාග්‍යවතුන්වහන්සේද විචාරමි. ස්වාමීන්වහන්ස, යමසේ මේ බොහෝවූ ශිල්පීහු වෙද්ද, ඔව්හු කවරහුදයත්.

හත්ථාරොහා අස්සාරොහා රථිකා ධනුග්ගාහා චෙලකා චලකා පිණ්ඩදායිකා උග්ගාරාජපුත්තා පක්ඛන්දිනො මහානාගා සූරා චම්මයොධිනො දාසකපුත්තා ආළාරිකා කප්පකා නහාපකා සූදා මාලාකාරා රජකා පෙසකාරා නළකාරා කුම්භකාරා ගණකා මුද්දිකා යානිවා පනඤ්ඤානිපි එවංගතිකානි පුථුසිප්පායතනානි, තෙ දිට්ඨෙවධම්මෙ සන්දිට්ඨිකං සිප්පඵලං උපජීවන්ති තෙ තෙන අත්තානං සුඛෙන්ති පීණෙන්ති මාතාපිතරො සුඛෙන්ති පීණෙන්ති පුත්තදාරං සුඛෙන්ති පීණෙන්ති මිත්තාමච්චෙ සුඛෙන්ති පීණෙන්ති සමණබ්‍රාහ්මණෙසු උද්ධග්ගිකං දක්ඛිණං පතිට්ඨාපෙන්ති සොවග්ගිකං සුඛවිපාකං සග්ගසංවත්තනිකං.

සියලු හස්ත්‍යාචාර්‍ය්‍යාදීහුය, සියලු අශ්වාචාර්‍ය්‍යාදීහුය, රියනැගී යුද්කරණ සියලු රථාචාර්‍ය්‍යයෝය, දුනුගෙණ යුද්කරණධනුරාචාර්‍ය්‍යයෝය, යුධයෙහි ජය ධවජගෙණ පෙරටුව යන්නෝය, රජාදීන්ට ස්ථාන නියාමවශයෙන් සෙනාවිධානකරන්නෝය, මස්බිලි මෙන් පරසෙන් සිඳහරින සාහසික මහා යොධයෝය, නොහොත් යුධ මධ්‍යයට පැමිණි යොධයන්ට බත්වඩන්නෝය, ජවපරාක්‍රමාදියෙන් උඩටනැගී සඞ්ග්‍රාමයට බැසගත් රාජපුත්‍රයෝය ,යුද්මැදට පැණ සතුරන්ගේ හිස් ආදිය ගෙණ එන්නෝය, හස්ත්‍යාදීන් අභිමුඛවඑන කල්හි නොනවත්නා මහඇතුන්වැනි යොධයෝය, හුදකලාව යුධ කරන්නෝය, සම්පසුම්බියක්ගෙණ හෝ පලිහයක්ගෙණ යුධකරන්නෝය, බලවත් සෙනගඇති ගෘහදාස යෝධයෝය, මහානස බත් කරන්නෝය, මනුෂ්‍යයන්ගේ අලඞ්කාරවිධිය කරන්නාවූ කපුවෝය, විලවුන් ආදිය ගැල්වීමෙන් නහවන්නෝය, අරක්කැමියෝය, මාලාකාරයෝය, රදවිය, පිළිවියන්නෝය, කුඹපොන්නෝය, කුඹල්ලුය, ගණකයෝය, හස්තමුද්‍රාගණනිසා ජීවත්වන්නෝය යන් මොහුයි. මෙයින් අන්‍යවූද මෙසේ පැවැත්තාවූ චිත්‍රකාරාදී යම් ඒ බොහෝ ශිල් හුපී වෙද්ද, ඒ හස්ත්‍යාරොහාදීහු මේ අත්බැව්හිම තමාවිසින්ම දක්කයුතුවූ හෝ අනුභවකටයුතුවූ ශිල්පඵලයනිසා ජීවිකාව කෙරෙත්, ඔව්හු ඒ ශිල්පඵලයෙන් තමා සුවපත්කෙරෙත්, පිණවත්, හෙවත් බලසම්පන්නකෙරෙත්, මව්පියන් සුවපත්කෙරෙත්, පිණවත්, හෙවත් බලසම්පන්නකෙරෙත්, අඹුදරුවන් සුවපත්කෙරෙත් පිණවත්, මිත්‍රාමාත්‍යයන් සුවපත්කෙරෙත්, පිණවත්, හෙවත් බලසම්පන්නකෙරෙත්, මහණබමුණන් කෙරෙහි මත්තෙහි ඵල උපදවන්නාවූ ස්වර්‍ගයට සුදුසුවූ සැපවිපාකඇති රූපශබ්දාදි දශධර්ම ලාභය පිණිස පවත්නාවූ, දක්ෂිණාව (දානය) පිහිටුවද්ද,

සක්කානුබො මෙ භන්තෙ එවමෙව දිට්ඨෙවධම්මෙ සන්දිට්ඨිකං සාමඤ්ඤ ඵලං පඤ්ඤපෙතුන්ති. සක්කා මහාරාජ, තෙනහි මහාරාජ තඤ්ඤෙවෙත්ථ පටිපුච්ඡිස්සාමි, යථා තෙ ඛමෙය්‍ය තථා නං ව්‍යාකරෙය්‍යාසි.

35. තඞ්කිම්මඤ්ඤසි මහාරාජ, ඉධ තෙ අස්ස පුරිසො දාසො කම්මකරො පුබ්බුට්ඨායී පච්ඡා නිපාතිකිංකාරපටිස්සාවී මනාපචාරී පියවාදී මුඛුල්ලොකකො. තස්ස එවමස්ස අච්ඡරියං වත භො අබ්භුතං වතභො පුඤ්ඤානංගති පුඤ්ඤානං විපාකො. අයංහි රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො මනුස්සො, අහංපි මනුස්සො. අයංහිරාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො පඤ්චහි කාමගුණෙහි සමප්පිතො සමඞ්ගීභූතො පරිචාරෙති දෙවො මඤ්ඤෙ. අහම්පනම්හිස්ස දාසො කම්මකරො පුබ්බුට්ඨායී පච්ඡානිපාතී කිංකාරපටිස්සාවී මනාපචාරී පියවාදී.

ස්වාමින්වහන්ස, එපරිද්දෙන්ම මේ අත්බැව්හිම දක්කයුතුවූ විපාක ඇති ශ්‍රාමණ්‍යගුණය හෙවත් මාර්ගයහා ඵලය පණවන්ට කිමෙක් හැක්කේදැයි විචාළේය. මහරජ හැක්කේය. මහරජ එහෙනම් තාම මේකරුණෙහි පිළිවිසින්නෙමි, තට යම්පරිද්දෙකින් රුචිවන්නේනම් හෝ අදහස්වන්නේනම් එපරිද්දෙන් එය ප්‍රකාශකරව.

35. මහරජ, මෙහි තට අනලසව කටයුතුකරන්නාවූ දුරදීම දැක නැඟිසිටින සවභාව ඇත්තාවූ, පසුව හිඳින සවභාව ඇත්තාවූ නොහොත් පළමුකොට සයනයෙන් නැඟිසිටින්නාවූ, පසුව සයනය කරන්නාවූ, කුමක්කරම්දැයි පිළිවිසකරණ සවභාව ඇත්තාවූ, ස්වාමිහුගේ සිත්පරිද්දෙන් හැසිරෙන්නාවූ, ප්‍රියකථාඇත්තාවූ තුටුපහටුව හිමියාගේ මුහුණබලමින් හැසිරෙණ සවභාවඇත්තාවූ, වැඩකරු පුරුෂයෙක් වන්නේද, ඔහට මෙබඳු අදහසක් වන්නේද, පින්වත්නි, කුශලයන්ගේ පැවැත්මද, කුශලයන්ගේ සවභාවද, එකාන්තයෙන් අසිරිමත්ය. පින්වත්නි, එකාන්තයෙන් අද්භූතයි. මගධෙශ්වරවූ වෙදෙහිපුත්‍රවූ මේ අජාසත්රජතෙමේද මනුෂ්‍යයෙක. මමද මනුෂ්‍ය යෙක්මි. මගධෙශ්වරවූ වෙදෙහිපුත්‍රවූ මේ අජාසත්රජතෙමේ පස්කම් ගුණයෙන් පිණාගියේ යුක්තවූයේ දෙවියෙක්මෙන් ඉන්ද්‍රියයන් හසුරුවාලයි. මමවූකලි අනලස්ව කටයුතුකරන්නාවූ දුරදීම දැක නැඟීසිටින සවභාවඇත්තාවූ, පසුව හිඳින සවභාවඇත්තාවූ නොහොත් පළමුකොට සයනයෙන් නැඟිසිටින්නාවූ, පසුව සයනයකරන්නාවූ, කුමක්කරම්දැයි පිළිවිස කරණ සවභාව ඇත්තාවූ ස්වාමිහුගේ සිත් පරිද්දෙන් හැසිරෙන්නාවූ, ප්‍රියකථා ඇත්තාවූ,

මුබුල්ලොකකො. සො ච තස්ස හං පුඤ්ඤානි කරෙය්‍යං යන් නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍යන්ති. සො අපරෙන සමයෙන කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය. සො එවං පබ්බජිතො සමානො කායෙන සංවුතො විහරෙය්‍ය, වාචාය සංවුතො විහරෙය්‍ය, මනසා සංවුතො විහරෙය්‍ය ඝාසච්ඡාදනපරමතාය සන්තුට්ඨො අභිරතො පවිවෙකෙ. තඤ්චෙ තෙ පුරිසා එවමාරොචෙය්‍යුං. යග්ඝෙ දෙව ජානෙය්‍යාසි යො තෙ පුරිසො දාසො කම්මකරො පුබ්බුට්ඨායී පච්ඡා නිපාතී කිං කාරපටිස්සාවී මනාපචාරී පියවාදී මුඛුල්ලොකකො, සො දෙව කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිතො. සො එවං පබ්බජිතො සමානො.

තුටුපහටුව හිමියාගේ මුහුණබලමින් හැසිරෙණ සවභාව ඇත්තාවූ, වැඩකරුවෙක් වෙමි. පින්කරන්නෙම්නම් ඒ මමද එකාන්තයෙන් මෙබඳුවන්නෙමි. එකාන්තයෙන් මම කෙස්දැළි රැවුලු හරවා කාසායවස්ත්‍රයන් අන්දවා ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවන්නෙම් නම් ඉතායෙහෙකැයි කියායි. ඒ දාසතෙම මෑතකලකදී කෙස්දැළිරැවුලු හරවා කාසායවස්ත්‍රයන් අන්දවා ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවන්නේද, ඒ දාස තෙමේ මෙසේ පැවිදිවූයේම. කයින් ඇවුරුණේ වාසයකරන්නේද, වචනයෙන් ඇවුරුණේ වාසයකරන්නේද, සිතින් ඇවුරුණේ වාසය කරන්නේද, චතුර්විධප්‍රත්‍යයපරිභොගය හා සිව්රුදූරීම උතුම්කොට ඇති බැවින් ක්ලෙශසං ලිඛනප්‍රතිපදාවෙන් සතුටුවූයේ කායවිවෙකාදි තුන්වැදෑරුම් විවෙකයෙහි ඇලුනේ වාසයකරන්නේද, තෙල පුරුෂ කෙනෙක් තට මෙසේ දන්වන්නාහුද, කෙසේදයත්, පින්වත, දෙව යන්වහන්ස, අනලසව කටයුතුකරන්නාවූ දුරදීමදූක නැගීසිටින සවභාවඇත්තාවූ නොහොත් පළමුකොට සයනයෙන් නැගීසිටින් නාවූ, පසුව සයනයකරන්නාවූ, කුමක්කරම්දැයි පිළිවිස කරණ සවභාවඇත්තාවූ, ඔබගේ අදහස්පරිද්දෙන් හැසිරෙන්නාවූ, ප්‍රිය කථා ඇත්තාවූ, තුටුපහටුව මුහුණබලමින් හැසිරෙන සවභාවඇත් නාවූ, යම් ඒ වැඩකරු පුරුෂයෙක් වීද, දෙවයන්වහන්ස, හෙතෙමේ කෙස්දැළිරැවුලු හරවා කාසායවස්ත්‍රයන් අන්දවා ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවූයේය. හෙතෙමේ මෙසේ පැවිදිවූයේම.

කායෙන සංවුතො විහරති, වාචාය සංවුතො විහරති, මනසා සංවුතො විහරති ඝාසච්ඡාදනපරමතාය සන්තුට්ඨො අභිරතො පවිවෙකෙති, අපිනුන්වං එවං වදෙය්‍යාසි. එතු මෙ භො සො පුරිසො, පුනදෙව හොතු දාසො කම්මකරො පුබ්බුට්ඨායී පච්ඡා නිපාතී කිංකාර පටිස්සාවී මනාපචාරී පියවාදී මුඛුල්ලොකකොති.

36. නොහෙතම් භන්තෙ. අථඛො නං මයමෙව අභිවාදෙය්‍යාමපි පච්චුට්ඨෙය්‍යාමපි ආසනෙනපි නිමන්තෙය්‍යාම අභිනිමන්තෙය්‍යාමපි තං චීවරපිණ්ඩපාතසෙනාසන ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙහි. ධම්මිකම්පි ඍරක්ඛාවරණගුත්තිං සංවිදහෙය්‍යාමාති.

කයින් ඇවුරුණේ වාසයකෙරේ. වචනයෙන් ඇවුරුණේ වාසයකෙරේ. සිතින් ඇවුරුණේ චතුර්විධප්‍රත්‍යය පරිභොගය හා චීවරධාරණය පරමකොටඇතිබැවින් කෙලෙසුන්නසන පිළිවෙත් මගින් සතුටුවූයේ කායවිවෙකාදි ප්‍රකශීවිවෙකයෙහි ඇලුනේ වාසයකෙරේ. කිමෙක්ද, දන්නෙහිද කියාපි. නැවත ඔහු පිළිබඳව පිත්වත්නි, මාගේ ඒ පුරුෂතෙම ඒවා නැවතද අනලසව කටයුතු කරන්නාවූ දුරදීමදැක නැඟීසිටින සවභාවඇත්තාවූ. පසුව ගිදින සවභාවඇත්තාවූ, නොහොත් පළමුකොට සයනයෙන් නැඟීසිටින්නාවූ, පසුව සයනයකරන්නාවූ, කුමක්කරම්දැයි පිළිවිස කටයුතු කරණ සවභාව ඇත්තාවූ, මාගේ සිත්පරිද්දෙන් හැසිරෙන්නාවූ, ප්‍රියකථා ඇත්තාවූ. තුටුපහටුව මුහුණ බලමින් හැසිරෙණ සවභාව ඇත්තාවූ. දාසයෙක් වේවායි කිමෙක්ද මහරජ මෙසේ කියන්නෙහි දැයි විචාළේය.

36. සවාමීන්වහන්ස, එය එසේ නොවේ. එසේ ඇතිකල්හි ඕහට අපිම, අභිවාදනය කරන්නමෝද, ඔහු දැක හුනස්නෙන් නැඟීසිටින්නමෝද, වෙමු. අසන්නේද පවරන්නෙමු. සිවුරුය, පිණ්ඩපාතය, සෙනසුන්ය ගිලන්පස බෙහෙත් පිරිකරය, යන මෙයින් කැමතිකල්හි සිවුරුආදිය පිළිබඳව අපට කියවයි ඔහු වෙසෙසින් පවරන්නමෝද වෙමු. ඔහු සම්බන්ධව ධාර්මිකවූ ආරක්ෂාවරණ ගොපනය විධානකරන්නමෝද වෙමු.

තං කිම්මඤ්ඤසි, මහාරාජ යදි එවං සන්තෙ හොති වා සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං නො වාති. අද්ධා ඛො භන්තෙ එවං සන්තෙ හොති සන්දිට්ඨිකං සාමඤ්ඤඵලන්ති. ඉදං ඛො තෙ මහාරාජ මයා පඨමං දිට්ඨෙව ධම්මෙ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පඤ්ඤත්තන්ති.

37 සක්කා පන භන්තෙ අඤ්ඤම්පි එවමෙව දිට්ඨෙව ධම්මෙ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පඤ්ඤපෙතුන්ති. සක්කා මහාරාජ තෙනහි මහාරාජ තඤ්ඤෙවෙත්ථ පටිපුච්ඡිස්සාමි. යථා තෙ ඛමෙය්‍ය තථා නං ව්‍යාකරෙය්‍යාසි. තං කිම්මඤ්ඤසි මහාරාජ ඉධ තෙ අස්ස පුරිසො කස්සකො ගහපතිකො කාරකාරකො රාසිවඩ්ඪකො තස්ස එවමස්ස අච්ඡරියං වත භො අබ්භුතං වත භො පුඤ්ඤානං ගති. පුඤ්ඤානං විපාකො අයංහි රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො මනුස්සො අහම්පි මනුස්සො අයංහි රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො පඤ්චහි කාමගුණෙහි සමප්පිතො සමඞ්ගිභූතො පරිචාරෙති දෙවො මඤ්ඤෙ, අහම්පනම්හිස්ස කස්සකො ගහපතිකො කාරකාරකො රාසිවඩ්ඪකො සොවතස්සාහං පුඤ්ඤානි කරෙය්‍යං.

මහරජ, ඉදින් මෙසේ ඇතිකල්හි ඒ දසයා තොපගේ සම්පයෙන් අභිවාදනාදියලබනකල්හි සාංදෘෂ්ටිකවූ ශ්‍රාමාණ්‍යඵලය වෙයි කියා හෝ නොවෙයිකියා හෝ තට කෙබඳු අදහසක්වේදැයි විචාළසේක. ස්වාමින්වහන්ස, ඒකාන්තයෙන්මෙසේ ඇතිකල්හි සාංදෘෂ්ටිකවූ ශ්‍රාමාණ්‍යඵලය වේමය. මහරජ, මාවිසින් තට මේ අත්බැව්හිම පළමුවෙනිවූ සාංදෘෂ්ටිකශ්‍රාමාණ්‍යඵලය පණවනලද්දේය.

37. ස්වාමීන්වහන්ස, මෙපරිද්දෙන්ම මේඅත්බැව්හි අන්‍යවූද ශ්‍රාමාණ්‍යඵලයක් පණවන්නට හැක්කේ දැයි විචාළේය. මහරජ හැක්කේය. එහෙනම් මහරජ තාම මේ කරුණෙහිලා පිළිවිසින්නෙමි. තට යම්පරිද්දෙකින් රුචිවන්නේද නොහොත් වැටහෙන්නේද එපරිද්දෙන්එය ප්‍රකාශකරව. ඒ කුමකැයි හභනෙහිද. මහරජ මෙහි තට සීසාන්නාවූ. ගෘහාධිපතිවූ. බලිසම්පාදනයකරන්නාවූ ධනධාන්‍යරාශිය වර්ධනයකරන්නාවූ. පුරුෂයෙක්වන්නේද. ඕහට මෙබඳු අදහසක්වන්නේද. මේ මගධෙශ්වරවූ අජාසත්රජතෙමේ මිනුෂ්‍යයෙක, මමද මනුෂ්‍යයෙක්මි. මගධෙශ්වරවූ වෙදෙහිපුත්‍රවූ මේ අජාසත්රජතෙමේ පස්කම්කොටසින්පිණාගියේ යුක්තවූයේ දෙවියෙකුමෙන් ඉන්ද්‍රියයන් හසුරුවාලයි මමවූකලි සීසාන්නාවූ ගෘහාධිපතිවූ බලිසාම්පාදනයකරන්නාවූ ධනධාන්‍යරාශිය වර්ධනයකරන්නාවූ ඔහුගේදස්කරුවෙක්වෙමි. පින්වත්නි, මෙය ආශ්චර්‍ය්‍යයි පින්වත්නි, මෙය අද්භූතයි. මමද පින්කරන්නෙමිනම් ඒකාන්තයෙන් මෙබන්දෙක්වන්නෙමි.

යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡා දෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍යන්ති. සො අපරෙන සමයෙන අප්පං වා භොගක්ඛන්ධං පහාය මහන්තංවා භොග ක්ඛන්ධං පහාය අප්පංවා ඤාතිපරිවට්ටං පහාය මහන්තං වා ඤාතිපරිවට්ටං පහාය කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය. සො එවං පබ්බජිතො සමානො කායෙන සංවුතො විහරෙය්‍ය වාචාය සංවුතො විහරෙය්‍ය මනසාසංවුතො විහරෙය්‍යඝාසච්ඡාදනපරමතාය සන්තුට්ඨො අභිරතො පවිවෙකෙතං වෙතෙ පුරිසා එවමාරොචෙය්‍යුංයග්ඝෙ දෙව ජානෙය්‍යාසියොතෙබො පුරිසොකස්සකො ගහපතිකො කාරකාරකො රාසිවඩ්ඪකොසො දෙව කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිතො. සො,එවං පබ්බජිතො සමානො කායෙන සංවුතො විහරති වාචාය සංවුතො විහරති.

එකාන්තයෙන් මම කෙස්දැළිරැවුලු හරවා කාසායවස්ත්‍රයන් අන්දවා ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවන්නෙම් නම් ඉතායෙහෙකැයි කියායි. ඒපුරුෂතෙම මෑතකලකදී ස්වල්පවූ හෝ භොගරාශිය හැර මහත්වූ හෝ භොගරාශිය හැර ස්වල්පවූ හෝ නෑයන්හැර බොහෝවූ හෝ නෑයන්හැර කෙස්දැළි රැවුලුහරවා ගිහිගෙයින්නික්ම සස්නෙහිපැවිදිවන්නේද ඒපුරුෂ තෙමේ මෙසේ පැවිදිවූයේම. කාය සංයමයෙන් යුක්තවූයේ වාසය කරන්නේද වාක්සංයමයෙන්යුක්තවූයේ වාසයකරන්නේද මනො සංයමයෙන්යුක්තවූයේ චතුර්විධප්‍රත්‍යය පරිභොගය හා සිව්රුදුරිම් කෙළවරකොට ඇතිබැවින් කෙලෙසුන්වනසන පිළිවෙතින්යුක්ත වූයේ කායවිවෙකාදිත්‍රිවිධවිවෙකයෙහි වෙසෙසින් ඇලුනේ වාසය කරන්නේද, තෙල පුරුෂයෝ ඒ කාරණය තට මෙසේ ප්‍රකාශකර න්නාහුද. කෙසේද, දෙවයන්වහන්ස, තුබවහන්සේගේ. සීසාන්නාවූ ගෘහාධිපතිවූ බලිසම්පාදනැකරන්නාවූ ධනධාන්‍යරාශිය වර්ධනය කරන්නාවූ යම් ඒදස්කරු පුරුෂයෙක් වීද. දෙවයන්වහන්ස, ඒපුරු ෂතෙමේ කෙස්දැළිරැවුලු හරවා කාසායවස්ත්‍රයන් අන්දවා ගිහිගෙයින් නික්ම සස්නෙහිපැවිදිවූයේය. හෙතෙමේ මෙසේ පැවිදිවූයේම කාය සංයමයෙන් ඇවුරුණේ වාසයකෙරෙයි. වාක්සංයමයෙන් ඇවුරු ණේ වාසයකෙරෙයි.

මනසා සංවුතො විහරති ඝාසච්ඡාදනපරමතාය සන්තුට්ඨො අභිරතො පවිවෙකෙති. අපිනු ත්වං එවං වදෙය්‍යාසි එතු මෙ භො සො පුරිසො පුනදෙව හොතු කස්සකො ගහපතිකො කාරකාරකො රාසිවඩ්ඪකොති.

38 නොහෙතං භන්තෙ අථඛො නං මයමෙව අභිවාදෙය්‍යාමපි පච්චුට්ඨෙය්‍යාමපි ආසනෙනපි නිමන්තෙය්‍යාම අභිනිමන්තෙය්‍යාමපි නං චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙහි ධම්මිකංපිස්ස රක්ඛාවරණගුත්තිං සංවිදහෙය්‍යාමාති. තං කිම්මඤ්ඤසි මහාරාජ යදි එවං සන්තෙහොතිවා සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං නොවාති. අද්ධා ඛො භන්තෙ එවං සන්තෙ හොති සන්දිට්ඨිකං සාමඤ්ඤඵලන්ති. ඉදං ඛො තෙ මහාරාජ මයාදුතියං දිට්ඨෙව ධම්මෙ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පඤ්ඤත්තන්ති.

මනොසංයමයෙන් ඇවුරුණේ ප්‍රත්‍යය පරිභොගය හා චීවර ධාරණය උතුම්කොටඇතිබැවින් කෙලෙසුන් වනසන පිළිවෙතින් යුක්තවූයේ කායවිවෙකාදිත්‍රිවිධ විවෙකයෙහි වෙසෙසින් ඇලුනේ වාසයකෙරෙයි. කිමෙක්ද මහරජ දන්නෙහිදැයි විචාළේය. තවද පින්වත්නි, මාගේ ඒ පුරුෂතෙමේ ඒවා. නැවතද සීසාන්නාවූ ගෘහාධිපතිවූ බලිසම්පාදනය කරන්නාවූ ධනධාන්‍යරාශිය වර්ධනයකරන්නාවූ දාසයෙක්වේවායි කිමෙක තෝ කියන්නෙහිද.

38 සවාමින්වහන්ස, එය නොවේමය. එසේ ඇතිකල්හි අපිම ඔහු අභිවාදනය කරන්නමෝද වෙමු. දුරදීමදැක හුනස්නෙන්නැගිසිටින්නමෝද වෙමු. හුනස්නෙන්ද පවරන්නෙමු. සිව්රුය පිණ්ඩපාතය සෙනසුන්ය ගිලන්පස බෙහෙත් පිරිකරය යනමෙයින් කැමතිකල්හි කියවයි මනාකොට පවරන්නමෝද වෙමු. ඔහුසම්බන්ධව ධාර්මිකවූආරක්ෂාවරණ ගොපනයද මනාකොටකරවන්නෙමුයිසැලකලෝ. මහරජ ඉදින් මෙසේ ඇතිකල්හි සාන්දෘෂ්ටිකශ්‍රාමාණ්‍යඵලය මෙහි වෙයි කියා හෝ නොවෙයි කියා හෝ තට කෙබඳු අදහසෙක්වේ දැයත්. සවමීන්වහන්ස, එකාන්තයෙන් මෙසේ ඇතිකල්හි මෙසාන්දෘෂ්ටික ශ්‍රාමාණ්‍යඵලයවේ මහරජ තට මේ අත්බැව්හිම තමන්කෙරෙහි දැක්කයුතුවූ මේදෙවෙනි මාගීඵලය මාවිසින් පණවනලද්දේය.

39 සක්කා පන භන්තෙ අඤ්ඤම්පි දිට්ඨෙව ධම්මෙ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පඤ්ඤපෙතුං ඉමෙහි සන්දිට්ඨිකෙහි සාමඤ්ඤඵලෙහි අභික්කන්තතරඤ්ච පණීතතරඤ්චාති. සක්කා මහාරාජ. තෙනහි මහාරාජ සුණොහි සාධුකං මනසිකරොහි භාසිස්සාමීති. එවං භන්තෙති ඛො රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො භගවතො පච්චස්සොසි භගවා එතදවොච.

40 ඉධ මහාරාජ තථාගතො ලොකෙ උප්පජ්ජති, අරහං සම්මා සම්බුද්ධො විජ්ජාචරණ සම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා. සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණ බ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසාන කල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති.

---

39. ස්වාමීන්වහන්ස, මේ තමන්කෙරෙහි දක්කයුතුවූ මාර්ගඵලයන් අතුරෙන් අතිශයින්මනවඩන්නාවූ අතිශයින් ශ්‍රෙෂ්ඨවූ. මේ අත්බැව්හිම තමන්කෙරෙහිලා දක්කයුතුවූ මාර්ගඵලයක් පණවන්ට හැක්කේදැයි විචාළේය. මහරජ හැක්කේය. එහෙනම් මහරජ අසව. මොනවට මෙනෙහිකරව කියන්නෙමියි වදාළෝ, ස්වාමීන්වහන්ස, එසේයයි මගධේශ්වරවූ වෙදෙහිපුත්‍රවූ අජාසත්රජතෙමේ භාග්‍යවතුන්වහන්සේට පිළිවදන්දුන්නේය. භාග්‍යවතුන්වහන්සේ මේ සාන්දෘෂ්ටිකමාර්ගඵලය වදාළසේක.

40. මහරජ අහිත්වූ. සම්‍යක්සම්බුද්ධවූ අෂ්ටවිද්‍යාපසළොස්චරණධර්මයන්ගෙන් සමන්විතවූ යහපත්ගතිඇත්තාවූ තුන්ලොවදන්නාසුලුවූ ශ්‍රෙෂ්ඨවූ දණ්ඩපුරුෂයන් දමනයකිරීමෙහි රථාචාර්යයෙක් වැනිවූ දෙව්මිනිසුන්ට අනුශාසනාකරන්නාවූ චතුස්සත්‍යයඅවබොධකළාවූ භාග්‍යවත්වූ තථාගතතෙමේ මේසත්වලොකයෙහිඋපදීද. ඒ තථාගතතෙමේ පඤ්චකාමාවචර දෙවියන්සහිතවූ මාරයාසහිතවූ නොහොත් සවෙනි කාමාවචරදෙවියන්සහිත. බ්‍රහ්මකායිකයන් සහිතවූ මහණබමුණන් සහිතවූ දෙව්මිනිසුන් සහිතවූ සත්වවර්ගයාද තෙමේ විශිෂ්ටඥානයෙන්දැන ප්‍රත්‍යක්‍ෂකොට ප්‍රකාශකෙරේද, ඒ තථාගතතෙමේ ආදියෙහි යහපත්වූ හෙවත් නිර්දොෂවූ මධ්‍යයෙහියහපත්වූ හෙවත් නිර්දොෂවූ. අන්තයෙහියහපත්වූ. හෙවත්නිර්දොෂවූ සතරසිව්වටන්ආදිය අසුරුකලහෙයින් අර්ථසහිතවූ, සිථිලධනිතාදි දශවිධව්‍යඤ්ජනය නොපිරිහෙළා වදාරණහෙයින් ව්‍යඤ්ජනසහිතවූ, සියල්ලෙන් සම්පූර්ණවූ පිරිසිදුවූ ශික්‍ෂාත්‍රයසඞ්ග්‍රහකරණලද සකලශාසනමාර්ගබ්‍රහ්මචර්යාව ප්‍රකාශකෙරේද.

41 තං ධම්මං සුණාති ගහපතිවා ගහපතිපුත්තොවා අඤ්ඤතරස්මිංවා පච්චාජාතො සො තං ධම්මං සුත්වා තථාගතෙ සද්ධං පටිලභති සො තෙන සද්ධාපටිලාභෙන සමන්නාගතො ඉති පටිසංචික්ඛති සම්බාධො ඝරාවාසො රජොපථො අබ්භොකාසො පබ්බජ්ජා නයිදං සුකරං අසාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං එකන්තපරිසුද්ධං සංඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානිවත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍යන්ති. සො අපරෙණ සමයෙන අප්පංවා භොගක්ඛන්ධං පහාය මහන්තංවා භොගක්ඛන්ධංපහාය අප්පංවා ඤාතිපරිවට්ටංපහාය මහන්තංවා ඤාතිපරිවට්ටංපහාය කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජති.

42 සො එවං පබ්බජිතො සමානො පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාර ගොචරසම්පන්නො අනුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු කායකම්මවචීකම්මෙන සමන්නාගතො කුසලෙන.

---

41. ඒ ධර්මය ගෘහපතියෙක් හෝ ගෘහපතිපුත්‍රයෙක් හෝ අන්‍ය කුලයන් අතුරෙන් එක්තරාකුලයෙක්හි උපන්නෙක් හෝ අසාද, හෙතෙමේ ඒ ධර්මය අසා බුද්ධගුණය අරමුණුකොට ශ්‍රද්ධාව ලබාද, හෙතෙමේ ඒ ශ්‍රද්ධාලාභයෙන් යුක්තවූයේ ගිහිගෙයි විසීම පීඩාසහිතය, කෙලෙසිලිකරණ රජොමාර්ගයක. පැවිද්ද අභ්‍යවකාශයි. හෙවත් පස්කම්ගුණවශයෙන් බැඳීමට තැනක් නොමැතිහෙයින් අවකාශරහිතයි. ගිහිගෙයි වසන්නහුවිසින් ලියවූ සකක්මෙන් සියලු අයුරින් පිරුණාවූ, සියලු අයුරින් පිරිසිදුවූ, මේ බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙන්ට පහසු නොවේ. එකාන්තයෙන් මම කෙස්දැළිරැවුළු හරවා කාසාවවස්ත්‍රයන් අන්දවා ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවන්නෙම් නම් ඉතායෙහෙකැයි මෙසේසලකාද.හෙතෙමේ මෑතකලකදී ස්වල්පවූ හෝ භොගරාශියහැර,බොහෝවූ හෝ භොගරාශියහැර ස්වල්පවූ හෝ නෑයන් හැර, බොහෝවූ හෝ නෑයන් හැර, කෙස්දැළිරැවුළුහරවා කාසාවවස්ත්‍රයන් අන්දවා ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදි වේ.

42. හෙතෙමේ මෙසේ පැවිදිවූයේම ප්‍රාතිමොක්ෂසංවරයෙන් ඇවුරුණේ සම්පන් ආචාරයෙන් හා ගොචරයෙන් යුක්තවූයේ ස්වල්පවූද, අකුශලධර්මවිෂයෙහි භයදක්නා ස්වභාවඇතිව කුසල්වූ කායකර්ම වචීකර්ම දෙකින් යුක්තවූයේ ශික්ෂාපද රැගෙණ ඒ ඒ ශික්ෂාපදයන්හි හික්මෙයි.

පරිසුද්ධාජීවො සීලසම්පන්නො ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො භොජනෙ මත්තඤ්ඤූ සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො සන්තුට්ඨො.

43 කථඤ්ච මහාරාජ භික්ඛු සීලසම්පන්නො හොති ඉධ මහාරාජ භික්ඛු පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති, නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බපාණභූතහිතානුකම්පී විහරති ඉදම්පිස්ස හොති සීලස්මිං. අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො හොති දින්නාදායී දින්නපාටිකඞ්ඛී අථෙනෙන සුචිභූතෙන අත්තනා විහරති ඉදම්පිස්ස හොති සීලස්මිං. අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී හොති ආරාචාරී විරතො මෙථුනා ගාමධම්මා ඉදම්පිස්ස හොති සීලස්මිං.

44 මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො හොති සච්චවාදී සච්චසන්ධො ථෙතො පච්චයිකො.

පිරිසිදු දිවිපැවතුම් ඇත්තේ ත්‍රිවිධශීලයෙන් යුක්තවෙයි. ෂඩින්ද්‍රියයෙහි වසනලද දොරඇත්තේ වේ. ඉදිරිගමන් ආදිසථාන සතෙක්හි යහපත් සිහියෙන්ද, යහපත් ප්‍රඥාවෙන්ද, යුක්ත වෙයි. චීවරාදි චතුර්විධ ප්‍රත්‍යයෙහි ත්‍රිවිධ සන්තොෂයෙන් යුක්තවෙයි.

43. මහරජ, කෙසේනම් භික්ෂුතෙමේ ශීලසම්පන්න වේද, මහරජ, මේ සස්නෙහි මහණෙක් ප්‍රාණඝාතය හැර ප්‍රාණඝාතයෙන් වැළැක්කේ වේද, සත්වහිංසාවපිණිස සිත්නැත්තෙන් බහාතබනලද දඬු ඇත්තේ වේද, බහාතබනලද ආයුධඇත්තේ වේද, පව්කිරීමෙහි ලජ්ජාඇත්තේ වේද, කරුණාවට පැමිණියේ වේද, ප්‍රාණීවූ සියල්ලන් කෙරෙහි හිතානුකම්පාඇතිව වාසය කෙරේද, මෙසේ මේ සත්වහිංසාවෙන් වැළැක්ම ඒ මහණහුගේ ශීලය වේ. අයිනාදන හැර අයිනාදනින් වෙසෙසින් වැළැක්කේ දුන්දෙයම ගන්නා සවභාවඇත්තේ දුන් දෙයට සිතිනුත් කැමතිවන සවභාවඇත්තේ සොරනොවූ පවිත්‍රවූ සිතින් යුක්තව වාසය කෙරේද, මෙසේ මේ අයිනාදනින් වැළැක්ම ඒ මහණහුගේ ශීලය වේ. අශ්‍රෙෂ්ඨචර්‍ය්‍යාව හැර නොබඹසරින් දුරුවූ හැසුරුම්ඇත්තේ ස්ත්‍රීපුරුෂසංසර්‍ගීයවූ ග්‍රාමධර්‍මයෙන් වැළැක්කේ බඹසරඇත්තේ වේද, මෙසේ මේ කාමසුඛාසවාද විරතියඒ මහණහුගේ ශීලය වේ.

44. බොරුකීම හැර බොරුකීමෙන් වෙසෙසින් වැළැක්කේ සත්‍ය කථාඇත්තේ සත්‍යයෙන් සත්‍යය ගළපන සවභාවඇත්තේ ස්ථිර කථාඇත්තේ ඇදහියයුතු කථාඇත්තේ.

අවිසංවාදකො ලොකස්ස ඉදම්පිස්ස හොති සීලස්මිං—පිසුණා වාචම් පහාය පිසුණාය වාචාය පටිවිරතො හොති. ඉතොසුත්වා නඅමුත්‍ර අක්ඛාතා ඉමෙසංභෙදාය අමුත්‍රවා සුත්වා නඉමෙසං අක්ඛාතා අමූසං භෙදාය ඉතිභින්නානං වා සන්ධාතා සහිතානංවා අනුප්පදාතා සමග්ගාරාමො සමග්ගරතො සමග්ගනන්දී සමග්ගකරණිං වාචම් භාසිතා හොති ඉදම්පිස්සහොති සීලස්මිං—ඵරුසාවාචම්පහාය ඵරුසායවාචායපටිවිරතො හොති යාසා වාචා නෙලා කණ්ණසුඛා පෙමනියා හදයඞ්ගමා පොරී බහුජනකන්තා බහුජනමනාපා තථාරූපං වාචං භාසිතා හොති ඉදම්පිස්ස හොති සීලස්මිං—සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතො හොති කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී නිධානවතිං වාචං භාසිතා හොති කාලෙන සාපදෙසං පරියන්තවතිං අත්ථසංහිතං ඉදම්පිස්ස හොති සීලස්මිං.

ලෝපිළිබඳව විරුඩකථා නොකරන්නේ වේද. මෙසේ මේ බොරුකීමෙන් වැළැක්මද, ඒ මහණහුගේ ශීලය වේ. පෙහෙසුන්වදන්හැර ප්‍රියභාවය ශූන්‍යකරණ කථාකිරීමෙන් වෙසෙසින් වැළැක්කේ වේ. මෙතනින් අසා මොවුන්ගේ භෙදයපිණිස එතැන්හි නොකියන ස්වභාවඇත්තේය, එතැන්හි අසා ඔවුන්ගේ භෙදය මෙතැන්හි නොකියන ස්වභාවඇත්තේය, මෙසේ බිදුනන් ගළපන්නේ සමගිවූවන්ට ධාර්මිකකථාදියෙන් අනුබලදෙන ස්වභාවඇත්තේ සාමග්‍රිකම්යෙහි ඇලුම්ඇත්තේ සාමග්‍රිකම්යෙහි ඇළුනේ සාමග්‍රිකම්යට සතුටුවන ස්වභාවඇත්තේ සමගිකරන්නාවූ වදන් කියන්නෙක් වේද, මේද ඒ මහණහුගේ ශීලය වේ. ඵරුසවදන්හැර ඵරුසවචනයෙන් වෙසෙසින් වැළැක්කේ වේද, යම් ඒ වචනයක් නිර්දෙෂද, ව්‍යඤ්ජන මධුරත්වයෙන් කණට සැපඇතිකරන්නේද, අර්ථමධුරත්වයෙන් ප්‍රෙමකටයුතුද, සිතට සුවසේ වදනාහෙයින් සිත්කලුද, පුරවාසීන්ගේ කථාවමෙන් අතිශය මනොඥද, බොහෝදෙනාට ප්‍රීතිඋපදවන්නිද, බොහෝදෙනාගේ මනවඩන්නේ වේද, එබඳුවූවදන් කියන්නේවේද. මේ කර්කශ වාග්ව්‍යවහාරයෙන් වැළැක්ම ඒ මහණහුගේ ශීලය වේ. සම්ඵප්‍රලාපයහැර සිස්වූ ප්‍රලාපභාෂණයෙන් වෙසෙසින් වැළැක්කේ වේද. සුදුසුකල්හි කියන කථා ඇත්තේ වේද. සත්‍යයම කියන ස්වභාවඇත්තේ වේද අර්ථයෙන් යුක්තවූම වදන් කියන ස්වභාව ඇත්තේ වේද. නවලොකොත්තරධර්මනිශ්‍රිතවම කියන්නේ වේද. සංවරවිනයාදියනිශ්‍රිතවම කියන්නේද. සුදුසුකල්හි උපමා හා කාරණා සහිතවූ පරිච්ඡෙදවත්වූ අර්ථයක් හෙවත් අභිවෘඩියෙන් යුක්තවූ නිධානයක්මෙන් සිත්හිතැබියයුතු වචනකියන ස්වභාව ඇත්තේවේද. මේද ඒ මහණහුගේ සීලයවේ.

45 බීජගාමභූතගාමසමාරම්භා පටිවිරතො හොති ඒකභත්තිකො හොති රත්තූපරතො පටිවිරතො විකාලභොජනා නච්චගීතවාදිතවිසූකදස්සනා පටිවිරතො හොති මාලාගන්ධවිලෙපනධාරණමණ්ඩනවිභූසණට්ඨානා පටිවිරතො හොති. උච්චාසයනමහාසයනා පටිවිරතො හොති. ජාතරූපරජතපටිග්ගහණා පටිවිරතො හොති…ආමකධඤ්ඤ පටිග්ගහණා පටිවිරතො හොති…ආමකමංසපටිග්ගහණා පටිවිරතො හොති…ඉත්ථිකුමාරිකපටිග්ගහණා පටිවිරතො හොති…දාසිදාසපටිග්ගහණා පටිවිරතො හොති. අජෙළකපටිග්ගහණා පටිවිරතො හොති…කුක්කුටසූකරපටිග්ගහණා පටිවිරතො හොති…හත්ථිගවාස්සවළවපටිග්ගහණා පටිවිරතො හොති…ඛෙත්තවත්ථු පටිග්ගහණා පටිවිරතො හොති…දූතෙය්‍යපහිණගමනානුයොගා පටිවිරතො හොති…කයවික්කයා පටිවිරතො හොති…තුලාකූටකංසකූටමානකූටා පටිවිරතො හොති

---

45 තෘණවෘක්ෂලතාදීන්ගේ සිඳිම් බිඳිම් ආදි විකොපනයෙන් වැළැක්කේවේද. එක්වේලේවලදන බත්ඇත්තේවේද. රාත්‍රිභොජනයෙන් වැළැක්කේවේද. විකල්බොජුන්හෝ වැළැක්කේවේද. නැටීමය ගිකිමය. බෙරආදියවැයීමය. මේආදිවිසුලුදුක්මය යනමෙයින් වැළැක්කේවේද. ගෙතුනොගෙතුමල්ය සුගන්ධද්‍රව්‍යය. ඡවිරාගකරණ විලවුන්ය. යනමේ සියල්ල පැලඳීමෙන්දූරීමය උනුතැන්පිරවීමය. සැරහීමය. යනමේකරුණෙන් වැළැක්කේවේද. පමණඉකුත්දික් හාලාපුටුආදිඋසසුන්ය. සතරඟුලෙන්දික්ලොම්ඇති කොඳුපලස් ආදිමහසුන්ය යනමෙයින් වැළැක්කේවේද. රන්රිදී මසු කහවණුපිළිගැන්මෙන් වැළැක්කේවේද. සත්වැදෑරුම් ධාන්‍යය පිළිගැන්මෙන් වැළැක්කේවේද. ආමකමත්ස්‍යමාංසයන්ගේ පිළිගැන්මෙන් වැළැක්කේවේද. පුරුෂයන්වෙත පැමිණිස්ත්‍රීන් හා පුරුෂයන්වෙත නොපැමිණි කුමාරින් පිළිගැන්මෙන් වැළැක්කේවේද දාසි දාසයන් පිළිගැන්මෙන් වැළැක්කේවේද. තිරෙළුවන්හා පලෙලූවන් පිළිගැන්මෙන් වැළැක්කේවේද. කුකුලන්හා ඌරන් පිළිගැන්මෙන් වැළැක්කේවේද. ඇත්තුය. ගෙරිය. අශ්වයෝය වෙළඹුය යන මොවුන්ගේ පිළිගැන්මෙන් වැළැක්කේවේද. කෙත්වත් පිළිගැන්මෙන් වැළැක්කේවේද. ගිහියන්ගේ පත්හසුන් ආදියගෙණයනදූතභාවය ගෙයින්ගෙට යනකුදු මහත්මෙහෙවරය යනමෙහියෙදීමෙන් වැළැක්කේවේද. ක්‍රයවික්‍රයසඞ්ඛ්‍යාත ගණුදෙනුවෙන්. වැළැක්කේවේද. තරාදිපලම් දඬුආදියෙන් වඤ්චාකොට ගැන්මය රන්තලිහා රන්ගැතලි මිශ්‍රකොට වඤ්චාකිරීමය වීආදිය වඤ්චාකොට මැනගැන්මය. යනමේ සියල්ලෙන් වැළැක්කේවේද.

උක්කොටනවඤ්චනනිකතිසාචියොගා පටිවිරතො හොති. ඡේදන වධබන්ධනවිපරාමොසආලොපසහසාකාරා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති. සීලස්මිං.

46. යථාවා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං බීජගාමභූතගාමසමාරම්භං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථිදං, මූලබීජං ඛන්ධබීජං ඵළුබීජං අග්ගබීජං බීජබීජමෙව පඤ්චමං. ඉති එවරූපා බීජගාමභූතගාමසමාරම්භා පටිවිරතො හොති ඉදම්පිස්ස හොති සීලස්මිං.

47. යථාවා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං සන්නිධිකාරපරිභොගං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථිදං අන්නසන්නිධිං පානසන්නිධිං වත්ථසන්නිධිං යානසන්නිධිං.

හිමියන් අභිමිකිරීමාදියෙන් අල්ලස්ගැන්මය. නානාවිධඋපායෙන් මෙරමා වඤ්චාකිරීමය. අයොලොහාදිය සවර්ණරජතයයි වඤ්චාකොට ගැන්මය නානාවිධවූ කුටිලප්‍රයොගය යනමෙයින් වැළැක්කේවේ. අත්පා ආදිය කැපීමය. මැරීමය. රැහැන් ආදියෙන්බැඳීමය. අරණ්‍යාදියෙහි සැඟවීසිට වස්තුපැහැර ගැන්මය ගම්නියම්ගම් ආදියපැහැරීමය බලාත්කාරයෙන් වස්තුව පැහැරගැන්මය. යනමෙයින් වැළැක්කේවේ. මේද ඒ මහණහුගේ ශීලයවේ.

46. යම්බඳුවූ හෝ සමහර පින්වත් මහණබමුණකෙනෙක් වෙද්ද, ඔව්හු සැදැහැයෙන් දෙනලද බොජුන් අනුභවකොට මෙබඳුවූ බීජ ගාමිභූතගාමසමාරම්භයෙහි යෙදුනාහු වෙසෙත්. ඒනම්, කසාහිගුරු ආදී මූලබීජය, ඇසතුනුගආදී ඛන්ධබීජය, උක්උණආදී පුරුක්බීජය, අඳුතලාආදී දළුබීජය, පස්වැනිවූ හැල්ආදී බීජ බීජමයයි. මෙසේ මෙබඳුවූ බීජගාමභූතගාමයන්ගේ ඡේදනභෙදනාදියෙන් වැළැක්කේ වේ. මේද ඒ මහණහුගේ ශීලය වේ.

47. යම්බඳුවූ හෝ සමහර පින්වත් මහණබමුණුකෙනෙක් වෙද්ද, ඔව්හු සැදැහැයෙන් දුන් බොජුන් වළඳ මෙබඳුවූ සන්නිධිකාරපරිභොගයෙහි යෙදී වෙසෙත්ද. ඒනම්, ආහාරවර්ගීය දෙවෙනි දවසට තබා ප්‍රයොජන විඳීමය, පානවර්ගීය දෙවෙනි දවසට තබා ප්‍රයොජන විඳීමය, නොඉටූ සිවුරු ආදිය ලදින් නගාතිබීමය, යානායයි කියූ වහන් ලදින් තබා ප්‍රයොජන විඳීමය.

සයනසන්නිධිං ගන්ධසන්නිධිං ආමිසසන්නිධිං ඉතිවා, ඉතිඑවරූපා සන්නිධිකාරපරිභොගා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

48. යථා වා පනෙකෙ හොන්තො සමණබ්‍රාහමණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විසූකදස්සනං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථිදං, නච්චං ගීතං වාදිතං පෙක්ඛං අක්ඛානං පාණිස්සරං වෙතාලං කුම්භථූනං සොභනකරකං චණ්ඩාලං වංසං ධොපනං හත්ථියුද්ධං අස්සයුද්ධං මහිසයුද්ධං උසභයුද්ධං අජයුද්ධං මෙණ්ඩකයුද්ධං කුක්කුටයුද්ධං වට්ටකයුද්ධං දණ්ඩයුද්ධං නිබ්බුද්ධං උය්‍යොධිකං බලග්ගං සෙනාබ්‍යූහං අනීකදස්සනං ඉතිවා ඉතිඑවරූපා විසූකදස්සනා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

49. යථා වා පනෙකෙ හොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං ජූතප්පමාදට්ඨානානුයොගං අනුයුත්තා විහරන්ති සෙය්‍යථිදං.

දෙකකින්වැඩි සයනයන්ලදින් පසුවට තබා ප්‍රයොජන විදීමය, සුවඳලදින් තබා ප්‍රයොජන විදීමය, තිලතණ්ඩුලාදිය රුස්කොට තබා ප්‍රයොජන විදීමයයි මෙසේ මෙබඳුවූ සන්නිධිකාරපරිභොගයෙන් වැළැක්කේ වේ. මේද ඒ මහණහුගේ ශීලය වේ.

48. යම්බඳුවූ හෝ සමහර පින්වත් මහණබමුණුකෙනෙක් වෙද්ද, ඔව්හු සැදැහැයෙන් දුන් බොජුන් අනුභවකොට මෙබඳුවූ විපරීත දර්‍ශනයෙහි යෙදී වෙසෙත්ද. ඒ කවරේද, නැටීමය, ගීකීමය, බෙර ආදිය වැයීමය, රඟමඩුලු සැරහීමය, භාරතරාමායනාදි පරකථා ඇසීමය, කස්තල හා අත්තල ආදිය ගැසීමය, මන්ත්‍ර පිරවීමෙන් මළමිනී නැංවීමය, සිවුරුස්බෙර ගැසීම හෝ කලබෙර ගැසීමය, ප්‍රතිභාන චිත්‍රවිචිත්‍රය, චණ්ඩාලයන්ගේ සණදෙවුනා කෙළීමය, උණගස්ඔසවා නැටීමය, මිනිඇට සෝදනැබීමය, ඇතුන් හා යුධකිරීමය, අසුන් හා යුධකිරීමය, මීවුන් හා යුධකිරීමය, වෘෂභයන් හා යුධකිරීමය, නිරෙළුවන් හා යුධකිරීමය, පලෙළුවන් හා යුධකිරීමය, කුකුලන්යුදලැවීමය, වටුවන්යුද ගැන්වීමය, දඬුපොලු සරමකිරීමය, තොරතුරු ඇනීමය, මල්ලවයුධය, යුධකිරිවිය, ඇත්අස් ආදිය ගණන්කිරීමය, සෙනාසන් නිවෙසය, ඇත්අස් ආදිය දැක්ම හෝයයි, මෙසේ මෙබඳුවූ විසුලු දැක්මෙන් වැළැක්කේ වේ. මේද ඒ මහණහුගේ ශීලය වේ.

49. යම්බඳුවූ හෝ සමහර පින්වත් මහණබමුණුකෙනෙක් වෙද්ද, ඔව්හු සැදැහැයෙන් දුන් බොජුන් වළඳ මෙබඳුවූ ප්‍රමාදයට කාරණාවූ ද්‍යූතක්‍රීඩායොගයෙහි යෙදුනාහු වෙසෙත්ද. ඒ කවරේද.

අට්ඨපදං දසපදං ආකාසං පරිහාරපථං සන්තිකං ඛලිකං ඝටිකං සලාක
හත්ථං අක්ඛං පඞ්ගචීරං වඞ්කකං මොක්ඛචිකං චිඞ්ගුලකං පත්තාළ්හකං
රථකං ධනුකං අක්ඛරිකං මනෙසිකං යථාවජ්ජං ඉතිවා ඉති එවරූපා
ජූතප්පමාදට්ඨානානුයොගා පටිවිරතො හොති ඉදම්පිස්ස හොති සිලස්මිං.

50. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි
භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං උච්චාසයනමහාසයනං අනුයුත්තා
විහරන්ති. සෙය්‍යථිදං,ආසන්දිං පල්ලඞ්කං ගොනකං චිත්තකං පටිකං
පටලිකං තූලිකං විකතිකං උද්දලොමිං එකන්තලොමිං කට්ටිස්සං
කොසෙය්‍යං කුත්තකං හත්ථත්ථරං අස්සත්ථරං රථත්ථරං අජිනප්ප
වෙණිං කාදලිමිගපවරපච්චත්ථරණං.

දූපෝරු රාජවිල්පෝරු ආදියෙහි කෙළීමය, (රාජවිල්පෝරු ආදියෙහි
කෙළීමය,) දූපෝරු ආදියෙහි මෙන් ආකාශයෙහි කෙළීමය,බිම මණ්
ඩල වශයෙන් සාදා පැණ පැණ කෙළීමය,එක්කොට තබනලද දූකැට
ආදිය නොසොල්වා තියෙන්ම ගසා කෙළීමය, පසඇටින් කෙළී
මය,සිංකෙළීමය,භිත්ති ආදියෙහි ඉරටමිටිගසා ඇත්අස් ආදි රූ දක්වා
කෙළීමය, පත්දූකෙළීමය, පත්කුළල් පිඹ කෙළීමය, ගම්දරුවන්
කෙළනා කුඩානගුල් ගෙණ සීසෑම්වසයෙන් කෙළීමය, කරණ්ම් පිනි
මය,තල්පත් ආදියෙන් කත්නාන්ගුරුවා ඉදිකොට කෙළීමය,පත්නැළි
යෙන් වැලි ආදිය මැණ කෙළීමය, කුඩා රියෙන් කෙළීමය, කුඩා
දුන්නෙන් කෙළීමය, අහසෙහි හෝ පිට අකුරු ඇඳ දක්වා කෙළීමය,
සිතින් යමක් සිතා මා සිතින් සිතූදෙය දතුද යනාදීන් දන්වා කෙළී
මය, ඒ ඒ දෙෂරූප දක්වා කෙළීමයයි, මෙසේ මෙබඳුවූ ද්‍යූතප්‍රමාද
කාරණයෙහි යෙදීමෙන් වැළැක්කේ වේ. මේද ඒ මහණහුගේ ශිලය
වේ.

50. යම්බඳුවූ හෝ සමහර පින්වත් ශ්‍රමණබ්‍රාහමණකෙනෙක්
වෙද්ද, ඔව්හු සැදැහැයෙන් දුන් බොජුන් වලඳා මෙබඳුවූ උසසුන්
මහස්නෙහි යෙදුනාහු වෙසෙත්. ඒ කවරේද, දික්හගලාපුටුය, පල
ඟය, සතරඟුලෙන් දික්ලොම්ඇති ඇතිරිය, විසිතුරු එළලොම් ඇති
රිය, එළලොම්මුවා සුදු ඇතිරිය, එළලොම්මුවා ඝනපුප් ඇතිරිය,
තිලිය, සිංහාදි රූපයෙන් විසිතුරු එළලොම් ඇතිරිය. එක්පිටක
ලොම්ඇති එළලොම් ඇතිරිය, දෙපිට ලොම්ඇති එළලොම් ඇතිරිය,
රන්කසුකම්කොට කැටී තිහිරිහුයින් කළ පසතරණය, නාටිකාවන්
සොළොස්දෙනෙකුට නැටියහැකි එළලොම්මුවා මහ ඇතිරිය, ඇතුන්
පිට අතුරණ ඇතිරිය, අසුන්පිට අතුරණ ඇතිරිය, රථපිට අතුරණ
ඇතිරිය, අඳුන්දිවිසමින් කළ පසතරණය.

සළුත්තරච්ඡදං උභතොලොහිතකූපධානං ඉතිවා, ඉති එවරූපා උච්චාසයනමහාසයනා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

51 යථාවාපනෙකෙහොන්තොසමණබ්‍රාහ්මණාසද්ධාදෙය්‍යානිභොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං මණ්ඩණවිභූසණඨානානුයොගං අනුයුත්තා විහරන්ති.සෙය්‍යථිදං,උච්ඡාදනං පරිමද්දනං නහාපනං සම්බාහනං ආදසං අඤ්ජනං මාලාවිලෙපනං මුඛචුණ්ණකං මුඛාලෙපනං හත්ථබන්ධං සිඛාබන්ධං දණ්ඩකං නාලිකං ඛග්ගං ඡත්තං චිත්‍රූපාහනං උණ්හීසං මණිං වාලවීජනිං ඔදාතානි වත්ථානි දීඝදසානි ඉතිවා ඉති එවරූපා මණ්ඩණවිභූසණඨානානුයොගා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

52 යථා වා පනෙකෙ හොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං තිරච්ඡානකථං.

කෙහෙල්මුවසමින් කළ උතුම් පසතරණය, මත්තෙහි බඳනාලද රත් වියන්සහිත දෙපසෙහි තබනලද රත්කන්වයින් ඇති ආසනායයි. මෙසේ මෙබඳුවූ උසසුන්මහස්නෙන් වැළැක්කේ වේ. මේද ඒ මහණ හුගේ ශීලය වේ

51. යම්බඳුවූ හෝ සමහර පින්වත් මහණබමුණුකෙනෙක් වෙද්ද, ඔව්හු සැදැහැයෙන් දුන් බොජුන් වළඳ මෙබඳුවූ සැරසීමය, උණු තැන් පිරවීමය, යන මේ යොගයෙහි නැවත නැවත යෙදුනාහු වෙසෙත්ද. ඒ කවරේද, සුවඳසුණු ආදියෙන් ඇඟ ඉලීමය, පිරිමැදීමය, නැවීමය, තැළීමෙන් මැඩීමය, කැඩපත් පරිහරණයකිරීමය, අඳුන් තෙල් පරිහරණය කිරීමය, ගෙතූ නොගෙතූ මල් හා විලවුන්ය, මුව සුණුය, මුවෙහි ගල්වන ආලෙපය, හස්තාභරණාදිය පැළඳීමය, රන්හු ආදියෙන් කුඩුම්බිය සිසාරා බැඳීමය, විසිතුරු දඬුගෙණ ඇවිදීමය, බෙහෙත්නල දසරුවෙහි එල්වා ඇවිදීමය, කඩු උරෙහි එල්වා ඇවිදීමය. ඡත්‍රධාරීව ඇවිදීමය, විසිතුරු වහන්පයලා ඇවිදීමය, නළල්පට බැඳීමය, ශිඛාමාණික්‍ය පැළඳීමය, වල්විදුනා දැරීමය, දික්දහඇති ධවලවස්ත්‍ර හැඳීම් ආදියයි. මෙසේ මෙබඳුවූ සැරසීම් හා අලඞ්කාර කිරීම් ආදියෙහි යෙදීමෙන් වැළැක්කේ වේ. මේද ඒ මහණහුගේ ශීලය වේ.

52. යම්බඳුවූ හෝ සමහර පින්වත් මහණබමුණුකෙනෙක් ඇද්ද, ඔව්හු සැදැහැයෙන් දුන් බොජුන් වළඳ මෙබඳුවූ තිරශ්චීන කථාවෙහි.

අනුයුත්තාවිහරන්ති. සෙය්‍යථිදං, රාජකථං චොරකථං මහාමත්ත කථං සෙනාකථං භයකථං යුද්ධකථං අන්නකථං පානකථං වත්ථ කථං සයනකථං මාලාකථං ගන්ධකථං ඤාතිකථං යානකථං ගාමකථං නිගමකථං නගරකථං ජනපදකථං ඉත්ථිකථං පුරිසකථං සූරකථං විසිඛාකථංකුම්භඨානකථං පුබ්බපෙතකථං නානත්තකථං ලොක ක්ඛායිකං සමුද්දක්ඛායිකං ඉතිභවාභවකථං ඉතිවා, ඉති එවරූපාය තිරච්ඡාන කථාය පටිවිරතො හොති. ඉදම්පිඍස්ස හොති සීලස්මිං.

53 යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විග්ගාහිකකථං අනුයුත්තා විහ රන්ති සෙය්‍යථිදං.

යෙදුනාහු වෙසෙත්. ඒ කවරේද, රජුන් අරබයා පැවැති කථාය සොරුන් අරබයා පැවැති කථාය, මහ ඇමතියන් අරබයා පැවැති කථාය, සෙනාසම්බන්ධි කථාය, බියපිළිබඳ කථාය, යුධ සම්බන්ධි කථාය, ආහාරසම්බන්ධි කථාය, පානවගී පිළිබඳ කථාය, වස්ත්‍රසම් බන්ධි කථාය, සයන සම්බන්ධිකථාය, මාලාසම්බන්ධි කථාය, සුගන්ධද්‍රව්‍යසම්බන්ධි කථාය, නෑයන් පිළිබඳ කථාය, යානා පිළි බඳ කථාය, ගම්පිළිබඳ කථාය, නියම්ගම් පිළිබඳ කථාය. නුවර පිළි බඳ කථාය, දනව් පිළිබඳ කථාය, ස්ත්‍රීන් පිළිබඳ කථාය, යොධ යන් පිළිබඳ කථාය, වීථි පිළිබඳ කථාය, ඝටවෙටිකාවන් හෝ තිථි පිළිබඳ කථාය, පෙර මළ නෑයන් අරබයා පැවැති කථාය, නානා සවභාවඇති ව්‍යාපිකථාය, විතණ්ඩනමලද ලොකාඛ්‍යායික කථාය, සමුද්‍රය පිළිබඳ කථාය, මේ කාරණයෙන් භවය, මේ කාරණයෙන් අභවයයි පැවැත්තාවූ භවාභව කථායයි. මෙසේ මෙබඳුවූ තිරශ්චීන කථාවෙන් මහණගොයුම්තෙම වැළැක්කේ වේ. මේද ඒ මහණ හුගේ ශීලය වේ.

53. යම්බඳුවූ හෝ සමහර පින්වත් මහණබමුණුකෙනෙක් ඇද්ද, ඔව්හු සැදැහැයෙන් දුන් බොජුන් වළඳ මෙබඳුවූ විවිධග්‍රාහකථා වෙහි හෙවත් සද්‍වෙෂ කථාවෙහි යෙදුනාහු වෙසෙති. කෙසේදයත්,

න ත්‍වං ඉමං ධම්මවිනයං ආජානාසි. අහං ඉමං ධම්මවිනයං ආජානාමි. කිං ත්‍වං ඉමං ධම්මවිනයං ආජානිස්සසි. මිච්ඡාපටිපන්නො ත්‍වමසි අහමස්මි සම්මාපටිපන්නො සහිතම්මෙ අසහිතන්තෙ පුරෙවචනීයං පච්ඡා අවච පච්ඡා වචනීයං පුරෙ අවච ආචිණ්ණං තෙ විපරාවත්තං ආරොපිතො තෙ වාදො නිග්ගහිතොසි චර වාදප්පමොක්ඛාය නිබ්බෙඨෙහි වා සචෙ පහොසීති ඉති වා, ඉති එවරූපාය විග්ගාහිකකථාය පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

54 යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්‍වා තෙ එවරූපං දූතෙය්‍ය පහිණ ගමනානුයොගං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං, රඤ්ඤං රාජමහාමත්තානං ඛත්තියානං බ්‍රාහ්මණානං ගහපතිකානං කුමාරානං ඉධ ගච්ඡ අමුත්‍රාගච්ඡ, ඉදං හර ඉදං ආහරාති ඉති වා, ඉති එවරූපා දූතෙය්‍ය පහිණ ගමනානුයොගා පටිවිරතො හොති ඉදම්පිස්ස හොති සීලස්මිං.

තෝ මේ ධර්මවිනය නොදන්නෙහිය, මම මේ ධර්මවිනය දනිමි, තෝ මේ ධර්මවිනය කිමෙකැයි දන්නෙහිද, තෝ වරදවා පිළිපන්නෙහිය, මම මොනවට පිළිපන්නේනම් වෙමි, මාගේ වචනය සිලුටුය, අර්ථයෙන් යුක්තය, තාගේ වචනය නොසිලුටුය, (අනර්ථයෙන් යුක්තවෙයි.) පළමුව කියයුත්ත පසුව කීයෙහිය, පසුව කියයුත්ත පළමුකොට කීයෙහිය, යමක් තාවිසින් බොහෝකල් පුරුදුකරණලදද, ඒ සියල්ල පෙරළී ව්‍යර්ථව ගියේය, තට වාදාරොපණයකරණ ලද්දේය. නිග්‍රහකරණලද්දෙහිය, වාදයෙන් මිදෙනපිණිස හැසිරෙව, ඉදින් සමර්ථයෙහිනම් දැන්ම තෝ වාදයෙන් ගැලවීයයි මෙසේ මෙබඳුවූ (විවිධග්‍රාහ) දෝෂාරොපණ කථායෙන් වැළැක්කේ වේ. මේද ඒ මහණහුගේ ශීලය වේ.

54. යම්බඳුවූ හෝ සමහර පින්වත් මහණබමුණුකෙනෙක් ඇද්ද, ඔව්හු සැදැහැයෙන් දුන් බොජුන් වළඳා මෙබඳුවූ දූතභාවය, හසුන් පත්ගෙණ යාමය, යන මේ යොගයෙහි යෙදුනාහු වෙසෙත්. ඒ කවරේද, රජුන්ගේද, රජමහඇමතියන්ගේද, ක්‍ෂත්‍රියයන්ගේද, බමුණන් ගේද, ගැහැවියන්ගේද, කුමාරයන්ගේද, හසුන්ගෙණ මෙතනින් අසවල්තැනට යව, එතනින් අසවල්තැනට එව, මෙය ගණුව, අස වල්තැනින් මෙතම් දෙයක් ගෙණඑවයි මෙසේ මෙබඳුවූ පත්හසුන් පඬුරු හා ගෙනින්ගෙට යන මෙහෙ ආදියෙහි යෙදීමෙන් වැළැක්කේ වේ. මේද ඒ මහණහුගේ ශීලය වේ.

55 යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ කුහකාච හොන්ති. ලපකාච නෙමිත්තිකාච නිප්පෙසිකාච ලාභෙන ලාභං නිජිගිංසිතාරො ඉති එවරූපා කුහනලපනාපටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සිලස්මිං.

56. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති. සෙය්‍යථිදං, අඞ්ගං නිමිත්තං උප්පාදං සුපිණං ලක්ඛණං මූසිකච්ඡින්නං අග්ගිහොමං දබ්බිහොමං ථුසහොමං කණහොමං තණ්ඩුලහොමං සප්පිහොමං තෙලහොමං මුඛහොමං ලොහිතහොමං.

---

55. යම්බඳුවූ හෝ සමහර පින්වත් මහණබමුණුකෙනෙක් ඇද්ද, ඔව්හු සැදැහැයෙන් දුන් බොජුන් වළඳ කුහකභාවයෙන් යුක්තද වෙති, සිව්පසරිසියෙන් කථාකරන්නෝද වෙති, නිමිත්ත හෙවත් ලාභසත්කාර සඳහන්කරවීම සවභාවකොට ඇත්තාහුද වෙති, පර ලාභාදිය නිසා කීම සවභාවකොට ඇත්තෝද වෙති, ලාභයකින් ලාභයක් සොයන්නෝදවෙති, මෙසේ මෙබඳුවූ කුහණලපනාදියෙන් වැළැක්කේ වේ. මේද ඒ මහණහුගේ ශීලය වේ.

56. යම්බඳුවූ හෝ සමහර පින්වත් මහණබමුණුකෙනෙක් ඇද්ද, ඔව්හු සැදැහැයෙන් දුන් බොජුන් වළඳ මෙබඳුවූ තිරශ්චීන විද්‍යාව හෙතුකොටගෙණ ලාමකජීවිකාවෙන් ජීවිකාව කෙරෙත්. ඒ කව රේද, සාමුද්‍රිකාලක්‍ෂණයයි කියූ අඞගශාස්ත්‍රය, ඒ ඒ කායචී පරීක්‍ෂා කොට කියන්නාවූ නිමිත්තශාස්ත්‍රය. අසනිපාතාදි මහත්නිමිත්තෙන් මෙබඳු ශුභාශුභ වන්නේය යි ප්‍රකාශකරන්නාවූ උත්පාදශාස්ත්‍රය, සවප්නශාස්ත්‍රය, ලක්‍ෂණශාස්ත්‍රය. වස්ත්‍රාදිය මියන් කැපූකල මෙබඳු ශුභාශුභවන්නේය යි කියන්නාවූ මූසිකශාස්ත්‍රය, අග්ගිහොමය, (ගිනිපූජාවය) හැන්දේ විශෙෂත්වය සලකා කරණ දබ්බිහොමය, පොතුවල විශෙෂත්වය සලකා කරණ ථුසහොමය, කුඩුවලවිශෙෂත්වය සලකා කරණ තණ්ඩුලහොමය, ගිතෙලේ විශෙෂත්වය සලකා කරණ සප්පිහොමය, තෙලේ විශෙෂත්වය සලකා කරණ තෙලහොමය, මුඛයෙන් අබ ආදියගෙණ ගින්නේ ලීම්වශයෙන් පැවති මුඛහොමය, දක්‍ෂිණජත්‍රුවෙහි ලෙයින් හොමකිරීමවූ ලොහිතහොමය,

අඞ්ගවිජ්ජා වත්ථුවිජ්ජා ඛත්තවිජ්ජා සිවවිජ්ජා භූතවිජ්ජා භූරිවිජ්ජා අහිවිජ්ජා විසවිජ්ජා විච්ඡිකවිජ්ජා මූසිකවිජ්ජා සකුණවිජ්ජා වායසවිජ්ජා පක්ඛජ්ඣානං සරපරිත්තාණං මිගචක්කං ඉතිවා, ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති ඉදම්පිස්ස හොති සීලස්මිං.

57. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡාන විජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති; සෙය්‍යථිදං, මණිලක්ඛණං දණ්ඩලක්ඛණං වත්ථලක්ඛණං අසිලක්ඛණං උසුලක්ඛණං ධනුලක්ඛණං ආයුධලක්ඛණං ඉත්ථිලක්ඛණං පුරිසලක්ඛණං කුමාරලක්ඛණං කුමාරිලක්ඛණං දාසලක්ඛණං දාසිලක්ඛණං හත්ථිලක්ඛණං අස්සලක්ඛණං මහිසලක්ඛණං.

සිරුර දක ශුභාශුභප්‍රකාශකරන්නාවූ අඞ්ගවිද්‍යාය, ගෘහවස්තු ආදියේ ගුණදොෂසංලක්ෂණය කරන්නාවූ වස්තුවිද්‍යාය, අභෙගය්‍යශාස්ත්‍ර මසුරක්ඛණශාස්ත්‍රාදි නීතිශාස්ත්‍රය, සොහොණෙහි ශාන්තිකරන්නාවූ විද්‍යාවහෝ සිවල්රුතවිද්‍යාය, යක්ෂාහ්වාණාදිය කරන්නාවූ භූතවිද්‍යාය, සර්පවිෂාපහරණ මන්ත්‍රාදියවූ අහිවිද්‍යාය, බිම්ගෙයිවසන්නහුවිසින් උගතයුතු මන්ත්‍රය, විෂවිද්‍යාය, ගෝනුසුදෂ්ටයට පිළියම් කිරීමවූ විච්ඡිකවිද්‍යාය, මීයන්කෑකල පිළියම්කිරීමවූ මූසිකවිද්‍යාය, සකුණවිද්‍යාය, කපුටුවන් රැව්අසා ශුභාශුභ ප්‍රකාශකරණ වායසවිද්‍යාය, මෙතෙම මෙතෙක්කල් ජීවත්වන්නේයයි මෙසේ පැවැත්තාවූ අරිෂ්ටකඥාන නම්ලද පක්ඛජ්ඣානය, ශරයන්ගෙන් ආරක්ෂකත්වියදායකවූ ශරපරිත්‍රාණය, මෘගපක්ෂීන්ගේ ශබ්දඥානවශයෙන් පැවැත්තාවූ මන්ත්‍රයයි, මෙසේ මෙබඳුවූ තිරශ්චීනවිද්‍යාව හෙතුකොටගෙණ මිථ්‍යාජීවිකාවෙන් වැළැක්කේවේ. මේද ඒමහණහුගේ ශීලයවේ.

57. යම්බඳුවූ හෝ සමහර පින්වත් මහණබමුණුකෙනෙක් ඇද්ද. ඔව්හු සැදැහැයෙන් දුන්බොජුන් වළඳා මෙබඳුවූ තිරශ්චීනවිද්‍යාව හෙතුකොටගෙණ මිථ්‍යාජීවිකාවෙන් ජීවිකාව කෙරෙත්. ඒකවරේද, මාණික්‍යයන්ගේ ශුභාශුභඥානයවූ මණිලක්ෂණය, දඬුගැන්මෙහි මෙබඳු ශුභාශුභය යි පැවැති දණ්ඩලක්ෂණය, වස්ත්‍රලක්ෂණය, ඛඩ්ගලක්ෂණය, ශරලක්ෂණය, ධනුලක්ෂණය, ආයුධලක්ෂණය, ස්ත්‍රීලක්ෂණය, පුරුෂලක්ෂණය, කුමාරලක්ෂණය, කුමාරිලක්ෂණය, දාසලක්ෂණය, දාසිලක්ෂණය හස්තිලක්ෂණය, අශ්වලක්ෂණය, මහිෂලක්ෂණය.

උසභලක්ඛණං ගොලක්ඛණං අජලක්ඛණං මෙණ්ඩකලක්ඛණං කුක්කුට ලක්ඛණං වට්ටකලක්ඛණං ගොධාලක්ඛණං කණ්ණිකාලක්ඛණං කච්ඡප ලක්ඛණං මිගලක්ඛණං ඉති වා,ඉති එවරූපාය තිරච්ඡාන විජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

58. යථාවාපනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති සෙය්‍යථීදං, රඤ්ඤං නිය්‍යානං භවිස්සති රඤ්ඤං අනිය්‍යානං භවිස්සති අබ්භන්තරානං රඤ්ඤං උපයානං භවිස්සති බාහිරානං රඤ්ඤං අපයානං භවිස්සති බාහිරානං රඤ්ඤං උපයානං භවිස්සති අබ්භන්තරානං රඤ්ඤං අපයානං භවිස්සති අබ්භන්තරානං රඤ්ඤං ජයො භවිස්සති, බාහිරානං රඤ්ඤං පරාජයො භවිස්සති බාහිරානං රඤ්ඤං ජයො භවිස්සති, අබ්භන්තරානං රඤ්ඤං පරාජයො භවිස්සති ඉති ඉමස්ස ජයො භවිස්සති, ඉමස්ස පරාජයො භවිස්සති. ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

වෘෂභලක්‍ෂණය, ගොලක්‍ෂණය, අජලක්‍ෂණය, මෙණ්ඩකලක්‍ෂණය කුක්කුටලක්‍ෂණය, වර්තිකලක්‍ෂණය, ගොධාලක්‍ෂණය, කර්ණිකාලක්‍ෂණය, කච්ඡපලක්‍ෂණය, මෘගලක්‍ෂණය, කියා හෝ මෙසේ මෙබඳුවූ තිරශ්චිනවිද්‍යාව හෙතුකොටගෙණ මිථ්‍යාජීවිකාවෙන් වැළැක්කේ වේ. මේද ඒමහණහුගේ ශියලවේ.

58. යම්බඳුවූ හෝ සමහර පින්වත් මහණබමුණුකෙනෙක් ඇද්ද, ඔව්හු සැදැහැයෙන් දුන් බොජුන් වළඳා මෙබඳුවූ තිරශ්චිනවිද්‍යාව හෙතුකොටගෙණ මිථ්‍යා (ලාමක) ජීවිකාවෙන් ජීවිකාව කෙරෙත්. ඒ කවරේද, අසෝදින රජහුගේ බැහැරයාම වන්නේය, රජහුගේ ඇතුළට පැමිණීම වන්නේය, ඇතුළුනුවරඋන් රජුවෙතට (අප රජ්ජුරුවන්ගේ) යාම වන්නේය, බාහිර රජුන්ගේ බැහැර යාම වන්නේය, බාහිරරජුන්ගේ ඇතුළුනුවර ඊම වන්නේය, ඇතුළුනුවර රජුන්ගේ පෙරළායාම වන්නේය,ඇතුළුනුවර රජුන්ට ජයවන්නේය, පිටතවූ රජුන්ට පරාජයවන්නේය, බාහිර රජුන්ට ජයවන්නේය, ඇතුළුනුවර රජුන්ට පරාජයවන්නේය, මෙසේ මොහුට ජයවන්නේය, මොහුට පරාජයවන්නේයයි, කියා හෝ මෙසේ මෙබඳුවූ තිරශ්චිනවිද්‍යාව හෙතුකොටගෙණ මිථ්‍යා ජීවිකාවෙන් වැළැක්කේ වේ. මේද ඒ මහණහුගේ ශීලයවේ.

59. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡාන විජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති. සෙය්‍යථිදං, චන්දග්ගාහො භවිස්සති සුරියග්ගාහො භවිස්සති, නක්ඛත්තග්ගාහො භවිස්සති, චන්දිමසුරියානං පථගමනං භවිස්සති, චන්දිමසුරියානං උප්පථගමනං භවිස්සති, නක්ඛත්තානං පථගමනං භවිස්සති, නක්ඛත්තානං උප්පථගමනං භවිස්සති, උක්කාපාතො භවිස්සති, දිසාදාහො භවිස්සති, භූමිචාලො භවිස්සති, දෙවදුන්දුභි භවිස්සති, චන්දිමසුරියනක්ඛත්තානං උග්ගමනං ඔගමනං සංකිලෙසං වොදානං භවිස්සති, එවංවිපාකො චන්දග්ගාහො භවිස්සති, එවං විපාකො සුරියග්ගාහො භවිස්සති, එවංවිපාකො නක්ඛත්තග්ගාහො භවිස්සති, එවංවිපාකං චන්දිමසුරියානං පථගමනං භවිස්සති, එවංවිපාකං චන්දිමසුරියානං උප්පථගමනං භවිස්සති, එවංවිපාකො නක්ඛත්තානං පථගමනං භවිස්සති, එවංවිපාකං නක්ඛත්තානං උප්පථගමනං භවිස්සති, එවංවිපාකො උක්කාපාතො භවිස්සති, එවං විපාකො දිසාදාහො භවිස්සති

59. යම්බඳුවූ හෝ සමහර පින්වත් මහණබමුණුකෙනෙක් ඇද්ද, ඔව්හු සැදූහැයෙන් දුන් බොජුන් වලඳා මෙබඳුවූ තිරශ්චීනවිද්‍යාව හෙතුකොටගෙණ මිථ්‍යා ජීවිකාවෙන් ජීවිකාවකෙරෙත්. ඒකවරේද, චන්ද්‍රග්‍රහණය වන්නේය, සූර්‍ය්‍යග්‍රහණය වන්නේය, (ග්‍රහ) තාරකාවන්ගේ සමාගමය වන්නේය, චන්ද්‍රසූර්‍ය්‍යයන්ගේ මාර්ගයෙහි ගමන වන්නේය, චන්ද්‍රසූර්‍ය්‍යයන්ගේ අමාර්ගයෙහි ගමන වන්නේය,(ග්‍රහ) තාරකාවන්ගේ මාර්ගයෙහි ගමන වන්නේය, තාරකාවන්ගේ අමාර්ගයෙහි ගමන වන්නේය, උල්කාපාත වන්නේය, දිගුන්දූවිම වන්නේය, පොළව සැලීම වන්නේය, අසනිපාතවශයෙන් අහසගිගුම් වන්නේය. චන්ද්‍රසූර්‍ය්‍යනක්ෂත්‍රයන්ගේ නැගීමද අස්තයට යාමද, කෙලෙසීමද, පිරිසිදුබවද, වන්නේය, චන්ද්‍රග්‍රහණය මෙබඳු විපාක ඇතිවන්නේය, සූර්‍ය්‍යග්‍රහණය මෙබඳුවිපාක ඇතිවන්නේය, නක්ෂත්‍ර සමාගමය මෙබඳුවිපාක ඇතිවන්නේය, චන්ද්‍රසූර්‍ය්‍යයන්ගේ මාර්ගයෙහි ගමන මෙබඳුවිපාක ඇතිවන්නේය, චන්ද්‍රසූර්‍ය්‍යයන්ගේ නොමග ගමන,මෙබඳුවිපාක ඇතිවන්නේය,ග්‍රහතාරකාවන්ගේ මාර්ගයෙහි ගමන මෙබඳුවිපාක ඇතිවන්නේය, නක්ෂත්‍රතාරකාවන්ගේ නොමග ගමන මෙබඳුවිපාක ඇතිවන්නේය, උල්කාපාතය මෙබඳු විපාක ඇතිවන්නේය, දිගුන්දූවීම මෙබඳුවිපාක ඇතිවන්නේය,

එවං විපාකො භූමිචාලො භවිස්සති, එවංවිපාකො දෙවදුන්දුභි භවිස්සති, එවං විපාකං චන්දිමසුරියනක්ඛත්තානං උග්ගමනං ඔගමනං සඞ්කිලෙසං වොදානං භවිස්සති ඉතිවා, ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

60. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධා දෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡාන විජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති. සෙය්‍යථීදං, සුබ්බුට්ඨිකා භවිස්සති, දුබ්බුට්ඨිකා භවිස්සති, සුභික්ඛං භවිස්සති, දුබ්භික්ඛං භවිස්සති, ඛෙමං භවිස්සති, භයං භවිස්සති, රොගො භවිස්සති, ආරොග්‍යං භවිස්සති, මුද්දා ගණනා සංඛානං කාවෙය්‍යං ලොකායතං ඉතිවා, ඉති එවරූපාය තිරච්ඡාන විජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති ඉදම්පිස්ස හොති. සීලස්මිං.

61. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධා දෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ.

පොළොව සැලීම මෙබඳුවිපාක ඇතිවන්නේය, ශුෂ්කවලාහකගර්ජනා මෙබඳුවිපාක ඇතිවන්නේය, චන්ද්‍රසූර්‍ය්‍යනක්ෂත්‍රයන්ගේ නැගීමද, අස්තයට යාමද කිළුටුබවද පිරිසිදුබවද මෙබඳුවිපාක ඇතිවන්නේය, කියා හෝ මෙසේ මෙබඳු තිරශ්චීනවිද්‍යාවහෙතුකොට ගෙණ මිථ්‍යා ජීවිකාවෙන් වැළැක්කේවේ. මේද ඒ මහණහුගේ ශීලයවේ.

60. යම්බඳුවූ හෝ සමහර පින්වත් මහණබමුණුකෙනෙක් ඇද්ද, ඔව්හු සැදැහැයෙන් දුන් බොජුන් වළඳ මෙබඳුවූ තිරශ්චීනවිද්‍යාව හෙතුකොටගෙණ මිථ්‍යාජීවිකාවෙන් ජීවිකාවකෙරෙත්, ඒකවරේද, මනාවැසිඇතිවන්නේය. නපුරුවැසිඇතිවන්නේය, යහපත් භික්ෂා ඇතිවන්නේය, දුර්භික්ෂ වන්නේය, නිර්භය වන්නේය, භයවන් නේය, රොගඇති වන්නේය, නිරොගිබව වන්නේය, ඇඟිල්ල ඇල්වීමය, ගිණීමය, පුඩුගණනය, කාව්‍යකිරීමය, විතණ්ඩශාස්ත්‍ර ඉගණීමය කියා හෝ මෙසේ මෙබඳුවූ තිරශ්චීනවිද්‍යාව හෙතුකොටගෙණ මිථ්‍යාජීවිකාවෙන් වැළැක්කේවේ. මේද ඒ මහණහුගේ ශීලයවේ.

61. යම්බඳුවූහෝ සමහරපින්වත් මහණබමුණුකෙනෙක් ඇද්ද. ඔව්හු සැදැහැයෙන් දුන් බොජුන් වළඳ.

එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති. සෙය්‍යථිදං, ආවාහනං විවාහනං සංවදනං විවදනං සංකිරණං විකිරණං සුභගකරණං දුබ්භගකරණං විරුඩගබ්භකරණං ජිව්හානිබන්ධනං හනුසංහනනං හත්ථාභිජප්පනං කණ්ණජප්පනං ආදාසපඤ්හං කුමාරිපඤ්හං දෙවපඤ්හං ආදිච්චුපට්ඨානං මහතුපට්ඨානං අබ්භුජ්ජලනං සිරව්හායනං ඉතිවා, ඉති එවරූපාය තිරච්ඡාන විජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති, ඉදම්පිස්ස හොති සීලස්මිං.

62. යථා වා පනෙකෙ හොන්තො සමණබ්‍රාහ්මණා සද්ධා දෙය්‍යානි. භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡාන විජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති සෙය්‍යථිදං සන්තිකම්මං පණිධිකම්මං භූතකම්මං.

මෙබඳුවූ තිරශ්චීනවිද්‍යාව හෙතුකොටගෙණ මිථ්‍යාජීවිකාවෙන් ජීවිකාව කෙරෙත්. ඒ කවරේද, ආවාහ කරවීමය, විවාහ කරවීමය, සමගිය පිළිබඳ යහපත්කථා කිරීමය, වියොගය පිළිබඳ කථාකිරීමය, ධනරැස්කිරීමය, ව්‍යය කරවීමය, මනොඥශ්‍රීකිරීමය, ගර්භයනොනස්නාපිණිස බෙහෙත් දීම්වූ ගර්භ විරොධිකරණය, දිවසොල්වාගතනොදී තදකිරීමය, හනුබන්ධනය කිරීමය, අත්පෙරළවන පිණිස මන්ත්‍රකිරීමය, ශබ්දනො ඇසීමපිණිස මන්ත්‍රජපකිරීමය, කැටපත්හි දෙවතාරොපණයකොට ප්‍රශ්නවිචාරීමය, කුමාරියගේ සිරුරෙහි දෙවතාරොපණයකොට ප්‍රශ්නවිචාරීමය, දෙවදාසියගේ සිරුරෙහි යකුන්නංවා ප්‍රශ්න විචාරීමය, සූය්‍ය්‍යයාට නමස්කාරකිරීමය, මහබඹුටඋවැටැන් හෝ නැමදුම් කිරීමය, මුඛයෙන්ගිනිදැල්පිටත් කිරීමය, ශ්‍රීදෙවිය ආභ්වානය කිරීමය (කැඳවීමය) යි මෙසේ මෙබඳුවූ සගමොක් මුවහකරණ තිරශ්චීනවිද්‍යාව හෙතුකොටගෙණ මිථ්‍යාජීවිකාවෙන් වැළැක්කේ වේ. මේද ඒ මහණහුගේ ශීලයවේ.

62. යම්බඳුවූහෝ සමහරපින්වත් මහණබමුණුකෙණෙක් ඇද්ද, ඔව්හු සැදැහැයෙන් දුන් බොජුන් වළඳ මෙබඳුවූ තිරශ්චීන විද්‍යාව හෙතුකොටගෙණ මිථ්‍යාජීවිකාවෙන් ජීවිකාව කෙරෙත්. ඒකවරේද, ශාන්තිප්‍රතිඥතකර්මය, කාය්‍ය්‍යසමෘද්ධියෙන් පසු කාටයුතු ප්‍රණිධිකර්මය, බිම්ගෙයි වැස උගත් මන්ත්‍රයාගේ ප්‍රයොගකිරීමය.

භූරිකම්මං වස්සකම්මං වොස්සකම්මං වත්ථුකම්මං වත්ථුපරිකිරණං ආචමනං නහාපණං ජුහනං වමනං විරෙචනං උද්ධවිරෙචනං අධො විරෙචනං සීසවිරෙචනං කණ්ණතෙලං නෙත්තතප්පණං නත්ථුකම්මං අඤ්ජනං පච්චඤ්ජනං සාලාකියං සල්ලකත්තිකං දාරකතිකිච්ඡා මූලභෙසජ්ජානං අනුප්පාදනං ඔසධීනං පටිමොක්ඛො ඉතිවා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති ඉදම්පිස්ස හොති සීලස්මිං.

63 ස ඛො සො මහාරාජ භික්ඛු එවංසීලසම්පන්නො න කුතොචි භයංසමනුපස්සති. යදිදංසීලසංවරතො. සෙය්‍යථාපි මහාරාජඛත්තියො මුද්ධාභිසිත්තො නිහිත පච්චාමිත්තො න කුතොචි භයං සමනුපස්සති යදිදංපච්චත්ථිකතො. එවමෙවඛොමහාරාජභික්ඛුඑවං සීලසම්පන්නො න කුතොචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතො.

පණ්ඩකයාපුරුෂකිරීමය, පුරුෂයාපණ්ඩකකිරීමය, පළමුගෙවල් නොකළබිම ගෙවල් කිරීමය, ගෘහවස්තුවට සුදුසුතන්හි බලිවිධානකිරීමය, උදකයෙන් මුඛශුද්ධ කිරීමය, අනුන් නැහැවීමය, අනුන්ගේ කාර්‍ය්‍යය නිසා ගිනිපිදීමය, වමනකිරීමය, විරේකකරවීමය, නැබින් මතු දෝෂහැරීමට ඌර්ධ්ව විරෙචනය, නැබින් යට දෝෂ හැරීමට අධොවිරෙචනය සිරොවිරෙක කිරීමය, කන්තෙලය, නෙත්‍රතර්පණය නොහොත් අක්ෂිසන්තාපයට බෙහෙත් යෙදීමය, නස්‍ය කිරීමය, ක්ෂාරාඤ්ජන ඉදිකිරීමය, සිහිල්බෙහෙත් අඳුන් ඉදිකිරීමය, සැත්කටුලා කටයුතුවෛද්‍යකමය, ශල්‍යකර්තෘහුවිසින් කටයුතු වෛද්‍යකමය, කුමාරපොෂණය පිළිබඳ වෛද්‍යකමය, ශනාදිබෙහෙත් ද්‍රව්‍යයෙන් කටයුතු ශරීරචිකිත්සාය, සුදුසු තදබෙහෙත්දී පසුව එහිබලය හැරීමය කියාහෝ මෙසේ මෙබඳුවූ තිරශ්චීනවිද්‍යාව හෙතුකොට ගෙණ මිථ්‍යාජීවිකාවෙන් වැළැක්කේ වේ. මේද ඒ මහණහුගේ ශීලය වේ.

63 එම්බා මහරජ, මෙසේ ශීලයෙන් සම්පූර්ණවූ ඒ මේ මහණහට අසංවරයමුල්කොටඇති යම් ඒ භයකාරණයෝ උපදින්නාහුද, ඔවුනතුරෙන් එක්බියකුන් කිසිතැනකදී මේ ශීලසංවරය හෙතුකොට ගෙණ නොදක්නේය. කෙසේදයත්. මහරජ ක්ෂත්‍රියාභිෂෙකයෙන් මුදුනෙහි අභිෂෙකකරණලද නසනලදපසමිතුරන්ඇති ක්ෂත්‍රියරජෙක් කිසියම් පසමිතුරෙකුගෙන් කිසිභයක් නොදක්නේද මහරජ, එපරිද්දෙන්ම ශීලයෙන්සම්පූර්ණවූ භික්ෂුතෙමේ අසංවරය මුල්කොට උපදනා භයකාරණයන් අතුරෙන් එකකුන් මේ ශීලසංවරය හෙතුකොටගෙණ කිසියම්තැනකදී නොදක්නේය.

සො ඉමිනා අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො අජ්ඣත්තං අනවජ්ජසුඛං පටිසංවෙදෙති. එවං ඛො මහාරාජ භික්ඛුසීලසම්පන්නො හොති.

64 කථඤ්ච මහාරාජ භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති. ඉධ මහාරාජ භික්ඛු චක්ඛුනා රූපං දිස්වා නනිමිත්තග්ගාහී හොති. නානුව්‍යඤ්ජනග්ගාහී යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතංවිහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං තස්ස සංවරාය පටිපජ්ජති රක්ඛති, චක්ඛුන්ද්‍රියං, චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති සොතෙන සද්දං සුත්වා—පෙ—ඝානෙන ගන්ධං ඝායිත්වා—පෙ—ජිව්හාය රසං සායිත්වා—පෙ—කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා—පෙ—මනසා ධම්මං විඤ්ඤාය නනිමිත්තග්ගාහී හොති නානුව්‍යඤ්ජනග්ගාහී යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං තස්ස සංවරාය පටිපජ්ජති, රක්ඛති මනින්ද්‍රියං, මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති.

ශ්‍රෙෂ්ඨවූ මේ ශීලරාශියෙන් යුක්තවූ ඒ භික්‍ෂුතෙමෙ සියසතන්තුල නිර්දොෂවූ හෙවත් ප්‍රීතිප්‍රමොද්‍යාදියෙන් පරිග්‍රහණයකරණලද කායික චෛතසික සැපය විඳී. මහරජ මෙසේ භික්‍ෂුතෙමේ ශීලසම්පන්න වේ.

64 මහරජ භික්‍ෂුතෙමෙ කෙසේනම් ෂඩින්‍ද්‍රියයන්හි වසනලද දොරඇත්තේවේද, මහරජ මේ සස්නෙහි මහණෙක් චක්‍ෂුරින්ද්‍රියයෙන් රූපයක්දැක ශුභය සුඛය යනාදීන් අරමුණුනොගන්නේවේද. අනුව්‍යඤ්ජනවශයෙන් නොගන්නේවේද යම්ක්හෙතුකොටගෙණ මේ චක්‍ෂුරින්ද්‍රියයෙහි සංවරරහිතවවාසයකරන්නාහුට අභිද්‍යාදෞර්මනස්‍යාදි ලාමක අකුශලධර්මයෝ වැඟිපවත්නාහුද ඔහුගේ සංවරය පිණිසපිළිපදීද, චක්‍ෂුරින්ද්‍රිය රකීද, චක්‍ෂුරින්ද්‍රියකෙරෙහි සංවරයට පැමිණේද. ශ්‍රොත්‍රෙන්ද්‍රියයෙන් ශබ්දයක්අසා—පෙ—ඝ්‍රාණෙන්ද්‍රියයෙන් ගන්ධයක් ආඝ්‍රාණයකොට—පෙ—ජිහ්වේන්ද්‍රියයෙන් රසාස්වාදනයකොට—පෙ—කායෙන්ද්‍රියයෙන් ස්ප්‍රෂ්ටව්‍යයක් ස්පර්ශකොට—පෙ—සිතින් ධර්මයක්. දැනගෙණ නිමිතිනොගන් තේවේද. අනුව්‍යඤ්ජනවශයෙන් නොගන්නේවේද, යමක්හෙතුකොටගෙණ මේ මනෙන්ද්‍රියයෙහි සංවර රහිතකොට වාසයකරන්නාහට අභිද්‍යාදෞර්මනස්‍යාදිවූ ලාමකඅකුශල ධර්මයෝ වැඟිපවත්නාහුද, ඔහුගේ සංවරයපිණිස පිළිපදීද මනෙන්ද්‍රිය රක්‍ෂාකෙරේද මනෙන්ද්‍රියයෙහි සංවරයට පැමිණේද.

සො ඉමිනා අරියෙන ඉන්ද්‍රියසංවරෙණ සමන්නාගතො අජ්ඣත්තං අව්‍යාසෙකසුඛං පටිසංවෙදෙති එවං ඛො මහාරාජ භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති.

65 කථඤ්ච මහාරාජ භික්ඛු සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො හොති, ඉධමහාරාජභික්ඛුඅභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී හොති, ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී හොති, සම්මිඤ්ජිතෙ පසාරිතෙසම්පජානකාරීහොති, සඞ්ඝාටිපත්තචීවරධාරණෙ සම්පජාන කාරී හොති, අසිතෙ පීතෙ ඛායිතෙ සායිතෙ සම්පජානකාරී හොති, උච්චාරපස්සාවකම්මෙසම්පජානකාරීහොතිගතෙඨිතෙනිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙතුණ්හීභාවෙ සම්පජානකාරීහොති. එවං ඛො මහාරාජ භික්ඛු සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො හොති.

66 කථඤ්ච මහාරාජ භික්ඛු සන්තුට්ඨො හොති. ඉධ මහාරාජ භික්ඛුසන්තුට්ඨො හොති, කායපරිහාරිකෙන චීවරෙන.

ඒ භික්ෂු තෙමේ ආයඝීවූ ශීලරාශියෙන් යුක්තවූයේසතන්තුළපිරිසිදුවූ අඛිච්ඡනසුවයවිඳී. මහරජ මෙසේ භික්ෂුතෙමේ ඉන්‍ද්‍රියයන්හි වසනලද දෙරඇත්තේ වේ.

65. මහරජ කෙසේනම් භික්ෂුතෙමේ ස්මෘතිසම්ප්‍රයුක්තසම්‍යක් ප්‍රඥාවෙන් යුක්තවේද, මහරජ මේ සස්නෙහි මහණෙක්, ඉදිරියට යාමෙහිද, ආපසුකරකැවීමෙහිද, ප්‍රඥාවෙන්දැන පරාමර්ශනයකොට (සත්‍වනොවූ කායසම්මතවූ ඇටසැකිල්ලෙක් ඉදිරියටයාම්ආදී ක්‍රියා කරන්නේයයිසලකා දැන) කරන්නේද. අභිමුඛය බැලීමෙහිද, අනුදික්බැලීමෙහිද, ප්‍රඥාවෙන්දැන මෙසේයයි බලන්නේද. හස්ත පාදයන් හැකිලීමෙහිද, දිගුකිරීමෙහිද, ප්‍රඥාවෙන්දැන (ඒ ඒ ප්‍රයො ජන සලකා) කරන්නේද. සංඝාටිපාසිවුරුදැරීමෙහිද, (ධාතුසමූ හයෙක් ධාතුසමූහයක් වැලඳගණීයනාදි ක්‍රමයෙන්) ප්‍රඥාවෙන්දැන සැලකීමෙන්යෙදී වැලඳගන්නේවේද. අනුභවකිරීමෙහිද, පානයකිරී මෙහිද, (ඛාද්‍යාදිවිකෘතීන්ගේ) කෑමෙහිද, (මීසකුරු ආදීන්ගේ)රස විඳීමෙහිද, නුවනින්දැනසලකා ප්‍රයොජනවිඳින්නේවේද.(ශරීරයෙන්) මලමූත්‍ර පහකිරීමෙහිද, ප්‍රඥාවෙන්දැන ආදීනවසලකා (ශරීරකෘත්‍ය) පවත්වන්නේද. යාමෙහිද, සිටීමෙහිද, හිඳීමෙහිද, නිද්‍රාවකිරීම හා නිදිදුරුකිරීමෙහිද, කථනයකිරීමෙහිද, කථානොකිරීමෙහිද, ප්‍රඥා වෙන්දැන ඒ ඒ කෘත්‍යකරන්නේවේද, මහරජ මෙසේවූකලී මහණ තෙමේ ස්මෘතිසම්ප්‍රයුක්තසම්‍යක්ප්‍රඥාවෙන් සමන්විත වේ.

66. මහරජ මහණතෙමෙ කෙසේනම් දෙලොස්පරිදිවූ ඉතරෙතර ප්‍රත්‍යයසන්තොෂයෙන්සතුටුසිත්ඇත්තේ වේද, මහරජමේසස්නෙහි මහණෙක් කායපරිහරණයට ප්‍රමාණවූ සිවුරෙන්ද,

කුච්ඡිපරිහාරිකෙන පිණ්ඩපාතෙන, සො යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති, සෙය්‍යථාපි මහාරාජ පක්ඛී සකුණො යෙන යෙනෙව ඩෙති සපත්තභාරොව ඩෙති. එවමෙව ඛො මහාරාජ භික්ඛු සන්තුට්ඨො හොති, කායපරිහාරිකෙන චීවරෙන කුච්ඡිපරිහාරිකෙන පිණ්ඩපාතෙන, සො යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති. එවං ඛො මහාරාජ භික්ඛු සන්තුට්ඨො හොති.

67. සො ඉමිනා අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො ඉමිනා ච අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො, ඉමිනා ච අරියෙන සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො, ඉමාය ච අරියාය සන්තුට්ඨියා සමන්නාගතො විවිත්තං සෙනාසනං භජති. අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං.

කුක්ෂිපරිහරණයට ප්‍රමාණවූ පිණ්ඩපාතභොජනයෙන්ද, සතුටුසිත් ඇත්තේවේද, ඒ මහණතෙමේ යම්යම් තැනෙක්හිම ගමනය කෙරේද, අටපිරිකරරැගෙණම ගමන්කෙරේ. (මාගේ පිරිවෙණය විහාරය උපස්ථායකයෝයයි බැඳීමක් නැත්තෙන් දුනුදියෙන් මිදුනු ඊතලයමෙන්ද, සමූහයා කෙරෙන් බැහැරගිය මත්ඇතෙකුමෙන්ද, වනලැහැබ් රුක්මුල් කඳුරැලි ආදී සෙනසුන් ඇසුරු කරමින් විදර්ශක භික්ෂුතෙමේ හැසිරෙයි.) මහරජ පියාපත්වලින් යුක්තවූ පක්ෂිතෙමේ යම් යම් තැනෙක්හි යේනම් ඒ හැමතන්හිම පක්ෂපත්‍රභාරසහිතවූයේම යම්සේ පියාඹාද මහරජ එපරිද්දෙන්ම යොගාවචර භික්ෂුතෙමේ කායපරිහරණයට ප්‍රමාණවූ චීවරයෙන්ද, කුච්ඡිපරිහරණයට ප්‍රමාණවූ පිණ්ඩපාත භොජනයෙන්ද, ඉතරෙතරසන්තොෂයෙන් සතුටුවේද, ඒ භික්ෂු තෙමේ යම් යම් තැනකට ගමන්කෙරේද, අටපිරිකරරැගෙණ බැහැරයේ. මහරජ, භික්ෂුතෙමේ මෙසේ ඉතරෙතර සන්තොෂයෙන් සතුටුසිත් ඇත්තේවේ.

67. ශ්‍රෙෂ්ඨවූ මේ ශීලස්කන්ධයෙන් සමන්විතවූද ශ්‍රෙෂ්ඨවූ මේ ඉන්ද්‍රිය සංවරශීලයෙන් සමන්විතවූද මේ ශ්‍රෙෂ්ඨ ස්මෘතිසම්ප්‍රයුක්ත සම්‍යක් ප්‍රඥවෙන් යුක්තවූද, මේ ශ්‍රෙෂ්ඨවූ ඉතරෙතරසන්තොෂයෙන් සමන්විතවූද, ඒ යොගාවචර භික්ෂුතෙමේ දුනුපන්සියයකින් ඔබ්බෙහිවූ අරණ්‍යයද, ශාන්ද්‍රච්ඡායා ඇතිජනශූන්‍යවූ වෘක්ෂමූලද, ජලයෙන් බිඳුනු පර්වතපෙදෙස්ද කඳුරැලිද, පර්වතගුහා හෝ මහාඋමගද, සොහොන්ද ග්‍රාමසීමාව ඉක්මවා පැවැති කෘෂිකර්මාදිය කරණුනොලබන ඉතාදුරවන සෙනසුන්ද, සිවිරුකුටිආදියකිරීමෙන් අභ්‍යවකාශස්ථානද.

පල්ලපුඤ්ජං. සො පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො නිසීදති,පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා.

68. සො අභිජ්ඣං ලොකෙ පහාය විගතාභිජ්ඣෙන චෙතසා විහරති, අභිජ්ඣාය චිත්තං පරිසොධෙති. ව්‍යාපාදපදොසං පහාය අව්‍යාපන්නචිත්තො විහරති, සබ්බපාණභූතහිතානුකම්පී. ව්‍යාපාදපදොසා චිත්තං පරිසොධෙති ථිනමිද්ධං පහාය විගතථිනමිද්ධො විහරති, ආලොකසඤ්ඤී සතො සම්පජානො ථිනමිද්ධා චිත්තං පරිසොධෙති. උද්ධච්චකුක්කුච්චං පහාය අනුද්ධතො විහරති, අජ්ඣත්තං වූපසන්තචිත්තො උද්ධච්චකුක්කුච්චා චිත්තං පරිසොධෙති. විචිකිච්ඡං පහාය.

මහත් පිදුරුරැසින් ගිරිලෙන්පරිද්දෙන් කළ පිදුරු ගුහාද යන මේ ජනයාගෙන් හිස්වූ සෙනසුන් සෙවනයකෙරෙයි. ඒ භික්‍ෂුතෙමේ පසුබත්කල්හි පිණ්ඩපාතභොජනයෙන් වැළැක්කේ පයඞ්කාභොගකොටගෙණ ඌර්ධ්වකය ඇදනැතිසේ පිහිටුවා සිහිය නිවන්සැපයෙහිම එලඹසිටුවා ඒනිවණම අරමුණුකරමින් අභිමුඛකොට පිහිටුවාගෙණ හිඳී.

68. ඒ යොගාවචරතෙම ලොකයෙහි අභිධ්‍යායයි කියනලද ලොභය පහකොට ලොභරහිතසිතින් යුක්තව වාසයකෙරේ. ලොභයෙන් සිත පිරිසිදුකෙරේ. සිතදූෂ්‍යය කරන්නාවූ ක්‍රොධය පහකොට ක්‍රොධවශයෙන් විපතට පැමිණිසිත්නැත්තේ ප්‍රාණිවූ සියල්ලන්කෙරෙහි හිතකාරණයෙන් අනුකම්පා කරමින් වාසයකෙරේ. අතිශයින් කිළුටු කරන්නාවූ ක්‍රොධයෙන් සිතපිරිසිදුකෙරේ. රූපාදිකිසිඅරමුණක් සිතින්ගැන්මෙහි අසමර්ථවූ සිතසැඟවීමවූ ලීනභාවයයි කියනලද සිත අලස බවද, පඤ්චස්කන්ධයන් අතුරෙන් වෙදනාසඤ්ඤාසංඛාර යන සකන්ධ තුන්දෙනාගේ යම්කිසි කායයියකට යොමුවීමක් නිදිගත්කල නැතිහෙයින් එසේවූ කටයුත්තට නුසුදුසුබවයයි කියනලද කය අලසබවද, පහකොට පහවූ සිත අලසබව හා කයඅලසබව ඇත්තේ,ආලොකසංඥාඇත්තේ,සිහිඇත්තේ,යහපත්ප්‍රඥාඇත්තෙක්ව වාසයකෙරේ. ථිනමිද්ධනිවරණයෙන් සිත පිරිසිදුකෙරේ. ගලකින් ගසනලද අලුරැසක්මෙන් විසිරපවත්නාවූ උද්ධතබව හා කරණලද සුචරිත දුශ්චරිත දෙකට පසුව ශොකකිරීම ලක්‍ෂණකොටඇති කුකුස දැයි කියූ උද්ධච්චකුක්කුච්චනීවරණය දුරුකොට සැකියසන්තානයෙහි සංසිඳුනු සිත්ඇතිව වාසයකෙරේ. බුද්ධාදි අටතන්හි සැකකිරීම් වශයෙන් නානාප්‍රකාර කාරණයන් සොයමින් දුකටපැමිණීම ලක්‍ෂණකොට ඇති විචිකිච්ඡානීවරණය දුරුකොට.

තිණ්ණවිචිකිච්ඡො විහරති, අකථංකථී කුසලෙසු ධම්මෙසු විචිකිච්ඡාය චිත්තං පරිසොධෙති.

69. සෙය්‍යථාපි මහාරාජ පුරිසො ඉණං ආදාය කම්මන්තෙ පයොජෙය්‍ය, තස්ස තෙ කම්මන්තා සමිජ්ඣෙය්‍යුං, සො යානි ච පොරාණානි ඉණමූලානි තානි ච ව්‍යන්තීකරෙය්‍ය, සියා චස්ස උත්තරිං අවසිට්ඨං දාරභරණාය. තස්ස එවමස්ස, අහං ඛො පුබ්බෙ ඉණං ආදාය කම්මන්තෙ පයොජෙසිං, තස්ස මෙ තෙ කම්මන්තා සමිජ්ඣිංසු, සොහං යානි ච පොරාණානි ඉණමූලානි තානි ච ව්‍යන්තී අකාසිං, අත්ථි ච මෙ උත්තරිං අවසිට්ඨං දාරභරණායාති. සො තතොනිදානං ලභෙථ පාමුජ්ජං අධිගච්ඡෙය්‍ය සොමනස්සං.

70. සෙය්‍යථාපි මහාරාජපුරිසො ආබාධිකො අස්ස දුක්ඛිතො බාළ්හගිලානො, භත්තං චස්ස නච්ඡාදෙය්‍ය, න චස්ස කායෙ බලමත්තා. සො අපරෙන සමයෙන තම්හා ආබාධා මුච්චෙය්‍ය භත්තඤ්චස්ස ඡාදෙය්‍ය සියාචස්ස කායෙ බලමත්තා. තස්ස එවමස්ස.

තරණයකර ණලද විචිකිච්ඡාඇත්තේ කුශලධර්මවිෂයෙහි කෙසේ කෙසේදැයි පැවති සැකනැතිව වාසයකෙරේ. විචිකිච්ඡානිවරණයෙන් සිත පිරිසිදුකෙරේ.

69. මහරජ, යම්සේ පුරුෂයෙක් නයගෙණ කර්මාන්තයන් යොදත්තේද, ඔහුගේ ඒ කර්මාන්තයෝ සමෘඬ වන්නාහුනම් ඔහුගේ පුරාණවූ යම් නයමුදල් වෙත්නම් ඒ සියල්ල ගෙවන්නේය. ඔහුගේ අඹුදරුවන් පොෂණයකරගැන්මට වැඩි යමක් ඉතුරුවූයේනම් ඕහට මෙබඳු අදහසක් වන්නේය. මමවූකලි පළමුකොට නය ගෙණ කර්මාන්තයන් යෙදවූයෙමි, මාගේ ඒ සියලු කර්මාන්තයෝ සමෘඬවූහ. ඒ මම පළමුතිබුනු නයමුදල් ආදිය ගෙවීමකෙළෙමි. මාගේ අඹුදරුවන් පොෂණයකරගැන්මටද වැඩි යමක් මට ඉතුරුවියයි ඒ පුරුෂතෙම එයම මූලකාරණාකොටගෙණ ප්‍රමුදිතභාවය ලබන්නේය. සතුටටද පැමිණෙන්නේය.

70. මහරජ, යම්සේ ආබාධඇත්තාවූ, දුක්ඇත්තාවූ, දැඩිගිලන්බැව් ඇත්තාවූ, පුරුෂයෙක් වන්නේද, ඕහට (බත්) ආහාරරුචි නොවන්නේද, ඔහුගේ ශරීරයෙහි බලය නැත්තේද, ඒ පුරුෂතෙම මදකලකදී ඒ ආබාධයෙන් මිදෙන්නේද, ඕහට ආහාරද රුචිවන්නේනම්, ඔහුගේ ශරීරයෙහි බලයද ඇතිවන්නේනම්, ඕහට මේ අදහසඇතිවන්නේය.

අහං ඛො පුබ්බෙ ආබාධිකො අහොසිං දුක්ඛිතො බාළ්හගිලානො භත්තං ච මෙ නච්ඡාදෙසි න ච මෙ ආසි කායෙ බලමත්තා. සොම්හි එතරහි තම්හා ආබාධා මුත්තො භත්තඤ්ච මෙ ඡාදෙති, අත්ථි ච මෙ කායෙ බලමත්තාති. සො තතො නිදානං ලභෙථ පාමොජ්ජං අධිගච්ඡෙය්‍ය සොමනස්සං.

71. සෙය්‍යථාපි මහාරාජ පුරිසො බන්ධනාගාරෙ බද්ධො අස්ස. සො අපරෙනසමයෙන තම්හා බන්ධනා මුච්චෙය්‍ය සොත්ථිනා අව්‍යයෙන, න චස්ස කිඤ්චි භොගානං වයො. තස්ස එවමස්ස අහං ඛො පුබ්බෙ බන්ධනාගාරෙ බද්ධො අහොසිං, සොම්හි එතරහි තම්හා බන්ධනා මුත්තො සොත්ථිනා අව්‍යයෙන, නත්ථිච මෙ කිඤ්චි භොගානං වයොති. සො තතො නිදානං ලභෙථ පාමොජ්ජං අධිගච්ඡෙය්‍ය සොමනස්සං.

72 සෙය්‍යථාපි මහාරාජ පුරිසො දාසො අස්ස අනත්තාධීනො පරාධීනො න යෙන කාමං ගමො.

මමවූකලි පූර්වයෙහි ලෙඩඇත්තාවූ, දුක්ඇත්තාවූ, දැඩිගිලන්බැව් ඇත්තෙක්ද වූයෙමි. මට ආහාරදරුචිනොවිය, මාගේ ශරීරයෙහි බලයද නැතිවිය, ඒ මම දැන් ඒ පළමුපැවති ආබාධයෙන් මිදුනෙක් වෙමි. මට ආහාර රුචියද ඇතිවිය. මාගේශරීරයෙහි බලයද ඇත්තේයයි ඒ පුරුෂතෙම එයම මූලකාරණාකොටගෙණ ප්‍රමුදිත භාවය ලබන්නේය. සතුටටද පැමිණෙන්නේය.

71. මහරජ, යම්සේ පුරුෂයෙක් සිරගෙයි බැඳුනේ වේද, ඒ පුරුෂ තෙම මෑතකලකදී වියදම්නැතිව නොහොත් පීඩාරහිතව සැපසේ ඒ සිරගෙයින් මිදෙන්නේද, ඔහට භොගසම්පත්තින්ගේ කිසි වියද මක් නොවන්නේනම්, ඔහට මේ කල්පනාව වන්නේය. මමවූකලි පළමුකොට සිරගෙයි බැඳුනෙක් වූයෙමි. ඒ මම දැන් වියදම් රහිතව නොහොත් පීඩාරහිතව සැපසේ ඒ සිරගෙයින් මිදුනෙමි. මට භොග සම්පත්තීන්ගේ කිසි වියදමක්ද නොවූයේයයි ඒ පුරුෂතෙම ඒ සිර ගෙයින් මිදීම මූලකාරණාකොටගෙණ ප්‍රමුදිතභාවය ලබන්නේය. සතුටටද පැමිණෙන්නේය.

72. මහරජ, යම්සේ තමාගේ අධිපතිභාවයක් නැත්තාවූ, අනුන්ට යටත්වූ හෙවත් අනුන්අයිතිපැවතුම් ඇත්තාවූ, කැමතිපරිද්දෙන් යන්නට නොහැක්කාවූ නොහොත් සිය අදහස් පරිද්දෙන් ඉරියව් පැවැත්විය නොහැක්කාවූ, වැඩකරු පුරුෂයෙක් වන්නේද,

සො අපරෙන සමයෙන තම්හා දාසබ්‍යා මුච්චෙය්‍ය අත්තාධීනො අපරාධීනො භුජිස්සො යෙනකාමඞ්ගමො. තස්ස එවමස්ස අහං ඛො පුබ්බෙ දාසො අහොසිං අනත්තාධීනො පරාධීනො න යෙනකාමඞ්ගමො, සොම්හි එතරහි තම්හා දාසබ්‍යා මුත්තො අත්තාධීනො අපරාධීනො භුජිස්සො යෙනකාමඞ්ගමොති. සො තතො නිදානං ලභෙථ පාමොජ්ජං අධිගච්ඡෙය්‍ය සොමනස්සං.

73 සෙය්‍යථාපි මහාරාජ පුරිසො සධනො සභොගො කන්තාරද්ධානමග්ගං පටිපජ්ජෙය්‍ය දුබ්භික්ඛං සප්පටිභයං. සො අපරෙන සමයෙන තං කන්තාරං නිත්ථරෙය්‍ය, සොත්ථිනා ගාමන්තං අනුපාපුණෙය්‍ය ඛෙමං අප්පටිභයං. තස්ස එවමස්ස, අහං ඛො පුබ්බෙ සධනො සභොගො කන්තාරද්ධානමග්ගං පටිපජ්ජිං දුබ්භික්ඛං සප්පටිභයං.

ඒ දාසතෙම මෑතකලකදී ඒ දාසභාවයෙන් මිදෙන්නේද, තමාම අධිපතිකොට ඇත්තේ වේද, අනුන්ට යටත් පැවතුම් නැත්තේ වේද, අනුන්ට නයනැතිව තමාවිසින් උපයාගත් ධනයෙන් අඹුදරුවන් රක්‍ෂාකරන්නෙක් වේද, කැමතිපරිද්දෙන් යාහැකිවන්නේද හෙවත් තමාගේ අදහස් පරිද්දෙන් ඉරියව් පැවැත්වියහැක්කෙක් වන්නේද, ඕහට මේ අදහස වන්නේය. මමවූකලි පළමුකොට මාගේ අධිපතිභාවයක් නැත්තාවූ, අනුන්ට යටත්පැවතුම් ඇත්තාවූ, මාගේ අදහස පරිද්දෙන් යන්නට හෙවත් ඉරියව් පවත්වන්නට නොහැක්කාවූ, දාසයෙක් වූයෙමි. ඒ මම දැන් ඒ දාසභාවයෙන් මිදුනෙක්වූයෙමි. මා ම අධිපතිකොට ඇත්තෙක් වෙමි. අනුන්ට යටත් පැවතුම් ඇත්තෙක් නොවෙමි. අනුන්ට නයනැතිව මාවිසින් උපයාගත් ධනයෙන් අඹුදරුවන් රක්‍ෂාකරමි. මාගේ අදහස පරිද්දෙන් යන්නට හැක්කෙක් වෙමියි ඒ පුරුෂතෙම එයම මූලකාරණාකොටගෙණ ප්‍රමුදිතභාවය ලබන්නේය. සතුටටද පැමිණෙන්නේය.

73. මහරජ, යම්සේ ධනසහිතවූ, භොගසම්පත් සහිතවූ, පුරුෂයෙක් දුකසේ ලැබියයුතු භික්‍ෂාඇති සොරසතුරුආදී විරොධීන් ගෙන් පැමිණෙන භයසහිතවූ දුරුකතර මගකට පැමිණෙන්නේද, ඒ පුරුෂතෙම මදකලකදී ඒ දුරුකතර මග තරණය කරන්නේද හෙවත් පසුකරන්නේද, සැපදායකවූ, ප්‍රතිභයකාරණාරහිතවූ, ගමකට පිළිවෙළින් පැමිණෙන්නේද, ඕහට මේ අදහස වන්නේය. මමවූකලි පළමුකොට ධනසහිතවූයේ, භොගසම්පත්සහිතවූයේ, දුර්භික්‍ෂවූ හෙවත් ආහාරාදිය දුකසේ ලැබියයුතුවූ සොරසතුරුආදි විරොධීන්ගේ භයකාරණාසහිතවූ, දුරුකතර මගකට පැමිණියෙමි.

සොම්හි එතරහි තං කන්තාරං නිත්ථිණ්ණො, සොත්ථිනා ගාමන්තං අනුප්පත්තො ඛෙමං අප්පටිභයංති. සො තතො නිදානංලභෙථ පාමොජ්ජං අධිගච්ඡෙය්‍ය සොමනස්සං

74 එවමෙව ඛො මහාරාජ භික්ඛු යථා ඉණං යථාරොගං යථා බන්ධනාගාරං යථා දාසව්‍යං යථා කන්තාරද්ධානමග්ගං ඉමෙ පඤ්ච නිවරණෙ අප්පහිනෙ අත්තනි සමනුපස්සති. සෙය්‍යථාපි මහාරාජ ආණණ්‍යං යථාආරොග්‍යං යථාබන්ධනාමොක්ඛං යථා භුජිස්සං යථා ඛෙමන්තභූමිං, එවමෙව ඛො මහාරාජ භික්ඛු ඉමෙ පඤ්චනිව රණෙ පහිනෙ අත්තනි සමනුපස්සති.

75 තස්සිමෙ පඤ්චනිවරණෙ පහිනෙ අත්තනි සමනුපස්සතො පාමොජ්ජං ජායති, පමුදිතස්ස පීති ජායති, පීති මනස්ස කායො පස්සම්භති, පස්සද්ධකායො සුඛං වෙදෙති, සුඛිනො චිත්තං සමාධියති.

ඒ මම දැන් ඒ කාන්තාරය තරණයකෙළෙම් හෙවත් පසුකෙළෙම්. සැපසේ සැපදායකවූ ප්‍රතිභයකාරණාරහිතවූ ගමකට පිළිවෙළින් පැමිණියෙමියි ඒ පුරුෂතෙම එයම මූලකාරණාකොටගෙණ ප්‍රමුදිත භාවය ලබන්නේය. සතුටටද පැමිණෙන්නේය.

74. මහරජ, ණය යම්සේද, රොගය යම්සේද, බන්ධනාගාරය යම්සේද, දාසභාවය යම්සේද, දුරුකතරමග යම්සේද, එපරිද්දෙන්ම භික්ෂුතෙමේ ප්‍රහීණනොවූ මේ නිවරණ ධර්මපස තමාකෙරෙහි මනාකොට නුවණින් දකී මහරජ, ණය නැතිබව යම්සේද, නිරොගිබව යම්සේද, සිරගෙයින් මිදීම යම්සේද, අදාසභාවය යම්සේද, නිර්භය භූමිය යම්සේද, මහරජ, එපරිද්දෙන්ම භික්ෂුතෙමේ ප්‍රහීණවූ මේ නිවරණ පස තමාකෙරෙහි නැතැයි නුවණින් දකී.

75. ප්‍රහීණවූ මේ නිවරණ පස තමාකෙරෙහි නැතැයි මොනවට නුවණින් දක්නාවූ ඒ භික්ෂුහට ප්‍රමොද්‍යය හෙවත් සන්තොෂාකාරය උපදී. සතුටට පැමිණියාහට සියලු සිරුරකලඹමින් ප්‍රීතිය උපදී. ප්‍රීතියෙන් යුක්ත සිත්ඇත්තහුගේ නාමකාය පහවූදාහ ඇත්තේ වේ. නාමකාය පිළිබඳ දුහය මැඩලුතැනැත්තේ කයෙහි උපදනාවූද, සිතෙහි උපදනාවූද, සැපය විඳී. සැප ඇත්තහුගේ සිත උපචාරවශයෙන් හා අර්පණා වශයෙන් එකඟවෙයි.

සො විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති, නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස විවෙකජෙන පීතිසුඛෙන අප්ඵුටං හොති.

76 සෙය්‍යථාපි මහාරාජ දක්ඛො න්හාපකො වා න්හාපකන්තෙවාසී වා කංසථාලෙ.

ඒ යොගාවචරභික්‍ෂුතෙමේ වස්තූන්ගේ ලොලභාවයට හෙතුවූ ප්‍රියරූපාදිවස්තූන් කෙරෙන්ද තෘෂ්ණාදි සංක්ලෙශධර්මයන්කෙරෙන් නොහොත් සංක්ලෙශවස්තුයයිකියනලද අවිඥප්තිකණ සවිඥප්තික සියලුවස්තුකාමයන් කෙරෙන්වෙන්වම හෙවත් කායවිවෙකයට පැමිණ කාමච්ඡන්දනිවරණාදියෙන්ද, අශුභභාවයටහෙතුවූ අයොනිසොමනස්කාරාදියෙන් හා සියලු අකුශලධර්මයන් කෙරෙන් චිත්තවිවෙකයට පැමිණ හෙවත් විෂ්කම්භණවිවෙකවශයෙන් වෙන්ව අද හෝ නොහොත් තෘෂ්ණාවෙන් හා ඒ සමග යෙදුනු අකුශලය ලොභසම්ප්‍රයුක්ත අෂ්ටචිත්තුපපාද යයන මොවුන් කෙරෙන්ද, ධ්‍යානභාවනාවන්ට කාරණාවූ පූර්වයොගාදි වශයෙන් සිඩකරණලද තෘෂ්ණාප්‍රතාපයෙන්ද, අවිද්‍යාවෙන්ද, ද්වෙෂය හා යෙදුනු දෙසිතය. මොහය මුල්කොටඇති දෙසිතය යන සිව්වැදෑරුම්වූ අකුසල්චිත්තයන් කෙරෙන්ද වෙන්වම කිසි අරමුණක සිත එලවා එහි කල්පනා වශයෙන් සිත පිහිටුවන සවභාවඇති විතර්කසහිතවූ අරමුණුපිරිමැදිම ලක්‍ෂණකොටඇති විචාරසහිතවූ තනිව සිත විවෙකවීමෙන් නිවරණයන්කෙරෙන් දුරුවීම්හෙතුකොටගෙණ උපන්නාවූ ප්‍රීතියම සැපකොට ඇත්තාවූ ප්‍රථමධ්‍යානකුශලචිත්තය විඥානසන්තානයෙහි ඉපදවීම් වශයෙන් ඊට පැමිණ වාසයකෙරේ. ඒ යොගාවචරභික්‍ෂුතෙමේ මේ කයම විවෙකයෙන් හටගත්තාවූ ප්‍රීතිසැපයෙන් තෙමයි හෙවත් සියලුතන්හි ප්‍රීතිසැප ඇත්තක් කෙරේ. හාත්පසින් තෙමයි. වැඩියක් සම්පූර්ණකෙරේ. හාත්පසින් ස්පර්ශකෙරේ. සියලු කොටස් ඇත්තාවූ මේ භික්‍ෂුහුගේ කය පිළිබඳ ලේ මස් ඇතුළත්වූ සවල්පවූද ස්ථානයක් ප්‍රථමධ්‍යාන සැපයෙන් පහස්නා නොලද්දේ නොවේ. (යම් යම් තැනෙක්හි කර්මජරූපය පවතිද ඒසියලුතන්හි චිත්තජරූපය පැතිර පවතීයයි සේයි.)

76. මහරජ යම්සේ දක්‍ෂවූ හෙවත් නැමටසුදුසු චූර්ණයන්කරන්ට හා යොදන්ට සමර්ථවූ ස්නානද්‍රව්‍යසම්පාදනයකරන්නෙක් හෝ ස්නානද්‍රව්‍ය සම්පාදනය කරන්නෙකුගේ අතවැසියෙක්හෝ ලොහොමුවාතලියෙක්හි

ස්නානියචුණ්ණානි ආකිරිත්වා උදකෙන පරිප්ඵොසකං පරිප්ඵොසකං සන්නෙය්‍ය, සායං ස්නානිය පිණ්ඩි ස්නෙහානුගතා ස්නෙහපරෙතා සන්තරබාහිරා ඵුටා සිනෙහෙන, නච පග්ඝරණී එවමෙවඛො මහාරාජ භික්ඛු ඉමමෙව කායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති, නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස විවෙකජෙන පීතිසුඛෙන අප්ඵුටං හොති. ඉදම්පි ඛොමහාරාජ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුරිමෙහි සන්දිට්ඨිකෙහි සාමඤ්ඤඵලෙහි අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

77 පුනචපරං මහාරාජ භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති.

නෑමට යොග්‍යවූ චූර්ණයන්(වගුරුවා)බහා ජලයෙන් ඉස ඉස වම්අතින් ලොහමයතලිය අල්වාගෙණ දකුණුඅතින් ඊටප්‍රමාණජලය ඉසිමින් පිරිමදිමින් පිඩුකරන්නේද. ඒ මේස්නානචූර්ණපිණ්ඩය ජලයෙන් යුක්තවෙයි. ජලයෙන් හාත්පසින් ඇතුළත්විය. ඒ සුණුපිඩෙහි ඇතුළත හා පිටත සියඑතන්හිම ජලයෙන් පහස්නාලද්දී වේ. නමුත් බින්දුවශයෙන් ජලය නොවැගිරේ. මහරජ, එපරිද්දෙන්ම භික්ෂුතෙමේ මේශරීරයම නීවරණයන්ගේ අභාවයෙන් විෂ්කම්භණවිවෙකවශයෙන් හටගත්තාවූ ප්‍රීතිසැපයෙන්තෙමයි හෙවත් සියල්තැන පැතිරපවත්නා සැපඇත්තෙක් කෙරේ. හාත්පසින් වගුරුවයි. සුලඟින් කඹුරුසම පුරවන්නාක්මෙන් හාත්පසින් සම්පූර්ණ කෙරේ. හාත්පසින් ස්පර්ශ කෙරේ. සියලුකොටස් ඇත්තාවූ ඒ භික්ෂුහුගේ කයපිළිබඳව ලේමස්ආදිය ඇතුළත්වූ ස්වල්පවූද තැනක් ප්‍රථම්ධ්‍යානසැපයෙන් පහස්නා නොලද්දේ නොවේ. හෙවත් සකලශරීරය ප්‍රථමධ්‍යානසැපයෙන් සම්පූර්ණ කෙරෙයි. මහරජ, මේඅත්බැව්හි දැක්කයුතුවූ ගුණඇති මේ මාර්ගඵලය පළමු දක්වනලද සාන්දෘෂ්ටිකමාර්ගඵලයන්අතුරෙන් අතිශයින් මනොඥ වේ. අතිශයින් ශ්‍රේෂ්ඨද වේයයි වදාළෝ.

77. නැවතද අනිකක් කියමි. මහරජ, භික්ෂුතෙමේ අරමුණෙට සිත නැගීම ලක්ෂණකොටඇති විතර්කය, අරමුණුපිරිමැදීම ලක්ෂණකොට ඇති විචාරය, යන දෙදෙනාගේ සංසිඳීමෙන් තමාගේ චිත්තසන්තානයෙහි යහපත්පැහැදීමඇති සිතපිළිබඳවූ එකඟබවඇති විතර්කරහිතවූ විචාරරහිතවූ සමාධියෙන්හටගත්තාවූ ප්‍රීතිසැපඇති ද්විතීය ධ්‍යානචිත්තයට පැමිණ වාසය කෙරේ.

සො ඉමමෙව කායං සමාධිජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති, පරිප්ඵරති, නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස සමාධිජෙන පීතිසුඛෙන අප්ඵුටං හොති.

78 සෙය්‍යථාපි මහාරාජ උදකරහදො උබ්භිදොදකො, තස්සනෙවස්ස පුරත්ථිමාය දිසාය උදකස්සායමුඛං, න පච්ඡිමාය දිසාය උදකස්සාය මුඛං, න උත්තරාය දිසාය උදකස්සායමුඛං, න දක්ඛිණාය දිසාය උදකස්සායමුඛං, දෙවොච කාලෙන කාලං සම්මා ධාරං අනුපවෙච්ඡෙය්‍ය. අථ ඛො තම්හා උදකරහදා සීතා වාරිධාරා උබ්භිජ්ජිත්වා තමෙව උදකරහදං සීතෙන වාරිනා අභිසන්දෙය්‍ය පරිසන්දෙය්‍ය පරිපූරෙය්‍ය පරිප්ඵරෙය්‍ය, නාස්සකිඤ්චි සබ්බාවතො උදකරහදස්ස සීතෙන වාරිනා අප්ඵුටං අස්ස.

ඒවිදශීකභික්ෂුතෙමේ මේකරජකයමසමාධියෙන්හටගත්තාවූ ප්‍රීතිසැප යෙන් සියල්තැන පැතිරපවත්නා සැපඇත්තක් කෙරේ. හාත්පසින් වගුරුවයි. සුලහිත්කඹුරුසම පුරවන්නාක්මෙන්හාත්පසින් සම්පූර්ණ කෙරේ.හාත්පසින්ස්පර්ශකෙරේ.සියලුකොටස්ඇත්තාවූමඒභික්ෂූහුගේ කයපිළිබඳව ඡවිමාංශලොහිතාදිය ඇතුළත්වූ ස්වල්පවූද තැනක් ද්විතියධ්‍යානසැපයෙන් පහස්නා නොලද්දේ නොවේ. හෙවත් සකල ශරීරය ද්විතියධ්‍යානසැපයෙන් සම්පූර්ණකෙරෙයි.

78. මහරජ, පොළොවබිඳගෙණ නික්මෙන්නාවූ හෙවත් ඇතුළ තම උපදනා ජලයඇත්තාවූ දියවිලක්යම්සේද ඒවිලසම්බන්ධිවූ පෙරදිගින්ද ජලයපැමිණෙනමාර්ගයක් හෙවත් මෝයක්නැත්තේද, පැසුලුදිගින්ද, ජලයපැමිණෙන මාර්ගයක් නැත්තේද, උතුරු දිගින්ද, ජලයපැමිණෙනමාර්ගයක් නැත්තේද, දකුණුදිගින්ද, ජලය පැමිණෙනමාර්ගයක් නැත්තේද, මෙඝයද බොහෝසේ මනාකොට වර්ෂාව ප්‍රවෙසකරන්නේද, හෙවත් ධාරා වර්ෂණයකරන්නේද, එසේ ඇතිකල්හි ඒවිලෙන් සීතලජලධාරාවෝ පොළොවබිඳගෙණනැගී ඒවිලම සිහිල්ජලයෙන් සියල්තැනපැතිර පවත්නාජලය ඇත්තක් කෙරේ. හාත්පසින්වගුරුවයි හාත්පසින් සම්පූර්ණකෙරේ හාත් පසින් ස්පර්ශ කෙරේ.හෙවත් සියලුජලය කලඹයි(සියලුජලය පිළිබඳව සීත ජලයපැතිර නොපවත්නා තැනක්නැත්තේ වෙයි.)

එවමෙවඛො මහාරාජ භික්ඛු ඉමමෙව කායං සමාධිජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති, නාස්සකිඤ්චි සබ්බාවතො කායස්ස සමාධිජෙන පීතිසුඛෙන අප්ඵුටං හොති. ඉදම්පි ඛො මහාරාජ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුරිමෙහි සන්දිට්ඨිකෙහි සාමඤ්ඤඵලෙහි අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

79 පුනචපරං මහාරාජ භික්ඛු පීතියාච විරාගා උපෙක්ඛකොච විහරති සතො සම්පජානො, සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති යන්තං අරියා ආචික්ඛන්ති. උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති තතියං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං නිප්පීතිකෙන සුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති, නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස නිප්පීතිකෙන සුඛෙන අප්ඵුටං හොති.

මහරජ, එපරිද්දෙන්ම විදර්ශක භික්ෂුතෙමේ මේකරජකයම සමාධියෙන් හටගත්තාවූ ප්‍රීතිසැපයෙන් සියල්තැන පැතිරපවත්නා සැපඇත්තක් කෙරේ. හාත්පසින් වගුරුවයි. සුලගින් කඹුරුසම පුරවන් නාක්මෙන් හාත්පසින් සම්පූර්ණ කෙරේ. හාත්පසින් ස්පර්ශ කෙරෙයි හෙවත් ප්‍රීතිසැපයෙන් සියල්සිරුර කලඹයි සියලුකොටස් ඇත්තාවූ ඒ භික්ෂුහුගේ කයපිළිබඳ මස් ලේ ආදිය ඇතුළත්වූ සවල්පවූද, තැනක් විතීයධ්‍යානසැපයෙන් පහස්නානොලද්දේ නොවේ. හෙවත් සකලශරීරය විතීයධ්‍යාන සැපයෙන් සම්පූර්ණ කෙරේ.

79. නැවතද අනිකක් කියමි. මහරජ, භික්ෂුතෙමේ ප්‍රීතිහුගේ වැළැක්මෙන් මධ්‍යස්ථතා ඇත්තේ සිහිඇත්තේ සම්‍යක්ප්‍රඥා ඇත්තේ කයින්සැපයක්ද, විඳී යම්කාරණයකින් උපෙක්ෂාඇත්තේ සිහි ඇත්තේ සැපවිහරණඇත්තේයයි යම්ධ්‍යානයක් පිළිබඳව ආර්යයෝ කියද්ද, ඒතෘතීයධ්‍යානචිත්තයට පැමිණවාසය කෙරේ. ඒවිදර්ශක භික්ෂුතෙමේ මේකරජකයම ප්‍රීතිනැත්තාවූ සැපයෙන් තෙමයි හෙවත් සියල්තැන පැතිරපවත්නා සැපඇත්තක් කෙරේ. හාත්පසින් වගුරුවයි. සුලගින් කඹුරුසමපුරවන්නාක්මෙන් හාත්පසින් සම්පූර්ණ කෙරේ. හාත්පසින් ස්පර්ශ කෙරේ. සියලුකොටස් ඇත්තාවූ ඒ භික්ෂුහුගේ කය පිළිබඳ ලේ මස් ආදිය ඇතුළත්වූ සවල්පවූද, තැනක් ප්‍රීතිරහිතවූ තෘතීයධ්‍යානසැපයෙන් පහස්නා නොලද්දේ නොවේ. හෙවත් සකලශරීරය තෘතීයධ්‍යාන සැපයෙන්ම සම්පූර්ණ කෙරේ.

80 සෙය්‍යථාපි මහාරාජ උප්පලිනියං වා පදුමිනියං වා පුණ්ඩරීකිනියං වා අප්පෙකච්චානි උප්පලානිවා පදුමානිවා පුණ්ඩරීකානිවා උදකෙ ජාතානි උදකෙසංවඩ්ඪානි උදකානුග්ගතානි අන්තොනිමුග්ගපොසීනි තානි යාවචග්ගා යාවච මූලා සීතෙන වාරිනා අභිසන්නානි පරිසන්නානි පරිපූරානි පරිප්ඵුටානි නාස්සකිඤ්චි සබ්බාවතං උප්පලානංවා පදුමානංවා පුණ්ඩරීකානංවා සීතෙන වාරිනා අප්ඵුටං අස්ස එවමෙව ඛො මහාරාජ භික්ඛු ඉමමෙව කායං නිප්පීතිකෙන සුඛෙන අභිසන්නෙති පරිසන්නෙති පරිපූරෙති පරිප්ඵරති, නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස නිප්පීතිකෙන සුඛෙන අප්ඵුටං හොති. ඉදම්පි ඛො මහාරාජ, සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුරිමෙහි සන්දිට්ඨිකෙහි සාමඤ්ඤඵලෙහි අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

---

80. මහරජ, යම්සේ උපුල්විලක හෝ පියුම්විලක හෝ හෙල පියුම්විලක හෝ ජලයෙහි හටගත්තාවූ ජලයෙහිම වැඩුනාවූ ජලයෙන් උඩට නොනැගුනාවූ ඇතුළතගැලී පොෂණයවන්නාවූ හෙවත් වැඩෙන්නාවූ සමහර උපුල් හෝ වෙද්ද, සමහර පියුම් හෝ වෙද්ද, සමහර හෙලපියුම් හෝ වෙද්ද, ඒඋපුල් ආදිහු අගදක්වාද, මුලදක්වාද, සිහිල්ජලයෙන් තෙමුනාහු හෙවත් පැතුරුනාහු හාත්පසින් ජලයෙහි ගැලුනාහු හාත්පසින් සම්පූර්ණවූවාහු හාත්පසින් පහස්නාලද්දාහු වෙත්. උපුල්ය, පියුම්ය, හෙලපියුම්ය, යන මොවුන්ගෙන් එකකුත් ජලයෙන් පහස්නානොලද්දේ නොවේ. සියල්ල ජලයෙන් යුක්තම වෙයි. මහරජ, එපරද්දෙන්ම භික්ෂුතෙමේ මේ කරජකයම ප්‍රීතිරහිතවූ ධ්‍යානසැපයෙන් තෙමයි හෙවත් සියල්තැනපැතිරපවත්නා සැපඇත්තෙක් කෙරේ. හාත්පසින් වගුරුවයි, සුලඟින් කඹුරුසමපුරවන්නාක්මෙන් හාත්පසින් සම්පූර්ණ කෙරේ. හාත්පසින් ස්පර්ශ කෙරේ. සියලුකොටස් ඇත්තාවූ ඒභික්ෂුහුගේ කයපිළිබඳ ලේ මස් ආදිය ඇතුළත්වූ ස්වල්පවූද, තැනක් ප්‍රීතිරහිතවූ තෘතීයධ්‍යානසැපයෙන් පහස්නානොලද්දේ නොවේ. හෙවත් සකලශරීරය තෘතීයධ්‍යානසැපයෙන් සම්පූර්ණ කෙරේ. මහරජ, මේඅත්බැව්හි දක්කයුතුගුණඇති මේ මාර්ගඵලයද, පළමුදක්වනලද සාන්දෘෂ්ටිකමාර්ගඵලවලට වඩා අතිශයින්මනොඅඩු වේ. අතිසයින් ශ්‍රේෂ්ඨද වේයයි වදාළේ.

81 පුනචපරං මහාරාජ භික්ඛු සුඛස්සච පහානා දුක්ඛස්සච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන ඵරිත්වා නිසින්නො හොති, නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන අඵුටං හොති.

82. සෙය්‍යථාපි මහාරාජ පුරිසො ඔදාතෙන වත්ථෙන සසීසං පාරුපිත්වා නිසින්නො අස්ස, නාස්සකිඤ්චි සබ්බාවතො කායස්ස ඔදාතෙන වත්ථෙන අප්ඵුටං අස්ස, එවමෙව ඛො මහාරාජ භික්ඛු ඉමමෙව කායං පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන ඵරිත්වා නිසින්නො හොති, නාස්සකිඤ්චි සබ්බාවතො කායස්ස පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන අප්ඵුටං හොති.

---

81. නැවතද අනිකක්කියම්. මහරජ, විදර්ශකභික්ෂුතෙමේ සුඛප්‍රහාණයෙන්ද, දුඃඛප්‍රහාණයෙන්ද, පළමුකොටම සොම්නස් දොම්නස් දෙදෙනාගේ දුරලීමෙන් දුක්නැත්තාවූ සැපනැත්තාවූ උපෙක්ෂාස්මෘතීන්ගේ පිරිසිදුභාවය ඇති චතුර්ථධ්‍යානචිත්තයට පැමිණවාසය කෙරේ. ඒ ධ්‍යානලාභිභික්ෂුතෙමේ මේකරජකයම කෙලෙස් රහිත බැවින් පිරිසිදුවූ අත්‍යර්ථයෙන් බබලන බැවින් පයිවදතවූ ධ්‍යානචිත්තයෙන් පතුරුවා උන්නේ වේ. ඒධ්‍යානලාභිභික්ෂුහුගේ සියලුකොටස් ඇත්තාවූ කයපිළිබඳ ලේ මස් ආදිය ඇතුළත්වූ සවල්පවූද, ස්ථානයක් පිරිසිදුවූ බබලන්නාවූ චතුර්ථධ්‍යානචිත්තයෙන් පහස්නා නොලද්දේ නොවේ. හෙවත් සකලශරීරය චතුර්ථධ්‍යානසිතින්ම සම්පූර්ණ කෙරෙ.

82. මහරජ, යම්සේ පුරුෂයෙක් පිරිසිදුවූ සුදුවස්ත්‍රයකින් හිසසහිතව පාරවා උන්නේ වේද, ඔහුගේ සියලු කොටස්ඇත්තාවූ කයපිළිබඳ ලේ මස් ආදියඇතුළත්වූ සවල්පවූද තැනක් සුදුවස්ත්‍රයෙන් පහස්නා නොලද්දේ නොවෙයි. නොහොත් ඔදාතවස්ත්‍රය හෙතුකොටගෙණ සියල් සිරුරෙහි ස්‍වතුගුණය පැතිර පවතී. මහරජ, එපරිද්දෙන්ම ධ්‍යානලාභි භික්ෂුතෙමේ මේ කරජකයම පිරිසිදුවූ බබලන්නාවූ චතුර්ථධ්‍යානසිතින් පතුරුවා උන්නේ වේ. ඒ භික්ෂුහුගේ සියලු කොටස්ඇත්තාවූ කයපිළිබඳ ලේ මස් ආදිය ඇතුළත්වූ සවල්පවූද තැනක් පිරිසිදුවූ බබලන්නාවූ චතුර්ථධ්‍යානචිත්තයෙන් පහස්නානොලද්දේ නොවේ. හෙවත් චතුර්ථධ්‍යානචිත්තයෙන් සකල ශරීරය සම්පූර්ණකෙරේ.

ඉදම්පි ඛො මහාරාජ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුරිමෙහි සන්දිට්ඨිකෙහි සාමඤ්ඤඵලෙහි අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

83. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ඤාණදස්සනාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො එවං පජානාති අයං ඛො මෙ කායො රූපී චාතුම්මහාභූතිකො මාතාපෙත්තිකසම්භවො ඔදනකුම්මාසූපචයො අනිච්චුච්ඡාදන පරිමද්දන භෙදන විද්ධංසන ධම්මො, ඉදංච පනමෙ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථපටිබද්ධන්ති.

84 සෙය්‍යථාපි මහාරාජ මණි වෙළුරියො සුභො ජාතිමා අට්ඨංසො සුපරිකම්මකතො අච්ඡො විප්පසන්නො අනාවිලො සබ්බාකාරසම්පන්නො.

මහරජ, මේ අත්බැව්හි දක්කයුතු ගුණඇති මේ මාර්ගඵලයද පළමු දක්වනලද සාන්දෘෂ්ටික මාර්ගඵලවලට වඩා අතිශයින් මනොඥ වේ. අතිශයින් ශ්‍රේෂ්ඨද වේයයි වදාළෝ.

83. ඒ චතුර්ථධ්‍යානලාභී විදර්ශකභික්ෂුතෙමේ මෙසේ ධ්‍යානයෙන් සිතඑකඟවූකල්හි පිරිසිදුවූකල්හි දීප්තිමත්වූකල්හි කෙලෙස්රහිතවූකල්හි පහවූ උපක්ලෙශඇතිවූකල්හි මෘදුවූකල්හි කර්මයටසුදුසුවසිටිකල්හි අකම්ප්‍යභාවයට පැමිණිකල්හි සර්වප්‍රකාරයෙන් තරුණ විදර්ශනාඥානදර්ශනය නිපදවීමපිණිස සිත එලවා තබයි. මනාසේ නැමීසිටීමය, එහි ආදරයෙන් ඇලීසිටීමය, පර්වතයක්මෙන් ඒඅතට බොහෝ බරව එල්බීසිටීමය යන මේ ක්‍රමයෙන් වැඩියක් සිතනමයි. ඒ ධ්‍යානලාභිභික්ෂුතෙමේ මෙසේ දැනගණී. කෙසේද, මාගේ මේ කයවූකලි ආකාරඇත්තේය. පෘථිවිආදිසතර මහාභූතයන්ගේ හෙතුවෙන් හටගත්තේය, මව්පියදෙදෙනාගේ ශුක්‍ර ශ්‍රොණිතය නිසා හටගත්තේය, බත්කොමුආදිආහාරයෙන් වැඩිමඇත්තේය, අනිත්‍යබවය, සුණුආදිය ගැල්වීමෙන් ඉලීමය, අඞ්ගප්‍රත්‍යඞ්ගයෙහි ආබාධදුරුකිරීමපිණිස පිරිමැදීමය, බිඳීමය, වැනසීමය යන මෙය ස්වභාවකොට ඇත්තේය, මාගේ මේ විඥානය වූකලි මේ කය ඇසුරුකලේ වෙයි. මෙහිම බැඳුනේ වෙයි කියායි.

84 මහරජ, කාන්තිමත්භාවයෙන් යහපත්වූ කුරුවින්දජාතිආදි උත්තමජාතිඇතිහෙයින් පිරිසිදු ආකාරයෙන් නැගිසිටියාවූ අටැස්වූ දෙස්බැහැරකිරීම් වශයෙන් මනාකොට පරිකර්මකරණලද්දාවූ නිර්මලවූ විශෙෂයෙන් ප්‍රසන්නවූ සියලුඅයුරින් සම්පූර්ණවූ වෛඩූර්‍ය්‍ය මාණික්‍යයක් යම්සේද.

තත්‍ර සුත්තං ආවුතං නීලංවා පීතංවා ලොහිතංවා ඕදාතංවා පණ්ඩු සුත්තංවා. තමෙනං චක්ඛුමා පුරිසො හත්ථෙ කරිත්වා පච්චවෙක්ඛෙය්‍ය අයං ඛො මණි වෙළුරියො සුභො ජාතිමා අට්ඨංසො සුපරිකම්මකතො අච්ඡො විප්පසන්නො සබ්බාකාරසම්පන්නො, තත්‍රිදං සුත්තං ආවුතං නීලංවා පීතංවා ලොහිතංවා ඕදාතංවා පණ්ඩුසුත්තංවාති. එවමෙව ඛො මහාරාජ භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ඤාණදස්සනාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො එවං පජානාති අයං ඛො මෙ කායො රූපී චාතුම්මහාභූතිකො මාතාපෙත්තිකසම්භවො ඔදනකුම්මාසූපචයො අනිච්චුච්ඡාදන පරිමද්දනභෙදනවිද්ධංසනධම්මො.

ඒ මැණිකෙහි නිල්වන්වූ හෝ රන්වන්වූ හෝ රත්වන්වූ හෝ සුදුවන්වූ හෝ පඬුවන්වූ හෝ හුයක් (නූලක්) අමුණනලද්දේ ඒ මේ මැණික චක්ෂුරින්ද්‍රියයන්ගේ දර්‍ශනශක්තියඇති පුරුෂයෙක් අතටගෙණ මෙසේ ප්‍රත්‍යවෙක්‍ෂා කරන්නේද හෙවත් සලකන්නේද, කෙසේද, මේ වෛඩූර්‍ය්‍යමාණික්‍යය වනාහි කාන්තිමත්භාවයෙන් යහපත්වෙයි. පිරිසිදුආකාරයෙන් නැගීසිටියේය. අටැස් ඇත්තේය. දෙස්බැහැරකිරීම වශයෙන් මනාකොට පරිකර්‍ම කරණලද්දේය. නිර්‍මලවෙයි. විශෙෂයෙන් ප්‍රසන්නවෙයි. සියලු අයුරින් සම්පූර්‍ණවෙයි. ඒ මැණිකෙහි නීලවර්‍ණවූ හෝ පීතවර්‍ණවූ හෝ රක්තවර්‍ණවූ හෝ ශුභ්‍රවර්‍ණවූ හෝ පඬුවන්වූ හෝ හුයක් මේ අමුණනලද්දේයයි කියාසි. මහරජ, එපරද්දෙන්ම භික්‍ෂුතෙමේ මෙසේ සිත එකඟවූකල්හි පිරිසිදුවූකල්හි වෙසෙසින් පිරිසිදුවූකල්හි කෙලෙස්රහිතවූකල්හි පහවූ කෙලෙස්ඇතිවූකල්හි මෘදුවූකල්හි කර්‍මයට සුදුසුවසිටිකල්හි අකම්ප්‍යභාවයට පැමිණිකල්හි විදර්‍ශනාඥනදර්‍ශනලාභයපිණිස සිත එලවා තබයි. මනාසේ නැමිසිටීමය, එහි ආදරයෙන් ඇලීසිටීමය, පර්‍වතයක්මෙන් ඒඅතට බොහෝ බරව එල්වීසිටීමය යන මේ ක්‍රමයෙන් වැඩියක් සිත නමයි. ඒ ධ්‍යානලාභී භික්‍ෂුතෙමේ මෙසේ දැනගණී.මාගේ මේ කයවූකලි ආකාරඇත්තේය. පෘථිවිආදිසතරමහාභූතයන්ගේ හෙතුවෙන් හටගත්තේය. මව්පිය දෙදෙනාගේ ශුක්‍රශ්‍රොණිතයනිසා හටගත්තේය. බත්කොමුආදි ආහාරයෙන් වැඩීමඇත්තේය. අනිත්‍යබවය සුණුආදිය ගැල්වීමෙන් ඉලීමය. අඞ්ගප්‍රත්‍යඞ්ගයෙහි ආබාධ දුරැකිරීමපිණිස පිරිමැදීමය. බිඳීමය. වැනසීමය යන මෙය ස්වභාවකොට ඇත්තේය.

ඉදංච පනමෙවිඤ්ඤාණං එත්ථසිතං එත්ථ පටිබද්ධන්ති. ඉදම්පි ඛො මහාරාජ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුරිමෙහි සන්දිට්ඨිකෙහි සාමඤ්ඤඵලෙහි අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

85. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මණියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ මනොමයංකායං අභිනිම්මිනාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති සො ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනොමයං සබ්බඞ්ගපච්චඞ්ගිං අහීනින්ද්‍රියං.

86. සෙය්‍යථාපි මහාරාජ පුරිසො මුඤ්ජම්හා ඉසිකං පවාහෙය්‍ය තස්ස එවමස්ස අයං මුඤ්ජො අයං ඉසිකා අඤ්ඤො මුඤ්ජො අඤ්ඤා ඉසිකා මුඤ්ජම්හාත්වෙව ඉසිකා පවාල්හාති. සෙය්‍යථාපි පන මහාරාජ පුරිසො අසි කොසියං පවාහෙය්‍ය තස්ස එවමස්ස අයං අසි අයං කොසි අඤ්ඤො අසි අඤ්ඤා කොසි කොසියා ත්වෙව අසි පවාල්හොති

මාගේ මේ විඥානය වූකලි මේ කය ඇසුරුකළේ වෙයි. මෙහිම බැඳුනේම වෙයි කියායි. මහරජ, මේ අත්බැව්හි දක්කයුතු ගුණඇති මේ මාගීඵලයද පළමුදක්වනලදසාන්දෘෂ්ටිකමාගීඵලවලටවඩා අතිශයින් මනොඥ වෙයි අතිශයින් ශ්‍රෙෂ්ඨද වේයයි වදාළෝ.

85. ඒවතුර්ථධ්‍යානලාභී භික්ෂුතෙමේ මෙසේ සිතධ්‍යානයෙන් එකඟවූකල්හි පිරිසිදුවූකල්හි වෙසෙසින් දිප්තිමත්වූකල්හි කෙලෙස්රහිතකල්හි පහවූ උපකෙලශධර්මඇතිවූකල්හි මෘදුවූකල්හි කර්මයටසුදුසුව සිටිකල්හි අකම්ප්‍යභාවයට පැමිණිකල්හි ධ්‍යානසිතින් නිපදවනලද කයක්මනාකොට මැවීමපිණිස සිත එලවා තබයි. වෙසෙසින්නමයි, ඒ විදර්ශක භික්ෂුතෙමේ ආකාරඇත්තාවූ ධ්‍යානසිතින් නිපදවනලද සියලු ප්‍රධානඅවයව හා කුඩා අව යවඇති විකාරයට නොපැමිණියාවූ විශෙෂයෙන් ප්‍රසන්නඉන්ද්‍රියයන්ඇති මේකයින් අන්‍යවූකයක් මනාකොට මවයි.

86 මහරජ, යම්සේ පුරුෂයෙක් මුදුතණින් ඉසිකාසංඛ්‍යාත ආස්තරණයක් හෙවත් තණඇතිරියක් වඩන්නේද, ඒසඳහා මේ මුදුතණය, මේ තණඇතිරියය, මුදුතණ අනිකක, ආස්තරණය අනිකක, මුදුතණින් ආස්තරණය වඩනලද්දීයයි ඔහට මේ අදහසවන්නේය. මහරජ, යම්සේ පුරුෂයෙක් කඩුකොපුවක් සම්පාදනය කරන්නේද ඔහට මේ අදහසවන්නේය. මේ කඩුවය, මේ කොපුවය, කඩුව අනිකක, කොපුව අනිකක, කොපුවෙන් කඩුවරක්නාලද්දේය කීයායි.

සෙය්‍යථාපි පන මහාරාජ පුරිසො අහිං කරණ්ඩා උද්ධරෙය්‍ය තස්ස එවමස්ස අයං අහි අයං කරණ්ඩො අඤ්ඤො අහි අඤ්ඤො කරණ්ඩො කරණ්ඩා ත්වෙව අහි උබ්භතොති. එවමෙව ඛො මහාරාජ භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ මනොමයං කායං අභිනිම්මිනාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති, රූපිං මනොමයං සබ්බඞ්ගපච්චඞ්ගිං අහීනින්ද්‍රියං. ඉදම්පි ඛො මහාරාජ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුරිමෙහි සන්දිට්ඨිකෙහි සාමඤ්ඤඵලෙහි අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

87. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ඉද්ධිවිධාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති.

මහරජ, යම්සේ පුරුෂයෙක් සර්පයෙකු සර්ප සැවයෙන් පහකරන්නේද, ඔහට මේ අදහස වන්නේය. මේ සර්පයාය, මේ සැවය, සර්පතෙම අනිකෙක, සැවය අනිකක, සැවයෙන් සර්පතෙම පහකරණලද්දේය කියායි. මහරජ, එපරිද්දෙන්ම භික්ෂුතෙමේ මෙසේ සිතසමාධිගතවූ කල්හි පිරිසිදුවූකල්හි දීප්තිමත්කල්හි පහවූ ක්ලෙශඇතිකල්හි මෘදුවූ කල්හි කර්මයට සුදුසුවසිටිකල්හි අකම්ප්‍යභාවයටපැමිණිකල්හි මනොමයවූ කයක් මනාකොට මැවීමපිණිස සිත එලවා තබයි. මනාකොට නමති, හෙතෙමේ මේ කයින් අන්‍යවූ ආකාරඇත්තාවූ සිතින් නිපදවනලද්දාවූ සියලු ප්‍රධාන අවයව හා කුඩා අවයව ඇත්තාවූ විකාරයට නොපැමිණි ප්‍රසන්න ඉන්ද්‍රියයන්ඇති අන්‍යවූ කයක් මවයි. මහරජ, මේඅත්බැව්හි දැක්කයුතු ගුණඇති මේ මාර්ගඵලයද පළමු දක්වනලද සාන්දෘෂ්ටිකමාර්ගඵලවලටවඩා අතිශයින් මනොඥ වෙයි. අතිශයින් ශ්‍රෙෂ්ඨද වේයයි වදාළෝ.

87. ඒ භික්ෂුතෙමේ මෙසේ ධ්‍යානයෙන් සිතඑකඟවූකල්හි පිරිසිදුවූ කල්හි වෙසෙසින් දීප්තිමත්වූකල්හි කෙලෙස්රහිතකල්හි පහවූ කෙලෙස්ඇතිකල්හි මෘදුවූකල්හි කර්මයටසුදුසුවසිටිකල්හි අකම්ප්‍යභාවයටපැමිණිකල්හි කියූපරිද්දෙන් ඒ සිත අභිඥාපාදකවූකල්හි සෘද්ධිවිධින්ගේ ලාභයපිණිස පරිකර්මචිත්තය එලවා තබයි. හෙවත් කසිණඅරමුණෙන් පහකොටගෙණ සෘද්ධිවිධියට අභිමුඛව සිත යවයි. ලැබියයුතු සෘද්ධියට බරව සාදරයෙන් සිතනමයි. මෙසේ කරණලද චිත්තාභිනීහාරඇති ඒ භික්ෂුතෙමේ නානාප්‍රකාරවූ සෘද්ධිකොට්ඨාසය වලඳයි හෙවත් ස්පර්ශකරමින් ඊට පැමිණේ. කෙසේදයත්,

එකොපි හුත්වා බහුධා හොති බහුධාපි හුත්වා එකො හොති, ආවීභාවං තිරොභාවං තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡති සෙය්‍යථාපි ආකාසෙ, පඨවියාපි උම්මුජ්ජ නිම්මුජ්ජං කරොති සෙය්‍යථාපි උදකෙ, උදකෙපි අභෙජ්ජමානො ගච්ඡති සෙය්‍යථාපි පඨවියං, ආකාසෙ පි පල්ලඞ්කෙන කමති සෙය්‍යථාපි පක්ඛී සකුණො, ඉමෙපි චන්දිමසුරියෙ එවං මහිද්ධිකෙ එවං මහානුභාවෙ පාණිනා පරාමසති. පරිමජ්ජති.

සෘද්ධිකිරීමට පළමුකොට ස්වභාවයෙන් එක්කෙනෙක්වම බොහෝදෙනාගේ සමීපයෙහි ප්‍රශ්නවිචාරීම් ආදිය කරණුකැමැත්තෙන් බොහෝ පරිද්දෙන් වෙයි. හෙවත් සියයක් හෝ දහසක් වෙයි. බොහෝ පරිද්දෙන්වම ඉන්පසු පාදකධ්‍යානයට සමවැද එයින් නැගිට එක්කෙනෙක් වෙම්යි පරිකර්ම්කොට අධිෂ්ඨානසිත සමගම එක්කෙනෙක් වෙයි. ප්‍රකාශබවටද නොහොත් ප්‍රකට ප්‍රාතිහාර්‍ය්‍යයටද මුවහබවටද නොහොත් අප්‍රකට ප්‍රාතිහාර්‍ය්‍යයටද ගෘහභිත්තිහුගේ පරභාගයටද විහාර ග්‍රාමාදීන්ගේ ප්‍රකාරසම්බන්ධි පරභාගයටද පර්වතයාගේ පරභාගයටද අහසෙහිමෙන් නොගැටෙමින් ගමන්කෙරේ. මෙසේ ගමන්කරණුකැමැත්තහුවිසින් ආකාසකසිණයට සමවැද එයින් නැගිට ප්‍රාකාරභිත්තිආදිය ආකාශය වේවායි අධිෂ්ඨාන කටයුතුයි. ජලයෙහිමෙන් පෘථිවියෙහිද ගැලීම හා ඉල්පීමකෙරේ. මෙසේකරණුකැමැත්තහුවිසින් ආපොකසිණයට සමවැද එයින් නැගිට පොළවේ මෙපමණතැන් ජලය වේවායි අධිෂ්ඨාන කටයුතු. පොළවෙහිමෙන් ජලයෙහිද දියනොබෙදමින් ගමන්කෙරේ. මෙසේකරණුකැමැත්තහුවිසින් පාථිවිකසිණයට සමවැද එයින් නැගිට ජලයේ මෙපමණතැන් පෘථිවිය වේවායි අධිෂ්ඨාන කටයුතුයි. පියාපත්වලින්යුක්තවූ පක්ෂියෙක් යම්සේද එපරිද්දෙන්ම අහසෙහිද පලඟින් සක්මන්කෙරේ. මෙසේ කරණුකැමැත්තහුවිසින් පෘථිවිකසිණයට සමවැද එයින් නැගිට පර්‍ය්‍යඞ්කප්‍රමාණස්ථානය පිරිසිඳ පරිකර්ම්කොට කියූපරිද්දෙන්ම අධිෂ්ඨාන කටයුතු. දෙසතළිස්දහසක් යොදුන් මත්තෙහි හැසිරෙණ මහත්සෘද්ධි ඇත්තාවූ ලොකත්‍රයෙහි එකවිට ආලොකකරණ මහත් ආනුභාව ඇත්තාවූ සඳහිරුද පරාමර්ශනය කෙරේ. හෙවත් අතින් ගණී. හාත්පසින් කැඩපත්තලයක්මෙන් පිරිමදී. අභිඥාපාදක ධ්‍යානවශයෙන් චිත්තවසීභාවයට පැමිණියාවූ ඒ භික්ෂුතෙමේ සඳහිරු ආවර්ජනාකරමින් ඥානයෙන් අධිෂ්ඨානකෙරේද එකල්හි අත්පසට පැමිණෙත්. එහෙයින් සෘද්ධිමත්තෙමේ සයනයකරමින් හෝ ඉඳිමින් හෝ සඳහිරු පරාමර්ශනයද කෙරේ. පිරිමැදීමද කෙරේ.

පරිමජ්ජති, යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති.

88. සෙය්‍යථාපි මහාරාජ දක්ඛො කුම්භකාරො වා කුම්භකාරන්තෙවාසී වා සුපරිකම්මකතාය මත්තිකාය යං යදෙව භාජනවිකතිං ආකඞ්ඛෙය්‍ය තං තදෙව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය. සෙය්‍යථාපි පන මහාරාජ දක්ඛො දන්තකාරො වා දන්තකාරන්තෙවාසී වා සුපරිකම්මකතස්මිං දන්තස්මිං යං යදෙව දන්තවිකතිං ආකඞ්ඛෙය්‍ය තං තදෙව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය සෙය්‍යථාපි පන මහාරාජ දක්ඛො සුවණ්ණකාරො වා සුවණ්ණකාරන්තෙවාසී වා සුපරිකම්මකතස්මිං සුවණ්ණස්මිං යං යදෙව සුවණ්ණවිකතිං ආකඞ්ඛෙය්‍ය තං තදෙව කරෙය්‍ය අභිනිප්පාදෙය්‍ය, එවමෙව ඛො මහාරාජ භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මණියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ඉද්ධිවිධාය චිත්තං අභිනිහරති.

බඹලොවදක්වාද කයින් වසයෙහි පවත්වයි. චිත්ත වසීභාවයට පැමිණි ඍද්ධිමත්තෙමේ බ්‍රහ්මලොකයට ගමන්කෙරේ. දිවැසින් ඔහුගේ රූපය දකී. දිව්‍යශ්‍රොත්‍රධාතුවෙන් ඔහුගේ ශබ්දය අසයි. යනාදිනත් අයුරින් බඹලොව කෙළවර කොටඇති සියලුතන්හි තමාගේ අධිපතිභාවය පවත්වා.

88. මහරජ, යම්සේ දක්‍ෂවූ කුම්භකාරයෙක් හෝ කුම්භකාරයෙකුගේ අතවැස්සෙක් හෝ දෙස්පහකිරීමෙන් මනාකොට සකස් කරණලද මැටියෙන් යම් යම් භාජනවිශෙෂයක් කැමතිවන්නේ නම්, ඒ ඒ භාජනවිශෙෂයම කරන්නේද මනා කොට නිපදවන්නේද, මහරජ, යම්සේ දක්‍ෂවූ ඇත්දත් ආදියෙන් විසිතුරුකම් කරන්නෙක් හෝ දන්තකාරයෙකුගේ අතවැස්සෙක් හෝදෙස්පහකිරීමෙන් මනාකොට සකස්කරණලද දතෙක්හි යම් යම් විසිතුරු රූපආදි දන්තවිශෙෂයක් කැමතිවන්නේද, ඒ ඒරූප විශෙෂයම කරන්නේද මනාකොට නිපදවන්නේද. මහරජ, යම්සේ දක්‍ෂවූ රන්කරුවෙක් හෝ රන්කරුවෙකුගේ අතවැස්සෙක් හෝ දෙස්පහකිරිමාදියෙන් මනාකොට සකස්කරණලද ස්වර්ණයෙක්හි යම් යම් ස්වර්ණාභරණ විශෙෂයක් කැමතිවන්නේ නම්. ඒ ඒ ආභරණ විශෙෂයම කරන්නේද මනාකොට නිපදවන්නේද, මහරජ, එපරිද්දෙන්ම භික්‍ෂුතෙමේ මෙසේ ධ්‍යානයෙන් සිත එකඟවූ කල්හි පිරිසිදුවූ කල්හි වෙසෙසින් දීප්තිමත්වූ කල්හි කෙලෙස් රහිතකල්හි පහවූ උපක්ලෙශ ඇති කල්හි මෘදුවූ කල්හි කර්මයට සුදුසුව සිටි කල්හි අකම්ප්‍යභාවයට පැමිණි කල්හි කියූපරිද්දෙන් ඒසිත අභිඥාපාදකවූ කල්හි ඍද්ධිවිධින්ගේ ලාභය පිණිස පරිකර්මචිත්තය එලවා තබයි. හෙවත් කසිණ අරමුණෙන් පහකොට ගෙණ ඍද්ධිවිධියට අභිමුඛව සිත යවයි.

අභිනින්නාමෙති, සො අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති එකො පි හුත්වා බහුධා හොති, බහුධා පි හුත්වා එකො හොති, ආවිභාවං තිරොභාවං තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡති සෙය්‍යථාපි ආකාසෙ, පඨවියා පි උම්මුජ්ජනිම්මුජ්ජං කරොති සෙය්‍යථාපි උදකෙ, උදකෙපි අභෙජ්ජමානො ගච්ඡති සෙය්‍යථාපි පඨවියං, ආකාසෙ පි පල්ලඞ්කෙන කමති සෙය්‍යථාපි පක්ඛී සකුණො. ඉමෙපි චන්දිමසුරියෙ එවං මහිද්ධිකෙ එවං මහානුභාවෙ පාණිනා පරිමසති.

ලැබියයුතු සෘද්ධියට බරව සාදරයෙන් සිත නමයි, මෙසේ කරණලද චිත්තාභිනීහාරඇති ඒ භික්ෂුතෙමේ නානාප්‍රකාරවූ සෘද්ධිකොට්ඨාශය වළඳයි. හෙවත් ස්‍වපගීකෙරෙමින් ප්‍රාප්තපැමිණේ. කෙසේද යත්, සෘද්ධිකිරීමට පළමුකොට ස්‍වභාවයෙන් එක්කෙනෙක්වම බොහෝ දෙනාගේ සමීපයෙහි ප්‍රශ්න විචාරීම් ආදියකරණු කැමත්තෙන් බොහෝපරිද්දෙන් වෙයි. හෙවත් සියයක් හෝ දහසක්වෙයි. බොහෝ පරිද්දෙන් වම ඉන්පසු පාදකධ්‍යානයට සමවැද එයින්නැගිට එක්කෙනෙක් වෙම්යි පරිකර්මකොට අධිෂ්ඨාන සිතසමගම එක්කෙනෙක් වෙයි ප්‍රකාශබවටද නොහොත් ප්‍රකට ප්‍රාතිහාර්‍ය්‍යයටද මුවහ බවටද නොහොත් අප්‍රකටප්‍රාතිහාර්‍ය්‍යයටද ගෘහභිත්තිහුගේ පරභාගයටද විහාරග්‍රාමාදින්ගේ ප්‍රාකාරය සම්බන්ධ පරභාගයටද පර්වතයාගේ පරභාගයටද අහසෙහිමෙන් නොගැටෙමින් ගමන්කෙරේ. මෙසේ ගමන්කරණු කැමත්තහුවිසින් ආකාසකසිණයට සමවැද එයින් නැගිට ප්‍රකාර භිත්ති ආදිය ආකාශය වේවායි අධිෂ්ඨාන කටයුතුයි ජලයෙහිමෙන් පෘථිවියෙහිද ගැලීමහා ඉල්පීමකෙරේ. මෙසේකරණු කැමත්තහුවිසින් ආපොකසිණයට සමවැද එයින්නැගිට පොළවේ මෙපමණතැන් ජලයවේවායි අධිෂ්ඨාන කටයුතු පොළවෙහිමෙන් ජලයෙහිද දියනොබෙදමින් ගමන්කෙරේ. මෙසේ කරණු කැමත්තහුවිසින් පෘථිවිකසිණයට සමවැද එයින් නැගිට ජලයේ මෙපමණ තැන් පෘථිවිය වේවායි අධිෂ්ඨාන කටයුතුයි. පියාපත්වලින්යුක්තවූ පක්ෂියෙක් යම්සේද, එපරිද්දෙන්ම අහසෙහිද පලඟින් සක්මන්කෙරේ. මෙසේ කරණුකැමැත්තහුවිසින් පෘථිවිකසිණයට සමවැද එයින් නැගිට පර්‍ය්‍යඞ්කප්‍රමාණස්ථානය පිරිසිඳ පරිකර්මකොට කියුපරිද්දෙන්ම අධිෂ්ඨාන කටයුතු. දෙසතළිස්දහසක් යොදුන් මත්තෙහි හැසිරෙණ මහත්සෘද්ධිඇත්තාවූ ලොකත්‍රයෙහි එකවිට ආලොකකරණ මහත් ආනුභාවඇත්තාවූ සඳහිරුද පරාමර්ශනය කෙරේ. හෙවත් අතින්ගණී.

පරිමජ්ජති, යාව බ්‍රහ්මලොකාපි කායෙනෙව වසං වත්තෙති, ඉදම්පි ඛො මහාරාජ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුරිමෙහි සන්දිට්ඨිකෙහි සාමඤ්ඤඵලෙහි අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

89. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මණියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ දිබ්බාය සොතධාතුයා චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය.

හාත්පසින් කැඩපත්තලයක් මෙන් පිරිමදී. අභිඥපාදක ධ්‍යාන වශයෙන් චිත්තවසීභාවයට පැමිණියාවූ ඒ භික්ෂු තෙමේ සඳහිරු ආවර්ජනාකරමින් ඥානයෙන් අධිෂ්ඨාන කෙරේද, එකල්හි දන් පසට පැමිණෙත්. එහෙයින් ඍද්ධිමත්තෙමේ සයනය කරමින් හෝ ඉඳිමින් හෝ සඳහිරු පරාමර්ශනයද කෙරේ. පිරිමැදීමද කෙරේ. බඹලොවදක්වාද කයින්වසයෙහි පවත්වයි. චිත්තවසීභාවයට පැමිණි ඍද්ධිමත්තෙමේ බ්‍රහ්මලොකයට ගමන්කෙරේ. දිවැසින් ඔහුගේ රූපය දකී. දිව්‍යශ්‍රොතෘධාතුවෙන් ඔහුගේ ශබ්දය අසයි. යනාදිනන් අයුරින් බඹලොවකෙළවරකොටඇති සියලුතන්හි. තමාගේ අධිපතිභාවය පවත්වා මහරජ, මේ සාන්දෘෂ්ටිකමාගීඵලයද පළමුදක්වනලද සාන්දෘෂ්ටිකමාගී ඵලවලටවඩා අතිශයින් මනොඥ වෙයි. අතිශයින් ශ්‍රෙෂ්ඨද වේයයි වදාළෝ.

89. ලබනලද චතුර්ථධ්‍යාන ඇති ඒ යොගී භික්ෂුතෙමේ මෙසේ රූපාවචර සිත චතුර්ථධ්‍යාන සමාධියෙන් එකඟවූ කල්හි උපෙක්ෂාස්මතින්ගේ පිරිසිදුභාවයෙන් පිරිසිදුවූකල්හි ප්‍රභාශ්වරවූකල්හි කෙලෙස් රහිතවූකල්හි පහවූ උපක්ලෙශධර්ම ඇතිකල්හි මෘදුවූකල්හි හෙවත් වසීභාවයට පැමිණිකල්හි කර්මයට සුදුසුවූකල්හි තමාගේවසයෙහි සිටිකල්හි ශ්‍රද්ධාදීෂඩ්ධර්මවිසින් පරිගෘහිත හෙයින් අකම්ප්‍යභාවයට පැමිණිකල්හි උපක්ලෙශයන්ගෙන් මිදුනුබැවින් දුරසිටියාවූද, අරමුණු පිළිගැන්මට සමර්ථවූ දිව්‍යමය ප්‍රසාදශ්‍රොත්‍රධාතුවසමානවූ වියශීභාවනා බලයෙන් නිපදවනලද දිව්‍යශ්‍රොතෘධාතුලාභය පිණිස සිත එලවා තබයි. ලැබියයුතු දිව්‍යශ්‍රොතෘධාතුවට බරව සාදරයෙන් සිත නමයි. මෙසේ කරණලද චිත්තාභිනීහාරඇති ඒ භික්ෂුතෙමේ කෙලශාභාවයෙන් පිරිසිදුවූ මනුෂ්‍යොපචාරය ඉක්මවා ශබ්ද ශ්‍රවණය කරණහෙයින් මානුසික මාංශශ්‍රොතෘධාතුව ඉක්ම පැවැත්තාවූ.

උභො සද්දෙ සුණාති, දිබ්බෙ ච මානුසෙ ච යෙ දූරෙ සන්තිකෙ ච.

90. සෙය්‍යථාපි මහාරාජ පුරිසො අද්ධානමග්ගපටිපන්නො සො සුණෙය්‍ය භෙරිසද්දම්පි මුතිඞ්ගසද්දම්පි සඞ්ඛපණවදෙණ්ඩිමසද්දම්පි තස්ස එවමස්ස භෙරිසද්දො ඉතිපි මුතිඞ්ගසද්දො ඉතිපි සඞ්ඛපණවදෙණ්ඩිමසද්දො ඉතිපි. එවමෙව ඛො මහාරාජ භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මණියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ දිබ්බාය සොතධාතුයා චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය.

දිව්‍යමය ඥාන ශ්‍රොත්‍ර ධාතුවෙන් දෙවියන්ගේ හා මනුෂ්‍යයන්ගේ ශබ්දද, යම්ශබ්දයෝ අන්‍යචක්‍රවාළයන්හි පවත්නාහු නම් ඔවුන්හා යටත් පිරිසෙයින් තමාගේ සිරුර ඇසුරුකළ පණුවන්ගේ ශබ්දදූයි යම්ශබ්දයෝ සමීපයෙහි වෙත්නම්ඔවුන්ද යනමේ ශබ්ද දෙකම ශ්‍රවණය කෙරේ.

90. මහරජ, යම්සේ පුරුෂයෙක් දීර්ඝමාර්ගයකට පිළිපන්නේවේද හෙතෙමේබෙරහඬක්ද මිහිඟුබෙරහඬක්ද සක්හඬක්ද පණාබෙර හඬක්ද ගැටබෙරහඬක්ද අසන්නේද මේ බෙරහඬ යයි කියාද මිහිඟුබෙරහඬක්යකියාද මේ සක්හඬය කියාද මේ පණාබෙර හඬයකියාද මේ ගැටබෙරහඬයකියාද ඕහට මේ අදහස ඇතිවන්නේය. මහරජ, එපරිද්දෙන්ම ලබනලද චතුර්ථධ්‍යාන ඇති ඒයොගීභික්ෂු තෙමේ, මෙසේ රූපාවචර සිත චතුර්ථධ්‍යානසමාධියෙන් එකඟවූ කල්හි උපෙක්ෂාස්මෘතින්ගේ පිරිසිදුභාව නෙන් පිරිසිදුවූ කල්හි ප්‍රභාශ්වරවූ කල්හි කෙලෙස්රහිත කල්හි පහවූ උපකෙලශධර්ම ඇතිකල්හි මෘදුවූකල්හි හෙවත් වසීභාවයට පැමිණිකල්හි, කර්මයට සුදුසුවූ කල්හි තමාගේවසයෙහි සිටිකල්හි ශ්‍රද්ධාදිෂඩ්ධර්ම විසින් පරිගෘහීත හෙයින් අකම්ප්‍යභාවයට පැමිණිකල්හි උපකෙලශයන්ගෙන් මිදුනුබැවින් දුරසිටියාවූද අරමුණු පිළිගැන්මට සමර්ථවූ දිව්‍යමය ප්‍රසාදශ්‍රොත්‍රධාතුවක්සමානවූ වීර්‍ය්‍යභාවනා බලයෙන් නිපදවන ලද ඥානශ්‍රොත්‍ර ධාතුලාභයපිණිස පරිකර්ම චිත්තය එලවා තබයි, ලැබියයුතු දිව්‍යශ්‍රොත්‍ර ධාතුවට බරව සාදරයෙන් සිත නමයි, මෙසේ කරණලද චිත්තාභිනිහාර ඇති ඒ භික්ෂුතෙමේ භාවනායෙන් පිරිසිදුවූ මනුෂ්‍යොපචාරය ඉක්මවා ශබ්ද ශ්‍රවණය කරණහෙයින් මානු සික මාංසශ්‍රොත්‍රධාතුව ඉක්මපැවැත්තාවූ දිව්‍යමය ඥානශ්‍රොත්‍රධාතුවෙන්.

උභො සද්දෙ සුණාති, දිබ්බෙච මානුසෙච යෙ දූරෙ සන්තිකෙච. ඉදම්පි ඛො මහාරාජ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුරිමෙහි සන්දිට්ඨිකෙහි සාමඤ්ඤඵලෙහි අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

91. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ චෙතොපරියඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානාති සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති, වීතරාගං වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානාති, සදොසං වා චිත්තං සදොසං චිත්තන්ති පජානාති, වීතදොසං වා චිත්තං වීතදොසං චිත්තන්ති පජානාති.

දෙවියන්ගේ හා මනුෂ්‍යයන්ගේ ශබ්දයම් ශබ්දයෝ අන්‍යචක්‍රවාළයන්හි පවත්නාහුනම්. ඔවුන් හා යටත්පිරිසෙයින් තමාගේ සිරුර ඇසුරුකළ පණුවන්ගේ ශබ්ද දූයි යමශබ්දයෝ සමීපයෙහි වෙත්නම්. ඔවුන්ද යනමේ ශබ්ද දෙකමශ්‍රවණය කෙරේ. මහරජ, මේ අත්බැව්හි දක්කයුතු ගුණඇති මේ මාගීඵලයද පළමුදක්වනලද සාන්දෘෂ්ටික මාගීඵලවලට වඩාඅතිශයින් මනොඥවේ. අතිශයින් ශ්‍රෙෂ්ඨද වේ යයි වදාළෝ.

91. ලබනලද චතුර්ථධ්‍යානඇති ඒයොගී භික්‍ෂුතෙමේ මෙසේ රූපාවචර සිත චතුර්ථධ්‍යාන සමාධියෙන් එකඟවූ කල්හි උපෙක්‍ෂාස්මෘතින්ගේ පිරිසුදුභාවයෙන් පිරිසිදුවූ කල්හි ප්‍රභාශ්වරවූකල්හි කෙලෙස් රහිත කල්හි පහවූ උපක්ලෙශධර්මඇති කල්හි මෘදුවූකල්හි හෙවත් වසීභාවයටපැමිණිකල්හි කර්මයට සුදුසුවූ කල්හි තමාගේ වසයෙහි සිටිකල්හි ශ්‍රද්ධාදිෂඩ්ධර්මයන්විසින් පරිගෘහීත හෙයින් අකම්ප්‍යභාවයට පැමිණිකල්හි චෙතොපරියාය ඥාණයයි කියනලද චිත්තපරිච්ඡෙද ඥානලාභය පිණිස පරිකර්මචිත්තය එළවා තබයි. ලැබියයුතු චිත්තපරිච්ඡෙද ඥානයට බරව සාදරයෙන් සිතනමයි. ඒ යොගී භික්‍ෂුතෙමේ තමන්හැර අන්‍යසත්වයන් ගේද අන්‍යපුද්ගලයන්ගේද සිත, තමාගේ සිතින් පිරිසිඳ රාගාදි වශයෙන් නානාප්‍රකාරයෙන් මෙසේ දනී. අටවැදෑරුම්වූ ලොභසහගතචිත්තය හෝ අටවැදෑරුම්වූ ලොභය හා එක්වූ සිතයයි දන්නේය. ලෞකික කුශලප්‍රකාශ සිත හෝ ලෞකික කුශලයන් ප්‍රකාශ සිතයයි දන්නේය. දෙවැදෑරුම්වූ වෙෂ සහගත චිත්තය හෝ දෙවැදෑරුම් දෙම්නස් එක්වගිය සිතයයි දන්නේය. ලෞකික කුශල ප්‍රකාශචිත්තය හෝ ලෞකික කුශලප්‍රකාශචිත්තයයි දන්නේය.

සමොහං වා චිත්තං සමොහං චිත්තන්ති පජානාති, වීත මොහං වා චිත්තං වීතමොහං චිත්තන්ති පජානාති, සඞ්ඛිත්තං වා චිත්තං සඞ්ඛිත්තං චිත්තන්ති පජානාති, වික්ඛිත්තං වා චිත්තං වික්ඛිත්තං චිත්තන්ති පජානාති, මහග්ගතං වා චිත්තං මහග්ගතං චිත්තන්ති පජානාති, අමහග්ගතං වා චිත්තං අමහග්ගතං චිත්තන්ති පජානාති, සඋත්තරං වා චිත්තං සඋත්තරං චිත්තන්ති පජානාති, අනුත්තරං වා චිත්තං අනුත්තරං චිත්තන්ති පජානාති, සමාහිතං වා චිත්තං සමාහිතං චිත්තන්ති පජානාති, අසමාහිතං වා චිත්තං අසමාහිතං චිත්තන්ති පජානාති, විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානාති, අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති.

විචිකිච්ඡාව හා උද්ධච්චය සමග පැවති අකුශලචිත්තය හෝ විචිකිච්ඡාව හා ඖද්ධත්‍යය එක්වයිය අකුශලචිත්ත යයි දන්නේය. ලෞකික කුශලයන් ප්‍රකාශචිත්තය හො ලෞකික කුශලයන් ප්‍රකාශ සිතයයි දන්නේය. ථිනමිද්ධය හා අනුවැපවැත් තාවූ චිත්තය හෝ ථිනමිද්ධය හා අනුවපැවති (නිදිගත්කල පැකිළසිටි) සිතයයි දන්නේය. ඖද්ධත්‍යය හා එක්විමෙන් නො සන්හුන් ස්වභාවයෙන් විසිරපවත්නා චිත්තය හෝ නොසන්හුන් ස්වභාවයෙන් විසිර පවත්නා සිතයයි දන්නේය. රූපාවචර අරූපා වචර චිත්තය හෝ රූපාවචර අරූපාවචර බ්‍රහ්මලොකවල පැවති සිතයයි දන්නේය. කාමාවචර චිත්තය හෝ කාමාවචර ලොකයෙහි පැවති සිතයයි දන්නේය. රූපාවචර අරූපාවචර චිත්තය හෝ රූපාවචර අරූපාවචර සිතයයි දන්නේය. චිත්තෛකාග්‍රතාවයෙන් උපදනා අර්පණසමාධි උපචාරසමාධි සහිත චිත්තය හෝ අර්පණසමාධි උපචාර සමාධිවශයෙන් එකඟවූ සිතයයි දන්නේය. එසේ නො සන්හුන් චිත්තය හෝ සමාධිවශයෙන් නොසන්හුන් සිතයයි දන් නේය. තදඞ්ගවිෂ්කම්භණවිමුක්තින් යුක්තවූ සිත හෝ තදඞ්ගවිෂ් කම්භණ විමුක්තින් මිදිසිටි සිතයයි දන්නේය. තදඞ්ගවිෂ්කම්භණ විමුක්තිදෙකින් යුක්තනොවූ චිත්තය හෝ ලොභාදී ක්ලෙශයන් දුරුවීමට තිසි අනාදි දුඃඛාදි කාරණයන් හා "පාණාතිපාතා වෙරමණී" යනාදි ශික්ෂාපද සිහිකිරීමෙන් ඒ ඒ අකුශල් සිඞ නොවනසේ සිහි කිරීමෙන් කරණ යම් යම් උපායෙක්ඇද්ද, ඒ හැම තදඞ්ගනම් වෙයි. භාවනාකොට ධ්‍යාන උපදවාගෙණ එම භාවනාබලයෙන් ක්ලෙශ යන් ඔබ්බාගැන්ම විෂ්කම්භනම් වෙයි. එසේවූ ද්විප්‍රකාර විමුක්තියෙන් යුක්තනොවූ ක්ලෙශයන් හා එක්ව පවත්නා සිතයයි දන්නේය.

92. සෙය්‍යථාපි මහාරාජ ඉත්ථී වා පුරිසො වා දහරො වා යුවා මණ්ඩනජාතිකො ආදාසෙ වා පරිසුද්ධෙ පරියොදාතෙ අච්ඡෙ වා උදපත්තෙ සකං මුඛනිමිත්තං පච්චවෙක්ඛමානො සකණිකං වා සකණිකන්ති ජානෙය්‍ය අකණිකං වා අකණිකන්ති ජානෙය්‍ය, එවමෙව ඛො මහාරාජ භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ චෙතොපරියඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති සො පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානාති සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති. වීතරාගං වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානාති. සදොසං වා චිත්තං සදොසං චිත්තන්ති පජානාති. වීතදොසං වා චිත්තං වීතදොසං චිත්තන්ති පජානාති. සමොහං වා චිත්තං සමොහං චිත්තන්ති පජානාති.

---

92. මහරජ, ස්ත්‍රියෙක් හෝ පුරුෂයෙක් හෝ යොවුන් බැවින් යුක්තවූ තරුණයෙක් හෝ සැරසීම ස්වභාකොට ඇත්තේ, පිරිසිදුවූ දීප්තිමත්වූ කැඩපතක හෝ නිර්මලවූ ජලභාජනයෙක්හි හෝ තමාගේ මුඛශොභාව ප්‍රත්‍යවේක්‍ෂාකරන්නේ තලකැලල් සහිතවූවක් හෝ තලකැලල්සහිතයයි යම්සේ දැනගන්නේද. තලකැලල්රහිතවූවක් හෝ තලකැලල්රහිතයයි යම්සේ දැනගන්නේද මහරජ, එපරිද්දෙන්ම යොගීභික්‍ෂුතෙමේ, රූපාවචර සිත චතුර්ථධ්‍යානසමාධින් එකඟවූ කල්හි පිරිසිදුවූ කල්හි අත්‍යර්ථයෙන් දීප්තිමත්වූ කල්හි කෙලෙස්රහිත කල්හි පහවූ උපක්ලෙශධර්මඇතිකල්හි වසීභාවයට පැමිණිකල්හි කර්මයට සුදුසුවූකල්හි තමාගේ වසයෙහි සිටිකල්හි ශ්‍රද්ධාදිෂඩ්ධර්මවිසින් පරිගෘහිතහෙයින් අකම්ප්‍යභාවයට පැමිණිකල්හි චෙතොපරියායඥාණයයි කියනලද චිත්තපරිච්ඡේදඥානලාභයපිණිස පරිකර්මචිත්තය එලවා තබයි. ලැබියයුතු චිත්තපරිච්ඡේදඥානයට බරව සාදරයෙන් සිතනමියි. ඒ යොගීභික්‍ෂුතෙමේ, තමන්හැර අන්‍යසත්වයන්ගේද, අන්‍යපුද්ගලයන්ගේද, සිත තමාගේ සිතින් පිරිසිඳ රාගාදිවශයෙන් නානාප්‍රකාරයෙන් වෙසෙසාදනී අටවැදෑරුම්වූලොභසහගතචිත්තයහෝඅටවැදෑරුම්වූ ලොභයහා එක්වූ සිතයයි දන්නේය. ලෞකික කුශලප්‍රකාශ සිත හෝ ලෞකික කුශලයන් ප්‍රකාශ සිතයයි දන්නේය. දෙවැදෑරුම්වූ වෙෂසහගත චිත්තය හෝ දෙවැදෑරුම් දෞර්මනස් එක්වගිය සිතයයි දන්නේය. ලෞකික කුශලප්‍රකාශචිත්තය හෝ ලෞකික කුශලප්‍රකාශ චිත්තයයි දන්නේය. විචිකිච්ඡාව හා උද්ධච්චය සමඟ පැවති අකුශල චිත්තය හෝ විචිකිච්ඡාව හා ඖද්ධත්‍යය එක්වගිය අකුශලචිත්තයයි දන්නේය.

වීතමොහං වාචිත්තං වීතමොහං චිත්තන්තිපජානාති-පෙ-සඞ්ඛිත්තං වා චිත්තං-පෙ-වික්ඛිත්තං වාචිත්තං-පෙ-මහග්ගතං වා චිත්තං-පෙ-අමහග්ගතං වා චිත්තං-පෙ-සඋත්තරං වා චිත්තෙ-පෙ-අනුත්තරං වා චිත්තා-පෙ-සමාහිතංවා චිත්තං—පෙ—අසමාහිතංවාචිත්තං —පෙ— විමුත්තංවා චිත්තං - පෙ — විමුත්තං චිත්තන්ති පජානාති. අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති ඉදම්පි බො මහරාජ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුරිමෙහි සන්දිට්ඨිකෙහි සාමඤ්ඤඵලෙහි අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

ලෞකික කුශලයන් ප්‍රකාශචිත්තය හෝ ලෞකිකකුශල යන් ප්‍රකාශ සිතයයි දන්නේය. ථිනමිද්ධය හා අනුවපැවැත්තාවූ චිත්තය හෝ ථිනමිද්ධය හා අනුවපැවති (නිදිගත්කල පැකිළසිටි) සිතයයි දන්නේය. ඖද්ධත්‍යය හා එක්වීමෙන් නොසන්හුන් සවභාවයෙන් විසිරපවත්නා චිත්තය හෝ නොසන්හුන් ස්වභාව යෙන් විසිරපවත්නා සිතයයි දන්නේය. රූපාවචර අරූපාවචර චිත්තය හෝ රූපාවචර අරූපාවචර බ්‍රහ්මලොකවලපැවති සිතයයි දන්නේය. කාමාවචර චිත්තය හෝ කාමාවචර ලොකයෙහි පැවති සිතයයි දන්නේය. කාමාවචරසිත හෝ කාමාවචර ලොකයෙහිවූ සිතයයි දන්නේය. රූපාවචර අරූපාවචර චිත්තය හෝ රූපාවචර අරූපාවචර සිතයයි දන්නේය. චිත්තෛකාග්‍රතාවයෙන් උපදනා අර්පණ සමාධි උපචාරසමාධි සහිත චිත්තය හෝ අර්පණසමාධි උපචාර සමාධිවශයෙන් එකඟවූ සිතයයි දන්නේය. එසේ නොසන්හුන් චිත්තය හෝ සමාධිවශයෙන් නොසන්හුන් සිතයයි දන්නේය. තදඞ්ගවිෂ්කම්භණ විමුක්තීන් යුක්තවූ සිත හෝ තදඞ්ගවිෂ්කම්භණ විමුක්තීන් මිදීසිටි සිතයයි දන්නේය. තදඞ්ගවිෂ්කම්භණ විමුක්ති දෙකින් යුක්තනොවූ චිත්තය හෝ ලොභාදී ක්ලෙශයන් දුරුවීමට නිසි අනිත්‍ය දුඃඛාදී කාරණයන් හා "පාණාතිපාතා වෙරමණී,, යනාදී ශික්ෂාපද සිහිකිරීමෙන් ඒ ඒ අකුශල් සිඳනොවනසේ සිහි කිරීමෙන් කරණ යම් යම් උපායෙක් ඇද්ද, ඒ හැම තදඞ්ගනම් වෙයි. භාවනාකොට ධ්‍යාන උපදවාගෙණ එම භාවනා බලයෙන් ක්ලෙශයන් ඔබාගැන්ම විෂ්කම්භණනම් වෙයි. එසේවූ විප්‍රකාර විමුක්තියෙන් යුක්තනොවූ ක්ලෙශයන් හා එක්ව පවත්නාසිත යයි දන්නේය. මහරජ, මේදක්වනලද මේ අත්බැව්හි දක්කයුතු ගුණ ඇති මාගීඵලයද පළමුදක්වනලද සාන්දෘෂ්ටිකමාගීඵලවලට වඩා අතිශයින් මනොඥවේ. අතිශයින්ශ්‍රේෂ්ඨද වේයයි වදළෝ.

93 සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මණියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ පුබ්බෙනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති සො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති සෙය්‍යථීදං එකම්පි ජාතිං ද්වෙපි ජාතියො තිස්සොපි ජාතියො චතස්සොපි ජාතියො පඤ්චපි ජාතියො දසපි ජාතියො වීසතිම්පි ජාතියො තිංසම්පි ජාතියො චත්තාරීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාතිසතම්පි ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි අනෙකෙපි සංවට්ටකප්පෙ අනෙකෙපි විවට්ටකප්පෙ අනෙකෙපි සංවට්ටවිවට්ටකප්පෙ අමුත්‍රාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී.

---

93. ඒයෝගීභික්ෂුතෙමේ රූපාවචරසිතවතුර්ථධ්‍යානසමාධින්මෙසේ එකඟවූ කල්හි පිරිසිදුවූකල්හි අත්‍යර්ථයෙන් දීප්තිමත්වූකල්හි කෙලෙස්රහිතකල්හි පහවූ උපක්ලේශධර්මඇතිකල්හි වසීභාවයට පැමිණිකල්හි කර්මයටසුදුසුවූකල්හි තමාගේවසයෙහි පිහිටිකල්හි ශ්‍රද්ධාදීෂඩ්ධර්මවිසින් පරිගෘහීතහෙයින් අකම්ප්‍යභාවයට පැමිණි කල්හි පෙරවිසූකන්දපිළිවෙල දැනගන්නානුවණලැබීමපිණිස පරිකර්මිතනය එලවා තබයි. ලැබියයුතු පූර්වේනිවෙශඥානයට බරව සාදරයෙන් සිතනමයි. ඒයෝගීභික්ෂුතෙමේ නානාවිධවූ හෙවත් නොයෙක්ප්‍රකාරයෙන් පවත්වනලද පූර්වේනිවාසය හෙවත් අනතුරුභාවය ආදිකොට ඇති ඒ ඒ ජාතින්හි පැවති පරම්පරාව ස්කන්ධපටිපාටිවශයෙන් හෝ චුතිප්‍රතිසන්ධිවශයෙන් අනුවගොස් සිහිකෙරේ. ඒකවරේදයත්, එක්ජාතියක්ද හෙවත් එක්ප්‍රතිසන්ධියක් මුල්කොට ඇති චුතියක්කෙළවරකොට ඇති එක්භවයකට ඇතුළත්වූ ස්කන්ධපිළිවෙළක්ද, මෙසේම ජාතිදෙකක්ද, ජාතිතුණක්ද, ජාතිසතරක්ද, ජාතිපසක්ද. ජා ති ද ස ය ක් ද, ජා ති වි ස් ස ක් ද, ජා ති තිසක්ද, ජාතිසතළිසක්ද, ජාතිපණසක්ද, ජාතිසියයක්ද, ජාතිදහසක්ද, ජාතිලක්ෂයක්ද, නොයෙක් පිරිහෙනුලබන කල්පයන්ද, මෙසේම සංවර්ත්තස්ථායී කල්පයන්ද, නොයෙක් වැඩෙනකල්පයන්ද, නොයෙක් විවර්ත්තස්ථායී කල්පයන්ද නොයෙක් සංවර්ත විවර්ත කල්පයන්ද, සිහිකෙරේ. මම අසවල් සංවර්තකල්පයෙහි හෝ අසවල් භවයෙහි හෝ සත්ත්වාවාසසත්ත්වනිකායාදියෙහි උපන්නෙම් මෙබඳුනම් ඇත්තෙක්වීමි. මෙබඳු ගොත්‍ර ඇත්තෙක්වීමි. මෙබඳු ශරීරදුක් වර්ණ ඇත්තෙක්වීමි. මෙබඳු ආහාර ඇත්තෙක්වීමි. මෙබඳු සැප විඳීම්ඇත්තෙක් වීමි.

එවමායුපරියන්තොසො තතො චුතො අමුත්‍ර උපපාදිංතත්‍රාපාසිං එවං නාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛප්‍ප ටිසංවෙදි එවමායුපරියන්තො සො තතො චුතො ඉධූපපණ්ණොති. ඉතිසාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති.

94 සෙය්‍යථාපි මහරාජ පුරිසො සකම්හාගාමා අඤ්ඤං ගාමං ගච්ඡෙය්‍ය තම්හාපි ගාමා අඤ්ඤං ගාමං ගච්ඡෙය්‍ය තම්හා ගාමා සක ඤ්ඤෙව ගාමං පච්චාගච්ඡෙය්‍ය තස්ස එවමස්ස අහං ඛො සක ම්හා ගාමා අමුං ගාමං අගච්ඡිං තත්‍ර එවං අඨාසිං එවං නිසීදිං එවං අභාසිං එවං තුණ්හි අහොසිං තම්හාපි ගාමා අමුං ගාමං අගච්ඡිං තත්‍රාපි එවං අඨාසිං එවං නිසීදිං එවං අභාසිං එවං තුණ්හි අහොසිං සොම්හි තම්හා ගාමා සකඤ්ඤෙව ගාමං පච්චාගතොති එවමෙවං ඛො මහාරාජ භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදා තෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මණියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ.

මෙබඳු ආයුෂයක් කෙළවරකොට ඇත්තෙක්වූයෙමි. ඒමම එහින්චුත වූයෙමිඅසවල්තැනඋපන්නෙමි. එහිදමෙබඳුනම්ඇත්තෙක්වීමි. මෙබඳු ගොත්‍රඇත්තෙක් වීමි. මෙබඳුශරීරවණී ඇත්තෙක්වීමි. මෙබඳුආහාර ඇත්තෙක්වීමි මෙබඳුසැපදුක් විඳිමිඇත්තෙක්වීමි. ඒමම එයින් චුතවූ යෙමි මෙ අත්බැව්හි උපන්නෙමියි කියායි. මෙසේ වණීාදිවශයෙන් ආකාර සහිතවූ නාමගොත්‍රාදිවශයෙන් උද්දෙසුම්සහිතවූ නානාවිධවූ පෙරවිසූකඳපිළිවෙල ඥානයෙන් අනුවගොස් සිහිකෙරේ.

94. මහරජ, යම්සේ පුරුෂයෙක් තමාගේ ගමින් අනික්ගමකට යන්නේද, ඒගමින්ද අනික්ගමකට යන්නේද, ඒගමින් තමාගේ ගමටම පෙරළාඑන්නේද, ඕහට මේඅදහස වන්නේය. මමවූකලි මාගේ ගමින් අසවල්ගමට ගියෙමි. එහි මෙසේ සිටියෙමි. මෙසේ උන්නෙමි. මෙසේ කථාකෙළෙමි. මෙසේ නිශ්ශබ්ද වූයෙමි. ඒ ගමින්ද අසවල්ගමට ගියෙමි. එහිද මෙසේ සිටියෙමි. මෙසේ උන් නෙමි. මෙසේ කථා කෙළෙමි. මෙසේ නිශ්ශබ්ද වූයෙමි. ඒමම ඒ ගමින් සවකීයගමටම පෙරළාආයේ වෙමියි කියායි. මහරජ, එපරිද් දෙන්ම ඒ යොගී භික්‍ෂුතෙමේ රූපාවචරසිත චතුර්ථධ්‍යානසමාධීන් එකගවූ කල්හි පිරිසිදුවූකල්හි අත්‍යර්ථයෙන් දීප්තිමත්වූ කල්හි කෙලෙස්රහිතකල්හි පහවූ උපක්ලෙශධර්ම ඇතිකල්හි වශීභාවයට පැමිණිකල්හි කර්මයටසුදුසුවූ කල්හි තමාගේ වසයෙහි පිහිටිකල්හි ශ්‍රද්ධාදිෂඩ්ධර්මවිසින් පරිග්‍රහිත හෙයින් අකම්ප්‍යභාවයට පැමිණි කල්හි

පුබ්බෙනිවාසානුස්සති ඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති සො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති සෙය්‍යථිදං, එකම්පි ජාතිං ද්වෙපි ජාතියො තිස්සොපි ජාතියො චතස්සොපි ජාතියො පඤ්චපි ජාතියො දසපි ජාතියො වීසතිම්පි ජාතියො තිංසම්පි ජාතියො චත්තාරීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාතිසතම්පි ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි අනෙකෙපි සංවට්ටකප්පෙ අනෙකෙපි විවට්ටකප්පෙ අනෙකෙපි සංවට්ටවිවට්ටකප්පෙ අමුත්‍රාසිං එවං නාමො එවං ගොත්තො එවං වණ්ණො එවමාහාරො එවං සුඛදුක්ඛපටිසංවෙදී එවමායු පරියන්තො සො තතො චුතො අමුත්‍ර උදපාදිං තත්‍රාපාසිං එවං නාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛ පටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො ඉධුපපන්නොති.

පෙරවිසූ කඳපිළිවෙළ දැනගන්නා නුවණලැබීමපිණිස ධ්‍යාන චිත්තය එලවාතබයි. ලැබියයුතු පූර්වේනිවාසඥානයට බරව සාදර යෙන් සිතනමයි. ඒ යොගීභික්ෂුතෙමේ නානාවිධවූ හෙවත් නොයෙක් ප්‍රකාරයෙන් පවත්වනලද පූර්වේනිවාසය හෙවත් අනතුරු භාවය ආදිකොටඇති ඒ ඒ ජාතීන්හි පැවති පරම්පරාව ස්කන්ධ පටිපාටිවශයෙන් හෝ චුතිප්‍රති සන්ධිවශයෙන් අනුවගොස් සිහිකෙරේ. ඒ කවරේදයත්, එක්ජාතියක්ද හෙවත් එක්ප්‍රතිසන්ධියක් මුල්කොට ඇති චුතියක් කෙළවරකොට ඇති එක්භවයකට ඇතුළත්වූ ස්කන්ධ පිළිවෙළද මෙසේම ජාතිදෙකක්ද, ජාතිතුණක්ද, ජාතිසතරක්ද. ජාතිපසක්ද, ජාතිදසයක්ද, ජාතිවිස්සක්ද, ජාතිතිසක්ද, ජාතිසතළිසක්ද, ජාතිපණසක්ද, ජාතිසියයක්ද, ජාතිදහසක්ද ජාතිලක්‍ෂයක්ද, නොයෙක් පිරිහෙනුලබන කල්පයන්ද, මෙසේම සංවට්ටස්ථායී කල්පයන්ද, නොයෙක් වැඩෙනකල්පයන්ද, නොයෙක් විවට්ටස්ථායී කල්පයන්ද, නොයෙක් සංවර්තවිවර්තකල්පයන්ද, සිහිකෙරේ. මම අසවල් සංවර්තකල්පයෙහි හෝ අසවල් භවයෙහි හෝ සත්වාවාසසත්වනිකායාදියෙහි හෝ උපන්නෙමි. මෙබඳුනම් ඇත්තෙක් වීමි. මෙබඳු ගොත්‍ර ඇත්තෙක්වීමි. මෙබඳු ශරීර ඇත්තෙක්වීමි. මෙබඳු ආහාර ඇත්තෙක වීමි. මෙබඳු සැපදුක් විඳිම් ඇත්තෙක්වීමි. මෙබඳු ආයුෂයක් කෙළවරකොට ඇත්තෙක්වූයෙමි. ඒ මම එයින් චුතවූයෙම් අසවල්තැන උපන්නෙමි. එහිද මෙබඳුනම් ඇත්තෙක්වීමි, මෙබඳු ගොත්‍ර ඇත්තෙක්වීමි. මෙබඳු ශරීරවර්ණ ඇත්තෙක්වීමි. මෙබඳු ආහාර ඇත්තෙක්වීමි. මෙබඳු සැපවිඳීම් ඇත්තෙක්වීමි. මම එයින් චුතවූයෙම් මේඅත්බැවීහි උපන්නෙමියි කියායි.

ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. ඉදම්පි ඛො මහාරාජ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුරිමෙහි සන්දිට්ඨිකෙහි සාමඤ්ඤඵලෙහි අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

95. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනිහරති අභිනින්නාමෙති. සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උප්පජ්ජමානෙ, හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති. ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා.

මෙසේ වර්ණාදිවශයෙන් ආකාරසහිතවූ නාමගොත්‍රාදිවශයෙන් උදෙසුම් සහිතවූ නානාවිධවූ පෙරවිසූ කඳපිළිවෙළ ඥනයෙන් අනුව ගොස් සිහිකෙරේ. මහරජ, මේ අත්බැවිහි දක්කයුතුගුණඇති මේ මාගීඵලයද පළමුදක්වනලද සාන්දෘෂ්ටිකමාගීඵලවලට වඩා අතිශයින් මනොඥ වේ. අතිශයින් ශ්‍රෙෂ්ඨදවේයයි වදාළෝ.

95. ඒ යොගීභික්‍ෂුතෙමේ මෙසේ ධ්‍යානයෙන් සිත එකඟවූකල්හි පිරිසිදුවූකල්හි අත්‍යර්ථයෙන් දීප්තිමත්වූකල්හි කෙලෙස්රහිතකල්හි පහවූ උපක්ලෙශධර්මඇතිකල්හි වසීභාවයට පැමිණිකල්හි කර්මයට සුදුසුවූකල්හි තමාගේ වසයෙහි පිහිටිකල්හි අකම්ප්‍යභාවයටපැමිණිකල්හි සත්‍වයන්ගේ චුතිඋත්පත්ති දනගන්නා ඥනය ලැබීමපිණිස ධ්‍යානසිත එලවා තබයි. ලැබියයුතු චුතූපපාතඥනයට බරව සාදරයෙන් සිත නමයි. ඒ යොගීභික්‍ෂුතෙමේ පිරිසිදුවූ මනුෂ්‍යඥනය ඉක්මපවන්නාවූ දිව්‍යඥනයෙන් චුතියට ආසන්නවසිටි සත්‍වයන්ද, උපදින්නාවූ, සත්‍වයන්ද, දකී. මොහහෙතුවෙන් යුක්තබැවින් හීනජාතිකුලාදීන්ගේ වශයෙන් අවඥකරණලද සත්වයන්ද, ශ්‍රෙෂ්ඨසත්වයන්ද, මනවඩන්නාවූ මනහරවර්ණඇති සත්වයන්ද, මනනොවඩන්නාවූ දුර්වර්ණවත් සත්වයන්ද, යහපත්ගතිඇති ධනාදියෙන් ආඪ්‍ය සත්වයන්ද, දිළිඳුබැවින් ස්වල්පවූ ආහාරපානාදියඇති නපුරුගතියට පැමිණි සත්වයන්ද, යම් යම් කර්මයක් රැස්කරණලද්දේනම් ඒ ඒ කර්මානුරූප පරිද්දෙන් සුගති දුර්ගති දෙකට පැමිණි සත්වයන්ද, ඥානයෙන් දනගණී. ඒකාන්තයෙන් මේ සත්වයෝ කායදුශ්චරිතයෙන් යුක්තවූවෝය, වචීදුශ්චරිතයෙන් යුක්තවූවෝය, මනොදුශ්චරිතයෙන් යුක්තවූවෝය.

අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා තෙ කායස්සභෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නාති ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උප්පජ්ජමානෙ, හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති.

96. සෙය්‍යථාපි මහාරාජ මජ්ඣෙ සිංඝාටකෙ පාසාදො, තත්‍ථ චක්ඛුමා පුරිසො ඨිතො පස්සෙය්‍ය මනුස්සෙ ගෙහං පවිසන්තෙපි නික්ඛමන්තෙපි රථියා වීථිසඤ්චරන්තෙපි මජ්ඣෙ සිංඝාටකෙ නිසින්නෙ. තස්ස එවමස්ස එතෙ මනුස්සා ගෙහං පවිසන්ති.

බුද්ධප්‍රත්‍යෙකබුද්ධාදි ආර්‍ය්‍යයන්ට මොවුන්ට මහණදම් නැතැයි යනාදීන් අන්තිම වස්තුවෙන් හෝ ධ්‍යානවිමොක්ෂමාර්ගඵල නැතැයි ගුණවැනසීමෙන් ආක්‍රොශකෙරෙත්. මිථ්‍යාලබ්ධිඇත්තෝය, මිථ්‍යාදෘෂ්ටිකර්‍මසමාදාන ඇත්තෝය, ඒ සත්වයෝ කාය භෙදයෙන් මරණින්මතු සැපයෙන් තොරවූ නපුරුගති ඇත්තාවූ විවසව පතිතවන්නාවූ නරකයෙහි උපන්නාහුය. මේ පින් වත් සත්වයෝ වූකලි කායසුචරිතයෙන් යුක්තවූවෝය, වාක්සුචරිතයෙන් යුක්තවූවෝය, මනොසුචරිතයෙන් යුක්තවූවෝය, බුද්ධාදි ආර්‍ය්‍යයන්ට ආක්‍රොශනොකරන්නාහුය, සම්‍යක්දර්‍ශන ඇත්තාහුය, සම්‍යක්දෘෂ්ටිකර්‍මසමාදාන ඇත්තාහුය, ඒ සත්වයෝ කාබුන් මරණින් මතු යහපත්ගති ඇත්තාවූ ස්වර්‍ගලොකයෙහි උපන්නාහුය කියායි. මෙසේ පිරිසිදුවූ මනුෂ්‍යඥානචක්ෂුස ඉක්මපැවැත්තාවූ, දිවැසින් චුතවන්නාවූද, උපදින්නාවූද, සත්වයන් දකී. හීනජාතිකුලාදීන්ගේ වශයෙන් අවඥාකරණලද සත්වයන්ද, ශ්‍රෙෂ්ඨ සත්වයන්ද, මනොඥ වර්‍ණවත් සත්වයන්ද, දුර්‍වර්‍ණ සත්වයන්ද, යහපත්ගතිඇති සත්වයන්ද, නපුරුගතිඇති සත්වයන්ද, යම් යම් කර්‍මයක් රැස්කරණලද්දේනම් ඒ ඒ කර්‍මානුරූප පරිද්දෙන් සුගතිදුර්‍ගති දෙකට පැමිණි සත්වයන්ද ඥානයෙන් දැනගණී.

96. මහරජ, යම්සේ මාර්‍ගසන්ධියක් මැද ප්‍රාසාදයක් වන්නේද, එහි චක්ෂුරින්ද්‍රිය ශක්තියඇත්තාවූ පුරුෂයෙක් සිටියේ ගෙටඇතුල්වන්නාවූද ගෙයින් පිටතට නික්මෙන්නාවූද, රථයෙන් විථිසඤ්චාරණය කරන්නාවූද, මාර්‍ගසන්ධිය මැද උන්නාවූද, මනුෂ්‍යයන් දක්නේද, ඕහට මේ අදහස ඇතිවන්නේය. මේ මනුෂ්‍යයෝ ගෙට ඇතුල්වෙත්.

එතෙ නික්ඛමන්ති එතෙ රථියා වීථිසංචරන්ති එතෙ මජ්ඣෙ සිංඝාට
කෙ නිසින්නාති. එවමෙව ඛො මහාරාජ භික්ඛු එවං සමාහිතෙ චිත්
තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ
කම්මණියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ සත්තානං චුතූපපාතඤාණාය
චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො දිබ්බෙන චක්ඛුනා විසු
ද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උප්පජ්ජ
මානෙ, හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ
යථාකම්මූපගෙ සත්තෙ පජානාති ඉමෙවත භොන්තො සත්තා
කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා
මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා
මිච්ඡාදිට්ඨිකම්මසමාදානා තෙ කායස්ස භෙදා පරම්මරණා අපායංදුග්ග
තිං විනිපාතං නිරයං උප්පන්නා.

මොව්හු ගෙසින් බැහැර නික්මෙත්, මොව්හු රථයෙන් විපිසඤ්චාර
ණය කෙරෙත්, මොව්හු මාග්සන්ධිය මැද උන්නාහුය කියායි. මහරජ,
එපරිද්දෙන්ම ඒ යොගීභික්ෂුතෙමේ මෙසේ ධ්‍යානයෙන් සිත එකඟවූ
කල්හි පිරිසිදුවූකල්හි අත්‍යර්‍ථයෙන් දිප්තිමත්වූකල්හි කෙලෙස්රහිත
කල්හි පහවූ උපක්ලෙශධර්මඇතිකල්හි වසීභාවයටපැමිණිකල්හි කර්ම
යට සුදුසුවූකල්හි තමාගේ වසයෙහි පිහිටිකල්හි අකම්ප්‍යභාවයට
පැමිණිකල්හි සත්වයන්ගේ චුතිඋත්පත්ති දැනගන්නාඥානයලැබීම
පිණිස පරිකර්මසිත එලවා තබයි. ලැබියයුතු චුතූපපාතඥානයට
බරව සාදරයෙන් සිත නමයි. ඒ යොගීභික්ෂුතෙමේ පිරිසිදුවූ මනුෂ්‍ය
ඥානය ඉක්මපවත්නාවූ දිව්‍යඥනයෙන් චුතියට ආසන්නවසිටි සත්
වයන්ද, උපදින්නාවූ, සත්වයන්ද දකී. මොහහෙතුවෙන් යුක්ත
බැවින් හීනජාතිකුලාදීන්ගේ වශයෙන් අවඥකරණලද සත්වයන්ද,
ශ්‍රෙෂ්ඨ සත්වයන්ද, මනවඩන්නාවූ සත්වයන්ද, දුර්‍වර්‍ණ සත්වයන්ද,
යහපත්ගතිඇති ධනාදියෙන් ආඪ්‍ය සත්වයන්ද, දිළිඳුබැවින් ස්වල්පවූ
ආහාරපානාදියඇති නපුරුගතියටපැමිණි සත්වයන්ද, යම් යම් කර්‍ම
යක් රැස්කරණලද්දේනම් ඒ ඒ කර්මානුරූපපරිද්දෙන් සුගතිදුර්ගති
දෙකටපැමිණි සත්වයන්ද, ඥනයෙන් දැනගණී. එකාන්තයෙන් මේ
සත්වයෝ කායදුශ්චරිතයෙන් යුක්තවූවෝය, වචීදුශ්චරිතයෙන් යුක්
තවූවෝය, මනොදුශ්චරිතයෙන් යුක්තවූවෝය, බුද්ධප්‍රත්‍යෙක බුද්ධාදී
ආර්‍ය්‍යයන්ට මොවුන්ට මහණදම් නැතැයි යනාදීන් අන්තිම වස්තු
වෙන් හෝ ධ්‍යානවිමොක්ෂමාර්ගඵලනැතැයි ගුණවැනසීමෙන් ආක්‍රෝ
ශ කෙරෙත්. මිථ්‍යාලබ්ධි ඇත්තෝය, මිථ්‍යාදෘෂ්ටිකර්මසමාදන ඇත්
තොය, ඒ සත්වයෝ කායභෙදයෙන් මරණින්මතු සැපයෙන් තොරවූ
නපුරුගතිඇත්තාවූ, විවසවපතිතවන්නාවූ නරකයෙහි උපන්නාහුය.

ඉමෙවාපන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා තෙ කායස්සභෙදා පරම්මරණා සුගතිං සග්ගංලොකං උප්පන්නාති. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති, ඉදම්පි ඛො මහාරජ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුරිමෙහි සන්දිට්ඨිකෙහි සාමඤ්ඤඵලෙහි අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

97. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති.

මේ පින්වත් සත්වයෝ වූකලී කායසුචරිතයෙන් යුක්තවූවෝය, වාක්සුචරිතයෙන් යුක්තවූවෝය, මනොසුචරිතයෙන් යුක්තවූවෝය, බුද්ධාදිආර්‍ය්‍යයන්ට ආක්‍රොශ නොකරන්නාහුය, සම්‍යක්දෘෂ්ටිකර්‍මසමාදාන ඇත්තාහුය, ඒ සත්වයෝ කාබුන් මරණින්මතු යහපත්ගති ඇත්තාවූ ස්වර්‍ගලොකයෙහි උපන්නාහුය කියාති. මෙසේ පිරිසිදුවූ මනුෂ්‍යඥානචක්ෂුස ඉක්ම පැවැත්තාවූ දිවැසින් චුතවන්නාවූද, උපදින්නාවූද, සත්වයන් දකී. හීනජාතිකුලාදීන්ගේ වශයෙන් අවඥකරණලද සත්වයන්ද, ශ්‍රෙෂ්ඨ සත්වයන්ද, මනොඥවර්‍ණවත් සත්වයන්ද, දුර්‍වර්‍ණ සත්වයන්ද, යහපත්ගතිඇති සත්වයන්ද, නපුරුගතිඇති සත්වයන්ද, යම් යම් කර්‍මයක් රැස්කරණලද්දේනම් ඒකර්‍මානුරූප පරිද්දෙන් සුගතිදුර්ගති දෙකට පැමිණි සත්වයන්ද, ඥානයෙන් දැනගනී. මහරජ, මේ අත්බැව්හි දක්කයුතුගුණඇති මේ මාර්‍ගඵලයද, පළමුදක්වනලද සාන්දෘෂ්ටික මාර්‍ගඵලවලටවඩා අතිශයින් මනොඥවේ. අතිශයින් ශ්‍රෙෂ්ඨද වේයයි වදාළේය.

97. ඒ යොගීභික්ෂුතෙමේ මෙසේ ධ්‍යානයෙන් සිතඑකඟවූකල්හි පිරිසිදුවූකල්හි අත්‍යර්ථයෙන් දීප්තිමත්වූකල්හි කෙලෙස්රහිතකල්හි පහවූ උපක්ලෙශධර්‍මඇතිකල්හි වසීභාවයට පැමිණිකල්හි කර්‍මයට සුදුසුවූකල්හි තමාගේ වසයෙහි පිහිටිකල්හි අකම්ප්‍යභාවයටපැමිණිකල්හි ආශ්‍රවක්ෂයකරඥානයපිණිස හෙවත් අභිත්මාර්‍ගඥානලාභය පිණිස විදර්‍ශනාචිත්තය එලවා තබයි. ලැබියයුතු ආශ්‍රවක්ෂයකරඥානයට බරව සාදරයෙන් සිත නමයි.

සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති, අයං දුක්ඛසමුදයොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති, ඉමෙ ආසවාති යථාභූතං පජානාති, අයං ආසවසමුදයොති යථාභූතං පජානාති, අයං ආසවනිරොධොති යථාභූතං පජානාති, අයං ආසවනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති, තස්ස එවං ජානතො එවං පස්සතො කාමාසවාපි චිත්තං විමුච්චති භවාසවාපි චිත්තං විමුච්චති අවිජ්ජාසවාපි චිත්තං විමුච්චති විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාති.

98. සෙය්‍යථාපි මහාරාජ පබ්බත සඞ්ඛෙපෙ උදකරහදො අච්ඡො විප්පසන්නො අනාවිලො, තත්ථ චක්ඛුමා පුරිසො තීරෙ ඨිතො.

ඒ යොගීභික්ෂුතෙමෙ මේ දුඃඛසත්‍යය නොහොත් මීටවැඩිවූ දුකක් නැතැයි ස්වභාවලක්ෂණප්‍රතිවෙධවශයෙන් තත්වූපරිද්දෙන් විදර්ශනාඥානයෙන් දැනගණී. මේ තෘෂ්ණාව දුඃඛසමුදයාර්‍ය්‍යසත්‍යයයි තත්වූපරිද්දෙන් විදර්ශනාඥානයෙන් දැනගණී. මේ තෘෂ්ණානිරොධසඞ්ඛ්‍යාතනිර්වාණය දුඃඛනිරොධාර්‍ය්‍යසත්‍යයයි තත්වූපරිද්දෙන් විදර්ශනාඥානයෙන් දැනගණී. මේ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය දුඃඛනිරොධගාමිනීප්‍රතිපදාර්‍ය්‍ය සත්‍යයයි තත්වූපරිද්දෙන් විදර්ශනාඥානයෙන් දැනගණී. මේ කාමාශ්‍රවාදීහු ආශ්‍රවයෝයයි තත්වූපරිද්දෙන් ඥානයෙන් දැනගණී. මේ ආශ්‍රව සඞ්ඛ්‍යාත ක්ලෙශයන්ගේ පහළවීමයයි තත්වූපරිද්දෙන් ඥානයෙන් දැනගණී. මේ ක්ලෙශනිරොධය ආශ්‍රවයන්ගේ නිරුද්ධකිරීමයයි තත්වූපරිද්දෙන් දැනගණී. මේ ආශ්‍රවයන්ගේ අනුත්පාදනිරොධයට පමුණුවනසුලුවූ පිළිවෙත්මගයයි තත්වූපරිද්දෙන් දැනගණී. මෙසේ ඥානයෙන් දත්නාවූ මෙසේ නුවණින් දක්නාවූ ඒ යොගීභික්ෂුහුගේ සිත කාමාශ්‍රවය කෙරෙන් වෙසෙසින් මිදේ. භවාශ්‍රය කෙරෙන්ද සිත මිදේ. අවිද්‍යාශ්‍රවය කෙරෙන්ද සිත මිදේ. ආශ්‍රවයන් කෙරෙන් සිතමිදුනුකල්හි කෙලෙසුන්කෙරෙන් සිතමිදුනේයයි විමුක්තිඥානය උපදී. කෙසේ ප්‍රත්‍යවෙක්ෂාකෙරේදයත්, ජාතිතොමෝ ක්ෂයවිය මගබඹසරවැස නිම වණලද්දේය. චතුස්සත්‍යයන්හි චතුර්විධමාර්ගයෙන් පරිඥාප්‍රහාණාදි වශයෙන් ෂොඩෂවිධකෘත්‍යය කරණලද්දේය. මේ ක්ලෙශක්ෂයපිණිස හෝ මේ මාර්ගභාවනාවපිණිස මේ ස්කන්ධපරම්පරාවෙන් අන්‍යවූ ස්කන්ධපරම්පරාවක් මට නැතැයි ප්‍රකාරයෙන් දැනගණී.

98. මහරජ, පර්වත මස්තකයෙක්හි නිම්ලවූ විශෙෂයෙන් ප්‍රසන්නවූ නොකැලඹුනාවූ ජලවිලක්ඇම්හේවේද ඒ විල්තෙර චක්ෂුරින්ද්‍රියයාගේ දර්ශන ශක්තිය ඇතිපුරුෂයෙක් සිටීයේ.

පස්සෙය්‍යසිප්පිසම්බුකම්පිසක්ඛරකඨලම්පිමච්ඡගුම්බම්පි චරන්තම්පි තිට්ඨන්තම්පි තස්ස එවමස්ස. අයං බො උදකරහදො අච්ඡො විප්පසන්නො අනාවිලො, තත්‍රිමෙ සිප්පිසම්බුකාපි සක්ඛරකඨලාපි මච්ඡගුම්බාපි චරන්තිපි තිට්ඨන්තිපී ති. එවමෙව බො මහාරාජ භික්ඛු සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති, අයං දුක්ඛසමුදයොති, යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධොති යථාභූතං පජානාති අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති, ඉමෙ ආසවාති යථාභූතං පජානාති, අයං ආසවසමුදයොති යථාභූතං පජානාති,

---

හැසිරෙන්නාවූද,සිටින්නාවූද,සිප්පිබෙල්ලන්හාරන්වන් බෙල්ලන්ද, කැටකැබලිතිද,මත්ස්‍යසමූහයාද,යම් සේදක් නේද,ඕහටමේඅදහසවන්නේය.මෙවූකලිනිර්මලවූවිශෙෂයෙන්ප්‍රසන්නවූනොකැලඹුනාවූවතුර විලක්ස. එහි මේ සිප්පි බෙල්ලන් හා රන්වන් බෙල්ලෝද, කැට කැබිලිතිද, මත්ස්‍ය සමූහයාද, හැසිරෙන්නාහුද, සිටින්නාහුද, වෙත්ය කියාහි. මහරජ, එපරිද්දෙන්ම ඒ යොගී භික්ෂුතෙමේ මෙසේ ධ්‍යානයෙන් සිතඑකඟවූ කල්හි පිරිසිදුවූ කල්හි අත්‍යර්ථයෙන් දිප්තිමත්වූ කල්හි කෙලෙස්රහිත කල්හි පහවූ උපක්ලෙශ ධර්‍මඇති කල්හි වසීභාවයට පැමිණිකල්හි කර්‍මයට සුදුසුවූකල්හි තමාගෙ වසයෙහි පිහිටිකල්හි අකම්ප්‍යභාවයට පැමිණිකල්හි ආශ්‍රවක්ෂයකරඥනය පිණිසහෙවත් අර්හත් මාර්ගඥනලාභය පිණිස විදර්ශනාචිත්තය එලවා තබයි ලැබියයුතු ආශ්‍රවක්ෂයකරඥනයට බරව සාදරයෙන් සිතනමයි.ඒයොගීභික්ෂුතෙමේමේ දුඃඛායයි සත්‍යයයි නොහොත් මීට වැඩිවූ දුකක් නැතැයි ස්වභාවලක්ෂණප්‍රතිවෙධවශයෙන් තත්වූ පරිද්දෙන් විදර්ශනාඥනයෙන් දැනගණී. මේ තෘෂ්ණාව දුඃඛසමුදයායයි සත්‍යයයි තත්වූපරිද්දෙන් විදර්ශනාඥනයෙන් දැනගණී. මේ තෘෂ්ණා නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණය දුඃඛනිරොධායයිසත්‍යයයි තත්වූපරිද්දෙන් විදර්ශනාඥනයෙන්දැනගණී. මේ ආර්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදායයි සත්‍යයයි තත්වූපරිද්දෙන් විදර්ශනාඥනයෙන් දැනගණී. මේ කාමාශ්‍රවාදීහු ආශ්‍රවයෝයයි තත්වූපරිද්දෙන් ඥනයෙන් දැනගණී. මේආශ්‍රව සඞ්ඛ්‍යාත ක්ලෙශයන්ගේ පහළවීමයයි තත්වූපරිද්දෙන් ඥනයෙන්දැනගණී.

අයං ආසවනිරොධොතියථාභූතං පජානාති, අයං ආසවනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති, තස්ස එවං ජානතො එවං පස්සතො කාමාසවාපි චිත්තං විමුච්චති භවාසවාපි චිත්තං විමුච්චති අවිජ්ජාසවාපි චිත්තං විමුච්චති විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති, ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාති, ඉදං ඛො මහාරාජ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුරිමෙහි සන්දිට්ඨිකෙහි සාමඤ්ඤඵලෙහි අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච. ඉමෙහි මහාරාජ සන්දිට්ඨිකෙහි සාමඤ්ඤඵලෙහි අඤ්ඤං සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං උත්තරිතරංවා පණීතතරංවා නත්ථීති.

99. එවං වුත්තෙ රාජාමාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො භගවන්තං එතදවොච. අභික්කන්තං භන්තෙ, අභික්කන්තං භන්තෙ. සෙය්‍යථාපි භන්තෙ නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය.

මේ ක්ලෙශනිරොධය ආශ්‍රවයන්ගේ නිරුද්ධකිරීමයයි තත්වූපරිද්දෙන් දැනගණී. මේ ආශ්‍රවයන්ගේ අනුත්පාදනිරොධයට පමුණුවන සුලුවූ පිළිවෙත්මගයයි තත්වූපරිද්දෙන් දැනගණී. මෙසේ ඥානයෙන්දන්නාවූ මෙසේ ඥානයෙන් දක්නාවූ ඒ යොගීහුගේ සිත කාමාශ්‍රවය කෙරෙන්වෙසෙසින් මිදේ. භවාශ්‍රවයකෙරෙන්ද සිතමිදේ අවිද්‍යාශ්‍රවය කෙරෙන්ද, සිතමිදේ. ආශ්‍රවයන්කෙරෙන් සිතමිදුනු කල්හි කෙලෙසුන් කෙරෙන් සිතමිදුනේයයි විමුක්තිඥානය වේ. කෙසේ ප්‍රත්‍යවෙක්‍ෂාකෙරෙත්ද, ජාතිඤතාමෝ ක්‍ෂයවීය මගබඹසර වැසනිමවනලද්දේය. චතුස්සත්‍යයන්හි චතුර්විධමාගියෙන් පරිඥප්‍රහාණාදිවශයෙන් ෂොඩශවිධ කෘත්‍යය කරණලද්දේය. මේ ක්ලෙශක්‍ෂය පිණිස හෝ මාගීභාවනාවපිණිස මේ ස්කන්ධපරම්පරාවෙන් අන්‍යවූ ස්කන්ධපරම්පරාවක් මටනැතැයි ප්‍රකාරයෙන් දැනගණී. මහරජ, මේ අත්බැව්හිදැක්කයුතුගුණඇති මේමාගීඵලය වූකලි පළමු දක්වනලද, සාන්දෘෂ්ටිකමාගීඵලවලට වඩා අතිශයින් මනොඥවෙයි. අතිශයින් ශ්‍රෙෂ්ඨද වේ. මහරජ, මේසාන්දෘෂ්ටිකවූ මාගීඵලවලින් අන්‍යවූ මත්තෙහිවූ හෝ අතිශයින් ශ්‍රෙෂ්ඨවූ සාන්දෘෂ්ටික මාගීඵලයක් නැතැයි වදාළෝ.

99. මෙසේ වදාළකල්හි මගධෙශ්වරවූ වෙදෙහිපුත්‍රවූ අජාසත්රජතෙමේ භාග්‍යවතුන්වහන්සේට මෙය සැලකලේය. ගොයුම්ගොත් ස්වාමීන්වහන්ස, දම්දෙසුම ඉතායහපත ගොයුම්ගොත් ස්වාමීන්වහන්ස දම්දෙසුම ඉතායහපත ස්වාමීන්වහන්ස, මුනින් තබනලද භාජනයක් උඩුකුරුකොට තබන්නේ හෝ යම්සේද.

පටිච්ඡන්නංවා විවරෙය්‍ය මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති. එවමෙව භගවතා අනෙකපරියායෙන ධම්මො පකාසිතො. සො අහං භන්තෙ භගවන්තං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච, උපාසකංමං භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණංගතං, අච්චයො මං භන්තෙ අච්චගමා යථාබාලං යථාමූළ්හං යථාඅකුසලං, සොහං පිතරං ධම්මිකං ධම්මරාජානං ඉස්සරියස්ස කාරණා ජීවිතා වොරොපෙසිං. තස්ස මෙ භන්තෙ භගවා අච්චයං අච්චයතො පටිගණ්හාතු ආයතිං සංවරායාති.

100. තග්ඝ ත්වං මහාරාජ අච්චයො අච්චගමා යථාබාලං යථා මූළ්හං යථාඅකුශලං යං ත්වං පිතරං ධම්මිකං ධම්මරාජානං ජීවිතා වොරොපෙසි.

වැසීතිබුනු යමක් විවෘතකොට දක්වන්නේ හෝ යම්සේද මං මුලාවූවෙකුට මගකියන්නේ හෝ යම්සේද, ඇස්ඇත්තෝ රූපයන් දකිත්වායි අඳුරෙහි තෙල්පහනක් දරන්නේ හෝ යම්සේද, එප රිද්දෙන්ම භාග්‍යවතුන්වහන්සේ විසින් නොයෙක්ප්‍රකාරයෙන් ධර්මය දේශනාකරණලද්දේය. ඒ මම භාග්‍යවතුන්වහන්සේදධර්මයද, සඞ්ඝ යාද, පිහිටකොට යම් භාග්‍යවතුන්වහන්සේ අදපටන් දිවිහිම්කොට සරණගිය උපාසකයෙකැයි මාදරාගන්නා සේක්වා. ස්වාමීන්වහන්ස මෙමම ධර්මචාරිවූ දැහැමිරජවූස්වකීයපියානන් ඓශ්වර්‍ය්‍යයයිකියනලද රාජ්‍යභාරය හෙතුකොටගෙණ ජීවිතයෙන් තොරකරවූයෙම්ද ඒ අප රාධයතෙමේ අඥානයෙකුයම්සේද මූඪයෙකු යම්සේද අදක්ෂයෙකුයම් සේද එපරිද්දෙන්මඅඥානවූමූඪවූඅදක්ෂවූමාඅභිභවනයකොට පැවැත් තේය. ස්වාමීන්වහන්ස,මත්තෙහි සංවරයපිණිස හෙවත් නැවතමෙ බඳුවූ අපරාධකාරණයක් නොකිරීම පිණිස මාගේ ඒ අපරාධය අපරා ධවශයෙන් භාග්‍යවතුන්වහන්සේ පිළිගන්නාසේක්වා හෙවත් මාගේ ඒ අපරාධයට ඉවසනසේක්වායි සැලකළෝ.

100. මහරජ, යම්බඳුවූ තෝ ධර්මචාරිවූ ධර්මරාජන්වූ ස්වකීය පියානන් ජීවිතයෙන් තොරකරවූයෙහිද ඒහෙයින් ඒ අපරාධය තෙමේ අඥානයෙකු මූඪයෙකු අදක්ෂයෙකු යම් සේද එපරිද්දෙන් අඥානවූ මූඪවූ අදක්ෂවූ තා ඒකාන්තයෙන් ඉක්මවා පැවැත්තේය.

යතොච ඛො ත්වං මහාරාජ අච්චයං අච්චයතො දිස්වා යථාධම්මං පටිකරොසි, තන්තෙ මයං පටිගණ්හාම. වුඩ්ඪි හෙසා මහාරාජ අරියස්ස විනයෙ යො අච්චයං අච්චයතො දිස්වා යථාධම්මං පටිකරොති ආයතිං සංවරං ආපජ්ජතීති.

101. එවං වුත්තෙ රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො භගවන්තං එතදවොච. හන්දච දානිමයං භන්තෙ ගච්ඡාම, බහු කිච්චා මයං බහුකරණීයාති. යස්ස දානි ත්වං මහාරාජ කාලං මඤ්ඤසීති. අථඛො රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

102. අථ ඛො භගවා අචිරපක්කන්තස්ස රඤ්ඤො මාගධස්ස අජාතසත්තුස්ස වෙදෙහිපුත්තස්ස භික්ඛූ ආමන්තෙසි.

මහරජ, තෝ යම්හෙයකින් අපරාධඃඅපරාධවශයෙන් දැක ධර්මයවූපරිද්දෙන් ප්‍රතිකර්මකෙරෙහිනම් හෙවත් දෘෂයටසමකෙරෙහිනම්තාගේඒ අපරාධය අපිපිළිගණිමු. හෙවත් ඒසඳහා ඉවසුයෙමු. මහරජ,යමෙක් ආර්‍යවිනයශික්‍ෂනලද බුද්ධසස්නෙහි අපරාධයඅපරාධවශයෙන් දැක ධර්මයවූ පරිද්දෙන් ප්‍රතිකර්මකෙරේද, නැවතමෙබඳුවූ මහපාතක කර්මයක් නොකෙරෙමියි මත්තෙහි සංවරයටපැමිණේද මේසාමාතොමෝ වැඩීමවේ නොහොත් යහපත් පිළිවෙත්මගපිහිටාකුසල් දහම් පසක්කිරීමෙන් අභිවෘඩියපිණිස පවතියයි වදාළෝ.

101. මෙසේ වදාළකල්හි මගධෙශ්වරවූ වෛදෙහිපුත්‍රවූ අජාසත්රජතෙමේ භාග්‍යවතුන්වහන්සේට මේ කාරණය සැලකළේය. නිදුකානන්වහන්ස, අපි බොහෝ කටයුතුඇත්තම්හ. අවශ්‍යයෙන් බොහෝ කටයුතුදෑ ඇත්තම්හ. එබැවින් දැන් අපි යම්හයි සැලකළෝ. මහරජ තෝ දැන් යම් ගමනක් සම්බන්ධව කල්යයි හඟනෙහිනම් එය එසේ කරණුලැබේවායි වදාළෝ. ඉක්බිත්තෙන් මගධෙශ්වරවූ වෛදෙහිපුත්‍රවූ අජාසත්රජතෙමේ භාග්‍යවතුන්වහන්සේගේ ධර්මභාෂිතය සතුටින්පිළිගෙණ අනුමෝදත්ව හුනස්නෙන් නැගිට භාග්‍යවතුන්වහන්සේ තුන්වරක් පැදකුණුකොට ගියේය.

102. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ මගධෙශ්වරවූ වෛදෙහිපුත්‍රවූ අජාසත්රජහු බැහැරගිය නොබෝකලකින් භික්ෂූන්ට ආමන්ත්‍රණයකළසේක.

ඛතාහං භික්ඛවෙ රාජා, උපහතායං භික්ඛවෙ රාජා සචායං භික්ඛවෙ රාජා පිතරං ධම්මිකං ධම්මරාජානං ජීවිතා නවොරොපෙස්සථ, ඉමස්මිං යෙව ආසනෙ විරජං වීතමලං ධම්මචක්ඛුං උප්පජ්ජිස්සථාති. ඉදමවොච භගවා, අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

සාමඤ්ඤඵලසුත්තං නිට්ඨිතං දුතියං.

මහණෙනි, මේ අජාසත්රජතෙමේ ප්‍රතිෂ්ඨාරහිත වෙයි හෙවත් ආයර්‍ය්‍යමාර්ගිනැමැති පොළවෙහි පිහිටන ගුණධර්‍මනැමති කුසල් මුල් නැත්තෙන් අනාථ වෙයි. මහණෙනි, මේ රජතෙම අභ්‍යන්තර යෙහි ගුණධර්‍මනැත්තෙන් තෙමේම සහමුලින් වැනසුනේ වෙයි. මහණෙනි, ඉදින් මේ අජාසත්රජතෙමේ ධර්‍මචාරිවූ ධර්‍මරාජත්වූ ස්වකීය පියානන් ඉදින් ජීවිතයෙන් තොරනොකරවූයේනම් මේ හුනස්නෙහිදීම ඔහට රාගාදිරජස්රහිතවූ පහවූ රාගාදිමලඇති ශ්‍රොත ආපත්තිමාර්ගඥනය උපදින්නේයයි වදාළේ‍ර්. පිතෘඝාතනකර්‍මය හෙතුකොටගෙණ ඒමාර්ගාධිගමය වැළැක්කේය යනුයි. භාග්‍යවතුන් වහන්සේ මේසූත්‍රධර්‍මයවදාළේය. සතුටුසිත්ඇති ඒභික්‍ෂුහුභාග්‍යවතුන් වහන්සේගේ දෙශනාවසතුටින් පිළිගත්හ.

දෙවෙනිවූ සාමඤ්ඤඵලසූත්‍රාර්‍ථ

ව්‍යාඛ්‍යාව නිමියේයි.

III. අම්බට්ඨ සුත්තං.

1 එවං මෙ සුතං. එකං සමයං භගවා කොසලෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි. යෙන ඉච්ඡානඞ්ගලං නාම කොසලානං බ්‍රාහ්මණගාමො තදවසරි. තත්‍ර සුදං භගවා ඉච්ඡානඞ්ගලෙ විහරති ඉච්ඡානඞ්ගලවනසණ්ඩෙ. තෙන ඛො පන සමයෙන බ්‍රාහ්මණො පොක්ඛරසාති උක්කට්ඨං අජ්ඣාවසති සත්තුස්සදං සතිණකට්ඨොදකං සධඤ්ඤං රාජභොග්ගං රඤ්ඤා පසෙනදිනා කොසලෙන දින්නං රාජදායං බ්‍රහ්මදෙය්‍යං.

2 අස්සොසි ඛො බ්‍රාහ්මණො පොක්ඛරසාති සමණො ඛලු භො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො කොසලෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි.

අම්බට්ඨසූත්‍රාර්ථව්‍යාඛ්‍යා.

1. මාවිසින් මේ සූත්‍රධර්මය මෙසේ අසනලදී. එක්කාලයෙක්හි භාග්‍යවතුන්වහන්සේ භික්ෂූන් පන්සියයක්වූ මහද් භික්ෂුසඞ්ඝයා සමග කොසොල්දනව්හි සැරිසරාවඩනාසේක් කොසොල්ජනපදවාසීන්ගේ ඉච්ඡානඞ්ගලනම් බමුණුගම යම්තැනෙක්හිද එතැනට වැඩිසේක. එහි වනාහි භාග්‍යවතුන්වහන්සේ ඉච්ඡානඞ්ගලනම් බමුණුගමෙහිවූ ඉච්ඡානඞ්ගලවනලැහැබෙහි වැඩවාසයකරණසේක. ඒකාලයෙහිදී පොක්ඛරසාතීනම් බ්‍රාහ්මණතෙමේ පසෙනදි කොසොල් රජහුවිසින් දෙනලද්දාවූ නොයෙක් සත්වයන්ගේ උත්සන්නතාඇති හෙවත් නොයෙක් සත්වයන්ගෙන් ගැවසීගත්තාවූ තණ දර ආදිය හා පුෂ්කරණීන් සහිතවූ ධාන්‍ය සහිතවූ රජහුකෙරෙන් ලදින් අනුභවකටයුතුවූ රජවිසින් දෙනලද දායාදයවූ ශ්‍රේෂ්ඨවශයෙන් දෙනලද්දාවූ හෙවත් රාජස්වරූපයෙන් පරිභොගකටයුතුවූ උක්කට්ඨානම් නුවර අධිපතිව වෙසෙයි.

2. එකල්හිදී ශාක්‍යරජපුත්‍රවූ ශාක්‍යකුලයෙන් නික්ම පැවිදිවූ ශ්‍රමණභවද්ගෞතමයන්වහන්සේ භික්ෂූන් පන්සියයක්වූ මහද් භික්ෂු සඞ්ඝයා සමග කොසොල් දනව්හි සැරිසරාවඩනාසේක්.

ඉච්ඡානඞ්ගලං අනුප්පත්තො ඉච්ඡානඞ්ගලෙ විහරති ඉච්ඡානඞ්ගල වනසණ්ඩෙ. තං ඛො පන භවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්ති සද්දො අබ්භුග්ගතො. ඉතිපි සො භගවා අරහං සම්මා සම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්ම සාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා. සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති සො ධම්මං දෙසෙති. ආදිකල්‍යාණං මජ්ඣෙ කල්‍යාණං පරියොසාන කල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවල පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති සාධු ඛො පන තථාරූපානං අරහතං දස්සනං හොතීති.

3 තෙන ඛො පන සමයෙන බ්‍රාහ්මණස්ස පොක්ඛරසාතිස්ස අම්බට්ඨො නාම මාණවො අන්තෙවාසී හොති අජ්ඣායකො මන්ත ධරො.

ඉච්ඡානඞ්ගලනම් බමුණුගමට පැමිණිසේක් ඉච්ඡානඞ්ගලනම් බමුණු ගමෙහිවූ ඉච්ඡානඞ්ගල වනලැහැබෙහි වැඩවාසයකරණසේක. ඒ භාග්‍යවත්තෙම සංසාරචක්‍රයාගේ අරකැපූසේක. සර්වප්‍රකාරයෙන් සර්වධර්මයන් මනාකොට තෙමේම අවබොධකළසේක. අෂ්ටවිද්‍යා පසළොස්චරණ ධර්මයන්ගෙන් සම්පූර්ණසේක. ශොභනවූ ගමන්ඇතිසේක. තුන්ලොවදන්නාසේක. ශීලසමාධ්‍යාදි ගුණයෙන් ශ්‍රෙෂ්ඨවූසේක. පුරුෂයන් දමනයකිරීමෙහි සමර්ථසේක. දෙවිමිනිසුන්ට අනුශාසනාකරණසේක. චතුස්සත්‍යාවබොධකළසේක. සකලක්ලෙශයන් භග්නකළසේකැයිද, ඒ භාග්‍යවතුන්වහන්සේ දෙවියන් සහිතවූ මරුන් සහිතවූ බඹුන් සහිතවූ මෙලොවද ශ්‍රමණබ්‍රාහ්මණයන් සහිතවූ දෙවිමිනිසුන් සහිතවූ සත්වවර්ගයාද තෙමේ විශිෂ්ටඥනයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට ප්‍රකාශකරණසේකැයිද, ඒ භාග්‍යවතුන්වහන්සේ මුල යහපත්වූද මැද යහපත්වූද අග යහපත්වූද අර්ථ සහිතවූ ව්‍යඤ්ජන සහිතවූ සියල්ලෙන් සම්පූර්ණවූ ධර්මය දෙශනාකරණසේක්යයිද, පිරිසිදුවූ බ්‍රහ්මචර්‍ය්‍යාව ප්‍රකාශකරණසේක්යයිද, මෙසේ ඒ ශ්‍රමණභවද් ගෞතමයන්වහන්සේ පිළිබඳවූ මනොඥවූ කීර්ති ශබ්දයෙක් පැන නැංගේයයි පොක්ඛරසාතිනම් බ්‍රාහමණතෙමේ ඇසුයේමය. අසා එබඳුවූ රහතුන්ගේ දැකීම යහපත්ම වේයයි සිතී.

3. එසමයෙහි අම්බට්ඨමානවකතෙමේ පොක්ඛරසාතිනම් බ්‍රාහ්මණයාගේ අතවැසි වේ. කෙබඳුදයත්, වෙදය හදාරන්නාවූ මන්ත්‍රධාරිවූ.

තිණ්ණං වෙදානං පාරගූ සනිඝණ්ඩු කෙටුභානං සක්ඛරප්පභෙදානං ඉතිහාස පඤ්චමානං පදකො වෙය්‍යාකරණො ලොකායත මහාපුරිස ලක්ඛණෙසු අනවයො අනුඤ්ඤාතපටිඤ්ඤාතො සකෙ ආචරියකෙ තෙවිජ්ජකෙ පාවචනෙ යමහං ජානාමි තං ත්වං ජානාසි යං ත්වං ජානාසි තමහං ජානාමීති.

4 අථ ඛො බ්‍රාහ්මණො පොක්ඛරසාති අම්බට්ඨං මානවං ආමන්තෙසි අයං තාත අම්බට්ඨ, සමණො ඛලු භො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො කොසලෙසු චාරිකං චරමානො මහතා භික්ඛු සඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි ඉච්ඡානඞ්ගලං අනුප්පත්තො ඉච්ඡානඞ්ගලෙ විහරති ඉච්ඡානඞ්ගලවනසණ්ඩෙ. තං ඛො පන භවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්ති සද්දො අබ්භුග්ගතො ඉතිපි සො භගවා අරහං සම්මා සම්බුද්ධො ...පෙ... බ්‍රහ්මචරියං පකාසෙති සාධු ඛො පන තථාරූපානං අරහතං දස්සනං හොතීති.

වෘක්ෂාදීන්ගේ නාමප්‍රකාශක නිඝණ්ඩු ශාස්ත්‍රය හා ක්‍රියාකල්ප විකල්පප්‍රකාශක කවීන්ට ප්‍රයොජනවත් කෙටුභශාස්ත්‍රයද සහිතවූ ශික්ෂානිරුක්ති සහිතවූ ඉතිහාසය පස්වෙනිකොටඇති වෙදත්‍රය පිළිබඳ පරතෙරට පැමිණියාවූ පදදන්නාවූ ව්‍යාකරණ ශාස්ත්‍රය හදුරන්නාවූ විතණ්ඩවාදීන්ගේ ශාස්ත්‍ර හා මහා පුරුෂලක්ෂණ ශාස්ත්‍රයන්හි සම්පූර්ණ දැනගැනීම් ඇත්තාවූ ස්වකීය ආචාර්‍ය්‍යයන්විසින් හදුරවනලද ත්‍රිවිද්‍යාවවූ ශ්‍රෙෂ්ඨවචනයෙහි යමක් මම දනිම්ද එය තෝ දන්නෙහිදැයි ආචාර්‍ය්‍යයා විසින් අනුදන්නා ලදින් නුඹවහන්සේ යම් ශාස්ත්‍රයක් දන්නෙහිද එය මම දනිමියි දෙනලද ප්‍රතිඥාඇත්තාවූ අම්බට්ඨනම් මානවකතෙමේ පොක්ඛරසාතී නම් බ්‍රාහ්මණයාගේ අතවැසි වේ.

4. ඉක්බිත්තෙන් පොක්ඛරසාතිනම් බ්‍රාහ්මණතෙමේ අම්බට්ඨනම් මානවකයා හට අඩගැසීය. පුත අම්බට්ඨය, ශාක්‍යරාජපුත්‍රවූ ශාක්‍ය කුලයෙන් නික්ම පැවිදිවූ මේ ශ්‍රමණ භවද් ගෞතමතෙමේ භික්ෂූන් පන්සියයක්වූ මහද් භික්ෂුසඞ්ඝයා සමග කොසොල් දනව්හි සැරිසරා වඩනාසේක් ඉච්ඡානඞ්ගලනම් බමුණුගමට පැමිණියේ ඉච්ඡානඞ්ගල බමුණුගමෙහිවූ ඉච්ඡානඞ්ගලනම් වනලැහැබෙහි වැඩවාසයකරණසේක. එකල්හි ඒ භාග්‍යවත්තෙම සංසාරචක්‍රයාගේ අරකැපූසේක. සර්වප්‍රකාරයෙන් සර්වධර්මයන් මනාකොට අවබොධකළසේක. සෙස්ස කීනයින් දතයුතු. බ්‍රහ්මචර්‍ය්‍යාව ප්‍රකාශකරණසේක්යයිද, මෙසේ ඒ ශ්‍රමණ භවද් ගෞතමයන්වහන්සේ පිළිබඳවූ මනොඥ කීර්ති ශබ්දයෙක් පැනනැංගේය. එබඳුවූ රහතුන්ගේ දැකීම යහපත්ම වේයයි.

එහි ත්වං තාත අම්බට්ඨ යෙන සමණො ගොතමො තෙනු පසඞ්කම. උපසඞ්කමිත්වා සමණං ගොතමං ජානාහි යදිවා තං භවන්තං ගොතමං තථා සන්තංයෙව සද්දො අබ්භුග්ගතො යදි වා නො තථා යදිවා සො භවං ගොතමො තාදිසො යදිවා න තාදිසො තථා මයං තං භවන්තං ගොතමං වෙදිස්සාමාති.

5 යථා කථං පනාහං භො තං භවන්තං ගොතමං ජානිස්සාමි. යදිවා තං භවන්තං ගොතමං තථා තං සන්තංයෙව සද්දො අබ්භුග්ගතො යදිවා නො තථා යදිවා සො භවං ගොතමො තාදිසොති යදිවා නතාදිසො. ආගතානි ඛො තාත අම්බට්ඨ අම්හාකං මන්තෙසු ද්වත්තිංස මහාපුරිසලක්ඛණානි යෙහි සමන්නාගතස්ස මහාපුරිසස්ස ද්වෙයෙව ගතියො භවන්ති අනඤ්ඤා. සචෙ අගාරං අජ්ඣාවසති රාජා හොති චක්කවත්තී ධම්මිකො ධම්මරාජා චාතුරන්තො විජිතාවී ජනපදත්ථාවරියප්පත්තො.

පුත අම්බට්ඨය, තෝ මෙහි එව. ශ්‍රමණ ගෞතමතෙමේ යම් තැනෙක් හිද එතැනට එළඹෙව. එළඹ ඉදින් ඒ භාග්‍යවත් ගෞතම යන්වහන්සේගේ එසේ විද්‍යමානවූම කීර්තිශබ්දයෙක් පැන නැංගේද නොහොත් විද්‍යමානනොවූ කීර්තිශබ්දයක් පැනනැංගේද ඉදින් ඒ භාග්‍යවතුන්වහන්සේ එසේ ගුණඇත්තෙක්ද නොහොත් එබඳු ගුණනැත්තෙක්දැයි ශ්‍රමණ ගෞතමයන්වහන්සේ දැනගණුව. එසේ අපි ඒ පින්වත් ගෞතමයන්වහන්සේ දැනගණුම්හයි කීයේය.

5. පින්වත, ඉදින් ඒ පින්වත් ගෞතමයන්වහන්සේ පිළිබඳවූ එසේ විද්‍යමානවූම කීර්තිශබ්දයෙක් පැනනැංගේද නොහොත් එසේ අවිද්‍යමානවූම කීර්තිශබ්දයෙක් පැනනැංගේද ඉදින් ඒ පින්වත් ගෞතමයන්වහන්සේ එබඳු ගුණඇත්තෙක්ද නොහොත් එබඳු ගුණ නැත්තෙක්දැයි ඒ පින්වත් ගෞතමයන්වහන්සේ මම කෙසේනම් දැනගන්නෙම්ද, පුත අම්බට්ඨය, අපගේ මන්ත්‍රයන්හි දෙතිස්මහාපුරුෂ ලක්ෂණකෙනෙක් ආවාහුමය. යම් ලක්ෂණයන්ගෙන් යුක්තවූ මහා පුරුෂයාගේ ගතිදෙකක්ම වෙත්ද. අනික් ගතියක් නොවේද. ඉදින් ගිහිගෙහි වාසයකෙරේනම් ධාර්මිකවූ ධර්මරජන්වූ චාතුර්ද්වීපාධිපතිවූ හෙවත් පෘථිවීශ්වරවූ දිනනලද ප්‍රතිභයකාරණා ඇත්තාවූ ජනපද යන්හි ස්ථාවරබවට පැමිණියාවූ.

සත්තරතන සමන්නාගතො තස්සිමානි සත්තරතනානි භවන්ති සෙය්‍යථිදං චක්කරතනං හත්ථිරතනං අස්සරතනං මණිරතනං ඉත්ථිරතනං ගහපතිරතනං පරිනායකරතනමෙව සත්තමං. පරෝ සහස්සං ඛො පනස්ස පුත්තා භවන්ති සූරා වීරඞ්ගරූපා පරසෙනප්පමද්දනා සො ඉමං පඨවිං සාගරපරියන්තං අදණ්ඩෙන අසත්ථෙන ධම්මෙන අභිවිජිය අජ්ඣාවසති. සචෙ ඛො පන අගාරස්මා අනගාරියං පබ්බජති. අරහං හොති සම්මා සම්බුද්ධො ලොකෙ විවත්තච්ඡද්දො. අහං ඛො පන තාත අම්බට්ඨ මන්තානං දාතා ත්වං මන්තානං පටිග්ගහෙතාති.

6 එවං භොතිඛො අම්බට්ඨො මාණවො බ්‍රාහ්මණස්ස පොක්ඛරසාතිස්ස පටිස්සුත්වා උට්ඨායාසනා බ්‍රාහ්මණං පොක්ඛරසාතිං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා වළවාරථමාරුය්හ සම්බහුලෙහි මාණවකෙහි සද්ධිං යෙන ඉච්ඡානඞ්ගලවනසණ්ඩො තෙන පායාසි. යාවතිකා යානස්ස භූමි යානෙන ගන්ත්වා යානා පච්චොරොහිත්වා පත්තිකොව ආරාමං පාවිසි.

සප්තරත්නයෙන් යුක්තවූ සක්විතිරජ වෙයි. ඒ රජහුගේ සප්තරත්නකෙනෙක් වෙති. ඔවුහුකවරහුදශත්, චක්‍රරත්නය, හස්තිරත්නය, අශ්වරත්නය, මාණික්‍යරත්නය, ස්ත්‍රීරත්නය, ගෘහපතිරත්නය, සත්වෙනිකොටඇති පරිනායකරත්නය යන මොව්හුයි. ඔහට වනාහි බියසුලුනොවූ වියසීයෙන්කරණ ලද්දක් වැනි රූපඇත්තාවූ පරසෙන් මර්දනයකරත්නාවූ පුත්‍රයෝ දහසකට වැඩිවෙත්. ඒ සක්විතිරජතෙමේ සයුර කෙළවරකොට ඇති මේ පෘථිවිය දණ්ඩනරහිතවූ සැත්රහිතවූ දැහැමින් ජයගෙණ අධිපතිව වෙසෙයි. ඉදින් වනාහි ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවේද ලොකයෙහි විවෘතකරණලද රාගාදි කෙලෙස්නැමති සෙවෙනිඇති අභිත් සම්‍යක් සම්බුද්ධ වෙයි. පුත අම්බඨය, මම වනාහි මන්ත්‍රදෙන්නෙක්මි. තෝ මන්ත්‍ර පිළිගන්නෙකැයි කීයේය.

6. අම්බට්ඨ මාණවකතෙමේ පින්වත එසේයයි පොක්ඛරසාතිනම් බමුණුහට පිළිවදන් දී හුනස්නෙන් නැගිට පොක්ඛරසාතිනම් බ්‍රාහ්මණයා වැඳ පැදකුණුකොට වෙළඹුන් සොදනලද රියකට නැගී බොහෝ මානවකයන් සමග ඉච්ඡානඞ්ගලනම් වනලැහැබ යම් තැනෙක්හිද එතැනට යානාවෙන් යායුතු භූමිය යම්පමණද එපමණ තැන් යානාවෙන් නොස් යානාවෙන් බැස පයින්ම ආරාමයට ඇතුල් වූයේය.

7 තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ අබ්භොකාසෙ චඞ්කමන්ති අථඛො අම්බට්ඨො මාණවො යෙන තෙ භික්ඛූ තෙනුප සඞ්කමි උපසඞ්කමිත්වා තෙ භික්ඛූ එතදවොච. කහන්නුඛො භො එතරහි සො භවං ගොතමො විහරති තංහි මයං භවන්තං ගොතමං දස්සනාය ඉධූපසඞ්කන්තාති.

8 අථඛො තෙසං භික්ඛූනං එතද හොසි. අයං ඛො අම්බට්ඨො මාණවො අභිඤ්ඤාත කොලඤ්ඤො චෙව අභිඤ්ඤාතස්ස ච බ්‍රාහ්මණස්ස පොක්ඛරසාතිස්ස. අන්තෙවාසි අගරු ඛො පන භගවතො එවරූපෙහි කුලපුත්තෙහි සද්ධිං කථාසල්ලාපො හොතීති අම්බට්ඨං මාණවං එතද වොචුං. එසො අම්බට්ඨ විහාරො සංවුතද්වාරො තෙන අප්පසද්දො උපසඞ්කමිත්වා අතරමානො ආළින්දං පවිසිත්වා අග්ගලං ආකොටෙහි විවරිස්සති තෙ භගවා ද්වාරන්ති.

9. අථ ඛො අම්බට්ඨො මාණවො යෙන සො විහාරො සංවුතද්වාරො තෙන අප්පසද්දො උපසඞ්කමිත්වා අතරමානො ආළින්දං පවිසිත්වා උක්කාසෙත්වා අග්ගලං ආකොටෙසි.

---

7. ඒකාලයෙහි බොහෝ භික්ෂූහු අවකාශස්ථානයෙහි සක්මන් කෙරෙති. ඉක්බිත්තෙන් අම්බෂ්ඨ මානවකතෙමේ ඒ භික්ෂූහු යම් තැනෙක්හිද එතැනට එළඹියේය. එළඹ පින්වත්නි, ප්‍රසිද්ධවූ භවත් ගෞතමයන්වහන්සේ දැන් කොතැන්හි වැඩවෙසේද, අපි ඒ භවත් ගෞතමයන්වහන්සේ දැකීමපිණිස මෙහි එළඹුනෙමුයි ඒ භික්ෂූන්ට මේ කාරණය දැන්වූයේය.

8. ඉක්බිත්තෙන් ඒ භික්ෂූන්ට මෙබඳු සිතක් පහළවිය, මේ අම්බෂ්ඨ මානවකතෙමේ ප්‍රසිද්ධ කුලයෙහි උපන්නෙක්ද ප්‍රසිද්ධවූ පොක්ඛරසාතිනම් බ්‍රාහ්මණයාගේ අතවැස්සෙක්ද වෙයි. එහෙයින් මෙබඳුවූ කුලපුත්‍රයන් සමග කථාසල්ලාපය භාග්‍යවතුන්වහන්සේට ගරු නොවේමය යනුයි, ඒ භික්ෂූහු අම්බෂ්ඨය, මේ වසනලද දොරඇත්තේ විහාරයයි. එතැනට ශබ්දරහිතව එළඹ යුහුසුළුනොවමින් ප්‍රමුඛයට පැමිණ මුඛශබ්දකොට අගුල හෙවත් කවුළුව නියඅගින් සොලවව, හෙවත් නියපිටින් ගසව. එවිට භාග්‍යවතුන්වහන්සේ තට දොර හරින්නේයයි අම්බෂ්ඨ මානවකයාහට මෙසේ කීහ.

9. ඉක්බිත්තෙන් වසනලදදොරඇති ඒ විහාරයතෙම යම් තැනෙක්හිද එතැනට අම්බෂ්ඨ මානවකතෙම ශබ්දරහිතව එළඹ යුහුසුළුනොවමින් ප්‍රමුඛයටපැමිණ කැරීම්ශබ්දකොට අගුල හෙවත් කවුළුව නියඅගින් සෙලවී.

විවරි භගවා වාරං, පා විසිඅම්බට්ඨො මාණවො. මාණවකාපි පවිසිත්වා භගවතා සද්ධිං සම්මොදිංසු සම්මොදනියං කථං සාරාණීයං වීති සාරෙත්වා එකමන්තං නිසීදිංසු. අම්බට්ඨො පන මාණවො චඞ්කමන්තොපි නිසින්නෙන භගවතා කිඤ්චි කිඤ්චි කථං සාරාණීයං වීතිසාරෙති. ඨිතොපි නිසින්නෙන භගවතා කිඤ්චි කිඤ්චි කථං සාරාණීයං වීතිසාරෙති.

10. අථ ඛො භගවා අම්බට්ඨං මාණවං එතදවොච. එවන්නුඛො වත අම්බට්ඨ බ්‍රාහ්මණෙහි වුඩ්ඪෙහි මහල්ලකෙහි ආචරියපාචරියෙහි සද්ධිං කථා සල්ලාපො හොති යථයිදං චරං තිට්ඨං නිසින්නෙන මයා කිඤ්චි කිඤ්චි කථං සාරාණීයං වීතිසාරෙති. නොහිදං භො ගොතම ගච්ඡන්තොවාහි ගච්ඡන්තෙන බ්‍රාහ්මණො බ්‍රාහ්මණෙන සද්ධිං සල්ලපිතු මරහති. ඨිතො වාහි භොගොතම ඨිතෙන බ්‍රාහ්මණො බ්‍රාහ්මණෙන සද්ධිං සල්ලපිතු මරහති. නිසින්නොවා හි භොගොතම බ්‍රාහ්මණො නිසින්නෙන බ්‍රාහ්මණෙන සද්ධිං සල්ලපිතු මරහති.

එකල භාග්‍යවතුන්වහන්සේ දොර හළසේක. අම්බට්ඨ මානවකතෙම ඇතුල්විය. සෙසුමානවකයෝද ඇතුල්වී භාග්‍යවතුන්වහන්සේ සමග සතුටුවූවාහුය. සතුටුවියයුතුවූ සිහිකටයුතුවූ කථාවකොට නිමවා එකත්පසෙක උන්නාහුය. අම්බට්ඨනම් මානවකතෙමේ වනාහි සක්මන්කරමින් වැඩහුන්නාවූ භාග්‍යවතුන්වහන්සේ සමග සිහිකටයුතුවූ යම් යම් කථාකොට නිමවයි. සිටියේද, වැඩහුන්නාවූ භාග්‍යවතුන්වහන්සේ සමග සිහිකටයුතුවූ යම් යම් කථාකොට නිමවයි.

10. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ අම්බට්ඨය, යම්සේ ඇවිදිමින් සිටිමින් උන්නාවූ මාසමග සිහිකටයුතුවූ යම් යම් කථාවන් කොට නිමවයිද, මෙසේ වෘද්ධවූ මහලුවූ ආචාර්‍ය්‍ය ප්‍රාචාර්‍ය්‍යවූ බ්‍රාහ්මණයන් සමග තාගේ මෙබඳුවූ කථාසල්ලාපයෙක් වේදැයි යන මේ කාරණය අම්බට්ඨනම් මානවකයාහට භාග්‍යවතුන්වහන්සේ වදාළසේක. භවද් ගෞතමය, මේකාරණය නොවේමය. භවද් ගෞතමය, යන්නාවූ හෝ බ්‍රාහ්මණතෙමේ යන්නාවූ බ්‍රාහ්මණයා සමග කථාකරන්නට සුදුසුයි. භවද් ගෞතමය සිටියාවූ හෝ බ්‍රාහ්මණතෙමේ සිටියාවූ බ්‍රාහ්මණයා සමග කථාකරන්නට සුදුසුයි. භවද් ගෞතමය, උන්නාවූ බ්‍රාහ්මණතෙමේ උන්නාවූ බ්‍රාහ්මණයා සමග කථාකරන්නට සුදුසුයි.

සයානොවාහි හො ගොතම බ්‍රාහ්මණො සයානෙන බ්‍රාහ්මණෙන සද්ධිං සල්ලපිතුමරහති. යෙච බො තෙ භොගොතම මුණ්ඩකා සමණකා ඉබ්භා කණ්හා බන්ධු පාදාපච්චා තෙහිපි මෙ සද්ධිං එවං කථා සල්ලාපො හොති යථරිව භොතා ගොතමෙනාති.

11. අත්ථිකවතො බො පන තෙ අම්බට්ඨ ඉධාගමනං අහොසි යා යෙව බො පනත්ථාය ආගච්ඡෙය්‍යාථ. තමෙව අත්ථං සාධුකං මනසි කරෙය්‍යාථ ආවුසිතවා යෙව බොපන හො අයං අම්බට්ඨො මාණවො වුසිතමානි කිමඤ්ඤත්‍ර අවුසිතත්තාති

12. අථ බො අම්බට්ඨො මාණවො භගවතා අවුසිතවාදෙන වුච්චමානො කුපිතොඅනත්තමනො භගවන්තං යෙව ඛුංසෙන්තො භගවන්තං යෙව වම්භෙන්තො භගවන්තං යෙව උපවදමානො සමණොච වෙ හො ගොතමො පාපිකො භවිස්සතිති භගවන්තං එතදවොච චණ්ඩා හො ගොතම සක්‍යජාති.

සැතපියාවූ හෝ බ්‍රාහ්මණතෙමේ සැතපියාවූ බ්‍රාහ්මණයා සමග කථා කරන්නට සුදුසුයි. භවද් ගෞතමය ගෘහපතිවූ කෘෂ්ණවූ බ්‍රහ්මයාගේ පිටිපත්ලෙන් උපන්නාවූ යම් ඒ මුඩුමහණෝ වෙද්ද,එවුන් හා සමග භවද් ගෞතමයා සමග මෙන් මාගේ කථාසල්ලාපය මෙබඳුමයයි අම්බට්ඨතෙමේ කීයේය.

11. අම්බට්ඨය, අර්ථිවශයෙන් හෙවත් පැමිණි කටයුතු කම්සම් පාදනයපිණිස මෙහි තාගේ ඊමවූයේය. යම් කාරණයක්පිණිස ආවාහුනම් ඒ ප්‍රයොජනයම මනාකොට මෙනෙහිකරව්. පින්වත්නි මේ අම්බට්ඨ මාණවකතෙමේ නොහික්මුනේමය හුදෙක් හික්මුණේය යන අභිමාන ඇත්තේය නොහික්මුණු බැවින් අන්‍යකථා සංලාපාදි යෙහි ස්වභාව කිනම්ද කවරේද.

12. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ විසින් අල්පශ්‍රුතවාද යෙන් වදාරණලද්දාවූ අම්බට්ඨ මාණවකතෙමේ කිපියේ නොසතුටු සිත් ඇත්තේ භාග්‍යවතුන්වහන්සේටම ගටන්නේ භාග්‍යවතුන්වහන්සේ ටම ගහිකරන්නේ භාග්‍යවතුවහන්සේටම විරුඩකථා කරන්නේ ශ්‍රමණ භවද්ගෞතමතෙමේ පව්ටෙක් වන්නේයයි භාග්‍යවතුන්වහන්සේට මෙපවත් කීයේය. භවද්ගෞතමය ශාක්‍යජාතිතොමෝ චණ්ඩය.

ඵරුසා භොගොතම සක්‍යජාති. ලහුසා භො ගොතම සක්‍යජාති. රභසා භොගොතම සක්‍යජාති. ඉබ්භා සන්තා ඉබ්භා සමානා න බ්‍රාහ්මණෙ සක්කරොන්ති. න බ්‍රාහ්මණෙ ගරු කරොන්ති. න බ්‍රාහ්මණෙ මානෙන්ති. න බ්‍රාහ්මණෙ පූජෙන්ති න බ්‍රාහ්මණෙ අපචායන්ති. තයිදං භො ගොතම නච්ඡන්නං තයිදං නප්පතිරූපං යදි මෙ සක්‍යා ඉබ්භා සන්තා ඉබ්භා සමානා න බ්‍රාහ්මණෙ සක්කරොන්ති. න බ්‍රාහ්මණෙ ගරු කරොන්ති. න බ්‍රාහ්මණෙ මානෙන්ති. න බ්‍රාහ්මණෙ පූජෙන්ති. න බ්‍රාහ්මණෙ අපචායන්තීති. ඉතිහ අම්බට්ඨො මාණවො ඉදං පඨමං සක්‍යෙසු ඉබ්භවාදං නිපාතෙසි.

13. කිම්පන තෙ අම්බට්ඨ සක්‍යා අපරද්ධුන්ති. එකමිදාහං භො ගොතම සමයං ආචරියස්ස බ්‍රාහ්මණස්ස පොක්ඛරසාතිස්ස කෙනචිදෙව කරණීයෙන කපිලවත්ථුං අගමාසිං යෙන සක්‍යානං සන්ථාගාරං තෙනුපසඞ්කමිං. තෙන ඛො පන සමයෙන සම්බහුලා සක්‍යා චෙව සක්‍යකුමාරා ච සන්ථාගාරෙ උච්චෙසු ආසනෙසු නිසින්නා හොන්ති. අඤ්ඤමඤ්ඤං අඞ්ගුලිපතොදකෙහි සඤ්ජග්ඝන්තා සංකීළන්තා.

භවද්ගෞතමය ශාක්‍යජාතිතොමෝ ක්‍රෑරය. භවද් ගෞතමය ශාක්‍යජාතිතොමෝ සවල්පයෙන් සතුටුවන්නාහු හෝ කිපෙන්නාහුය. භවද් ගෞතමය ශාක්‍යජාතිතොමෝ වාචාලය ගෘහපතිකයෝ වන්නාහුය. ගෘහපතිකයෝ වූ බ්‍රාහ්මණයන්ට සත්කාර නොකෙරෙති. බ්‍රාහ්මණයන්ට ගරු නොකෙරෙති. බ්‍රාහ්මණයන්ට බුහුමන් නොකෙරෙති, බ්‍රාහ්මණයන් නොපුදති බමුණන් නොවඳිති, භවද්ගෞතමය ඉදින් ශාක්‍යයෝ ගෘහපතිකයෝ වන්නාහුම. ගෘහපතිකයෝ වම බ්‍රාහ්මණයන්ට සත්කාර නොකෙරෙති. බ්‍රාහ්මණයන්ට ගරු නොකෙරෙති, බ්‍රාහ්මණයන්ට බුහුමන් නොකෙරෙති, බ්‍රාහ්මයන් නොපුදති බ්‍රාහ්මණයන්ට නොවඳිති මෙසේ මෙහි මේකාරණය මට කැමතිනොවෙයි මේ කාරණය මට සුදුසු නොවීය අම්බෂ්ඨ මාණවකතෙමේ ශාක්‍යයන් කෙරෙහි මේ පළමුවෙනි ගෘහපතිකවාදය හෙළූයේය.

13. අම්බෂ්ඨ, තට ශාක්‍යයෝ කිනම් අපරාධයක් කළෝදැයි පිළිවිසී. භවද් ගෞතමය මම එක්කලෙක ආචාර්‍ය්‍යවූ පොක්ඛරසාතිනම් බ්‍රාහ්මණයාගේ කිසියම් කටයුත්තක් කරණකොටගෙණ කිඹුල්වත් පුරයට ගියෙමි. (එහි) ශාක්‍යයන්ගේ සන්ථාගාරය හෙවත් මන්ත්‍රණශාලාව යම්තැනෙක්හිද එතැනට එළඹියෙමි. එකල්හිදීබොහෝවූ අභිෂේක කරණලද ශාක්‍යරජදරුවෝද අභිෂේක නොකරණ ලද ශාක්‍යකුමාරයෝද ඔවුනොවුන් ඇඟිලිකෙව්ටි කරන්නාහුහෙලා දැකීම් වශයෙන්ම මනසිකරන්නාහු කෙළින්නාහු සන්ථාගාරයෙහි උසසුන්හි උන්නාහුවෙත්.

අඤ්ඤදත්ථු මමං යෙව මඤ්ඤෙ අනුජග්ඝන්තා න මං කොචි ආසනෙන පි නිමන්තෙසි. තයිදං භො ගොතම නච්ඡන්නං තයිදං නප්පතිරූපං යදිමෙ සක්‍යා ඉබ්භා සන්තා ඉබ්භා සමානා න බ්‍රාහ්මණෙ සක්කරොන්ති. න බ්‍රාහ්මණෙ ගරුං කරොන්ති න බ්‍රාහ්මණෙ මානෙන්ති. න බ්‍රාහ්මණෙ පූජෙන්ති. න බ්‍රාහ්මණෙ අපචායන්තීති. ඉතිහ අම්බට්ඨො මාණවො ඉදං දුතියං සක්‍යෙසු ඉබ්භවාදං නිපාතෙසි.

14. ලටුකිකාපි ඛො අම්බට්ඨ සකුණිකා සකෙ කුලාවකෙ කාමලාපිණී හොති. සකං ඛො පනෙතං අම්බට්ඨ සක්‍යානං යදිදං කපිලවත්ථුං නාරහතායස්මා අම්බට්ඨො ඉමාය අප්පමත්තාය අභිසජ්ජිතුන්ති.

15. චත්තාරොමෙ භො ගොතම වණ්ණා. ඛත්තියා බ්‍රාහ්මණා වෙස්සා සුද්දා. ඉමෙසං හි භො ගොතම චතුන්නං වණ්ණානං තයො වණ්ණා ඛත්තියා ච වෙස්සා ච සුද්දා ච අඤ්ඤදත්ථු බ්‍රාහ්මණස්සෙව පරිචාරකා සම්පජ්ජන්ති.

ඒකාන්තයෙන් මටමමෙන් නැවත නැවත මහත්ව සිනාසෙන්නාහු කිසිවෙක්මට ආසනයකින්ද නොපැවරූයේය. භවද්ගෞතමය ඒ මේය කැමැති නොවෙයි. ඒ මෙය සුදුසු නොවෙයි. ඉදින් ගෘහපතිකවන්නාවූ ගෘහපතික සමානවූ මේ ශාක්‍යයෝ බ්‍රාහ්මණයන්ට සත්කාර නොකෙරෙති, බ්‍රාහ්මණයන්ට ගෞරව නොකෙරෙති, බ්‍රාහ්මණයන්ට බුහුමන් නොකෙරෙති. බ්‍රාහ්මණයන් නොපුදති බ්‍රාහ්මණයන්ට නොවඳිතියි. මෙසේ මෙහි අම්බෂ්ඨ මාණවක තෙමේ ශාක්‍යයන් කෙරෙහි මේ දෙවෙනිවූ ගෘහපතිකවාදය හෙළූයේය.

14. අම්බෂ්ඨය, කැටකිරිල්ලි තොමෝද ස්වකීය කැදැල්ලෙහි (කූඩුවෙහි) කැමැතිසේ නාදකරන්නීවේ. අම්බෂ්ඨය, යම් මේ කපිලවස්තුපුරයක් වේද එය ශාක්‍යයන්ගේ ස්වකීය නුවරවේ. ආයුෂ්මත් අම්බෂ්ඨ තෙමේ මේ ස්වල්පකාරණයෙන් ක්‍රොධවශයෙන් ලැගන්නට සුදුසු නොවෙයි වදාළසේක.

15. භවද්ගෞතමයන් වහන්ස, මේ වංශයෝ සතරදෙනෙක් වෙත්. ඔව්හු කවරහුද යත් ක්‍ෂත්‍රියයෝය, බ්‍රාහ්මණයෝය, වෛශ්‍යයෝය, ශූද්‍රයෝය (යනමොහුයි) භවද් ගෞතමයන්වහන්ස, මේ චතුර්වර්ණයන් අතුරෙන් ක්‍ෂත්‍රියයෝද වෛශ්‍යයෝද, ශූද්‍රයෝද යන වංශත්‍රය ඒකාන්තයෙන් බ්‍රාහ්මණ වංශයටම මෙහෙකරුබවට පැමිණෙත්.

තයිදං හො ගොතම නච්ඡන්නං තයිදං නප්පතිරූපං යදි මෙ සක්‍යා ඉබ්භා සන්තා ඉබ්භා සමානා න බ්‍රාහ්මණෙ සක්කරොන්ති. න බ්‍රාහ්මණෙ ගරුකරොන්ති. න බ්‍රාහ්මණෙ මානෙන්ති. න බ්‍රාහ්මණෙ පූජෙන්ති. න බ්‍රාහ්මණෙ අපචායන්ති ඉතිහ අම්බට්ඨො මාණවො ඉදං තතියං සක්‍යෙසු ඉබ්භවාදං නිපාතෙසි.

16. අථ ඛො භගවතො එතදහොසි, අතිබාළ්හං ඛො අයං අම්බට්ඨො මාණවො සක්‍යෙසු ඉබ්භවාදෙන නිම්මාදෙති. යන්නූනාහං ගොත්තං පුච්ඡෙය්‍යන්ති. අථඛො භගවා අම්බට්ඨං මාණවං එතදවොච. කථං ගොත්තොසි අම්බට්ඨාති. කණ්හායනො හමස්මි භො ගොතමාති. පොරාණං ඛො පන තෙ අම්බට්ඨ මාතාපෙත්තිකං නාම ගොත්තං අනුස්සරතො අය්‍යපුත්තා සක්‍යා භවන්ති දාසිපුත්තො ත්වමසි සක්‍යානං සක්‍යා ඛො පන අම්බට්ඨ රාජානං ඔක්කාකං පිතාමහං දහන්ති භූතපුබ්බං අම්බට්ඨ රාජා ඔක්කාකො යා සා මහෙසී පියා මනාපා තස්සා පුත්තස්ස රජ්ජං පරිනාමෙතු කාමො ජෙට්ඨ කුමාරෙ රට්ඨස්මා පබ්බාජෙසි.

භවද්ගෞතමය ඒ මෙය කැමැති නොවෙයි. ඒ මෙය සුදුසු නොවෙයි. ඉදින් ගෘහපතිකවූ ගෘහපතිකසමානවූ මේ ශාක්‍යයො බ්‍රාහ්මණයන්ට සත්කාර නොකෙරෙති. බ්‍රාහ්මණයන්ට ගෞරව නොකෙරෙති බ්‍රාහ්මණයන්ට බුහුමන් නොකෙරෙති. බ්‍රාහ්මණයන් නොපුදති බ්‍රාහ්මණයන්ට නොවඳිතියි. මෙසේ මෙහි අම්බට්ඨ මාණවකතෙමේ ශාක්‍යයන්කෙරෙහි මේ තුන්වෙනිවූ ගෘහපතික වාදය හෙලූයේය.

16. ඉක්බිති මේ අම්බට්ඨමාණවකතෙමේ ඉතා වැඩියක්ම ශාක්‍යයන් කෙරෙහි ගෘහපතිකවාදයෙන් නිගාකෙරෙයි. එකාන්තයෙන් මම ගොත්‍රවිචාළෙම් නම් යෙහෙකැයි භාග්‍යවතුන්වහන්සේට මෙබඳු සිතක් පහළවිය. ඉක්බිති භාග්‍යවත් තෙමේ අම්බට්ඨය තෝ කවර ගොත්‍රයක වූයෙහිදැයි අම්බට්ඨමාණවකයා මෙපවත් විචාළසේක. භවද්ගෞතමය මම කණ්හායන ගොත්‍රඇත්තෙක්මියි කීයේය. අම්බට්ඨය, මවුපියන් සතුවූ පැරණිවූ නාමයහා ගොත්‍රය සිහිකරන්නාවූ තාගේ ස්වාමිපුත්‍රයෝ ශාක්‍යයෝ වෙත්. තෝ ශාක්‍යයන්ගේ දාසීපුත්‍රයෙක් වූයෙහිය. අම්බට්ඨය, ශාක්‍යයෝ වනාහි ඔක්කාකනම් රජහු මහපිය තනතුරෙහි හෙවත් ශ්‍රෙෂ්ඨභාවයෙහි පිහිටුවත්. අම්බට්ඨය, පූර්වකාලයෙහි ඔක්කාකරජතෙමේ ප්‍රියවූ මනවඩන්නාවූ යම් ඒ මෙහෙසි යක්විද ඈගේ පුත්‍රයාහට රාජ්‍යය පිරිනමනුකැමැත්තේ දෙටුකුමරුන් රටින් බැහැරකෙළේය.

ඔක්කාමුඛං කරණ්ඩුං හත්ථිනිකං සිනිසූරං. තෙ රට්ඨස්මා පබ්බාජිතා හිමවන්තපස්සෙ පොක්ඛරණියාතීරෙ මහා සාකසණ්ඩො. තත්ථ වාසං කප්පෙසුං තෙ ජාති සම්භෙදභයා සකාහි භගිනීහි සද්ධිං සංවාසං කප්පෙසුං අථ ඛො අම්බට්ඨ රාජා ඔක්කාකො අමච්චෙ පාරිසජ්ජෙ ආමන්තෙසි. කහන්නුඛො භො එතරහි කුමාරා සම්මන්තීති අත්ථි දෙව හිමවන්තපස්සෙ පොක්ඛරණියා තීරෙ මහා සාකසණ්ඩො. තත්ථෙතරහි කුමාරා සම්මන්ති තෙ ජාති සම්භෙද භයා සකාහි භගිනීහි සද්ධිං සංවාසං කප්පෙන්තීති. අථ ඛො අම්බට්ඨ රාජා ඔක්කාකො උදානං උදානෙසි. සක්‍යා වත භො කුමාරා පරමසාක්‍යා වත භො කුමාරාති. තදග්ගෙ ඛො පන අම්බට්ඨ සක්‍යා පඤ්ඤායන්ති සොච තෙසං පුබ්බපුරිසො. රඤ්ඤොච ඛොපන අම්බට්ඨ ඔක්කාකස්සදිසානාම දාසී අහොසි. සා කණ්හං නාම ජනෙසි ජාතො කණ්හො පබ්‍යාහාසි. ධොවථ මං අම්ම නහාපෙථ මං අම්ම ඉමස්මා මං අසුචිස්මා පරිමොචෙථ අත්ථාය වො භවිස්සාමීති යථා ඛො පනඅම්බට්ඨ එතරහි මනුස්සා පිසාචෙ දිස්වා පිසාචාති සඤ්ජානන්ති.

රටින් බැහැරකරණලද්දාවූ ඔක්කාමුඛය, කරණ්ඩුය, හත්ථිකාය, සිනිසූරය, යන ඒ කුමාරවරු හිමාලයවන පාර්ශ්වයෙහිවූ පොකුණු තෙර මහඅතුලැහැබෙක් විය. එහි වාසයකළෝ. ඔවුහු ජාතිය බිද්දේය යන බියෙන් සියබුහුනනියන් සමග සංවාසයකළෝ. අම්බට්ඨය, එකල්හි ඔක්කාකරජතෙමේ පින්වත්නි, දැන් කුමාරවරු කොතැන්හි වෙසෙත්දැයි අමාත්‍යපිරිස විචාළේය. දෙවයන්වහන්ස හිමවත් පසැ පොකුණතෙර මහත් අතුලැහැබෙක් ඇත. එහි දැන් කුමාරයෝ වෙසෙත්. ඔවුහු ජාතිය බිද්දේය යන බියෙන් ස්වකීය බුහුනනියන්සමග සංවාසකෙරෙත්යයිකීහු. ඉක්බිති අම්බට්ඨය ඔක්කාකරජතෙමේ පින්වත්නි කුමාරයෝ ඒකාන්තයෙන් ශාක්‍යයෝය. පින්වත්නි කුමාරයෝ ඒකාන්තයෙන් උත්තම ශාක්‍යයෝයයි ප්‍රීතිවාක්‍ය පහළකෙළේය. අම්බට්ඨය, එතැන්පටන් ශාක්‍යයෝ පණවනුලැබෙත්,ඒ ඔක්කාකරජතෙමේම ඔවුන්ගේ පූර්වපුරුෂයාවේ. අම්බට්ඨය ඔක්කාකරජහුගේ වනාහි දිශානම් දාසියක්වූවාය. ඕතොමෝ කෘෂ්ණකුමාරයා ඉපදවූවාය. උපන් කෘෂ්ණනම් යක්‍ෂ තෙමේ නැවත නැවත කථාකෙළේය. මෑනියෙනි මා සෝදවව්. මෑනියෙනි, මා නහවව්. මේ අශුචියෙන් මා මුදවව්. නුඹලාට වැඩපිණිස වන්නෙමියි කියායි. අම්බට්ඨය යම්සේ වනාහි දැන් මනුෂ්‍යයෝ පිශාචයන් දැක පිශාචයෝයයි හඳුනත්ද.

එවමෙව බො අම්බඪ තෙන බො පන සමයෙන මනුස්සා පිසාචෙ කණ්හාති සඤ්ජානන්ති. තෙ එව මාහංසු. අයං ජාතො පච්චාහාසි කණ්හො ජාතො පිසාචො ජාතොති. තදග්ගෙ බො පන අම්බඪ කණ්හායනා පඤ්ඤායන්ති සො ච කණ්හායනානං පුබ්බපුරිසො. ඉති බො තෙ අම්බට්ඨ පොරාණං මාතාපෙත්තිකං නාම ගොත්තං අනුස්සරතො අය්‍ය පුත්තා සක්‍යා භවන්ති දාසි පුත්තො ත්වමසි සක්‍යානන්ති.

17. එවං වුත්තෙ තෙ මාණවකා භගවන්තං එතදවොචුං. මා භවං ගොතමො අම්බඪං මාණවං අතිබාල්හං දාසිපුත්තවාදෙන නිම්මාදෙසි. සුජාතොච හොගොතම අම්බඪො මාණවො.කුලපුත්තොච අම්බඪො මාණවො. බහුස්සුතොච අම්බඪො මාණවො කල්‍යාණවාක්කරණොච අම්බඪො මාණවො. පණ්ඩිතොච අම්බඪො මාණවො පහොතිච අම්බඪො මාණවො. හොතා ගොතමෙන සද්ධිං අස්මිං වචනෙ පටිමන්තෙතුන්ති.

අම්බඪය, එපරිද්දෙන්ම ඒකාලයෙහි මනුෂ්‍යයෝ පිශාචයන් කණ්හයයි දැනගණිත් මේ උපන්තැනැත්තේ යක්ෂයෙක කෘෂ්ණවූවෙක පිශාචවූවෙකැයි ඔව්හු මෙසේ කීවාහුය. අම්බඪය කෘෂ්ණයන් අතුරෙන් මේ තෙමේ අග්‍රවෙයි හෙවත් එතැන්පටන් කෘෂ්ණජාතිය පණවත්. හෙතෙමේ කෘෂ්ණවූවන් අතුරෙන් ආදි පුරුෂයාවේ. අම්බඪය මෙසේ පැමිණියාවූ මවුපියන්සන්තකවූ පුරාණ නාමගොත්‍රය සිහිකරන්නාවූ තාගේ ස්වාමිපුත්‍රයෝ ශාක්‍යයෝ වෙත්. තෝ ශාක්‍යයන්ගේ දාසිපුත්‍රයෙක් වූයෙහිය කියායි.

17. මෙසේ වදාළකල්හි ඒ මාණවකයෝ භාග්‍යවතුන්වහන්සේට මේකාරණය සැලකළෝ. භවද් ගෞතමතෙමේ ඉතාවැඩියක් අම්බඪ මාණවකයාහට දාසීපුත්‍රවාදයෙන් මානනිග්‍රහය කරණසේක. භවද් ගෞතමය අම්බඪ මාණවකතෙමේ උභයකුලපරිශුද්ධ ජාති ඇත්තෙක්ද අම්බඪමාණවකතෙමේ කුලපුත්‍රයෙක්ද අම්බඪමාණවකතෙමේ බොහෝ ඇසූපිරූතැන් ඇත්තේක්ද අම්බඪමාණවකතෙමේ මනවඩන්නාවූ යහපත්වචන කථාකරන්නෙක්ද අම්බඪ මාණවකතෙමේ පණ්ඩිතයෙක්ද අම්බඪමාණවකතෙමේ භවද් ගෞතමයන්වහන්සේ සමග මේ වෙදත්‍රයපිළිබඳ කථායෙහි ප්‍රති කථාකිරීමට පොහොසතෙක්ද වේය යනුයි.

18. අථ ඛො භගවා තෙ මාණවකෙ එතදවොච. සචෙ ඛො තුම්හාකං මාණවකානං එවං හොති දුජ්ජාතො ච අම්බට්ඨො මාණවො අකුලපුත්තො ච අම්බට්ඨො මාණවො අප්පස්සුතො ච අම්බට්ඨො මාණවො අකල්‍යාණවාක්කරණො ච අම්බට්ඨො මාණවො දුප්පඤ්ඤො ච අම්බට්ඨො මාණවො නච පහොති අම්බට්ඨො මාණවො සමණෙන ගොතමෙන සද්ධිං අස්මිං වචනෙ පටිමන්තෙතුන්ති. තිට්ඨතු අම්බට්ඨො මාණවො තුම්හෙ මයා සද්ධිං මන්තයන්තු අස්මිං වචනෙ සචෙ පන තුම්හාකං මාණවකානං එවං හොති සුජාතො ච අම්බට්ඨො මාණවො කුලපුත්තො ච අම්බට්ඨො මාණවො බහුස්සුතො ච අම්බට්ඨො මාණවො කල්‍යාණවාක්කරණො ච අම්බට්ඨො මාණවො පණ්ඩිතො ච අම්බට්ඨො මාණවො පහොති ච අම්බට්ඨො මාණවො සමණෙන ගොතමෙන සද්ධිං අස්මිං වචනෙ පටිමන්තෙතුන්ති තිට්ඨථ තුම්හෙ අම්බට්ඨො මාණවො මයා සද්ධිං පටිමන්තෙතූති.

19. සුජාතො ච භො ගොතම අම්බට්ඨො මාණවො කුලපුත්තො ච අම්බට්ඨො මාණවො බහුස්සුතො ච අම්බට්ඨො මාණවො.

---

18. ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ ඒ මාණවකයන්ට මෙපවත් වදාළසේක. ඉදින් වනාහි තොපගේ මාණවකයන්ට මේ අදහස වෙයිද, කෙසේදයත්, අම්බඨ මාණවකතෙමේ නපුරුජාති ඇත්තෙක්ද, අම්බඨ මාණවකතෙමේ කුලපුත්‍ර නොවූවෙක්ද අම්බඨ මාණවකතෙමේ අල්පශ්‍රැතයෙක්ද අම්බඨමාණවකතෙමේ මනාවචන නොකියන්නෙක්ද අම්බඨ මාණවකතෙමේ දුෂ්ප්‍රාඥයෙක්ද අම්බඨ මාණවකතෙමේ ශ්‍රමණ ගෞතමයන්වහන්සේ සමග මේ ප්‍රතිකථාවෙහි ප්‍රතිකථා කිරීමට අපොහොසතෙක්දවේය කියායි. මේ අම්බඨ මාණවකතෙමේ සිටීවා. තෙපි මා සමග මේ කථාවෙහි කථාකෙරෙත්වා, ඉදින් වනාහි තොපගේ මාණවකයන්ට මෙසේ අදහස් වේද. එනම් අම්බඨමාණවකතෙමේ යහපත් ජාති ඇත්තෙක, අම්බඨමාණවකතෙමේ කුලපුත්‍රයෙක අම්බඨමාණවකතෙමේ බහුශ්‍රැතයෙක අම්බඨ මාණවකතෙමේ මනාවචන කියන්නෙක අම්බඨ මාණවකතෙමේ පණ්ඩිතයෙක, අම්බඨ මාණවකතෙමේ ශ්‍රමණගෞතමයන්වහන්සේ සමග මේ කථායෙහි උත්තර කියන්නට පොහොසතෙක්ද වෙයි! යනුයි. තෙපි සිටිව්. අම්බඨමාණවකතෙමේ මා සමග ප්‍රති මන්ත්‍රණය කෙරේවා.

19. භවද් ගෞතමයන්වන්ස, අම්බඨ මාණවකතෙමේ යහපත් ජාති ඇත්තෙක්ද, අම්බඨ මාණවකතෙමේ **කුලපුත්‍රයෙක්ද,** අම්බඨ මාණවකතෙමේ බහුශ්‍රැතයෙක්ද.

කල්‍යාණවාක්කරණො ච අම්බට්ඨො මාණවො පණ්ඩිතො ච අම්බට්ඨො මාණවො පහොති ච අම්බට්ඨොමාණවො භොතා ගොතමෙන සද්ධිං අස්මිං වචනෙ පටිමන්තෙතුන්ති. තුණ්හී මයං භවිස්සාම අම්බට්ඨො මාණවො භොතා ගොතමෙන සද්ධිං අස්මිං වචනෙ පටිමන්තෙතූති.

20. අථ ඛො භගවා අම්බට්ඨං මාණවං එතද වොච. අයං ඛො පන තෙ අම්බට්ඨ සහධම්මිකො පඤ්හො ආගච්ඡති අකාමාපි ව්‍යාකාතබ්බො. සචෙ ත්වං න ව්‍යාකරිස්සසි අඤ්ඤෙන වා අඤ්ඤං පටිචරිස්සසි තුණ්හී වා භවිස්සසි පක්කමිස්සසි වා එත්ථෙව තෙ සත්තධා මුද්ධා ඵලිස්සති. තං කිං මඤ්ඤසි. අම්බට්ඨ කින්ති තෙ සුතං බ්‍රාහ්මණානං වුඩ්ඪානං මහල්ලකානං ආචරියපාචරියානං කුතොපභුතිකා කණ්හායනා කොච කණ්හායනානං පුබ්බපුරිසොති. එවං වුත්තෙ අම්බට්ඨො මාණවො තුණ්හී අහොසි. දුතියම්පි ඛො භගවා අම්බට්ඨං මාණවං එතදවොච තං කිම්මඤ්ඤසි අම්බට්ඨ කින්ති තෙ සුතං බ්‍රාහ්මණානං වුඩ්ඪානං මහල්ලකානං....පෙ....කොච කණ්හායනානං පුබ්බපුරිසොති.

අම්බට්ඨ මාණවකතෙමේ මනා වචන කියන්නෙක්ද, අම්බට්ඨ මාණවක තෙමේ පණ්ඩිතයෙක්ද අම්බට්ඨමාණවකතෙමේ භවද් ගෞතමයන් වහන්සේ සමග මේ කථායෙහි උත්තර කියන්නට පොහොසතෙක්ද වේ. අම්බට්ඨ මාණවකතෙමේ භවද් ගෞතමයන්වහන්සේ සමග මේ වචනයෙහි ප්‍රතිමන්ත්‍රණය කෙරේවායි අපි නිශ්ශබ්ද වූම්හ.

20. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ අම්බට්ඨනම්මාණවකයාහට මේකාරණය වදාලේය. අම්බට්ඨය තාගේ කරුණු සහිතවූ මේ ප්‍රශ්න යෙක් එයි. නොකැමැත්තාවූද තාවිසින් අවශ්‍යයෙන් විසඳිය යුතුයි. ඉදින් තෙ ප්‍රකාශ නොකරන්නෙහි නම් අනික් වචනයකින් හෝ අනික් වචනයක් වසන්නෙහි නම් හෙවත් යටපත් කරන් නෙහි නම් නිශ්ශබ්ද හෝ වන්නෙහි නම් බැහැර හෝ යන් නෙහිනම් මෙහිදීම තාගේ හිස සත්කඩකට පැලෙන්නේය. අම්බට්ඨය, ඒ කුමකැයි සිතන්නෙහිද. කණ්හායන ගොත්‍ර ඇත්තෝ කොතැන්සිට පැවතෙද්ද, කණ්හායන ගොත්‍ර ඇත්තන්ගේ කවරෙක් පූර්වපුරුෂයා වේදැයි වයසින් වැඩිසිටියාවූ මහළුවූ ආචාර්‍ය්‍ය ප්‍රාචාර්‍ය්‍යවූ බ්‍රාහ්මණයන්විසින් කියනුලබන්නාවූ කෙබඳු වචනයක් තාවිසින් කෙසේ අසනලද්දැයි මෙසේ විචාරා වදාළකල්හි අම්බට්ඨමාණවකතෙමේ නිශ්ශබ්දවිය. දෙවනුවද අම්බට්ඨනම්මාණ වකයාහට භාග්‍යවතුන්වහන්සේ, අම්බට්ඨය, ඒ කුමකැයි හඟනෙහිද, කණ්හායනගොත්‍ර ඇත්තෝ කොතැන්සිට

දුතියම්පි ඛො අම්බට්ඨො මාණවො තුණ්හී අහොසි. අථඛො භගවා අම්බට්ඨං මාණවං එතදවොච. ව්‍යාකරොහිදානි අම්බට්ඨ න දානි තෙ තුණ්හීභාවස්ස කාලො. යොඛො අම්බට්ඨ තථාගතෙන යාව තතියකං සහ ධම්මිකං පඤ්හං පුට්ඨො න ව්‍යාකරොති එත්ථෙවස්ස සත්තධා මුද්ධා ඵලිස්සතීති.

21. තෙන ඛො පන සමයෙන වජිරපාණී යක්ඛො මහන්තං අයොකූටං ආදාය ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතං අම්බට්ඨස්ස මාණවස්ස උපරි වෙහාසං ඨිතො හොති සචායං අම්බට්ඨො මාණවො භගවතා යාව තතියකං සහ ධම්මිකං පඤ්හං පුට්ඨො න ව්‍යාකරිස්සති එත්ථෙවස්ස සත්තධා මුද්ධං ඵාලෙස්සාමීති. තං ඛො පන වජිරපාණිං යක්ඛං භගවා චෙව පස්සති අම්බට්ඨො ච මාණවො.

පැවතෙද්ද, කණ්හායන ගොත්‍ර ඇත්තන් අතුරෙන් කවරෙක් පූර්ව පුරුෂවේදැයි වැඩිසිටියාවූ මහළුවූ ආචාර්ය්‍ය ප්‍රාචාර්ය්‍යවූ බමුණන්විසින් කියනුලබන්නාවූ කෙබඳුවචනයක් තාවිසින් කෙසේනම් අසනලද්දැයි මෙපවත් විචාළසේක, දෙවනුවද අම්බට්ඨමාණවකතෙමේ නිශ්ශබ්දවිය, ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ අම්බට්ඨ මාණවකයාට, අම්බට්ඨය, දැන් ප්‍රකාශකරව, දැන් තට නිශ්ශබ්ද වියයුතු කාලය නොවෙයි. අම්බට්ඨය, යමෙක් වනාහි තථාගතයන්වහන්සේවිසින් කරුණු සහිතව තුන්යල දක්වා ප්‍රශ්න විචාරණලද්දේම ප්‍රකාශ නොකෙරේද, මෙහිදීම ඔහුගේ හිස සත්පරිද්දෙකින් පැලෙන්නේයයි මෙපවත් වදාළසේක.

21. එකාලයෙහිදි වජිරපාණීයක්‍ෂතෙමේ හෙවත් සක්දෙව්තෙමේ ගිනිගෙණ දිලියෙන්නාවූ අතිශයින් දීප්තිමත්ව දිලියෙන්නාවූ හාත්පස ඇවිලගත් ආලොක සහිතවූ මහත්වූ යකුළක් රැගෙණ අම්බට්ඨ නම් මාණවකයාගේ හිසමතු අහසෙහි සිටියේ වෙයි. ඉදින් මේ අම්බට්ඨ මාණවකතෙමේ භාග්‍යවතුන්වහන්සේවිසින් තුන්යල දක්වා කරුණු සහිතව ප්‍රශ්න විචාරණලද්දේම. ප්‍රකාශ නොකරන්නේ නම් මෙහිදීම ඔහුගේ හිස සත්කඩක් කොට පලන්නෙමියි කියායි. ඒ වජිරපාණිනම්යක්‍ෂයා වූකලි භාග්‍යවතුන්වහන්සේද අම්බට්ඨ මාණවකතෙමේද දකියි.

අථඛො අම්බට්ඨො මාණවො තං දිස්වා භීතො සංවිග්ගො ලොමහට්ඨජාතො භගවන්තං යෙව තාණං ගවෙසී භගවන්තං යෙව ලෙනං ගවෙසී භගවන්තංයෙව සරණං ගවෙසී උපනිසීදිත්වා භගවන්තං එතදවොච. කිමෙතං භවං ගොතමො ආහ පුන භවං ගොතමො බ්‍රවිතුන්ති තං කිම්මඤ්ඤසි අම්බට්ඨ කින්ති තෙ සුතං බ්‍රාහ්මණානං වුඩ්ඪානං මහල්ලකානං ආචරිය පාචරියානං භාසමානානං කුතොපපභුතිකා කණ්හායනා කොච කණ්හායනානං පුබ්බ පුරිසොති. එවමෙව ඛො ගොතම සුතං යථෙවං භොගොතමො ආහ තතොපපභුතිකා කණ්හායනා සොච කණ්හායනානං පුබ්බපුරිසොති.

22. එවං වුත්තෙතෙ මාණවකා උන්නාදිනො උච්චා සද්ද මහා සද්දා අහෙසුං.

ඉක්බිති අම්බට්ඨනම් මාණවකතෙමේ ඒ වජ්‍රපාණීයක්‍ෂයා දැක බියපත්වූයේ සංවෙගයට පැමිණියේ හටගත් ලොමුදැහැගැණුම් ඇත්තේ භාග්‍යවතුන් වහන්සේගෙන්ම ආරක්‍ෂාස්ථාන සොයන්නේ භාග්‍යවතුන් වහන්සේගෙන්ම නිලීනස්ථාන හෙවත් සැඟවීමටතැන් සොයන්නේ භාග්‍යවතුන්වහන්සේගෙන්ම පිහිට සොයන්නේ සමීපයට එළඹ නිවාසනයෙක හිඳ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකරයි. භාග්‍යවතුන්වහන්සේ මේ කුමක් විචාරණසේක්ද, භවද් ගෞතමයන්වහන්සේ නැවත එය මා විචාළ මැනව. අම්බට්ඨය, ඒ කුමකැයි සිතන්නෙහිද, ඒනම්, කණ්හායන ගොත්‍ර ඇත්තේ කොතැන්සිටද, කණ්හායන ගොත්‍ර ඇත්තෝ කොතැන්සිට පැවතෙද්ද, කණ්හායන ගොත්‍ර ඇත්තන්ගේ පූර්වපුරුෂ තෙමේ කවරෙක්දැයි වයසින්වැඩිසිටියාවූ මහළුවූ ආචාර්‍ය ප්‍රාචාර්‍යවූ බ්‍රාහ්මණයන්ගේ නොහොත් බ්‍රාහ්මණයන්විසින් කියනුලබන්නාවූ කෙබඳු වචනයක් තාවිසින් කෙසේ අසනලද්දේදැයි විචාළසේක. භවද් ගෞතමයන්වහන්සේ කණ්හායනගොත්‍ර ඇත්තෝ කොතැන් සිට පැවතෙද්ද එතැන්පටන්ය. හෙවත් දසීපුත්‍රයන්ගේ පටන් කණ්හායන ගොත්‍ර ඇත්තෝ පවතින්ය. කණ්හායන ගොත්‍ර ඇත්තන් අතුරෙන් කණ්හායකනම් හෙතෙමේම පූර්වපුරුෂයායයි යම්සේ වදාළසේක්ද, භවද් ගෞතමය, එපරිද්දෙන්ම මාවිසින් අසනලද්දේයයි අම්බට්ඨතෙමේ කීයේය.

22. මෙසේ කීකල්හි පින්වත්නි, ඒ මාණවකයෝ උසස් ශබ්ද ඇත්තෝ මහත් ශබ්ද ඇත්තෝ අපහාස්‍යවශයෙන් උසස්කොට නාද කරන්නෝ හෙවත් සත්‍යය ප්‍රකාශකරන්නෙවූහ්. කෙසේද,

දුජ්ජාතො කිර භො. අම්බට්ඨො මාණවො අකුලපුත්තො කිරභො අම්බට්ඨො මාණවො. දාසි පුත්තො කිරභො අම්බට්ඨො මාණවො සක්‍යානං. අය්‍යපුත්තා කිර භො අම්බට්ඨස්ස මාණවස්ස සක්‍යා භවන්ති. ධම්මවාදිං යෙව කිරමයං සමණං ගොතමං අපසාදෙතබ්බං අමඤ්ඤිම්හාති.

23. අථඛො භගවතො එතදහොසි. අතිබාළ්හං ඛො ඉමෙ මාණවකා අම්බට්ඨං මාණවං දාසි පුත්තවාදෙන නිම්මාදෙන්ති. යන්නූනාහං පරිමොචෙය්‍යන්ති, අථ ඛො භගවා තෙ මාණවකෙ එතදවොච. මා ඛො තුම්හෙ මාණවකා අම්බට්ඨං මාණවං අතිබාළ්හං දාසි පුත්තවාදෙන නිම්මාදෙථ. උළාරො සො කණ්හො ඉසි අහොසි. සො දක්ඛිණං ජනපදං ගන්ත්වා බ්‍රහ්මමන්තෙ අධීයිත්වා රාජානං ඔක්කාකං උපසංකමිත්වා මද්දරූපිං ධීතරං යාචි, තස්ස රාජා ඔක්කාකො ඛො නෙවංරෙ අයං මය්හං දාසි පුත්තො සමානො මද්දරූපිං ධීතරං යාචතීති කුපිතො අනත්තමනො ඛුරප්පං සන්නය්හි. සො තං ඛුරප්පං නෙව අසක්ඛි මුඤ්චිතුං නො පටි සංහරිතුං.

අම්බඨ්ඨමාණවකතෙමේ නපුරුජාති ඇත්තෙක හෙවත් කිළුටුජාති ඇත්තෙක. පින්වත්නි, අම්බඨ්ඨනම් මාණවකතෙමේ කුලපුත්‍ර නොවූ වෙක. පින්වත්නි, අම්බඨ්ඨමාණවකතෙමේ ශාක්‍යයන්ගේ දාසිපුත්‍රයෙක. පින්වත්නි, අම්බඨ්ඨමාණවකයාගේ ස්වාමිපුත්‍රයෝ ශාක්‍යයො වෙත්. ධර්මවාදීවූම ශ්‍රමණ ගෞතමයන්වහන්සේ අපි අවමන්කටයුත්තෙකු කොට සිතුයෙමුයි කියාඊ.

23. එකල්හි භාග්‍යවතුන්වහන්සේට මෙබඳු සිතක් පහළවිය. මේ මාණවකයෝ ඉතා වැඩියක්ම අම්බඨ්ඨමාණවකයා දාසිපුත්‍රවාදයෙන් නිගාකරත්. එකාන්තයෙන් මම එය වළක්වන්නෙම්නම් ඉතා යෙහෙකැයි. ඉක්බිති, භාග්‍යවතුන්වහන්සේ ඒ මාණවකයන්ට මෙප වත් වදාළසේක. මානවකයෙනි තෙපි ඉතාවැඩියක් අම්බඨ්ඨමාණවකයා දාසිපුත්‍රවාදයෙන් නිගානොකරව්. ඒ මාණවකතෙමේ මහානුභාවසම්පන්නවූ කෘෂ්ණනම් ඍෂිකෙනෙක්විය. හෙතෙම දකුණුජනපදයට ගොස් ආනුභාවසම්පන්නවූ ශ්‍රෙෂ්ඨමන්ත්‍රයන් හදාරා ඔක්කාක රජහුවෙතට පැමිණ මද්දරූපීනම් දුහිතෘව ඉල්විය. ඔක්කාකරජතෙම ඔහට බොල දාසි පුත්‍රවූ කවරෙක් අපගෙන් මද්දරූපීනම් දුව ඉල්වන්නේ දැයි කිපියේ නොසතුටුසිත් ඇත්තේ ඊය සැරසූයේය. හෙතෙම ඒ ඊය මුදන්වද, ඇදකුලන්වද, නොහැක්කේ විය.

අථ ඛො මාණවකා අමච්චා පාරිසජ්ජා කණ්හං ඉසිං උපසඞ්කමිත්වා එතදවොචුං, සොත්ථි භදන්තෙ හොතු රඤ්ඤො. සොත්ථි භදන්තෙ හොතු රඤ්ඤොති. සොත්ථි භවිස්සති රඤ්ඤො. අපිච රාජා යදි අධො ඛුරප්පං මුඤ්චිස්සති. යාවතා රඤ්ඤො විජිතං එත්තාවතා පඨවී උද්‍රියිස්සතීති. සොත්ථි භදන්තෙ හොතු රඤ්ඤො. සොත්ථි ජනපදස්සාති. සොත්ථි භවිස්සති රඤ්ඤො සොත්ථි ජනපදස්ස අපිච රාජා යදි උද්ධං ඛුරප්පං මුඤ්චිස්සති, යාවතා රඤ්ඤො විජිතං එත්තාවතා සත්තවස්සානි දෙවො න වස්සිස්සතීති. සොත්ථි භදන්තෙ හොතු රඤ්ඤො සොත්ථි ජනපදස්ස දෙවොච වස්සතූති සොත්ථි භවිස්සති රඤ්ඤො සොත්ථි ජනපදස්ස දෙවොච වස්සිස්සති අපි ච රාජා ජෙට්ඨකුමාරෙ ඛුරප්පං පතිට්ඨාපෙතු, සොත්ථි කුමාරො පල්ලොමො භවිස්සතීති. අථ ඛො මාණවකා අමච්චා ඔක්කාකස්ස ආරොචෙසුං ඔක්කාකො ජෙට්ඨකුමාරෙ ඛුරප්පං පතිට්ඨාපෙතු සොත්ථි කුමාරො පල්ලොමො භවිස්සතීති අථ ඛො රාජා ඔක්කාකො ජෙට්ඨ කුමාරෙ ඛුරප්පං පතිට්ඨාපෙසි.

එකල්හි මාණවකයෝද, අමාත්‍යයෝද, මහඇමතිපිරිසද, කෘෂ්ණ නම් ඍෂිහු වෙතටපැමිණ මෙසේ සැලකළෝ. පින්වතුන්වහන්ස, රජහට සැපවේද, පින්වතුන්වහන්ස, රජහටසැපවේද යනුයි. රජහට සැපවන්නේය. යලිදු,රජතෙම ඉදින් ඊයයටහෙලන්නේද රජහුගේ පුරය යම් පමණතැන්ද එපමණතැන් පොළොව කම්පාවන්නේය. පින්වතුන්වහන්ස, රජහටසැපවේද, ජනපදයට සැපවේදැයි, රජහටසැපවින්නේය. ජනපදයට සැපවන්නේය. යලිදු රජතෙමේ ඉදින් ඊය උඩට හරින්නේද රජුගේනුවර යම් පමණතැන්ද එපමණතැන් සත්වර්‍ෂයක්මුලුල්ලෙහි වර්‍ෂාව නොවසින්නේය. පින්වතුන්වහන්ස, රජහටසැපවේද. ජනපදයට සැපවේද, වර්‍ෂාව වසිවයි, රජහටසැපවින්නේය. ජනපදයටසැපවන්නේය. වර්‍ෂාවද වසින්නේය. යලිදු,රජතෙම දෙටුකුමරුකෙරෙහි ඊය පිහිටුවාවා ලොමුදූහැගැණුම් පමණකුදු නැති කුමරුතෙම සැපවන්නේයයි කී. ඉක්බිති මානවකයෝද. අමාත්‍යයෝද, ඔක්කාකරජතෙමේ දෙටුකුමරු කෙරෙහි ඊය පිහිටවනුමැනවි. ලොමුදූහැගැණුම් පමණකුදු නැති කුමාරතෙමේ සැපවන්නේයයි ඔක්කාකරජහට සැලකළෝ. ඉක්බිති ඔක්කාක රජතෙමේ දෙටුකුමරුවන්කෙරෙහි ඊය පිහිටෙවූයේය.

සොත්පි කුමාරො පලලාමො භවිස්සති. අථ ඛො තස්ස රඤ්ඤො ඔක්කාකො
භීතො සංවිග්ගො ලොමහට්ඨජාතො බ්‍රහ්මදණ්ඩෙන තජ්ජිතො
බුද්දරූපිං ධීතරං අදාසි. මා ඛො තුම්හෙ මාණවකා අම්බට්ඨං මාණවං අති
බාළ්හං දාසිපුත්තවාදෙන නිම්මාදෙථ උළාරො සො කණ්හො ඉසි
අහොසීති.

24. අථ ඛො භගවා අම්බට්ඨං මාණවං ආමන්තෙසි තං කිම්මඤ්
ඤසි අම්බට්ඨ, ඉධ ඛත්තිය කුමාරො බ්‍රාහ්මණ කඤ්ඤාය සද්ධිං සංවා
සං කප්පෙය්‍ය තෙසං සංවාසමන්වාය පුත්තො ජායෙථ. යො සො
ඛත්තිය කුමාරෙන බ්‍රාහ්මණ කඤ්ඤාය පුත්තො උප්පන්නො අපිනු
සො ලභෙථ බ්‍රාහ්මණෙසු ආසනං වා උදකං වාති. ලභෙථ භො
ගොතම, අපිනුනං බ්‍රාහ්මණා භොජෙය්‍යුං සද්ධෙ වා ථාලිපාකෙ වා
යඤ්ඤෙවා පාහුණෙවාති. භොජෙය්‍යුං භොගොතම. අපිනුනං
බ්‍රාහ්මණා මන්තෙ වාචෙය්‍යුං වා නො වාති වාචෙය්‍යුං භො ගොතම.

ලොමුදැහැගැණුම් පමණකුදුනැති කුමාරතෙමේ සැපවන්නේය. ඉක්
බිති ඔක්කාක රජතෙමේ භීතභයවූයේ බ්‍රහ්මදණ්ඩණයෙන් තර්ජ
නයකරණලද්දේ බුද්දරූපිනම් දුහිතෘව දුන්නේය. මානවකයෙනි,
තෙපි ඉතා වැඩියක් අම්බට්ඨමාණවකයා දාසි පුත්‍රවාදයෙන් මානනිග්‍රහ
නොකරව්. හෙතෙම කෘෂ්ණනම් මහත් ඍෂිවූයේය.

24. ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ අම්බට්ඨ මාණවකයාහට
අඬගාවදාළසේක. අම්බට්ඨය, ඒ කුමකැයි සිතන්නෙහිද. මේලොක
යෙහි ක්‍ෂත්‍රිය කුමාරයෙක් බ්‍රාහ්මණකන්‍යාවක්සමග සංවාසය
කරන්නේද ඔවුන්ගේ සංවාසයට පැමිණීම් හෙතුවෙන් පුත්‍රයෙක්
උපදින්නේද. ක්‍ෂත්‍රිය කුමාරයා කරණකොටගෙණ බ්‍රාහ්මණ
කන්‍යාවට යම් ඒ පුත්‍රයෙක් උපන්නේද හෙතෙම බමුණන් අතු
රෙහි අග්‍රාසනය හෝ අග්‍රපැන් හෝ ලබන්නේද. භවද්ගෞතමය,
ලබන්නේය. ඉදින්ඔහු මතකබත් හෝ මඞ්ගලබත් හෝ යාගබත්
හෝ පඬුරුබත් හෝ බමුණෝ අනුභවකරවන්නාහුද. භවත්
ගෞතමය, අනුභවකරවන්නාහුය. ඉදින් බ්‍රාහ්මණයෝ මන්ත්‍රයන්
කියවන්නාහුද, ඉදින් නොකියවන්නාහුද, භවත් ගෞතමය. කිය
වන්නාහුමය.

අපිනුස්ස ඉත්ථීසු ආවට්ටංවා අස්සඅනාවට්ටං වාති අනාවට්ටං හිස්ස හො ගොතම. අපිනුනං ඛත්තියා ඛත්තියාභිසෙකෙන අභිසිඤ්චෙය්‍යුන්ති. නො හිදං හොගොතම. තංකිස්සහෙතු. මාතිතො හි හො ගොතම අනුපපන්නොති.

25. තං කිමඤ්ඤසි අම්බට්ඨ ඉධ බ්‍රාහ්මණකුමාරො ඛත්තිය කඤ්ඤාය සද්ධිං සංවාසං කප්පෙය්‍ය තෙසං සංවාසා අන්වාය පුත්තො ජායෙථ යො සො බ්‍රාහ්මණ කුමාරෙන ඛත්තිය කඤ්ඤාය පුත්තො උප්පන්නො අපිනු සො ලභෙථ බ්‍රාහ්මණෙසු ආසනංවා උදකං වාති ලභෙථ හොගොතම අපිනුනං බ්‍රාහ්මණා භොජෙය්‍යුං සද්ධෙ වා ථාලි පාකෙ වා යඤ්ඤෙ වා පාහුණෙවාති. භොජෙය්‍යුං හො ගොතම අපිනුනං බ්‍රාහ්මණා මන්තෙ වාචෙය්‍යුං වා නොවාති. වාචෙය්‍යුං හො ගොතම අපිනුස්ස ඉත්ථීසු ආවට්ටං වා අස්ස අනාවට්ටං වාති. අනාවට්ටං හිස්ස හො ගොතම, අපිනුනං ඛත්තියා ඛත්තියාභි සෙකෙන අභිසිඤ්චෙය්‍යුන්ති. නොහිදං හො ගොතම. තං කිස්සහෙතු. පිති තො හි හොගොතම අනුපපන්නොති.

ඒ ක්ෂත්‍රියකුමරුහට ක්ෂත්‍රීන්අතුරෙහි වැලක්මක් හෝ නොවැලැක්මක් හෝ ඉදින්වන්නාහුද, භවත් ගෞතමය. නොවැලැක්ම වන්නාහුය. ක්ෂත්‍රියයෝ ඔහු ක්ෂත්‍රියාභිෂෙකයෙන් අභිෂෙක කරන්නාහුද, භවත්ගෞතමය. මෙය නොකරන්නේමය. ඊට හෙතු කවරේද. භවත්ගෞතමය.මව්පක්ෂයෙන් අපිරිසිදුවඋපන්හෙයිනි.

25. අඹඨය ඒ කුමකැයි හඟින්නෙහිද, මෙහි බමුණුකුමාරයෙක් ක්ෂත්‍රිය කන්‍යාවක් සමග සංවාසයකරන්නේද. ඔවුන්ගේ සංවාසය හෙතුකොටගෙණ පුත්‍රයෙක් උපදින්නේද. බමුණුකුමාරයා කරණකොටගෙණ ක්ෂත්‍රිය කන්‍යාවට යම් ඒ පුත්‍රයෙක් උපන්නේද හෙතෙම බමුණන්අතුරෙහි අග්‍රාසනය හෝ අග්‍රපැන් හෝ ඉදින් ලබන්නේද, භවත්ගෞතමය. ලබන්නේය. බ්‍රාහ්මණයෝ ඔහු මත කබත් හෝ මඞ්ගලබත් හෝ යාගබත් හෝ පඬුරු බත් හෝ ඉදින් අනුභව කරවන්නාහුද, භවද්ගෞතමය. අනුභවකරවන්නාහුය. බ්‍රාහ්මණයෝ ඔහුට මන්ත්‍ර කියවන්නාහුද ඉදින් නොකියවන්නාහුද,භවත්ගෞතමය.කියවන්නාහුය ඒ බමුණුකුමරුහට ස්ත්‍රීන් අතුරෙහි වැලක්මක් හෝ නොවලැක්මක් හෝ ඉදින් වේද. භවද් ගෞතමය. නොවැලක්මවන්නේය. ක්ෂත්‍රියයෝ ක්ෂත්‍රියාභිෂෙකයෙන් ඉදින් ඔහුඅභිෂෙක කරන්නාහුද, භවද්ගෞතමය.එය නොකරන්නේමය. ඊට හේතුකවරේද, භවද්ගෞතමය. පිය පක්ෂයෙන් අපිරිසිදුව උපන්හෙයිනි.

26. ඉති ඛො අම්බඨ්ඨ ඉත්ථි යා වා ඉත්ථිං කරිත්වා පුරිසෙනවා පුරිසං කරිත්වා ඛත්තියාව සෙට්ඨා. හීනා බ්‍රාහ්මණා තංකිම්මඤ්ඤසි අම්බඨ්ඨ. ඉධ බ්‍රාහ්මණා බ්‍රාහ්මණං කිස්මිඤ්චිදෙව පකරණෙ ඛුර මුණ්ඩං කරිත්වා අස්සපුටෙන වධිත්වා රට්ඨා වා නගරා වා පබ්බාජෙය්‍යුං අපිනුසො ලභෙථ බ්‍රාහ්මණෙසු ආසනං වා උදකං වාති. නොහිදං භොගොතම. අපිනුනං බ්‍රාහ්මණා භොජෙය්‍යුං. සද්ධෙවා ථාලි පාකෙ වා යඤ්ඤෙ වා පාහුණෙවාති. නොහිදං භොගොතම. අපිනුනං බ්‍රාහ්මණා මන්තෙ වාචෙය්‍යුං වා නො වාති. නොහිදං භොගොතම අපිනුස්ස ඉත්ථිසු ආවටං වා අස්ස අනාවටං වාති. ආවටං හිස්ස භොගොතම.

27. තං කිම්මඤ්ඤසි අම්බඨ්ඨ. ඉධ ඛත්තියා ඛත්තියං කිස්මිඤ්චි දෙව පකරණෙ ඛුරමුණ්ඩං කරිත්වා අස්සපුටෙන වධිත්වා රට්ඨා වා නගරා වා පබ්බාජෙය්‍යුං අපිනු සො ලභෙථ බ්‍රාහ්මණෙසු ආසනං වා උදකං වාති.

---

26. අම්බෂ්ඨය මෙසේ වනාහි ස්ත්‍රියක්විසින් හෝ ස්ත්‍රියක් සොයාද පුරුෂයකු විසින්හෝ පුරුෂයෙක් සොයාද ක්‍ෂත්‍රියයෝම ශ්‍රේෂ්ඨයෝ වෙත්. බ්‍රාහ්මණයෝ ලාමකයෝවෙත්. අම්බෂ්ඨය ඒකුමකැයි හඟින්නෙහිද, මෙහි බ්‍රාහ්මණයෝ බ්‍රාහ්මණකුමාරයෙකු කිසියම් දෙෂකාරණ යක්නිමිති කොටගෙණ මුදුනෙහි ක්‍ෂුරයෙන්මුඩුකොට උණුඅළුපොදිය කින්හිසඅලුවගුරුවාරටින් හෝනුවරින්බැහැරකරන්නාහුද.හෙතෙම බමුණන්අතුරෙහි අග්‍රාසනය හෝ අග්‍රපැන් හෝ ඉදින් ලබන්නේද. භවද්ගෞතමය, නොලබන්නේය. බ්‍රාහ්මණයෝ ඔහු මතකබත් හෝ මඞ්ගලබත් හෝ යාගබත් හෝ පඬුරුබත් හෝ ඉදින් අනුභවක රවන්නාහුද, භවද්ගෞතමය.මෙය නොකරන්නාහුය. බ්‍රාහ්මණයෝ ඔහු මන්ත්‍රයන් කියවන්නාහුද ඉදින් නොකියවන්නාහුද. භවද් ගෞතමය, මෙය නොවන්නේය ඒ බ්‍රාහ්මණකුමරුහට ස්ත්‍රීන් අතුරෙහි වැළක්මක් හෝ නොවැළක්මක් හෝ ඉදින් වන්නාහුද භවද්ගෞතමය මෙයවන්නේය.

27. අම්බෂ්ඨය ඒකුමකැයි හඟින්නෙහිද මෙහි ක්‍ෂත්‍රියයෝ ක්‍ෂත්‍රිය කුමරෙකු කිසියම් දෙසකාරණයෙක්හි මුදුනෙහි ක්‍ෂුරයෙන්මුඩුකොට උණුඅළු පොදියකින් හිසඅලුවගුරුවාවධකොට රටින් හෝ නුවරින් බැහැරකරන්නාහුද හෙතෙමේ බමුණන් අතුරෙහි අග්‍රාසනය හෝ අග්‍රපැන් හෝ ඉදින්ලබන්නේද,

ලභෙථ හො ගොතම අපිනුනං බ්‍රාහ්මණා භොජෙය්‍යුං සද්ධෙ වා ථාලි පාකෙ වා යඤ්ඤෙ වා පාහුණෙ වාති භොජෙය්‍යුං භො ගොතම අපිනුනං බ්‍රාහ්මණා මන්තෙ වාචෙය්‍යුං වා නො වාති. වාචෙය්‍යුං භො ගොතම. අපිනුස්ස ඉත්ථීසු ආවටං වා අස්ස අනාවටං වාති. අනාවටං හිස්ස භො ගොතම. එත්තාවතා ඛො අම්බට්ඨ ඛත්තියො පරම නිහීනතං පත්තො හොති යදෙව නං ඛත්තියා ඛුර මුණ්ඩං කරිත්වා අස්සපුටෙන වධිත්වා රට්ඨා වා නගරා වා පබ්බාජෙන්ති. ඉති ඛො අම්බට්ඨ යදාපි ඛත්තියො පරම නිහීනතං පත්තො හොති. තදාපි ඛත්තියාව සෙට්ඨා හීනා බ්‍රාහ්මණා.

28. බ්‍රහ්මුණාපි එසා අම්බට්ඨ සනංකුමාරෙන ගාථා භාසිතා.

ඛත්තියො සෙට්ඨො ජනෙතස්මිං–යෙ ගොත්තපටිසාරිනො
විජ්ජාචරණ සම්පන්නො–සො සෙට්ඨො දෙවමානුසෙති.

සා ඛො පනෙසා අම්බට්ඨ බ්‍රහ්මුණා සනංකුමාරෙන ගාථා සුගීතා. න දුග්ගීතා. සුභාසිතා. න දුබ්භාසිතා.

භවද් ගෞතමය. ලබන්නේය. බ්‍රාහ්මණයෝ ඔහු මතක බත් හෝ මඞ්ගලබත් හෝ යාගබත් හෝ පඩුරුබත් හෝ ඉදින් අනුභවකරන්නාහුද, භවද්ගෞතමය. අනුභවකරන්නේය. ඒක්‍ෂත්‍රිය කුමරුහට ස්ත්‍රීන් අතුරෙහි වැලක්මක් හෝ නොවැලක්මක් හෝ වන්නේද, භවද්ගෞතමය. නොවැළැක්මක් වන්නේය. අම්බඨය මෙපමණකින් ක්‍ෂත්‍රියතෙමේ අතිශයින් හීනබවට පැමිණියේවේ. ක්‍ෂත්‍රියයෝ ඔහු මුදුනෙහි ක්‍ෂුරයෙන්මුඩුකොට උණුඅළුපොදියකින් හිසඅලුවගුරුවා වධකොට රටින් නුවරින් බැහැරකෙරෙත්. අම්බඨය, මෙසේයම්කලක ක්‍ෂත්‍රියතෙමේ අතිශයින් හීනබවට පැමිණියේ වේද එකල්හිද ක්‍ෂත්‍රියයෝම ශ්‍රේෂ්ඨවෙත්. බ්‍රාහ්මණයෝ හීනවෙත්.

28. අම්බඨය බ්‍රහ්මවූ සනත්කුමාරයා විසින් මේ ගාථාතොමෝ කියනලදී. සත්වවර්ගයා අතුරෙන් ක්‍ෂත්‍රියතෙමේ ශ්‍රේෂ්ඨවේ. යමෙක් ගොත්‍රය සිහිකරන්නේවේද අෂ්ටවිද්‍යාවෙන් හා පසළොස්චරණ ධර්මයෙන් සම්පූර්ණවූයේ වේද, ඒතථාගතතෙම දෙවමිනිසුන්අතුරෙහි ශ්‍රේෂ්ඨවේයනුයි. අම්බට්ඨය බ්‍රහ්මවූසනත්කුමාරයා විසින් ඒ මේ ගාථාතොමෝ මනාකොට ගායනාකරණලද්දීය. නපුරුකොට ගායනා නොකරණ ලද්දීය. යහපත්ව කියනලද්දීය. නපුරුකොට නො කියනලද්දීය.

අත්ථසංහිතා. නො අනත්ථසංහිතා. අනුමතා මයා. අහම්පි අම්බඨ්ඨ එවං වදාමි.

ඛත්තියො සෙට්ඨො ජනෙතස්මිං--යෙ ගොත්ත පටිසාරිනො
විජ්ජාචරණ සම්පන්නො—සො සෙට්ඨො දෙව මානුසෙති.

භාණවාරං පඨමං

---

29. කතමංපනතංභොගොතමචරණං,කතමාච පනසාවිජ්ජාති. න ඛො අම්බඨ්ඨ අනුත්තරාය විජ්ජාචරණසම්පදාය ජාති වාදො වා වුච්චති ගොත්ත වාදොවා වුච්චති මානවාදො වා වුච්චති. අරහසි වා මං ත්වං න වා මං ත්වං අරහසීති. යත්ථ ඛො අම්බඨ්ඨ ආවාහො වා හොති. විවාහො වා හොති. ආවාහ විවාහො වා හොති. එත්ථෙතං වුච්චති ජාතිවාදො ඉතිපි ගොත්තවාදො ඉතිපි මාන වාදො ඉතිපි. අරහසි වා මං ත්වං න වා මං ත්වං අරහසීති. යෙහි කෙචි අම්බඨ්ඨ ජාති වාද විනිබද්ධාවා. ගොත්තවාද විනිබද්ධා වා මානවාද විනිබද්ධා වා ආවාහවිවාහ විනිබද්ධා වා ආරකා තෙ අනුත්තරාය විජ්ජාචරණ සම්පදාය.

අර්ථඵලවත්නිය. අනර්ථ නොඑලවත්නිය, මා විසින්ද අනුමත කරණ ලද්දිය. අම්බට්ඨය, මමද මෙසේ කියමි. සත්ත්වවර්ගයා අතුරෙන්ක්ෂත්‍රිය තෙමේ ශ්‍රේෂ්ඨ වේ. යමෙක් ගොත්‍රය සිහිකරන්නේද අෂ්ටවිද්‍යාවෙන් හා පසළොස්චරණ ධර්මයන්ගෙන් සම්පූර්ණ වූයේවේද ඒතථාගතතෙමදෙව්මිනිසුන් අතුරෙහිශ්‍රේෂ්ඨවේය කියායි.

පළමුවෙනි බණවරයි.

---

29. භවද්ගෞතමයන්වහන්ස, ඒ චරණධර්මය කවරේද? ඒ විද්‍යා තොමෝ කවරීද? අම්බඨ්ඨය නිරුත්තරවූ විද්‍යාචරණසම්පදායෙහි ජාතිවාදය හෝ කියනුනොලැබේ. ගොත්‍රවාදය හෝ කියනු නොලැබේ. මානවාදය හෝ කියනු නොලැබේ. තෝ මටසුදුසුවූයෙහි හෝතෝමටසුදුසුනොවූයෙහියකියාහෝනොවේ. අම්බඨ්ඨයයම්තෙනක ආවාහයක්හෝවේද විවාහයක්හෝවේදආවාහ විවාහයක් හෝ වේද එහි මෙය ජාතිවාදයයි කියනුලැබේ. මෙසේම ගොත්‍රවාදයයි කියනු ලැබේ. මෙසේම මෙය මානවාදයයි කියනුලැබේ. තෝ මට සුදුසු වූයෙහි යකියාහෝ තෝ මට සුදුසු නොවූයෙහියකියා හෝ නොවේ. අම්බට්ඨය යම්කිසිවෙක් ජාතිවාදයෙන් තදවබැඳුනාහුද. ගොත්‍රවාදයෙන් තදවබැඳුනාහුදමානවාදයෙන් තදවබැඳුනාහුද, ආවාහ විවාහයෙන් තදවබැඳුනාහුද, ඔවුහුනිරුත්තරවූ විද්‍යාචරණ සම්පදායෙන් තොරවූවාහුවෙත්.

පහාය බො අම්බට්ඨ ජාතිවාද විනිබද්ධඤ්ච, ගොත්තවාද විනිබද්ධඤ්ච, මානවාදවිනිබද්ධඤ්ච, ආවාහ විවාහ විනිබද්ධඤ්ච අනුත්තරාය විජ්ජාචරණසම්පදාය සච්ඡිකිරියා හොතීති.

30. කතමං පන තං භො ගොතම චරණං. කතමා ච සා විජ්ජාති. ඉධ අම්බට්ඨ තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මා සම්බුද්ධො —පෙ— සාමඤ්ඤඵලං එවං විත්ථාරෙතබ්බං —පෙ— එවං ඛො අම්බට්ඨ භික්ඛු සීලසම්පන්නො හොති —පෙ— පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති. ඉදම්පිස්ස හොති චරණස්මිං —පෙ— චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරති. ඉදම්පිස්ස හොති චරණස්මිං. ඉදං ඛො තං අම්බට්ඨ චරණං. ඤාණදස්සනාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති —පෙ— ඉදම්පිස්ස හොති විජ්ජාය —පෙ— නාපරං ඉත්ථත්තායාති පජානාති. ඉදම්පිස්ස හොති විජ්ජාය. අයං ඛො සා අම්බට්ඨ විජ්ජා. අයං වුච්චති අම්බට්ඨ භික්ඛු විජ්ජාසම්පන්නො. ඉතිපි චරණසම්පන්නො ඉතිපි විජ්ජාචරණසම්පන්නො ඉතිපි. ඉමාය ච අම්බට්ඨ විජ්ජාචරණසම්පදාය ච අඤ්ඤා විජ්ජාසම්පදා ච චරණසම්පදා ච උත්තරිතරා වා පණීතතරා වා නත්ථි.

අම්බට්ඨය ජාතිවාදයෙන් තදවබැඳීමද, ගොත්‍රවාදයෙන් තදවබැඳීමද, මානවාදයෙන් තදවබැඳීමද, ආවාහ විවාහයෙන් තදවබැඳීමද, හැර නිරුත්තරවූ විද්‍යාචරණසම්පදාහුගේ ප්‍රත්‍යක්ෂකිරීම වේ.

31. භවද්ගෞතමයන, ඒ චරණධර්මය කවරේද? ඒ විද්‍යා තොමෝ කවරීද, එම්බල අම්බට්ඨය මේ ලොකයෙහි අර්හත්සම්‍යක්සම්බුද්ධවූ තථාගතතෙමේ උපදීද —පෙ— සාමඤ්ඤඵලසූත්‍රයෙහි යම් සේද එසේ විස්තර කටයුතුයි. අම්බට්ඨය මෙසේ භික්ෂුතෙමේ ශීලයෙන් යුක්ත වේද —පෙ— ප්‍රථමධ්‍යානයට පැමිණවාසය කෙරේද, ඒ භික්ෂුහුගේ මේ චරණ ධර්මය වේ. —පෙ— චතුර්ථධ්‍යානයට පැමිණවාසය කෙරේද ඒ භික්ෂුහුගේ මේ චරණධර්මය වේ. අම්බට්ඨය මෙයටනාගි ඒ චරණ ධර්මයයි ඥානදර්ශනයපිණිස සිතඑලවාතබාද —පෙ— ඔහුගේමේවිද්‍යාව වේ —පෙ— මේමිනිසත්බවපිණිස අනිකක් නැත්තේයයිදැනගණියි. අම්බට්ඨය ඔහුගේ මේවිද්‍යාව වේ. මේමහණතෙමේවිද්‍යාවෙන් සම්පූර්ණයයි කියතුලැබේ. මේමහණතෙමේ චරණධර්මයෙන් සම්පූර්ණයයිද කියතුලැබේ. මෙසේම විද්‍යාවෙන්හාචරණධර්මයෙන් සම්පූර්ණයයිකියතුලැබේ. අම්බට්ඨය මේ විද්‍යාචරණ සම්පත්තියට වඩා අතිශයින් උතුම්වූ හෝ අතිශයින් ශ්‍රේෂ්ඨ දඅනික්වූ විද්‍යාචරණ සම්පත්තියක් නැත්තීය.

31. ඉමාය ඛො අම්බට්ඨ අනුත්තරාය විජ්ජාචරණ සම්පදාය චත්තාරි
අපාය මුඛානි භවන්ති. කතමානි චත්තාරි ඉධ අම්බට්ඨ එකච්චො
සමණො වා බ්‍රාහ්මණො වා ඉමඤ්ඤෙව අනුත්තරං විජ්ජාචරණසම්
පදං අනභිසම්භුණමානො ඛාරිවිවිධ මාදාය අරඤ්ඤායතනං අජ්
ඣොගාහති පවත්ත ඵල භොජනො භවිස්සාමීති. සො අඤ්ඤදත්ථු
විජ්ජාචරණ සම්පන්නස්සෙව පරිචාරකො සම්පජ්ජති. ඉමාය ඛො
අම්බට්ඨ අනුත්තරාය විජ්ජාචරණ සම්පදාය ඉදං පඨමං අපාය මුඛං
භවති. පුනචපරං අම්බට්ඨ ඉධෙකච්චො සමණො වා බ්‍රාහ්මණොවා
ඉමඤ්ඤෙව අනුත්තරං විජ්ජාචරණසම්පදං අනභිසම්භුණමානො
පවත්ත ඵල භොජනතඤ්ඤෙව අනභිසම්භුණමානො කුද්දාල පිටකං ආ
දාය අරඤ්ඤායතනමජ්ඣොගාහති කන්ද මූල ඵල භොජනො භවි
ස්සාමීති. සො අඤ්ඤදත්ථු විජ්ජාචරණ සම්පන්නස්සෙව පරිචාරකො
සම්පජ්ජති. ඉමායව ඛො අම්බට්ඨ අනුත්තරාය විජ්ජාචරණ සම්පදාය
ඉදං දුතියං අපාය මුඛං භවති. පුනච පරං අම්බට්ඨ ඉධෙකච්චො
සමණො වා බ්‍රාහ්මණො වා ඉමඤ්ඤෙව අනුත්තරං විජ්ජාචරණ
සම්පදං අනභිසම්භුණමානො.

31. අම්බට්ඨය නිරුත්තරවූ මේවිද්‍යාචරණ සම්පත්තිහුගේ විනාශ
කාරණයෝ සතරක් වෙත්. ඒ සතර කවරහුද? අම්බට්ඨය මෙහි
ඇතැම්ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ නිරුත්තරවූම මේ
විද්‍යාචරණසම්පත්තිය සම්පූර්ණ නොකරන්නේ තවුස් පිරිකර කද
ගෙණ වැටුනු ඵල අනුභව කරන්නෙක් වන්නෙමියි වනපෙදෙස
කට බැසගණීද හෙතෙම එකාන්තයෙන් අෂ්ටවිද්‍යාවෙන්
හා පසළොස් චරණධර්මයන්ගෙන් යුක්තවූ වෙකුගේම මෙහෙකරු
බවට පැමිණේ. අම්බට්ඨය නිරුත්තරවූ මේවිද්‍යාචරණ සම්පත්ති
හුගේ මේ පළමුවෙනි විනාශකාරණයවේ. අම්බට්ඨය නැවතද
අනික්කරුණක් කියමි. මෙහි ඇතැම්ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණ
යෙක් හෝ නිරුත්තරවූම මේ විද්‍යාචරණ සම්පත්තිය සම්පූර්ණනො
කරන්නේ වැටුනඵල අනුභව කිරීමටද, නොපැමිණෙන්නේ
උදැල්ලක් හා පැසක්ගෙණ අල මුල් ඵල අනුභවකරන්නෙක්
වන්නෙමියි වනයෙහි වනමැදටබැසගණීද, හෙතෙම එකාන්තයෙන්
විද්‍යාචරණ ධර්මයෙන් යුක්තවූවෙක්හටම මෙහෙකරුබවට පැමිණේ.
අම්බට්ඨය නිරුත්තරවූ විද්‍යාචරණ සම්පත්තිහුගේ මේ දෙවෙනිවූ
විනාශකාරණය වේ. අම්බට්ඨය නැවතද අනිකක්කියමි. මෙහි
ඇතැම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ නිරුත්තරවූම මේ
විද්‍යාචරණ සම්පත්තිය සම්පූර්ණනොකරන්නේ.

පවත්තඵල භොජනතඤ්ච අනභිසම්භුණමානො කන්ද මූලඵල භො ජනතඤ්ච අනභිසම්භුණමානො ගාම සාමන්තං වා නිගම සාමන්තං වා අග්‍යාගාරං කරිත්වා අග්ගිං පරිචරන්තො අච්ඡති. සො අඤ්ඤදත්ථු විජ්ජාචරණසම්පන්නස්සෙව පරිචාරකො සම්පජ්ජති. ඉමායබො අම්බට්ඨ අනුත්තරාය විජ්ජාචරණසම්පදාය ඉදං තතියං අපාය මුඛං භවති. පුනච පරං අම්බට්ඨ ඉධෙකච්චො සමණො වා බ්‍රාහ්මණො වා ඉමඤ්චෙව අනු ත්තරං විජ්ජාචරණ සම්පදං අනභිසම්භුණ මානො පවත්ත ඵල භොජනතඤ්ච අනභිසම්භුණමානො කන්ද මූල ඵල භොජන තඤ්ච අනභි සම්භුණමානො අග්ගිපරිචරියඤ්ච අනභිසම්භුණමානො චාතු මහාපථෙ චතුද්වාරං අගාරං කරිත්වා අච්ඡති. යො ඉමාහි චතුහි දිසාහි ආගමිස්සති සමණො වා බ්‍රාහ්මණො වා තමහං යථා සත්ති යථා බලං පටිපූජෙස්සාමීති. සො අඤ්ඤදත්ථු විජ්ජාචරණ සම්පන්න ස්සෙව පරිචාරකො සම්පජ්ජති. ඉමාය බො අම්බට්ඨ අනුත්තරාය විජ්ජාචරණ සම්පදාය ඉදං චතුත්ථං අපාය මුඛං භවති. ඉමාය බො අම්බට්ඨ අනුත්තරාය විජ්ජාචරණ සම්පදාය ඉමානි චත්තාරි අපාය මුඛානි භවන්ති.

වැටුනු ඵල අනුභව කිරීමටද නොපැමිණෙන්නේ අල මුල් ගෙඩි අනුභවකිරීමටද, නොපැමිණෙන්නේ ගමහාත්පස හෝ නියම්ගම හාත්පසහෝගිනිහල්ගෙයක්කොට ගිණිපුදමින් හිඳිද, හෙතෙම එකා න්තයෙන් අෂ්ටවිද්‍යාපසළොස්චරණධර්මයන්ගෙන් සම්පූර්ණවූවෙකුටම මෙහෙකරු බවටපැමිණේ අම්බට්ඨය නිරුත්තරවූම මේවිද්‍යාචර ණ සම්පත්තිහුගේ මේ තුන්වෙනිවූ විනාශකාරණය වේ, අම් බඨය, නැවතද අනිකක් කියමි, මෙහි ඇතැම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ නිරුත්තරවූම මේ විද්‍යාචරණසම්පත්තිය සම් පූර්ණ නොකරන්නේ අලමුල්ගෙඩි අනුභවකිරීමටද නොපැමිණෙන් නේ වැටුන ඵල අනුභවකිරීමද සම්පූර්ණ නොකරන්නේ ගිනි පිදීමද සම්පූර්ණ නොකරන්නේ මේ සතරදිශාවෙන් යම්බඳුවූ ශ්‍රමණ යෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ පැමිණෙන්නේද ඔහු මම ශක්ති පරිද්දෙන් පුදන්නෙමියි සතරමංසන්ධියෙක්හි දොරටු සතරක්ඇති ගෙයක් කොට හිඳිද හෙතෙම එකාන්තයෙන් අෂ්ටවිද්‍යා පසළොස් චරණ ධර්මයන්ගෙන් සම්පූර්ණවූවෙකුගේම මෙහෙකරුබවට පැමිණේ. අම්බඨය, නිරුත්තරවූ මේ විද්‍යාචරණ සම්පත්තියෙහි මේ සතරවෙනිවූ විනාශ කාරණය වේ. අම්බඨය, නිරුත්තරවූ මේ විද්‍යා චරණ සම්පත්තියෙහි මේසතර විනාශකාරයෝ වෙත්යයිවදාළෝ.

32. තං කිමමඤ්ඤසි අම්බට්ඨ. අපිනු ත්වං ඉමාය අනුත්තරාය විජ්ජාචරණසම්පදාය සන්දිස්සසි සාචරියකොති. නොහිදං භො ගොතම. කොචාහං භො ගොතම සාචරියකො. කා ච අනුත්තරා විජ්ජාචරණසම්පදා. ආරකාහං භො ගොතම අනුත්තරාය විජ්ජාචරණසම්පදාය සාචරියකොති. තං කිමමඤ්ඤසි අම්බට්ඨ. අපිනු ත්වං ඉමඤ්චෙව. අනුත්තරං විජ්ජාචරණසම්පදං අනභිසම්භුණමානො ඛාරිවිවිධමාදාය අරඤ්ඤවනමජ්ඣොගාහසි සාචරියකො පවත්තඵලභොජනො භවිස්සාමීති. නොහිදං භො ගොතම. තං කිමමඤ්ඤසි අම්බට්ඨ අපිනු ත්වං ඉමඤ්චෙව අනුත්තරං විජ්ජාචරණසම්පදං අනභිසම්භුණමානො පවත්තඵලභොජනතඤ්ච අනභිසම්භුණමානො කුද්දාලපිටකං ආදාය අරඤ්ඤවනමජ්ඣොගාහසි සාචරියකො කන්දමූලඵලභොජනො භවිස්සාමීති. නොහිදං භො ගොතම. තං කිමමඤ්ඤසි අම්බට්ඨ අපිනු ත්වං ඉමඤ්චෙව අනුත්තරං විජ්ජාචරණසම්පදං අනභිසම්භුණමානො පවත්තඵලභොජනතඤ්ච අනභිසම්භුණමානො කන්දමූලඵලභොජනතඤ්ච අනභිසම්භුණමානො.

32. අම්බට්ඨය, ඒ කුමකැයි සිතන්නෙහිද, නිරුත්තරවූ මේ විද්‍යාචරණ සම්පත්තියෙහි ආචාර්ය(භාව)සහිතවූ තෝ ඉදින් දක්නෙහිද, භවද් ගෞතමය, මෙය නොවේමය. භවද් ගෞතමය, ආචාර්ය(භාව) සහිතවූ මම කවරෙක් වෙම්ද. නිරුත්තරවූ විද්‍යාචරණසම්පද තොමෝ කවරිද, භවද් ගෞතමය, ආචාර්යසහිතවූ මම නිරුත්තරවූ මේ විද්‍යාචරණ සම්පත්තියෙන් දුරුවූවෙක් වෙමි. අම්බට්ඨය, ඒ කුමකැයි සිතන්නෙහිද, ආචාර්ය(භාව)සහිතවූ තෝ නිරුත්තරවූ මේ විද්‍යාචරණ සම්පත්තිය සම්පූර්ණ නොකරන්නේ තවුස්පිරිකරකද ගෙණ වැටුන ඵල අනුභවකරන්නෙක් වන්නෙමියි. වනයෙහි වනමැද බැසගන්නෙහිද, භවද්ගෞතමය, මෙය නොවේමය. අම්බට්ඨය, ඒ කුමකැයි සිතන්නෙහිද, ආචාර්ය(භාව)සහිතවූ තෝ නිරුත්තරවූම මේ විද්‍යාචරණ සම්පත්තිය සම්පූර්ණ නොකරන්නේ වැටුන ඵල අනුභව කිරීමද සම්පූර්ණ නොකරන්නේ උදැල්ලක් හා පැසක් ගෙණ අලමුල් ඵල අනුභවකරන්නෙක් වන්නෙමියි වනයෙහි වනමැද බැසගන්නෙහිද භවද් ගෞතමය, මේය නොවන්නේය. අම්බට්ඨය, ඒ කුමකැයි සිතන්නෙහිද, තෝ නිරුත්තරවූම මේ විද්‍යාචරණ සම්පත්තිය සම්පූර්ණ නොකරන්නේ වැටුන ඵල අනුභව කිරීමද සම්පූර්ණ නොකරන්නේ අලමුල් ඵල අනුභවකිරීමද සම්පූර්ණ නොකරන්නේ.

ගාම සාමන්තං වා නිගම සාමන්තං වා අග්‍යාගාරං කරිත්වා
අග්ගිං පරිචරන්තො අච්ඡසි සාචරියකො’ති. නොහිදං භො ගොතම.
තං කිම්මඤ්ඤසි අම්බට්ඨ. අපිනු ත්වං ඉමඤ්චෙව අනුත්තරං විජ්ජා
චරණසම්පදං අනභිසම්භුණමානො පවත්තඵල භොජනතඤ්ච
අනභිසම්භුණමානො කන්ද මූල ඵල භොජනතඤ්ච අනභිසම්භුණ
මානො අග්ගිපරිචරියඤ්ච අනභිසම්භුණමානො චාතුම්මහාපථෙ
චතුද්වාරං අගාරං කරිත්වා අච්ඡසි සාචරියකො යො ඉමාහි
චතූහි දිසාහි ආගමිස්සති සමණො වා බ්‍රාහ්මණො වා තං මයං යථා
සත්ති යථා බලං පටිපූජෙස්සාමා’ති. නොහිදං භො ගොතම.

33. ඉති ඛො අම්බට්ඨ ඉමායචෙව ත්වං අනුත්තරාය විජ්ජාචරණ
සම්පදාය පරිහීනකො, සාචරියකො යෙචි මෙ අනුත්තරාය විජ්ජා
චරණසම්පදාය චත්තාරි අපාය මුඛානි භවන්ති. තතො ච ත්වං
පරිහීනො සාචරියකො. භාසිතා ඛො පන තෙ එසා අම්බට්ඨ ආච
රියෙන බ්‍රාහ්මණෙන පොක්ඛරසාතිනා වාචා.

ආචාර්‍ය්‍ය[භාව]සහිතවූයේ ගම හාත්පස හෝ නියම්ගම හාත්පස ගිනි
ගිණිහල් ගෙයක් කොට ගිනිපුදමින් හිඳීද, භවද් ගෞතමය, මෙය
නොවේමය. අම්බෂ්ඨය, ඒ කුමකැයි සිතන්නෙහිද, යළිදු ආචාර්‍ය්‍ය[භාව]
සහිතවූ තෝ නිරුත්තරවූම මේ විද්‍යාචරණසම්පත්තිය සම්පූර්ණ
නොකරන්නේ වැටුන ඵල අනුභවකිරීමද, සම්පූර්ණ නොකරන්නේ
අලමුල් ඵල අනුභවකිරීමද, සම්පූර්ණ නොකරන්නේ ගිණිපිදීමද සම්
පූර්ණනොකරන්නේ මේ සතරදිශාවෙන් යම්බඳුවූ ශ්‍රමණයෙක් හෝ
බ්‍රාහ්මණයෙක් හෝ පැමිණෙන්නේද ඔහු අපි ශක්තිපරිද්දෙන් බල
පරිද්දෙන් පුදන්නෙමුයි සතරමංසන්ධියෙක්හි දොරටුසතරක්ඇති
ගෙයක්කොට සිටින්නෙහිද භවද් ගෞතමය මෙය නොවන්නේමය.

33. අම්බෂ්ඨය, ආචාර්‍ය්‍ය [භාව] සහිතවූ තෝ මෙසේමේ නිරුත්
තරවූම විද්‍යාචරණසම්පත්තියෙන් පිරිහුනෙක් වෙහිද, නිරුත්තරවූ
මේ විද්‍යාචරණ සම්පත්තිය සම්බන්ධවූ යම්බඳුවූ මේ විනාශකාරණයෝ
සතරක් වෙත්ද. එහෙයින් ආචාර්‍ය්‍ය[භාව]සහිතවූ තෝ එයින් පිරිහු
නෙක් වෙහිය. අම්බෂ්ඨය, තාගේආචාර්‍ය්‍යවූ පොක්ඛරසාති බ්‍රාහ්මණයා
විසින් මේ වාක්තොමෝ කියනලද්දීය.

කෙච මුණ්ඩකා සමණකා ඉබ්භා කණ්හා බන්ධුපාදාපච්චා. කාච තෙ විජ්ජානං බ්‍රාහ්මණානං සාකච්ඡාති. අත්තනා අපායිකොපි අපරිපූරමානො පස්සම්බට්ඨ යාව අපරාධඤ්ච තෙ ඉදං ආචරියස්ස බ්‍රාහ්මණස්ස පොක්ඛරසාතිස්ස.

34. බ්‍රාහ්මණො බො පන අම්බට්ඨ පොක්ඛරසාති රඤ්ඤො ප සෙනදිස්ස කොසලස්ස දත්තිකං භුඤ්ජති. තස්ස රාජා පසෙනදි කො සලො සම්මුඛීභාවම්පි න දදාති. යදාපි තෙන මන්තෙති. තිරො දුස්සං තෙන මන්තෙති. යස්ස බො පන අම්බට්ඨ ධම්මිකං පයතං භික්ඛං පටිගණ්හෙය්‍ය කථං තස්ස රාජා පසෙනදිකොසලො සම් මුඛීභාවම්පි න දදෙය්‍ය. පස්ස අම්බට්ඨ යාව අපරාධඤ්ච තෙ ඉදං ආචරියස්ස. බ්‍රාහ්මණස්ස පොක්ඛරසාතිස්ස තං කිම්මඤ්ඤසි අම්බට්ඨ. රාජා පසෙනදි කොසලො හත්ථිගීවාය වා නිසින්නො අස්සපිට්ඨෙ වා නිසින්නො රථූපත්ථරෙ වා ඨිතො.

ගෘහපතිකවූ කෘෂ්ණවූ බ්‍රහ්මයාගේ පිටිපතුලෙන් උපන්නාවූ මුඩු ශ්‍රමණයෝ කවරහුද, ත්‍රිවිද්‍යකබ්‍රාහ්මණයන්ගේ සාකච්ඡා තොමෝ කවරිද, අම්බඨ්ඨය තෙමේවඕනයනොකරන්නේතෙමේ සම් පූර්ණනොකරන්නේ තාගේ ආචාර්‍ය්‍යවූ පොක්ඛරසාති බමුණාගේ බලවත්වූ මේ අපරාධය බලව.

34. අම්බඨ්ඨය, පොක්ඛරසාති බ්‍රාහ්මණතෙම පසේනදි කොසොල් රජහුගේ [නොහොත්] පසේනදි කොසොල්රජවිසින් දෙනලද්ද අනුභවකෙරෙයි. පසේනදි කොසොල්රජතෙමේ ඔහුගේ හමුබවද නොදෙයි. යම්කලෙක්හි ඔහුසමග මන්ත්‍රණය කෙරේද, එකල්හි තිරෙහ් පිටතවූ ඔහුසමග මන්ත්‍රණය කෙරෙයි,අම්බඨ්ඨය, යමෙකුහට ගෙණවුත්දියයුතුවූ ධාර්මික භික්ෂාව පිළිගන්වන්නේද, ඔහට පසේනදි කොසොල්රජතෙමේ කෙසේ හමුබව නොදෙන්නේද. අම් බඨ්ඨය,තාගේ ආචාර්‍ය්‍යවූ පොක්ඛරසාති බ්‍රාහ්මණයාගේ මේ අපරාධයද බලව. අම්බඨ්ඨය, ඒ කුමකැයි සිතන්නෙහිද, පසේනදි කොසොල්රජ තෙමේ හස්ති ග්‍රීවයෙහි හෝ උන්නේ වේද, අස්පිටෙහි හෝ උන්නේ වේද, රථයෙහි රජහට යානාපිණිස සැරසූ පෙදෙසෙහි හෝ සිටියේ වේද.

උග්ගෙහි වා රාජඤ්ඤෙහි වා කිඤ්චිදෙව මන්තණං මන්තෙය්‍ය. සො තම්හා පදෙසා අපක්කම්ම එකමන්තං තිට්ඨෙය්‍ය.

35. අථ ආගච්ඡෙය්‍ය. සුද්දෙවා සුද්දදාසො වා සො තස්මිං පදෙසෙ ඨිතො තදෙව මන්තණං මන්තෙය්‍ය. එවම්පි රාජා පසෙනදි කොසලො අභාසි. අපිනු සොරාජ භණිතං වා භණති, රාජ මන්තං වා මන්තෙති. එත්තාවතා සො අස්ස රාජා වා රාජමත්තොවාති. නොහිදං භො ගොතම.

36. එවමෙව බො ත්වං අම්බට්ඨ යෙ තෙ අහෙසුං බ්‍රාහ්මණානං පුබ්බකා ඉසයො මන්තානං කත්තාරො මන්තානං පවත්තාරො යෙසමිදං. එතරහි බ්‍රාහ්මණා පොරාණං මන්ත පදං ගීතං පවුත්තං සමිහිතං තදනුගායන්ති තදනුභාසන්ති භාසිතමනු භාසන්ති වාචිතමනු වාචෙන්ති සෙය්‍යථිදං, අට්ටකො, වාමකො, වාමදෙවො වෙස්සාමිත්තො යමතග්ගි අඞ්ගීරසො භාරද්වාජො වාසෙට්ඨො.

ප්‍රධාන ආචාර්‍යයින් සමගහෝ අනභිෂික්ත රජදරුවන් සමග හෝ කිසියම් මනත්‍රණයක් මන්ත්‍රණයකෙරේද හෙතෙම ඒ ප්‍රදෙශයෙන් ඉවත්ව එක්පාර්ශවයෙක්හි සිටී.

35. එකල්හි ශුද්‍රයෙක් හෝ ශුද්‍රදාසයෙක් හෝ එන්නේද, හෙතෙම ඒ ප්‍රදෙශයෙහි සිටියේ ඒ මන්ත්‍රණයම මන්ත්‍රණය කරන්නේය. මෙසේද පසෙනදි කොසොල්රජතෙම කීයේය. වැලිදු ඒ රජතෙමේ කියනලද්ද හෝ කියයිද. රාජමන්ත්‍රණය හෝ මන්ත්‍රණය කෙරෙයිද. එපමණෙකින් මොහු රජ හෝ රාජමාත්‍යයෙක් හෝ වන්නේදැයි [පිළිවිසී] භවද් ගෞතමය, නොවේමය.

36. අම්බඨය, තෝ එපරිද්දෙන්ම පූර්‍වයෙහි මන්ත්‍රණයකළාවූ, මන්ත්‍ර පැවැත්තුවාවූ, බ්‍රාහ්මණයන්ගේ යම් ඍෂිකෙනෙක් වූවාහුද, දැන් බ්‍රාහ්මණයෝ යමකට අනුව කියද්දයම්කෙනෙකුන් සන්තකවූ පැරණිවූ මේ වේද මන්ත්‍රපදය ගායනාකරණලද්දය සජ්ඣායනා කරණලද්දඃ පිඩුකරණ ලද්දය යන ඊට අනුව ගායනාකරන්නාහු ඒ අනුව සජ්ඣායනා කරන්නාහු කියනලද්දට අනුවකියන්නාහු කියනලද්දට අනුවකීඃද්ද, ඔවුහු කවරහුදයත්, අට්ටකය, වාමකය, වාමදෙවය, වෙස්සාමිත්තය, යමතග්ගිය, අඞ්ගීරසය, භාරවාජය, වාසෙඨය,

කස්සපො භගුත්‍යාහං මන්තෙ අධියාමි සාචරියකොති. තාවතා ත්වං භවිස්සසි ඉසිවා ඉසිත්තාය වා පටිප්පන්නොති, නෙතං ඨානං විජ්ජති.

37. තං කිම්මඤ්ඤසි. අම්බට්ඨ කින්ති තෙ සුතං බ්‍රාහ්මණානං වුඩ්ඪානං මහල්ලකානං ආචරිය පාචරියානං භාසමානානං යෙතෙ අහෙසුං බ්‍රාහ්මණානං පුබ්බකා ඉසයො මන්තානං කත්තාරො මන්තානං පවත්තාරො. යෙ සම්දා එතරහි බ්‍රාහ්මණා පොරාණං මන්තපදං ගීතං පවුත්තං සමිහිතං තදනුගායන්ති තදනුභාසන්ති භාසිතමනු භාසන්ති වාචිතමනුවාචෙන්ති. සෙය්‍යථීදං. අට්ටකො වාමකො, වාමදෙවො වෙස්සාමිත්තො යමතග්ගි අඞ්ගිරසො භාරද්වාජො වාසෙට්ඨො කස්සපො භගු. එවංසු තෙ සුනාතා සුවිලිත්තා කප්පිතකෙසමස්සු ආමුත්තමණිකුණ්ඩලා භරණා ඔදාතවත්ථවසනා පඤ්චහි කාමගුණෙහි සමප්පිතා සමඞ්ගීභූතා පරිචාරෙන්ති සෙය්‍ය ථාපි ත්වං එතරහි සාචරියකොති. නොහිදංභො ගොතම.–පෙ=

කස්සපය,භගුය, යන මොව්හු වෙත්.ආචාය්‍ය්‍ය භාවසහිතවූ තෝ මන්ත්‍ර හදාරම්යි යන පමණෙකින්ම සෘෂියෙක් හෝ සෘෂි බවට පිළිපන් නෙක් හෝවන්නෙහිද, මේ කාරණය විද්‍යමාන නොවේ.

37. අම්බෂ්ඨය, ඒ කුමකැයි සිතන්නෙහිද, වෘඬවූ මහළුවූ ආචාය්‍ය්‍ය ප්‍රාචාය්‍ය්‍යවූ බමුණන්විසින් කියනුලබන්නාවූ කෙබඳු වචනයක් තාවිසින් කෙසේඅසනලදද, පූර්‍වයෙහි මන්ත්‍රකළාවූ මන්ත්‍රපැවැත්තුවාවූ බ්‍රාහ්මණයන්ගේ යම් ඒ සෘෂිහු වූවාහුද, දැන් බ්‍රාහ්මණයෝ පැරණිවූ මේ වේදසඞ්ඛ්‍යාත මන්ත්‍රපදය ගායනා කරණලද්දය සඞ්ඛායනාකරණලද්දය පිඬුකරණලද්දය යන ඒ අනුව ගායනාකරන්නාහු ඒ අනුව සඞ්ඛායනාකරන්නාහු කියනලද්ද අනුව කියන්නාහු අනුන්ට කියවනලද්ද අනුවකියවන්නාහු වෙද්ද, ඔවුහු කවරහුද, අට්ටකය, වාමකය, වාමදෙවය, වෙස්සාමිත්තය, යමතග්ගිය, අඞ්ගීරසය, භාරවාජය, වාසෙඨය, කස්සපය, භගුය, යන මොව්හු වෙත්. දැන් තෝ ආචාය්‍ය්‍යවූයේ යම්සේද, එසේ යපහත්ව ස්නානයකරණලද්දුවූ, යහපත්ව සඳුන් ගල්වනලද්දුවූ, පිළිසෙළකරණලද කෙස් දැළිරැවුලු ඇත්තාවූ අමුතනලද මිණිකොඩොල් අබරණ පළඳනාලද්දුවූ, සුදුවස්ත්‍ර හඳනාලද්දුවූ ඔව්හු පස්කම්ගුණයෙන් පමුණුවනලද්දහු, එයින්ම යුක්තවූවාහු, ඉන්‍ද්‍රියයන් හසුරුවාලද්ද භවද් ගෞතමය, මෙය නොවේමය.

38. එවංසු තෙ සාලීනං ඔදනං සුචිමංසූපසෙචනං විචිත කාලකං අනෙක සූපං අනෙකබ්‍යඤ්ජනං පරිභුඤ්ජන්ති. සෙය්‍යථාපි ත්වං එතරහි සාචරියකොති. නොහිදං භො ගොතම. එවංසුතෙ වෙඨකනත පස්සාහි නාරීහි පරිචාරෙන්ති. සෙය්‍යථාපි ත්වං එතරහි සාචරියකොති. නොහිදං භොගොතම. එවංසු තෙ කුත්තවාලෙහි වළවාරථෙහි දීඝාහි පතොදලට්ඨීහි වාහනෙපිතුදෙන්තා විපරියායන්ති. සෙය්‍යථාපි ත්වං එතරහි සාචරියකොති. නොහිදං භො ගොතම. එවං සුතෙ උක්කිණ්ණපරිඛාසු ඔක්ඛිත්තපළිඝාසු නගරූපකාරිකාසු දීඝාහි දාවුධෙහි පුරිසෙහි රක්ඛාපෙන්ති. සෙය්‍යථාපි ත්වං එතරහි සාචරියකොති. නොහිදං භො ගොතම. ඉති ඛො අම්බට්ඨ නෙව ත්වං ඉසි. න ඉසිත්තාය පටිප්පනෙනා සාචරියකො. යස්ස ඛො පන අම්බට්ඨ මයි කඞ්ඛා වා විමති වා සොමං පඤ්හෙන අහං වෙය්‍යාකරණෙන සොහෙස්සාමිති.

39. අථ ඛො භගවා විහාරා නික්ඛම්ම චඞ්කමං අබ්භුට්ඨාසි අම්බට්ඨොපි මාණවො විහාරා නික්ඛම්ම චඞ්කමං අබ්භුට්ඨාසි.

---

38. මෙසේ ඇතිකල්හි ඔව්හු පිරිසිදුවූ මාංස (රස) යෙන් යුක්තවූ පහවූ කාලවර්ණයඇති නොයෙක් සූපයෙන්හා නොයෙක් ව්‍යඤ්ජනයෙන් යුක්තවූ ඇල්සහලේබත් ආචාය්‍ය්‍යීභාවසහිතවූ තෝමෙන් අනුභවකෙරෙත්ද. භවද්ගෞතමයන්වහන්ස, මෙය නොවේමය. මේසේ ඇතිකල්හි ඔව්හු වස්ත්‍ර පට්ටාදියෙන් වෙළනලද්දවූ ස්ත්‍රීන් කරණකොටගෙණ දූන් ආචාය්‍ය්‍යී සහිතවූ තෝමෙන් ඉන්ද්‍රියයන් හසුරුවද්ද, භවද්ගෞතමයන්වහන්ස, මෙය නොවේමය. මෙසේ ඇතිකල්හි ඔව්හු ආචාය්‍ය්‍යී සහිතවූ තෝමෙන් පිළිසෙළ කොට කපනලද වාලධියඇති වෙළඹුන් යෙදූරථවලින් දික්වූ කැවිටිවලින් වාහනවූ අසුන්ට අනිමින් ඔබිමොබ හැසිරෙද්ද, භවද්ගෞතමය මෙය නොවේමය. මෙසේ ඇතිකල්හි ඔව්හු දූන්ආචාය්‍ය්‍යී (භාව) සහිතවූ තෝමෙන් සාරණලද අගල්ඇති තබනලද කණයම් ඇති හාත්පසකරණලද පව්රුඇති නගරයන්හි දික්වූ කඩුගත්ඇති පුරුෂයන්ලවා ආරක්‍ෂාකරවද්ද, භවද්ගෞතමය නොවේමය. අම්බඨය මෙසේවූකලි තෝ ඍෂියෙක් නොවූයෙහිය ඍෂිබවලැබීම පිණිස පිළිපන්නවූ ආචාය්‍ය්‍යී භාවසහිත යෙක්ද නොවූයෙහිය- අම්බඨය මාකෙරෙහි යමෙක්හටවූකලි සැකයක් හෝ දුම්තියක් හො වේද, හෙතෙමේ ප්‍රශ්න කිරීමකරණකොටගෙණ මම විසඳීමෙන් ඔහු හොබවන්නෙමියි.

39. ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ විහාරයෙන් නික්ම සක්මන් මලුවට නැගිසේක. අම්බඨමාණවකතෙමේද විහාරයෙන්නික්ම සක්මණට නැංගේය.

අථ ඛො අම්බට්ඨො මාණවො භගවන්තං චඞ්කමන්තං අනුචඞ්කමානො භගවතො කායෙ ද්වත්තිංස මහාපුරිස ලක්ඛණානි සමන්නෙසි. අද්දස ඛො අම්බට්ඨො මාණවො භගවතො කායෙ ද්වත්තිංස මහාපුරිස ලක්ඛණානි යෙභුය්‍යෙන ඨපෙත්වා ද්වෙ. ද්වීසුමහාපුරිස ලක්ඛණෙසු කඞ්ඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති කොසොහිතෙ ච වත්ථගුය්හෙ පහූත ජිව්හතාය ච.

40. අථ ඛො භගවතො එතදහොසි. පස්සති ඛො මෙ අයං අම්බට්ඨො මාණවො ද්වත්තිංස මහා පුරිස ලක්ඛණානි යෙභුය්‍යෙන ඨපෙත්වා ද්වෙ. ද්වීසු මහාපුරිස ලක්ඛණෙසු කඞ්ඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති කොසොහිතෙ ච වත්ථ ගුය්හෙ පහූත ජිව්හතාය චාති. අථ ඛො භගවා තථාරූපං ඉද්ධාභිසඞ්ඛාරං අභිසඞ්ඛාසි. යථා අද්දස අම්බට්ඨො මාණවො භගවතො කොසොහිතං වත්ථ ගුය්හං. අථ ඛො භගවා ජිව්හං නින්නාමෙත්වා උභොපි කණ්ණසොතානි අනුමසි පටිමසි.

එකල්හි අම්බෂ්ඨනම් මාණවකතෙමේ සක්මන්කරන්නාවූ භාග්‍යවතුන්වහන්සේට අනුව සක්මන්කරන්නේ භාග්‍යවතුන්වහන්සේගේ ශරීරයෙහි දෙතිස්මහා පුරුෂලක්‍ෂණයන් බැලූයේය. අම්බෂ්ඨනම් මාණවකතෙම බොහෝසෙයින් භාග්‍යවතුන්වහන්සේගේ ශරීරයෙහි ලක්‍ෂණද්වයක් හැර දෙතිස්මහාපුරුෂලක්‍ෂණයන් දුටුයේමය. කොශොහිත වස්ත්‍රගුය්හයද පහූතජිව්හතායද යන මහාපුරුෂ ලක්‍ෂණද්වය කෙරෙහි සැකකෙරෙයි. විචිකිත්සා කෙරෙයි. නිශ්චයට නොයෙයි. නොපහදියි.

40. ඉක්බිති භාග්‍යවතුන්වහන්සේට මෙසේ සිතෙක් පහළවී, මේ අම්බෂ්ඨනම් මාණවකතෙමබොහෝසෙයින් ලක්‍ෂණද්වයක් හැර මාගේ දෙතිස්මහපුරුෂලක්‍ෂණයන් දකියි. කොශොහිතවස්ත්‍රගුය්හයද පහූතජිව්හතායද යන මහාපුරුෂලක්‍ෂණද්වය කෙරෙහි සැකකෙරෙයි. විචිකිත්සා කෙරෙයි. නිශ්චයට නොයෙයි. නොපහදියි. ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ එබඳුවූ ඍද්ධ්‍යාභිසංස්කාරයක් නිර්මිතකළසේක. අම්බෂ්ඨනම් මාණවකතෙම යම්සේ භාග්‍යවතුන්වහන්සේගේ කොශොහිතවස්ත්‍රගුය්හනම් ලක්‍ෂණය දුටුයේද, එසේයි. එකල්හි භාග්‍යවතුන්වහන්සේ දිව පිටතට නමා දෙකන්සිදුරු පිරිමැදිසේක. හාත්පස පිරිමැදිසේක.

උභොපි නාසිකසොතානි අනුමසි කෙවලම්පි නලාටමණ්ඩලං ජිව්හාය ඡාදෙසි. අථ ඛො අම්බට්ඨස්ස මාණවස්ස එතදහොසි. සමන්නාගතො ඛො සමණො ගොතමො ද්වත්තිංස මහාපුරිසලක්ඛණෙහි පරිපුණ්ණෙහි නො අපරිපුණ්ණෙහීති. භගවන්තං එතදවොච හන්දචදානි මයං භො ගොතම ගච්ඡාම බහුකිච්චා මයං බහුකරණීයාති. යස්සදානි ත්වං අම්බට්ඨ කාලං මඤ්ඤසීති. අථ ඛො අම්බට්ඨො මාණවො වළවාරථමාරුය්හ පක්කාමි.

41. තෙන ඛො පන සමයෙන බ්‍රාහ්මණො පොක්ඛරසාති උක්කට්ඨාය නික්ඛමිත්වා මහතා බ්‍රාහ්මණගණෙන සද්ධිං සකෙ ආරාමෙ නිසින්නො හොති· අම්බට්ඨංයෙව මාණවං පටිමානෙන්තො. අථඛො අම්බට්ඨො මාණවො යෙන සකො ආරාමො තෙන පායාසි. යාවතිකා යානස්ස භූමි යානෙන ගන්ත්වා යානා පච්චොරොහිත්වා පත්තිකොව යෙන බ්‍රාහ්මණො පොක්ඛරසාති. තෙනුපසංකමි. උපසංකමිත්වා බ්‍රාහ්මණං පොක්ඛරසාතිං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො අම්බට්ඨං මාණවං බ්‍රාහ්මණො පොක්ඛරසාති එතදවොච.

නාසිකා සිදුරුදෙකද පිරිමැදිසේක. හාත්පසපිරිමැදිසේක. හුදෙක් නලල්මඬල දිවෙනවැසූසේක. ඉක්බිති අම්බට්ඨ මාණවකයාහට මහණ ගොයුම්ගොතුන්වහන්සේ සියල්ලෙන් සම්පූර්ණවූ දෙතිස්මහාපුරිස් ලකුණෙන් යුක්තසේක. අසම්පූර්ණ ලක්ෂණයන්ගෙන් යුක්තනොවනසේකැයි මේඅදහස ඇතිවිය. ඉක්බිති භවද්ගෞතමයන්වහන්ස අපි බොහො කටයුතු ඇත්තම්හ. අවශ්‍යයෙන් අපි බොහෝ කටයුතු දෑ ඇත්තම්හ. එහෙයින් දැන් අපියම්හයි භාග්‍යවතුන්වහන්සේට මෙපවත් සැළකළේය. අම්බට්ඨය තෝ දැන් යම්ගමනක් සම්බන්ධව කල්යයි හඟනෙහිනම් එය එසේකරව හෙවත් රුචිපරිද්දෙන්යවයි වදාළෝ. ඉක්බිති අම්බට්ඨමාණවකතෙමේ වෙළඹුන් යෙදූරියකට නැගී බැහැරගියේය.

41. ඒකාලයෙහිදී පොක්ඛරසාති බ්‍රාහ්මණතෙමේ උක්කට්ඨානුවරින්නික්ම බොහෝ බ්‍රාහ්මණ සමූහයාසමග සියඅරමෙහි අම්බට්ඨමාණවකයාගේ ඊමබලාපොරොත්තුවෙමින් උන්නේවේ. එකල්හි අම්බට්ඨ මාණවකතෙමේ සියඅරම යම්තැනෙක්හිද එතනට එළඹියේය. යානාවෙන්යායුතු භූමිය යම්පමණද එපමණතැන් යානාවෙන්ගොස් යානාවෙන් බැසපයින්ම ගොස් පොක්ඛරසාති බ්‍රාහ්මණතෙම යම් තැනෙක්හිද එතනට එළඹියේය. එළඹ පොක්ඛරසාති බ්‍රාහ්මණයාට වැඳ එකත්පසෙක උන්නේය. එකත්පසෙකඋන්නාවූ අම්බට්ඨමාණවකයා පොක්ඛරසාති බ්‍රාහ්මණතෙමේ මෙපවත් විචාළේය.

42. කච්චි තාත අම්බඨ අද්දස තං භගවන්තං ගොතමන්ති. අද්ද සාම බො මයං භො තං භගවන්තං ගොතමන්ති. කච්චි තාත අම්බඨ තං භගවන්තං ගොතමං තථා සන්තංයෙව සද්දො අබ්භුග්ගතො නො අඤ්ඤථා. කච්චි පන සො භවං ගොතමො තාදිසො. නො අඤ්ඤාදිසොති. තථා සන්තංයෙව භොතං භගවන්තං ගොතමං සද්දො අබ්භුග්ගතො. නො අඤ්ඤථා. තාදිසොව සො භවං ගොතමො නො අඤ්ඤාදිසො. සමන්නාගතොච සො භවං ගොතමො ධත්තිංස මහා පුරිස ලක්ඛණෙහි පරිපුණ්ණෙහි නො අපරිපුණ්ණෙහිති. අහුපන තෙ තාත අම්බඨ සමණෙන ගොතමෙන සද්ධිං කොචිදෙව කථා සල්ලා පොති. අහු බො මෙ භො සමණෙන ගොතමෙන සද්ධිං කොචිදෙව කථා සල්ලාපොති. යථා කථං පන තෙ තාත අම්බඨ අහු සමණෙන ගොතමෙන සද්ධිං කොචිදෙව කථා සල්ලාපොති. අථ බො අම්බඨො මාණවො යාවතකො අහොසි භගවතා සද්ධිං කථා සල්ලාපො තං සබ්බං බ්‍රාහ්මණස්ස පොක්ඛරසාතිස්ස ආරොචෙසි.

43, එවං වුත්තෙ බ්‍රාහ්මණො පොක්ඛරසාති අම්බඨං මාණවං එතදවොච අහො වතරෙ අම්හාකං පණ්ඩිතක. අහො වතරෙ අම්හාකං බහුස්සුතක.

42. පුත අම්බඨය, කිමෙක්ද, ඒ භාග්‍යවත් ගෞතමයා දුටුයෙහිද, පින්වත,අපි ඒ භාග්‍යවත් ගෞතමයන්වහන්සේ දුටුවෙමු.පුත අම්බඨය,ඒභාග්‍යවත්ගෞතමයාගේ එසේවිද්‍යමානවූම කීර්තිශබ්දයක් පැනනැංගේද නොහොත්අන්පරිද්දකින්ද.කිමෙක්ඒභවත් ගෞතමතෙම එබන්දෙක්ද නොහොත් එබන්දෙක් නොවේද, පින්වත,ඒභාග්‍යවත් ගෞතමයාගේ එසේ විද්‍යමානවූම කීර්තිශබ්දය පැනනැංගේ. නොහොත්අන්පරිද්දකින් නොවේ. ඒ භවද්ගෞතමතෙම එබන්දෙක්මය.අන්පරිදි කෙනෙක් නොවේමය. පින්වත, ඒ භවත්ගෞතම තෙමේ සියල්ලෙන් සම්පූර්ණවූ දෙතිස්මහාපුරුෂලක්‍ෂණයෙන් යුක්ත සේක. අසම්පූර්ණලක්‍ෂණයන්ගෙන්යුක්තනොවනසේක. පුත අම්බඨය, ශ්‍රමණගෞතමයා සමග තාගේකිසියම් කථාසල්ලාපයක්වූයේද, පුත අම්බඨය, තාවිසින් ශ්‍රමණ ගෞතමයා සමග කරණලද ඒ කථාසල්ලාපය කෙබඳුද. ඉක්බිති අම්බඨනම් මාණවකතෙම භාග්‍ය වතුන්වහන්සේ සමග යම්පමණ කථාසල්ලාපයක්වූයේද ඒ සියල්ල පොක්ඛරසාති බ්‍රාහ්මණයාහට සැලකෙළේය.

43. මෙසේ කීකල්හි පොක්ඛරසාතිනම් බ්‍රාහ්මණතෙම අම්බඨ මාණවකයාහට මෙසේ කියේය. කොල පණ්ඩිතය අපට ඉතා නින්දාවෙක. කොල බහුශ්‍රැතය අපට ඉතා නින්දාවෙක.

අහො වතරෙ අම්භාකං තෙවිජ්ජක. එවරූපෙන කිර භො පුරිසො අත්ථචරකෙන කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍ය. යදෙව ඛො ත්වං අම්බට්ඨ තං භවන්තං ගොතමං එවං ආසජ්ජ ආසජ්ජ අවච සි. අථ ඛො භවං ගොතමො අම්හෙපි එවං උපනෙය්‍ය උපනෙය්‍ය අවච. අහො වතරෙ අම්භාකං පණ්ඩිතක. අහො වතරෙ අම්භාකං බහුස්සුතක. අහො වතරෙ අම්භාකං තෙවිජ්ජක එවරූපෙන කිරභො පුරිසො අත්ථචරකෙනකායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍යාති කුපිතො අනත්තමනො අම්බට්ඨං මාණවං පදසායෙව පවත්තෙසි. ඉච්ඡි තිච තාවදෙව භගවන්තං දස්සනාය උපසඞ්කමිතුං.

44. අථ ඛො තෙ බ්‍රාහවණා බ්‍රාහ්මණා පොක්ඛරසාතිං එතද වොචුං. අතිවිකාලො ඛො භො අජ්ජ සමණං ගොතමං දස්සනාය උපසඞ්කමිතුං. දනිසෙව භවං පොක්ඛරසාති සමණං ගොතමං දස්සනාය උපසඞ්කමිස්සතීති.

කොලත්‍රිවිද්‍යකයඅපට ඉතානින්දවෙක. නොහොත්පුදුමයෙක. පින්වතමෙබඳුවූකටයුත්තෙහිහැසිරිමෙන්පුරුෂතෙමකාබුන්මරණින්මතු අපායනම්වූනපුරුගති ඇත්තාවූ විවසවපතිතවන්නාවූනරකයෙහිඋපදින්නේය. අම්බඨය,යම්හෙයකින් තෝඒභාග්‍යවත්ගෞතමයන්වහන්සේමෙසේ ගටගටා කියෙහිද එසේඇතිකල්හිඒභාග්‍යවත් ගෞතම තෙමේඅපටද මෙසේ පමුණුවමින් වදලේය. කොල පණ්ඩිතය අපට ඉතා නින්දවෙක. කොල බහුශ්‍රැතය අපට ඉතා නින්දවෙක.කොල ත්‍රිවිද්‍යකය අපට ඉතානින්දවෙක. පින්වත මෙබඳුවූ කටයුත්තෙහි හැසිරීමකරකොටගෙණ පුරුෂතෙම ශරීරයාගේබිඳීමෙන් මරණින් මතු අපායනම්වූ නපුරුගති ඇත්තාවූ විවශව පතිතවන්නාවූ නරකයෙහි උපදින්නේයයි හෙතෙම කිපියේ නොසතුටුසිත් ඇත්තේ අම්බඨ මාණවකයාහට පයින්ගසා භුමියෙහිහෙලුයේය. නොහොත් රියගමන් හැරපයින්ගමන්විධානකලේය. එකෙණෙහිම භාග්‍යවතුන්වහන්සේ දැකීමපිණිස එළඹෙන්ට කැමැත්තේද විය.

44. එකල්හි බමුණෝ පොක්ඛරසාතී බ්‍රාහ්මණයාහට මෙපවත් කීහු. පින්වත, අද ශ්‍රමණ ගෞතමයානන් දැකීමපිණිස එළඹෙන්නට කාලය නොවේ.පින්වත් පොක්ඛරසාතී බ්‍රාහ්මණය,දැන් හෙටම ශ්‍රමණ ගෞතමයානන් දැකීමපිණිස එළඹෙන්නේය.

එවං බො බ්‍රාහ්මණො පොක්ඛරසාති සකෙ නිවෙසනෙ පණීතං ඛාදනියං භොජනියං පටියාදෙත්වා යානෙසු ආරොපෙත්වා උක්කාසු ධාරියමානාසු උක්කට්ඨාය නීයාසි යෙන ඉච්ඡානඞ්ගලවනසණ්ඩො තෙන පායාසි. යාවතිකා යානස්ස භූමි යානෙන ගන්ත්වා යානා පච්චොරොහිත්වා පත්තිකොව යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරානියං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො බො බ්‍රාහ්මණො පොක්ඛරසාතී භගවන්තං එතදවොච.

45. ආගමා නුඛො'ධ භො ගොතම අම්හාකං අන්තෙවාසී අම්බට්ඨො මාණවොති. ආගමා බො තෙ බ්‍රාහ්මණ අන්තෙවාසී අම්බට්ඨො මාණවොති. අහු පන තෙ භො ගොතම අම්බට්ඨෙන මාණවෙන සද්ධිං කොචි දෙව කථා සල්ලාපොති. අහු බො මෙ බ්‍රාහ්මණ අම්බට්ඨෙන මාණවෙන සද්ධිං කොචිදෙව කථා සල්ලාපොති. යථා කථං පන තෙ භො ගොතම. අහු අම්බට්ඨෙන මාණවෙන සද්ධිං කොචිදෙව කථා සල්ලාපොති.

මෙසේ පොක්ඛරසාති බ්‍රාහ්මණතෙම සියනිවෙසෙහි ප්‍රණීතවූ ඛාද්‍යභොජ්‍යාදිය පිළියෙළ කරවා යානාවන්හි නන්වා පන්දන්එලිය දරණ්නලබනකල්හි උක්කට්ඨානම් නුවරින්පිටත්විය. ඉච්ඡානඞ්ගලනම් වනලැහැබ යම්තැනෙක්හිද එතනට ගියේය. යානාවෙන්යායුතු භූමිය යම්පමණතැන්ද එපමණතැන් යානාවෙන් ගොස් යානාවෙන් බැස පයින්ම භාග්‍යවතුන්වහන්සේ යම්තැනෙක්හිද එතැනට එළඹියේය. එළඹ භාග්‍යවතුන්වහන්සේ සමග සතුටුවූයේය. සතුටුවියයුතුවූ සිහිකටයුතුවූ කථාව කොට නිමවා එකත්පසෙක උන්නේය. එකත්පසෙක උන්නාවූ පොක්ඛරසාතී බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේට මෙපවත් සැලකෙළේය.

45. භවද්ගෞතමයන්වහන්ස, අපගේඅතවැසිවූ අම්බඪමාණවක තෙම මෙහි ආයේද? බමුණ තාගේ අතවැසිවූ අම්බඪමාණවකතෙම ආයේය. භවද්ගෞතමයන්වහන්ස, අම්බට්ඨමාණවකයා සමගනුඹ වහන්සේගේ කිසියම් කථාසල්ලාපයක් වූයේද බමුණ අම්බට්ඨමාණවකයා සමග මාගේකිසියම් කථාසල්ලාපයක්වූයේමය. භවද් ගෞතමයන්වහන්ස, අම්බට්ඨමාණවකයා සමග නුඹවහන්සේගේ කිසියම් කථාසල්ලාපයක් කෙසේවූයේද. එය කෙබඳුදැයි කියාසි.

අථ ඛො භගවා යාවතිකො අහොසි අම්බට්ඨෙන මාණවෙන සද්ධිං කථාසල්ලාපො තං සබ්බං බ්‍රාහ්මණස්ස පොක්ඛරසාතිස්ස ආරොචෙසි. එවං වුත්තෙ බ්‍රාහ්මණො පොක්ඛරසාති භගවන්තං එතදවොච. බාලො භො ගොතම අම්බට්ඨො මාණවො. ඛමතං භවං ගොතමො අම්බට්ඨස්ස මාණවස්සාති. සුඛී හොතු බ්‍රාහ්මණ අම්බට්ඨො මාණවොති.

46. අථ ඛො බ්‍රාහ්මණො පොක්ඛරසාති භගවතො කායෙ ද්වත්තිංස මහාපුරිස ලක්ඛණානි සමන්නෙසි. අද්දසා ඛො බ්‍රාහ්මණො පොක්ඛරසාති භගවතො කායෙ ද්වත්තිංස මහාපුරිස ලක්ඛණානි යෙභුය්‍යෙන ඨපෙත්වා ද්වෙ. ද්වීසු මහාපුරිස ලක්ඛණෙසු කඞ්ඛති විචිකිච්ඡති. නාධිමුච්චති න සම්පසීදති කොසොහිතෙ ච වත්ථගුය්හෙ පහූතජිව්හතාය ච.

47. අථ ඛො භගවතො එතදහොසි පස්සති ඛො මෙ අයං බ්‍රාහ්මණො පොක්ඛරසාති ද්වත්තිංස මහාපුරිස ලක්ඛණානි යෙභුය්‍යෙන ඨපෙත්වා ද්වෙ. ද්වීසු මහාපුරිසලක්ඛණෙසු කඞ්ඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති කොසොහිතෙ ච වත්ථගුය්හෙ පහූතජිව්හතාය චාති.

ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ අම්බට්ඨ මාණවකයා සමග යම් පමණ කථා සල්ලාපයක් වූයේද, ඒ සියල්ල පොක්ඛරසාති බ්‍රාහ්මණයාහට වදාළසේක. මෙසේ වදාළකල්හි පොක්ඛරසාති බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන්වහන්සේට මෙසේ සැලකෙළේය, භවද්ගෞතමයන්වහන්ස, අම්බට්ඨ මාණවකතෙම බාලය. භවද්ගෞතමතෙමේ අම්බට්ඨ මාණවකයාහට ඉවසනසේක්වා. බමුණ අම්බට්ඨ මාණවකතෙම සුවපත් වේවායි වදාළෝ.

46. ඉක්බිති පොක්ඛරසාති බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන්වහන්සේගේ ශරීරයෙහි දෙතිස් මහා පුරුෂලක්‍ෂණයන් බැලූයේය. පොක්ඛරසාති බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන්වහන්සේගේ ශරීරයෙහි ලක්‍ෂණ දෙකක් හැර දෙතිස්මහා පුරුෂලක්‍ෂණයන් දුටුයේය. බොහෝ සෙයින් කොශොහිත වස්ත්‍රගුය්හයෙහිද පහුතජිව්හතායෙහිදයන මහාපුරුෂලක්‍ෂණ දෙකෙහි සැකකෙරෙයි විචිකිත්සා කෙරෙයි. නිශ්චයට නොයෙයි නොපැහැදෙයි.

47. ඉක්බිති, භාග්‍යවතුන්වහන්සේට මේ සිත පහළවූයේය. මේ පොක්ඛරසාති බ්‍රාහ්මණතෙම මාගේ දෙතිස්මහාපුරුෂ ලක්‍ෂණයන් බොහෝ සෙයින් ලක්‍ෂණ දෙකක් හැර බලයි. කොශොහිත වස්ත්‍රගුය්හලක්‍ෂණයෙහිද පහූතජිව්හතායෙහිදයන පුරුෂලක්‍ෂණ දෙකෙරෙහි සැකකෙරෙයි. විචිකිත්සා කෙරෙයි. නිශ්චයට නොයෙයි. නොපහදියි.

අථ ඛො භගවා තථාරූපං ඉද්ධාභිසඞ්ඛාරං අභිසඞ්ඛාසි. යථා අද්දස බ්‍රාහ්මණො පොක්ඛරසාති භගවතො කොසොහිතං වත්ථගුය්හං. අථ ඛො භගවා ජිව්හං නින්නාමෙත්වා උභොපි කණ්ණසොතානි අනුමසි පටිමසි උභොපි නාසික සොතානි අනුමසි පටිමසි කෙවලම්පි නලාට මණ්ඩලං ජිව්හාය ඡාදෙසි. අථ ඛො බ්‍රාහ්මණස්ස පොක්ඛරසාතිස්ස එතදහොසි. සමන්නාගතො ඛො සමණො ගොතමො ද්වත්තිංස මහා පුරිස ලක්ඛණෙහි පරිපුණ්ණෙහි. නො අපරිපුණ්ණෙහීති භගවන්තං එතදවොච. අධිවාසෙතු මෙ භවං ගොතමො, අජ්ජතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනාති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන.

48. අථ ඛො බ්‍රාහ්මණො පොක්ඛරසාති භගවතො අධිවාසනං විදිත්වා භගවතො කාලං ආරොචෙසි කාලො භො ගොතම නිට්ඨිත භත්තන්ති. අථ ඛො භගවා පුබ්බණ්හ සමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය සද්ධිං භික්ඛුසඞ්ඝෙන යෙන බ්‍රාහ්මණස්ස පොක්ඛරසාතිස්ස පරිවෙසනා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි,

---

ඉක්බිතිභාග්‍යවතුන්වහන්සේඍද්ධිමයරූපයක් නිර්මාණයකළසේක. යම්සේපොක්ඛරසාති බ්‍රාහ්මණතෙම් භාග්‍යවතුන්වහන්සේගේ කොෂොහිතවත්ථගුය්හලක්ෂණය යම්සේ දකිදළුසේයි,එකල්හිභාග්‍යවතුන් වහන්සේදිවපිටතටනමා දෙකන්සිදුරු පිරිමැදිසේක. හාත්පසපිරිමැදිසේක. නාසිකා සිදුරුදෙක පිරිමැදිසේක. හාත්පස පිරිමැදිසේක. සියලුලලාට මණ්ඩලය දිවින් වැසූසේක. එකල්හි පොක්ඛරසාති බ්‍රාහ්මණයාහට මෙබඳුසිතක් වූයේය. පින්වත්නි,ශ්‍රමණභවද් ගෞතමතෙම සියල්ලෙන් සම්පූර්ණවූදෙතිස්මහාපුරුෂලක්ෂණයෙන් යුක්තසේක. අසම්පූර්ණලක්ෂණයන්ගෙන්යුක්තනොවනසේකයනුයි. ඉක්බිති භාග්‍යවතුන්වහන්සේට මෙපවන් සැලකළේය. භවද්ගෞතමතෙම, අදට මාගේ බත භික්ෂුසඞ්ඝයා සමග ඉවසාවදාරණසේක්වායි. භාග්‍යවතුන්වහන්සේ නිශ්ශබ්ද භාවයෙන් ඉවසාවදාළසේක.

48. ඉක්බිති පොක්ඛරසාති බ්‍රාහමණතෙම භාග්‍යවතුන්වහන්සේ ඉවසාවදාළබව දැන භවද්ගෞතමය. බත නිමවනලද්දේය. ඒසඳහා දැන්කාලයයි භාග්‍යවතුන්වහන්සේට කල්දන්නූයේය. ඉක්බිතිභාග්‍යවතුන්වහන්සේ පෙරවරුකාලයෙහි හැඳපොරවා අතින් පාත්‍රයහා කයින් සිවුරුගෙණභික්ෂුසඞ්ඝයාසමග පොක්ඛරසාති බ්‍රාහ්මණයාගේ නිවෙසනය යම් තැනකද එතනට ඒළඹිසේක.එළඹ පණවනලද ආසනයෙහි වැඩඋන්සේක.

අථ ඛො බ්‍රාහ්මණො පොක්ඛරසාති භගවන්තං පණීතෙන ඛාදනියෙන භොජනියෙන සහත්ථා සන්තප්පෙසි, සම්පවාරෙසි. මාණවකා ච භික්ඛුසඞ්ඝං, අථ ඛො බ්‍රාහ්මණො පොක්ඛරසාති භගවන්තං භුත්තාවිං ඔනීත පත්තපාණිං අඤ්ඤතරං නීචං ආසනං ගහෙත්වා එකමන්තං නිසීදි.

49. එකමන්තං නිසින්නස්ස ඛො බ්‍රාහ්මණස්ස පොක්ඛරසාතිස්ස භගවා ආනුපුබ්බිකථං කථෙසි. සෙය්‍යථිදං. දානකථං සීලකථං සග්ගකථං කාමානං ආදීනවං ඔකාරං සංකිලෙසං නෙක්ඛම්මෙ ආනිසංසං පකාසෙසි. යදා භගවා අඤ්ඤාසි බ්‍රාහ්මණං පොක්ඛරසාතිං කල්ලචිත්තං මුදුචිත්තං විනීවරණචිත්තං උදග්ගචිත්තං පසන්නචිත්තං. අථ යා බුද්ධානං සාමුක්කංසිකා ධම්මදෙසනා තං පකාසෙසි. දුක්ඛං සමුදයං නිරොධං මග්ගං. සෙය්‍යථාපි නාම සුද්ධං වත්ථං අපගතකාළකං සම්මදෙව රජනං පටිග්ගණ්හෙය්‍ය.

එකල්හි පොක්ඛරසාති බ්‍රාහ්මණතෙමේ භාග්‍යවතුන්වහන්සේ ප්‍රණීතවූ කෑයුතුදෙයින්ද, බුදියයුතුදෙයින්ද සියතින් සන්තර්පණයකරවූයේය. හෙවත් වැළඳවූයේය. මනාකොට පවාරණය කරවූයේය. ඒ මාණවකයෝද, භික්ෂුසඞ්ඝයා වැළඳවූහ. මනාකොට පවාරණය කරවූහ. එකල්හි පොක්ඛරසාති බ්‍රාහ්මණතෙම වළඳ නිමකරණලද්දවූ පාත්‍රයෙන් ඉවත්කරණලද, අත්ඇත්තාවූ භාග්‍යවතුන්වහන්සේ දැන එක්තරනීචාසනයක්ගෙණ එකත්පසෙක උන්නේය.

49. එකත්පසෙක උන්නාවූ පොක්ඛරසාති බ්‍රාහ්මණයාහට භාග්‍යවතුන්වහන්සේ පිළිවෙළකථාව වදාළසේක. ඒකවරේද, දානකථාවය ශීලකථාවය ස්වර්ගකථාවය කාමයන්ගේ දෝෂය ලාමකබවය කෙලෙසෙනබවය නෛෂ්ක්‍රම්‍යයෙහි අනුසස්ද ප්‍රකාශකළසේක. යම් කලෙක්හි භාග්‍යවතුන්වහන්සේ යහපත් සිතඇත්තාවූද, මෘදුසිත් ඇත්තාවූද, නිවරණයන්ගෙන් පහවූසිත්ඇත්තාවූද, ඔදවැඩි සිත්ඇත්තාවූද, ප්‍රසන්න සිත්ඇත්තාවූද පොක්ඛරසාති බ්‍රාහ්මණයා දැනවදාළසේක්ද, එකල්හි බුදුවරයන්වහන්සේලාගේ යම්බඳුවූ තෙමේම උසස්බවට පමුණුවනලද්දවූ යම් ධර්මදේශනාවක් ඇත්තීද, දුඃඛය සමුදය නිරොධය මාර්ගය යන ඒ ධර්මය ප්‍රකාශකළසේක. යම්සේ පහවූ කාළවර්ණඇති පිරිසිදුවූ වස්ත්‍රයක් මනාකොට සායම අල්වාගන්නේද,

එවමෙව බ්‍රාහ්මණස්ස පොක්ඛරසාතිස්ස තස්මිං යෙව ආසනෙ විරජං විතමලං ධම්මචක්ඛුං උදපාදි. යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මන්ති.

50. අථ ඛො බ්‍රාහ්මණො පොක්ඛරසාති දිට්ඨධම්මො පත්තධම්මො විදිතධම්මො පරියොගාළ්හධම්මො තිණ්ණවිචිකිච්ඡො විගතකථංකථො වෙසාරජ්ජප්පත්තො අපරප්පච්චයො සත්ථුසාසනෙ, භගවන්තං එතදවොච. අභික්කන්තං භො ගොතම, අභික්කන්තං භො ගොතම. සෙය්‍යථාපි භො ගොතම. නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය. පටිච්ඡන්නං වා විවරෙය්‍ය. මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය. අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය. චක්ඛුමන්තො රූපානි දක්ඛින්ති එවමෙවං භොතා ගොතමෙන අනෙක පරියායෙන ධම්මො පකාසිතො. එසාහං භො ගොතම සපුත්තො සභරියො සපරිසො සාමච්චො භගවන්තං ගොතමං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතං.

එපරිද්දෙන් පොක්ඛරසාතීනම් බ්‍රාහමණයාහට එම ආසනයෙහිදීම පහවූරජස්ඇති පහවූරාගාදිමලඇති ධර්මචක්‍ෂුස හෙවත් ශ්‍රොත ආපත්ති මාර්ගඥානය පහළවූයේය. කෙසේදයත්, යම්කිසිවක් සමුදය ස්වභාවඇත්තේවේද. ඒ සියල්ල නිරොධ (වැනසීම) ස්වභාවකොට ඇත්තේය කියායි.

50. එකල්හිදී දක්නාලද ධර්මඇත්තාවූ පැමිණිමාර්ග ධර්ම ඇත්තාවූ දත්නාලද ධර්මඇත්තාවූ සර්වප්‍රකාරයෙන් ඥානයෙන් බැසගත් ධර්මඇත්තාවූ තරණයකරණලද විචිකිත්සා ඇත්තාවූ පහවූ කෙසේකෙසේදැයිපැවතිසැකඇත්තාවූවිසාරද භාවයට හෙවත් බියරහිතබවට පැමිණියාවූ ශාස්තෘ ශාසනයෙහි පරප්‍රත්‍යයරහිතවූහෙවත් අන්‍යශාස්තෘ කෙනෙකුන් කෙරෙහි ඇදහීමක්නැත්තාවූ පොක්ඛරසාතී බ්‍රාහ්මණතෙමේ භාග්‍යවතුන්වහන්සේට මේකාරණය සැළකලේය. භවද්ගෞතමයන්වහන්ස, දම්දෙසුම ඉතාමැනව භවද්ගෞතමයන්වහන්ස, දම්දෙසුම ඉතාමැනව. භවද්ගෞතමයන්වහන්ස, යටිකුරුකරණලද්දක් උඩුකුරුකොට තබන්නේ හෝ යම්සේද තෘණපර්ණාදියෙන් වසනලද්දක් විවෘතකොට දක්වන්නේ හෝ යම්සේද මංමුලාවූවෙකුට මගකියන්නේ හෝ යම්සේද චක්‍ෂුරින්ද්‍රිය දර්ශනශක්තිය ඇත්තෝ නීලපීතාදි රූපයන් දකිත්වායි. අඳුරෙහි තෙල්පහනක් දල්වන්නේ හෝ යම්සේද එපරිද්දේම භවද්ගෞතමයන්වහන්සේ විසින් නොයෙක් ප්‍රකාරයෙන් ධර්මය දේශනාකරණලද්දේය. භවද්ගෞතමයන්වහන්ස, පුත්‍රයන්සහිතවූ භාර්‍ය්‍යාවසහිතවූ පිරිස්සහිතවූ ඇමතියන්සහිතවූ මේමම භවද්ගෞතමයන්වහන්සේද, නවලොකොත්තර ධර්මයද, ආර්‍ය්‍යභික්‍ෂුසමූහයාද, පිහිටකොටයමි. අදපිටන් දිවිහිම්කොට සරණගියාවූ උපාසකයෙකැයි භවද්ගෞතමයන්වහන්සේ මා දරාගන්නාසේක්වා යනුයි.

යථාච භවංගොතමො උක්කට්ඨාය අඤ්ඤානිඋපාසකකුලානි උපසඞ්කමති. එවමෙව භවං ගොතමො පොක්ඛරසාතිකුලං උපසඞ්කමතු. තත්‍ථ යෙ තෙ මාණවකා වා මාණවිකා වා භගවන්තං ගොතමං අභිවාදෙස්සන්ති වා පච්චුට්ඨිස්සන්ති වා ආසනං වා උදකං වා දස්සන්ති. චිත්තං වා පසාදෙස්සන්ති. තෙසං තං භවිස්සති දීඝරත්තං හිතාය සුඛායාති. කල්‍යාණං වුච්චති බ්‍රාහ්මණාති.

අම්බට්ඨසුත්තං නිට්ඨිතං තතියං.

භවද්ගෞතමයන්වහන්සේ යම්සේ උක්කට්ඨානුවර අන්‍යඋපාසකකුලයන්කරා එළඹෙනසේක්ද, එපරිද්දෙන්ම භවද්ගෞතමතෙම පොක්ඛරසාතිකුලයට එළඹෙනසේක්වා. එහි යම් මාණවකයෝ හෝ මාණවිකාවෝහෝ වෙද්ද ඔව්හු භාග්‍යවත් ගෞතමයන්වහන්සේට වඳින්නාහුද දූකහුනස්නෙන් නැඟීසිටින්නාහුද අග්‍රාසනයහා අග්‍රපැන්දෙන්නාහුද සිත හෝ පහදවන්නාහුදවෙත්. ඔවුන්ට එයදීර්ඝකාලයක්මුලුල්ලෙහි වැඩපිණිසද, සැපපිණිසද, වන්නේයයිභාග්‍යවතුන්වහන්සේ මෙපවත්සැලකළේය. බ්‍රාහ්මණය යහපතක් කියනුලැබේ.යි වදාළෝ.

තුන්වෙනිවූ අම්බට්ඨසූත්‍රාර්ථව්‍යාඛ්‍යාව
නිමියේයි.

IV සොණදණ්ඩසුත්තං.

—o:o —

1. එවං මෙ සුතං. එකං සමයං භගවා අඞ්ගෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි යෙන චම්පා තදවසරි. තත්‍ර සුදං භගවා චම්පායං විහරති ගග්ගරාය පොක්ඛරණියා තීරෙ. තෙනඛොපන සමයෙන සොණදණ්ඩො බ්‍රාහ්මණො චම්පං අජ්ඣාවසති සත්තුස්සදං සතිණකට්ඨොදකං සධඤ්ඤං රාජභොග්ගං රඤ්ඤා මාගධෙන සෙනියෙන බිම්බිසාරෙන දින්නං රාජදායං බ්‍රහ්මදෙය්‍යං.

2. අස්සොසුං ඛො චම්පෙය්‍යකා බ්‍රාහ්මණගහපතිකා සමණො ඛලු භොගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො අඞ්ගෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි.

සොණදණ්ඩසූත්‍රාර්ථව්‍යාඛ්‍යා.

——:o:——

1. මාවිසින් මේ සූත්‍රධර්මය මෙසේ අසනලදී. එක්කාලයෙක්හි භාග්‍යවතුන්වහන්සේ පන්සියයක් භික්ෂූන්වූ මහද් භික්ෂුසඞ්ඝයා සමග අඞ්ගදනව්හි සැරිසරාවඩනාසේක් චම්පානුවර යම්තැනෙක්හිද එතනට වැඩිසේක. එහි භාග්‍යවතුන්වහන්සේ චම්පානුවර ගග්ගරා නම් පොකුණුතෙර සපුවෙතෙහි වාසයකරණසේක. ඒකාලයෙහිදී සොණදණ්ඩනම් බ්‍රාහ්මණතෙමේ මගධෙශ්වරවූ බොහෝසෙනාඇත්තාවූ බිම්සරරජහුවිසින් දෙනලද්දාවූ නොයෙක් සත්වයන්ගේ උත්සන්නතාඇති හෙවත් නොයෙක් සත්වයන්ගෙන් ගැවසීගත්තාවූ තණ දර දිය හා පුෂ්කරණීන් සහිතවූ ධාන්‍ය සහිතවූ රජහුකෙරෙන් ලදින් අනුභවකටයුතුවූ රජවිසින්දෙනලද දායාදයවූ ශ්‍රෙෂ්ඨවශයෙන් දෙන ලද්දාවූ හෙවත් රාජස්වරූපයෙන් පරිභොගකටයුතුවූ චම්පානුවර අධිපතිව වෙසෙයි.

2. එකල්හිදී චම්පානුවරවාසී බමුණුගැහැවියෝ මේකාරණය ඇසූහ. ශාක්‍යරාජපුත්‍රවූ ශාක්‍යකුලයෙන් නික්ම පැවිදිවූ ශ්‍රමණ භවද් ගෞතමයන්වහන්සේ භික්ෂූන් පන්සියයක්වූ මහද් භික්ෂුසඞ්ඝයා සමග අඞ්ගදනව්හි සැරිසරාවඩනාසේක්.

චම්පං අනුප්පත්තො චම්පායං විහරති ගග්ගරාය පොක්ඛරණියා තීරෙ. තං ඛො පන භගවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො, ඉතිපි සො භගවා අරහං සම්මා සම්බුද්ධො විජ්ජාචරණ සම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා. සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙ කල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං, කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති. සාධු ඛො පන තථාරූපානං අරහතං දස්සනං හොතීති. අථ ඛො චම්පෙය්‍යකා බ්‍රාහ්මණගහපතිකා චම්පාය නික්ඛමිත්වා සඞ්ඝසඞ්ඝී ගණීභූතා යෙන ගග්ගරාපොක්ඛරණී තෙනුපසංකමන්ති.

චම්පානුවරටපැමිණිසේක්. චම්පානුවර ගග්ගරා පොකුණුතෙර සපුවෙනෙහි වැඩවාසයකරණසේක. ඒ භාග්‍යවත්තෙම සංසාරචක්‍රයාගේ අරකැපූසේක. සර්‍වප්‍රකාරයෙන් සර්‍වධර්‍මයන්මනාකොට තෙමේම අවබොධකලසේක. අෂ්ටවිද්‍යාපසලොස්චරණ ධර්‍මයන්ගෙන් සම්පූර්‍ණසේක. සොභනවූ ගමන්ඇතිසේක. තුන්ලොව දන්නාසේක. ශිලසමාධ්‍යාදි ගුණයෙන් ශ්‍රෙෂ්ඨවූසේක. පුරුෂයන් දමනයකිරීමෙහි සමර්‍ථසේක. දෙව්මිනිසුන්ට අනුශාසනාකරණසේක. චතුස්සත්‍යාවබොධකලසේක. සකලක්ලෙශයන් භග්නකලසේකැයිද ඒ භාග්‍යවතුන්වහන්සේ දෙවියන් සහිතවූ මරුන් සහිතවූ බඹුන් සහිතවූ මෙලොවද ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිතවූ දෙව්මිනිසුන් සහිතවූ සත්‍වවර්‍ගයාද තෙමේ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්‍ෂකොට ප්‍රකාශකරණසේකැයිද ඒභාග්‍යවතුන්වහන්සේ මුලයහපත්වූද මැද යහපත්වූද අග යහපත්වූද අර්‍ථසහිතවූ ව්‍යඤ්ජන සහිතවූ සියල්ලෙන් සම්පූර්‍ණවූ ධර්‍මය දෙශනාකරණසේක්යයිද, පිරිසිදුවූ බ්‍රහ්මචර්‍ය්‍යාව ප්‍රකාශකරණසේක්යයිද, මෙසේ ඒ ශ්‍රමණ භවද් ගෞතමයන්වහන්සේ පිළිබඳවූ මනොඥවූ කීර්ත්තිශබ්දයෙක් පැනනැංගේය. එය අසා එබඳුවූ රහතුන්ගේ දැකීම යහපත්ම වේයයි සිතූහ. ඉක්බිත්තෙන් චම්පානුවරවැසි බමුණුගැහැවියෝ චම්පානුවරින්නික්ම බොහෝපරිද්දෙන් රැස්වූ මහත්සමූහයාඇත්තෝ නුවරින් පිටතදී රැස්වූ මහත් ගණයා ඇත්තෝව ගග්ගරානම් පොකුණ යම්තැනෙක්හිද එතනට එළඹෙත්.

3. තෙන ඛො පන සමයෙන සොණදණ්ඩො බ්‍රාහ්මණො උපරිපාසාදෙ දිවාසෙය්‍යං උපගතො හොති. අද්දසා ඛො සොණදණ්ඩො බ්‍රාහ්මණො චම්පෙය්‍යකෙ බ්‍රාහ්මණගහපතිකෙ චම්පාය නික්ඛමිත්වා සඞ්ඝසඞ්ඝී ගණීභූතෙ යෙනගග්ගරාපොක්ඛරණී තෙනුපසංකමන්තෙ දිස්වා ඛත්තං ආමන්තෙසි. කින්නුඛො භො ඛත්ත චම්පෙය්‍යකා බ්‍රාහ්මණගහපතිකා චම්පාය නික්ඛමිත්වා සඞ්ඝා සඞ්ඝී ගණීභූතා යෙන ගග්ගරාපොක්ඛරණී තෙනුපසංකමන්තීති. අත්ථි ඛො භො සමණො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො අඞ්ගෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි චම්පං අනුප්පත්තො චම්පායං විහරති ගග්ගරාය පොක්ඛරණියා තීරෙ තං ඛො පන භගවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො. ඉතිපි සො භගවා අරහං සම්මා සම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො.

3 ඒකාලයෙහිදී සොණදණ්ඩ බ්‍රාහ්මණතෙමේ ප්‍රාසාදයාගේ මතුමහල්තෙලෙහි දිවාසයනයට පැමිණියේ වේ. සොණදණ්ඩ බ්‍රාහ්මණතෙමේ චම්පානුවරින් නික්ම බොහෝපරිද්දෙන් රැස්වූ සමූහයා ඇතිව නුවරින් පිටතදී රැස්වූ මහත් ගණයා ඇතිව ගග්ගරා පොකුණ යම්තැනෙක්හිද එතනට එලඹෙන්නාවූ. චම්පානුවරවාසීවූ බමුණුගැහැවියන් දැක ඛත්තනම් මහ ඇමතියා ඇමතුයේය. පින්වත, ඛත්තය, චම්පානුවරවාසිවූ බමුණුගැහැවියෝ චම්පානුවරින් නික්ම බොහෝපරිද්දෙන් රැස්වූ මහත්සමූහයා ඇතිව මහත් ගණයා ඇතිව ගග්ගරා පොකුණ යම්තැනෙක්හිද එතනට එලඹෙත්. මේ කිමෙක්දැයි විචාළේය. පින්වත, මේ කාරණය ඇත්තේමය ඒනම්, ශාක්‍යරාජපුත්‍රවූ ශාක්‍යකුලයෙන් නික්ම පැවිදිවූ ශ්‍රමණ ගෞතමයන්වහන්සේ පන්සියයක් භික්‍ෂූන්වූ මහද් භික්‍ෂුසඞ්ඝයා සමග සැරිසරාවඩනාසේක් චම්පානුවරට පිළිවෙළින් පැමිණිසේක්. චම්පාපුරියෙහි ගග්ගරානම් පොකුණුතෙර [සපුවෙනෙහි] වාසයකරණසේක. ඒ භවද් ගෞතමයන්වහන්සේ සම්බන්ධව මෙසේ යහපත්වූ කීර්තිශබ්දයක් උස්ව පැවැත්තේය. කෙසේදයත්, ඒ භාග්‍යවතුන්වහන්සේ සියලූ කෙලෙසුන් කෙරෙන් දුරුවූයේය. සියල්ලන්ගේ පූජාවට සුදුසුය යන මේ කාරණයන්ගෙන් අහිත්සේක. මනාකොට තමන්වහන්සේ සියලූ දහම් අවබොධකෙළේය. යනාදි කාරණයන්ගෙන් සම්‍යක්සම්බුද්ධසේක. අෂ්ටවිද්‍යාපසළොස්චරණධර්මයන්ගෙන් සම්පූර්ණය යන මේ කාරණයන්ගෙන් විජ්ජාචරණසම්පන්නසේක.

සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි. සත්‍ථා දෙව මනුස්සානං බුද්ධො භගවාති. තමෙතෙ භවන්තංගොතමං දස්සනාය උපසඞ්කමන්තීති. තෙනහි භො ඛත්ත යෙන චම්පෙය්‍යකා බ්‍රාහ්මණගහපතිකා තෙනුපසංකම, උපසංකමිත්වා චම්පෙය්‍යකෙ බ්‍රාහ්මණගහපතිකෙ එවං වදෙහි, සොණදණ්ඩො භො බ්‍රාහ්මණො එවමාහ ආගමෙන්තු කිර භවන්තො සොණදණ්ඩොපි බ්‍රාහ්මණො සමණං ගොතමං දස්සනාය උපසංකමිස්සතීති.එවංභොති ඛො සො ඛත්තා සොණදණ්ඩස්ස බ්‍රාහ්මණස්ස පටිස්සුත්වා යෙන චම්පෙය්‍යකා බ්‍රාහ්මණ ගහපතිකා තෙනුපසංකමි, උපසංකමිත්වා චම්පෙය්‍යකෙ බ්‍රාහ්මණගහපතිකෙ එතදවොච. සොණදණ්ඩො භො බ්‍රාහ්මණො එවමාහ. ආගමෙන්තු කිර භවන්තො, සොණදණ්ඩොපි බ්‍රාහ්මණො සමණං ගොතමං දස්සනාය උපසංකමිස්සතීති.

සොඳුරුගමන්ඇතිබැවින් හා සොඳුරු තැනට ගියබැවින්ය යන මේ ආදි කාරණයන්ගෙන් සුගතසේක. සියලු අයුරින් ලොව දැනගත්තේය.යන මේකාරණයෙන් ලොකවිදූසේක.තමන්වහන්සේට ශ්‍රෙෂ්ඨ කෙනෙක්නැත්තේය.යන මේ කාරණයෙන් අනුත්තරසේක. දමනය කටයුතු හෙවත් හික්මවියයුතු පුරුෂයන් දමනයකෙරෙයි.යනාදි අර්ථයෙන් පුරිසදම්මසාරථිසේක.දෙව්මිනිසුන්ට අනුශාසනාකෙරෙයි.යන මේ ආදි කාරණයන්ගෙන් සත්ථුසේක.චතුස්සත්‍ය ධර්මයන් අවබොධ කෙළේය. යන මේ ආදි කාරණයෙන් බුඩසේක. වනසනලද රාගාදි කෙලෙසුන් ඇත්තේය. යන මේ ආදි කාරණයෙන් භගවත්සේකැයි කියායි. මොව්හු ගොයුම්ගොත් පින්වතුන්වහන්සේ දැකීමපිණිස එළඹෙත්යයි දන්වූයේය. පින්වත ඛත්තය, එහෙනම් චම්පාපුරවාසීවූ බමුණුගැහැවියෝ යම්තැනෙක්හිද එතනට එළඹෙව. එළඹ චම්පාපුරවාසී බමුණුගැහැවියන්ට මෙසේ කියව. සොණදණ්ඩ බ්‍රාහ්මණ තෙමේද මහණ ගොයුම්ගොතුන්වහන්සේ දැකීමට එළඹෙන්නේය. එහෙයින් පින්වත්හු බලාපොරොත්තුවෙත්වායි සොණදණ්ඩ බ්‍රාහ්මණතෙමේ මෙසේ කියායයි දන්වව යනුයි. පින්වත, එසේයයි ඒ ඛත්තනම් මහඇමතිතෙමේ සොණදණ්ඩ බ්‍රාහ්මණයාහට පිළිවදන්දී චම්පාපුරවාසී බමුණුගැහැවියෝ යම්තැනෙක්හිද එතනට එළඹියේය, එළඹ චම්පාපුරවාසී බමුණුගැහැවියන්ට මේකාරණය දැන්විය. පින්වත්නි, සොණදණ්ඩ බ්‍රාහ්මණතෙමේද මහණ ගොයුම්ගොතුන්වහන්සේ දක්මට එළඹෙන්නේය.එහෙයින් බලාපොරොත්තුවෙත්වා. සොණදණ්ඩ බ්‍රාහ්මණතෙමේ මෙසේ කියාය යනුයි.

4. තෙනඛො පන සමයෙන නානාවෙරජ්ජකානං බ්‍රාහ්මණානං පඤ්චමත්තානි බ්‍රාහ්මණසතානි චම්පායං පටිවසන්ති කෙනචිදෙව කරණීයෙන. අස්සොසුං ඛො තෙ බ්‍රාහ්මණා සොණදණ්ඩො කිර බ්‍රාහ්මණො සමණං ගොතමං දස්සනාය උපසංකමිස්සතීති. අථ ඛො තෙ බ්‍රාහ්මණා යෙන සොණදණ්ඩො බ්‍රාහ්මණො තෙනුපසංකමිංසු, උපසංකමිත්වා සොණදණ්ඩං බ්‍රාහ්මණං එතදවොචුං. සච්චං කිර භවං සොණදණ්ඩො සමණං ගොතමං දස්සනාය උපසංකමිස්සතීති. එවං ඛො මෙ භො හොති, අහම්පි සමණං ගොතමං දස්සනාය උපසංකමිස්සාමීති.

5. මා භවං සොණදණ්ඩො සමණං ගොතමං දස්සනාය උපසංකමි, න අරහති භවං සොණදණ්ඩො සමණං ගොතමං දස්සනාය උපසංකමිතුං. සචෙ භවං සොණදණ්ඩො සමණං ගොතමං දස්සනාය උපසංකමිස්සති, භොතො සොණදණ්ඩස්ස යසො හායිස්සති, සමණස්ස ගොතමස්ස යසො අභිවඩ්ඪිස්සති. යම්පි භොතො සොණදණ්ඩස්ස යසො හායිස්සති සමණස්ස ගොතමස්ස යසො අභිවඩ්ඪිස්සති

---

4. ඒකාලයෙහිදී නොයෙක් රාජධානිවලින් පැමිණියාවූ බ්‍රාහ්මණයන් සම්බන්ධිවූ පන්සියයක් බ්‍රාහ්මණයෝ කිසියම් කටයුත්තක් සඳහා චම්පාපුරියෙහි වාසයකෙරෙත්. ඒ බමුණෝ සොණදණ්ඩ බ්‍රාහ්මණතෙමෙ ශ්‍රමණ ගෞතමයානන් දක්මට එලඹෙන්නේයයි ඇසුවාහුමය. ඉක්බිත්තෙන් ඒ බ්‍රාහ්මණයෝ සොණදණ්ඩ බ්‍රාහ්මණතෙම යම්තැනෙක්හිද එතනට එලඹියාහුය. එලඹ පින්වත් සොණදණ්ඩතෙමේ ගොයුම්ගොත් මහණහු දක්මට එලඹෙන්නේය යනු කිමෙක සැබෑදැයි සොණදණ්ඩ බ්‍රාහ්මණයා මේකරුණ විචාළාහුය. පින්වත්නි, මමත් ශ්‍රමණ ගෞතමයානන් දක්මට එලඹෙන්නෙමියි මෙසේ මාගේ අදහසයයි දන්වීය.

5. පින්වත් සොණදණ්ඩතෙමේ ගොයුම්ගොත් මහණහු දැක්මට නොඑලඹෙනසේක්වා. පින්වත් සොණදණ්ඩතෙමේ ගොයුම්ගොත් මහණහු දැක්මට එලඹෙන්ට සුදුසුසේක් නොවේ. පින්වත් සොණදණ්ඩතෙමේ ගොයුම්ගොත් මහණහු දැක්මට ඉදින් එලඹෙන්නේ නම් සොණදණ්ඩ පින්වත්හුගේ කීර්තිය පිරිහෙන්නේය. ශ්‍රමණ ගෞතමයාගේ කීර්තිය මනාසේ වැඩෙන්නේය. සොණදණ්ඩ පින්වත්හුගේ යසස පිරිහෙන්නේය. ගොයුම්ගොත් මහණහුගේ යසස බොහෝසෙයින් වැඩෙන්නේය.

ඉමිනා පඞ්ගෙන න අරහති භවං සොණදණ්ඩො සමණං ගොතමං දස්සනාය උපසංකමිතුං, සමණො ත්වෙව ගොතමො අරහති භවන්තං සොණදණ්ඩං දස්සනාය උපසංකමිතුං. භවංහි සොණදණ්ඩො උභතො සුජාතො මාතිතොච පිතිතොච සංසුද්ධගහණිකො යාව සත්තමා පිතාමහයුගා අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන. යම්පි භවං සොණදණ්ඩො උභතො සුජාතො මාතිතොච පිතිතොච සංසුද්ධගහණිකො යාව සත්තමා පිතාමහයුගා අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන. ඉමිනාපඞ්ගෙන න අරහති භවං සොණදණ්ඩො සමණං ගොතමං දස්සනාය උපසංකමිතුං. සමණො ත්වෙව ගොතමො අරහති භවන්තං සොණදණ්ඩං දස්සනාය උපසංකමිතුං. භවංහි සොණදණ්ඩො අඩ්ඪො මහද්ධනො මහාභොගො......පෙ...... භවංහි සොණදණ්ඩො අජ්ඣායකො මන්තධරො තිණ්ණං වෙදානං පාරගූ සනිඝණ්ඩු කෙටුභානං සක්ඛරප්පභෙදානං ඉතිහාස පඤ්චමානං.

මේකාරණයෙන්ද සොණදණ්ඩ පින්වත්තෙමේ ගොයුම්ගොත් මහණහු දැක්මට එලඹෙන්නට නුසුදුසුයි. ගොයුම්ගොත් මහණතෙමේම සොණදණ්ඩ පින්වතුන් දැක්මට එලඹෙන්නට සුදුස්සෙක්වේ. සොණදණ්ඩ පින්වත්තෙමේ මව්පසින්ද, පියපසින්ද, යන දෙපසින් යහපත්සේ උපන්නේය. පිරිසිදු මාතෘගර්භ ඇත්තේය. සත්වෙනි මහාපිතෘ පරම්පරාවදක්වා අවඥකිරිමෙන් බැහැර නොකරණලද්දේය. ජාතිවාදයෙන් උපක්‍රොශ නොකරණලද්දේය. යම් හෙයකින් සොණදණ්ඩ පින්වත්තෙමේ මව්පිය දෙපසින් යහපත්සේ උපන්නේද, පිරිසිදු මාතෘගර්භ ඇත්තේද සත්වෙනි මහාපිතෘ පරම්පරාවදක්වා අවඥ කිරීමෙන් බැහැර නොකරණ ලද්දේද, ජාතිවාදයෙන් උපක්‍රොශ නොකරණ ලද්දේද, මේ කාරණයෙන්ද සොණදණ්ඩ පින්වත්තෙමේ ගොයුම්ගොත් මහණහු දැක්මට එලඹෙන්නට සුදුස්සෙක්නොවේ. ගොයුම්ගොත් මහණතෙමේම සොණදණ්ඩ පින්වත්හු දැක්මට එලඹෙන්නට සුදුස්සෙක්වේ. සොණදණ්ඩ පින්වත්තෙමේ ආඪ්‍යය හෙවත් අධිපතිය මහද්ධනඇත්තේය. පස්කම් ගුණවශයෙන් මහත් උපභොග සම්පත් ඇත්තේය. සෙස්සකී නයින් දතයුතුයි. සොණදණ්ඩපින්වත්තෙමේ වේදහදුරන්නේය. වේද මන්ත්‍ර දරන්නෙය. වෘක්ෂාදීන්ගේ නාමප්‍රකාශකනිඝණ්ඩු ශාස්ත්‍රය හා ක්‍රියා කල්ප විකල්ප ප්‍රකාශක කවින්ට ප්‍රයොජනවත් කෙටුභ ශාස්ත්‍රයද සහිතවූ ශික්ෂානිරුක්ති සහිතවූ ඉතිහාසය පස්වෙනිකොටඇති වෙදත්‍රය පිළිබඳ පරතෙරට පැමිණියේය.

පදකො වෙය්‍යාකරණො ලොකායත මහාපුරිසලක්ඛණෙසු අනවයො. භවංහි සොණදණ්ඩො අභිරූපො දස්සනීයො. පාසාදිකො පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතො බ්‍රහ්මවණ්ණී බ්‍රහ්මවච්ඡසී අඛුද්දාවකාසො දස්සනාය. භවංහි සොණදණ්ඩො සීලවා වුඩ්ඪසීලී වුඩ්ඪසීලෙන සමන්නාගතො. භවංහි සොණදණ්ඩො කල්‍යාණවාචො කල්‍යාණවාක්කරණො පොරියා වාචාය සමන්නාගතො විස්සට්ඨාය අනෙලගලාය අත්ථස්ස විඤ්ඤාපනියා. භවංහි සොණදණ්ඩො බහුන්නං ආචරියපාචරියො තීණි මාණවකසතානි මන්තෙ වාචෙති, බහූ ඛො පන නානාදිසා නානාජනපදා මාණවකා ආගච්ඡන්ති භොතො සොණදණ්ඩස්ස සන්තිකෙ මන්තත්ථිකා මන්තෙ අධියිතුකාමා. භවංහි සොණදණ්ඩො ජිණ්ණො වුඩ්ඪො මහල්ලකො අද්ධගතො වයො අනුප්පත්තො.

පද දන්නේය. ව්‍යාකරණ ශාස්ත්‍රය හදාරන්නේය. විතණ්ඩවාදීන්ගේ ශාස්ත්‍රය හා මහාපුරුෂලක්ෂණ ශාස්ත්‍රයන්හි සම්පූර්ණ දැනගැනීම් ඇත්තේය.—පෙ—සොණදණ්ඩ පින්වත්තෙමේ විශිෂ්ට රූප ඇත්තේය. දැකුම්කටයුත්තේය. ප්‍රසාද එලවන්නේය. උත්තමවූ වර්ණ සෞන්දර්යයෙන් යුක්තවේ. නොහොත් ඉතාපිරිසිදුවූ ශරීරවර්ණයෙන් හා ශරීරසටහණින්ද, සමන්විත වේ. ශ්‍රේෂ්ඨවූ ස්වර්ණ වර්ණයෙන්ම සමන්විත වේ. මහබඹහුගේ සිරුර සමානවූ ශරීරයෙන් සමන්විත වේ. දක්මටසවල්පාවකාශඇත්තේවේ—පෙ—සොණදණ්ඩ පින්වත්තෙමේ සිල්ඇත්තේය. වඩනලද සිල් ඇත්තේය. සම්පූර්ණ සීලයෙන් යුක්තවේ. සොණදණ්ඩ පින්වත්තෙමේ යහපත් වචන ඇත්තේය. යහපත් වචනකිරීම් ඇත්තේය. ගුණයෙන් සම්පූර්ණවූ නොහොත් පුරවාසී ස්ත්‍රීන්ගේ කථාවමෙන් සිච්මැලිබැවින් කර්ණරසායනවූ මධුරභාවයෙන් සිහිකටයුතුවූ නිර්දෝෂවූ ආදිමධ්‍යපර්‍යවසානය යන ස්ථානත්‍රය ප්‍රකටකොට කියනලද අර්ථයාගේ අවබොධයට සමර්ථවූ වචනයෙන් යුක්තය.—පෙ—සොණදණ්ඩ පින්වත්තෙමේ බොහෝ දෙනාගේ ආචාර්‍ය්‍යද ආචාර්‍ය්‍යයන්ගේ ප්‍රාචාර්‍ය්‍යද වේ. තුන්සියයක් මාණවකයන්ට වෙදමන්ත්‍රයන් කියවයි. සොණදණ්ඩ පින්වත්හුගේ සමීපයෙහි වේදමන්ත්‍රප්‍රයොජනකොට ඇත්තාවූ වෙදමන්ත්‍ර හදාරණුකැමැත්තාවූ බොහො මාණවකයෙ නොයෙක් දිසාවලින්ද, නොයෙක් දනව්වලින්ද, එන්නාහ. සොණදණ්ඩ පින්වත්තෙමේ ජරාවෙන් ජීර්ණය අඞ්ග ප්‍රත්‍යඞ්ගයන්ගේ වැඩීමටපැමිණියේය. මහලුය ඉක්මගියදෙතුන්රජපරපුරකල්ඇත්තේය. පැසුළුවයසට පැමිණියේය.

සමණො ගොතමො තරුණොවෙව තරුණපබ්බජිතො ච. භවංහි සොණදණ්ඩො රඤ්ඤො මාගධස්ස සෙනියස්ස බිම්බිසාරස්ස සක්කතො ගරුකතො මානිතො පූජිතො අපචිතො. භවංහි සොණදණ්ඩො බ්‍රාහ්මණස්ස පොක්ඛරසාතිස්ස සක්කතො ගරුකතො මානිතො පූජිතො අපචිතො. භවංහි සොණදණ්ඩො චම්පං අජ්ඣාවසති සත්තුස්සදං සතිණකට්ඨොදකං සධඤ්ඤං රාජභොග්ගං රඤ්ඤා මාගධෙන සෙනියෙන බිම්බිසාරෙන දින්නං රාජදායං බ්‍රහ්මදෙය්‍යං, යම්පි භවං සොණදණ්ඩො චම්පං අජ්ඣාවසති සත්තුස්සදං සතිණකට්ඨොදකං සධඤ්ඤං රාජභොග්ගං.

නොහොත් බොහෝකල් පැවති කුලපරම්පරා ඇත්තේය. සීලාචාරගුණාදියෙන් වැඩීමට පැමිණියේය. මහත්සම්පත්තියෙන් යුක්තය. බ්‍රාහ්මණයන්ගේ ව්‍රතචර්‍ය්‍යාදි සීමා හෙද නොකිරීමෙන් මාර්ගයට පිළිපන්නේය. අන්තිමවයසට පැමිණියේය. ගොයුම්ගොත් මහණතෙමේ තරුණයෙක්ද, තරුණ පැවිද්දෙක්ද වේ. සොණදණ්ඩ පින්වත්තෙමේ මගධ ජනපදාධිපතිවූ බොහෝ සේනා ඇත්තාවූ බිම්සර රජහුවිසින් සත්කාර කරණලද්දේද, ගරුකරණලද්දේද, බුහුමන්කරණලද්දේද, පුදන ලද්දේද, සත්කාර පෙරදැරිකොට ඇති ප්‍රණිපාතයෙන් පූජාකරණ ලද්දේද වෙයි. සොණදණ්ඩ පින්වත්තෙමේ පොක්ඛරසාති බ්‍රාහ්මණයාවිසින් සත්කාරකරණලද්දේය. ගරුකරණලද්දේය. බුහුමන්කරණලද්දේය. පුදනලද්දේය. සත්කාර පෙරදැරිකොටඇති ප්‍රණිපාතයෙන් පූජාකරණ ලද්දේද වෙයි. සොණදණ්ඩ පින්වත්තෙමේ මගධජනපදාධිපතිවූ බොහෝසේනා ඇත්තාවූ බිම්සර රජහු විසින් දෙනලද්දාවූ නොයෙක් සත්ත්‍වයන්ගේ උත්සන්නතාඇති හෙවත් නොයෙක් සත්වයන්ගෙන් ගැවසීගත්තාවූ තණදැව ආදිය හා පුෂ්කරණීන් සහිතවූ ධාන්‍යසහිතවූ රජහුකෙරෙන් ලදින් අනුභව කටයුතුවූ රජවිසින් දෙනලද දායාදයවූ ශ්‍රෙෂ්ඨවශයෙන් දෙන ලද්දාවූ නොහොත් රාජස්වරූපයෙන් පරිභොග කටයුතුවූ චම්පා පුරියෙහි අධිපතිව වෙසේ. යම්හෙයකින් පින්වත් සොණදණ්ඩ තෙමේ මගධ ජනපදාධිපතිවූ බොහෝ සේනාඇත්තාවූ බිම්සර රජහු විසින් දෙනලද්දාවූ නොයෙක් සත්වයන්ගේ උත්සන්නතා ඇති නොහොත් නොයෙක් සත්වයන්ගෙන් ගැවසීගත්තාවූ තණදැව ආදිය හා පුෂ්කරණීන් සහිතවූ ධාන්‍යසහිතවූ රජහුකෙරෙන් ලදින් අනුභවකටයුතුවූ.

රඤ්ඤා මාගධෙන සෙනියෙන බිම්බිසාරෙන දින්නං රාජදායං බ්‍රහ්මදෙය්‍යං. ඉමිනාපඞ්ගෙන න අරහති භවං සොණදණ්ඩො සමණං ගොතමං දස්සනාය උපසංකමිතුං. සමණොත්වෙව ගොතමො අරහති භවන්තං සොණදණ්ඩං දස්සනාය උපසංකමිතුන්ති.

6. එවං වුත්තෙ සොණදණ්ඩො බ්‍රාහ්මණො තෙ බ්‍රාහ්මණෙ එතදවොච. තෙනහි භො මමපි සුණාථ, යථා මයමෙව අරහාම තං භවන්තං ගොතමං දස්සනාය උපසංකමිතුං. නත්වෙව අරහති සො භවං ගොතමො අම්හාකං දස්සනාය උපසංකමිතුං. සමණො ඛලු භො ගොතමො උභතො සුජාතො මාතිතොච පිතිතොච සංසුද්ධගහණිකො යාව සත්තමා පිතාමහයුගා අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන. යම්පි භො සමණො ගොතමො උභතො සුජාතො මාතිතොච පිතිතොච සංසුද්ධගහණිකො යාව සත්තමා පිතාමහයුගා අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන ඉමිනාපඞ්ගෙන න අරහති සො භවං ගොතමො අම්හාකං දස්සනාය උපසංකමිතුං,

රජවිසින් දෙනලද දායාදයවූ ශ්‍රෙෂ්ඨවශයෙන් දෙනලද්දවූතොහොත් රාජස්වරූපයෙන් පරිභොග කටයුතුවූ චම්පාපුරියෙහි අධිපතිව වෙසේද. මේකාරණයෙන්ද සොණදණ්ඩ පින්වත්තෙමේ ඒ ගොයුම්ගොත් මහණහු දක්මට එලඹෙන්නට සුදුසුනොවේ. මහණගොයුම් තෙමේම සොණදණ්ඩ පින්වතුන්දක්ම පිණිස එලඹෙන්නට සුදුසුය කීයායි.

6. මෙසේ කීකල්හි සොණදණ්ඩ බ්‍රාහ්මණතෙමේ ඒ බමුණන්ට මේකරුණු දැන්වීය. ඒ පින්වත් ගෞතමයන්වහන්සේ දැකීමපිණිස එලඹෙන්ට අපිම යම්සේ සුදුස්සෝ වෙමුද. ඒ පින්වත් ගෞතමයන්වහන්සේ අප දැකීමපිණිස එලඹෙන්නට සුදුසුම නොවේද, එහෙයින් මාගේ කථාවද අසව්. ශ්‍රමණ ගෞතමයන්වහන්සේ වූකලි මව්පිය දෙපසින් යහපත්සේ උපන්නේය. පිරිසිදු මාතෘගර්භ ඇත්තේය. සත්වෙනි මහපිතු පරම්පරාව දක්වා අවඥකිරීමෙන් බැහැරනොකරණලද්දේය. ජාතිවාදයෙන් උපක්‍රොශ නොකරණලද්දේය. පින්වත්නි, යම්හෙයකින් ශ්‍රමණ ගෞතමයන්වහන්සේ මව්පිය දෙපසින් යහපත්සේ උපන්නේද පිරිසිදු මාතෘගර්භ ඇත්තේද සත්වෙනි මහපිතු පරම්පරාව දක්වා අවඥකිරීමෙන් බැහැරනොකරණ ලද්දේද ජාතිවාදයෙන් උපක්‍රොශ නොකරණ ලද්දේද මේකාරණයෙන්ද ඒ පින්වත් ගෞතමයන්වහන්සේ අපගේ දැකීමපිණිස එලඹෙන්නට සුදුස්සෙක් නොවේ.

අථඛොමයමෙවඅරහාම තංභවන්තං ගොතමංදස්සනායඋපසංකමිතුං. සමණොඛලුභොගොතමො මහන්තංඤාතිසංඝංඔහායපබ්බජිතො. සමණො ඛලු භො ගොතමො පහූතං හිරඤ්ඤසුවණ්ණං ඔහාය පබ්බජිතො භූමිගතඤ්ච වෙහාසට්ඨඤ්ච. සමණො ඛලු භො ගොතමො දහරොව සමානො සුසු කාළකෙසො භද්‍රෙන යොබ්බනෙන සමන්නාගතො පඨමෙන වයසා. අගාරස්මා අනගාරියං පබ්බජිතො සමණො ඛලු භො ගොතමො අකාමකානං මාතාපිතුන්නං අස්සුමුඛානං රුදන්තානං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිතො. සමණො ඛලු භො ගොතමො අභිරූපො දස්සනීයො පාසාදිකො පරමාය වණ්ණ පොක්ඛරතාය සමන්නාගතො බ්‍රහ්මවණ්ණී බ්‍රහ්මවච්ඡසී අඛුද්දාවකාසො දස්සනාය. සමණො ඛලු භො ගොතමො. සීලවා අරියසීලී කුසලසීලී කුසලසීලෙන සමන්නාගතො. සමණො ඛලු භො ගොතමො. කල්‍යාණවාචො කල්‍යාණවාක්කරණො පොරියා වාචාය සමන්නාගතො විස්සට්ඨාය අනෙලගලාය අත්ථස්ස විඤ්ඤාපනීයා.

එසේ ඇතිකල්හි අපිම ඒභවද් ගෞතමයන්වහන්සේ දක්මටඑලඹෙන්නටසුදුස්සෝවෙමු. ශ්‍රමණභවද්ගෞතමයන්වහන්සේවූකලිමහත්වූ ඤාතිසමූහයා හැර පැවිදිවූයේය. ශ්‍රමණ භවද් ගෞතමයන්වහන්සේවූකලි භූමිගතවූද, ආකාශගතවූද, බොහෝවූ හිරණ්‍යසවර්ණයන්හැර පැවිදිවූයේය. ශ්‍රමණ භවද් ගෞතමයන්වහන්සේ වූකලි බාලවූයේම තරුණභාවයෙන් යුක්තවූයේකලුහිසකෙස්ඇත්තේ යහපත් යොවුන් බැවින් හා පළමුවෙනිවයසින් යුක්තවූයේම ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවූයේය. ශ්‍රමණ භවද් ගෞතමයන්වහන්සේ වූකලි නොකැමැත්තාවූ මව්පියන්කඳුලුපිරුණු මුහුණුඇතිව අඬද්දී නොහොත් අඬන්නාවූ මව්පියන්ට අනාදරකොට කෙස්දැලිරැවුලු හරවා කාසාය වස්ත්‍රයන් අන්දවා ගිහිගෙයින් නික්ම සස්නෙහිපැවිදිවූයේය. ශ්‍රමණ භවද් ගෞතමයන්වහන්සේ වූකලි උත්තම රූප ඇත්තේය. දැකුම් කටයුත්තේය. ප්‍රසාද එලවන්නේය. උත්තම වර්ණ සෞන්දර්‍ය්‍යයෙන් යුක්තසේක. ශ්‍රේෂ්ඨ ස්වර්ණවර්ණ ඇත්තේය. මහබඹහුගේ ශරීරය සමාන ශරීරයෙන් සමන්විතසේක. දැක්මට ස්වල්පවූ අවකාශ ඇත්තේය. ශ්‍රමණ භවද් ගෞතමයන්වහන්සේ චතුපාරි ශුද්ධශීල ඇත්තේය. ආර්‍ය්‍ය ශීල ඇත්තේය. නිර්දෝෂවූ ශීල ඇත්තේය. නිර්දෝෂ ශීලයෙන් සමන්විතවේ. ශ්‍රමණ භවද් ගෞතමයන්වහන්සේ වූකලි යහපත් වචන ඇත්තේය. යහපත් වචන කිරීම් ඇත්තේය. ගුණයෙන් සම්පූර්ණවූ කර්ණරසායනවූ මධුරභාවයෙන් සිහිකටයුතුවූ නිර්දෝෂවූ ආදි මධ්‍යපර්‍ය්‍යවසාන ඝන ස්ථානත්‍රය ප්‍රකටකොට කියනලද අර්ථයාගේ අවබෝධයට සමර්ථවූ වචනයෙන් යුක්තසේක.

සමණො බලු භො ගොතමො. බහුනනං ආචරිය පාචරියො. සමණො බලු භො ගොතමො ඛීණකාමරාගො විගතචාපල්ලො. සමණො බලු භො ගොතමො කම්මවාදි කිරියවාදී අපාපපුරෙක්ඛාරො බ්‍රහ්මඤ්ඤාය පජාය. සමණො බලු භො ගොතමො උච්චා කුලා පබ්බජිතො අසම්භින්නා ඛත්තියකුලා.සමණො බලු භො ගොතමො අඩ්ඪකුලා පබ්බජිතො මහද්ධනා මහාභොගා. සමණං බලු භො ගොතමං තිරොරට්ඨා තිරොජනපදා සම්පුච්ඡිතුං ආගච්ඡන්ති. සමණං බලු භො ගොතමං අනෙකානි දෙවතාසහස්සානි පාණෙහි සරණං ගතානි. සමණං බලු භො ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො ඉතිපි සො භගවා අරහං.

ශ්‍රමණභවද් ගෞතමයන්වහන්සේ වූකලී බොහෝදෙනාගේ ආචාර්‍ය්‍ය ප්‍රාචාර්‍ය්‍යවෙයි ශ්‍රමණභවද්ගෞතමයන්වහන්සේවූකලි ක්‍ෂයකරණලද කාමරාගඇත්තේය. සර්‍වඥයන්වහන්සේ සකලක්ලේශයන්ප්‍රහාණකළනමුත්මෙහි කාමරාගය පමණක්ක්‍ෂය කළේයයි පොක්ඛරසාතිබ්‍රාහ්මණතෙමේ කීවේ. ඔහුදන්නාපමණින් බුද්ධගුණ වර්‍ණනා කිරීම හෙයිනි. පාත්‍ර චීවර මණ්ඩනාදී පහවූ චපලභාවඇත්තේය. ශ්‍රමණභවද්ගෞතමයන්වහන්සේවූකලි කර්‍මවිපාක ඇතයයන කථා ඇත්තේය. නවලොවුතුරා දහම් පසක්කිරීම සඳහා කුශලධර්‍මයන්ගේ කිරීම යහපත හෙවත් කුසල්කරව්‍යයන විධානකථා ඇත්තේය. අපාපසඞ්ඛ්‍යාත නවලොකොත්තර ධර්‍මයන් පෙරටුකොට හැසිරීම් ඇත්තේය. නොහොත් ශාරිපුත්‍ර මෞද්ගල්‍යායනාදි ප්‍රභෙදඇති ශ්‍රේෂ්ඨ සත්වවර්‍ගයාවිසින් පෙරටු කරණලද්දේ වේ. (ශ්‍රමණභවද් ගෞතමයන්වහන්සේ පෙරටුකොටගෙණ හැසිරේය යන අර්‍ථයි) ද්‍යෙහෝ නොහොත් පාපකර්‍මය පෙරටුකොට හැසිරීම් නැත්තේය. හෙවත් පාපයෙහි නොහැසිරේ. ශ්‍රමණභවද් ගෞතමයන්වහන්සේ වූකලි අසම්භින්නවූ ක්‍ෂත්‍රියකුල සඞ්ඛ්‍යාත උසස්කුලයෙන් නික්ම පැවිදිවූසේක. ශ්‍රමණභවද් ගෞතමයන්වහන්සේ වූකලි මහද්ධන ඇත්තාවූ මහත් භොගසම්පත් ඇත්තාවූ ආඪ්‍යකුලයෙන් නික්ම පැවිදිවූසේක. ශ්‍රමණභවද් ගෞතමයන් පිළිවිසින්ට අන්රටවලින්ද, අන්දනව් වලින්ද ජනයෝ:එන්නාහ. නොයෙක්දහස්ගණන්දෙවතාවෝ ශ්‍රමණභවද් ගෞතමයානන් ප්‍රාණවලින් හෙවත් දිවිහිමියෙන් පිහිටකොට ගියාහුය. ශ්‍රමණභවද් ගෞතමයන්වහන්සේගේ වූකලි මෙසේයහපත්වූ කීර්ත්ති ශබ්දයක් විශෙෂයෙන් උස්වනැංගේය. කෙසේදයත් ඒ භාග්‍යවතුන්වහන්සේ සියලුකෙලෙසුන් කෙරෙන්දුරුවූසේය. සියල්ලන්ගේ පූජාවට සුදුසුය යන මේකාරණයන්ගෙන් අර්හත්සේක.

සම්මා සම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්ම සාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවානි. සමණො ඛලු භො ගොතමො ද්වත්තිංසමහාපුරිසලක්ඛණෙහි සමන්නාගතො. සමණොඛලු භොගොතමො එහිසාගතවාදි සඛිලො සම්මොදකො අබ්භාකුටිකො උත්තානමුඛො පුබ්බභාසී.

මිනාකොට තමන්වහන්සේ සියලුදහම් අවබෝධ කෙළේය. යනමේආදි කාරණයන්ගෙන් සම්‍යක්සම්බුද්ධසේක. ත්‍රිවිද්‍යා අෂ්ටවිද්‍යා පසළොස් චරණධර්මයන්ගෙන් සම්පූර්ණය යනමේ කාරණයන්ගෙන් විජ්ජාචරණ සම්පන්නසේක. සොඳුරුගමන් ඇතිබැවින් හා සොඳුරුතැනටගියබැවින් යනමේආදිකාරණයන්ගෙන් සුගතසේක. සියලුඅයුරින් ලොව දැනගත්තේය යනමේ කාරණයෙන් ලොකවිදූසේක. තමන්වහන්සේට ශ්‍රේෂ්ඨ කෙනෙක් නැත්තේය. යන මේ කාරණයෙන් අනුත්තරසේක. දමනයකටයුතු (හික්මවියයුතු) පුරුෂයන් දමනය කෙරෙති. හෝ ඔවුන් දමනය කිරිමෙහි රථාචාර්‍ය්‍යයෙක් සමානය යන මේ කාරණයෙන් පුරිස දම්ම සාරථි සේක. දෙවිමිනිසුන්ට අනුශාසනා කෙරෙයි යන මේආදි කාරණයන්ගෙන් සත්ථුසේක. චතුස්සත්‍ය ධර්මයන් අවබොධ කෙළේය යන මේආදිකාරණයෙන් බුද්ධසේක. විනාසකරණලද රාගාදි කෙලෙසුන් ඇත්තේය. යන මේ ආදිකාරණයෙන් භගවත් සේකැයි කියායි. ශ්‍රමණභවද් ගෞතමයන්වහන්සේ වූකලි දෙතිස්මහා පුරුෂලක්ෂණයන්ගෙන් යුක්තසේක. ශ්‍රමණභවද් ගෞතමයන්වහන්සේ වූකලි දිව්‍යමනුෂ්‍ය ගෘහස්ථ ප්‍රව්‍රජිතයන් අතුරෙන් යම් කෙනෙක් තමන්වහන්සේගේ සමීපයට පැමිණියේනම් ඒ පැමිණියාහට මෙහි එව යහපත් ඊමක් වේවායි යන ආශිර්වාද කථා ඇතිසේක. කර්ණරසායනවූ මොලොක් වචන ඇතිසේක. පිළිසඳර කථාවෙහි දක්ෂසේක. තමන්වහන්සේ වෙත පැමිණියන්ගෙන් සැපදුක් කෙසේද යනාදින් විචාරිම්වසයෙන් සතුටුවියයුතුවූ මිහිරිකථා ඇතිසේක. බැම වකුටුකළ මුහුණක් නැත්තේය. හෙවත් පිරිස දැකීමෙන් පූර්ණචන්ද්‍රශ්‍රියක්මෙන් සතුටපහළ කරණසේක. සුලභකථා ඇත්තේය. හෙවත් පැමිණි පිරිස සතුටුකරණ මනහරදම් දෙසුම් ඇතිසේක. පළමුකොට කරණකථා ඇත්තේය. හෙවත් කාලයට සුදුසුවූ අර්ථනිශ්‍රිතවූ ධාර්මික කථා ඇතිසේක.

සමණො ඛලු භො ගොතමො චතුන්නං පරිසානං සක්කතො ගරුකතො මානිතො පූජිතො අපචිතො. සමණෙ ඛලු භො ගොතමෙ බහූ දෙවා මනුස්සා ච අභිප්පසන්නා. සමණො ඛලු භො ගොතමො යස්මිං ගාමෙ වා නිගමෙ වා පටිවසති න තස්මිං ගාමෙ වා නිගමෙ වා අමනුස්සා මනුස්සෙ විහෙඨෙන්ති. සමණො ඛලු භො ගොතමො සඞ්ඝී ගණී ගණාචරියො පුථුතිත්ථකරානං අග්ගමක්ඛායති. යථා ඛො පන භො එකෙසං සමණබ්‍රාහ්මණානං යථා වා තථා වා යසො සමුදාගච්ඡති න හෙවං සමණස්ස ගොතමස්ස යසො සමුදාගතො. අථ ඛො අනුත්තරාය විජ්ජාචරණසම්පදාය සමණස්ස ගොතමස්ස යසො සමුදාගතො. සමණං ඛලු භො ගොතමං රාජා මාගධො සෙනියො බිම්බිසාරො සපුත්තො සභරියො සාමච්චො පාණෙහි සරණං ගතො. සමණං ඛලු භො ගොතමං රාජා පසෙනදි කොසලො සපුත්තො සභරියො සපරිසො සාමච්චො.

ශ්‍රමණභවද් ගෞතමයන්වහන්සේ වූකලි භික්ෂුණ්‍යාදි සිව්පිරිස විසින් සත්කාරකරණලද්දේය. ගරුකරණලද්දේය. බුහුමන්කරණ ලද්දේය. පුදනලද්දේය. සත්කාර පූර්වක ප්‍රණිපාතයෙන් ආදරසහිතව පුදනලද්දේය. ශ්‍රමණභවද් ගෞතමයන්වහන්සේ කෙරෙහි බොහෝ දෙවියෝද, මනුෂ්‍යයෝද විශෙෂයෙන් ප්‍රසන්නයහ. ශ්‍රමණභවද් ගෞතමයන්වහන්සේවූකලි යම් ගමක හෝ නියම්ගමක වාසය කරණසේක්ද, ඒ ගමෙහි හෝ නියම් ගමෙහි අමනුෂ්‍යයෝ මිනිසුන්ට නානාවිධ හිංසාපීඩා කිරිමෙන් නොවෙහෙසත්. ශ්‍රමණභවද් ගෞතමයන්වහන්සේ වූකලි මහාකාශ්‍යපාදි මහරහත් පැවිදිසමූහයා ඇත්තේය. ගෘහස්ථසමූහයා ඇත්තේය. ගණාචාර්‍ය්‍යද වේ. බොහෝලබ්ධි උපදවන්නන් අතුරෙන් ශ්‍රේෂ්ඨයයි කියනුලැබේ. පින්වත්නි, යම්සේ ඇතැම් මහණ බමුණන්ගේ යසස අචෙලකාදි කිසියම්කරුණකින් උසස්බවට පැමිණේ. ශ්‍රමණභවද් ගෞතමයන්වහන්සේගේ යසස එසේ අචෙලකතාදි කරුණකින් වැඩීමට නොපැමිණියේය. කෙසේ වැඩීමට පැමිණියේදයත්, ශ්‍රේෂ්ඨවූ විද්‍යාචරණසම්පත්තියෙන් ශ්‍රමණභවද් ගෞතමයන්වහන්සේගේ යසස වැඩීමෙන් උසස්බවට පැමිණියේය. පුත්‍රයන්සහිතවූ භාර්‍ය්‍යාවන් (දේවීන්) සහිතවූ ඇමතියන්සහිතවූ මගධ ජනපදාධිපතිවූ බොහෝ සේනා ඇත්තාවූ බිම්සර රජතෙමේ දිවිහිමියෙන් ශ්‍රමණභවද් ගෞතමයානන් පිහිටකොට ගියේය. පුත්‍රයන්සහිතවූ භාර්‍ය්‍යාවන්සහිතවූ පිරිස්සහිතවූ ඇමතියන්සහිතවූ පසේනදි කොසොල් රජතෙමේ ශ්‍රමණභවද් ගෞතමයන්යානන්

පාණෙහි සරණං ගතො. සමණං ඛලු භො ගොතමං බ්‍රාහ්මණො පොක්ඛරසාති සපුත්තො සභරියො සපරිසො සාමච්චො පාණෙහි සරණං ගතො. සමණො ඛලු භො ගොතමො රඤ්ඤො මාගධස්ස සෙනියස්ස බිම්බිසාරස්ස සක්කතො ගරුකතො මානිතො පූජිතො අපචිතො. සමණො ඛලු භො ගොතමො රඤ්ඤො පසෙනදිකොසලස්ස සක්කතො ගරුකතො මානිතො පූජිතො අපචිතො. සමණො ඛලු භො ගොතමො බ්‍රාහ්මණස්ස පොක්ඛරසාතිස්ස සක්කතො ගරුකතො මානිතො පූජිතො අපචිතො. සමණො ඛලු භො ගොතමො චම්පං අනුප්පත්තො චම්පායං විහරති ගග්ගරාය පොක්ඛරණියා තීරෙ. යෙ ඛො පන කෙචි සමණා වා බ්‍රාහ්මණා වා අම්හාකං ගාමඛෙත්තං ආගච්ඡන්ති අතිථී නො තෙ හොන්ති. අතිථී ඛො පනම්හෙහි සක්කාතබ්බා ගරුකාතබ්බා මානෙතබ්බා පූජෙතබ්බා අපචෙතබ්බා. යම්පි භො සමණො ගොතමො චම්පං අනුප්පත්තො

දිවිහිම්යෙන් සරණකොට ගියේය. පුත්‍රයන්සහිතවූ භාර්‍ය්‍යාවන් සහිතවූ පිරිස්සහිතවූ ඇමතියන්සහිතවූ පොක්ඛරසාති බ්‍රාහමණ තෙමේ ශ්‍රමණභවද් ගෞතමයානන් දිවිහිම්යෙන් සරණකොට ගියේය. ශ්‍රමණභවද් ගෞතමයන්වහන්සේවූකලි මගධජනපදාධිපතිවූ බොහෝ සේනාඇත්තාවූ බිම්සරරජහු විසින් සත්කාර කරණලද්දේය. බුහුමන්කරණ ලද්දේය. පුදනලද්දේය. සත්කාර පූජිකප්‍රණිපාතයෙන් පුදනලද්දේය. ශ්‍රමණ භවද්ගෞතමයන්වහන්සේ පසේනදී කොසොල්රජහුවිසින් සත්කාර කරණලද්දේය. ගරු කරණලද්දේය. බුහුමන්කරණලද්දේය. පුදනලද්දේය. සත්කාර පූජිකප්‍රණිපාතයෙන් ආදරසහිතව පුදනලද්දේය. ශ්‍රමණ භවද් භෞතමයන්වහන්සේ පොක්ඛරසාති බ්‍රාහ්මණයාවිසින් සත්කාරකරණලද්දේය. ගරුකරණලද්දේය. බුහුමන්කරණලද්දේය පුදනලද්දේය. සත්කාර පූජිකප්‍රණිපාතයෙන් ආදරසහිතව පුදනලද්දේය. ශ්‍රමණ භවද් ගෞතමයන්වහන්සේ චනාහි චම්පාපුරියට වැඩිසේක් චම්පාපුරියෙහිවූ ගග්ගරානම් පොකුණුතෙර වාසයකරණසේක. යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ අපගේ ග්‍රාමසීමාවට එත්ද, ඔව්හු ආගන්තුගයෝ වෙත්. ආගන්තුකව පැමිණියෝවූකලි අපවිසින් සත්කාරකටයුත්තෝ වෙත්. ගරුකටයුත්තෝ වෙත් බුහුමන්කටයුත්තෝ වෙත්. පිදියයුත්තෝ වෙත්. සත්කාර පූජිකප්‍රණිපාතයෙන් ආදරසහිතව පිදියයුත්තෝ වෙත්. පින්වත්නි, යම්හෙයකින් ශ්‍රමණ ගෞතමයන්වහන්සේ චම්පාපුරියට පිළිවෙළින් පැමිණිසේක්ද,

චම්පායං විහරති ගග්ගරාය පොක්ඛරණියා තීරෙ, අතිථම්හාකං සමණො ගොතමො. අතිථි ඛො පනම්හෙහි සක්කාතබ්බා ගරුකාතබ්බා මානෙතබ්බා පූජෙතබ්බා අපචෙතබ්බා. ඉමිනා පඞ්ගෙන නාරහති සො භවං ගොතමො අම්හාකං දස්සනාය උපසංකමිතුං, අථ ඛො මයමෙව අරහාම තං භගවන්තං ගොතමං දස්සනාය උපසංකමිතුං. එත්තකෙ ඛො අහං භො තස්ස භොතො ගොතමස්ස වණ්ණෙ පරියාපුණාමි, නොච ඛො සො භවං ගොතමො එත්තකවණ්ණො, අපරිමාණවණ්ණොහි සො භවං ගොතමොති.

7. එවං වුත්තෙ තෙ බ්‍රාහ්මණා සොණදණ්ඩං බ්‍රාහ්මණං එතදවොචුං. යථා ඛො භවං සොණදණ්ඩො සමණස්ස ගොතමස්ස වණ්ණෙ භාසති ඉතො චෙපි සො භවං ගොතමො යොජනසතෙ විහරති අලමෙව සද්ධෙන කුලපුත්තෙන දස්සිතාය උපසංකමිතුං අපිපුටංසෙනාපි.

චම්පාපුරියෙහිවූ ගග්ගරානම් පොකුණුතෙරවූ සපුවනයෙහි වාසයකරණසේක්ද ඒ ශ්‍රමණ ගෞතමයන්වහන්සේ අපගේ ආගන්තුකයි. ආගන්තුකව පැමිණි තැනැත්තේ වූකලි අපවිසින් සත්කාරකටයුත්තේ වේ. ගරුකටයුත්තේ වේ. බුහුමන්කටයුත්තේ වේ. පිදියයුත්තේ වේ. සත්කාර පූර්වකප්‍රණිපාතයෙන් ආදරසහිතව පිදියයුත්තේ වේ. මේකාරණයෙන්ද ඒ භවද් ගෞතමයන්වහන්සේ අපගේ දැක්මපිණිස එලඹෙන්නට සුදුස්සෙක් නොවේ. එසේකල්හි කාරණයෙක් ඇත්තේමය. අපිම ඒ භවද් ගෞතමයන්වහන්සේ දැක්මපිණිස එලඹෙන්නට සුදුස්සෝවෙමු. පින්වත්නි, මම ඒ භවද් ගෞතමයන්වහන්සේගේ මෙපමණක්ම ගුණවර්ණනාව දනිමි. ඒ භවද් ගෞතමයන්වහන්සේ මෙපමණ ස්වල්ප ගුණවර්ණනා ඇත්තෙක් නොවේ. ඒ භවද් ගෞතමයන්වහසේ සර්වතාඥනාදි වශයෙන් අප්‍රමාණ ගුණවර්ණනා ඇත්තේය. ඒහෙයින් මාවැනි ලාමක ප්‍රඥ ඇත්තෙක් ඒ සමස්ත බුඩගුණය ඒකසේනම් වර්ණනාකරන්නේද නොහැක්කේමැයිසේයි.

7 මෙසේ කීකල්හි ඒබ්‍රාහ්මණයෝ සොණදණ්ඩ බ්‍රාහ්මණයාහට මේ කාරණය දන්වූහ. යම්සේ පින්වත් සොණදණ්ඩතෙමේ ශ්‍රමගෞතමයානන්වහන්සේගේ ගුණවර්ණනාවන්කියාද. ඒභවද්ගෞතමයන්වහන්සේ මෙයින් යොදුන් සියයයකින් මත්තෙහි වාසය කෙරේද, සැදැහැති කුලපුත්‍රයාවිසින් උන්වහන්සේ දැකීම පිණිස මාර්ගෝපකරණගෙණද, එලඹෙන්නට සුදුසුයි.

තෙනහි භො සබ්බෙව සමණං ගොතමං දස්සනාය උපසංකමිස්සාමාති. අථ ඛො සොණදණ්ඩො බ්‍රාහ්මණො මහතා බ්‍රාහ්මණගණෙන සද්ධිං යෙන ගග්ගරා පොක්ඛරණී තෙනුපසංකමි.

8. අථ ඛො සොණදණ්ඩස්ස බ්‍රාහ්මණස්ස තිරොවනසණ්ඩගතස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි. අහඤ්චෙව ඛො පන සමණං ගොතමං පඤ්හං පුච්ඡෙය්‍යං, තත්‍ර චෙ මං සමණො ගොතමො එවං වදෙය්‍යං නවෙස බ්‍රාහ්මණ පඤ්හො එවං පුච්ඡිතබ්බො, එවං නාමෙස බ්‍රාහ්මණ පඤ්හො පුච්ඡිතබ්බොති. තෙන මං අයං පරිසා පරිභවෙය්‍ය බාලො සොණදණ්ඩො බ්‍රාහ්මණො අව්‍යත්තො, නාසක්ඛි සමණං ගොතමං යොනිසො පඤ්හං පුච්ඡිතුන්ති. යං ඛො පනායං පරිසා පරිභවෙය්‍ය යසොපි තස්ස හායෙථ, යස්ස ඛො පන යසො හායෙථ භොගාපි තස්ස හායෙය්‍යුං, යසො ලද්ධා ඛො පන අම්හාකං භොගා. මංචෙව ඛො පන සමණො ගොතමො පඤ්හං පුච්ඡෙය්‍ය තස්සචාහං පඤ්හස්ස වෙය්‍යාකරණෙන චිත්තං න ආරාධෙය්‍යං. තත්‍ර චෙ මං සමණො ගොතමො එවං වදෙය්‍ය. නවෙස බ්‍රාහ්මණ පඤ්හො එවං ව්‍යාකාතබ්බො,.

පින්වත්නි, එහෙනම් අපිසියල්ලෝම ශ්‍රමණගෞතමයන්වහන්සේ දකිම පිණිස එලඹෙන්නෙමුයි කීහ.

8. ඉක්බිත්තෙන් සොණදණ්ඩබ්‍රාහ්මණතෙමේ මහත් බ්‍රාහ්මණ සමූහයා සමග ගග්ගරාපොකුණ යම්තැනෙක්හිද එතනට එලඹුනේය. ඉක්බිත්තෙන් වනලැහැප්අතරට පැමිණියාවූ නොහොත් විහාරාභ්‍යන්තරයට ප්‍රවිෂ්ටවූ සොණදණ්ඩබ්‍රාහ්මණයාහට මෙබඳුවූ සිතපිළිබඳ භාත්පස කල්පනාවක් උපන්නේය. කෙසේදයත්, මම ශ්‍රමණගෞතමයානන් ප්‍රශ්න විචාරන්නෙම් නම් ඉදින් එහි ශ්‍රමණගෞතමයන්වහන්සේ බ්‍රාහ්මණය මේ ප්‍රශ්නය මෙසේ නොවිචාළ යුතුයයි මට මෙසේ කියන්නේ නම් ඒ කරණකොටගෙණ මට මේ පිරිස්තොමෝ නින්දාකරන්නේය. සොණදණ්ඩබ්‍රාහ්මණතෙමේ අඥනය, අව්‍යක්තය, හෙවත් ප්‍රශ්නවිචාරීමේ අසමර්ථය ශ්‍රමණගෞතම්යානන් නුවණින් යුක්තව ප්‍රශ්න පිළිවිසින්ට නොහැක්කේය කියායි, යමෙකුන්ට වූකලි මේ පිරිස්තොමෝ නින්දාකරන්නේද ඔහුගේ යසසද පිරිහෙන්නේය. යමෙකුගේ යසස පිරිහෙන්නේද ඔහුගේ භොගයෝද පිරිහෙන්නාහ, අපගේ භොගයෝ යසසහෙතුකොටගෙණ ලබනලද්දාහුමය. ශ්‍රමණගෞතමයන්වහන්සේ ඉදින් මාද ප්‍රශ්න විචාරන්නේද මම උන්වහන්සේගේ ප්‍රශ්න විසඳීමෙන් සිතසතුටු නොකරන්නෙම් නම්, ඒකරුණ නිමිතිකොටගෙණ ශ්‍රමණගෞතමයන්වහන්සේ මට මෙසේ කියන්නේය. බ්‍රාහ්මණය මේ ප්‍රශ්නය මෙසේ ප්‍රකාශ නොකටයුතුය කියායි.

එවං නාමෙස බ්‍රාහ්මණ පඤ්හො ව්‍යාකාතබ්බොති. තෙන මං අයං පරිසා පරිභවෙය්‍ය බාලො සොණදණ්ඩො බ්‍රාහ්මණො අව්‍යත්තො නාසක්ඛි සමණස්ස ගොතමස්ස පඤ්හස්ස වෙය්‍යාකරණෙන චිත්තං ආරාධෙතුන්ති. යං ඛො පනායං පරිසා පරිභවෙය්‍ය යසොපි තස්ස හායෙථ, යස්ස ඛො පන යසො හායෙථ භොගාපි තස්ස හායෙය්‍යුං, යසොලද්ධා ඛො පනම්හාකං භොගා. අහං චෙව ඛො පන එවං සම්පගතො සමානො අදිස්වා සමණං ගොතමං නිවත්තෙය්‍යං තෙන මං අයං පරිසා පරිභවෙය්‍ය. බාලො සොණදණ්ඩො බ්‍රාහ්මණො අව්‍යත්තො මානත්ථද්ධො භීතොච, නො විසහි සමණං ගොතමං දස්සනාය උපසඞ්කමිතුං, කථංහි නාම එවං සම්පගතො සමානො අදිස්වා සමණං ගොතමං නිවත්තිස්සතීති. යං ඛො පනායං පරිසා පරිභවෙය්‍ය යසොපි තස්ස හායෙථ, යස්ස ඛො පන යසො හායෙථ භොගාපි තස්ස හායෙය්‍යුං, යසොලද්ධා ඛො පනම්හාකං භොගාති.

9. අථ ඛො සොණදණ්ඩො බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසංකමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං.

බ්‍රාහ්මණය, මේ ප්‍රශ්නය මෙසේනම් ප්‍රකාශකටයුතුය කියායි. ඒකරණකොටගෙණ මේ පිරිස් තොමෝ මට නින්දාකරන්නේය, කෙසේද සොණදණ්ඩබ්‍රාහ්මණතෙමේ අඥානය, ප්‍රශ්නව්‍යාකරණයෙහි ප්‍රතිබලරහිතය, ශ්‍රමණගෞතමයානන්වහන්සේගේ ප්‍රශ්න විසඳීමෙන් සිත්ගන්ට නොහැක්කේය කියායි. යමෙකුට මේ පිරිස් තොමෝ නින්දාකරන්නේද ඔහුගේ යසසද පිරිහෙන්නේය, යමෙකුගේ යසසපිරිහෙන්නේනම් ඔහුගේ භොගයෝද පිරිහෙන්නාහ, අපගේ භොගයෝ යසසහෙතුකොටගෙණ ලබනලද්දාහුමය මමවූකලි මෙසේ සම්පයට පැමිණියේම ශ්‍රමණ ගෞතමයන්වහන්සේ නොදැක නවතින්නෙම් නම් ඒ කරණකොටගෙණ මේ පිරිස් තොමෝ මට නින්දාකරන්නේය. කෙසේද ? සොණදණ්ඩබ්‍රාහ්මණතෙමේ අඥානය. ප්‍රතිබලරහිතය. තදමත් ඇත්තේය. බියපත්වූයේම ශ්‍රමණගෞතමයානන් දැකීමට එළඹෙන්ට නොහැක්කේ විය. කෙසේනම් මෙසේ සම්පයට පැමිණියේම ශ්‍රමණගෞතමයන්වහන්සේ නොදැක නවතින්නේදැයි කියායි. යමෙකුට මේ පිරිස්තොමෝ නින්දාකරන්නේද, ඔහුගේ යසසද පිරිහෙන්නේය. යමෙකුගේ වූකලි යසස පිරිහෙන්නේනම් ඔහුගේ භොගසම්පත්තිහුද පිරිහෙන්නාහ. අපගේ භොගසම්පත්තිහු යසස හෙතුකොටගෙණ ලබනලද්දාහුමය කියායි.

9. ඉක්බිත්තෙන් සොණදණ්ඩබ්‍රාහ්මණතෙමේ භාග්‍යවතුන්වහන්සේ යම්තැනෙක්හිද එතනට එළඹියේය. එළඹ භාග්‍යවතුන්වහන්සේ සමග සතුටුවූයේය. සතුටුවියයුතුවූ.

කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. චම්පෙය්‍යකාපි ඛො බ්‍රාහ්මණගහපතිකා අප්පෙකච්චෙ භගවන්තං අභිවාදෙත්වා එකම න්තං නිසීදිංසු, අප්පෙකච්චෙ භගවතා සද්ධිං සම්මොදිංසු සම්මො දනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙ කච්චෙ යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා එකමන්තංනිසීදිංසු. අප්පෙකච්චෙ නාමගොත්තං සාවෙත්වා එකමන්තං නිසීදිංසු, අප්පෙ කච්චෙ තුණ්හීභූතා එකමන්තං නිසීදිංසු.

10. තත්‍රපි සුදං සොණදණ්ඩො බ්‍රාහ්මණො බහුලං අනුවිතක්කෙන්තො නිසින්නො හොති අහං චෙව ඛො පන සමණං ගොතමං පඤ්හං පුච්ඡෙය්‍යං තත්‍ර චෙ මං සමණො ගොතමො එවං වදෙය්‍ය න චෙස බ්‍රාහ්මණ පඤ්හො එවං පුච්ඡිතබ්බො එවං නාමෙස බ්‍රාහ්මණ පඤ්හො පුච්ඡිතබ්බොති.තෙන මං අයං පරිසා පරිභවෙය්‍ය බාලො සොණදණ්ඩො බ්‍රාහ්මණො අව්‍යත්තො නාසක්ඛි සමණං ගොතමං යොනිසො පඤ්හං පුච්ඡිතුන්ති.

සිහිකටයුතුවූ කථාවකොට නිමවා සමීපවූ එක් පෙදෙසෙක්හි උන් නේය.චම්පාපුරවැසිබමුණුගැහැවියෝද ඇතම්කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ සකසාවැඳ සමීපවූ එක්පෙදෙසෙක්හි උන්හ.ඇතම්කෙනෙ ක් භාග්‍යවතුන්වහන්සේසමග සතුටුවූහ. සතුටුවියයුතුවූ සිහිකට යුතුවූ කථාවකොට නිමවා සමීපවූ එක්පෙදෙසෙක්හි උන්හ.ඇතම්කෙ නෙක් භාග්‍යවතුන්වහන්සේ යම්තැනෙක්හිද ඒදෙසට අඤ්ජලිප්‍රණාමයකොට සමීපවූ එක් පෙදෙසෙක්හි උන්හ. ඇතම්කෙනෙක් නම් ගොත් අස්වා සමීපවූ එක් පෙදෙසෙක්හි උන්හ. ඇතම්කෙනෙක් නිශ්ශබ්දවූවෝ සමීපවූ එක් පෙදෙසෙක්හි උන්හ.

10. එහිදීද සොණදණ්ඩබ්‍රාහ්මණතෙමේ බොහෝසේ නැවත නැවත විතර්‍කණයකරමින් උන්නේ වේ. මමම ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ප්‍රශ්න විචාරන්නෙම් නම් ඉදින් ඒ කරුණෙහිදී ශ්‍රමණ ගෞතමයන්වහන්සේ මෙසේ කියන්නේ නම් බ්‍රාහ්මණය මේ ප්‍රශ්නය මෙසේ නොවිචාළයුතුයි. බ්‍රාහ්මණය, මේ ප්‍රශ්නය මෙසේ විචාළයුතුය කියායි. ඒකරණකොටගෙණ මේ පිරිස්තොමෝ මට පරිභවකරන්නේය. කෙසේදයත්, සොණදණ්ඩ බ්‍රාහ්මණතෙමේ අඥානය. ප්‍රතිබලරහිතය. ශ්‍රමණ ගෞතමයානන් නුවණින් යුක්තව ප්‍රශ්න විචාරන්නට නොහැක්කේය කියායි.

යං ඛො පනායං පරිසා පරිභවෙය්‍ය යසොපි තස්ස හායෙථ යස්ස ඛො පන යසො හායෙථ භොගාපි තස්ස හායෙය්‍යුං, යසො ලද්ධා ඛො පනම්හාකං භොගා. මංචෙව ඛො පන සමණො ගොතමො පඤ්හං පුච්ඡෙය්‍ය තස්ස චාහං පඤ්හස්ස වෙය්‍යාකරණෙන චිත්තං න ආරාධෙය්‍යං, තත්‍ර චෙ මං සමණො ගොතමො එවං වදෙය්‍ය නාවෙස බ්‍රාහ්මණ පඤ්හො එවං ව්‍යාකාතබ්බො එවං නාමෙස බ්‍රාහ්මණ පඤ්හො ව්‍යාකාතබ්බොති, තෙන මං අයං පරිසා පරිභවෙය්‍ය බාලො සොණදණ්ඩො බ්‍රාහ්මණො අව්‍යත්තො, නාසක්ඛි සමණස්ස ගොතමස්ස පඤ්හස්ස වෙය්‍යාකරණෙන චිත්තං ආරාධෙතුන්ති. යං ඛො පනායං පරිසා පරිභවෙය්‍ය යසොපි තස්ස හායෙථ, යස්ස පන යසො හායෙථ භොගාපි තස්ස හායෙය්‍යුං, යසො ලද්ධා ඛො පනම්හාකං භොගා. අහො වත මං සමණො ගොතමො සකෙ ආචරියකෙ තෙවිජ්ජකෙ පඤ්හං පුච්ඡෙය්‍ය අද්ධාවතස්සාහං චිත්තං ආරාධෙය්‍යං පඤ්හස්ස වෙය්‍යාකරණෙනාති.

යම්හෙයකින් යමෙකුට මේ පිරිස්තොමෝ නින්දාකරන්නේද ඔහුගේ යසසද පිරිහෙන්නේය. යමෙකුගේ යසස පිරිහෙන්නේනම් ඔහුගේ භොගසම්පත්තීහුද පිරිහෙන්නාහ. අපගේ භොගසම්පත්තීහු යසස හෙතුකොටගෙණම ලබනලද්දාහුය. ශ්‍රමණගෞතමයන්වහන්සේ ඉදින් මාද ප්‍රශ්නවිචාරන්නේනම් ඒ ප්‍රශ්න විසඳීමෙන් උන්වහන්සේගේ සිත සතුටුනොකරන්නෙම්නම් ඒ කාරණය නිමිතිකොටගෙණ ශ්‍රමණගෞතමයන්වහන්සේ මට මෙසේ කියන්නේනම් බ්‍රාහ්මණය, මේ ප්‍රශ්නය මෙසේ ප්‍රකාශනොකටයුත්තේය කියාසි. ඒකරණකොටගෙණ මේ පිරිස්තොමෝ මට හෙළාදකින්නේය. කෙසේද. සොණදණ්ඩබ්‍රාහමණතෙමෙ අඥානය. ප්‍රතිබලරහිතය. ප්‍රශ්න විසඳීමෙන් ශ්‍රමණගෞතමයන්වහන්සේගේ සිත සතුටුකරන්නට නොහැක්කේය කියාසි. යම්හෙයකින් මේ පිරිස්තොමෝ නින්දාකරන්නේනම් ඔහුගේ යසස පිරිහෙන්නේය. යමෙකුගේ යසස පිරිහේනම් ඔහුගේ භොගසම්පත්තීහුද පිරිහෙන්නාහ. අපගේ භොගසම්පත්තීහු යසස හෙතුකොටගෙණ ලබනලද්දාහුමය. ශ්‍රමණගෞතමයන්වහන්සේ ස්වකීය ආචාර්‍ය්‍යයන්විසින් හදාරවනලද්දාවූ නොහොත් තමාගේ ආචාර්‍ය්‍යභාවයඇති ත්‍රිවිද්‍යාවිෂයෙහි මා ප්‍රශ්න විචාරන්නේනම් ඉතා යෙහෙක. එකාන්තයෙන්ම මම උන්වහන්සේගේ සිත ප්‍රශ්න විසඳීමෙන් සතුටුකරන්නෙම්යි සිතුයේය.

334 11. අථ ඛො භගවතො සොණදණ්ඩස්ස බ්‍රාහ්මණස්ස චෙතසා චෙතො පරිවිතක්කමඤ්ඤාය එතදහොසි. විහඤ්ඤති ඛො අයං සොණදණ්ඩො බ්‍රාහ්මණො සකෙන චිත්තෙන. යන්නූනාහං සොණදණ්ඩං බ්‍රාහ්මණං සවෙ ආචරියකෙ තෙවිජ්ජකෙ පඤ්හං පුච්ඡෙය්‍යන්ති අථ ඛො භගවා සොණදණ්ඩං බ්‍රාහ්මණං එතදවොච. කතිහිපන බ්‍රාහ්මණ අඞ්ගෙහි සමන්නාගතං බ්‍රාහ්මණා බ්‍රාහ්මණං පඤ්ඤපෙන්ති, බ්‍රාහ්මණොස්මීතිච වදමානො සම්මාවදෙය්‍ය නච පන මුසාවාදං ආපජ්ජෙය්‍යාති.

12. අථ ඛො සොණදණ්ඩස්ස බ්‍රාහ්මණස්ස එතදහොසි. යං වත නො අහොසි ඉච්ඡිතං යං ආකඞ්ඛිතං යං අධිප්පෙතං යං පත්ථිතං අහො වත මං සමණො ගොතමො සකෙ ආචරියකෙ තෙවිජ්ජකෙ පඤ්හං පුච්ඡෙය්‍ය, අද්ධාව තස්සාහං චිත්තං ආරාධෙය්‍යං පඤ්හස්ස වෙය්‍යාකරණෙනාති.

---

11. ඉක්බින්තෙන් භාග්‍යවතුන්වහන්සේ සොණදණ්ඩබ්‍රාහ්මණයාගේ සිත පිළිබඳවූ හාත්පස විතර්කය තමන්වහන්සේගේ සිතින් දැන වදරා මේ අදහස ඇතිවිය. කෙසේදයත්! මේ බ්‍රාහ්මණතෙමේ තමාගේ සිතකරණකොටගෙණ වෙහෙසට පැමිණේ. එකාන්තයෙන් මම සොණදණ්ඩබ්‍රාහ්මණයා ස්වකීය ආචාර්‍ය්‍යයන්විසින් හදරවනලද්දාවූ නොහොත් තමාගේ ආචාර්‍ය්‍යභාවය ඇත්තාවූ ත්‍රිවිද්‍යාවිෂයෙහි ප්‍රශ්න විචාරන්නෙම්නම් ඉතා යෙහෙකැයි කියායි- ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ සොණදණ්ඩබ්‍රාහ්මණයාහට මේ කාරණය වදාළේය. බ්‍රාහ්මණය කරුණුකීයකින් යුක්තවූවහු බ්‍රාහ්මණයයි බ්‍රාහ්මණයෝ පණවද්ද බ්‍රාහ්මණවෙමියි කියනතැනැත්තේ මනාකොට මෙය කියන්නේය. බොරුකීමට නොපැමිණෙන්නේමය.

12. ඉක්බිත්තෙන් සොණදණ්ඩබ්‍රාහ්මණයාහට මේ සිත විය. එකාන්තයෙන් අපවිසින් යමක් කැමතිවන ලද්දේද. යමක් ආකාංසා කරණලද්දේද, යමක් අදහස් කරණලද්දේද, යමක් බොහෝ සෙයින් පතනලද්දේද, ඒනම් ශ්‍රමණ ගෞතමයන්වහන්සේ ස්වකීය ආචාර්‍ය්‍යයන්විසින් හදරවනලද්දාවූ නොහොත් තමාගේ ආචාර්‍ය්‍යභාවයඇති ත්‍රිවිද්‍යාවිෂයෙහි මා ප්‍රශ්න විචාරන්නේනම් එකාන්තයෙන් ඒ ප්‍රශ්නවිසඳීමෙන් උන්වහන්සේගේ සිත සතුටු කරන්නෙමි කියායි.

තත්‍ර මං සමණො ගොතමො සකෙ ආචරියකෙ තෙවිජ්ජකෙ පඤ්හං පුච්ඡති. අද්ධාව තස්සාහං චිත්තං ආරාධෙස්සාමි පඤ්හස්ස වෙය්‍යාකරණෙනාති.

13. අථ ඛො සොණදණ්ඩො බ්‍රාහ්මණො අබ්භුන්නාමෙත්වා කායං අනුවිලොකෙත්වා පරිසං භගවන්තං එතදවොච. පඤ්චහි භො ගොතම, අඞ්ගෙහි සමන්නාගතං බ්‍රාහ්මණා බ්‍රාහ්මණං පඤ්ඤපෙන්ති, බ්‍රාහ්මණොස්මීතිච වදමානො සම්මාවදෙය්‍ය නච පන මුසාවාදං ආපජ්ජෙය්‍ය. කතමෙහි පඤ්චහි. ඉධ භො බ්‍රාහ්මණො උභතො සුජාතො හොති මාතිතොච පිතිතොච සංසුද්ධගහණිකො යාව සත්තමා පිතාමහයුගා අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන. අජ්ඣායකො හොති මන්තධරො තිණ්ණං වෙදානං පාරගූ සනිඝණ්ඩුකෙටුභානං සාක්ඛරප්පභෙදානං ඉතිහාස පඤ්චමානං පදකො වෙය්‍යාකරණො ලොකායතමහාපුරිසලක්ඛණෙසු අනවයො. අභිරූපො හොති දස්සනියො පාසාදිකො පරමාය වණ්ණ පොක්ඛරතාය සමන්නාගතො.

ඒ කාරණයෙහි ශ්‍රමණගෞතමයන්වහන්සේ ස්වකීය ආචාර්‍ය්‍යයන් විසින් හදාරවනලද්දාවූ නොහොත් තමාගේ ආචාර්‍ය්‍යභාවය ඇති ත්‍රිවිද්‍යා විෂයෙහි මා ප්‍රශ්න විචාරණසේක. මම ඒ ප්‍රශ්න විසඳීමෙන් ඒකාන්තයෙන් උන්වහන්සේගේ සිත සතුටු කරන්නෙමි.

13. ඉක්බිත්තෙන් සොණදණ්ඩබ්‍රාහ්මණතෙමේ උස්වසිරුරනමා පිරිස නැවත නැවත බලා භාග්‍යවතුන්වහන්සේට මේ කාරණය සැලකළේය. භවද්ගෞතමයන්වහන්ස, බ්‍රාහ්මණයෝ කරුණුපසකින් යුක්තවූවහු බ්‍රාහ්මණයයි පණවත්. බ්‍රාහ්මණ වෙමියි කියන තැනැත්තේ මනාකොට කියන්නේය. බොරුකීමට නොපැමිණෙන්නේමය. කවරකරුණුපසකින්දයත්. පින්වතුන්වහන්ස, මේලොකයෙහි බ්‍රාහ්මණතෙමේ මව්පිය දෙපසින් යහපත්ව උපන්නේ වේද, පිරිසිදු මාතෘගර්භ ඇත්තේවේද. සත්වෙනි මහාපිතෘයුගලයදක්වා අවඥකිරීමෙන් බැහැර නොකරණලද්දේද ජාතිවාදයෙන් උපක්‍රොශ නොකරණලද්දේද වෙදමන්ත්‍ර හදාරන්නේ වෙද මන්ත්‍ර දරන්නේවේද, වෘක්ෂාදීන්ගේ නාම ප්‍රකාශක නිඝණ්ඩු ශාස්ත්‍රය හා ක්‍රියාකල්ප විකල්පප්‍රකාශක කවීන්ට ප්‍රයොජනවත් කෛටුභ ශාස්ත්‍රයද,සහිතවූ ශික්ෂානිරුක්ති සහිතවූ ඉතිහාසය පස්වෙනිකොට ඇති වෙදත්‍රය පිළිබඳ පරතෙරට පැමිණියේ වේද, පදදන්නේ වේද, ව්‍යාකරණ ශාස්ත්‍ර හදාරන්නේ වේද, විතණ්ඩවාදීන්ගේ ශාස්ත්‍ර හ මහාපුරුෂ ලක්ෂණශාස්ත්‍රයන්හි සම්පූර්ණඥානගැණීමට පැමිණියේවේද විශිෂ්ට රූපඇත්තේවේද, දැකුම්කටයුත්තේ වේද, ප්‍රසාද එළවන්නේවේද, උත්තමවර්ණ සෞන්දර්‍ය්‍යයෙන් යුක්ත වේද,

බ්‍රහ්මවණ්ණී බ්‍රහ්මවච්ඡසී අඛුද්දාවකාසො දස්සනාය. සීලවා හොති
වුඩ්ඪසීලී වුඩ්ඪසීලෙන සමන්නාගතො, පණ්ඩිතොච හොති මෙධාවී පඨ
මොවා දුතියොවා සුජං පග්ගණ්හන්තානං. ඉමෙහි ඛො භො ගොතම
පඤ්චහි අඞ්ගෙහි සමන්නාගතං බ්‍රාහ්මණා බ්‍රාහ්මණං පඤ්ඤාපෙන්ති,
බ්‍රාහ්මණොස්මීතිච වදමානො සම්මා වදෙය්‍ය. නච පන මුසාවාදං
ආපජ්ජෙය්‍යාති.

14. ඉමෙසං පන බ්‍රාහ්මණ පඤ්චන්නං අඞ්ගානං සක්කා එකං
අඞ්ගං ඨපයිත්වා චතූහි අඞ්ගෙහි සමන්නාගතං බ්‍රාහ්මණං පඤ්ඤා
පෙතුං. බ්‍රාහ්මණොස්මීතිච වදමානො සම්මාවදෙය්‍ය. නච පන මුසා
වාදං ආපජ්ජෙය්‍යාති, සක්කා භො ගොතම. ඉමෙසංහි භො ගොත
ම පඤ්චන්නං අඞ්ගානං වණ්ණං ඨපයාම. කිංහි වණ්ණො කරිස්සති,
යතො ඛො භො බ්‍රාහ්මණො උභතො සුජාතො හොති මාතිතොච
පිතිතොච සංසුද්ධගහණිකො යාව සත්තමා පිතාමහයුගා අක්ඛිත්තො
අනුපක්කුට්ඨො ජාතිවාදෙන අජ්ඣායකොච හොති මන්තධරො.

ශ්‍රෙෂ්ඨවූ සුවර්ණවර්ණ ඇත්තේ වේද, මහබඹහුගේ ශරීරයසමානවූ ශරීර
යක්ඇත්තේවේද, දැක්මටසවල්පාවකාශඇත්තේවේද සිල්ඇත්තේ වේ
ද, වඩනලද සිල් ඇත්තේවේද, සම්පූර්ණශීලයෙන් යුක්තවේද, ප්‍රඥා
ඇත්තාවූපණ්ඩිතවූයේ යාග (පරිග්‍රහ) පූජාකරන්නන් අතුරෙන්
පළමුවෙනියෙක් හෝ දෙවෙනියෙක් වේද, භවද්ගෞතමයන්වහන්ස
මේ කරුණුපසින් යුක්ත තැනැත්තා බ්‍රාහ්මණයෝ බ්‍රාහ්මණයයි
පණවත්. බ්‍රාහ්මණවෙමියි කියනතැනැත්තේ මනාකොට කියන්
නේය. බොරුකීමට නොපැමිණෙන්නේමය.

14. බ්‍රාහ්මණය, මේකරුණුපසඅතුරෙන් එක්කරුණක්හැර කරුණු
සතරකින් යුක්ත තැනැත්තා බ්‍රාහ්මණයයි පණවන්නට හැක්කේද?
බ්‍රාහ්මණ වෙමියි කියන තැනැත්තේ මනාකොට කියන්නේය, මුසා
වාදයට නොපැමිණෙන්නේමය, භවද් ගෞතමයන්වහන්ස, හැක්
කේය. භවද් ගෞතමයන්වහන්ස, මේ කරුණුපස අතුරෙන් වර්ණය
තබමු. වර්ණයතෙමේ කුමක්නම් කරන්නේද ? පින්වත්නි,
බ්‍රාහ්මණතෙමේ යම්කලකපටන් මව්පිය දෙපසින් යහපත්ව උපන්
නේ වේද, පිරිසිදු මාතෘගර්භ ඇත්තේවේද, සත්වෙනි මහාපිතෘයුග පරම්
පරාව දක්වා අවඥකිරීමෙන් බැහැරනොකරණ ලද්දේද, ජාතිවාද
යෙන් උපක්‍රොශ නොකරණ ලද්දේ වේද, වෙදමන්ත්‍ර හදාරන්නේ
වේද, වෙදමන්ත්‍ර දරන්නේ වේද,

තිණ්ණංවෙදානං පාරගූ සනිඝණ්ඩුකෙටුභානං සක්ඛරප්පභෙදානං ඉතිහාසපඤ්චමානං පදකො වෙය්‍යාකරණොලොකායත මහාපුරිසලක්ඛණෙසු අනවයො. සීලවාච හොති වුඩ්ඪසීලී වුඩ්ඪසීලෙන සමන්නාගතො පණ්ඩිතොච හොති මෙධාවී පඨමොවා දුතියොවා සුජං පග්ගණ්හන්තානං. ඉමෙහි ඛො භො ගොතම චතුහඞ්ගෙහි සමන්නාගතං බ්‍රාහ්මණා බ්‍රාහ්මණං පඤ්ඤපෙන්ති, බ්‍රාහ්මණොස්මීතිච වදමානො සම්මා වදෙය්‍ය. නච පන මුසාවාදං ආපජ්ජෙය්‍යාති.

15. ඉමෙසං පන බ්‍රාහ්මණ චතුන්නං අඞ්ගානං සක්කා එකං අඞ්ගං ඨපයිත්වා තීහි අඞ්ගෙහි සමන්නාගතං බ්‍රාහ්මණං පඤ්ඤපෙතුං, බ්‍රහ්මණොස්මීතිච වදමානො සම්මාවදෙය්‍ය නච පන මුසාවාදං ආපජ්ජෙය්‍යාති. සක්කා භො ගොතම. ඉමෙසංහි භො ගොතම චතුන්නං අඞ්ගානං මන්තෙ ඨපයාම. කිංහි මන්තා කරිස්සන්ති,

---

වෘක්ෂාදීන්ගේ නාමප්‍රකාශක නිඝණ්ඩුශාස්ත්‍රය හා ක්‍රියාකල්ප විකල්පප්‍රකාශක කවීන්ට ප්‍රයොජනවත් කෙටුභශාස්ත්‍රයද සහිතවූ ශික්ෂානිරුක්ති සහිතවූ ඉතිහාසය පස්වෙනිකොටඇති වෙදත්‍රය පිළිබඳ පරතෙරට පැමිණියේ වේද, පදදත්තේ වේද, ව්‍යාකරණ ශාස්ත්‍ර හදාරන්නේ වේද, විතණ්ඩවාදීන්ගේ ශාස්ත්‍ර හා මහාපුරුෂලක්ෂණ ශාස්ත්‍රයන්හි සම්පූර්ණ දැනගැණීමෙන් යුක්ත වේද, සිල්ඇත්තේ වේද, වඩනලද සිල්ඇත්තේ වේද, සමපූර්ණ සීලයෙන් යුක්තවේද, ප්‍රඥාඇත්තාවූ පණ්ඩිතවූයේ යාග පරිග්‍රහ කරන්නන් අතුරෙන් හෙවත් යාගහෝමාදිය කරන්නවුන් අතුරෙන් පළමුවෙනියෙක් හෝ දෙවෙනියෙක් වේද, භවද් ගෞතම යන්වහන්ස, මේ කරුණු සතරින් යුක්ත තැනැත්තා බ්‍රාහ්මණයයි බ්‍රාහ්මණයෝ පණවත්. බ්‍රාහ්මණ වෙමියි කියන තැනැත්තේ මනාකොට කියන්නේය. බොරුකීමට නොපැමිණෙන්නේමයයි සැළකළේය.

15. බ්‍රාහ්මණය මේ කරුණුසතර අතුරෙන් එක්කරුණක් හැර කරුණු තුණකින්යුක්ත තැනැත්තා බ්‍රාහ්මණයයි පණවන්ට කිමෙක හැක්කේද? බ්‍රාහ්මණ වෙමියි කියන තැනැත්තේ මනාකොට කියන්නේය. බොරුකීමට නොපැමිණෙන්නේමය. භවද් ගෞතමයන් වහන්ස, හැක්කේය. භවද් ගෞතමයන්වහන්ස, මේ කරුණු සතරින් මන්ත්‍රයන් තබමු. මන්ත්‍රයෝ කුමක්නම් කරන්නාහුද,

යතො ඛො භො බ්‍රාහ්මණො උභතො සුජාතො හොති මාතිතොච පිතිතොච සංසුද්ධගහණිකො යාව සත්තමා පිතාමහයුගා අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන, සීලවාච හොති වුඩ්ඪසීලී වුඩ්ඪසීලෙන සමන්නාගතො පණ්ඩිතොච හොති මෙධාවී පඨමොවා දුතියොවා සුජං පග්ගණ්හන්තානං. ඉමෙහි ඛො භො ගොතම තීහඞ්ගෙහි සමන්නාගතං බ්‍රාහ්මණා බ්‍රාහ්මණං පඤ්ඤාපෙන්ති, බ්‍රාහ්මණොස්මී තිච වදමානො සම්මාවදෙය්‍ය. නච පන මුසාවාදං ආපජ්ජෙය්‍යාති.

16. ඉමෙසං පන බ්‍රාහ්මණ තිණ්ණං අඞ්ගානං සක්කා එකං අඞ්ගං ඨපයිත්වා ද්වීහඞ්ගෙහි සමන්නාගතං බ්‍රාහ්මණං පඤ්ඤාපෙතුං, බ්‍රාහ්මණොස්මීතිච වදමානො සම්මාවදෙය්‍ය. නච පන මුසාවාදං ආපජ්ජෙය්‍යාති, සක්කා භො ගොතම. ඉමෙසංහි භො ගොතම තිණ්ණං අඞ්ගානං ජාතිං ඨපයාම. කිංහි ජාති කරිස්සති, යතො ඛො බ්‍රාහ්මණො සීලවාච හොති වුඩ්ඪසීලී වුඩ්ඪසීලෙන සමන්නාගතො.

පින්වතුන්නි, යම්කලකපටන් බ්‍රාහ්මණතෙම මව්පසින්ද, පියපසින්ද, යන දෙපසින් යහපත්ව උපන්නේ වේද, පිරිසිදු මාතෘගර්භ ඇත්තේ වේද,සත්වෙනි මහාපිතෘයුගපරම්පරාව දක්වා අවඥකිරීමෙන් බැහැර නොකරණලද්දේ වේද, ජාතිවාදයෙන් උපක්‍රොශ නොකරණලද්දේ වේද,සිල්ඇත්තේ වේද,වඩනලදසිල්ඇත්තේ වේද,සම්පූර්ණ සීලයෙන් යුක්ත වේද, ප්‍රඥවත් පණ්ඩිතවූයේ යාගපරිග්‍රහ කරන්නන් අතුරෙන් හෙවත් යාගහෝමාදිය පුදන්නවුන් අතුරෙන් පළමුවෙනි යෙක් හෝ දෙවෙනියෙක් වේද, භවද් ගෞතමයන්වහන්ස, මේ කරුණුතුණෙන් යුක්ත තැනැත්තා බ්‍රාහ්මණයයි බ්‍රාහ්මණයෝ පණ වත්. බ්‍රාහ්මණ වෙමියි කියන තැනැත්තේ මනාකොට කියන්නේය. බොරුකීමට නොපැමිණෙන්නේමය.

16. බ්‍රාහ්මණය,මේ කරුණුතුණ අතුරෙන් එක්කරුණක් හැර කරු ණු දෙකකින් යුක්ත තැනැත්තා බ්‍රාහ්මණයයි පණවන්ට කිමෙක හැක්කේද? බ්‍රාහ්මණ වෙමියි කියන තැනැත්තේ මනාකොට කියන් නේය.බොරුකීමට නොපැමිණෙන්නේමය. භවද්ගෞතමයන්වහන් ස,මේ කරුණුතුණෙන් ජාතිය තබමු.ජාතිතොමෝ කුමක් කරන්නීද, පින්වත්නි, බ්‍රාහ්මණතෙමේ යම්කලකපටන් සිල්ඇත්තේ වේද, වඩන ලද සිල්ඇත්තේ වේද, සම්පූර්ණ සීලයෙන් යුක්තවේද,

පණ්ඩිතොච හොති මෙධාවී පඨමො වා දුතියො වා සුජම්පගගණ්හන්තා නං. ඉමෙහි ඛො භො ගොතම ද්විහඞ්ගෙහි සමන්නාගතං බ්‍රාහ්මණා බ්‍රාහ්මණං පඤ්ඤපෙන්ති, බ්‍රාහ්මණොස්මීතිච වදමානො සච්චං වදෙය්‍ය නච පන මුසාවාදං ආපජ්ජෙය්‍යාති.

17. එවං වුත්තෙ තෙ බ්‍රාහ්මණා සොණදණ්ඩං බ්‍රාහ්මණං එතද වොචුං. මා භවං සොණදණ්ඩො එවං අවච මා භවං සොණදණ්ඩො එවං අවච අපවදතෙව භවං සොණදණ්ඩො වණ්ණං අපවදති, මන්තෙ අපවදති ජාතිං,එකංසෙන භවං සොණදණ්ඩො සමණස්සෙව ගොතමස්ස වාදං අනුපක්ඛන්දතීති.

18. අථ ඛො භගවා තෙ බ්‍රාහ්මණෙ එතදවොච. සචෙ තුම්හාකං බ්‍රාහ්මණා එවං හොති. අප්පස්සුතොච සොණදණ්ඩො බ්‍රාහ්මණො, අකල්‍යාණ වාක්කරණොච සොණදණ්ඩො බ්‍රාහ්මණො, දුප්පඤ්ඤොච සොණදණ්ඩො බ්‍රාහ්මණො නච පහොති සොණදණ්ඩො බ්‍රාහ්ම ණො සමණෙන ගොතමෙන සද්ධිං අස්මිං වචනෙ පතිමන්තෙතුන්ති,

---

ප්‍රඥඇත්තේ පණ්ඩිතවූයේ යාගහෝමපූජාදියකරන්නවුන් අතුරෙන් පළමුවෙනියෙක් හෝ දෙවෙනියෙක් වේද, භවද් ගෞතමයන් වහන්ස, මේ කරුණු දෙකින් යුක්ත තැනැත්තා බ්‍රාහ්මණයයි බ්‍රාහ්මණයෝ පණවත්. බ්‍රාහ්මණ වෙමියි කියන තැනැත්තේ මනාකොට කියන්නේය. බොරුකිමට නොපැමිණෙන්නේමය.

17. මෙසේ කිකල්හි ඒ බ්‍රාහ්මණයෝ සොණදණ්ඩ බ්‍රාහ්මණයාහට මේ කාරණය දූන්වූහ. සොණදණ්ඩ පින්වත්තෙමේ මෙසේ නොකියාවා. සොණදණ්ඩ පින්වත්තෙමේ මෙසේනොකියාවා. සොණදණ්ඩ පින්වත්තෙමේ වණ්යන්ට අපවාදකෙරේ හෙවත් නින්දකෙරේමය. මන්ත්‍රයන්ට නින්දකෙරෙයි. ජාතියට නින්දකෙරෙයි. සොණදණ්ඩ පින්වත්තෙමේ එකාන්තයෙන් මහණගොයුම්හුගේ ලබ්ධියටම පිළිවෙළින් පැමිණේයයි කීහ.

18. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ ඒ බ්‍රාහමණයන්ට මේ කාරණය වදාළේය. බ්‍රාහමණයෙනි,ඉදින්තොපට මෙබදුඅදහසක්වේද කෙසේද, සොණදණ්ඩ බ්‍රාහමණතෙමේ සවල්පවූ ඇසූපිරූතැන් ඇත්තේද, සොණදණ්ඩ බ්‍රාහ්මණතෙමේ යහපත් වචන කථාකිරීම් නැත්තේද, සොණදණ්ඩ බ්‍රාහ්මණතෙමේ යහපත් ප්‍රඥ නැත්තෙක්ද, සොණදණ්ඩ බ්‍රාහ්මණතෙමේ මේ වෙදසම්බන්ධී කථාවෙහි ශ්‍රමණ භවද් ගෞතමයන්වහන්සේ සමග ප්‍රතිකථාකරන්ටසමර්ථද නොවෙයි කියායි.

තිඨතු සොණදණ්ඩො බ්‍රාහ්මණො, තුම්හෙ මයා සද්ධිං මන්තව්හො. සචෙ පන තුම්හාකං බ්‍රාහ්මණා එවං හොති බහුස්සුතොව සොණ දණ්ඩො බ්‍රාහ්මණො, කල්‍යාණවාක්කරණොච සොණදණ්ඩො බ්‍රාහ් මණො, පණ්ඩිතොච සොණදණ්ඩො බ්‍රාහ්මණො, පහොතිච සොණ දණ්ඩො බ්‍රාහ්මණො සමණෙන ගොතමෙන සද්ධිං අස්මිං වචනෙ පති මන්තෙතුන්ති. තිඨථ තුම්හෙ. සොණදණ්ඩො බ්‍රාහ්මණො මයා සද්ධිං මන්තෙතූති.

19. එවං වුත්තෙ සොණදණ්ඩො බ්‍රාහ්මණො භගවන්තං එතද වොච. තිඨතු භවං ගොතමො, තුණ්හී භවං ගොතමො හොතු, අහ මෙව තෙසං සහ ධම්මෙන පටිවචනං කරිස්සාමීති. අථ ඛො සොණ දණ්ඩො බ්‍රාහ්මණො තෙ බ්‍රාහ්මණෙ එතදවොච. මා භවන්තො එවං අවචුත්‍ථ. මා භවන්තො එවං අවචුත්‍ථ. අපවදන්තෙව භව සොණදණ්ඩො වණ්ණං අපවදති මන්තෙ අපවදති ජාතිං එකංසෙන භවං සොණ දණ්ඩො සමණස්සෙව ගොතමස්ස වාදං අනුපක්ඛන්දතීති. නාහං භො අපවදාමි වණ්ණං වා මන්තෙ වා ජාතිං වාති.

සොණදණ්ඩ බ්‍රාහ්මණතෙමේ සිටීවා. තෙපි මාසමග මන්ත්‍ර ණය කරව්. බ්‍රාහ්මණයෙනි, සොණදණ්ඩ බ්‍රාහ්මණතෙමේ බහුශ්‍රැත වේයයිද, සොණදණ්ඩ බ්‍රාහ්මණතෙමේ යහපත් වචන කථාකිරීම් ඇත්තේයයිද, සොණදණ්ඩ බ්‍රාහ්මණතෙමේ පණ්ඩිතයයිද, සොණ දණ්ඩ බ්‍රාහ්මණතෙමේ ශ්‍රමණ ගෞතමයන්වහන්සේ සමග මේ වෙද සම්බන්ධි කථාවෙහි ප්‍රතිකථාකරන්නට සමර්ථයයිද ඉදින් තොපට මේ අදහස වේනම් තෙපි සිටිව්. (නවතිව්.) සොණදණ්ඩ බ්‍රාහ්මණ තෙමේ මා සමග මන්ත්‍රණයකෙරේවායි වදාළෝ.

19. මෙසේ වදාළකල්හි සොණදණ්ඩ බ්‍රාහ්මණතෙමේ භාග්‍ය වතුන්වහන්සේට මේ කාරණය සැළකළේය. භවද් ගෞතමයන් වහන්සේ සිටීවා හෙවත් නවතිනසේක්වා. භවද් ගෞතමයන්වහන් සේ නිශ්ශබ්දවේවා. මමම ඔවුන්ට කරුණු සහිතව ප්‍රතිකථාකරන් නෙමි. ඉක්බිති සොණදණ්ඩ බ්‍රාහ්මණතෙමේ ඒ බ්‍රාහ්මණයන්ට මේ කාරණය කීයේය. පින්වත්හු මෙසේ නොකියව්. පින්වත්හු මෙසේ නොකියව්. ඒනම්, සොණදණ්ඩපින්වත්තෙමේවණ්ණයට නින්දාකෙරේම ය. මන්ත්‍රයන්ට නින්දාකෙරේමය. ජාතියට නින්දාකෙරේමය. සොණ දණ්ඩ පින්වත්තෙමේ එකාන්තයෙන් ශ්‍රමණ ගෞතමයන්වහන් සේගේ ලබ්ධියටම පිළිවෙළින් බැසගණ්ණිය යතුයි. පින්වත්නි, මම වණ්ණයට හෝ මන්ත්‍රවලට හෝ ජාතියට හෝ නින්දා නොකරමියි කීයේය.

20. තෙන බො පන සමයෙන. සොණදණ්ඩස්ස බ්‍රාහ්මණස්ස භාගිනෙය්‍යො අඞ්ගකො නාම මාණවකො. තස්සං පාරිසායං නිසින්නො හොති. අථ බො සොණදණ්ඩො බ්‍රාහ්මණො තෙ බ්‍රාහ්මණෙ එතදවොච. පස්සන්ති නො භොන්තො ඉමං අඞ්ගකං මාණවකං අම්හාකං භාගිනෙය්‍යන්ති. එවං භො, අඞ්ගකො බො භො මාණවකො අභිරූපො දස්සනීයො පාසාදිකො පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතො බ්‍රාහ්මවණ්ණී බ්‍රහ්මවච්ඡසී අබුද්දවකාසො දස්සනාය, නාස්ස ඉමිස්සා පරිසාය සමසමො අත්ථි ඨපෙත්වා සමණං ගොතමං. අඞ්ගකො බො භො මාණවකො අජ්ඣායකො මන්තධරො තිණ්ණං වෙදානං පාරගූ සනිඝණ්ඩුකෙටුභානං සාක්ඛරප්පභෙදානං ඉතිහාස පඤ්චමානං පදකො වෙය්‍යාකරණො ලොකායත මහාපුරිසලක්ඛණෙසු අනවයො. අහමස්ස මන්තෙ වාචෙතා. අඞ්ගකො බො භො මාණවකො උභතො සුජාතො මාතිතොච පිතිතොච සංසුද්ධගහණිකො යාවසත්තමා පිතාමහායුගා අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන.

---

20. ඒකාලයෙහිදි සොණදණ්ඩ බ්‍රාහ්මණයාගේ බෑණන්වූ අඞ්ගක නම් තරුණතෙමේ ඒ පිරිසෙහි උන්නේ වේ. ඉක්බිති සොණදණ්ඩ බ්‍රාහ්මණතෙමේ ඒ බ්‍රාහ්මණයන් මේ කාරණය විචාළේය. පින්වත්නි, අපගේ බෑණන්වූ මේ අඞ්ගකනම් තරුණයා තෙපි දක්නහුද යනුයි. පින්වත, එසේය. පින්වත්නි, අඞ්ගකනම් තරුණතෙමේ විශිෂ්ට රූ ඇත්තේය. දක්නන්ගේ මනවඩන්නේය. ප්‍රසාද එලවන්නේය. උත්තමවර්ණ සෞන්දර්‍ය්‍යයෙන් යුක්තය ශ්‍රෙෂ්ඨවූ ස්වර්ණවර්ණ ඇත්තේය. මහබ්‍රහ්මහුගේ ශරීරයවැනි ශරීරයක් ඇත්තේය. දැකීමට ස්වල්ප අවකාශ ඇත්තේය. මේ පිරිසෙහි ශ්‍රමණ ගෞතමයන්වහන්සේ හැර ශරීරවර්ණයෙන් මොහට සියලු අයුරින් සමානකෙනෙක් නැත්තේය. පින්වත්නි, අඞ්ගක මාණවකතෙම වෙදමන්ත්‍ර හදාරන්නේය. වෙදමන්ත්‍ර දරන්නේය. වෘක්ෂාදීන්ගේ නාම ප්‍රකාශක නිඝණ්ඩු ශාස්ත්‍රය හා ක්‍රියාකල්පවිකල්ප ප්‍රකාශක කවීන්ට ප්‍රයොජනවත් කෙටුභශාස්ත්‍රයද සහිතවූ ශික්ෂානිරුක්ති සහිතවූ ඉතිහාසය පස්වෙනි කොටඇති වෙදත්‍රය පිළිබඳ පරතෙරට පැමිණියේය. පදදන්නේය. ව්‍යාකරණශාස්ත්‍රය හදාරන්නේය. විතණ්ඩවාදීන්ගේ ශාස්ත්‍ර හා මහාපුරුෂලක්ෂණ ශාස්ත්‍රයන්හි සම්පූර්ණ දැනගැනීම් ඇත්තේය. මම ඕහට මන්ත්‍ර කියවන්නේ වෙමි. පින්වත්නි, අඞ්ගක මාණවකතෙමේ මව්පසින්ද, පියපසින්ද, යන දෙපසින් යහපත්සේ උපන්නේය. පිරිසිදු මාතෘගර්භ ඇත්තේය. සත්වෙනි මහාපිතෘයුගපරම්පරාව දක්වා අවඥකිරීමෙන් බැහැරනොකරණ ලද්දේය. ජාතිවාදයෙන් උපක්‍රොශ නොකරණ ලද්දේය.

අහමස්ස මාතාපිතරෙ ජානාමි. අඞ්ගකො ඛො භො මාණවකො පාණම්පි හනෙය්‍ය. අදින්නම්පි ආදියෙය්‍ය පරදාරම්පි ගච්ඡෙය්‍ය මුසාපි භණෙය්‍ය මජ්ජම්පි පිවෙය්‍ය, එත්ථදානි භො කිං වණ්ණො කරිස්සති කිං මන්තා කිං ජාති? යතො ඛො භො බ්‍රාහ්මණො සීලවා ච හොති වුද්ධසීලී වුද්ධසීලෙන සමන්නාගතො, පණ්ඩිතො ච හොති මෙධාවී පඨමො වා දුතියො වා සුජං පග්ගණ්හන්තානං. ඉමෙහි ඛො භො ද්වීහඞ්ගෙහි සමන්නාගතං බ්‍රාහ්මණා බ්‍රාහ්මණං පඤ්ඤපෙන්ති බ්‍රාහ්මණොස්මීති ච වදමානො සම්මා වදෙය්‍ය න ච පන මුසාවාදං ආපජ්ජෙය්‍යාති.

21. ඉමෙසං පන බ්‍රාහ්මණ ද්වින්නං අඞ්ගානං සක්කා එකං අඞ්ගං ඨපයිත්වා එකෙන අඞ්ගෙන සමන්නාගතං බ්‍රාහ්මණං පඤ්ඤපෙතුං බ්‍රාහ්මණොස්මීති ච වදමානො සම්මා වදෙය්‍ය න ච පන මුසාවාදං ආපජ්ජෙය්‍යාති? නො හිදං භො ගොතම.

මම ඔහුගේ මවුපියන් දනිමි. පින්වත්නි, අඞ්ගක මාණවක තෙමේ ප්‍රාණඝාතද කරන්නේය හෙවත් දිවිදුරු වනසාලන්නේය නුදුන් දෙයද හැරගන්නේය. අනුන්ගේ භාර්‍ය්‍යාවන් වෙතටද යන්නේය. බොරුද කියන්නේය. මත්කිරිමෙන් සිහිය විකල බවට පමුණුවන රහමෙරද පානය කරන්නේය. පින්වත්නි, මෙසේ ඇතිකල්හි දැන් මේ කරුණෙහි ශරීරවර්ණය තෙමේ කුමක්කරන්නේද, මන්ත්‍රයතෙම කුමක්කරන්නේද, ජාති තොමෝ කුමක්කරන්නීද, පින්වත්නි, යම්කලකපටන් බ්‍රාහ්මණ තෙම සිල්ඇත්තේ වඩනලද සිල්ඇත්තේ වේද, වඩනලද ශීලයෙන් යුක්තවේද, ප්‍රඥාඇත්තේ, පණ්ඩිතවූයේ යාගහෝමාදිය කරන්නවුන් අතුරෙන් පළමුවෙනියෙක් හෝ දෙවෙනියෙක් වේද, පින්වත්නි, මේ කරුණු දෙකින් යුක්ත තැනැත්තා බ්‍රාහ්මණයයි බ්‍රාහ්මණයෝ පණවත්. බ්‍රාහ්මණ වෙමියි කියන තැනැත්තේ මනාකොට කියන්නේය. බොරුකීමට නොපැමිණෙන්නේමය.

21. බ්‍රාහ්මණය, මෙ කරුණු දෙකින් එක්කරුණක්හැර එක් කරුණකින් යුක්ත තැනැත්තා බ්‍රාහ්මණයයි පණවන්ට කිමෙක් හැක්කේද? බ්‍රාහ්මණ වෙමියි කියන තැනැත්තේ මනාකොට කියන්නේය. බොරුකීමට නොපැමිණෙන්නේමය. භවද් ගෞතමයන් වහන්ස, මේ කාරණය නොවේමය.

සීලපරිධොතාහි භොගොතම පඤ්ඤා, පඤ්ඤාපරිධොතං සීලං. යත්‍ථ
සීලං තත්‍ථපඤ්ඤා යත්‍ථපඤ්ඤා තත්‍ථසීලං සීලවතොපඤ්ඤා පඤ්ඤාවතො
සීලංසීලපඤ්ඤාණංචපනලොකස්මිං අග්ගමක්ඛායති. සෙය්‍යථාපි භො
ගොතම හත්‍ථෙනවා හත්‍ථංධොපෙය්‍ය,පාදෙනවාපාදං ධොපෙය්‍ය,එව
මෙවඛොභොගොතමසීලපරිධොතාහිපඤ්ඤා පඤ්ඤාපරිධොතා සීලං,
යත්‍ථසීලං තත්‍ථ පඤ්ඤා, යත්‍ථ පඤ්ඤා තත්‍ථ සීලං, සීලවතො පඤ්ඤා
පඤ්ඤාවතො සීලං, සීල පඤ්ඤාණඤ්ච පන ලොකස්මිං අග්ගමක්ඛා
යතීති.

22. එව මෙතං බ්‍රාහමණ. සීලපරිධොතාහි බ්‍රාහ්මණ පඤ්ඤා,
පඤ්ඤා පරිධොතං සීලං, යත්‍ථ සීලං තත්‍ථ පඤ්ඤා යත්‍ථ පඤ්ඤා
තත්‍ථ සීලං සීලවතො පඤ්ඤා පඤ්ඤාවතො සීලං,

භවද්ගෞතමයන්වහන්ස, ප්‍රඥතොමෝචතුපාරිසුඩිශීලයෙන් පිරිසිදු
කරණලද්දීමය. සීලය ප්‍රඥවෙන් පිරිසිදුකරණලද්දේය.යම් පුද්ගල
යෙකු කෙරෙහි සීලයවේද. ඔහුකෙරෙහි ප්‍රඥවවේ.යම් පුද්ගල
යෙකු කෙරෙහි ප්‍රඥව වේද, ඔහු කෙරෙහි සීලය වේ. සිල්ඇත්තාහට
ප්‍රඥව ඇතිවේ. ප්‍රඥ ඇත්තාහට සීලය ඇතිවේ.සීලය ප්‍රඥ යන දෙක
සම්බන්ධව ලොකයෙහිශ්‍රෙෂ්ඨයයි කියනුලැබේ. භවද් ගෞතමයන්
වහන්ස, එක් අතකින්අනිත් අත යම්සේ සෝදන්නේද, එක් පයක්
කරණකොටගෙණඅනිත්පයසෝදන්නේදභවද්ගෞතමයන්වහන්ස,
එපරිද්දෙන්මප්‍රඥතෝමෝචතුපාරිසුඩිශිලයෙන්පිරිසිදුකරණලද්දීය.
සීලයතෙමේ ප්‍රඥවෙන් පිරිසිදුකරණලද්දේය. යම් පුද්ගලයෙකු කෙ
රෙහි සීලය ඇත්තේද ඔහුකෙරෙහිප්‍රඥ ඇත්තේය. යම් පුද්ගලයෙකු
කෙරෙහි ප්‍රඥ ඇත්තේද ඔහු කෙරෙහි සීලය ඇත්තේ වේ. සිල්වත්
හට ප්‍රඥ ඇත්තේය. ප්‍රඥා ඇත්තාහට සිල්ඇත්තේය. ශිල ප්‍රඥා
දෙක සම්බන්ධව ලොකයෙහි ශ්‍රෙෂ්ඨයයි කියනුලැබේ.

22. බ්‍රාහ්මණය මේකාරණය මෙසේමය. බ්‍රාහ්මණය ප්‍රඥතොමෝ
චතුපාරිසුඩිසීලයෙන් පිරිසිදුකරණලද්දීය. සීලය ප්‍රඥවෙන් පිරි
සිදු කරණලද්දේය. යමෙකුකෙරෙහි සිල් ඇත්තේද, ඔහුකෙරෙහි
ප්‍රඥ ඇත්තේවේ. යමෙකු කෙරෙහි ප්‍රඥඇත්තේද, ඔහු කෙරෙහි
සිල් ඇත්තේය. සිල් ඇත්තාහට ප්‍රඥ ඇත්තේය. ප්‍රඥ ඇත්තාහට
සිල් ඇත්තේය.

සීලපඤ්ඤාණඤ්ච පන ලොකස්මිං අග්ගමක්ඛායති. කතමං පන තං බ්‍රාහ්මණ සීලං. කතමා සා පඤ්ඤාති. එත්තකපරමාව මයං භො ගොතම එතස්මිං අත්ථෙ. සාධු වත භවන්තං යෙව භො ගොතමං පටිභාතු එතස්ස භාසිතස්ස අත්ථොති.

23. තෙනහි බ්‍රාහ්මණ සුණාහි සාධුකං මනසිකරොහි, භාසිස්සාමීති. එවං භොති බො සොණදණ්ඩො බ්‍රාහ්මණො භගවතො පච්චස්සොසි. භගවා එතදවොච. ඉධ බ්‍රාහ්මණ තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මා සම්බුද්ධො...යථා සාමඤ්ඤඵලෙ එවං විත්ථාරෙතබ්බං...එවං බො බ්‍රාහ්මණ භික්ඛු සීල සම්පන්නො හොති. ඉදම්පි බො තං බ්‍රාහ්මණ සීලං...පෙ...පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති ...පෙ... දුතියජ්ඣානං ...පෙ...තතියජ්ඣානං චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරති...පෙ...

ශීල ප්‍රඥදෙක සම්බන්ධව ලොකයෙහි ශ්‍රෙෂ්ඨයයිකියනුලැබේ. බ්‍රාහ්මණය ඒ ශීලය කවරේද, ඒ ප්‍රඥතොමෝ කවරිද. භවද් ගෞතමයන්වහන්ස, අපි මේ කාරණයෙහි සීල පඤ්ඤායන පමණක්ම ප්‍රධානකොට ඇත්තෝ වම්හ. හෙවත් මීටවඩා ශීලප්‍රඥදෙක සම්බන්ධව කිසිඅර්ථයක් නොදනුම්හ. භවද් ගෞතමයන්වහන්සේටම මේ භාෂිතයසම්බන්ධ අර්ථය වැටහෙණසේක්වා හෙවත් භාග්‍යවතුන්වහන්සේම මේ ශීල ප්‍රඥදෙක පිළිබඳ විස්තරය ප්‍රකාශකරණසේක්වා. ඒ මැනවැයි සැළකළේය.

23. බ්‍රාහ්මණය එසේහනම් අසව. මනාසේ මෙනෙහිකරව. ඒ ශීල ප්‍රඥදෙක පිළිබඳ විස්තරය ප්‍රකාශකරන්නෙමියි වදාළෝ. පින්වතුන් වහන්ස, එසේ යහපතැයි සොණදණ්ඩ බ්‍රාහ්මණතෙමේ භාග්‍යවතුන්වහන්සේට පිළිවදන් දුන්නේය. භාග්‍යවතුන්වහන්සේ මේ ධර්මය වදාළේය. බ්‍රාහ්මණය රාගාදිපව් නැත්තාවූ හෝ පිදීමට සුදුසුවූ සම්‍යක් සම්බුද්ධවූ තථාගතතෙමේ මේ ලොකයෙහි උපදීද. සාමඤ්ඤඵලසූත්‍රයෙහි මෙන්මෙහි විස්තරකටයුතුයි. බ්‍රාහ්මණය මෙසේ මහණතෙම සම්පූර්ණ සිල් ඇත්තේ වේ. බ්‍රාහ්මණය මේද ඒමහණහුගේ ශීලයවේ.—පෙ—ප්‍රථමධ්‍යානයට පැමිණවාසයකෙරේද—පෙ—ද්විතියධ්‍යානයට පැමිණවාසය කෙරේද—පෙ—තෘතීයධ්‍යානයට පැමිණවාසය කෙරේද—පෙ—චතුර්ථධ්‍යානයට පැමිණවාසය කෙරේද —පෙ—

ඤාණදස්සනායචිත්තං අභිනිහරතිඅභිනින්නාමෙති—පෙ—ඉදම් පිස්ස හොතිපඤ්ඤාය—පෙ—නාපරං ඉත්ථත්තායාති පජානාති. ඉදම්පිස්සහොති පඤ්ඤාය.අයං ඛො සා බ්‍රාහ්මණ පඤ්ඤාති.

24. එවං වුත්තෙ සොණදණ්ඩො බ්‍රාහ්මණො භගවන්තං එතද වොච. අභික්කන්තං භො ගොතම අභික්කන්තං භො ගොතම. සෙය්‍යථාපි භො ගොතම නික්කුජ්ජිතංවා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නංවා විවරෙය්‍ය, මූළ්හස්සවා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙවා තෙලපජ්ජොතං ධාරෙය්‍ය. චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති, එවමෙවං භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො එසාහං භගවන්තං ගොතමං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛු සඞ්ඝඤ්ච. උපාසකම්මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතං. අධිවාසෙතුච මෙ භවං ගොතමො ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛු සඞ්ඝෙනාති. අධිවාසෙසි භගවා තුණ්හි භාවෙන

ඥානදර්ශනය ලැබීම පිණිස සිත මනාකොට ඵලවාතබාද මනාකොට නමාද---පෙ---මේද ඒ මහණහුගේ ශීලය වේ—පෙ---මේ පඤ්චස්කන්ධලාභයපිණිස හෝ මේ මාගී භාවනාවපිණිස අනිකක් නැතැයි ප්‍රත්‍යවෙක්ෂාඥානයෙන් දැනගණී. මේදඒභික්ෂුහුගේ ප්‍රඥාව වේ. බ්‍රාහ්මණය මේ ප්‍රඥායයි වදාළෝ.

24. මෙසේ වදාළකල්හි සොණදණ්ඩ බ්‍රාහ්මණතෙමේ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණයසැලකෙළේය. භවද් ගෞතමයන්වහන්ස, දම්දෙසුම ඉතාමැනව.භවද්ගෞතයන්වහන්සදම්දෙසුමඉතාමැනව. භවද්ගෞතමයන්වහන්සයටිකුරුකරණලද්දක්උඩුකුරුකොටතබන්නේහෝයම්සේදතෘණපණාදියෙන් වසනලද්දක්විවෘතකොටදක්වන්නේහෝයම්සේද,මංමුළාවූවෙකුටමගකියන්නේහෝයම්සේද,චක්ෂුරින්ද්‍රියදර්ශනශක්තියඇත්තෝනිලපීතාදිරූපයන්දකිත්වායිඅඳුරෙහිතෙල් පහනක් දල්වන්නේ හෝ යම්සේද, එපරිද්දෙන්ම භවද් ගෞතමයන්වහන්සේ විසින් නොයෙක් ප්‍රකාරයෙන් ධර්මය දෙශනාකරණලද්දේය. මේ මම භවද් ගෞතමයන්වහන්සේද, නවලොකොත්තර ධර්මයද අෂ්ටාර්‍ය්‍ය පුද්ගල මහාසඞ්ඝයාද සරණකොට යමි. භවද් ගෞතමයන්වහන්සේ අදපටන් දිවිහිම්කොට සරණගිය උපාසකයෙකැයි මා දරාගන්නා සේක්වා. භවද් ගෞතමයන්වහන්සේ භික්ෂුසඞ්ඝයා සමග සෙටදවසට මාගේ බත ඉවසනසේක්වායිද සැළකළේය. භාග්‍යවතුන්වහන්සේ නිශ්ශබ්ද භාවයෙන් එය ඉවසාවදාළසේක.

අථ ඛො සොණදණ්ඩො බ්‍රාහ්මණො භගවතො අධිවාසනං විදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි. අථ ඛො සොණදණ්ඩො බ්‍රාහ්මණො තස්සා රත්තියා අච්චයෙන සකෙ නිවෙසනෙ පණීතං ඛාදනීයං භොජනීයං පටියාදාපෙත්වා භගවතො කාලං ආරොචාපෙසි කාලො භො ගොතම නිට්ඨිතං භත්තන්ති.

25. අථ ඛො භගවා පුබ්බණ්හ සමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය සද්ධිං භික්ඛුසඞ්ඝෙන යෙන සොණදණ්ඩස්ස බ්‍රාහ්මණස්ස නිවෙසනං තෙනුපසංකමි. උපසංකමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි අථ ඛො සොණදණ්ඩො බ්‍රාහ්මණො බුද්ධපමුඛං භික්ඛුසංඝං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙසි. අථ ඛො සොණදණ්ඩො බ්‍රාහ්මණො භගවන්තං භුත්තාවිං ඔනීතපත්තපාණිං අඤ්ඤතරං නීචං ආසනං ගහෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සොණදණ්ඩො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච.

ඉක්බිත්තෙන් සොණදණ්ඩබ්‍රාහ්මණතෙමේ භාග්‍යවතුන්වහන්සේ ඉවසාවදාළබව දැන හුනස්නෙන්නැගිට භාග්‍යවතුන්වහන්සේ සකසාවැඳ පැදකුණුකොට ගියේය. ඉක්බිත්තෙන් සොණදණ්ඩ බ්‍රාහ්මණතෙමේ ඒ රාත්‍රිහුගේ ඇවෑමෙන් ස්වකීය ගෘහයෙහි ප්‍රණීතවූ කැයුතු දෙයද බුදියයුතු දෙයද පිළියෙළකරවා භවද් ගෞතමයන් වහන්ස, බත්පිණිස කල් පැමිණියේය. බත නිමවන ලද්දේයයි භාග්‍යවතුන්වහන්සේට කල්දැන්වූයේය.

25. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ පෙරවරුකාලයෙහි හැඳපොරවා අතින්පාත්‍රය හා කයින් සිවුරුගෙණ භික්ෂුසඞ්ඝයා සමග සොණදණ්ඩ බ්‍රාහ්මණයාගේ වාසස්ථානය යම් තැනෙක්හිද එතනට එළඹිසේක. එළඹ පැණවූ අස්නෙහි වැඩඋන්සේක. එකල්හි සොණදණ්ඩ බ්‍රාහ්මණතෙමේ බුදුන් ප්‍රධානකොටඇති භික්ෂුසඞ්ඝයා ප්‍රණීතවූ කෑයුතුදෙයින්ද, බුදියයුතු දෙයින්ද, සියතින් සන්තර්පණය කළේය. හෙවත් පිණවූයේය. මනාකොට පවාරණයද කරවූයේය. ඉක්බිති සොණදණ්ඩබ්‍රාහ්මණතෙමේ වළඳා නිමකරණලද්දාවූ පාත්‍රයෙන් ඉවත්කරණලද අත්ඇත්තාවූ භාග්‍යවතුන්වහන්සේ දැන එක්තරා නීචාසනයක්ගෙණ එකත්පසෙක උන්නේය. එකත් පසෙකඋන්නාමවූ සොණදණ්ඩ බ්‍රාහ්මණතෙමේ භාග්‍යවතුන්වහන්සේට මේ කාරණය සැලකළේය.

26. අහඤ්චෙව ඛො පන භො ගොතම පරිසගතො සමානො ආසනා වුට්ඨහිත්වා භගවන්තං ගොතමං අභිවාදෙය්‍යං තෙන මං සා පරිසා පරිභවෙය්‍ය. යං ඛො පනසා පරිසා පරිභවෙය්‍ය යසොපි තස්ස හායෙථ යස්ස ඛො පන යසො හායෙථ භොගාපි තස්ස හායෙය්‍යුං, යසො ලද්ධා ඛො පනම්හාකං භොගා. අහඤ්චෙව ඛො පන භො ගොතම පරිසගතො සමානො අඤ්ජලිංපග්ගණ්හෙය්‍යං, ආසනා මෙතං භවං ගොතමො පච්චුට්ඨානං ධාරෙතු. අහඤ්චෙව ඛො පන භො ගොතම පරිසගතො සමානො වෙඨනං ඔමුඤ්චෙය්‍යං සිරසා මෙතං භවං ගොතමො අභිවාදනං ධාරෙතු. අහඤ්චෙව ඛො පන භො ගොතම යානගතො සමානො යානා පච්චොරොහිත්වා භවන්තං ගොතමං අභිවාදෙය්‍යං තෙන මං සා පරිසා පරිභවෙය්‍ය. යං ඛො පනසා පරිසා පරිභවෙය්‍ය, යසොපි තස්ස හායෙථ යස්ස ඛො පන යසො හායෙථ භොගාපි තස්ස හායෙය්‍යුං යසො ලද්ධා ඛො පනම්හාකං භොගා. අහංචෙව ඛො පන භො ගොතම යානගතො සමානො.

---

26. භවද් ගෞතමයන්වහන්ස, මමද පිරිස්අතරට පැමිණියේම හුනස්නෙන්නැගිට භවද් ගෞතමයන්වහන්සේට වදින්නෙම්නම් ඒකරණකොටගෙණ මට ඒ පිරිස්තොමෝ නින්දාකරන්නේය. යමෙකුට ඒ පිරිස්තොමෝ නින්දාකරන්නේද, ඔහුගේ යසසද පිරිහෙන්නේය. යමෙකුගේ යසස පිරිහේනම් ඔහුගේ භොගයෝද, පිරිහෙන්නාහ. අපගේ භොගයෝ යසසකරණකොටගෙණ ලබනලද්දාහුමය. භවද් ගෞතමයන්වහන්ස, මමද පිරිස් අතරට පැමිණියේම ඇඳිලිබඳින්නෙම්නම් ඒකරණකොටගෙණ භවද් ගෞතමයන්වහන්සේ මාගේ හුනස්නෙන් නැගිසිටීම දරාගන්නා සේක්වා. භවද් ගෞතමයන්වහන්ස. මමද පිරිස්අතරට පැමිණියේම. හිස්වෙළුම මුදන්නෙම් නම් භවද් ගෞතමයන්වහන්සේ එය මාගේ හිසින් නමස්කාරයකි දරාගන්නා සේක්වා. භවද් ගෞතමයන්වහන්ස මමද යානාවකට පැමිණියේම යානාවෙන් බැස භවද් ගෞතමයන්වහන්සේ අභිවාදනය කරන්නෙම්නම් ඒකරණකොටගෙණ මට ඒ පිරිස්තොමෝ නින්දාකරන්නේය. යමෙකුට ඒ පිරිස්තොමෝ නින්දාකරන්නේද, ඔහුගේ යසසද පිරිහෙන්නේය. යමෙකුගේ යසස පිරිහෙන්නේනම් ඔහුගේ භොගයෝද පිරිහෙන්නාහ. අපගේ භොගයෝ වූකලී යසස හෙතුකොටගෙණ ලබනලද්දාහුමය. භවද් ගෞතමයන්වහන්ස, මමද යානාවට පැමිණියේම.

පතොදලඝිං අබ්භුත්තාමෙය්‍යං, යාතා මෙතං භවං ගොතමො පච්චො රොහනං ධාරෙතු. අහඤ්චෙව බො පන භො ගොතම යානගතො සමානො හත්‍ථං අපනාමෙය්‍යං සිරසා මෙතං භවං ගොතමො අභිවාදනං ධාරෙතූති·

27. අථ බො භගවා සොණදණ්ඩං බ්‍රාහ්මණං ධම්මියා කථාය සන්‍දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා උට්ඨායාසනා පක්කාමිති.

සොණදණ්ඩසුත්තං
නිට්ඨිතං චතුත්‍ථං.

කැවිටිකෝටුව ඉදිරියටනමන්නෙම්නම් එය මගේ යානාවෙන් බැසීමයයි. භවද් ගෞතමයන්වහන්සේ දරාගන්නාසේක්වා. භවද් ගෞතමයන්වහන්ස මමද යානාවට පැමිණියේම අත ගෞතමයන් වහන්සේ වෙතට නමන්නෙම්නම් එය මාගේ අභිවාදනයයි භවද් ගෞතමයන්වහන්සේ දරාගන්නා සේක්වායි සැලකලේය.

27. ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ සොණදණ්ඩ බ්‍රාහ්මණයා ඒ කාලයට සුදුසුවූ දැහැමිකථාවකින් කරුණුදක්වා කුශලධර්මයෙහි සමාදන්කරවා තෙදගන්වා හෙවත් එහි උත්සාහවත්කරවා අන්‍ය වූද බුද්ධගුණාදියෙන් සතුටුකරවා හුනස්නෙන්නැගිට වැඩිසේක.

සතරවෙනිවූ සොණදණ්ඩ සූත්‍රාර්ථ
ව්‍යාඛ්‍යාව නිමියේයි.

V. කූටදන්තසුත්තං.

—○፥○—

1. එවමෙම් සුතං. එකං සමයං භගවා මගධෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි යෙන ඛාණුමතං නාම මගධානං බ්‍රාහමණගාමො තදවසරි. තත්‍ර සුදං භගවා ඛාණුමතෙ විහරති අම්බලට්ඨිකායං. තෙන ඛො පන සමයෙන කූටදන්තො බ්‍රාහ්මණො ඛාණුමතං අජ්ඣාවසති සත්තුස්සදං සතිණකට්ඨොදකං සධඤ්ඤං රාජභොග්ගං රඤ්ඤා මාගධෙන සෙනියෙන බිම්බිසාරෙන දින්නං රාජදායං බ්‍රහ්මදෙය්‍යං. තෙන ඛො පන සමයෙන කූටදන්තස්ස බ්‍රාහ්මණස්ස මහායඤ්ඤො උපක්ඛතො හොති, සත්තච උසභසතානි සත්තච වච්ඡතරසතානි සත්තච වච්ඡතරීසතානි සත්තච අජසතානි සත්තච උරබ්භසතානි ථූණුපනීතානි හොන්ති යඤ්ඤත්ථාය.

කූටදන්තසූත්‍රාර්ථව්‍යාඛ්‍යා.

—○፥○—

1. මාවිසින් මේ සූත්‍රධර්මය මෙසේ අසනලදී. එක්කාලයෙක්හි භාග්‍යවතුන්වහන්සේ පන්සියයක් භික්ෂූන්වූ මහද් භික්ෂුසඞ්ඝයා සමග මගධදනව්හි සැරිසරාවඩනාසේක් ඛාණුමතනම්වූ මගධදනව් වැසි රජකුමරුවන්ගේ බමුණුගම යම්තැනෙක්හිද එතනට වැඩිසේක. එහි භාග්‍යවතුන්වහන්සේ ඛාණුමතනම් බමුණුගමෙහිවූ අම්බලට්ඨිකානම් උයනෙහි වාසයකරණසේක. ඒකාලයෙහිදී කූටදන්ත බ්‍රාහ්මණතෙමේ මගධෙශ්වරවූ බොහෝසෙනාඇත්තාවූ බිම්සරරජහුවිසින් දෙනලද්දාවූ නොයෙක් සත්වයන්ගේ උත්සන්නතාඇති හෙවත් නොයෙක් සත්වයන්ගෙන් ගැවසීගත්තාවූ තෘණ දර ආදිය හා පුෂ්කරණීන් සහිතවූ ධාන්‍ය සහිතවූ රජහුකෙරෙන් ලදින් අනුභවකට යුතුවූ රජවිසින් දෙනලද දායාදයවූ ශ්‍රෙෂ්ඨවශයෙන් දෙනලද්දාවූ හෙවත් රාජස්වරූපයෙන් පරිභොගකටයුතුවූ ඛාණුමතනම් බමුණුගම අධිපතිව වෙසෙසි. ඒකාලයෙහිදී කූටදන්ත බ්‍රාහ්මණයාගේ මහායාගයක් එලඹසිටියේ වේ. වෘෂභයන් සත්සියයක්ද, නාඹුවස්සන් සත්සියයක්ද, නාඹුවැස්සියන් සත්සියයක්ද, නිරෙළුවන් සත්සියයක්ද, එළුවන් සත්සියයක්දැයි මෙසේ සත්සියයබැගින් බොහෝ මෘගපක්ෂීහු ටූබැඳතැබීමපිණිස යාගස්ථම්භ වෙතට පමුණුවනලද්දාහු වෙත්.

2. අස්සොසුං ඛො ඛාණුමතකා බ්‍රාහ්මණගහපතිකා. සමණො ඛලු භො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො මගධෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි ඛාණුමතං අනුප්පත්තො ඛාණුමතෙ විහරති අම්බලට්ඨිකායං. තං ඛො පන භවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො. ඉතිපි සො භගවා අරහං සම්මා සම්බුද්ධො විජ්ජාචරණ සම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්ම සාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා. සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙව මනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං, කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති. සාධු ඛො පන තථාරූපානං අරහතං දස්සනං හොතීති.

---

2. එහිදී ඛාණුමතගම්වාසි බමුණුගැහැවියෝ මෙකාරණය ඇසූහ. ශාක්‍යරාජපුත්‍රවූ ශාක්‍යකුලයෙන් නික්ම පැවිදිවූ ශ්‍රමණ භවද් ගෞතමයන්වහන්සේ භික්ෂූන් පන්සියයක්වූ මහද් භික්ෂුසඞ්ඝයා සමග මගධදනව්හි සැරිසරාවඩනේ ඛාණුමත බමුණුගමට පැමිණිසේක්. ඛාණුමතබමුණුගමවෙහිවූ අම්බලට්ඨිකා උයනෙහි වැඩවාසයකරණසේක. ඒ භාග්‍යවත්තෙම සංසාරචක්‍රයාගේ අරකැපූසේක. සව්ප්‍රකාරයෙන් සව්ධර්මයන්මනාකොට තෙමේම අවබොධකළසේක. අෂ්ටවිද්‍යාපසළොස්චරණ ධර්මයන්ගෙන් සම්පූණිසේක. ශොභනවූ ගමන්ඇතිසේක. තුන්ලොව දන්නාසේක. ශීලසමාධ්‍යාදි ගුණයෙන් ශ්‍රෙෂ්ඨසේක. පුරුෂයන් දමනයකිරිමෙහි සමර්ථසේක. දෙව්මිනිසුන්ට අනුශාසනාකරණසේක. චතුස්සත්‍යාවබොධකළසේක. සකලක්ලෙශයන් භග්නකළසේකැයිද ඒ භාග්‍යවතුන්වහන්සේ දෙවියන් සහිතවූ මරුන් සහිතවූ බඹුන් සහිතවූ මෙලොවද ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිතවූ දෙව්මිනිසුන් සහිතවූ සත්වවර්ගයාද තෙමේ විශිෂ්ටඥනයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට ප්‍රකාශ කරණසේකැයිද ඒභාග්‍යවතුන්වහන්සේ මුලයහපත්වූද මැද යහපත් වූද අග යහපත්වූද අර්ථසහිතවූ ව්‍යඤ්ජන සහිතවූ සියල්ලෙන් සම්පූණිවූ ධර්මය දෙශනාකරණසේක්යයිද, පිරිසිදුවූ බ්‍රහ්මචය්‍යාව ප්‍රකාශ කරණසේක්යයිද, මෙසේ ඒ ශ්‍රමණ භවද් ගෞතමයන්වහන්සේ පිළිබඳවූ මනොඥ කීර්තිශබ්දයෙක් පැණනැංගේය. එය අසා එබඳුවූ රහතුන්ගේ දැකීම යහපත්ම වේයයි සිතූහ.

අථ ඛො ඛාණුමතකා බ්‍රාහ්මණගහපතිකා ඛාණුමතා නික්ඛමිත්වා සංඝසංඝී ගණීභූතා යෙන අම්බලට්ඨිකා තෙනුපසංකමන්ති.

3. තෙන ඛො පන සමයෙන කූටදන්තො බ්‍රාහ්මණො උපරිපාසාදෙ දිවාසෙය්‍යං උපගතො හොති. අද්දස ඛො කූටදන්තො බ්‍රාහ්මණො ඛාණුමතකෙ බ්‍රාහ්මණගහපතිකෙ ඛාණුමතා නික්ඛමිත්වා සඞ්ඝසංඝී ගණීභූතෙ යෙන අම්බලට්ඨිකා තෙනුපසඞ්කමන්තෙ. දිස්වා ඛත්තං ආමන්තෙසි. කින්නු ඛො භො ඛත්තෙ ඛාණුමතකා බ්‍රාහ්මණගහපතිකා ඛාණුමතා නික්ඛමිත්වා සඞ්ඝසංඝී ගණීභූතා යෙන අම්බලට්ඨිකා තෙනුපසංකමන්තීති. අත්ථි ඛො භො සමණො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො. මගධෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි ඛාණුමතං අනුප්පත්තො ඛාණුමතෙ විහරති අම්බලට්ඨිකායං. තං ඛො පන භවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො.

ඉක්බිත්තෙන් ඛාණුමතගම්වාසීවූ බමුණුගැහැවියෝ ඛාණුමතගමින් නික්ම බොහෝපරිද්දෙන් රැස්වූ මහත්සමූහයාඇත්තෝ ගමින් පිටතදී රැස්වූ මහත් ගණයා ඇත්තෝව අම්බලට්ඨිකා උයන යම් තැනෙක්හිද එතනට එලඹෙත්.

3. ඒකාලයෙහිදී කූටදන්තබ්‍රාහ්මණතෙමේ ප්‍රාසාදයාගේ මතුමහල් තෙලෙහි දිවාසයනයට පැමිණියේ වේ. කූටදන්ත බ්‍රාහ්මණතෙමේ ඛාණුමතබමුණුගමින් නික්ම බොහෝපරිද්දෙන් රැස්වූ සමූහයා ඇතිව ගමින් පිටතදී රැස්වූ මහත් ගණයා ඇතිව අම්බලට්ඨිකාඋයන යම්තැනෙක්හිද එතනට එලඹෙන්නාවූ. ඛාණුමතගම්වාසී බමුණු ගැහැවියන් දුටුයේමය. දැක ඛත්තනම් මහ ඇමතියා ඇමතුයේය. පින්වත, ඛත්තය, ඛාණුමතගම්වාසීවූ බමුණුගැහැවියෝ ඛාණුමතගමින් නික්ම බොහෝපරිද්දෙන් රැස්වූ මහත්සමූහයා ඇතිව මහත් ගණයා ඇතිව අම්බලට්ඨිකාඋයන යම්තැනෙක්හිද එතනට එලඹෙත්. මේ කිමෙක්දැයි විචාළේය. පින්වත, මේ කාරණය ඇත්තේමය. ඒනම්, ශාක්‍යරාජපුත්‍රවූ ශාක්‍යකුලයෙන් නික්ම පැවිදිවූ ශ්‍රමණ ගෞතමයන් වහන්සේ පන්සියයක්භික්ෂූන්වූ මහද්භික්ෂුසඞ්ඝයාසමග මගධදනව්හි සැරිසරාවඩනේ ඛාණුමතගමට පිළිවෙළින් පැමිණිසේක්. ඛාණුමත බමුණුගමෙහිවූ අම්බලට්ඨිකාඋයනෙහි වාසයකරණසේක. ඒ භවද් ගෞතමයන්වහන්සේ සම්බන්ධව මෙසේ යහපත්වූ කීර්තිශබ්දයක් උස්ව පැවැත්තේය. කෙසේදයත්.

ඉතිපි සො භගවා අරහං සම්මා සම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්ම සාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති. තමෙතෙ භවන්තං ගොතමං දස්සනාය උපසංකමන්තීති.

4. අථ ඛො කූටදන්තස්ස බ්‍රාහ්මණස්ස එතදහොසි. සුතං ඛො පන මෙතං සමණො ගොතමො තිවිධං යඤ්ඤසම්පදං සොළස පරික්ඛාරං ජානාතීති. නඛො පනාහං ජානාමි තිවිධං යඤ්ඤසම්පදං සොළසපරික්ඛාරං, ඉච්ඡාමි චාහං මහායඤ්ඤං යජිතුං. යන්නූනාහං සමණං ගොතමං උපසංකමිත්වා තිවිධං යඤ්ඤසම්පදං සොළසපරික්ඛාරං පුච්ඡෙය්‍යන්ති.

ඒ භාග්‍යවතුන්වහන්සේ සියලු කෙලෙසුන් කෙරෙන් දුරුවූයේය සියල්ලන්ගේ පූජාවට සුදුසුය යන මේකාරණයන්ගෙන් අර්හත්සේක. මනාකොට තමන්වහන්සේ සියලු දහම් අවබොධකෙළේය. යනාදි කාරණයන්ගෙන් සම්‍යක්සම්බුද්ධසේක. අෂ්ටවිද්‍යාපසළොස්චරණ ධර්මයන්ගෙන් සම්පූර්ණය යන මේ කාරණයන්ගෙන් විජ්ජාචරණසම්පන්නසේක. සොඳුරගමන්ඇතිබැවින් හා සොඳුරුතැනට ගියබැවින්ය යන මේආදි කාරණයන්ගෙන් සුගතසේක. සියලුඅයුරින් ලොව දැනගත්තේය. යන මේකාරණයෙන් ලොකවිදූසේක. තමන්වහන්සේට ශ්‍රේෂ්ඨ කෙනෙක් නැත්තේය. යන මේ කාරණයෙන් අනුත්තරසේක. දමනයකටයුතු හෙවත් හික්මවියයුතු පුරුෂයන් දමනය කෙරෙයි. යනාදි අර්ථයෙන් පුරිසදම්මසාරථිසේක. දෙවිමිනිසුන්ට අනුශාසනාකෙරෙයි. යන මේ ආදි කාරණයන්ගෙන් සත්ථුසේක. චතුස්සත්‍ය ධර්මයන් අවබෝධ කෙළේය. යන මේ ආදි කාරණයෙන් බුද්ධසේක. වනසනලද රාගාදිකෙලෙසුන් ඇත්තේය. යන මේ ආදි කාරණයෙන් භගවත්සේකැයි කියායි. මොව්හු ඒ ගොයුම්ගොත් පින්වතුන්වහන්සේ දැකීමපිණිස එළඹෙත්සයි දැන්වූයේය.

4. ඉක්බිත්තෙන් කූටදන්තබ්‍රාහ්මණයාහට මේ අදහස ඇතිවිය. මහණගොයුම්තෙමේ සොළොස්පිරිවරඇති ත්‍රිවිධයාගසම්පත්තිය දන්නේය යන මේ කාරණය මාවිසින් අසනලද්දේමය. මමවූකලි සොළොස්පිරිවරඇති ත්‍රිවිධයාගසම්පත්තිය නොදනිමි. මම මහායාග යක් යාගකරන්නටද කැමැත්තෙක්මි. මම ශ්‍රමණගෞතමයන් වෙතට එළඹ සොළොස්පිරිවරඇති ත්‍රිවිධයාගසම්පත්තිය ශ්‍රමණ ගෞතමයානන් විචාරන්නෙම්නම් ඉතා යෙහෙක යනුයි.

අථ බො කූටදන්තො බ්‍රාහ්මණො තං ඛත්තං ආමන්තෙසි. තෙනහි භො ඛත්ත යෙන ඛාණුමතකා බ්‍රාහ්මණගහපතිකා තෙනුපසංකම උපසංකමිත්වා ඛාණුමතකෙ බ්‍රාහ්මණගහපතිකෙ එවං වදෙහි. කූටදන්තො භො බ්‍රාහ්මණො එවමාහ. ආගමෙන්තු කිර භවන්තො කූටදන්තොපි බ්‍රාහ්මණො සමණං ගොතමං දස්සනාය උපසඞ්කමිස්සතීති. එවං භොති බො සො ඛත්තා කූටදන්තස්ස බ්‍රාහ්මණස්ස පටිස්සුත්වා යෙන ඛාණුමතකා බ්‍රාහ්මණගහපතිකා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ඛාණුමතකෙ බ්‍රාහ්මණගහපතිකෙ එතදවොච. කූටදන්තො භො බ්‍රාහ්මණො එවමාහ. ආගමෙන්තු කිර භවන්තො, කූටදන්තොපි බ්‍රාහ්මණො සමණං ගොතමං දස්සනාය උපසංකමිස්සතීති.

5. තෙන බො පන සමයෙන අනෙකානි බ්‍රාහ්මණසතානි ඛාණුමතෙ පටිවසන්ති. කූටදන්තස්ස බ්‍රාහ්මණස්ස මහායඤ්ඤං අනුභවිස්සාමාති. අස්සොසුං බො තෙ බ්‍රාහ්මණා. කූටදන්තො කිර බ්‍රාහ්මණො සමණං ගොතමං දස්සනාය උපසඞ්කමිස්සතීති.

ඉක්බිත්තෙන් කූටදන්තබ්‍රාහමණතෙමේ ඒ ඛත්තනම් ඇමතියා ඇමතූයේය. පින්වත ඛත්තය, එහෙනම් ඛාණුමතග්‍රාමවාසිවූ බමුණුගැහැවියෝ යම්තැනෙක්හිද එතනට එලඹෙව. එලඹ ඛාණුමතගම්වාසී බමුණුගැහැවියන්ට මෙසේ කියව. කූටදන්තබ්‍රාහ්මණූතෙමේද මහණගොයුම්ගොතුන්වහන්සේ දැකීමට එලඹෙන්නේය. එහෙයින් පින්වත්හු බලාපොරොත්තුවෙත්වායි කූටදන්ත බ්‍රාහ්මණතෙමේ මෙසේ කියායයි දන්වව යනුයි. පින්වත, එසේයයි ඒ ඛත්තනම් මහඇමතිතෙමේ කූටදන්ත බ්‍රාහ්මණයාහට පිළිවදන්දී ඛාණුමතග්‍රාමවාසී බමුණුගැහැවියෝ යම්තැනෙක්හිද එතනට එලඹියේය එලඹ ඛාණුමතග්‍රාමවාසි බමුණුගැහැවියන්ට මේකාරණය දැන්වීය. පින්වත්නි. කූටදන්ත බ්‍රාහ්මණතෙමේද මහණුගොයුම්ගොතුන්වහන්සේ දක්මට එලඹෙන්නේය. එහෙයින පින්වත්හු බලාපොරොත්තුවෙත්වා. කූටදන්තබ්‍රාහ්මණතෙමේ මෙසේ කියාය යනුයි.

5. ඒකාලයෙහිදී නොයෙක් සියගණන් බ්‍රාහ්මණයෝ කූටදන්ත බ්‍රාහමණයාගේ මහායාගය අනුභවකරන්නෙමුයි ඛාණුමතගමෙහි වාසයකෙරෙත්. ඒ බමුණෝ කූටදන්තබ්‍රාහ්මණතෙමේ ශ්‍රමණගෞතමයානන් දක්මට එලඹෙන්නේයයි ඇසුවාහුමය·

අථ ඛො තෙ බ්‍රාහ්මණා යෙන කූටදන්තො බ්‍රාහ්මණො තෙනුපසඞ්ක මිංසු, උපසඞ්කමිත්වා කූටදන්තං බ්‍රාහ්මණං එතදවොචුං. සච්චං කිර භවං කූටදන්තො සමණං ගොතමං දස්සනාය උපසංකමිස්සතීති. එවං ඛො මෙ හො හොති, අහම්පි සමණං ගොතමං දස්සනාය උප සඞ්කමිස්සාමීති.

6. මා භවං කූටදන්තො සමණං ගොතමං දස්සනාය උපසඞ්ක මි,න අරහති භවං කූටදන්තො සමණං ගොතමං දස්සනාය උපසඞ්ක මිතුං. සචෙ භවං කූටදන්තො සමණං ගොතමං දස්සනාය උපසඞ්ක මිස්සති, භො තො කූටදන්තස්ස යසො හායිස්සති, සමණස්ස ගො තමස්ස යසො අභිවඩ්ඪිස්සති. යම්පි භො තො කූටදන්තස්ස යසො හායිස්සති සමණස්ස ගොතමස්ස යසොඅභිවඩ්ඪිස්සති,ඉමිනා පඞ්ගෙන නඅරහති භවං කූටදන්තො සමණං ගොතමං දස්සනාය උප සඞ්කමිතුං. සමණොත්වෙව ගොතමො අරහති භවන්තං කූටදන්තං දස්සනාය උපසඞ්කමිතුං. භවංහි කූටදන්තො උභතො සුජාතො මාතිතොච පිතිතොච.

ඉක්බිත්තෙන් ඒබ්‍රාහ්මණයෝ කූටදන්තබ්‍රාහ්මණතෙම යම්තැනෙක් හිද එතනට එළඹියාහුය. එළඹ පින්වත් කූටදන්තතෙමේ ගොයුම් ගොත් මහණහු දක්මට එළඹෙන්නේය යනු කිමෙක සැබෑදැයි කූට දන්තබ්‍රාහ්මණයා මෙකරුණ විචාළාහුය. පින්වතුන්නි, මමත් ශ්‍රමණ ගෞතමයානන් දක්මට එළඹෙන්නෙමියි මෙසේ මාගේ අදහසයයි දුන්වීය.

6. පින්වත් කූටදන්තතෙමේ ගොයුම්ගොත් මහණහු දක්මට නොඑළඹෙනසේක්වා. පින්වත් කූටදන්තතෙමේ ගොයුම්ගොත් මහණහු දක්මට එළඹෙන්ට සුදුස්සෙක්නොවේ. පින්වත් කූටදන් තතෙමේ ගොයුම්ගොත් මහණහු දක්මට ඉදින් එළඹෙන්නේනම් කූටදන්ත පින්වත්හුගේ කීර්තිය පිරිහෙන්නේය. ශ්‍රමණ ගෞතම යාගේ කීර්තිය මනාසේ වැඩෙන්නේය. කූටදන්ත පින්වත්හුගේ යසස පිරිහෙන්නේය. ගොයුම්ගොත් මහණහුගේ යසස බොහෝ සෙයින් වැඩෙන්නේය.මේ කාරණයෙන්ද කූටදන්ත පින්වත්තෙමේ ගොයුම්ගොත් මහණහු දැක්මට එළඹෙන්නට නුසුදුසුයි. ගොයුම් ගොත් මහණතෙමේම කූටදන්ත පින්වතුන් දක්මට එළඹෙන්නට සුදුස්සෙක් වේ. කූටදන්ත පින්වත්තෙමේ මව්පසින්ද, පියපසින්ද, යන දෙපසින් යහපත්සේ උපන්නේය.

සංසුද්ධගහණිකො යාවසත්තමා පිතාමහයුගා අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන. යම්පි භවං කූටදන්තො උභතො සුජාතො මාතිතොච පිතිතොච සංසුද්ධගහණිකො යාවසත්තමා පිතාමහයුගා අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන, ඉමිනා පඞ්ගෙන න අරහති භවං කූටදන්තො සමණං ගොතමං දස්සනාය උපසඞ්කමිතුං, සමණොත්වෙව ගොතමො අරහති භවන්තං කූටදන්තං දස්සනාය උපසඞ්කමිතුං. භවංහි කූටදන්තො අඩ්ඪො මහද්ධනො මහාභොගො ......පෙ...... භවංහි කූටදන්තො අජ්ඣායකො මන්තධරො තිණ්ණං වෙදානං පාරගූ සනිඝණ්ඩු කෙටුභානං සාක්ඛරප්පභෙදානං ඉතිහාසපඤ්චමානං පදකො වෙය්‍යාකරණො ලොකායතමහාපුරිස ලක්ඛණෙසු අනවයො. භවංහි කූටදන්තො අභිරූපො දස්සනීයො පාසාදිකො පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතො.

පිරිසිදු මාතෘගර්භ ඇත්තේය. සත්වෙනිමහාපිතෘ පරම්පරාවදක්වා අවඥකිරීමෙන් බැහැර නොකරණලද්දේය. ජාතිවාදයෙන් උපක්‍රොශ නොකරණලද්දේය. යම් හෙයකින් කූටදන්ත පින්වත්තෙමේ මව්පිය දෙපසින්යහපත් සේඋපන්නේද පිරිසිදුමාතෘගර්භඇත්තේද සත්වෙනි මහාපිතෘ පරම්පරාවදක්වා අවඥ කිරීමෙන් බැහැර නොකරණ ලද්දේද, ජාතිවාදයෙන් උපක්‍රොශනොකරණලද්දේද, මේකාරණයෙන්ද කූටදන්ත පින්වත්තෙමේ ගොයුම්ගොත් මහණහු දක්මට එලඹෙන් නට සුදුස්සෙක්නොවේ. ගොයුම්ගොත් මහණතෙමේම කූටදන්ත පින්වත්හු දක්මට එලඹෙන්නට සුදුස්සෙක්වේ, කූටදන්ත පින්වත්තෙමේ ආඪ්‍යය හෙවත් අධිපතිය මහද්ධනඇත්තේය. පස්කම් ගුණවශයෙන් මහත් උපභොග සම්පත් ඇත්තේය. සෙස්ස කිනයින් දතයුතුයි. කූටදන්ත පින්වත්තෙමේ වේදහදාරන්නේය. වේද මන්ත්‍ර දරන්නේය. වෘක්ෂාදීන්ගේ නාමප්‍රකාශකනිඝණ්ඩු ශාස්ත්‍රය හා ක්‍රියා කල්ප විකල්ප ප්‍රකාශක කවින්ට ප්‍රයොජනවත් කෙටුභ ශාස්ත්‍රයද සහිතවූ ශික්ෂානිරුක්ති සහිතවූ ඉතිහාසය පස්වෙනිකොටඇති වෙදත්‍රය පිළිබඳ පරතෙරට පැමිණියේය. පද දන්නේය. ව්‍යාකරණ ශාස්ත්‍රය හදාරන්නේය. විතණ්ඩවාදීන්ගේ ශාස්ත්‍ර හා මහාපුරුෂලක්ෂණ ශාස්ත්‍රයන්හි සම්පූර්ණ දැනගැණීම් ඇත්තේය.—පෙ— කූටදන්ත පින්වත්තෙමේ විශිෂ්ට රූප ඇත්තේය. දකුම්කටයුත්තේය. ප්‍රසාද එලවන්නේය. උත්තමවූ වර්ණ සෞන්දර්‍ය්‍යයෙන් යුක්තය. නොහොත් ඉතාපිරිසිදුවූ ශරීරවර්ණයෙන් හා ශරීරසටහණින්ද, සමන්විත වේ.

බ්‍රහ්මවණ්ණී බ්‍රහ්මවච්ඡසී අඛුද්දාවකාසො දස්සනාය. භවංහි කූටදන්තො සීලවා හොති වුඩ්ඪසීලී වුඩ්ඪසීලෙන සමන්නාගතො. භවංහි කූටදන්තො කල්‍යාණවාචො කල්‍යාණවාක්කරණො පොරියා වාචාය සමන්නාගතො විස්සට්ඨාය අනෙළගලාය අත්ථස්ස විඤ්ඤාපනියා. භවංහි කූටදන්තො බහුන්නං ආචරියපාචරියො තීණිමාණවක සතානි මන්තෙ වාචෙති. බහූ ඛො පන නානාදිසා නානාජනපදා මාණවකා ආගච්ඡන්ති භොතො කූටදන්තස්ස සන්තිකෙ මන්තත්ථිකා මන්තෙ අධියිතුකාමා. භවංහි කූටදන්තො ජිණ්ණො වුඩ්ඪො මහල්ලකො අද්ධගතො වයො අනුප්පත්තො, සමණො ගොතමො තරුණො චෙව තරුණපබ්බජිතො ච.

ශ්‍රෙෂ්ඨවූ ස්වර්ණවර්ණයෙන් සමන්විතවේ. මහබඹහුගේ සිරුර සමානවූ ශරීරයෙන් සමන්විත වේ. දක්මට ඝවල් පාවකාශ ඇත්තේය.–පෙ–කූටදන්තපින්වත් තෙමේ සිල් ඇත්තේය. වඩනලද සිල් ඇත්තේය. සම්පූර්ණ සීලයෙන් යුක්තවේ. කූටදන්ත පින්වත් තෙමේ යහපත් වචනඇත්තේය. යහපත් වචනකථාකිරීම් ඇත්තේය. ගුණයෙන් සම්පූර්ණවූ නොහොත් පුරවාසී සත්‍රින්ගේ කථාවමෙන් සිව්මැලිබැවින් කණ්රසායනවූ මධුරභාවයෙන් සිහිකටයුතුවූ නිර්දෙෂවූ ආදිමධ්‍යපර්‍යවසානය ඝන ස්ථානත්‍රය ප්‍රකටකොට කියනලද අර්ථයාගේ අවබොධයට සමර්ථවූ වචනයෙන් යුක්තය.—පෙ—කූටදන්ත පින්වත් තෙමේ බොහෝ දෙනාගේ ආචාර්‍යද ආචාර්‍යයන්ගේ ප්‍රාචාර්‍යද වේ. තුන්සියයක් මාණවකයන්ට වෙදමන්ත්‍රයන් කියවයි. කූටදන්ත පින්වත්හුගේ සමීපයෙහි වෙදමන්ත්‍ර ප්‍රයොජනකොට ඇත්තාවූ වෙදමන්ත්‍ර හදුරණුකැමැත්තාවූ බොහෝ මාණවකයෝ නොයෙක් දිසාවලින්ද, නොයෙක් දනව්වලින්ද, එන්නාහ. කූටදන්ත පින්වත්තෙමේ ජරාවෙන් ජීර්ණය අඩග ප්‍රත්‍යඞ්ගයන්ගේ වැඩීමටපැමිණියේය. මහලුය ඉක්මගියදෙතුන්රජපරපුරකල්ඇත්තේය. පැසුලුවයසට පැමිණියේය. නොහොත් බොහෝකල් පැවති කුලපරම්පරා ඇත්තේය. සීලාචාරගුණාදියෙන් වැඩීමට පැමිණියේය. මහත්සම්පත්තියෙන් යුක්තය. බ්‍රාහ්මණයන්ගේ ව්‍රතචර්‍යාදිසීමාභෙද නොකිරීමෙන් මාර්ගයට පිළිපන්නේය. අන්තිමවයසට පැමිණියේය. ගෞතම ශ්‍රමණතෙමේ තරුණයෙක්ද, තරුණ පැවිද්දෙක්ද වේ.

භවංහි කූටදන්තො රඤ්ඤො මාගධස්ස සෙනියස්ස බිම්බිසාරස්ස සක්කතො ගරුකතො මානිතො පූජිතො අපචිතො. භවංහි කූටදන්තො බ්‍රාහ්මණස්ස පොක්ඛරසාතිස්ස සක්කතො ගරුකතො මානිතො පූජිතො අපචිතො. භවංහි කූටදන්තො ඛාණුමතං අජ්ඣාවසති සත්තුස්සදං සතිණ කට්ඨොදකං සධඤ්ඤං රාජභොග්ගං රඤ්ඤා මාගධෙන සෙනියෙන බිම්බිසාරෙන දින්නං රාජදායං බ්‍රහ්මදෙය්‍යං. යම්පිභවං කූටදන්තො ඛාණුමතං අජ්ඣාවසති සත්තුස්සදං සතිණ කට්ඨොදකං සධඤ්ඤං රාජභොග්ගං රඤ්ඤාමාගධෙන සෙනියෙන බිම්බිසාරෙන දින්නං රාජදායං බ්‍රහ්මදෙය්‍යං.

කූටදන්ත පින්වත්තෙමේ මගධ ජනපදාධිපතිවූ බොහෝ සේනා ඇත්තාවූ බිම්සර රජහුවිසින් සත්කාරකරණලද්දේද, ගරුකරණලද්දේද, බුහුමන්කරණලද්දේද, පුදනලද්දේද, සත්කාර පෙරදූරිකොට ඇති ප්‍රණිපාතයෙන් පූජාකරණලද්දේද වෙයි. කූටදන්ත පින්වත්තෙමේ පොක්ඛරසාති බ්‍රාහමණයාවිසින් සත්කාර කරණලද්දේය. ගරුකරණලද්දේය. බුහුමන් කරණලද්දේය. පුදනලද්දේය. සත්කාර පෙරදූරිකොටඇති ප්‍රණිපාතයෙන් පූජාකරණ ලද්දේද වෙයි. කූටදන්ත පින්වත්තෙමේ මගධජනපදාධිපතිවූ බොහෝසේනා ඇත්තාවූ බිම්සර රජහු විසින් දෙනලද්දාවූ නොයෙක් සත්‍වයන්ගේ උත්සන්නතාඇති හෙවත් නොයෙක් සත්වයන්ගෙන් ගැවසිගත්තාවූ තණදූව ආදිය හා පුෂ්කරණීන් සහිතවූ ධාන්‍යසහිතවූ රජහුකෙරෙන් ලදින් අනුභව කටයුතුවූ රජවිසින් දෙනලද දායාදයවූ ශ්‍රෙෂ්ඨවශයෙන් දෙන ලද්දාවූ නොහොත් රාජස්වරූපයෙන් පරිභොග කටයුතුවූ ඛාණුමත බමුණුගම අධිපතිව වෙසේ. යම්හෙයකින් පින්වත් කූටදන්ත තෙමේ මගධ ජනපදාධිපතිවූ බොහෝ සේනාඇත්තාවූ බිම්සර රජහුවිසින් දෙනලද්දාවූ නොයෙක් සත්වයන්ගේ උත්සන්නතා ඇති නොහොත් නොයෙක් සත්වයන්ගෙන් ගැවසිගත්තාවූ තණදූව ආදිය හා පුෂ්කරණීන් සහිතවූ ධාන්‍යසහිතවූ රජහුකෙරෙන් ලදින් අනුභවකටයුතුවූ.රජවිසින් දෙනලද දායාදයවූශ්‍රෙෂ්ඨවශයෙන් දෙනලද්දාවූ නොහොත් රාජස්වරූපයෙන් පරිභොග කටයුතුවූ ඛාණුමතගම අධිපතිව වෙසේද.

ඉමිනාපඞ්ගෙන න අරහති භවං කූටදන්තො සමණං ගොතමං දස්සනාය උපසංකමිතුං,සමණොත්වෙව ගොතමො අරහති භවන්තං කූටදන්තං දස්සනාය උපසඞ්කමිතුනති.

7. එවං වුත්තෙ කූටදන්තො බ්‍රාහ්මණො තෙ බ්‍රාහ්මණෙ එතද වොච. තෙනහි භො මමපි සුණාථ, යථා මයමෙව අරහාම තං භව න්තං ගොතමං දස්සනාය උපසංකමිතුං, නත්වෙව අරහති සො භවං ගොතමො අම්හාකං දස්සනාය උපසංකමිතුං. සමණො ඛලු භො ගොතමො උභතො සුජාතො මාතිතොච පිතිතොච සංසුඞගහණිකො යාව සත්තමා පිතාමහයුගා අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවා දෙන. යම්පි භො සමණො ගොතමො උභතො සුජාතො මාතිතොච පිතිතොච සංසුඩගහණිකො යාව සත්තමා පිතාමහයුගා අක්ඛිත් තො අනුපක්කුඪො ජාතිවාදෙන, ඉමිනාපඞගෙන න අරහති සො භවං ගොතමො අම්හාකං දස්සනාය උපසංකමිතුං.

මෙකාරණයෙන්ද කූටදන්ත පින්වත්තෙමේ ඒ ගොයුම්ගොත් මහණහු දක්මට එලඹෙන්නට සුදුස්සෙක්නොවේ. මහණගොයුම් තෙමේම කූටදන්ත පින්වතුන්දක්මපිණිස එලඹෙන්නට සුදුසුය කියායි.

7. මෙසේ කීකල්හි කූටදන්ත බ්‍රාහ්මණතෙමේ ඒ බමුණන්ට මෙකරුණු දැන්වීය. ඒ පින්වත් ගෞතමයන්වහන්සේ දැකීමපිණිස එලඹෙන්ට අපිම යම්සේ සුදුස්සෝ වෙමුද. ඒ පින්වත් ගෞතමයන් වහන්සේ අප දැකීමපිණිස එලඹෙන්නට සුදුසුම නොවේද, එහෙයින් මාගේ කථාවද අසව්. ශ්‍රමණ ගෞතමයන්වහන්සේ වූකලි මව්පිය දෙපසින් යහපත්සේ උපන්නේය. පිරිසිදු මාතෘගර්භ ඇත්තේය. සත් වෙනි මහාපිතෘයුග පරම්පරාවදක්වාඅවඥකිරීමෙන්බැහැරනොකරණ ලද්දේය. ජාතිවාදයෙන් උපක්‍රොශ නොකරණලද්දේය. පින්වත්නි, යම්හෙයකින් ශ්‍රමණ ගෞතමයන්වහන්සේ මව්පිය දෙපසින් යහ පත්සේ උපන්නේද පිරිසිදුමාතෘගර්භඇත්තේද සත්වෙනි මහපිතෘයුග පරම්පරාව දක්වා අවඥකිරීමෙන් බැහැරනොකරණ ලද්දේද ජාති වාදයෙන් උපක්‍රොශ නොකරණ ලද්දේද මෙකාරණයෙන්ද ඒ පින් වත් ගෞතමයන්වහන්සේ අපගේ දැකීමපිණිස එලඹෙන්නට සුදුස් සෙක් නොවේ.

අථඛොමයමෙවඅරහාම තංභවන්තං ගොතමංදස්සනායඋපසංකමිතුං. සමණොඛලුභොගොතමො මහන්තංඤාතිසංඝංඔහායපබ්බජිතො. සමණො ඛලු භො ගොතමො පහූතං හිරඤ්ඤසුවණ්ණං ඔහාය පබ්බජිතො භූමිගතඤ්ච වෙහාසට්ඨඤ්ච. සමණො ඛලු භො ගොතමො දහරොව සමානො සුසු කාළකෙසො භද්‍රෙන යොබ්බනෙන සමන්නාගතො පඨමෙන වයසා. අගාරස්මා අනගාරියං පබ්බජිතො. සමණො ඛලු භො ගොතමො අකාමකානං මාතාපිතුන්නං අස්සුමුඛානං රුදන්තානං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිතො. සමණො ඛලු භො ගොතමො අභිරූපො දස්සනීයො පාසාදිකො පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතො බ්‍රහ්මවණ්ණීබ්‍රහ්මවච්ඡසීඅඛුද්දාවකාසො දස්සනාය. සමණො ඛලු භො ගොතමො. සීලවා අරියසීලී කුසලසීලී කුසලසීලෙන සමන්නාගතො. සමණො ඛලු භො ගොතමො. කල්‍යාණවාචො.

එසේ ඇතිකල්හි අපිම ඒභවද් ගෞතමයන්වහන්සේ දක්මටඑළඹෙන්නටසුදුස්සෝවෙමු. ශ්‍රමණභවද්ගෞතමයන්වහන්සේවූකලිමහත්වූ ඥාතිසමූහයා හැර පැවිදිවූයේය. ශ්‍රමණ භවද් ගෞතමයන්වහන්සේ වූකලි භූමිගතවූද, ආකාශගතවූද, බොහෝ හිරණ්‍යසුවර්ණයන්හැර පැවිදිවූයේය. ශ්‍රමණ භවද් ගෞතමයන්වහන්සේ වූකලි බාලවූයේම තරුණභාවයෙන් යුක්තවූයේකළුහිසකෙස්ඇත්තේ යහපත් යොවුන් බැවින් හා පළමුවෙනිවයසින් යුක්තවූයේම ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිවූයේය. ශ්‍රමණ භවද්ගෞතමයන්වහන්සේ වූකලි නොකැමැත්තාවූ මව්පියන්කඳුලුපිරුණු මුහුණුඇතිව අඬද්දී නොහොත් අඬන්නාවූ මව්පියන්ටඅනාදරකොට කෙස්දැලිරැවුලු හරවා කාසාය වස්ත්‍රයන් අන්දවා ගිහිගෙයින් නික්ම සස්නෙහිපැවිදිවූයේය. ශ්‍රමණ භවද් ගෞතමයන්වහන්සේ වූකලි උත්තම රූප ඇත්තේය. දැකුම්කටයුත්තේය. ප්‍රසාද එලවන්නේය. උත්තම වර්ණ සෞන්දර්‍ය්‍යයෙන් යුක්තසේක. ශ්‍රේෂ්ඨ සුවර්ණවර්ණ ඇත්තේය. මහබඹහුගේ ශරීරය සමාන ශරීරයෙන් සමන්විතසේක. දැක්මට සවල්පවූ අවකාශ ඇත්තේය. ශ්‍රමණ භවද් ගෞතමයන්වහන්සේ චතුපාරිශුද්ධිශීල ඇත්තේය. ආර්‍ය්‍ය ශීල ඇත්තේය. නිර්දෝෂවූ ශීල ඇත්තේය. නිර්දෝෂ ශීලයෙන් සමන්විතවේ. ශ්‍රමණ භවද් ගෞතමයන්වහන්සේවූකලි යහපත් වචන ඇත්තේය.

කල්‍යාණවාක්කරණො පොරියාවාචාය සමන්නාගතො විස්සට්ඨාය අනෙලගලාය අත්ථස්ස විඤ්ඤාපනියා. සමණො ඛලු භො ගොතමො බහුන්නං ආචරිය පාචරියකො. සමණො ඛලු භො ගොතමො ඛීණකාමරාගො විගතචාපල්ලො. සමණො ඛලු භො ගොතමො කම්මවාදී කිරියවාදී අපාපපුරෙක්ඛාරො බ්‍රහ්මඤ්ඤාය පජාය. සමණො ඛලු භො ගොතමො උච්චා කුලා පබ්බජිතො අසම්භින්නඛත්තියකුලා. සමණො ඛලු භො ගොතමො අඩ්ඪකුලා පබ්බජිතො මහද්ධනා මහාභොගා. සමණං ඛලු භො ගොතමං තිරොරට්ඨා තිරොජනපදා සම්පුච්ඡිතුං ආගච්ඡන්ති.

යහපත්වචනකථාකිරීම්ඇත්තේය. ගුණයෙන්සම්පූර්ණවූකර්ණරසායනවූ මධුරභාවයෙන් සිහිකටයුතුවූනිර්දෙෂවූආදි මධ්‍යපර්‍යවසානය යන සර්‍වාංගයන් ප්‍රකටකොටකියනලදඅර්ථයාගේඅවබොධයට සමර්ථවූ වචනයෙන්යුක්තසේක. ශ්‍රමණභවද්ගෞතමයන්වහන්සේ වූකලිබොහෝ දෙනාගේ ආචාර්‍යප්‍රාචාර්‍යවෙයි. ශ්‍රමණභවද්ගෞතමයන්වහන්සේවූකලික්ෂයකරණලදකාමරාගඇත්තේය. සර්වඥයන්වහන්සේ සකලක්ලෙශයන් ප්‍රහාණකළ නමුත්මෙහි කාමරාගය පමණක්ක්ෂයකළේයයි කීවේ.ඔහුදන්නාපමණින් බුද්ධගුණ වර්ණනා කිරීමහෙයිනි. පාත්‍ර චීවර මණ්ඩනාදී පහවූචපලභාවඇත්තේය. ශ්‍රමණභවද්ගෞතමයන්වහන්සේවූකලි කර්මවිපාකඇතයයන කථා ඇත්තේය. නවලොවුතුරුදහම්පසක්කිරීමසඳහාකුශලධර්මයන්ගේකිරීම යහපත හෙවත් කුසල්කරව්‍යයනවිධානකථාඇත්තේය. අපාපසඞ්ඛ්‍යාතනවලොකොත්තරධර්මයන් පෙරටුකොටහැසිරීම්ඇත්තේයනොහොත්ශාරිපුත්‍රමෞද්ගල්‍යායනාදිප්‍රභේදඇතිශ්‍රෙෂ්ඨ සත්වවර්ගයාවිසින් පෙරටුකරණලද්දේ වේ.(ශ්‍රමණභවද්ගෞතමයන්වහන්සේ පෙරටුකොටගෙණහැසිරේයයනඅර්ථයි.) ද්‍රෝහ නොහොත් පාපකර්මය පෙරටුකොට හැසිරීම් නැත්තේය. හෙවත් පාපයෙහි නොහැසිරේ. ශ්‍රමණභවද් ගෞතමයන්වහන්සේ වූකලි අසම්භින්නවූ ක්ෂත්‍රියකුල සඞ්ඛ්‍යාත උසස්කුලයෙන් නික්ම පැවිදිවූසේක. ශ්‍රමණභවද් ගෞතමයන්වහන්සේ වූකලි මහද්ධන ඇත්තාවූ මහත් භොගසම්පත් ඇත්තාවූ ආඪ්‍යකුලයෙන් නික්ම පැවිදිවූසේක. ශ්‍රමණභවද් ගෞතමයන් පිළිවිසින්ට අන්රටවලින්ද, අන්දනව් වලින්ද ජනයෝ එන්නාහ.

සමණං ඛලු භොගොතමං අනෙකානි දෙවතාසහස්සානි පාණෙහි සරණං ගතානි. සමණං ඛලු භො ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දොඅබ්භුග්ගතො. ඉතිපි සො භගවා අරහං. සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්ම සාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති. සමණො ඛලු භො ගොතමො ද්වත්තිංස මහාපුරිසලක්ඛණෙහි සමන්නාගතො. සමණො ඛලු භොගොතමො එහිසාගතවාදී.

නොයෙක්දහස්ගණන් දෙවතාවෝ ශ්‍රමණභවද් ගෞතමයානන් ප්‍රාණවලින් හෙවත් දිවිහිමියෙන් පිහිටකොට ගියාහුය. ශ්‍රමණ භවද් ගෞතමයන්වහන්සේගේ වූකලි මෙසේයහපත්වූ කීර්ති ශබ්දයක් විශෙෂයෙන් උස්වනැංගේය.කෙසේදයත්. ඒ භාග්‍යවතුන් වහන්සේ සියලුකෙලෙසුන්කෙරෙන් දුරුවූයේය. සියල්ලන්ගේ පූජාවට සුදුසුය යන මේ කාරණයන්ගෙන් අර්හත්සේක. මිනාකොටතමන්වහන්සේසියලුදහම්අවබෝධකෙළේය. යනමේආදී කාරණයන්ගෙන් සම්‍යක්සම්බුද්ධසේක. ත්‍රිවිද්‍යා අෂ්ටවිද්‍යා පසළොස් චරණධර්මයන්ගෙන්සම්පූර්ණය යනමේ කාරණයන්ගෙන්විජ්ජාචරණ සම්පන්නසේක·සොඳුරුගමන්ඇතිබැවින්හා සොඳුරුතැනටගියබැවින්යයනමේආදිකාරණයන්ගෙන්සුගතසේක.සියලුඅයුරින්ලොව දැන ගත්තේයයනමේ කාරණයෙන් ලොකවිදූසේක. තමන්වහන්සේට ශ්‍රේෂ්ඨ කෙනෙක් නැත්තේය. යන මේ කාරණයෙන් අනුත්තර සේක. දමනයකටයුතු (හික්මවියයුතු) පුරුෂයන් දමනය කෙරෙති. හෝ ඔවුන් දමනය කිරීමෙහි ශ්‍රේෂ්ඨාචාර්‍ය්‍යයෙක් සමානය යන මේ කාරණයෙන් පුරිසදම්ම සාරථි සේක. දෙව්මිනිසුන්ට අනුශාසනා කෙරෙති යන මේආදි කාරණයන්ගෙන් සත්ථුසේක. චතුස්සත්‍ය ධර්මයන් අවබොධ කෙළේය යන මේආදිකාරණයෙන් බුද්ධසේක. විනාසකරණලද රාගාදි කෙලෙසුන් ඇත්තේය. යන මේ ආදිකාරණයෙන් භගවත් සේකැයි කියායි. ශ්‍රමණභවද් ගෞතමයන්වහන්සේ වූකලි දෙතිස්මහා පුරුෂලක්‍ෂණයන්ගෙන් යුක්ත සේක. ශ්‍රමණභවද් ගෞතමයන්වහන්සේ වූකලි දිව්‍යමනුෂ්‍ය ගෘහස්ථ ප්‍රව්‍රජිතයන් අතුරෙන් යම් කෙනෙක් තමන්වහන්සේගේ සමීපයට පැමිණියේනම් ඒ පැමිණියාහට මෙහි එව යහපත් ඊමක් වේවායි යන ආශිර්වාද කථා ඇතිසේක.

සබ්ලො සම්මොදකො අබ්භාකුටිකො උත්තානමුඛො පුබ්බභාසී. සමණො ඛලු භො ගොතමො චතුන්නං පරිසානං සක්කතො ගරුකතො මානිතො පූජිතො අපචිතො. සමණෙ ඛලු භො ගොතමෙ බහූ දෙවා මනුස්සාච අභිප්පසන්නා. සමණො ඛලු භො ගොතමො යස්මිං ගාමෙවා නිගමෙවා පටිවසති න තස්මිං ගාමෙවා නිගමෙවා අමනුස්සා මනුස්සෙ විහෙඨෙන්ති. සමණො ඛලු භො ගොතමො සඞ්ඝී ගණී ගණාචරියො පුථුතිත්ථකරානං අග්ගමක්ඛායති. යථා ඛො පන භො එකෙසං සමණබ්‍රාහ්මණානං යථාවා තථාවා යසො සමුදාගච්ඡති න හෙවං සමණස්ස ගොතමස්ස යසො සමුදාගතො අථ ඛො

කණ්ණරසායනවූ මොලොක්වචන ඇතිසේක. පිළිසඳර කථාවෙහි දක්‍ෂසේක. තමන්වහන්සේවෙතපැමිණියන්ගෙන් සැපදුක්කෙසේද යනාදින්විචාරිම්වසයෙන් සතුටුවියයුතුවූ මිහිරිකථා ඇතිසේක. බැම වකුටුකලමුහුණක්නැත්තේය. හෙවත්පිරිසදකීමෙන්පූර්ණචන්ද්‍රශ්‍රියක් මෙන්සතුටපහළකරණසේක. සුලභකථා ඇත්තේය. හෙවත් පැමිණි පිරිස සතුටුකරණ මනහරදම් දෙසුම් ඇතිසේක. පළමුකොට කරණකථා ඇත්තේය. හෙවත් කාලයට සුදුසුවූ අපිනිශ්‍රිතවූ ධාර්මිකකථා ඇතිසේක. ශ්‍රමණභවද් ගෞතමයන්වහන්සේ වූකලි භික්‍ෂු භික්‍ෂුණ්‍යාදිසිව්පිරිසවිසින්සත්කාරකරණලද්දේය ගරුකරණලද්දේය බුහුමන්කරණලද්දේය. පුදනලද්දේය. සත්කාර පූර්වක ප්‍රණිපාතයෙන් ආදරසහිතවපුදනලද්දේයශ්‍රමණභවද්ගෞතමයන්වහන්සේකෙරෙහි බොහෝ දෙවියෝද, මනුෂ්‍යයෝද, විශෙෂයෙන් ප්‍රසන්නයහ. ශ්‍රමණභවද් ගෞතමයන්වහන්සේවූකලි යම්ගමක හෝ නියම්ගමක වාසයක්රණසේක්ද, ඒගමෙහි හෝ නියම්ගමෙහි අමනුෂ්‍යයෝ මිනිසුන්ට නානාවිධ හිංසාපීඩා කිරීමෙන් නොවෙහෙසත්. ශ්‍රමණභවද් ගෞතමයන්වහන්සේ වූකලි මහාකාශ්‍යපාදි මහරහත් පැවිදිසමුහයා ඇත්තේය. ගෘහස්ථසමුහයා ඇත්තේය. ගණාචාර්‍ය්‍යද‍වේ. බොහෝලබ්ධි උපදවන්නන් අතුරෙන් ශ්‍රේෂ්ඨයයි කියනුලැබේ. පින්වත්නි, යම්සේ ඇතැම් මහණබමුණන්ගේ යසස අවෙලකතාදි කිසියම්කරුණකින් උසස්බවට පැමිණේ. ශ්‍රමණභවද් ගෞතමයන් වහන්සේගේ යසස එසේ අවෙලකතාදි කරුණකින් වැඞීමට නො පැමිණියේය. කෙසේ වැඞීමට පැමිණියේදයත්,

අනුත්තරාය විජ්ජාචරණ සම්පදාය සමණස්ස ගොතමස්ස යසො සමුග්ගතො. සමණං බලු භො ගොතමං රාජා මාගධො සෙනියො බිම්බිසාරො සපුත්තො සභරියො සාමච්චො පාණෙහි සරණං ගතො සමණං බලු භො ගොතමං රාජා පසෙනදිකොසලො සපුත්තො සභරියො සපරිසො සාමච්චො. පාණෙහි සරණං ගතො. සමණං බලු භො ගොතමං බ්‍රාහ්මණො පොක්ඛරසාතී සපුත්තො සභරියො සපරිසො සාමච්චො පාණෙහි සරණං ගතො. සමණො බලු භො ගොතමො රඤ්ඤො මාගධස්ස සෙනියස්ස බිම්බිසාරස්ස සක්කතො ගරුකතො මානිතො පූජිතො අපචිතො. සමණො බලු භො ගොතමො රඤ්ඤො පසෙනදිකොසලස්ස සක්කතො ගරුකතො මානිතො පූජිතො අපචිතො.සමණො බලු භො ගොතමො බ්‍රාහ්මණස්ස පොක්ඛරසාතිස්ස සක්කතො ගරුකතො මානිතො පූජිතො අපචිතො.සමණො බලු භො ගොතමො ඛාණුමතං අනුප්පත්තො.

උත්තමවූ විද්‍යාචරණසම්පත්තියෙන් ශ්‍රමණභවද් ගෞතමයන් වහන්සේගේ යසස වැඩීමෙන් උසස්බවට පැමිණියේය. පුත්‍රයන් සහිතවූ භාර්‍ය්‍යාවන්(දේවීන්) සහිතවූ ඇමතියන් සහිතවූ මගධ ජනපදාධිපතිවූ බොහෝ සේනාඇත්තාවූ බිම්සර රජතෙමේ දිවිහිම්යෙන් ශ්‍රමණභවද්ගෞතමයානන් පිහිටකොට ගියේය. පුත්‍රයන්සහිතවූ භාර්‍ය්‍යාවන් සහිතවූ පිරිස්සහිතවූ ඇමතියන් සහිතවූ පසේනදිකොසොල් රජතෙමේ ශ්‍රමණභවද් ගෞතමයානන් දිවිහිමියෙන් සරණකොට ගියේය. පුත්‍රයන්සහිතවූ භාර්‍ය්‍යාවන් සහිතවූ පිරිස්සහිතවූ ඇමතියන් සහිතවූ පොක්ඛරසාතී බ්‍රාහමණතෙමේ ශ්‍රමණභවද් ගෞතමයානන් දිවිහිමියෙන් සරණකොට ගියේය. ශ්‍රමණභවද් ගෞතමයන්වහන්සේ මගධජනපදාධිපතිවූ බොහෝ සේනාඇත්තාවූ බිම්සරරජහුවිසින් සත්කාරකරණලද්දේය. ගරුකරණලද්දේය. බුහුමන්කරණ ලද්දේය. පුදනලද්දේය. සත්කාර පූර්‍වකප්‍රණිපාතයෙන් පුදනලද්දේය. ශ්‍රමණ භවද් ගෞතමයන්වහන්සේ පසේනදි කොසොල්රජහුවිසින් සත්කාරකරණලද්දේය. ගරුකරණලද්දේය. බුහුමන්කරණලද්දේය. පුදනලද්දේය. සත්කාර පූර්‍වකප්‍රණිපාතයෙන් ආදරසහිතව පුදනලද්දේය. ශ්‍රමණ භවද් ගෞතමයන්වහන්සේ පොක්ඛරසාතී බ්‍රාහ්මණයාවිසින් සත්කාරකරණලද්දේය. ගරුකරණලද්දේය. බුහුමන්කරණලද්දේය පුදනලද්දේය. සත්කාර පූර්‍වකප්‍රණිපාතයෙන් ආදරසහිතව පුදනලද්දේය. ශ්‍රමණ භවද් ගෞතමයන්වහන්සේ දැනාහි ඛාණුමතගමට වැඩිසේක්.

ඛාණුමතෙ විහරති අම්බලට්ඨිකායං. යෙ ඛො පන කෙචි සමණාවා බ්‍රාහ්මණාවා අම්හාකං ගාමක්ඛෙත්තං ආගච්ඡන්ති අතිථී නො තෙ හොන්ති අම්හාකං. අතිථී ඛො පනම්හෙහි සක්කාතබ්බා ගරුකාතබ්බා මානෙතබ්බා පූජෙතබ්බා අපචෙතබ්බා. යම්පි භො සමණො ගොතමො ඛාණුමතං අනුප්පත්තො ඛාණුමතෙ විහරති අම්බලට්ඨිකායං අතිථම්හාකං සමණො ගොතමො. අතිථි ඛො පනම්හෙහි සක්කාතබ්බො ගරුකාතබ්බො මානෙතබ්බො පූජෙතබ්බො අපචෙතබ්බො. ඉමිනාපඞ්ගෙන නඅරහති සො භවං ගොතමො අම්හාකං දස්සනාය උපසංකමිතුං, අථ ඛො මයමෙව අරහාම තං භවන්තං ගොතමං දස්සනාය උපසංකමිතුං. එත්තකෙ ඛො අහං භො තස්ස භොතො ගොතමස්ස වණ්ණෙ පරියාපුණාමි, නොච ඛො සො භවංගොතමො එත්තකවණ්ණො, අපරිමාණවණ්ණොහි සො භවං ගොතමොති.

ඛාණුමතගමෙහිවූ අම්බලට්ඨිකාඋයනෙහි වාසයකරණසේක. යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ අපගේ ග්‍රාමසීමාතුළට එත්ද, ඔව්හු අපගේ ආගන්තුගයෝ වෙත්. ආගන්තුගව පැමිණියෝ වූකලි අපවිසින් සත්කාරකටයුත්තෝ වෙත්. ගරුකටයුත්තෝ වෙත් බුහුමන්කටයුත්තෝ වෙත්. පිදියයුත්තෝ වෙත්, සත්කාර පූර්වක ප්‍රණිපාතයෙන් ආදරසහිතව පිදියයුත්තෝ වෙත්. පින්වත්නි, යම් හෙයකින් ශ්‍රමණ ගෞතමයන්වහන්සේ ඛාණුමතගමට පිළිවෙළින් පැමිණිසේක්, ඛාණුමතගමෙහිවූ අම්බලට්ඨිකාඋයනෙහි වාසයකරණසේක්ද ඒ ශ්‍රමණ ගෞතමයන්වහන්සේ අපගේ ආගන්තුකයි. ආගන්තුකව පැමිණි උන්වහන්සේ අපවිසින් සත්කාරකටයුත්තේ වේ. ගරුකටයුත්තේ වේ. බුහුමන්කටයුත්තේ වේ. පිදියයුත්තේ වේ. සත්කාරපූර්වකප්‍රණිපාතයෙන් ආදරසහිතව පිදියයුත්තේ වේ. මේකාරණයෙන්ද ඒ භවද් ගෞතමයන්වහන්සේ අපගේ දැක්මපිණිස එළඹෙන්නට සුදුස්සෙක් නොවේ. එසේකල්හි කාරණයෙක් ඇත්තේමය. අපිම ඒ භවද් ගෞතමයන්වහන්සේ දැක්මපිණිස එළඹෙන්නට සුදුස්සෝවෙමු. පින්වත්නි, මම ඒ භවද් ගෞතමයන්වහන්සේගේ මෙපමණක්ම ගුණය දනිමි. ඒ භවද් ගෞතමයන්වහන්සේ මෙපමණ ස්වල්ප ගුණ ඇත්තෙක් නොවේ. ඒ භවද් ගෞතමයන්වහසේ සර්වඥතාඥනාදි වශයෙන් අප්‍රමාණ ගුණ ඇත්තේය. එහෙයින් මාවැනි ලාමක ප්‍රඥා ඇත්තෙක් ඒ සමස්ත බුද්ධගුණය කෙසේනම් වර්ණනා කරන්නේද නොහැක්කේමැයිසේයි.

8. එවං වුත්තෙ තෙ බ්‍රාහ්මණා කූටදන්තං බ්‍රාහ්මණං එතදවොචුං. යථා ඛො භවං කූටදන්තො සමණස්ස ගොතමස්ස වණ්ණ භාසති ඉතො චෙපි සො භවං ගොතමො යොජනසතෙ විහරති අලමෙව සද්ධෙන කුලපුත්තෙන දස්සනාය උපසංකමිතුං අපිපුටංසෙනාපි. තෙනහි භො සබ්බෙව සමණං ගොතමං දස්සනාය උපසංකමිස්සාමාති. අථ ඛො කූටදන්තො බ්‍රාහ්මණො මහතා බ්‍රාහ්මණගණෙන සද්ධිං යෙන අම්බලට්ඨිකා යෙන භගවා තෙනුපසංකමි. උපසංකමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. ඛාණුමතකාපි ඛො බ්‍රාහ්මණගහපතිකා අප්පෙකච්චෙ භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු, අප්පෙකච්චෙ භගවතා සද්ධිං සම්මොදිංසු සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු, අප්පෙකච්චෙ යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා එකමන්තං නිසීදිංසු, අප්පෙකච්චෙ තුණ්හීභූතා එකමන්තං නිසීදිංසු.

---

8 මෙසේ කීකල්හි ඒබ්‍රාහ්මණයෝ කූටදන්ත බ්‍රාහ්මණයාහට මේ කාරණය දැන්වූහ. යම්සේ පින්වත් සොණදණ්ඩතෙමේ ශ්‍රමගෞතමයානන්වහන්සේගේ ගුණවර්ණනාවන් කියාද. ඒභවද්ගෞතමයන්වහන්සේ මෙයින් යොදුන් සියයයකින් මත්තෙහි වාසයකරන්නේ නමුත් සැදැහැති කුලපුත්‍රයාවිසින් උන්වහන්සේ දැකීමපිණිස මාර්ගෝපකරණ ගෙණද, එලඹෙන්නට සුදුසුයි. පින්වත්නි, එහෙනම් අපිසියල්ලෝම ශ්‍රමණගෞතමයන්වහන්සේ දැකීම පිණිස එලඹෙන්නෙමුයි කීහ. ඉක්බිත්තෙන් කූටදන්තබ්‍රාහ්මණතෙමේ මහත් බ්‍රාහ්මණ සමූහයා සමග අම්බලට්ඨිකාඋයන යම්තැනෙක්හිද භාග්‍යවතුන්වහන්සේ යම්තැනෙක්හිද එතනට එලඹුනේය. එලඹ භාග්‍යවතුන්වහන්සේ සමග සතුටුවූයේය. සතුටුවියයුතුවූ සිහිකටයුතුවූ කථාව කොට නිමවා එකත්පසෙක උන්නේය. ඛාණුමත ගම්වැසි බමුණුගැහැවියෝද ඇතම් කෙනෙක් භාග්‍යවතුන්වහන්සේ සකසා වැඳ එකත්පසෙක උන්හ. ඇතම් කෙනෙක් භාග්‍යවතුන්වහන්සේ සමග සතුටුවූහ. සතුටුවියයුතුවූ සිහිකටයුතුවූ කථාව කොට නිමවා එකත්පසෙක උන්හ. ඇතම් කෙනෙක් භාග්‍යවතුන්වහන්සේ යම්තැනෙක්හිද ඒ දෙසට අඤ්ජලිප්‍රණාමය කොට එකත්පසෙක උන්හ. ඇතම් කෙනෙක් නම්ගොත් අස්වා එකත්පසෙක උන්හ. ඇතම් කෙනෙක් නිශ්ශබ්දවූවෝ එකත්පසෙක උන්හ.

9. එකමන්තං නිසින්නො ඛො කූටදන්තො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච. සුතං මෙතං භො ගොතම සමණො ගොතමො තිවිධං යඤ්ඤසම්පදං සොළසපරික්ඛාරං ජානාතීති. න ඛො පනාහං ජානාමි තිවිධං යඤ්ඤසම්පදං සොළසපරික්ඛාරං, ඉච්ඡාමි චාහං මහායඤ්ඤං යජිතුං. සාධු මෙ භවං ගොතමො තිවිධං යඤ්ඤසම්පදං සොළසපරික්ඛාරං දෙසෙතූති. තෙනහි බ්‍රාහ්මණ සුණාහි, සාධුකං මනසි කරොහි, භාසිස්සාමීති. එවං භොති ඛො කූටදන්තො බ්‍රාහ්මණො භගවතො පච්චස්සොසි. භගවා එතදවොච.

10. භූතපුබ්බං බ්‍රාහ්මණ රාජා මහාවිජිතො නාම අහොසි අඩ්ඪො මහද්ධනො මහාභොගො පහූත ජාතරූපරජතො පහූත විත්තූපකරණො පහූතධනධඤ්ඤො පරිපුණ්ණකොසකොට්ඨාගාරො.

---

9. එකත්පසෙක උන්නාවූ කූටදන්තබ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළේය. භවද්ගෞතමයන්වහන්ස, ශ්‍රමණගෞතමයන්වහන්සේ සොළොස්පිරිකරක්ඇති හෙවත් සොළසක් පිරිවරඇති ත්‍රිවිධ යාගසම්පත්තිය දන්නාසේකැයි මෙ කාරණය මාවිසින් අසනලද්දේමය. මමද මහායාගයක් කරන්නට කැමැත්තෙමි. එහෙයින් භවද්ගෞතමයන්වහන්සේ සොළොස් පිරිකරක්ඇති හෙවත් සොළසක් පිරිවරඇති ත්‍රිවිධ යාගසම්පත්තිය මට දේසනාකරණ සේක්වා. ඒ මැනවැයි සැලකළේය. බ්‍රාහ්මණය, එහෙනම් අසව· මනාකොට මෙනෙහිකරව. කියන්නෙම්යි වදාළෝ. පින්වතුන්වහන්ස, එසේයයි කූටදන්තබ්‍රාහ්මණතෙමේ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්නේය. භාග්‍යවතුන්වහන්සේ මේ ත්‍රිවිධ යාගසම්පත්තිය වදාළේය.

10. බ්‍රාහ්මණය, පෙරකාලයෙහි තමන්සන්තක ධනයෙන් ආඪ්‍යවූ මහද් ධනඇත්තාවූ පඤ්චකාමගුණ වශයෙන් උදාර භොගසම්පත් ඇත්තාවූ බොහෝ රන්රුවන් ඇත්තාවූ නානාවිධාලඞ්කාරවත්වූ රන්රිදී බඳුන් ආදිවූ සිත්සතුටුකරණ බොහෝ උපකරණ ඇත්තාවූ බොහෝ ධනධාන්‍ය ඇත්තාවූ නිධානකොට තබනලද ධනයෙන් සම්පූර්ණවූ භාණ්ඩාගාර හා ධාන්‍යයෙන් පිරුණු කොටුගුළු ඇත්තාවූ සයුරකෙළවරකොටඇති පොළෝමඬල ජයගත්හෙයින් ලබනලද අභිවත් නාමවශයෙන් මහාවිජිතනම්ලද රජෙක් වූයේය.

අථ ඛො බ්‍රාහ්මණ රඤ්ඤො මහාවිජිතස්ස රහොගතස්ස පතිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි. අධිගතා ඛො මෙ විපුලා මානුසකා භොගා, මහන්තං පඨවිමණ්ඩලං අභිවිජිය අජ්ඣාවසාමි. යන්නූනාහං මහායඤ්ඤං යජෙය්‍යං යං මම අස්ස දීඝරත්තං හිතාය සුඛායාති. අථ ඛො බ්‍රාහ්මණ රාජා මහාවිජිතො පුරොහිතං බ්‍රාහ්මණං ආමන්තාපෙත්වා එතදවොච. ඉධ මය්හං බ්‍රාහ්මණ රහොගතස්ස පතිසල්ලීණස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි. අධිගතා ඛො මෙ විපුලා මානුසකා භොගා, මහන්තං පඨවිමණ්ඩලං අභිවිජිය අජ්ඣාවසාමි. යන්නූහං මහායඤ්ඤං යජෙය්‍යං, යං මම අස්ස දීඝරත්තං හිතාය සුඛායාති. ඉච්ඡාමහං බ්‍රාහ්මණ මහායඤ්ඤං යජිතුං. අනුසාසතු මං භවං යං මම අස්ස දීඝරත්තං හිතාය සුඛායාති.

බ්‍රාහ්මණය, ඉක්බිත්තෙන් රහසිගතවූ හෙවත් සමූහයාකෙරෙන් තුරන් බවට පැමිණියාවූ සිහින් විවෙකයට පැමිණියාවූ මහාවිජිතරජහට සිතපිළිබඳවූ හාත්පස විතර්කයක් හෙවත් සාරවත් කල්පනාවක් පහළවිය. කෙසේදයත්, මාවිසින් බොහෝවූ මානුසිකභොගසම්පත්තීහු ලබනලද්දුහුමය. මහත්වූ පෘථිවිමණ්ඩලය සර්වප්‍රකාරයෙන් ජයගෙණ අධිපතිව වාසයකරමි. යම්හෙයකින් නොහොත් යමක් මට බොහෝකලක් මුලුල්ලෙහි වැඩපිණිසද සැපපිණිසද වන්නේනම් එබඳුවූ මහායාගයක් කරන්නෙම්නම් ඉතා යෙහෙකැයි කියායි. බ්‍රාහ්මණය, ඉක්බිත්තෙන් මහාවිජිතරජතෙමේ පෙරවිබමුණා ආමන්ත්‍රණයකරවා මේ කාරණය දැන්වීය. බ්‍රාහ්මණය, මෙහි සමූහයාකෙරෙන් තුරන්බවට පැමිණියාවූ සිතපිළිබඳ විවෙකයට පැමිණියාවූ මට සිතපිළිබඳවූ හාත්පස විතර්කයක් හෙවත් මෙබඳු සාරවත් කල්පනාවක් පහළවිය. කෙසේද, මාවිසින් මානුසික භොගසම්පත් ලබනලද්දුහුමය. මහත්වූ පෘථිවිමණ්ඩලය සර්වප්‍රකාරයෙන් ජයගෙණ අධිපතිව වාසයකරමි. යම්හෙයකින් යමක් මට බොහෝකාලයක් මුලුල්ලෙහි වැඩපිණිසද සැපපිණිසද වන්නේනම් එබඳුවූ මහායාගයක් කරන්නෙම්නම් යෙහෙකැයි කියායි. බ්‍රාහ්මණය, මම මහායාගයක් කරන්නට කැමැත්තෙමි. යමක් මට බොහෝකලක් මුලුල්ලෙහි වැඩපිණිසද සැපපිණිසද වන්නේනම් එබඳුවූ මහායාගයක් කරන්නට පින්වත් තෙමේ මට අනුශාසනාකෙරේවා.

11. එවං වුත්තෙ බ්‍රාහ්මණ පුරොහිතො බ්‍රාහ්මණො රාජානං මහාවිජිතං එතදවොච. භොතො ඛො රඤ්ඤො ජනපදො සකණ්ටකො සඋප්පීළො, ගාමඝාතාපි දිස්සන්ති නගරඝාතාපි දිස්සන්ති පන්ථදූහනාපි දිස්සන්ති. භවඤ්ච ඛො පන රාජා එවං සකන්ටකෙ ජනපදෙ සඋප්පීළෙ බලිමුද්ධරෙය්‍ය, අකිච්චකාරී අස්ස තෙන භවං රාජා. සියා ඛො පන භොතො රඤ්ඤො එවමස්ස. දස්සුඛීලං වධෙනවා බන්ධෙනවා ජානියාවා ගරහායවා පබ්බාජනාය වා සමූහනිස්සාමීති, න ඛො පනෙතස්ස දස්සුඛිලස්ස එවං සම්මා සමුග්ඝාතො හොති. යෙ තෙ හතාවසෙසකා භවිස්සන්ති, තෙ පච්ඡා රඤ්ඤො ජනපදං විහෙඨෙස්සන්ති. අපිච ඛො ඉදං සංවිධානං ආගම්ම එවමෙතස්ස දස්සුඛිලස්ස සම්මා සමුග්ඝාතො හොති. තෙන හි භවං රාජා යෙ භොතො රඤ්ඤො ජනපදෙ උස්සහන්ති කසිගොරක්ඛෙ තෙසං භවං රාජා බීජභත්තං අනුප්පාදෙතු,

11. බ්‍රාහ්මණය, මෙසේකීකල්හි පෙරවිබමුණුතෙමේ මහාවිජිතරජහට මේ කාරණය දැන්වූයේය. පින්වත් රජහුගේ ජනපදය වූකලි අවැඩවූ දුක්කරුණුඑලවන හෙයින් සොරනැමැති කටුසහිතව පැවතුම් ඇත්තේය. බොහෝසෙයින් සත්වයන්ට පීඩාකරණ කරුණුසහිතය. ගම්වැනසීම්ද දක්නාලැබෙත්. නුවරවැනසුම්ද දක්නාලැබෙත්. මංපැහැරීම්ද දක්නාලැබෙත්. ඉදින් පින්වත් රජතෙමේ මෙසේ සොරකටුසහිතවූ බොහෝසෙයින් සත්වයන්ට පීඩාකරණ කරුණුසහිතවූ දනව්වෙහි බලිඋදුරන්නේනම් ඒකරණකොටගෙණ පින්වත් රජතෙමේ නොකටයුතුදෑ හෙවත් අධර්මිෂ්ඨරන්නෙක් වන්නේය. මම මේ සොරඋළ වධකිරීමෙන් හෝ අන්දුබන්ධනාදියෙන් බැඳීමෙන් හෝ මිහත්විනාසයෙන් හෙවත් සියයක් ගණිව් දහසක් ගණිව් යනාදීන් පවත්වනලද දඬයෙන් හෝ නින්දාකිරීමෙන් හෝ රටින් බැහැර කිරීමෙන් හෝ සහෙතුක කාරණයෙන් වනසාලන්නෙම්යි. පින්වත් රජහට මෙබඳු අදහසක් වේයයි මට මේ අදහස වේ. මේ සොරඋළ පිළිබඳවූ වැනසීම මෙසේ නොවේමය. මරණලද්දන් කෙරෙන් ඉතිරිවූ යම් ඒ සත්වකෙනෙක් වන්නාහුනම් ඒ සත්වයෝ පසුව රජහුගේ ජනපදය පීඩාකරන්නාහ. තවද මේ කියනුලබන නියමයට පැමිණ මෙසේ මේ සොරඋළ පිළිබඳ සහමුලින් වැනසීම වේ. එහෙනම් යම් සත්වකෙනෙක් පින්වත් රජහුගේ ජනපදයෙහි සීසෑමෙහි හා ගෙරිරැකීමෙහි උත්සාහ කෙරෙත්ද ඔවුන්ට පින්වත් රජතෙමේ දුන් දෙය නොපොහොනාකල්හි නැවත අන්‍යවූ ධාන්‍යද, බත්ද, (බීජභක්තයද) සීබඩුද දනය කෙරේවා.

යෙ භොතො රඤ්ඤො ජනපදෙ උස්සහන්ති වනිජ්ජාය තෙසං භවං රාජා පාභතං අනුප්පාදෙතු, යෙ භො තො රඤ්ඤො ජනපදෙ උස්සහන්ති රාජපොරිසෙ තෙසං භවං රාජා භත්තවෙතනං පකප්පෙතු, තෙච මනුස්සා සකම්මපසුතා රඤ්ඤො ජනපදං න විහෙඨෙස්සන්ති, මහාච රඤ්ඤො රාසිකො භවිස්සති, ඛෙමට්ඨිතා ජනපදා අකන්ටකා අනුප්පීළා, මනුස්සාච මුදා මොදමානා උරෙ පුත්තෙ නච්චෙන්තා අපාරුතඝරා මඤ්ඤෙ විහරිස්සන්තීති. එවං භොති ඛො බ්‍රාහ්මණ රාජා මහාවිජිතො පුරොහිතස්ස බ්‍රාහ්මණස්ස පටිස්සුත්වා යෙ රඤ්ඤො ජනපදෙ උස්සහිංසු කසිගොරක්ඛෙ තෙසං භවං රාජා මහාවිජිතො බීජභත්තං අනුප්පාදෙසි, යෙ රඤ්ඤො ජනපදෙ උස්සහිංසු වණිජ්ජාය තෙසං රාජා මහාවිජිතො.

පින්වත් රජහුගේ ජනපදයෙහි යම්කෙනෙක් වෙළඳාම් පිණිස උත්සාහ කෙරෙත්ද, පින්වත් රජතෙමේ ඔවුන්ට පඬුරු හෙවත් ශාක්ෂිනොකොට පත්හසුන්හි නොලියා මූලච්ඡෙද්‍ය වශයෙන් සලකා මූලභාණ්ඩ නැවත දානය කෙරේවා. යම්කෙනෙක් පින්වත් රජහුගේ ජනපදයෙහි රාජපුරුෂභාවයෙහි හෙවත් රාජකාර්‍ය්‍යයෙහි උත්සාහ කෙරෙත්ද ඔවුන්ට පින්වත් රජතෙමේ දවස් වශයෙන් හෝ මාස වශයෙන් බත් වැටුප් හෙවත් ඒ ඒ කුලයන්ගේ කර්මාන්තයන්හි දක්ෂභාවයට සුදුසුපරිද්දෙන් තනතුරු හා ගම්නියම් ගම් ආදිය දානයකෙරේවා. ඒ මනුෂ්‍යයෝද තමතමන්ගේ කටයුතුවල යෙදුනාහු රජහුගේ දනව්ව නොවෙහෙසන්නාහ. රජහට මහත් ධනධාන්‍ය රාශියක්ද වන්නේය. සොරනැමති කටුනැත්තාවූ පීඩා නැත්තාවූ ජනපදයෝද සහපත්සේ පැවැත්තාහ. මනුෂ්‍යයෝද සතුටුකාරණයෙන් සතුටුවන්නෝ හෙවත් ඔවුනොවුන් ප්‍රමුදිත සිත් ඇත්තෝ නොවසනලද හෙවත් විවෘතකරණලද ගේදොර ඇත්තන් මෙන් ක්‍රීඩාවශයෙන් ළයෙහි පුත්‍රයන් නටවමින් වාසයකරන්නාහ. බ්‍රාහ්මණය පින්වත, එසේයයි මහාවිජිතරජතෙමේ පෙරවිබමුණුහට පිළිවදන්දී යම්කෙනෙක් රජහුගේජනපදයෙහි සීසෑමෙහිහාගෙරිරැකීමෙහි උත්සාහකළාහුද පින්වත් මහාවිජිතරජතෙමේ ඔන්ට දූත්දෙන නොපොහොනාකල්හි නැවත අන්‍යවූ ධාන්‍යද බත්ද සීබඩුද දානය කරවීය. යම්කෙනෙක් රජහුගේ ජනපදයෙහි වෙළඳමපිණිස උත් සාහකළාහුද ඔවුන්ට පින්වත් මහාවිජිතරජතෙමේ.

පාභතං අනුප්පාදෙසි, යෙ රඤ්ඤො ජනපදෙ උස්සහිංසු රාජපොරිසෙ, තෙසං රාජා මහාවිජිතො භත්තවෙතනං පකප්පෙසි, තෙ ච මනුස්සා සකම්මපසුතා රඤ්ඤො ජනපදං න විහෙඨෙසුං, මහා ච රඤ්ඤො රාසිකො අහොසි, ඛෙමට්ඨිතා ජනපදා අකණ්ටකා අනුපපීළා, මනුස්සා මුදා මොදමානා උරෙ පුත්තෙ නච්චෙන්තා අපාරුතඝරා මඤ්ඤෙ විහරිංසු.

12. අථ ඛො බ්‍රාහ්මණ රාජා මහාවිජිතො පුරොහිතං බ්‍රාහ්මණං ආමන්තාපෙත්වා එතදවොච. සමූහතො ඛො මෙ භො දස්සුඛීලො, භොතො සංවිධානං ආගම්ම. මහා ච මෙ රාසිකො. ඛෙමට්ඨිතා ජනපදා අකණ්ටකා අනුපපීළා මනුස්සා මුදා මොදමානා උරෙ පුත්තෙ නච්චෙන්තා අපාරුතඝරා මඤ්ඤෙ විහරන්ති. ඉච්ඡාමහං බ්‍රාහ්මණ මහායඤ්ඤං යජිතුං.

පඩුරු ගෙවත් ගෘහස්ථිනොකොට පත්හසුත්හි නොලියා මූලවෛද්‍ය වශයෙන් සලකා මූලභාණ්ඩයන් දුනකරවිය. යම්කෙනෙක් රජහුගේ ජනපදයෙහි රාජපුරුෂභාවයෙහි හෙවත් රාජකාර්‍ය්‍යයෙහි උත්සාහකළාහුද ඔවුන්ට පින්වත් මහාවිජිතරජතෙමේ වැටුප් හෙවත් ඒඒ කුලයන්ගේ කර්මාන්තයන්හි දක්ෂභාවයට සුදුසුපරිද්දෙන් තනතුරු හා ගම් නියම්ගම් ආදිය දුනයකරවිය, ඒ මනුෂ්‍යයෝද තමන්ගේ කටයුතුවල ව්‍යාවෘතවූවෝ රජහුගේ ජනපදය පීඩා නොකළාහුය, රජහටද මහත්වූ ධනධාන්‍ය රාශියක් විය, සොරකටු නැත්තාවූ පීඩාකරණ කාරණා නැත්තාවූ ජනපදයෝද යහපත්සේ පැවැත්තාහ. මනුෂ්‍යයෝද සතුටු කාරණයෙන් සතුටුවන්නාහු හෙවත් ඔවුනොවුන් ප්‍රමුදිත සිත ඇත්තාහු නොවසනලද ගේදොර ඇත්තන්මෙන් ලයෙහි ක්‍රීඩාවශයෙන් පුත්‍රයන් නටවමින් වාසයකළාහුය.

12. බ්‍රාහ්මණය ඉක්බිත්තෙන් මහාවිජිත රජතෙමේ පෙරවි බමුණා ආමන්ත්‍රණය කරවා මේ කාරණය දැන්වූයේය. පින්වත මා විසින් පින්වත්හුගේ නියමයට පැමිණ සොරඋළසහමුලින් වනසනලද්දේමය. මට මහත්වූ ධනධාන්‍ය රාශියක්ද, ඇතිවිය. ජනපදයෝ සොරකටු නැත්තෝ බොහෝ සෙයින් පීඩාකරණ කාරණා නැත්තාහු නිර්භය භාවයෙන් පැවැත්තාහුය. මනුෂ්‍යයෝද, බොහෝ සෙයින් ප්‍රීතිමත්වූවෝ ලයෙහි පුත්‍රයන් ක්‍රීඩාවශයෙන් නටවන්නාහු, නොවසනලද ගේ දොර ඇත්තන්මෙන් වාසය කරත්යයි හඟිමි. බ්‍රාහ්මණය, මම මහායාගයක් යාගකරන්නට කැමැත්තෙමි.

අනුසාසතු මං භවං යං මම අස්ස දීඝරත්තං හිතාය සුඛායාති. තෙනහි භවං රඤ්ඤො යෙ භොතො රට්ඨෙ ජනපදෙ ඛත්තියා අනුයුත්තා නෙගමා චෙව ජානපදා ච තෙ භවං රාජා ආමන්තයතං. ඉච්ඡාමහං භො මහායඤ්ඤං යජිතුං, අනුජානන්තු මෙ භොන්තො යං මම අස්ස දීඝරත්තං හිතාය සුඛායාති. යෙ භොතො රඤ්ඤො ජනපදෙ අමච්චා පාරිසජ්ජා නෙගමා චෙව ජානපදා ච ......පෙ......බ්‍රාහ්මණ මහාසාලා නෙගමා චෙව ජානපදා ච ......පෙ......ගහපතිනෙචයිකා නෙගමා චෙව ජානපදා ච, තෙ භවං රාජා ආමන්තයතං. ඉච්ඡාමහං භො මහායඤ්ඤං යජිතුං, අනුජානන්තු මෙ භවන්තො යං මම අස්ස දීඝරත්තං හිතාය සුඛායාති. එවං භොති ඛො බ්‍රාහ්මණ රාජා මහාවිජිතො පුරොහිතස්ස බ්‍රාහ්මණස්ස පටිස්සුත්වා යෙ රඤ්ඤො ජනපදෙ ඛත්තියා අනුයුත්තා නෙගමා චෙව ජානපදා ච, තෙ රාජා මහාවිජිතො ආමන්තෙසි.

යමක් මට බොහෝකලක් මුලුල්ලෙහි වැඩපිණිසද, සැපපිණිසද, වන්නේනම් එසේ පින්වත් තෙමේ මට අනුශාසනා කෙරේවා. එහෙනම් පින්වත්රජහුගේ ජනපදයෙහි අනුවයෙදුනාවූ හෙවත් යටත්වූ ක්ෂත්‍රියයෝද, නියම්ගම්වැස්සෝද, දනව්වැස්සෝදැයි යම් කෙනෙක් වෙද්ද, පින්වත්රජතෙමේ ඔවුන්ට ආමන්ත්‍රයණය කෙරේවා. පින්වත්නි, මමමහායාගයක් කරන්නට කැමැත්තෙමි. පින්වත්නි, යමක්මට බොහෝ කලක් මුලුල්ලෙහි වැඩපිණිසද, සැපපිණිසද, වන්නේනම් එසේ මට අනුඥ කෙරේවා. පින්වත්රජහුගේ ජනපදයෙහි ඇමතියෝද, අවසේස පිරිස්ද, නියම්ගම් වැස්සෝද, දනව්වැස්සෝදැයි යම් කෙනෙක් වෙද්ද, සෙස්ස කීනයින් දතයුතු. බමුණු මහසල් කුලයෝද, නියම්ගම් වැස්සෝද, දනව් වැස්සෝද, —පෙ—වස්තුරැස්කරණ ගෘහපතීහුද, නියම්ගම් වැස්සෝද, දනව් වැස්සෝදැයි ඔවුන්ට පින්වත් රජතෙමේ ආමන්ත්‍රණය කෙරේවා. පින්වත්නි, මම යාගයක්කරන්නට කැමැත්තෙමි. යමක්මට බොහෝ කලක්මුලුල්ලෙහි වැඩපිණිසද, සැපපිණිසද, වන්නේනම් එබඳු යාගයක්මට අනුඥ කෙරෙත්වායි කියායි. බ්‍රාහ්මණය මහාවිජිත රජතෙමේ පින්වත එසේයයි. පෙරවි බමුණාහට පිළිවදන්දී රජහුගේ දනව්වෙහි අනුවයෙදුනාවූ ක්ෂත්‍රියයෝද, නියම්ගම් වැස්සෝද, දනව්වැස්සෝදැයි යම් කෙනෙක් වෙත්ද, මහාවිජිත රජතෙමේ ඔවුන්ටආමන්ත්‍රණය කෙළේය.

ඉච්ඡාමහං භො මහායඤ්ඤං යජිතුං, අනුජානන්තු මෙ භවන්තොයං මම අස්ස දීඝරත්තං හිතාය සුඛායාති. යජතංභවංරාජා යඤ්ඤං යඤ්ඤකාලොමහාරාජාති. යෙරඤ්ඤො ජනපදෙ අමච්චා පාරිසජ්ජා නෙගමාචෙවජානපදාච ..... පෙ ..... බ්‍රාහ්මණමහාසාලානෙගමාචෙවජානපදාච ගහපති නෙචයිකා නෙගමාචෙව ජානපදාච, තෙ රාජා මහාවිජිතො ආමන්තෙසි ඉච්ඡාමහං භො මහායඤ්ඤං යජිතුං, අනුජානන්තු මෙ භවන්තො යං මම අස්ස දීඝරත්තං හිතාය සුඛායාති. යජතං භවං රාජා යඤ්ඤං, යඤ්ඤකාලො මහාරාජාති. ඉතිමෙ චත්තාරො අනුමතිපක්ඛා තස්සෙව යඤ්ඤස්ස පරික්ඛාරාභවන්ති.

13. රාජා මහාවිජිතො අට්ඨහඞ්ගෙහි සමන්නාගතො. උභතො සුජාතො මාතිතොච පිතිතොච සංසුද්ධගහණිකො යාව සත්තමා පිතාමහයුගා අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන.

පින්වත්නි මම මහායාගයක් කරන්නට කැමැත්තෙමි. යමක්මටබොහෝකලක්මුලුල්ලෙහිවැඩපිණිසද,සැපපිණිසද, වන්නේනම් එයපින්වත්හු අනුඥකෙරෙත්වා. පින්වත්රජතෙමේ යාග කෙරේවා, මහරජ යාගයටසුදුසුකාලයවේ රජහුගේජනපදයෙහිඇමතියෝදසෙසුපිරිස්ද නියම්ගම් වැස්සෝද, දනව් වැස්සෝද, —පෙ—බමුණු මහසල්කුල යෝද, නියම්ගම් වැස්සෝද, දනව් වැස්සෝද,–පෙ–වස්තුරැස්කරණ ගැහැවියෝද, නියම්ගම් වැස්සෝද, දනව් වැස්සෝදැයි, ඔවුන්ට මහා විජිත රජතෙමේ ආමන්ත්‍රණය කෙළේය. පින්වත්නි, මම මහායාගයක්කරන්නට කැමැත්තෙමි. යමක් මට බොහෝ කලක් මුලුල්ලෙහි වැඩපිණිසද, සැපපිණිසද, වන්නේනම් පින්වත්හු එය අනුඥකෙරෙත්වායි. කියායි. පින්වත්රජතෙමේ යාගකෙරේවා මහරජ, මේයාගයට සුදුසු කාලයයි දැන්වූහ. මෙසේ මේ අනුමතිපක්ෂ සතර හෙවත් අනුදැන්වීම කරණ කොටත් සතර යාගයට පිරිවර වෙත්.

13. මහාවිජිත රජතෙමේ කරුණු අටකින් යුක්තවේ. මව් පිය දෙපසින් යහපත්සේ උපන්නේය. පිරිසිදු මාතෘගර්භ ඇත්තේය. සත්වෙනි මුතුන්මිත්තන්ගේ පරම්පරාව දක්වා අවඥ කිරීමෙන් බැහැර නොකරණලද්දේය. ජාතිවාදයෙන් උපක්‍රොශ නොකරණලද්දේය.

අභිරූපො දස්සනීයො පාසාදිකො පරමාය වණ්ණපොක්ඛරතාය සම න්නාගතො බ්‍රහ්මවණ්ණී බ්‍රහ්මවච්ඡසී අඛුද්දවකාසො දස්සනාය. අඩ්ඪො මහද්ධනො මහාභොගො පහූතජාතරූපරජතො පහූතවිත්තූපකරණො පහූතධනධඤ්ඤො පරිපුණ්ණකොසකොට්ඨාගාරො බලවා චතුරඞ්ගිනියා සෙනාය සමන්නාගතො අස්සවාය ඔවාදපතිකරාය පහොති මඤ්ඤෙ පච්චත්ථිකෙ යසසා. සද්ධො දායකො දානපතී අනාවට ද්වාරො සමණබ්‍රාහ්මණ කපණද්ධිකවණිබ්බකයාචකානං ඕපාන භූතො පුඤ්ඤානි කරොති. බහුස්සුතො තස්ස තස්සෙව සුතජාතස්ස තස්ස තස්සෙව ඛො පන භාසිතස්ස අත්ථං ජානාති අයං ඉමස්ස භාසිතස්ස අත්ථො අයං ඉමස්ස භාසිතස්ස අත්ථොති. පණ්ඩිතො ව්‍යත්තො මෙධාවී පටිබලො අතීතානාගතපච්චුප්පන්නෙ අත්ථෙ චින්තෙතුං. රාජා මහාවිජිතො ඉමෙහි අට්ඨහඞ්ගෙහි සමන්නාගතො. ඉති ඉමානිපි අට්ඨඞ්ගානි තස්සෙව යඤ්ඤස්ස පරික්ඛාරා භවන්ති.

උත්තම රූපයක් ඇත්තේය. දක්මට සුදුසුයි ප්‍රසාදඑලවන්තේය. උත්තමවණී සෞන්දර්‍ය්‍යයෙන් යුක්ත වේ. ශ්‍රේෂ්ඨ ස්වණිවණී ඇත් තේය. මහබඹගේ ශරීරය වැනි ශරීරයක් ඇත්තේය. දකීමට සවල්පනොවූ අවකාශ ඇත්තේය. ආඪ්‍යය මහද්ධන ඇත්තේය. මහද් භොග සම්පත් ඇත්තේය. බොහො රන්රදිඇත්තේය. බොහෝ සිත්සතුටුකරණ උපකරණ ඇත්තේය. බොහෝ ධන ධාන්‍ය ඇත්තේය. සම්පූණිවූ ධනනිධාන හා කොටුගුළු ඇත්තේය. යට හත්වූ අවවාදයට අනුව ක්‍රියාකරන්නාවූ යසස කරණකොටගෙණ පසමිතුරන් තවන්නවුන්වැනිවූ බලවත් සිව්රඟ සෙනගින් යුක් තය. දෙනශවභාව ඇත්තේ දානාධිපතිවූයේ මහණබමුණන්ය. දිළින්ඳෙය. මගියෝය. ගුණවණීනාකොට ඉල්වන්නෝය. පතක් දුනමැනව යනාදීන් යාච්ඤාකරන්නාවූ යාචකයෝය. යන මොවුන්ට පානභූමියක්වූයේම නොවසනලද දොර ඇත්තේ පින්කෙරෙයි ඒ ඒ ශාස්ත්‍රාපීයන් සම්බන්ධි බොහෝ ඇසූපිරූතැන් ඇත්තේය. මේ භාෂිතය පිළිබඳඅපීයමෙසේය මේභාෂිතය පිළිබඳඅපීය මෙසේයකී ඒ ඒ භාෂිතයන් සම්බන්ධිඅපීදනී. අතීතානාගත යන කාලත්‍රයෙහි පවත්නාවූ අපීයන් සිතන්ට සමපීවූ ව්‍යක්තවූ ප්‍රඥඇත්තාවූ පණ්ඩිත වේ. මහාවිජිතරජතෙමේ මේකරුණු අටින් යුක්ත වේ. මෙසේ මේ කරුණුඅට ඒ යාගයට පිරිවර වෙත්.

14. පුරොහිතො බ්‍රාහ්මණො චතුහඞ්ගෙහි සමන්නාගතො. උභතො සුජාතො මාතිතො ච පිතිතො ච සංසුද්ධගහණිකො යාව සත්තමා පිතාමහයුගා අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන. අජ්ඣායකො මන්තධරො තිණ්ණං වෙදානං පාරගූ සනිඝණ්ඩුකෙටුභානං සාක්ඛරප්පභෙදානං ඉතිහාස පඤ්චමානං පදකො වෙය්‍යාකරණො ලොකායත මහාපුරිස ලක්ඛණෙසු අනවයො. සීලවා වුද්ධසීලී වුද්ධසීලෙන සමන්නාගතො පණ්ඩිතො වියත්තො මෙධාවී පඨමො වා දුතියො වා සුජං පග්ගණ්හන්තානං. පුරොහිතො බ්‍රාහ්මණො ඉමෙහි චතුහඞ්ගෙහි සමන්නාගතො. ඉති ඉමානිපි චත්තාරඞ්ගානි තස්සෙව යඤ්ඤස්ස පරික්ඛාරා භවන්ති.

15. අථ ඛො බ්‍රාහ්මණ පුරොහිතො බ්‍රාහ්මණො රඤ්ඤො මහාවිජිතස්ස පුබ්බෙව යඤ්ඤා තිස්සො විධා දෙසෙසි. සියා ඛො පන භොතො රඤ්ඤො මහායඤ්ඤං යිට්ඨුකාමස්ස කොචිදෙව විප්පටිසාරො මහාවත මෙ භොගක්ඛන්ධො විගච්ඡිස්සතීති,

---

14. පෙරවිබමුණුතෙමේ අඞ්ග සතරකින් යුක්ත වේ. මව්පසින්ද, පියපසින්ද, යන දෙපසින් යහපත්සේ උපන්නේය. පිරිසිදු මාතෘගර්භ ඇත්තේය. සත්වෙනි මහාපිතෘයුගපරම්පරාව දක්වා අවඥකිරීමෙන් බැහැරනොකරණලද්දේය. ජාතිවාදයෙන් උපක්‍රොශනොකරණලද්දේය. වෙදමන්ත්‍ර හදාරන්නේය. වෙදමන්ත්‍ර දරන්නේය. වෘක්ෂාදීන්ගේ නාමප්‍රකාශක නිඝණ්ඩුශාස්ත්‍රය හා ක්‍රියාකල්ප විකල්ප ප්‍රකාශක කවීන්ට ප්‍රයොජනවත් කෙටුභශාස්ත්‍රයද සහිතවූ ශික්ෂා නිරුක්ති සහිතවූ ඉතිහාසය පස්වෙනිකොටඇති වෙදත්‍රය පිළිබඳ පරතෙරට පැමිණියේය. පදදන්නේය ව්‍යාකරණශාස්ත්‍රය හදාරන්නේය. විතණ්ඩවාදීන්ගේ ශාස්ත්‍ර හා මහාපුරුෂලක්ෂණ ශාස්ත්‍රයන්හි සම්පූර්ණ දැනගැනීම් ඇත්තේය. සිල්ඇත්තේය. එහෙයින්ම වඩනලද සිල්ඇත්තේය. සම්පූර්ණ ශීලයෙන් යුක්තවේ. ප්‍රඥවත් පණ්ඩිත වූයේ යාගහෝමාදිය කරන්නවුන් අතුරෙන් පළමුවෙනියෙක් හෝ දෙවෙනියෙක් වේ. පෙරවිබමුණුතෙමේ මේ අඞ්ග සතරින් යුක්ත වේ. මෙසේ මේ අඞ්ග සතරද ඒ යාගය සම්බන්ධවූම පිරිවර වෙත්.

15. බ්‍රාහ්මණය, ඉක්බිත්තෙන් පෙරවිබමුණුතෙමේ මහාවිජිත රජහට යාගයෙන් පළමුකොට විධිතුණ දැක්වීය. මහායාගයක් කරණුකැමැත්තාවූ පින්වත් රජහට ඒකාන්තයෙන් මාගේ මහත්වූ මේභොගරාශිය ව්‍යයවන්නේයයි කිසියම් විපිළිසර කරුණක් වන්නේද,

සො ච භොතා රඤ්ඤා විප්පටිසාරො නකරණීයො. සියා ඛොපනභොතො රඤ්ඤො මහායඤ්ඤං යජමානස්ස කොචිදෙව විප්පටිසාරො මහාවතමෙ භොගක්ඛන්ධා විගච්ඡන්තීති, සො භොතා රඤ්ඤා විප්පටිසාරො නකරණීයො. සියා ඛො පන භොතො රඤ්ඤො මහායඤ්ඤං යිට්ඨස්ස කොචිදෙව විප්පටිසාරො. මහාවත මෙ භොගක්ඛන්ධා විගතොති, සො භොතා රඤ්ඤා විප්පටිසාරො නකරණීයොති. ඉමා ඛො බ්‍රාහ්මණ පුරොහිතො බ්‍රාහ්මණො රඤ්ඤො මහාවිජිතස්ස පුබ්බෙව යඤ්ඤා තිස්සො විධා දෙසෙසි.

16. අථ ඛො බ්‍රාහ්මණපුරොහිතො බ්‍රාහ්මණො රඤ්ඤො මහාවිජිතස්ස පුබ්බෙව යඤ්ඤා දසහාකාරෙහි පටිග්ගාහකෙසු විප්පටිසාරං පටිවිනොදෙසි. ආගමිස්සන්ති ඛො භොතො යඤ්ඤං පාණාතිපාතිනොපි පාණාතිපාතා පටිවිරතාපි. යෙ තත්ථ පාණාතිපාතිනො, තෙසඤ්ඤෙව තෙන, යෙ තත්ථ පාණාතිපාතා පටිවිරතා තෙ ආරබ්භ යජතං භවං මොදතං භවං චිත්තමෙව භවං අන්තරං පසාදෙතු.

පින්වත් රජහුවිසින් ඒ විපිළිසරය නොකටයුතුයි. මහායාගයක් කරන්නාවූ පින්වත් රජහට ඒකාන්තයෙන් මාගේ මහත්වූ භොගරාශිය ව්‍යයවන්නේයයි කිසියම් විපිළිසර කරුණක් වන්නේද. පින්වත්හුවිසින් ඒ විපිළිසරය නොකටයුතුයි, මහායාගය (පරිත්‍යාගය) කළාවූ පින්වත් රජහට ඒකාන්තයෙන් මාගේ මහත්වූ භොගරාශිය ව්‍යයවූයේයයි කිසියම් විපිළිසරයක් වන්නේද, පින්වත් රජහුවිසින් ඒ විපිළිසරය නොකටයුතුයි. බ්‍රාහ්මණය, පෙරවිබමුණුතෙමේමහාවිජිතරජහටයාගයෙන්පළමුකොටම මේවිධිතුණ දැක්විය.

16. බ්‍රාහ්මණය, ඉක්බිත්තෙන් පෙරවිබමුණුතෙමේ මහාවිජිතරජහට යාගයට පළමුවෙන්ම ප්‍රකාර දසයකින් හෙවත් කරුණු දසයකින් ප්‍රතිග්‍රාහකයන් කෙරෙහි හෙවත් යාගය පිළිගන්නන් කෙරෙහි විපිළිසරය වෙසෙසින් දුරුකෙරේ. කෙසේද, පින්වත්හුගේ යාගයට ප්‍රාණඝාතනයකරන්නෝද, ප්‍රාණඝාතනයෙන් සම්ප්‍රකාරයෙන් වැළැක්කෝද එන්නාහුමය. එහි යම්කෙනෙක් ප්‍රාණඝාත කරන්නෝ වෙද්ද ඔවුන්ට ඒපාපයෙන් අනිෂ්ටවිපාකඇතිවන්නේය. එහි යම් කෙනෙක් ප්‍රාණඝාතයෙන් සම්ප්‍රකාරයෙන් වැළැක්කෝද ඔවුන් අරබයා පින්වත්තෙමේ යාගකෙරේවා. පින්වත්තෙමේ සතුටුවේවා.

ආගමිස්සන්ති ඛො භොතො යඤ්ඤං අදින්නාදායිනොපි අදින්නාදානා පටිවිරතාපි—පෙ—කාමෙසු මිච්ඡාචාරිනොපි කාමෙසුමිච්ඡාචාරා පටිවිරතාපි,මුසාවාදිනොපිමුසාවාදාපටිවිරතාපි,පිසුණවාචිනොපි පිසුණායවාචායපටිවිරතාපි,ඵරුසවාචිනොපිඵරුසායවාචාය පටිවිරතාපි සම්ඵප්පලාපිනොපි සම්ඵප්පලාපා පටිවිරතාපි, අභිජ්ඣාලුනොපි අනභිජ්ඣාලුනොපි, ව්‍යාපන්නචිත්තාපි අව්‍යාපන්න චිත්තාපි මිච්ඡාදිට්ඨිකාපි සම්මාදිට්ඨිකාපි. යෙ තත්‍ථ මිච්ඡාදිට්ඨිකා තෙසඤ්ඤෙව තෙන, යෙ තත්‍ථ සම්මාදිට්ඨිකා තෙ ආරබ්භ යජතම්භවං මොදතම්භවං චිත්තමෙව භවං අන්තරං පසාදෙතූති. ඉමෙහි ඛො බ්‍රාහ්මණ පුරොහිතො බ්‍රාහ්මණො රඤ්ඤො මහාවිජිතස්ස පුබ්බෙව යඤ්ඤා දසහාකාරෙහි පටිග්ගාහකෙසු විප්පටිසාරං පටිවිනොදෙසි.

17. අථ ඛො බ්‍රාහ්මණ පුරොහිතො බ්‍රාහ්මණො රඤ්ඤො මහාවිජිතස්සමහායඤ්ඤං යජමානස්ස සොළසහාකාරෙහි චිත්තං.

පින්වත්තෙමේ ඇතුළත්වූ සිතේම පැහැදීම කෙරේවා.පින්වත්හුගේ යාගයටනුදුන්දෙය ගන්නෝද,නුදුන්දෙයගැන්මෙන්සම්ප්‍රකාරයෙන් වැළැක්කෝද එන්නාහුමය. සෙස්ස කීනයින් දතයුතු. කාමයන්හි මිථ්‍යා හැසුරුම් ඇත්තෝද, කාමයන්හි මිථ්‍යාචාරයෙන් සම්ප්‍රකාරයෙන් වැළැක්කෝද, බොරුකියන්නෝද, බොරුකීමෙන් වෙසෙසින් වැළැක්කෝද, පෙහෙසුන්වදන් කියන්නෝද, ප්‍රියසූන්‍යවචන කථාකිරීමෙන් වෙසෙසින් වැළැක්කෝද, කර්කශවචන ඇත්තෝද, කර්කශවචන කථාවෙන් වෙසෙසින් වැළැක්කෝද, හිස්වූ ප්‍රලාපකථා ඇත්තෝදහිස්ප්‍රලාපකථාවෙන්වෙසෙසින්වැළැක්කෝදඅභිධ්‍යාබහුලකොට ඇත්තෝද,අභිධ්‍යාබහුලකොට නැත්තෝද,ක්‍රොධාදි වශයෙන් විපතටපැමිණි සිත්ඇත්තෝද, එසේ විපතටපැමිණි සිත්නැත්තෝද, මිථ්‍යාදෘෂ්ටි ඇත්තෝද, සම්‍යග්දෘෂ්ටි ඇත්තෝද, එන්නාහ. එහි යම් කෙනෙක් මිථ්‍යාදෘෂ්ටික වෙත්ද, ඔවුන්ටම ඒ පාපයෙන් අනිෂ්ට විපාක ඇතිවන්නේය. එහි යම්කෙනෙක් සම්‍යක්දෘෂ්ටික වෙත්ද, ඔවුන් අරබයා පින්වත්තෙමේ යාගකෙරේවා. හෙවත් දනාය කෙරේවා. පින්වත්තෙමේ සතුටුවේවා. පින්වත්තෙමේ ඇතුළත්වූ සිතම පහදුවායි කියායි. බ්‍රාහ්මණය, පෙරවිබමුණුතෙමේ මේ කරුණු දසයෙන් මහාවිජිතරජහුගේ සිතපිළිබඳවයාගයට පළමුකොටම ප්‍රතිග්‍රාහකයන් කෙරෙහි විපිළිසරය හෙවත් පසුතැවිල්ල දුරුකෙළේය.

17. බ්‍රාහ්මණය, ඉක්බිත්තෙන් පෙරවිබමුණුතෙමේ යාගයට පළමුකොටම මහායාගයක්කරන්නාවූ මහාවිජිතරජහුගේ සිතට සොළොස් ආකාරයකින්.

සන්දස්සෙසි සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි. සියාඛො පන භොතො රඤ්ඤො මහායඤ්ඤං යජමානස්ස කොචිදෙව වත්තා. රාජා ඛො මහාවිජිතො මහායඤ්ඤං යජති, නොචඛොතස්ස ආමන්තිතා ඛත්තියා අනුයුත්තා නෙගමාචෙව ජානපදාච. අථච පන භවං රාජා එවරූපං මහායඤ්ඤං යජතීති. එවම්පි භොතො රඤ්ඤො වත්තා ධම්මතො නත්ථි. භොතො ඛො පන රඤ්ඤො ආමන්තිතා ඛත්තියා අනුයුත්තා නෙගමාචෙව ජානපදාච, ඉමිනාච පෙතං භවං රාජා ජානාතු යජතං භවං මොදතං භවං චිත්තමෙව භවං අන්තරං පසාදෙතු. සියා ඛො පන භොතො රඤ්ඤො මහායඤ්ඤං යජමානස්ස කොචිදෙව වත්තා රාජා ඛො මහාවිජිතො මහායඤ්ඤං යජති නොචඛොතස්ස ආමන්තිතා අමච්චා පාරිසජ්ජා නෙගමාචෙව ජානපදාච……පෙ……බ්‍රාහ්මණමහාසාලා නෙගමාචෙව ජානපදාච……පෙ……ගහපති නෙචයිකා නෙගමාචෙව ජානපදාච.

මෙබඳු දන්දෙන තැනැත්තේ මෙබඳු සැපලබායයි කරුණුදක්වා කීයේය. ඒ කාරණය මනාකොට සිතටගන්වමින් කීයේය, විපිළිසරබව දුරුකරමින් එහි සිත තෙදගැන්වීය හෙවත් පිරිසිදු කෙළේය. වැඩියක් සතුටුකළේය හෙවත් ඔබවිසින් යහපතක්කටයුතුයයි සතුටුකොට කීයේය. මහායාගයක් කරන්නාවූ පින්වත් රජහට දැහැමින් කරුණු කියන්නාවූ කිසිවෙක් වන්නේද. කෙසේදයත්, මහාවිජිතරජතෙමේ වූකලි මහායාගයක් කෙරේ. ඔහුවිසින් අනුවයෙදුනාවූ හෙවත් යටත්වූ ක්ෂත්‍රියයෝද නියම්ගම් වැස්සෝද, දනව් වැස්සෝද, ආමන්ත්‍රණයනොකරණලද්දහුමය. එසේනමුත් පින්වත් රජතෙමේ මෙබඳුවූ මහායාගයක් කෙරෙයි කියායි. මෙසේද පින්වත් රජහට දැහැමින් සෙමින් කියන්නෙක් නැත්තේය. පින්වත් රජහුවිසින් අනුවයෙදුනාවූ ක්ෂත්‍රියයෝද, නියම්ගම් වැස්සෝද, දනව් වැස්සෝද, ආමන්ත්‍රණයකරණලද්දහුය. මේ කාරණයෙන්ද පින්වත් රජතෙමේ මෙසේදැනගණීවා. පින්වත්තෙම යාගකෙරේවා. පින්වත්තෙම සතුටුවේවා. පින්වත්තෙම ඇතුළතවූ සිතම පහදවායි කියායි. මහායාගකරන්නාවූ පින්වත් රජහට කිසියම් කියන්නෙක් වන්නේද, මහාවිජිතරජතෙමේ මහායාගයක් කෙරෙයි. ඔහුවිසින් ඇමතියන් හා සෙසු පිරිසද, නියම්ගම් වැස්සෝද, දනව් වැස්සෝද, ආමන්ත්‍රණයනොකරණලද්දහුමය. සෙස්ස කීනයින් දතයුතු. බමුණුමහසල්කුලයෝද, නියම්ගම් වැස්සෝද, දනව් වැස්සෝද වස්තුරැස්කරණ ගෘහපතිහුද, නියම්ගම් වැස්සෝද, දනව් වැස්සෝද, ආමන්ත්‍රණය නොකරණ ලද්දහුමය.

අථච පන භවං රාජා එවරූපං මහායඤ්ඤං යජතීති. එවම්පි භොතො රඤ්ඤො වත්තා ධම්මතො නත්ථි. භොතො පන රඤ්ඤො ආමන්තිතා ගහපති නෙගමිකා නෙගමාචෙව ජානපදාච. ඉමිනා පෙතං භවං රාජා ජානාතු. යජතං භවං මොදතං භවං චිත්තමෙව භවං අන්තරං පසාදෙතු. සියා ඛො පන භොතො රඤ්ඤො මහායඤ්ඤං යජමානස්ස කොචිදෙව වත්තා. රාජා ඛො මහාවිජිතො මහායඤ්ඤං යජති, නොච ඛො උභතො සුජාතො මාතිතොච පිතිතොච සංසුද්ධගහණිකො යාවසත්තමා පිතාමහයුගා අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන, අථච පන භවං රාජා එවරූපං මහායඤ්ඤං යජතීති. එවම්පි භොතො රඤ්ඤො වත්තා ධම්මතො නත්ථි භවං ඛො පන රාජා උභතො සුජාතො මාතිතොච පිතිතොච සංසුද්ධගහණිකො යාවසත්තමා පිතාමහයුගා අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන, ඉමිනාපෙතං භවං රාජා ජානාතු. යජතං භවං, මොදතං භවං, චිත්තමෙව භවං, අන්තරං පසාදෙතු.

එසේනමුත් පින්වත් රජතෙමේ මෙබඳු මහායාගයක්(පරිත්‍යාගයක්) කෙරේය කියායි. පින්වත් රජහුවිසින් විස්තුරුස්කරණගෘහපතිහුද නියම්ගම් වැස්සෝද, දනව් වැස්සෝද, ආමන්ත්‍රණයකරණලද්දාහුයයි මෙසේත් පින්වත් රජහට දැහැමින් කියන්නෙක් නැත්තේය. මේ කාරණයෙන්ද පින්වත් රජතෙමේ මෙය දැනගණීවා. පින්වත් තෙමේ යාගකෙරේවා. පින්වත්තෙමේ සතුටුවේවා. පින්වත්තෙමේ ඇතුළතවූ සිතම පහදුවා. මහායාගය කරන්නාවූ පින්වත් රජහට කිසියම් කියන්නෙක් වන්නේද. කෙසේද, මහාවිජිතරජතෙමේ මහායාගයක්(පරිත්‍යාගයක්)කෙරේ. මව්පසින්ද පියපසින්ද යන දෙපසින් යහපත්සේ නොමඋපන්නේය. පිරිසිදු මාතෘගර්භ නැත්තේය. සත්වෙනි මුතුන්මිත්තන්ගේ පරම්පරාව දක්වා අවඥකිරීමෙන් බැහැර කරණලද්දේය. ජාතිවාදයෙන් උපක්‍රොශ කරණලද්දේය. එසේ නමුත් පින්වත් රජතෙමේ මෙබඳු මහාවස්තු පරිත්‍යාගයක් කෙරේවායි කියායි. මෙසේද පින්වත් රජහට ධර්මයෙන් කියන්නෙක් නැත්තේය. පින්වත් රජතෙමේ වූකලි මව්පිය දෙපසින් යහපත්සේ උපන්නේය. පිරිසිදු මාතෘගර්භ ඇත්තේය. සත්වෙනි මහාපිතෘයුග පරම්පරාව දක්වා අවඥකිරීමෙන් බැහැරනොකරණලද්දේය. ජාතිවාදයෙන් උපක්‍රොශනොකරණලද්දේය. පින්වත් රජතෙමේ මේ කාරණයෙන්ද මෙය දැනගණීවා. පින්වත්තෙමේ යාගකෙරේවා. පින්වත්තෙමේ සතුටුවේවා. පින්වත්තෙමේ ඇතුළතවූ සිතම පහදුවා.

සියා ඛො පන භොතො රඤ්ඤො මහායඤ්ඤං යජමානස්ස කොචිදෙව වත්තා. රාජා ඛො මහාවිජිතො මහායඤ්ඤං යජති, නොච ඛො අභිරූපො දස්සනීයො පාසාදිකො පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතො බ්‍රහ්මවණ්ණී බ්‍රහ්මවච්ඡසී අඛුද්දාවකාසො දස්සනාය —පෙ— නොච ඛො අඩ්ඪො මහද්ධනො මහාභොගො පහූතජාතරූපරජතො පහූතවිත්තූපකරණො පහූතධනධඤ්ඤො පරිපුණ්ණකොසකොට්ඨාගාරො —පෙ— නොච ඛො බලවා චතුරඞ්ගිනියා සෙනාය සමන්නාගතො අස්සවාය ඔවාදපතිකරාය පතාපති මඤ්ඤෙ පච්චත්ථිකෙ යස සා —පෙ— නොච ඛො සද්ධො දායකො දානපති අනාවටද්වාරො සමණබ්‍රාහ්මණ කපණද්ධික වණිබ්බක යාචකානං ඔපානභූතො පුඤ්ඤානි කරොති —පෙ— නොච ඛො බහුස්සුතො තස්ස තස්ස සුතජාතස්ස —පෙ— නොච ඛො තස්ස තස්සෙව ඛො පන භාසිතස්ස අත්ථං ජානාති අයං ඉමස්ස භාසිතස්ස අත්ථො, අයං ඉමස්ස භාසිතස්ස අත්ථොති —පෙ— නොච ඛො පණ්ඩිතො වියත්තො මෙධාවී පටිබලො අතීතානාගතපච්චුප්පන්නෙ අත්ථෙ චින්තෙතුං —පෙ—

මහාවස්තු පරිත්‍යාගයක්කරන්නාවූ පින්වත් රජහට කිසියම් කියන්නෙක් වන්නේද, මහාවිජිතරජතෙමේ මහා වස්තු පරිත්‍යාගයක් කෙරේ. උත්තම රූපයක් නැත්තේය. දකුම්කටයුත්තේ නොවේ. ප්‍රසාදඑලවත්නේද නොවේ. උත්තමවර්ණ සෞන්දර්‍ය්‍යයෙන් යුක්තද නොවේ. උත්තම ස්වර්ණවර්ණ නැත්තේය. මහබඹහුගේ ශරීරයවැනි ශරීරයක් නැත්තේය. දකිමට ඉතා පහසුය. ආඪ්‍යනොවේ. මහද් ධන නැත්තේය. මහත්භොගසම්පත් නැත්තේය. බොහෝ උපභොග පරිභොගසම්පත් නැත්තේය. බොහෝ ධනධාන්‍ය නැත්තේය. සම්පූර්ණ ධනනිධානාදිය හා කොටුගුළුනැත්තේය. කීකරුවූ අවවාදනුගතව ක්‍රියාකරන්නාවූ යසසකරණකොටගෙණ පසමිතුරන් තවත්න වුන්වැනිවූ බලවත්වූ සිව්රඟ සෙනඟින් සමන්විත නොවේ.—පෙ— ශ්‍රද්ධාඇත්තාවූ දෙන්නාවූ දානාධිපතියෙක්ද නොවේ. මහණබමුණෝය දිළින්දෝය. මඟියෝය යන මොවුන්ට ආවරණයනොකරණලදහෙවත් නොවසනලද දොරඇත්තේ ඔවුන්ට පානභූමියක් වැනිවූයේම පින් නොකෙරෙයි—පෙ—ඒ ඒ ශාස්ත්‍රසම්බන්ධව බොහෝ ඇසුපිරූතැන් ඇත්තේත් නොවේ—පෙ—මේ මේ භාෂිතය සම්බන්ධ අර්ථය, මේ මේ භාෂිතය සම්බන්ධි අර්ථයයි. ඒ ඒ භාෂිතයන් පිළිබඳ අර්ථයන් නොදනීමය—පෙ—අතීතානාගත යන කාලත්‍රය පිළිබඳ අර්ථයන් සිතන්ට සමර්ථවූ ව්‍යක්තවූ ප්‍රඥාඇත්තාවූ පණ්ඩිතයෙක්ද නොවේ.

අථච පන භවං රාජා එවරූපං මහායඤ්ඤං යජතීති. එවම්පි හොතො රඤ්ඤො වත්තා ධම්මතො නත්ථි, භවං ඛො පන රාජා පණ්ඩිතො වියත්තො මෙධාවි පටිබලො අතීතානාගතපච්චුප්පන්නෙන අත්ථෙ චින්තෙතුං, ඉමිනා පෙතං භවං රාජා ජානාතු යජතම් භවං, මොදතං භවං, චිත්තමෙව භවං අන්තරං පසාදෙතු. සියා ඛො පන භොතො රඤ්ඤො මහායඤ්ඤං යජමානස්ස කොචිදෙව වත්තා. රාජා ඛො මහාවිජිතො මහායඤ්ඤං යජති, නොච ඛො තස්ස පුරොහිතො බ්‍රාහ්මණො උභතො සුජාතො මාතිතොච පිතිතොච සංසුද්ධගහණිකො යාවසත්තමා පිතාමහයුගා අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන, අථච පන භවං රාජා එවරූපං මහායඤ්ඤං යජතීති. එවම්පි හොතො රඤ්ඤො වත්තා ධම්මතො නත්ථි හොතො ඛො පන රඤ්ඤො පුරොහිතො බ්‍රාහ්මණො උභතො සුජාතො මාතිතොච පිතිතොච සංසුද්ධගහණිකො යාවසත්තමා පිතාමහයුගා අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන.

එසේනමුත් පින්වත්රජතෙමේ මෙබඳු මහාවස්තුපරිත්‍යාගයක් කෙරේය කියායි. මෙසේත් පින්වත් රජහට ධර්මකාරණයෙන් කියන්නෙක් නැත්තේය.කෙසේදයත්,පින්වත් රජතෙමේවූකලි අතීතානාගත යන කාලත්‍රය පිළිබඳ අර්ථයන් සිතන්ට සමර්ථවූ ව්‍යක්තවූ ප්‍රඥඇත්තාවූ පණ්ඩිතයෙක. පින්වත් රජතෙමේ මේ කාරණයෙන්ද මෙය දැන ගණීවා. පින්වත්තෙමේ දනයකෙරේවා. පින්වත්තෙමේ සතුටුවේවා. පින්වත්තෙමේ ඇතුළතවූ සිතම පහදවා. මහාවස්තු පරිත්‍යාගයක් කරන්නාවූ පින්වත් රජහට මෙසේ කියන්නෙක් වන්නේද. කෙසේද,මහාවිජිතරජතෙමේමහාවස්තු පරිත්‍යාගයක්කෙරේ,ඔහුගේ පෙරවිබමුණුතෙමේ මව්පිය දෙපසින් යහපත්සේ නූපන්නේය. පිරිසිදු මාතෘගර්භ නැත්තේය. සත්වෙනි මහාපිතෘයුගපරම්පරාව දක්වා අවඥකිරීමෙන් බැහැරනොකරණලද්දේ නොවේ. ජාතිවාදයෙන් උපක්‍රොශනොකරණලද්දේ නොවේ. එසේනමුත් පින්වත් රජතෙමේ මෙබඳු වස්තු පරිත්‍යාගයක් කෙරෙයි කියායි. මෙසේද පින්වත් රජහට ධර්මයෙන් කියන්නෙක් නැත්තේය. පින්වත් රජහුගේ පෙරවිබමුණුතෙමේ මව්පිය දෙපසින් යහපත්සේ උපන්නේය. පිරිසිදු මාතෘගර්භ ඇත්තේය. සත්වෙනි මහාපිතෘයුගපරම්පරාව දක්වා අවඥකිරීමෙන් බැහැරනොකරණලද්දේය. ජාතිවාදයෙන් උපක්‍රොශනොකරණලද්දේය.

ඉමිනාපෙතං භවං රාජා ජානාතු. යජතං භවං මොදතං භවං චිත්තමෙව භවං අන්තරං පසාදෙතු ...පෙ... සියා ඛො පන හොතො රඤ්ඤො මහායඤ්ඤං යජමානස්ස කොචිදෙව වත්තා. රාජා ඛො මහාවිජිතො මහායඤ්ඤං යජති, නොචඛවස්ස පුරොහිතො බ්‍රාහ්මණො අජ්ඣායකො මන්තධරො තිණ්ණං වෙදානං පාරගූ සනිඝණ්ඩු කෙටුභානං සාක්ඛරප්පභෙදානං ඉතිහාස පඤ්චමානං පදකො වෙය්‍යාකරණො ලොකායතමහාපුරිසලක්ඛණෙසු අනවයො ...පෙ... නොචඛවස්ස පුරොහිතො බ්‍රාහ්මණො සීලවා වුඩ්ඪසීලී වුඩ්ඪසීලෙන සමන්නාගතො ...පෙ... නොචඛවස්ස පුරොහිතො බ්‍රාහ්මණො පණ්ඩිතො වියත්තො මෙධාවී පඨමො වා දුතියො වා සුජම්පග්ගණ්හන්තානං, අථ ච පන භවං රාජා එවරූපං මහායඤ්ඤං යජතීති. එවම්පි හොතො රඤ්ඤො වත්තා ධම්මතො නත්ථි, හොතො ඛො පන රඤ්ඤො පුරොහිතො බ්‍රාහ්මණො පණ්ඩිතො වියත්තො මෙධාවී පඨමො වා දුතියො වා සුජම්පග්ගණ්හන්තානං.

මේකාරණයෙන්ද පින්වත් රජතෙමේ මෙය දැනගණීවා. පින්වත්තෙමේ දනය කෙරේවා. පින්වත්තෙමේසතුටුවේවා. පින්වත්තෙමේඇතුළතවූ සිතම පහදවා. සෙස්ස කිනයින් දනයුතුයි. මහාවස්තු පරිත්‍යාගයක් කරන්නාවූ පින්වත් රජහට මෙසේ කිසියම් කියන්නෙක් වන්නේද. කෙසේද, මහාවිජිතරජතෙමේ මහාවස්තු පරිත්‍යාගයක්කෙරේ. ඔහුගේ පෙරවිබමුණුතෙමේ වෙදමන්ත්‍ර හදරන්නාවූ වෙදමන්ත්‍ර දරන්නාවූ වෘක්ෂාදීන්ගේ නාමප්‍රකාශක නිඝණ්ඩුශාස්ත්‍රය හා ක්‍රියා කල්පවිකල්පප්‍රකාශක කවීන්ට ප්‍රයොජනවන් කෙටුභශාස්ත්‍රයද සහිතවූ ශික්ෂානිරුක්ති සහිතවූ ඉතිහාසය පස්වෙනිකොටඇති වේදත්‍රය පිළිබඳ පරතෙරට පැමිණියෙක් නොවෙයි. පදදන්නෙක්ද ව්‍යාකරණශාස්ත්‍ර හදරන්නෙක්ද විතණ්ඩවාදීන්ගේ ශාස්ත්‍ර හා මහා පුරුෂලක්ෂණශාස්ත්‍රයන්හි සම්පූර්ණදැනගැණීම්ඇත්තෙක්ද නොවෙයි කියායි—පෙ—ඔහුගේ පෙරවිබමුණුතෙමේ සිල්ඇත්තාවූ එහෙයින්ම වඩනලද සිල්ඇත්තාවූ වඩනලද සම්පූර්ණ සීලයෙන් සමන්විතයෙක් නොවේයයිද ඔහුගේ පෙරවිබමුණුතෙමේ ව්‍යක්තවූ ප්‍රඥවත් පණ්ඩිතවූ යාගහෝමාදිය කරන්නවුන් අතුරෙන් පළමුවෙනියෙක් හෝ දෙවෙනියෙක්ද නොවෙයි. එසේනමුත් පින්වත් රජතෙමේ මෙබඳු මහාවස්තු පරිත්‍යාගයක් කෙරේය කියායි. මෙසේද පින්වත් රජහට ධර්මයෙන් කියන්නෙක් නැත්තේය. කෙසේද, පින්වත් රජහුගේ පෙරවිබමුණුතෙමේ ව්‍යක්තවූ ප්‍රඥඇත්තාවූ පණ්ඩිත වෙයි. යාග හෝමාදිය කරන්නවුන් අතුරෙන් පළමුවෙනියෙක් හෝ දෙවෙනියෙක් වෙයි කියායි.

ඉමිනාපෙතං භවං රාජා ජානාතු යජතම්භවං මොදතම්භවං චිත්තමෙව භවං අන්තරපසාදෙතූති. ඉමෙහි ඛො බ්‍රාහ්මණ පුරොහිතො බ්‍රාහ්මණො රඤ්ඤො මහාවිජිතස්ස මහායඤ්ඤං යජමානස්ස සොළසහි ආකාරෙහි චිත්තං සන්දස්සෙසි සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි.

18. තස්මිං ඛො බ්‍රාහ්මණ යඤ්ඤෙ නෙව ගාවො හඤ්ඤිංසු න අජෙළකා හඤ්ඤිංසු නකුක්කුට සූකරා හඤ්ඤිංසු න විවිධා පාණා සංඝාතං ආපජ්ජිංසු න රුක්ඛා ඡිජ්ජිංසු යූපත්ථාය, න දබ්භා ලූයිංසු පරහිං සත්ථාය. යෙපිස්ස අහෙසුං දාසාතිවා පෙස්සාතිවා කම්මකරාතිවා තෙපි න දණ්ඩතජ්ජිතා න භයතජ්ජිතා න අස්සුමුඛා රුදමානා පරිකම්මානි අකංසු.

පින්වත් රජතෙමේ මේ කාරණයෙන්ද මෙය දැනගණීවා. පින්වත්තෙමේ යාග කෙරේවා. පින්වත්තෙමේ සතුටු වේවා. පින්වත්තෙමේ ඇතුළතවූ සිතම පහදවායි. බ්‍රාහමණය, මහාවස්තු පරිත්‍යාගයක් කරන්නාවූ මහාවිජිතරජහුගේ සිතට පෙරවිබමුණු තෙමේ සොළොස්ආකාරයකින් කරුණුදක්වා කියේය. කාරණය මනාකොට සිතටගන්වමින් කීයේය. විපිළිසරබව දුරුකරමින් එහි සිත තෙදගැන්විය, වැඩියක් සතුටුකෙළේය.

18. බ්‍රාහ්මණය, ඒ යාගයෙහි ගවයන් නොමැරූහ. එළුවන් හා තිරෙළුවන් නොමැරූහ. කුකුළන් හා ඌරන් නොමැරූහ. නානාවිධවූ ප්‍රාණීන් විනාසයට නොපැමිණියාහ. යාගස්තම්භපිණිස රුක් නොකැපූහ. යූපනම් මහා ටැඹ ඔසවා අසවල් රජතෙමේ හෝ අසවල් බ්‍රාහමණතෙමේ මෙබඳු මහායාගයක් කෙළේයයි ඔවුන්ගේ නම් ලියා තබත්. එබැවින් ඒ සඳහා වෘක්ෂච්ඡේදනය නොකළේයයි සේයි. අතුන්ටහිංසාපිණිස කුසතණ නොකැපූහ.කුසතණකපා වනපුෂ්පවලින් ගොතනලද මාලාවන්මෙන් යාගශාලාව පිරිසිදීම හෝ භූමියෙහි ඇතිරීමද නොකළේයි සේයි. ඒ මහාවිජිතරජහුගේ සම්බන්‍ධවූ දාසයෝ හෝ පළමුකොට ධනය ගෙණ කටයුතුකරන්නෝ හෝ බත් වැටුප් රැගෙණ කම්කරන්නෝ හෝ වෙත්ද, ඔව්හු දඬු අඬ සපිමුගුරු ආදිය ගෙණ වැඩකරව්යයි තර්ජනයනොකරණලද්දහු බියෙන් තැතිනොගත්තෝ කඳුලුපිරුණු මුහුණු ඇතිව නොහඬමින් ඒ යාගකාලයෙහි කටයුතු කළාහුය.

අථ ඛො යෙ ඉච්ඡිංසු තෙ අකංසු. යෙ න ඉච්ඡිංසු නතෙ අකංසු. යං ඉච්ඡිංසු තං අකංසු. යං න ඉච්ඡිංසු නතං අකංසු. සප්පිතෙල නවනීත දධිමධු ඵාණිතෙන චෙව සො යඤ්ඤො නිට්ඨානමගමාසි.

19. අථ ඛො බ්‍රාහ්මණ ඛත්තියා අනුයුත්තා නෙගමාචෙව ජන පදාච අමච්චා පාරිසජ්ජා නෙගමාචෙව ජනපදාච බ්‍රාහ්මණ මහා සාලා නෙගමාචෙව ජනපදාච ගහපතිනෙචයිකා නෙගමාචෙව ජනපදාච පහූතං සාපතෙය්‍යං ආදාය රාජානං මහාවිජිතං උපසඞ්ක මිත්වා එවමාහංසු, ඉදං දෙව පහූතං සාපතෙය්‍යං දෙවඤ්ඤෙව උද්දිස්ස ආභතං. තං දෙවො පතිගණ්හාතූති. අලං භො මමපි ඉදං පහූතං සාපතෙය්‍යං ධම්මිකෙන අභිසඞ්ඛතං. තඤ්ච වො හොතු ඉතොච භිය්‍යො හරථාති. තෙ රඤ්ඤා පටික්ඛිත්තා එකමන්තං අප ක්කම්ම එවං සමමන්තෙසුං.

එසේ ඇතිකල්හි කෙසේ කටයුතු කළාහුදයත්, යම්කෙනෙක් කැමතිවූවාහුද ඔව්හු කටයුතුකළාහුය. යම්කෙනෙක් නොකැමතිවූ වාහුද ඔව්හු කටයුතු නොකළාහුය. යමක්කරන්නට කැමතිවූවාහුද එය කළාහුය. යමක් කරන්නට නොකැමතිවූවාහුද එය නොකළා හුය. ගිතෙල්ය, තෙල්ය, වෙඬරුය, දීය, මිය, පැණිය යන මෙයින්ද ඒ යාගය නිමාවට පැමිණියේය.

19. බ්‍රාහ්මණය, ඉක්බිත්තෙන් අනුව යෙදුනාවූ යටත් ක්‍ෂත්‍රිය යෝද, නියම්ගම් වැස්සෝද, දනව් වැස්සෝද, ඇමතියෝද, අවශෙෂ පිරිස්ද, එසේම නියම්ගම් වැස්සෝද, දනව් වැස්සෝද, බමුණුමහසල් කුලයෝද, නියම්ගම් වැස්සෝද, දනව් වැස්සෝද, වස්තුරැස්කරණ ගෘහපතීහුද, නියම්ගම් වැස්සෝද, දනව් වැස්සෝද, බොහෝවූ ධනය රැගෙණ මහාවිජිතරජහු වෙතට එළඹ මෙසේ කීහ. දේවයන්වහන්ස, බොහෝවූ මේ ධනය දේවයන්වහන්සේ උදෙසාම ගෙණඑනලද්දේය දේවයන්වහන්සේ ඒ ධනය පිළිගන්නාසේක්වා යනුයි. පින්වත්නි, මට මෙයින් කම්නැත. මාගේද මේ බොහෝවූ ධනය ධාර්මිකවූ අය බදුගැණීමෙන් මනාසේ රැස්කරණලද්දේය. ඒ ධනයද තොපටම වේවා. මේ ධනයෙන්ද වැඩියක් හැරගණිව්යයි කීයේය. රජවිසින් ප්‍රතික්‍ෂෙපකරණලද්දාවූ ඒ ක්‍ෂත්‍රියාදීහු සමීපවූ එක් පෙදෙසකට රැස්ව මෙසේ මන්ත්‍රණය කළාහුය.

නබො එතං අම්හාකං පතිරූපං. යං මයං ඉමානි සාපතෙය්‍යානි පුන දෙව සකානි ඝරානි පටිහරෙය්‍යාම. රාජා ඛො මහාවිජිතො මහායඤ්ඤං යජති, හන්‍දස්ස මයං අනුයායිනො හොමාති.

20. අථ ඛො බ්‍රාහ්මණ පුරත්‍ථිමෙන යඤ්ඤවාටස්ස ඛත්තියා අනුයුත්තා නෙගමාචෙව ජානපදාච දානානි පට්ඨපෙසුං, දක්ඛිණෙන යඤ්ඤවාටස්ස අමච්චා පාරිසජ්ජා නෙගමාචෙව ජානපදාච දානානි පට්ඨපෙසුං, පච්ඡිමෙන යඤ්ඤවාටස්ස බ්‍රාහ්මණමහාසාලා නෙගමාචෙව ජානපදාච දානානි පට්ඨපෙසුං, උත්තරෙන යඤ්ඤවාටස්ස ගහපති නෙචයිකා නෙගමාචෙව ජානපදාච දානානි පට්ඨපෙසුං. තෙසුපි බ්‍රාහ්මණ යඤ්ඤෙසු නෙව ගාවො හඤ්ඤිංසු නඅජෙළකා හඤ්ඤිංසු නකුක්කුටසූකරා හඤ්ඤිංසු නවිවිධා පාණා සංඝාතං ආපජ්ජිංසු, නරුක්ඛා ඡිජ්ජිංසු යූපත්‍ථාය, නදබ්භා ලූයිංසු පරහිංසත්‍ථාය, යෙපි තෙසං අහෙසුං දාසාති වා පෙස්සාති වා කම්මකරාති වා තෙපි න දණ්ඩතජ්ජිතා.

මේ ධනය දීම අපට සුදුසුනොවේමය. යම්හෙයකින් අපි මේ වස්තූන් නැවත තමතමන්ගේගෙවල්වලට හැරගෙණයන්නෙමුනම් යෙහෙක. මහාවිජිතරජතෙමේ මහායාගයක් කෙරේ. එකාන්තයෙන් අපි ඒ රජහට අනුව යාගකරන්නෝ වන්නමෝනම් මැනවයි කියායි.

20. බ්‍රාහ්මණය, ඉක්බිත්තෙන් රජහුගේ (යාග) දානශාලාවට ඉතා දුරනොවූ නුවරපෙරදිග අනුවයෙදුනාවූ ක්‍ෂත්‍රියයෝද, නියම්ගම් වැස්සෝද, දනව් වැස්සෝද, දානයන් පිහිටෙව්හ. යාගාවාටයට දකුණුදිගින් හෙවත් දකුණුනුවරදෙර ඇමතියන් හා අවශෙෂ පිරිස්ද නියම්ගම් වැස්සෝද, දනව් වැස්සෝද, දානයන් පිහිටෙව්හ. යාගාවාටයට පැසුලුදිගින් හෙවත් පැසුලුනුවරදෙර බමුණුමහසල්කුලයෝද, නියම්ගම් වැස්සෝද, දනව් වැස්සෝද, දානයන් පිහිටෙව්හ. යාගාවාටයට උතුරුදිග හෙවත් උතුරුනුවරදෙර වස්තුරැස්කරණ ගෘහපතිහුද, නියම්ගම් වැස්සෝද, දනව් වැස්සෝද, දානයන් පිහිටෙව්හ. බ්‍රාහ්මණය, ඒ ක්‍ෂත්‍රියාදිහු ඒ යාගයන්හිද ගෙරින් නොනැසූහ. එළුවන් හා තිරෙලුවන් නොනැසූහ. කුකුලන් හා ඌරන් නොනැසූහ. නානාවිධවූ ප්‍රාණීහු විනාසයට නොපැමිණියාහ. යාගස්තම්භපිණිස වෘක්‍ෂයෝ නොකපනලද්දාහුය. අනුන්ට හිංසාපිණිස කුසතණ නොකැපූහ. යම්බඳුවූ දාසයෝහෝ පළමුකොට ධනය ගෙණ කටයුතුකරන්නෝ හෝ බත් වැටුප්ගෙණ කම්කරන්නෝ හෝ වෙත්ද, ඔව්හු දඬු අඬයටි මුගුරු ආදිය ගෙණ මේ මේ කට යුතු කරව්යයි තර්ජනය නොකරණලද්දාහු.

න භයතජ්ජිතා න අස්සුමුඛා රුදමානා පරිකම්මානි අකංසු. අථ ඛො යෙ ඉච්ඡිංසු තෙ අකංසු, යෙ න ඉච්ඡිංසු න තෙ අකංසු, යං ඉච්ඡිංසු තං අකංසු, යං න ඉච්ඡිංසු න තං අකංසු. සප්පිතෙලනවනීතදධිමධුඵාණිතෙන චෙව තෙ යඤ්ඤා නිට්ඨානමගමංසු. ඉති චත්තාරොච අනුමතිපක්ඛා, රාජා මහාවිජිතො අට්ඨඞ්ගෙහි සමන්නාගතො, පුරොහිතො බ්‍රාහ්මණො චතුහඞ්ගෙහි සමන්නාගතො, තිස්සොච විධා. අයං වුච්චති බ්‍රාහ්මණ තිවිධා යඤ්ඤසම්පදා සොළසපරික්ඛාරාති.

21. එවං වුත්තෙ තෙ බ්‍රාහ්මණා උන්නාදිනො උච්චාසද්දමහාසද්දා අහෙසුං. අහො යඤ්ඤො, අහො යඤ්ඤසම්පදාති. කූටදන්තො පන බ්‍රාහ්මණො තුණ්හීභූතොව නිසින්නො හොති. අථ ඛො තෙ බ්‍රාහ්මණා කූටදන්තං බ්‍රාහ්මණං එතදවොචුං. කස්මා පන භවං කූටදන්තො සමණස්ස ගොතමස්ස සුභාසිතං සුභාසිතතො නාබ්භනුමොදතීති. නාහං භො සමණස්ස ගොතමස්ස සුභාසිතං සුභාසිතතො නාබ්භනුමොදාමි,

---

බියෙන් තැතිනොගත්තෝ කඳුලු පිරුණු මුහුණු ඇතිව නොහඬමින් ඒ යාගකාලයෙහි කටයුතු කළාහුය. එසේ ඇතිකල්හි යම්කෙනෙක් එහි කටයුතුකිරීමට කැමැත්තෝවූද, ඔව්හු ඒ කටයුතු කළාහුය. යම්කෙනෙක් නොකැමතිවූවාහුද ඔව්හු නොකළාහුය. යමක් කිරීමට කැමතිවූවාහුද එය කළාහුය. යමක් කිරීමට නොකැමතිවූවාහුද එය නොකළාහුය. ගිතෙල්ය, තෙල්ය, වෙඩරුය, දීය, මීය, පැණිය යන මෙයින්ද ඒ යාගයෝ නිෂ්ඨාවට ගියාහුය. මෙසේ අනුමති පක්‍ෂසතරෙක් වෙත්. මහාවිජිතරජ තෙමේ කරුණු අටකින් යුක්තවේ. පෙරවිබමුණු තෙමේ කරුණු සතරකින් යුක්තවේ. බ්‍රාහ්මණය, මේ විධිතුණක් හා සොළොස් පිරිවරඇති ත්‍රිවිධ යාගසම්පත්තියයි කියනුලැබේ.

21. මෙසේ වදාළකල්හි ඒ බමුණෝ උසස්ව නාදකරන්නෝ උසස් ශබ්ද හා අතිශයින් මහත් ශබ්දඇත්තෝ වූහ. කෙසේද, යාගය මැනව. යාගසම්පත්තිය මැනවැයි කියායි. කූටදන්තබ්‍රාහ්මණතෙම නිශ්ශබ්දවම උන්නේවේ. ඉක්බිත්තෙන් ඒ බමුණෝ කූටදන්තබ්‍රාහ්මණයාහට මේ කාරණය දැන්වූහ. පින්වත් කූටදන්තතෙමේ කවර හෙයකින් ශ්‍රමණගෞතමයන්වහන්සේගේ යහපත් කථාව යහපත් කථා වශයෙන් පිළිගෙණ වැඩියක් සතුටුනොවේදැයි කියායි. පින්වත්නි, මම ශ්‍රමණගෞතමයන්වහන්සේගේ යහපත් කථාව යහපත් කථා වශයෙන් දැන වැඩියක් සතුටුවෙමි.

මුඩාපි තස්ස විපතෙය්‍ය සො සමණස්ස ගොතමස්ස සුභාසිතං සුභාසිතතො නාබ්භනුමොදෙය්‍ය. අපිච මෙ භො එවං හොති. න සමණො ගොතමො එවමාහ. එවං මෙ සුතන්ති වා, එවං අරහති භවිතුන්ති වා, අපිච සමණො ගොතමො එවං තදා ආසි, ඉත්ථං තදා ආසිත්‍යෙව භාසති. තස්ස මය්හං භො එවං හොති අද්ධා සමණො ගොතමො තෙන සමයෙන රාජා අහොසි මහාවිජිතො යඤ්ඤසාමි, පුරොහිතො වා බ්‍රාහ්මණො තස්ස යඤ්ඤස්ස යාජෙතාති. අභිජානාති පන භවං ගොතමො එවරූපං යඤ්ඤං යජිත්වා වා යාජෙත්වා වා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජිතාති. අභිජානාමහං බ්‍රාහ්මණ එවරූපං යඤ්ඤං යජිත්වා වා යාජෙත්වා වා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජිතා. අහං තෙන සමයෙන පුරොහිතො බ්‍රාහ්මණො අහොසිං තස්ස යඤ්ඤස්ස යාජෙතාති.

22. අත්ථි පන භො ගොතම අඤ්ඤො යඤ්ඤො ඉමාය තිවිධාය යඤ්ඤසම්පදාය සොළසපරික්ඛාරාය අප්පට්ඨතරොච අප්පසමාරබ්භතරොච මහප්ඵලතරොච මහානිසංසතරොචාති.

යමෙක් ශ්‍රමණගෞතමයන්වහන්සේගේ යහපත් කථාව යහපත් කථාවශයෙන් පිළිගෙණ වැඩියක් සතුටුනොවන්නේනම් ඔහුගේ හිසද පැලෙන්නේය. පින්වත්නි, තවද ශ්‍රමණගෞතමතෙමේ මාවිසින් මෙසේ අසනලද්දයි කියා හෝ මෙසේවන්ට සුදුසුයකියා හෝ මෙසේ නොකියයි. තවද ශ්‍රමණගෞතමතෙමේ එකල්හි මෙසේ වීය. එකල්හි මේ අයුරින් වීය යනාදින් කියායි. මට මේ අදහසවේ පින්වත් ඒ මට මේ අදහසද වේ. ඒකාන්තයෙන් ශ්‍රමණගෞතමයන්වහන්සේ ඒකාලයෙහිදී යාගාධිපතිවූ මහාවිජිතරජ හෝ විය. නැතහොත් ඒ යාගය කරවූ පෙරවිබමුණු හෝ වීය කියායි. භවද් ගෞතමයන්වහන්සේ මෙබඳු යාගයක් කොට හෝ යාගයක් කරවා කාබුන් මරණින්මතු යහපත් ගමන්ඇත්තාවූ ස්වර්ගලොකයෙහි ඉපදුනේ කිමෙක දන්නාසේක්ද. බ්‍රාහ්මණය, මම මෙබඳු යාගයක්කොටද යාගයක් කරවාද කාබුන් මරණින්මතු යහපත්ගති ඇත්තාවූ ස්වර්ගලොකයෙහි ඉපදුනෙම් දනිම්මය. මම ඒකාලයෙහිදි ඒ යාගයකරවූ පෙරවිබමුණුවූයෙමියි වදාළෝ.

22. භවද්ගෞතමයන්වහන්ස, සොළසක් පිරිවරඇති මේ ත්‍රිවිධ යාගසම්පත්තියට වඩා ඉතා ස්වල්පකටයුතු ඇත්තාවූද ද්‍රව්‍ය රැස්කිරීම් වශයෙන් ඉතා ස්වල්ප ආරම්භඇත්තාවූද අතිශයින් මහත් ඵල ඇත්තාවූද අතිශයින් මහත් අනුසස්ඇත්තාවූද අනික් යාගයක් කිමෙක ඇත්තේද.

අත්ථි බො බ්‍රාහ්මණ අඤ්ඤො යඤ්ඤො ඉමාය තිවිධාය යඤ්ඤසම්පදාය සොළසපරික්ඛාරාය අප්පට්ඨතරො ච අප්පසමාරබ්භතරො ච මහප්ඵලතරො ච මහානිසංසතරො චාති. කතමො පන සො භො ගොතම යඤ්ඤො ඉමාය තිවිධාය යඤ්ඤසම්පදාය සොළසපරික්ඛාරාය අප්පට්ඨතරො ච අප්පසමාරබ්භතරො ච මහප්ඵලතරො ච මහානිසංස තරො චාති. යානි බො තානි බ්‍රාහ්මණ නිච්චදානානි අනුකුලයඤ්ඤානි සීලවන්තෙ පබ්බජිතෙ උද්දිස්ස දීයන්ති, අයං බො බ්‍රාහ්මණ යඤ්ඤො ඉමාය තිවිධාය යඤ්ඤසම්පදාය සොළසපරික්ඛාරාය අප්පට්ඨතරො ච අප්පසමාරබ්භතරො ච මහප්ඵලතරො ච මහානිසංසතරො චාති.

23. කො නු බො භො ගොතම හෙතු කො පච්චයො යෙන තං නිච්චදානං අනුකුලයඤ්ඤං ඉමාය තිවිධාය යඤ්ඤසම්පදාය සොළස පරික්ඛාරාය අප්පට්ඨතරඤ්ච අප්පසමාරබ්භතරඤ්ච මහප්ඵලතරඤ්ච මහානිසංසතරඤ්චාති.

බ්‍රාහ්මණය, සොළසක් පිරිවරඇති මේ ත්‍රිවිධයාගසම්පත්තියට වඩා ඉතා ස්වල්ප කටයුතු ඇත්තාවූද ද්‍රව්‍ය රැස්කිරීම්වශයෙන් ඉතා ස්වල්පවූ ආරම්භ ඇත්තාවූද අතිශයින් මහත්ඵල ඇත්තාවූද අතිශයින් මහත් අනුසස් ඇත්තාවූද අනික් යාගයක් ඇත්තේමය. භවද්ගෞතමයන්වහන්ස, සොළසක් පිරිවරඇති මේ ත්‍රිවිධ යාගසම්පත්තියට වඩා ඉතා ස්වල්පකටයුතු ඇත්තාවූද, ද්‍රව්‍ය රැස්කිරීම් වශයෙන් ඉතා ස්වල්ප ආරම්භ ඇත්තාවූද, අතිශයින් මහත්ඵල ඇත්තාවූද, අතිශයින් මහත් අනුසස් ඇත්තාවූද ඒ යාගය කවරේද. බ්‍රාහ්මණය, මුතුන්මිත්තන්විසින් පවත්වනලදින් පසුව වංශපරම්පරාවෙන් පවත්වනලද අනුකූලයාගවූ පිළිවෙළ නොසිඳ නිරන්තරයෙන් දියයුතු දානයෝ සිල්වත් පැවිද්දන් උදෙසා දෙනු ලැබෙද්ද. බ්‍රාහ්මණය, මේ යාගය සොළසක් පිරිවරඇති ත්‍රිවිධ යාග සම්පත්තියට වඩා ඉතාස්වල්පකටයුතු ඇත්තේද, ද්‍රව්‍යරැස්කිරීම්වශයෙන් ඉතා ස්වල්ප ආරම්භ ඇත්තේද, අතිශයින් මහත්ඵල ඇත්තේද, අතිශයින් මහත් අනුසස් ඇත්තේද වේයැයි වදාළෝ.

23. භවද්ගෞතමයන්වහන්ස, යම්හෙයකින් මුතුන්මිත්තන් විසින් පවත්වනලදින් පසුව වංශපරම්පරාවෙන් පවත්වනලද අනුකූල යාගවූ පිළිවෙළ නොසිඳ නිරන්තරයෙන් දියයුතුවූ ඒ දානය සොළසක් පිරිවරඇති මේ ත්‍රිවිධ යාගසම්පත්තියට වඩා අතිශයින් ස්වල්පකටයුතු ඇත්තේ වේද, ද්‍රව්‍ය රැස්කිරීම් වශයෙන් අතිශයින් ස්වල්ප ආරම්භ ඇත්තේ වේද, අතිශයින් මහත්ඵල ඇත්තේ වේද, අතිශයින් මහත් අනුසස් ඇත්තේ වේද, ඊට හෙතු කවරේද. ඊට ප්‍රත්‍යය කවරේදැයි විචාළේය.

නඛො බ්‍රාහ්මණ එවරූපං යඤ්ඤං උපසඞ්කමන්ති අරහන්තො වා අරහත්තමග්ගං වා සමාපන්නා. තං කිස්ස හෙතු, දිස්සන්ති හෙත්ථ බ්‍රාහ්මණ දණ්ඩප්පහාරාපි ගලග්ගහාපි. තස්මා එවරූපං යඤ්ඤං න උපසඞ්කමන්ති අරහන්තො වා අරහත්තමග්ගං වා සමාපන්නා. යානි ඛො පන තානි නිච්චදානානි අනුකුලයඤ්ඤානි සීලවන්තෙ පබ්බජිතෙ උද්දිස්ස දීයන්ති, එවරූපං ඛො බ්‍රාහ්මණ යඤ්ඤං උපසඞ්කමන්ති අරහන්තො වා අරහත්තමග්ගං වා සමාපන්නා. තං කිස්සහෙතු. න හෙත්ථ බ්‍රාහ්මණ දිස්සන්ති දණ්ඩප්පහාරාපි ගලග්ගහාපි. තස්මා එවරූපං යඤ්ඤං උපසඞ්කමන්ති අරහන්තො වා අරහත්තමග්ගං වා සමාපන්නා. අයං ඛො බ්‍රාහ්මණ හෙතු අයං පච්චයො යෙන තං නිච්චදානං අනුකුලයඤ්ඤං ඉමාය තිවිධාය යඤ්ඤසම්පදාය සොළසපරික්ඛාරාය අප්පට්ඨතරඤ්ච අප්පසමාරම්භතරඤ්ච මහප්ඵලතරඤ්ච මහානිසංසතරඤ්චාති.

බ්‍රාහ්මණය, මෙබඳුවූ යාගයට රහතන්වහන්සේලාද රහත්මගට පිළිපන්නෝද නො පැමිණෙත් මය. ඊට හෙතු කවරේදයත්. බ්‍රාහ්මණය, මේ යාගස්ථානයෙහි පිළිවෙළින් සිටිව්. ඇදනැතිව හොස් ගණිව්. යනාදිය කියමින් දෙනුලබන දණ්ඩප්‍රහාරයෝද, ග්‍රීවග්‍රාහයෝද, (බෙල්ල අල්ලාගැණුම්ද) දක්නාලැබෙත් එහෙයින් මෙබඳුවූ යාගයට රහතන්වහන්සේලාද, රහත්මගට පිළිපන්නෝද, නොඑළඹෙත්. යම්බඳුවූ ඒ අනුකූල යාගවූ හෙවත් මුතුන්මිත්තන්විසින් දෙනලදින් පසුවද පිළිවෙළ නොසිඳ දියයුතුවූ නිත්‍ය දානයෝ සිල්වත් භික්ෂූන් උදෙසා දෙනුලැබෙත්ද. බ්‍රාහ්මණය, මෙබඳුවූ යාගයට රහතන්වහන්සේලාද, රහත්මගට පිළිපන්නෝද එළඹෙත්. ඊට හෙතු කවරේද. බ්‍රාහ්මණය, මේ අනුකූල යාගයෙහි දණ්ඩප්‍රහාරයෝද, ග්‍රීවග්‍රාහයෝද නොදක්නාලැබෙත්මය. එහෙයින් මෙබඳු යාගයට රහතන්වහන්සේලාද, රහත්මගට පිළිපන්නෝද එළඹෙත්. බ්‍රාහ්මණය, යම්හෙයකින් අනුකූල යාගයවූ මේ නිත්‍යදානය සොළසක් පිරිවරඇති මේ ත්‍රිවිධ යාගසම්පත්තියට වඩා අතිශයින් ස්වල්ප කටයුතු ඇත්තේ වේද. ද්‍රව්‍ය රැස්කිරීම් වශයෙන් අතිශයින් ස්වල්පවූ ආරම්භ ඇත්තේ වේද, අතිශයින් මහත්ඵල ඇත්තෙත් වේද, අතිශයින් මහත් අනුසස් ඇත්තේ වේද, බ්‍රාහ්මණය, මේ ඊට හෙතුවයි. මේ ඊට ප්‍රත්‍යයයි.

---

24. අත්ථි පන භො ගොතම අඤ්ඤො යඤ්ඤො ඉමාය ච තිවිධාය යඤ්ඤසම්පදාය සොළසපරික්ඛාරාය ඉමිනා ච නිච්චදානෙන අනුකූලයඤ්ඤෙන අප්පට්ඨතරො ච අප්පසමාරම්භතරො ච මහප්ඵලතරො ච මහානිසංසතරො චාති. අත්ථි ඛො බ්‍රාහ්මණ අඤ්ඤො යඤ්ඤො ඉමාය ච තිවිධාය යඤ්ඤසම්පදාය සොළසපරික්ඛාරාය ඉමිනා ච නිච්චදානෙන අනුකූලයඤ්ඤෙන අප්පට්ඨතරො ච අප්පසමාරම්භතරො ච මහප්ඵලතරො ච මහානිසංසතරො චාති. කතමො පන සො භො ගොතම යඤ්ඤො ඉමාය ච තිවිධාය යඤ්ඤසම්පදාය සොළසපරික්ඛාරාය ඉමිනා ච නිච්චදානෙන අනුකූලයඤ්ඤෙන අප්පට්ඨතරො ච අප්පසමාරම්භතරො ච මහප්ඵලතරො ච මහානිසංසතරො චාති යො ඛො බ්‍රාහ්මණ චාතුද්දිසං සඞ්ඝං උද්දිස්ස විහාරං කරොති, අයං ඛො බ්‍රාහ්මණ යඤ්ඤො ඉමාය ච තිවිධාය යඤ්ඤසම්පදාය සොළසපරික්ඛාරාය ඉමිනා ච නිච්චදානෙන අනුකූලයඤ්ඤෙන අප්පට්ඨතරො ච අප්පසමාරම්භතරො ච මහප්ඵලතරො ච මහානිසංසතරො චාති.

---

24. භවද් ගෞතමයන්වහන්ස, සොළොස්පිරිවරඇති මේ ත්‍රිවිධ යාගසම්පත්තියටද අනුකූලයාගයවූ මේනිත්‍යදානයටදවඩා අතිශයින් ස්වල්පකටයුතු ඇත්තාවූද, ද්‍රව්‍ය රැස්කිරීම්වශයෙන් අතිශයින් ස්වල්ප ආරම්භ ඇත්තාවූද, අතිශයින් මහත් ඵල ඇත්තාවූද, අතිශයින් මහත් අනුසස් ඇත්තාවූද, අන්‍යයාගයක් ඇත්තේද, බ්‍රාහ්මණය සොළසක් පිරිවරඇති මේ ත්‍රිවිධ යාගසම්පත්තියටද, අනුකූල යාගයවූ මේ නිත්‍යදානයටද වඩා අතිශයින් ස්වල්පකටයුතු ඇත්තාවූද, ද්‍රව්‍ය රැස්කිරීම් වශයෙන් අතිශයින් ස්වල්ප ආරම්භ ඇත්තාවූද, අතිශයින් මහත්ඵල ඇත්තාවූද, අතිශයින් මහත් අනුසස් ඇත්තාවූද, අන්‍යවූ යාගයක් ඇත්තේමය. භවද් ගෞතමයන් වහන්ස, සොළසක් පිරිවරඇති මේ ත්‍රිවිධ යාගසම්පත්තියටද, අනුකූල යාගයවූ මේ නිත්‍ය දානයටද වඩා අතිශයින් ස්වල්ප කටයුතු ඇත්තාවූද, අතිශයින් ස්වල්ප ආරම්භ ඇත්තාවූද, අතිශයින් මහත් ඵල ඇත්තාවූද, අතිශයින් මහත් අනුසස් ඇත්තාවූද ඒ යාගයතෙම කවරේදයත්, බ්‍රාහ්මණය යමෙක් සිව්දිගින් පැමිණෙන සඞ්ඝයා උදෙසා විහාරයක් කෙරේද. බ්‍රාහ්මණය මේ පරිත්‍යාගයතෙම සොළසක් පිරිවරඇති මේ ත්‍රිවිධයාග සම්පත්තියටද, අනුකූල යාගයවූ නිත්‍යදානයටද, වඩා අතිශයින් ස්වල්පකටයුතු ඇත්තේද, අතිශයින් ස්වල්ප ආරම්භ ඇත්තේද, අතිශයින් මහත්ඵල ඇත්තේද, අතිශයින් මහත් අනුසස් ඇත්තේද, මේයයි වදාළෝ.

25 අඤ්ඤ පන හො ගොතම අඤ්ඤො යඤ්ඤො ඉමායච තිවිධාය යඤ්ඤසම්පදාය සොළසපරික්ඛාරාය ඉමිනාච නිච්චදානෙන අනුකුලයඤ්ඤෙන ඉමිනාච විහාරදානෙන අප්පට්ඨතරොච අප්පසමාරම්භතරොච මහප්ඵලතරොච මහානිසංසතරොචාති. අත්ථි ඛො බ්‍රාහ්මණ අඤ්ඤො යඤ්ඤො ඉමායච තිවිධාය යඤ්ඤසම්පදාය සොළසපරික්ඛාරාය ඉමිනාච නිච්චදානෙන අනුකුලයඤ්ඤෙන ඉමිනාච විහාරදානෙන අප්පට්ඨතරොච අප්පසමාරම්භතරොච මහප්ඵලතරොච මහානිසංසතරොචාති. කතමො පන සො හො ගොතම අඤ්ඤො යඤ්ඤො ඉමායච තිවිධාය යඤ්ඤසම්පදාය සොළසපරික්ඛාරාය ඉමිනාච නිච්චදානෙන අනුකුලයඤ්ඤෙන ඉමිනාච විහාරදානෙන අප්පට්ඨතරොච අප්පසමාරම්භතරොච මහප්ඵලතරොච මහානිසංසතරොචාති. යො ඛො බ්‍රාහ්මණ පසන්නචිත්තො බුද්ධං සරණං ගච්ඡති ධම්මං සරණං ගච්ඡති සඞ්ඝං සරණං ගච්ඡති. අයං ඛො බ්‍රාහ්මණ යඤ්ඤො ඉමායච තිවිධාය යඤ්ඤසම්පදාය සොළසපරික්ඛාරාය.

---

25. භවද් ගෞතමයන්වහන්ස, සොළසක් පිරිවරඇති මේ ත්‍රිවිධ යාග සම්පත්තියටද, අනුකූලයාගයවූ මේ නිත්‍ය දානයටද, මේ විහාරදානයටද වඩා අතිශයින් සවල්ප කටයුතු ඇත්තාවූද, අතිශයින් සවල්ප ආරම්භ ඇත්තාවූද, අතිශයින් මහත් ඵල ඇත්තාවූද අතිශයින් මහත් අනුසස් ඇත්තාවූද, අන්‍ය යාගයක් කිමෙක ඇත්තේදැයි විචාළේය. බ්‍රාහමණය, සොළසක් පිරිවරඇති මේ ත්‍රිවිධයාග සම්පත්තියටද, අනුකූලයාගයවූ මේ නිත්‍ය දානයටද, මේ විහාර දානයටද, වඩා අතිශයින් සවල්ප කටයුතු ඇත්තාවූද, අතිශයින් සවල්ප ආරම්භ ඇත්තාවූද, අතිශයින් මහත් ඵල ඇත්තාවූද, අතිශයින් මහත් අනුසස් ඇත්තාවූද, අන්‍ය යාගයක් ඇත්තේමය. භවද් ගෞතමයන්වහන්ස, සොළසක් පිරිවරඇති මේ ත්‍රිවිධයාග සම්පත්තියටද, අනුකූල යාගයවූ මේ නිත්‍ය දානයටද, මේ විහාර දානයටද, වඩා අතිශයින් සවල්ප කටයුතු ඇත්තාවූද, අතිශයින් සවල්ප ආරම්භ ඇත්තාවූද, අතිශයින් මහත් ඵල ඇත්තාවූද, අතිශයින් මහත් අනුසස් ඇත්තාවූද, ඒ යාගය කවරේදැයි විචාළේය. බ්‍රාහ්මණය, යමෙක් පහන් සිත් ඇත්තේ බුදුන් සරණකොටයේද, ධර්මය සරණකොට යේද, සඞ්ඝයා සරණකොටයේද, බ්‍රාහ්මණය රත්නත්‍රයට ජීවිතපරිත්‍යාගයවූ මේ යාගය සොළසක් පිරිවර ඇති මේ ත්‍රිවිධ යාග සම්පත්තියටද,

ඉමිනාච නිච්චදානෙන අනුකූල යඤ්ඤෙන ඉමිනාච විහාරදානෙන අප්පට්ඨතරොච අප්පසමාරබ්භතරොච මහප්ඵල තරොච මහානිසංසතරොචාති.

26. අත්ථි පන භො ගොතම අඤ්ඤො යඤ්ඤො ඉමායච තිවිධාය යඤ්ඤසම්පදාය සොළසපරික්ඛාරාය ඉමිනාච නිච්චදානෙන අනුකූල යඤ්ඤෙන ඉමිනාච විහාරදානෙන ඉමෙහිච සරණාගමනෙහි අප්පට්ඨතරොච අප්පසමාරබ්භතරොච මහප්ඵලතරොච මහානිසංසතරොචාති. අත්ථි ඛො බ්‍රාහ්මණ අඤ්ඤො යඤ්ඤො ඉමායච තිවිධාය යඤ්ඤසම්පදාය සොළසපරික්ඛාරාය ඉමිනාච නිච්චදානෙන අනුකූලයඤ්ඤෙන ඉමිනාච විහාරදානෙන ඉමෙහිච සරණගමනෙහි අප්පට්ඨතරොච අප්පසමාරබ්භතරොච මහප්ඵලතරොච මහානිසංසතරොචාති. කතමො පන සො භො ගොතම අඤ්ඤො යඤ්ඤො ඉමායච තිවිධාය යඤ්ඤසම්පදාය සොළසපරික්ඛාය ඉමිනාච නිච්චදානෙන අනුකූලයඤ්ඤෙන ඉමිනාච විහාරදානෙන ඉමෙහිච සරණාගමනෙහි අප්පට්ඨතරොච අප්පසමාරබ්භතරොච මහප්ඵලතරොච මහානිසංසතරොචාති.

අනුකූල යාගයවූ මේ නිත්‍යදානයටද, මේ විහාර දානයටද, වඩා අතිශයින් ස්වල්ප කටයුතු ඇත්තේ වේ. අතිශයින් ස්වල්පආරම්භ ඇත්තේ වේ. අතිශයින් මහත්ඵල ඇත්තේවේ. අතිශයින් මහත් අනුසස් ඇත්තේද, වේයයි වදාළෝ.

26 භවද්ගෞතමයන්වහන්ස,සොළසක්පිරිවරඇතිමේත්‍රිවිධයාගය සම්පත්තියටද,අනුකූලවස්තු පරිත්‍යාගයවූමේනිත්‍යදානයට මේ විහාර දානයටද, මේ සරණා ගමනවලටද, වඩා අතිශයින් ස්වල්ප කට කටයුතු ඇත්තාවූද අතිශයින් ස්වල්ප ආරම්භ ඇත්තාවූද, අතිශයින් මහත්ඵල ඇත්තාවූද, අතිශයින් මහත් අනුසස් ඇත්තාවූද, අන්‍ය යාගයක් කිමෙක ඇත්තේදැයි විචාළේය. බ්‍රාහ්මණය සොළසක් පිරිවරඇති මේ ත්‍රිවිධ යාග සම්පත්තියටද, මේ අනුකූල වස්තුපරිත්‍යාගයවූ නිත්‍යදානයටද, මේ විහාර දානයටද, මේ සරණාගමනවලටද, වඩා අතිශයින් ස්වල්පකටයුතු ඇත්තාවූද, අතිශයින් ස්වල්පආරම්භ ඇත්තාවූද, අතිශයින් මහත්ඵල ඇත් ආවූද, අතිශයින් මහත් අනුසස් ඇත්තාවූද, අනික් යාගයක් ඇත් තේමය. භවද් ගෞතමයන්වහන්ස, සොළසක් පිරිවරඇති මේ ත්‍රිවිධ යාග සම්පත්තියටද, අනුකූල වස්තු පරිත්‍යාගයවූ මේ නිත්‍ය දානයටද මේ විහාරදානයටද, මේ සරණා ගමනවලටද වඩා අතිශයින් ස්වල්ප කටයුතු ඇත්තාවූද, අතිශයින් ස්වල්ප ආරම්භ ඇත්තාවූද, අතිශයින් මහත්ඵල ඇත්තාවූද, අතිශයින් මහත් අනුසස් ඇත්තාවූද, ඒ යාගයතෙමේ කවරේ දැයි විචාළේය.

යොබො බ්‍රාහ්මණ පසන්නචිත්තො සික්ඛාපදානි සමාදියති, පාණාති පාතා වෙරමණී, අදින්නාදානා වෙරමණී, කාමෙසු මිච්ඡාචාරා වෙර මණී, මුසාවාදා වෙරමණී, සුරාමෙරය මජ්ජපමාදට්ඨානා වෙරමණී, අයං බො බ්‍රාහ්මණ යඤ්ඤො ඉමායච තිවිධාය යඤ්ඤසම්පදාය සොළසපරික්ඛාරාය ඉමිනාච නිච්චදානෙන අනුකූලයඤ්ඤෙන ඉමිනාච විහාරදානෙන ඉමෙහිච සරණාගමනෙහි අප්පට්ඨතරොච අප්පසමාරබ්භතරොච මහප්ඵලතරොච මහානිසංසතරොචාති.

27. අත්ථි පන භො ගොතම අඤ්ඤො යඤ්ඤො ඉමායච තිවිධාය යඤ්ඤ සම්පදාය සොළසපරික්ඛාරාය ඉමිනාච නිච්චදානෙන අනුකූලයඤ්ඤෙන ඉමිනාච විහාරදානෙන ඉමෙහිච සරණාගමනෙහි ඉමෙහිච සික්ඛා පදෙහි අප්පට්ඨතරොච අප්පසමාරබ්භතරොච මහප්ඵලතරොච මහානිසංසතරොචාති.

බ්‍රාහ්මණය, යමෙක් පහන්සිත්ඇතිව ශික්ෂාපදයන් සමාදන්වේද, හෙවත්කාමාවචර කුසලවශයෙන් අකුශලයෙන් විරතියට පැමිණේද. කෙසේද ප්‍රාණඝාතයෙන් වැළැකීම් නුදුන්දෙය ගැන්මෙන් වැළැ කීම් කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළැකීම් බොරුකීමෙන් වැළැකීම් මදප්‍රමාදදෙකට කාරණවූ රහමෙර පානයෙන් වැළකීම්යි කියායි. බ්‍රාහ්මණය මේ යාගයතෙමේ සොළසක් පිරිවරඇති මේ ත්‍රිවිධයාග සම්පත්තියටද, අනුකූල වස්තුපරිත්‍යාගයවූ මේ නිත්‍යදානයටද, මේ විහාරදානයටද, මෙ සරණාගමනවලටද, වඩා අතිශයින් සවල්පකටයුතු ඇත්තේ වේ. අතිශයින් සවල්ප ආරම්භ ඇත්තේවේ. අතිශයින් මහත්ඵල ඇත්තේ වේ. අතිශ යින් මහත් අනුසස් ඇත්තේද වේයයි වදාළෝ.

27. භවද්ගෞතමයන්වහන්ස, සොළසක් පිරිවරඇති මේ ත්‍රිවිධ යාගසම්පත්තියටද අනුකූල වස්තුපරිත්‍යාගයවූ මේ නිත්‍ය දානයටද මේ විහාර දානයටද, මේ සරණාගමනවලටද, මේ ශික්ෂාපද සමාදාන වලටද වඩා අතිශයින් සවල්පකටයුතු ඇත්තාවූද, අතිශයින් සවල්ප ආරම්භ ඇත්තාවූද, අතිශයින් මහත්ඵල ඇත්තාවූද, අතිශයින් මහත් අනුසස් ඇත්තාවූද, අන්‍යවූ යාගයක් කිමෙක ඇත්තේදැයි විචාළේය.

අත්‍ථි බො බ්‍රාහ්මණ අඤ්ඤො යඤ්ඤො ඉමාය ච තිවිධාය යඤ්ඤසම්පදාය සොළසපරික්ඛාරාය ඉමිනා ච නිච්චදානෙන අනුකුලයඤ්ඤෙන ඉමිනා ච විහාරදානෙන ඉමෙහි ච සරණාගමනෙහි ඉමෙහි ච සික්ඛාපදෙහි අප්පට්ඨතරො ච අප්පසමාරබ්භතරො ච මහප්ඵලතරො ච මහානිසංසතරො චාති, කතමො පන සො භො ගොතම යඤ්ඤො ඉමාය ච තිවිධාය යඤ්ඤසම්පදාය සොළසපරික්ඛාරාය ඉමිනා ච නිච්චදානෙන අනුකුලයඤ්ඤෙන ඉමිනා ච විහාරදානෙන ඉමෙහි ච සරණාගමනෙහි ඉමෙහි ච සික්ඛාපදෙහි අප්පට්ඨතරො ච අප්පසමාරබ්භතරො ච මහප්ඵලතරො ච මහානිසංසතරො චාති. ඉධ බ්‍රාහමණ තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මා සම්බුද්ධො—පෙ—යථා සාමඤ්ඤඵලෙ එවං විත්‍ථාරෙතබ්බං එවං බො බ්‍රාහමණ භික්ඛු සීලසම්පන්නො හොති—පෙ—පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති. අයං බො බ්‍රාහ්මණ යඤ්ඤො පුරිමෙහි යඤ්ඤෙහි අප්පට්ඨතරො ච අප්පසමාරබ්භතරො ච මහප්ඵලතරො ච මහානිසංසතරො ච—පෙ—දුතියජ්ඣානං—තතියජ්ඣානං

බ්‍රාහ්මණය, සොළසක් පිරිවරඇති මේ ත්‍රිවිධ යාගසම්පත්තියටද, අනුකූල වස්තු පරිත්‍යාගයවූ මේ නිත්‍ය දානයටද, මේ විහාර දානයටද, මේ සරණාගමනවලටද වඩා මේ ශික්‍ෂාපදවලටද වඩා අතිශයින් ස්වල්පකටයුතු ඇත්තාවූද, අතිශයින් ස්වල්ප ආරම්භ ඇත්තාවූද, අතිශයින් මහත්ඵල ඇත්තාවූද, අතිශයින් මහත් අනුසස් ඇත්තාවූද, අන්‍ය යාගයක් ඇත්තේමය. භවද්ගෞතමයන්වහන්ස, සොළසක් පිරිවරඇති මේ ත්‍රිවිධ යාගසම්පත්තියටද අනුකූල යාගයවූ මේ නිත්‍ය දානයටද, මේ විහාර දානයටද, මේ සරණාගමනවලටද, මේ ශික්‍ෂාපද සමාදානවලටද, අතිශයින් ස්වල්පකටයුතු ඇත්තාවූද, අතිශයින් ස්වල්ප ආරම්භ ඇත්තාවූද, අතිශයින් මහත්ඵල ඇත්තාවූද, අතිශයින් මහත් අනුසස් ඇත්තාවූද, යාගය කවරේදැයි විචාළේය. බ්‍රාහ්මණය, අර්හත්සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන්වහන්සේ මේ ලොකයෙහි උපදිද්ද, සෙස්ස සාමඤ්ඤඵලසූත්‍රයෙහි මෙන් විස්තර කටයුතු—පෙ—බ්‍රාහ්මණය, මෙසේ භික්‍ෂුතෙමේ සීලසම්පන්න වේ—පෙ—පළමුවෙනි ධ්‍යානයට පැමිණ වාසයකෙරේද, කාමච්ඡන්ද නීවරණාදීන්ගේ පරිත්‍යාගය කරණහෙයින් ධ්‍යානය යාගයයි දතයුතු. බ්‍රාහ්මණය, මේ යාගයතෙමේ පළමු දක්වනලද යාග අතුරෙන් අතිශයින් ස්වල්පකටයුතු ඇත්තේද, අතිශයින් ස්වල්ප ආරම්භ ඇත්තේද, අතිශයින් මහත්ඵල ඇත්තේද, අතිශයින් මහත් අනුසස් ඇත්තේද වෙයි—පෙ—දෙවෙනි ධ්‍යානයටද, තුන්වෙනි ධ්‍යානයටද,

—චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරති. අයම්පි ඛො බ්‍රාහ්මණ යඤ්ඤො පුරිමෙහි යඤ්ඤෙහි අප්පට්ඨතරො ච අප්පසමාරම්භතරො ච මහප්ඵලතරො ච මහානිසංසතරො චාති —පෙ— ඤාණදස්සනාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. අයම්පි ඛො බ්‍රාහ්මණ යඤ්ඤො පුරිමෙහි යඤ්ඤෙහි අප්පට්ඨතරො ච අප්පසමාරම්භතරො ච මහප්ඵලතරො ච මහානිසංසතරො ච —පෙ— නාපරං ඉත්ථත්තායාති පජානාති. අයම්පි ඛො බ්‍රාහ්මණ යඤ්ඤො පුරිමෙහි යඤ්ඤෙහි අප්පට්ඨතරො ච අප්පසමාරම්භතරො ච මහප්ඵලතරො ච මහානිසංසතරො ච. ඉමාය ච බ්‍රාහ්මණ යඤ්ඤසම්පදාය අඤ්ඤා යඤ්ඤසම්පදා උත්තරිතරා වා පණීතතරා වා නත්ථීති.

28. එවං වුත්තෙ කූටදන්තො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච. අභික්කන්තං භො ගොතම අභික්කන්තං භො ගොතම, සෙය්‍යථාපි භො ගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නං වා විවරෙය්‍ය.

සතරවෙනි ධ්‍යානයටද, පැමිණ වාසයකෙරේද, බ්‍රාහ්මණය මේ යාගය තෙම දක්වනලද යාගවලට වඩා අතිශයින් ස්වල්පකට යුතු ඇත්තේද, අතිශයින් ස්වල්ප ආරම්භ ඇත්තේද, අතිශයින් මහත්ඵල ඇත්තේද, අතිශයින් මහත් අනුසස් ඇත්තේද වෙයි—පෙ—ආයතිඥානදර්ශනලාභය පිණිස සිත එලවා තබයිද. මොනවට නමයිද. බ්‍රාහ්මණය, මේ යාගයද පළමු දක්වනලද යාගවලට වඩා අතිශයින් ස්වල්පකටයුතු ඇත්තේද, අතිශයින් ස්වල්ප ආරම්භ ඇත්තේද, අතිශයින් මහත්ඵල ඇත්තේද, අතිශයින් මහත් අනුසස් ඇත්තේද වෙයි—පෙ—මේ පඤ්චස්කන්ධලාභය පිණිස හෝ මේ මාගීබ්‍රහ්මචය්‍යාව පිණිස අනිකක් නැත්තේයයි ඥානයෙන් දැනගණීද. බ්‍රාහ්මණය, මේ යාගයතෙම පළමු දක්වනලද යාගවලට වඩා අතිශයින් ස්වල්පකටයුතු ඇත්තේද, අතිශයින් ස්වල්ප ආරම්භ ඇත්තේද, අතිශයින් මහත්ඵල ඇත්තේද, අතිශයින් මහත් අනුසස් ඇත්තේද වෙයි. බ්‍රාහ්මණය, මේ යාගසම්පත්තියට වඩා අතිශයින් උසස්වූ හෝ අතිශයින් ශ්‍රෙෂ්ඨවූ හෝ අන්‍යවූ යාගසම්පත්තියක් නැතැයි වදළෝ.

28. මෙසේ වදාළකල්හි කූටදන්තබ්‍රාහ්මණතෙමේ භාග්‍යවතුන් වහන්සේට මේකාරණාරාශිය සැලකළේය. භවද්ගෞතමයන්වහන්ස, දම්දෙසුම ඉතා මැනව. භවද්ගෞතමයන්වහන්ස, දම්දෙසුම ඉතා මැනව. භවද්ගෞතමයන්වහන්ස, යටිකුරුකරණලද්දක් උඩුකුරු කොට තබන්නේ හෝ යම්සේද තෘණපණීාදියෙන් වසනලද්දක් විවෘතකොට දක්වන්නේ හෝ යම්සේද.

මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති. එවමෙවං භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො, එසාහං භගවන්තං ගොතමං සරණංගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච, උපාසකම්මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතං. එසාහං භො ගොතම සත්තච උසභසතානි සත්තච වච්ඡතරසතානි සත්තච වච්ඡතරීසතානි සත්තච අජසතානි සත්තච උරබ්භසතානි මුඤ්චාපෙමි, ජීවිතං දෙමි, හරිතානි චෙව තිණානි ඛාදන්තු සීතානිච පානීයානි පිවන්තු, සීතොච නෙසං වාතො උපවායතූති.

29. අථ ඛො භගවා කූටදන්තස්ස බ්‍රාහ්මණස්ස ආනුපුබ්බිකථං කථෙසි. සෙය්‍යථීදං, දානකථං සීලකථං සග්ගකථං කාමානං ආදීනවං ඔකාරං සංකිලෙසං නෙක්ඛම්මෙ ආනිසංසං පකාසෙසි. යදා භගවා අඤ්ඤාසි කූටදන්තං බ්‍රාහ්මණං කල්ලචිත්තං මුදුචිත්තං විනීවරණචිත්තං උදග්ගචිත්තං පසන්නචිත්තං.

මං මුළාවූවෙකුට මගකියන්නේ හෝ යම්සේද, චක්ෂුරින්ද්‍රියදර්ශනශක්තිය ඇත්තෝ නිලපීතාදි රූපයන් දකිත්වායි අඳුරෙහි තෙල්පහනක් දල්වන්නේ හෝ යම්සේද, එපරිද්දෙන්ම භවද්ගෞතමයන්වහන්සේ විසින් නොයෙක්ප්‍රකාරයෙන් ධර්මය දෙශනාකරණලද්දේය. මේ මම භවද්ගෞතමයන්වහන්සේද නවලොකොත්තර ධර්මයද අෂ්ටාර්‍ය්‍යපුද්ගල මහාසඞ්ඝයාද සරණකොට යමි. භවද්ගෞතමයන්වහන්සේ අද පටන් දිවිහිම්කොට සරණගියඋපාසකයෙකැයි මා දරාගන්නාසේක්වා. භවද්ගෞතමයන්වහන්ස, මේ මම වෘෂභයන් සත්සියයද, නාඹුවස්සන් සත්සියයද, නාඹුවැස්සියන් සත්සියයද, තිරෙලුවන් සත්සියයද, එළුවන් සත්සියයද, මුදවමි, ඔවුන්ට ජීවිතදානය කරමි. ඔව්හු නිල්තෘණද අනුභවකෙරෙත්වා. සිහිල් පැන්ද පානයකෙරෙත්වා. ඔවුනට සිහිල් සුලඟද හමත්වායි කියායි.

29. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ කූටදන්ත බ්‍රාහ්මණයාහට පිළිවෙළ කථාව වදාළසේක. ඒ කවරේද, දානකථාවය ශීලකථාවය ස්වර්ගකථාවය කාමයන්ගේ දෝෂය ලාමකබවය කෙලෙසෙන බවය නෛෂ්ක්‍රම්‍යයෙහි අනුසස්ද ප්‍රකාශකළසේක. යම් කලෙක්හි භාග්‍යවතුන්වහන්සේ යහපත් සිත් ඇත්තාවූද, මෘදුසිත් ඇත්තාවූද, නීවරණයන්ගෙන් පහවූසිත් ඇත්තාවූද, ඔදවැඩිසිත් ඇත්තාවූද, ප්‍රසන්නසිත් ඇත්තාවූද, කූටදන්ත බ්‍රාහ්මණයා දැන වදාළසේක්ද.

VI මහාලිසුත්තං.

—○:○—

1. එවං මෙ සුතං. එකං සමයං භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං. තෙන ඛො පන සමයෙන සම්බහුලා කොසලකා ච බ්‍රාහ්මණදූතා මාගධකා ච බ්‍රාහ්මණදූතා වෙසාලියං පටිවසන්ති කෙනචිදෙව කරණීයෙන. අස්සොසුං ඛො තෙ කොසලකා ච බ්‍රාහ්මණදූතා මාගධකා ච බ්‍රාහ්මණදූතා සමණො ඛලු භො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං. තං ඛො පන භවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො. ඉතිපි සො භගවා අරහං සම්මා සම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ.

VI මහාලි සූත්‍රාර්ථ ව්‍යාඛ්‍යා.

—○:○—

1. මේ සූත්‍රධර්මය මා විසින් මෙසේ අසනලදි. එක්කාලයෙක්හි භාග්‍යවතුන්වහන්සේ විසාලාමහනුවර හෙවත් එය ඇසුරුකොට නුවරින් පිටත හිමාලය වනය හා එකාබද්ධව පිහිටියාවූ මහාවනයෙහි වූ කූටාගාරනම්ලද මහවෙහෙර වැඩවසනසේක. එකල්හිදි බොහෝවූ කොසොල්රටවැසි බ්‍රාහ්මණදූතයෝද, මගධරටවැසි බ්‍රාහ්මණ දූතයෝද, කිසියම් අවශ්‍ය කර්තව්‍යයක් සඳහා විසාලාමහනුවර වෙසෙති. ඒ කොසොල් රටවැසි බ්‍රාහ්මණදූතයෝද, මගධරටවැසි බ්‍රාහ්මණදූතයෝද, මේ කරුණු ඇසූහ. ඒනම්, ශාක්‍යරාජපුත්‍රවූ ශාක්‍ය කුලයෙන් නික්ම පැවිදිවූ හෙවත් ඥතිධනාදින් කිසිත් පිරිහීමකට නොපැමිණිසේක්ම නොපිරිහුනු රජකුලය හැරදමා හුදු සැදැහෙන්ම පැවිදිවූ ශ්‍රමණ භවද් ගෞතමයන්වහන්සේ විසාලාමහනුවර සමීප යෙහිවූ මහාවනයෙහි කූටාගාරසාලානම් මහවෙහෙර වැඩවසනසේක්ල. ඒ භවද් ගෞතමයන්වහන්සේ පිළිබඳව මෙසේ යහපත්වූ කීර්තිශබ්දයක් උස්වනැංගේය. කෙසේද, ඒ භාග්‍යවතුන්වහන්සේ සියලු කෙලෙසුන් කෙරෙන් සර්වප්‍රකාරයෙන් දුරුවූසේක. සර්වධර්මයන් සර්වාකාරයෙන් පරොපදෙශරහිතව තෙමේම අවබොධ කළසේක. විදර්ශනාඥනාදි අෂ්ටවිද්‍යාවෙන් හා ප්‍රාතිමොක්ෂ සංවරශීලාදිවූ පසළොස් චරණධර්මයන්ගෙන්ද සම්පූර්ණසේක. ශොභනවූ ගමන්ඇතිසේක. තුන්ලොව දත්නාසේක.

අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා, සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙ කල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං, කෙවලපරිපුණ්ණං පරිසුද්ධං, බ්‍රහ්මචරියං පකාසෙති. සාධු ඛො පන තථාරූපානං අරහතං දස්සනං හොතීති.

2. අථ ඛො තෙ කොසලකා ච බ්‍රාහ්මණදූතා මාගධකා ච බ්‍රාහ්මණදූතා යෙන මහාවනං කූටාගාරසාලා තෙනුපසංකමිංසු. තෙන ඛො පන සමයෙන ආයස්මා නාගිතො භගවතො උපට්ඨාකො හොති.

ශීලසමාධ්‍යාදි ගුණයෙන් තමහට උත්තරීතරයෙක් හුතබා සමානයෙක්ද නැත්තේය, පුරුෂයන් දමනයකිරීමෙහි හෙවත් හික්මවීමෙහි රථාචාර්‍ය්‍යයෙකුසේ සම්පීසේක. දෙවිමිනිසුන්ට අනුශාසනා කරණසේක. චතුස්සත්‍ය ධර්මයන් අවබොධ කළසේක. සිඳ බිඳලූ රාගාදිකෙලෙසුන් ඇතිසේක්යයිද උන්වහන්සේ දෙවියන්සහිතවූ මරුන්සහිතවූ බඹුන් සහිතවූ මේ ලොකයද මහණ බමුණන්සහිතවූ දෙවිමිනිසුන් සහිතවූ සත්වවර්ගයාද තෙමේම පරොපදෙශ රහිතව විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට හඟවනසේක. හෙවත් ප්‍රකාශකරණ සේක්යයිද උන්වහන්සේ මුල යහපත්කොට මැද යහපත්කොට අග යහපත්කොටද, සතරසතිපට්ඨානාදි අර්ථයෙන් යුක්තවූ සිථිලධනිතාදි දශවිධ ව්‍යඤ්ජන ශුද්ධියෙන් යුක්තකොට සියල්ලෙන් සම්පූර්ණවූ ධර්මය දෙශනා කරණසේක්යයිද පිරිසිදුවූ ශ්‍රෙෂ්ඨචර්‍ය්‍යය නොහොත් ශ්‍රෙෂ්ඨාර්ථයෙන් බ්‍රහ්මනම්ලද බුද්ධාදීන්ගේ අධිශීලාදී ත්‍රිවිධශික්ෂාවෙන් සඞ්ග්‍රහකරණලද සකලශාසනමාර්ගබ්‍රහ්මචර්‍ය්‍යාව ප්‍රකාශකරණ සේකැයිද යනුයි. මෙසේ පැවති බුදුන්ගේ යශොඝොෂා අසා එබඳුවූ රහතන්ගේ දර්ශනමාත්‍රයද, යහපත්මවේයයි හෙවත් හිත සැප එල වන්නේමයයි සිතූහ.

2. ඉක්බිත්තෙන් ඒ කොසොල්රටවැසි බ්‍රාහ්මණදූතයෝද, මගධ රටවැසි බ්‍රාහ්මණ දූතයෝද, මහාවනය යම්තැනෙක්හිද කූටාගාර ශාලාවිහාරය යම් තැනෙක්හිද, එතනට එළඹුනාහ. එකල්හිදී ආයුෂ්මත් නාගිතස්ථවිරතෙමේ භාග්‍යවතුන්වහන්සේට උපස්ථාන කරන්නේ වෙයි.

අථ ඛො තෙ කොසලකා ච බ්‍රාහ්මණදූතා මාගධකා ච බ්‍රාහ්මණදූතා යෙනායස්මා නාගිතො තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා ආයස්මන්තං නාගිතං එතදවොචුං. කහං නු ඛො භො නාගිත එතරහි සො භවං ගොතමො විහරති, දස්සනකාමා හි මයං තං භවං ගොතමන්ති. අකාලො ඛො ආවුසො භගවන්තං දස්සනාය, පටිසල්ලීනො භගවාති. අථ ඛො තෙ කොසලකා ච බ්‍රාහ්මණදූතා මාගධකා ච බ්‍රාහ්මණදූතා තත්ථෙව එකමන්තං නිසීදිංසු. දිස්වා'ව මයං තං භවන්තං ගොතමං ගමිස්සාමා,ති.

3. ඔට්ඨද්ධො පි ලිච්ඡවි මහතියා ලිච්ඡවිපරිසාය සද්ධිං යෙන මහාවනං කූටාගාරසාලා. යෙනා'යස්මා නාගිතො තෙනු'පසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මන්තං නාගිතං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො ඔට්ඨද්ධො 'පි ලිච්ඡවි.

ඉක්බිත්තෙන් ඒ කොසොල් රටවැසි බ්‍රාහ්මණ දූතයෝද, මගධ රටවැසි බ්‍රාහ්මණ දූතයෝද, ආයුෂ්මත් නාගිතස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද, එතනට එළඹුනාහ. එළඹ ආයුෂ්මත් නාගිතස්ථවිරයන්වහන්සේට. පින්වත් නාගිතස්ථවිරයන්වහන්ස, දැන් ප්‍රසිද්ධවූ භවද් ගෞතමයන්වහන්සේ කොහි වැඩවසනසේක්ද අපි භවද් ගෞතමයන්වහන්සේ දකිනු කැමැත්තම්හයි යනමෙය දූන්වූහ. ඊට ආයුෂ්මත්, භාග්‍යවතුන්වහන්සේ දක්නට මේ සුදුසුකාලය නොවේමය. භාග්‍යවතුන්වහන්සේ නොයෙක් අරමුණු රසවිඳීමෙන් තුරන්ව එකාන්තවිවෙකාරම්මණයෙහිඇලී ධ්‍යානරති විඳිනසේ කැයි කීයේය. ඉක්බිත්තෙන් ඒ කොසොල් රටවැසි බ්‍රාහ්මණ දූතයෝද, මගධරටවැසි බ්‍රාහ්මණ දූතයෝද, අපි ඒ භවද් ගෞතමයන් වහන්සේ දැකලාම යන්නම්හයි ඒ විහාරයෙහිම එකත්පසෙක හෙවත් ඒ ඒ රුක්සෙවනවල උන්හ.

3. අඩවූ උඩුතොල්ඇති බැවින් ඔට්ඨද්ධයයි ප්‍රසිද්ධවූ මහාලිනම් ලිච්ඡවි උපාසකතෙමේද, මහත්වූ ලිච්ඡවි පිරිසක්සමග මහාවනය යම් තැනෙක්හිද, කූටාගාරසාලාවිහාරය යම් තැනෙක්හිද, ආයුෂ්මත් නාගිතස්ථවිරයන්වහන්සේ යම් තැනෙක්හිද එතැනට එළඹියේය. එළඹ ආයුෂ්මත් නාගිත ස්ථවිරයන්වහන්සේ වැඳ එකත්පස්ව සිටියේය. එකත්පස්ව සිටියාවූ ඔට්ඨද්ධලිච්ඡවිතෙමේද.

ආයස්මන්තං නාගිතං එතදවොච. කහං නු බො භන්තෙ නාගිත එතරහි සො භගවා විහරති අරහං සම්මාසම්බුද්ධො, දස්සනකාමා හි මයං තං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධන්ති. අකාලො බො මහාලි භගවන්තං දස්සනාය, පටිසල්ලීනො භගවාති. ඔට්ඨද්ධො 'පි ලිච්ඡවි තත්ථෙ'ව එකමන්තං නිසීදි. දිස්වා 'ව අහං තං භගවන්තං ගමිස්සාමි අරහන්තං සම්මාසම්බුද්ධන්ති.

4. අථ බො සීහො සමණුද්දෙසො යෙනා'යස්මා නාගිතො තෙනු 'පසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මන්තං නාගිතං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො බො සීහො සමණුද්දෙසො ආයස්මන්තං නාගිතං එත'දවොච. එතෙ භන්තෙ කස්සප සම්බහුලා කොසලකා ච බ්‍රාහ්මණදූතා මාගධකා ච බ්‍රාහ්මණදූතා ඉධූ'පසඞ්කන්තා භගවන්තං දස්සනාය.

ආයුෂ්මත් නාගිතස්ථවිරයන්වහන්සේට. ස්වාමීනි,නාගිත ස්ථවිරයන් වහන්ස, දැන් ඒ භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරජානන්වහන්සේ කොහි වැඩවසනසේක්ද අපි ඒ භාග්‍යවත් අර්හත් සම්මාසම්බුදු රජානන්වහන්සේ දක්නා කැමැත්තම්හයි යන මෙය කීයේය. මහාලිය, භාග්‍යවතුන්වහන්සේ දැක්මට මේ නුසුදුසු කාලයමය. භාග්‍යවතුන් වහන්සේ තන් අරමුණෙන්වෙන්ව විවෙකීභාවයට පැමිණ ධ්‍යාන සැප අනුභවකරණසේකැයි දැන්වීය. ඉක්බිත්තෙන් ඔට්ඨද්ධ ලිච්ඡවිතෙමේද, මම ඒ භාග්‍යවත් අර්හත් සම්මාසම්බුදුරජානන්ව හන්සේ දැකලාම යන්නෙමියි ඒ විහාරයෙහිම එකත්පසෙක (ඒ ඒ රුක්සෙවනවල ඒ ලිච්ඡවි පිරිස සමග තුණුරුවන් ගුණකියමින්) උන්නේය.

4. ඉක්බිත්තෙන් නාගිතස්ථවිරයන්වහන්සේට බෑනන්වූ සත් හැවිරිදිකල්හි පැවිදිවූ සිංහනම් හෙරණතෙමේ ආයුෂ්මත් නාගිත ස්ථවිරයන්වහන්සේ යම් තැනෙක්හිද එතැනට එළඹියේය. එළඹ ආයුෂ්මත් නාගිතස්ථවිරයන්වහන්සේ අභිවාදනය කොට එකත් පස්ව සිටියේය. එකත්පස්ව සිටියාවූ සිංහනම් හෙරණතෙමේ ආයුෂ්මත් නාගිතස්ථවිරයන්වහන්සේට මේ කාරණය දැන්වීය. ස්වාමීනි, කාශ්‍යපගොත්‍රයෙහි උපන්නාවූ නාගිතස්ථවිරයන්වහන්ස, මේ බොහෝවූ කොසොල් රටවැසි බ්‍රාහ්මණ දූතයෝද, මගධරටවැසි බ්‍රාහ්මණ දූතයෝද, භාග්‍යවතුන්වහන්සේ දක්නා පිණිස මෙහි පැමිණියෝය.

ඔට්ඨද්ධොපි ලිච්ඡවි මහතියා ලිච්ඡවිපරිසාය සද්ධිං ඉධූපසඞ්කන්තො භගවන්තං දස්සනාය. සාධු භන්තෙ කස්සප ලභතං එසා ජනතා භගවන්තං දස්සනායාති. තෙන හි සීහ ත්වඤ්ඤෙව භගවතො ආරොචෙහීති. එවං භන්තෙති ඛො සීහො සමණුද්දෙසො ආයස්මතො නාගිතස්ස පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමි, උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො සීහො සමණුද්දෙසො භගවන්තං එතද'වොච. එතෙ භන්තෙ සම්බහුලා කොසලකා ච බ්‍රාහ්මණදූතා මාගධකා ච බ්‍රාහ්මණදූතා ඉධූපසඞ්කන්තා භගවන්තං දස්සනාය. ඔට්ඨද්ධො'පි ලිච්ඡවි මහතියා ලිච්ඡවිපරිසාය සද්ධිං ඉධූපසඞ්කන්තො භගවන්තං දස්සනාය,සාධු භන්තෙ ලභතං එසා පරිසා භගවන්තං දස්සනායා'ති. තෙන හි සීහ විහාරපච්ඡායාය ආසනං පඤ්ඤපෙහී'ති. එවං භන්තෙ 'ති ඛො සීහො සමණුද්දෙසො.

ඔට්ඨද්ධලිච්ඡවිතෙමේද මහත් ලිච්ඡවි පිරිසක් සමග භාග්‍යවතුන්වහන්සේ දක්නාපිණිස මෙහි පැමිණියේය. ස්වාමීනි, කාශ්‍යපගොත්‍රොද්භූතවූ නාගිතස්ථවිරයන්වහන්ස, මේ ජනසමූහතෙමේ භාග්‍යවතුන්වහන්සේ දක්නටලබාවා. ඒ ඉතා මැනව. හෙවත් එසේ ආයාචනා කරමියි යනුයි. එහෙනම් සිංහය, තෝම භාග්‍යවතුන්වහන්සේට මේබැව් සැලකරවයි කියේය. එසේය ස්වාමීන්වහන්සැයි, සිංහනම් හෙරණුතෙමේ ආයුෂ්මත් නාගිතස්ථවිරයන්වහන්සේට පිළිවදන්දී භාග්‍යවතුන්වහන්සේ යම්තැනෙක්හිද එතැනට එළඹියේය. එළඹ භාග්‍යවතුන්වහන්සේ සකසා වැඳ එකත්පස්ව සිටියේය. එකත්පසෙක සිටියාවූ සිංහනම් හෙරණුතෙමේ භාග්‍යවතුන්වහන්සේට මේකාරණය සැලකළේය. ස්වාමින්වහන්ස, මේ බොහෝවූ කොසොල්රටවැසි බ්‍රාහමණ දූතයෝද මගධරටවැසි බ්‍රාහමණ දූතයෝද භාග්‍යවතුන්වහන්සේ දක්නාපිණිස මෙහි පැමිණියාහ. ඔට්ඨද්ධලිච්ඡවිතෙමේද මහත් ලිච්ඡවි පිරිසක් සමග භාග්‍යවතුන්වහන්සේ දක්නාපිණිස මෙහි පැමිණියේය. ස්වාමීන්වහන්ස, මේ පිරිස්තොමෝ භාග්‍යවතුන්වහන්සේ දක්නට ලබාවා. එසේනම් ඒ ඉතා යහපතැයි හෙවත් එසේ ආයාචනාකරම්හි යනුයි. එහෙනම් සිංහය, කුටාගාරාභිමුඛයෙහිවූ සෙවනැල්ලෙහි අස්නක් පණවවයි වදාළසේක. එසේය ස්වාමින්වහන්සැයි, සිංහ හෙරණ තෙමේ.

භගවතො පටිස්සුත්වා විහාරපච්ඡායාය ආසනං පඤ්ඤපෙසි. අථ ඛො භගවා විහාරා නික්ඛම්ම විහාරපච්ඡායාය පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි.

5. අථ ඛො තෙ කොසලකා ච බ්‍රාහ්මණදූතා මාගධකා ච බ්‍රාහ්මණදූතා යෙන භගවා තෙනුපසංකමිංසු. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදිංසු. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු. ඔට්ඨද්ධො'පි ලිච්ඡවි මහතියා ලිච්ඡවි පරිසාය සද්ධිං යෙන භගවා තෙනු'පසඞ්කමි, උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ඔට්ඨද්ධො ලිච්ඡවි භගවන්තං එතද'වොච. පුරිමානි භන්තෙ දිවසානි පුරිමතරානි සුනක්ඛත්තො ලිච්ඡවිපුත්තො යෙනා'හං තෙනු'පසඞ්කමි. උපසඞ්කමිත්වා මං එතදවොච. යදග්ගෙ අහං මහාලි භගවන්තං උපනිස්සාය විහරිස්සාමි න චිරං තිණිවස්සානි, දිබ්බානි හි ඛො රූපානි පස්සාමි පියරූපානි කාමූපසංහිතානි රජනීයානි.

භාග්‍යවතුන්වහන්සේට ප්‍රතිවචනදී විහාර ගෘහාභිමුඛයෙහිවූ සෙවනැල්ලෙහි අස්නක් පැණවීය. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ විහාරයෙන් නික්ම විහාර ගෘහාභිමුඛයෙහිවූ සෙවනැල්ලෙහි පැණවූ අස්නෙහි වැඩඋන්සේක.

5. එකල්හිදී ඒ කොසොල්රටවැසි බ්‍රාහ්මණදූතයෝද, මගධරටවැසි බ්‍රාහ්මණ දූතයෝද භාග්‍යවතුන්වහන්සේ යම්තැනෙක්හිද එතනට එළඹුනාහ. එළඹ භාග්‍යවතුන්වහන්සේ සමග ඔබිමොබ සුවදුක් විචාරීමාදියෙන් සතුටුවූහ. ප්‍රීතිප්‍රමොද්‍ය සඞ්ඛ්‍යාතවූ මහත්වූද තරුණවූද සතුටුඋපදවනහෙයින් "සම්මොදනීය"වූද අර්ථව්‍යඤ්ජනයන්ගේ මධුරත්වයෙන් බොහෝකලක් මුලුල්ලෙහි සිහිකටයුතුවූ කථාවකොට නිමවා එකත්පසෙක උන්හ. ඔට්ඨද්ධයයි ප්‍රසිද්ධවූ මහාලි ලිච්ඡවිතෙමේද මහත් ලිච්ඡවිපිරිසක්සමග භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙක්හිද එතැනට එළඹියේය. එළඹ භාග්‍යවතුන්වහන්සේ වැඳ එකත්පසෙක උන්නේය.එකත්පස්ව උන්නාවූ ඔට්ඨද්ධ ලිච්ඡවිතෙමේ භාග්‍යවතුන්වහන්සේට මේකාරණය සැලකළේය. ඒනම්,ස්වාමීනි පූර්වවූද ඉතා පූර්වවූද දවස්හි හෙවත් නොබෝකල්හි සුනක්ඛත්ත ලිච්ඡවිපුත්‍රතෙමේ මම යම්තැනෙක්හිද එතැනට එළඹියේය. එළඹ මට එම්බා මහාලිය, මම යම්දවසකපටන් මේ තුන්අවිරුද්දක් මුලුල් ලෙහි භාග්‍යවතුන්වහන්සේ ඇසුරුකොට විසූයෙම්ද, ඒකාලයෙහිදී ප්‍රියස්වභාවඇති කාමාස්වාදයට යොග්‍යවූ හෙවත් අරමුණුකරන්නාවූ කාමයෙන් යුක්තවූ රාගජනකවූ දිව්‍යරූපයන් පමණක් දුටුවෙමි.

නො ච ඛො දිබ්බානි සද්දානි සුණාමි පියරූපානි කාමූපසංහිතානි රජනියානී'ති. සන්තානෙ'ව නුඛො භන්තෙ සුනක්ඛත්තෙන ලිච්ඡවිපුත්තෙන දිබ්බානි සද්දානි නාසෙසාසි පියරූපානි කාමූපසංහිතානි රජනියානි, නො උදාහු අසන්තානී'ති. සන්තානෙ'ව ඛො මහාලි සුනක්ඛත්තෙන ලිච්ඡවිපුත්තෙන දිබ්බානි සද්දානි නා'ස්සොසි පියරූපානි කාමූපසංහිතානි රජනියානි නො අසන්තානී 'ති.

6. කො නු ඛො භන්තෙ හෙතු කො පච්චයො, යෙන සන්තානෙ'ව සුනක්ඛත්තෙන ලිච්ඡවිපුත්තෙන දිබ්බානි සද්දානි නා'ස්සොසි පියරූපානි කාමූපසංහිතානි රජනියානි නො අසන්තානී'ති. ඉධ මහාලි භික්ඛුනො පුරත්ථිමාය දිසාය එකංසභාවිතො සමාධි හොති දිබ්බානං රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනියානං, නො ච ඛො දිබ්බානං සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං. සො පුරත්ථිමාය දිසාය එකංසභාවිතෙ සමාධිම්හි දිබ්බානං රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනියානං නො ච ඛො දිබ්බානං සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනියානං.

එහෙත් ප්‍රියජනක ස්වභාවඇති කාමාස්වාදයට යොග්‍යවූ රාගජනකවූ දිව්‍යශබ්දයන් නොමඇසීමියි කීයේය. ස්වාමීන්වහන්ස, සුනක්ඛත්ත ලිච්ඡවිපුත්‍රතෙමේ ඇත්තාවූම ප්‍රියජනක ස්වභාවඇති කාමාස්වාදයට යොග්‍යවූ රාගජනකවූ දිව්‍යශබ්දයන් නොමඇසුවේද, නැතහොත් නැත්තාවූ දිව්‍යශබ්දයන් නොමඇසුවේදැයි යන මේ කාරණය විචාළේය. මහාලිය, සුනක්ඛත්ත ලිච්ඡවිපුත්‍රතෙමේ ඇත්තාවූම ප්‍රියජනකස්වභාවයෙන්යුක්තවූ කාමාස්වාදයටයොග්‍යවූ රාගජනකවූ දිව්‍යශබ්දයන් නොමඇසුවේය. නැත්තාවූ දිව්‍යශබ්දයන් නොමඇසුවේ නොවේයයි වදාළසේක.

6. ස්වාමීන්වහන්ස, යම්හෙතුවකින් සුනක්ඛත්ත ලිච්ඡවිපුත්‍රතෙමේ ප්‍රියජනකස්වභාවයඇතිකාමාස්වාදයටයොග්‍යවූරාගජනකවූනැත්තාවූ නොව ඇත්තාවූම දිව්‍ය ශබ්දයන් නොඇසුයේනම් ඊට හෙතුව කවරේද, ඊට ප්‍රත්‍යය කවරේදැයි විචාළේය. මහාලිය, මේ ශාසනයෙහි යම් මහණෙකුට පෙරදික්හි එක කොටසක් සම්බන්ධව වඩනාලද්දාවූ ඒනම්, ඉෂ්ටවූ ස්වභාවයඇති කාමාස්වාදයට යොග්‍යවූ රාග ජනකවූ දිව්‍ය රූපයන් දක්නාපිණිස වඩනලද්දාවූ ඉෂ්ටවූ ස්වභාවයඇති කාමාස්වාදයට යොග්‍යවූ රාගජනකවූ දිව්‍ය ශබ්දයන් අසනා පිණිස නොවඩන ලද්දාවූ සමාධියෙක් වේද, ඒමහණතෙම පෙරදික්හි ඉෂ්ටවූ ස්වභාවයඇති කාමාස්වාදයට යොග්‍යවූ රාගජනකවූ දිව්‍ය ශබ්දයන් අසනාපිණිස නොව ඉෂ්ටවූ ස්වභාවයඇති කාමාස්වාදයට යොග්‍යවූ රාගජනකවූ දිව්‍ය රූපයන් දක්නා පිණිසය යන එක කොටසක් සම්බන්ධව වඩනලද සමාධියෙහි හෙවත් එය පාදක කොට ගෙණ.

පුරත්ථිමාය දිසාය දිබ්බානි රූපානි පස්සති පියරූපානි කාමූපසංහිතානි රජනීයානි, නො ච බො දිබ්බානි සද්දානි සුණාති පියරූපානි කාමූපසංහිතානි රජනීයානි. තංකිස්සහෙතු, එවං හෙ'තං මහාලි හොති භික්ඛුනො පුරත්ථිමාය දිසාය එකංසභාවිතෙ සමාධිම්හි දිබ්බානං රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං, නො ච බො දිබ්බානං සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං.

7. පුන ච පරං මහාලි භික්ඛුනො දක්ඛිණාය දිසාය—පෙ—පච්ඡිමාය දිසාය උත්තරාය දිසාය උද්ධමධො තිරියං එකංසභාවිතො සමාධි හොති දිබ්බානං රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං, නොච බො දිබ්බානං සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං. සො උද්ධමධො තිරියං එකංසභාවිතෙ සමාධිම්හි දිබ්බානං රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං, නො ච බො දිබ්බානං සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං, උද්ධමධො තිරියං දිබ්බානි රූපානි පස්සති පියරූපානි කාමූපසංහිතානි රජනීයානි,

---

පෙරදික්හි ඉෂ්ටවූ සවභාවයඇති කාමාස්වාදයට යොග්‍යවූ රාගජනකවූ දිව්‍ය රූපයන් දකී. එහෙත් ඉෂ්ටවූ සවභාවයඇති කාමාස්වාදයට යොග්‍යවූ රාගජනකවූ දිව්‍ය ශබ්දයන් නොමඅසයි. ඊට හෙතුකවරේදයත්. මහාලිය, ඒ මහණහට පෙරදික්හි ඉෂ්ටවූ සවභාවයඇති කාමාස්වාදයට යොග්‍යවූ රාගජනකවූ දිව්‍යශබ්දයන් අසන පිණිස නොව ඉෂ්ටවූ සවභාවයඇති කාමාස්වාදයට යොග්‍යවූ රාගජනකවූ දිව්‍යරූපයන්දක්නාපිණිසය යන එක කොටසක්සම්බන්ධව වඩනලද සමාධිය නිමිත්තකොටගෙණ මෙය මෙසේම වේ.

7. මහාලිය, තවද අන්කාරණයෙක් ඇත්තේය. යම් මහණෙක් හට දකුණුදික්හි—පෙ—සෙස්ස කී නයින්ම දතයුතු. පැලදික්හි උතුරු දික්හි උඩයටඅනුදික්හිඑක කොටසක් සම්බන්ධව වඩනලද්දාවූ ඉෂ්ටවූ සවභාවයඇති කාමාස්වාදයට යොග්‍යවූ රාගජනකවූ දිව්‍ය රූපයන් දක්නාපිණිස වඩනාලද්දාවූ ඉෂ්ටවූ සවභාවයඇති කාමාස්වාදයට යොග්‍යවූ රාගජනකවූ දිව්‍ය ශබ්දයන් අසන පිණිස නොව ඩන ලද්දාවූ සමාධියෙක් වේද. ඒ මහණතෙම—පෙ—උඩ යට අනුදික්හි ඉෂ්ටවූ සවභාවය ඇති කාමාස්වාදයට යොග්‍යවූ රාගජනකවූ දිව්‍ය ශබ්දයන් අසන පිණිස නොව ඉෂ්ටවූ සවභාවයඇති කාමාස්වාදයට යොග්‍යවූ රාගජනකවූ දිව්‍යරූපයන් දක්නා පිණිසය යන එකකොටසක්සම්බන්ධවවඩනලදසමාධියෙහිහෙවත් එයපාදකකොටගෙණ—පෙ—උඩ යට අනුදික්හි ඉෂ්ටවූ ස්වභාවය ඇති කාමාස්වාදයට යොග්‍යවූ රාගජනකවූ දිව්‍ය රූපයන්දකී.

නො ච බො දිබ්බානි සද්දානි සුණාති පියරූපානි කාමූපසංහිතානි රජනියානි. තං කිස්සහෙතු. එවං හෙතං මහාලි හොති භික්ඛුනො උද්ධමධො තිරියං එකංසභාවිතෙ සමාධිම්හි දිබ්බානං රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනියානං, නො ච බො දිබ්බානං සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනියානං.

8. ඉධ මහාලි භික්ඛුනො පුරත්ථිමාය දිසාය එකංසභාවිතො සමාධි හොති දිබ්බානං සද්දානං සවනාය පියරූපානං කාමූපසංහිතානං රජනියානං,නොචබොදිබ්බානංරූපානංදස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනියානං. සො පුරත්ථිමාය දිසාය එකංසභාවිතෙ සමාධිම්හි දිබ්බානං සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනියානං, නො ච බො දිබ්බානං රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනියානං, පුරත්ථිමාය දිසාය දිබ්බානි සද්දානි සුණාති පියරූපානි කාමූපසංහිතානි රජනියානි,

---

එහෙත් ඉෂ්ටවූ ස්වභාවය ඇති කාමාස්වාදයට යොග්‍යවූ රාගජනකවූ දිව්‍යශබ්දය නොඅසයි. ඊටහෙතුකවරේයදත්. මහාලිය, ඒ මහණහට –පෙ– උඩ යට අනුදික්හිඉෂ්ටවූස්වභාවයඇතිකාමාස්වාදයටයොග්‍යවූ රාගජනකවූ දිව්‍ය ශබ්දයන් අසනපිණිස නොව ඉෂ්ටවූ ස්වභාවය ඇති කාමාස්වාදයට යොග්‍යවූ රාගජනකවූ දිව්‍යරූපයන් දක්නා පිණිසය යන එක කොටසක් සම්බන්ධව වඩනලද සමාධිය නිමිත්ත කොටගෙණ මෙය මෙසේම වේ.

8. මහාලිය, මේ ශාසනයෙහි යම් මහණෙකුට පෙරදික්හි එක කොටසක් පිළිබඳව වඩනලද්දාවූ ඉෂ්ටවූ ස්වභාවය ඇති කාමාස්වාදයට යොග්‍යවූ රාගජනකවූ දිව්‍ය ශබ්දයන් අසනපිණිස වඩනලද්දාවූ ස්වභාවයඇති කාමාස්වාදයට යොග්‍යවූ රාගජනකවූ දිව්‍යරූපයන් දක්නා පිණිස නොවඩන ලද්දාවූ සමාධියෙක් වේද, ඒ මහණතෙම පෙරදික්හි ඉෂ්ටවූ ස්වභාවයඇති කාමාස්වාදයට යොග්‍යවූ රාගජනකවූ දිව්‍ය රූපයන් දක්නාපිණිස නොව ඉෂ්ටවූ ස්වභාවයඇති කාමාස්වාදයට යොග්‍යවූ රාගජනකවූ දිව්‍ය ශබ්දයන් අසන පිණිසය යනඑකකොටසක්පිළිබඳවවඩනලදසමාධියෙහිහෙවත්එයපාදකකොටගෙණ පෙරදික්හි ඉෂ්ටවූ ස්වභාවයඇති කාමාස්වාදයට යොග්‍යවූ රාගජනකවූ දිව්‍ය ශබ්දයන් අසයි.

නොච ඛො දිබ්බානි රූපානි පස්සති පියරූපානි කාමූපසංහිතානි රජනියානි. තංකිස්සහෙතු?එවං හෙතං මහාලි හොති භික්ඛුනො පුරත්ථිමාය දිසාය එකංසභාවිතෙ සමාධිම්හි දිබ්බානං සද්දානං පියරූපානං කාමූපසංහිතානංරජනියානං, නො ච ඛො දිබ්බානං රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනියානං.

9. පුන ච පරං මහාලි භික්ඛුනො දක්ඛිණාය දිසාය—පෙ—පච්ඡිමාය දිසාය උත්තරාය දිසාය උද්ධමධො තිරියං එකංසභාවිතො සමාධි හොති දිබ්බානං සද්දානං සවනාය පියරූපානං කාමූපසංහිතානං රජනියානං, නො ච ඛො දිබ්බානං රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනියානං, සො උද්ධමධො තිරියං එකංසභාවිතෙ සමාධිම්හි දිබ්බානං සද්දානං සවනාය පියරූපානං කාමූපසංහිතානං රජනියානං, නො ච ඛො දිබ්බානං රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනියානං, උද්ධමධො තිරියං දිබ්බානි සද්දානි සුණාති පියරූපානි කාමූපසංහිතානි රජනියානි

එහෙත් ඉෂ්ටවූ ස්වභාවයඇතිකාමාස්වාදයට යොග්‍යවූ රාගජනකවූ දිව්‍ය රූපයන් නොමදකී. ඊටහෙතුකවරේදයත්. මහාලිය, ඒ මහණහට පෙරදික්හි ඉෂ්ටවූ ස්වභාවයඇති කාමාස්වාදයට යොග්‍යවූ රාගජනකවූ දිව්‍ය රූපයන් දක්නාපිණිස නොව ඉෂ්ටවූ ස්වභාවයඇති කාමාස්වාදයට යොග්‍යවූ රාගජනකවූ දිව්‍ය ශබ්දයන් අසන පිණිසය යන එකකොටසක් පිළිබඳව වඩනලද සමාධියෙහි මෙයමෙසේම වේ.

9. මහාලිය, වැලි අනිකෙකුදු ඇත්තේය. යම් මහණෙකුට දකුණුදික්හි—පෙ—පැලදික්හි, උතුරුදික්හි, උඩ, යට, අනුදික්හි එකකොටසක් පිළිබඳව වඩනලද්දාවූ,කවරඑකකොටසක් පිණිසදයත්,ඉෂ්ටවූ ස්වභාවයඇති කාමාස්වාදයට යොග්‍යවූ රාගජනකවූ දිව්‍ය ශබ්දයන් අසන පිණිස වඩනලද්දාවූ ඉෂ්ටවූ ස්වභාවයඇති කාමාස්වාදයට යොග්‍යවූ රාගජනකවූ දිව්‍ය රූපයන් දක්නාපිණිස නොවඩනලද්දාවූ සමාධියක්වේද, ඒ මහණතෙම—පෙ—උඩ, යට, අනුදික්හි ඉෂ්ටවූ ස්වභාවයඇති කාමාස්වාදයට යොග්‍යවූ රාගජනකවූ දිව්‍ය රූපයන් දක්නා පිණිස නොව ඉෂ්ටවූ ස්වභාවයඇති කාමාස්වාදයට යොග්‍යවූ රාගජනකවූ දිව්‍ය ශබ්දයන් අසනපිණිසය යන එකකොටසක් පිළිබඳව වඩනලද සමාධියෙහි හෙවත්එය පාදකකොටගෙණ—පෙ—උඩ, යට අනුදික්හි ඉෂ්ටවූ ස්වභාවයඇති කාමාස්වාදයට යොග්‍යවූ රාගජනකවූ දිව්‍ය ශබ්දයන් අසයි.

නොච ඛො දිබ්බානි රූපානි පස්සති පියරූපානි කාමූපසංහිතානි රජනීයානි. තං කිස්ස හෙතු. එවං හෙතං මහාලි හොති භික්ඛුනො උද්ධමධො තිරියං එකංසභාවිතෙ සමාධිම්හි දිබ්බානං සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං, නො ච ඛො දිබ්බානං රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං.

10. ඉධ මහාලි භික්ඛුනො පුරත්ථිමාය දිසාය උභයංසභාවිතො සමාධි හොති දිබ්බානඤ්ච රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං දිබ්බානං සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං. සො පුරත්ථිමාය දිසාය උභයංසභාවිතෙ සමාධිම්හි දිබ්බානං රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං, දිබ්බානඤ්ච, සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං, පුරත්ථිමාය දිසාය දිබ්බානි ච රූපානි පස්සති පියරූපානි කාමූපසංහිතානි රජනීයානි, දිබ්බානි සද්දානි සුණාති පියරූපානි කාමූපසංහිතානි රජනීයානි. තං කිස්ස හෙතු.

එහෙන් ඉෂ්ටවූ ස්වභාවයඇති කාමාස්වාදයට යොග්‍යවූ රාගජනකවූ දිව්‍ය රූපයන් නොමදකී, ඊටහෙතුකවරේදයත්. මහාලිය, ඒ මහණහට—පෙ—උඩ, යට, අනුදික්හි ඉෂ්ටවූ ස්වභාවයඇති කාමාස්වාදයට යොග්‍යවූ රාගජනකවූ දිව්‍ය රූපයන් දක්නාපිණිස නොව ඉෂ්ටවූ ස්වභාවයඇති කාමාස්වාදයටයොග්‍යවූ රාගජනකවූ දිව්‍ය ශබ්දයන් අසන පිණිසයයනඑකකොටසක් පිළිබඳව වඩනලද සමාධියනිමිත්ත කොට මෙය මෙසේම වේ.

10, මහාලිය, මේශාසනයෙහි යම් මහණෙක්හට පෙරදික්හි ඉෂ්ටවූ ස්වභාවයඇති කාමාස්වාදයට යොග්‍යවූ රාගජනකවූ දිව්‍ය රූපයන් දක්නාපිණිසද ඉෂ්ටවූ ස්වභාවයඇති කාමාස්වාදයට යොග්‍යවූ රාගජනකවූ දිව්‍ය ශබ්දයන් අසනපිණිසදැයියන දෙකොටසම පිණිස වඩනලද්දාවූ සමාධියෙක් වේද, ඒ මහණතෙමේ පෙරදික්හි ඉෂ්ටවූ ස්වභාවයඇති කාමාස්වාදයට යොග්‍යවූ රාගජනකවූ දිව්‍යරූපයන් දක්නාපිණිසද ඉෂ්ටවූ ස්වභාවයඇති කාමාස්වාදයට යොග්‍යවූ රාගජනකවූ දිව්‍යශබ්දයන් අසනු පිණිසදැයි යන දෙකොටසම පිණිස වඩනලද්දාවූ සමාධියෙහි හෙවත් එයපාදකකොටගෙණ පෙරදික්හි ඉෂ්ටවූ ස්වභාවයඇති කාමාස්වාදයට යොග්‍යවූ රාගජනකවූ දිව්‍ය රූපයන්ද දකී. ඉෂ්ටවූ ස්වභාවයඇති කාමාස්වාදයට යොග්‍යවූ රාගජනකවූ දිව්‍ය ශබ්දයන්ද අසයි. ඊට හෙතුකවරේදයත්.

එවංභහතංමහාලිහොතිභික්ඛුනොපුරත්ථිමාය දිසාය උභයංසභාවිතො සමාධිම්හි දිබ්බානං සද්දානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං, දිබ්බානඤ්ච සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනියානං.

11. පුන ච පරං මහාලි භික්ඛුනො දක්ඛිණාය දිසාය......පෙ......පච්ඡිමාය දිසාය උත්තරාය දිසාය උඩ්ඪමධො තිරියං උභයංසභාවිතො සමාධි හොති දිබ්බානඤ්ච රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං, දිබ්බානඤ්ච සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං සො උද්ධමධො තිරියං උභයංසභාවිතෙ සමාධිම්හි දිබ්බානඤ්ච රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං, දිබ්බානඤ්ච සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං, උඩ්ඪමධො තිරියං දිබ්බානි රූපානි පස්සති පියරූපානි කාමූපසංහිතානි රජනීයානි, දිබ්බානි ච සද්දානි සුණාති පියරූපානි කාමූපසංහිතානි රජනියානි, තං කිස්ස හෙතු.

මහාලිය,ඒ මහණහට පෙරදික්හි ඉෂ්ටවූ ස්වභාවයඇති කාමාස්වාදයටයොග්‍යවූරාගජනකවූදිව්‍යරූපයන්දක්නාපිණිසද‍ඉෂ්ටවූස්වභාවය ඇති කාමාස්වාදයට යොග්‍යවූ රාගජනකවූ දිව්‍ය ශබ්දයන් අසන පිණිසදැයි යන දෙකොටසම පිණිස වඩනලද සමාධිය නිමිත්තකොට මෙසේම වේ.

11. මහාලිය, වැලිඅනිකෙකුදු ඇත්තේය. යම් මහණෙක්හට දකුණු දික්හි—පෙ—පැලදික්හි, උතුරුදික්හි, උඩ, යට, අනුදික්හි ඉෂ්ටවූ ස්වභාවය ඇතිකාමාස්වාදයට යොග්‍යවූ රාගජනකවූ දිව්‍ය රූපයන් දක්නාපිණිසද ඉෂ්ටවූ ස්වභාවයඇති කාමාස්වාදයට යොග්‍යවූ රාගජනකවූ දිව්‍යශබ්දයන් අසනු පිණිසදැයි යන දෙකොටසම පිණිස වඩනලද්දාවූ සමාධියෙක් වේද, ඒ මහණතෙමේ—පෙ—උඩ, යට, අනුදික්හි ඉෂ්ටවූ ස්වභාවයඇති කාමාස්වාදයට යොග්‍යවූ රාගජනකවූ දිව්‍ය රූපයන් දක්නාපිණිසද ඉෂ්ටවූ ස්වභාවයඇති කාමාස්වාදයට යොග්‍යවූ රාගජනකවූ දිව්‍ය ශබ්දයන් අසනුපිණිසදැයි යන දෙකොටසම පිණිස වඩනලද්දාවූ සමාධියෙහි හෙවත් එය පාදක කොටගෙණ—පෙ—උඩ, යට, අනුදික්හි ඉෂ්ටවූ ස්වභාවයඇති කාමාස්වාදයට යොග්‍යවූ රාගජනකවූ දිව්‍ය රූපයන්ද දකී. ඉෂ්ටවූ ස්වභාවයඇති කාමාස්වාදයට යොග්‍යවූ රාගජනකවූ දිව්‍ය ශබ්දයන්ද අසයි. ඊටහෙතුකවරේදයත්.

එවං හෙතං මහාලි හොති භික්ඛුනො උද්ධමධො තිරියං උභයංසභාවිතෙ සමාධිම්හි දිබ්බානඤ්ච රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනියානං, දිබ්බානඤ්ච සද්දානං සවණාය පිය රූපානං කාමූපසංහිතානං රජනීයානං, අයං ඛො මහාලි හෙතු, අයං පච්චයො, යෙන සුනක්ඛත්තො ලිච්ඡවිපුත්තො දිබ්බානි සද්දානි නාස්සොසි පියරූපානි කාමූපසංහිතානි රජනියානි, නො අසන්තානීති.

12. එතාසං නූන භන්තෙ සමාධිභාවනානං සච්ඡිකිරියාහෙතු භගවති භික්ඛූ බ්‍රහ්මචරියං චරන්තීති. න ඛො මහාලි එතාසං සමාධිභාවනානං සච්ඡිකිරියාහෙතු භික්ඛූ මයි බ්‍රහ්මචරියං චරන්ති. අත්ථි ඛො මහාලි අඤ්ඤෙ ච ධම්මා උත්තරිතරා ච පණීතතරා ච යෙසං සච්ඡිකිරියාහෙතු භික්ඛූ මයි බ්‍රහ්මචරියං චරන්තීති.

මහාලිය,ඒමහණහට—පෙ—උඩ,යට,අනුදික්හිඉෂ්ටවූ ස්වභාවය ඇති කාමාස්වාදයට යොග්‍යවූ රාගජනකවූ දිව්‍ය රූපයන් දක්නා පිණිසද ඉෂ්ටවූ ස්වභාවය ඇති කාමාස්වාදයට යොග්‍යවූ රාගජනකවූ දිව්‍ය ශබ්දයන් අසන පිණිසදැයි යන දෙකොටසම පිණිස වඩනලද සමාධියනිමිත්තකොටමෙයමෙසේමවේ. මහාලිය, යම් හෙතුවකින්සුනක්ඛත්ත ලිච්ඡවිපුත්‍රතෙමේ නැත්තාවූ නොවඇත්තාවූම ඉෂ්ටවූ ස්වභාවයඇති කාමාස්වාදයට යොග්‍යවූ රාගජනකවූ දිව්‍ය ශබ්දයන් නැසිද, ඒ හෙතුවනම්, මේ දිව්‍යරූපයන් දැකීමපිණිස පමණක්වූ එක කොටසක් පිණිස වඩනලද සමාධියමය. ඒ ප්‍රත්‍යයනම් මේ ඒ කාංශ භාවිතවූ සමාධියමයයි වදාළසේක.

12. ස්වාමීන්වහන්ස, මේ උභයාංශභාවිතවූ සමාධීන් සාක්ෂාත්කර ගැණීම හෙතුකොටගෙණම භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේ කෙරෙහි බ්‍රහ්මචර්‍ය්‍යය කෙරෙත්දැයි ඇසීය. මහාලිය, මේ සමාධීන් සාක්ෂාත්කර ගැණීම හෙතුකොටගෙණම භික්ෂූහු මාකෙරෙහි බ්‍රහ්මචර්‍ය්‍යය නොකෙරෙති. මහාලිය, යම්ධර්මකෙනෙකුන් සාක්ෂාත්කරගැණීම හෙතුකොට ගෙණම භික්ෂූහු මාකෙරෙහි බ්‍රහ්මචර්‍ය්‍යය කෙරෙත්ද, එසේවූ මීටවඩා අතිශයින් උසස්වූද අතිශයින් ප්‍රණීතවූද වෙනත් ධර්මයෝ ඇත්තාහුමයයි වදාළසේක. ස්වාමීන්වහන්ස, යම්ධර්මකෙනෙකුන් සාක්ෂාත්කර ගැණීම හෙතුකොටගෙණ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේ(ම)කෙරෙහි බ්‍රහ්මචර්‍ය්‍යය කෙරෙත්ද, මීටවඩා අතිශයින් උසස්වූද අතිශයින් ප්‍රණීතවූද ඒ ධර්මයෝ කවරහුදැයි ඇසීය.

13. කතමෙ ච පන තෙ භන්තෙ ධම්මා උත්තරිතරා ච පණීතතරා ච යෙසං සච්ඡිකිරියාහෙතු භික්ඛූ භගවති බ්‍රහ්මචරියං චරන්ති. ඉධ මහාලි භික්ඛු තිණ්ණං සංයොජනානං පරික්ඛයා සොතාපන්නො හොති අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායනො. අයම්පි ඛො මහාලි ධම්මො උත්තරිතරො ච පණීතතරො ච යස්ස සච්ඡිකිරියා හෙතු භික්ඛූ මයි බ්‍රහ්මචරියං චරන්ති. පුනචපරං මහාලි භික්ඛු තිණ්ණං සංයොජනානං පරික්ඛයා රාගදෙසමොහානං තනුත්තා සකදාගාමි හොති, සකි දෙව ඉමං ලොකං ආගන්ත්වා. දුක්ඛස්සන්තං කරොති. අයම්පි ඛො මහාලි ධම්මො උත්තරිතරො ච පණීතතරො ච යස්ස සච්ඡිකිරියාහෙතු භික්ඛූ මයි බ්‍රහ්මචරියං චරන්ති. පුන ච පරං, මහාලි භික්ඛු පඤ්චන්නං ඕරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකො හොති.

---

13. යම්කරුණකින් මහණහු භගවත්හු කෙරෙහි බඹසර කෙරෙත්නම් ශ්‍රෙෂ්ඨානිශ්‍රෙෂ්ඨ ඒ ධර්‍මයෝ කවරහුදයනු විචාරණලද්දෙ ඉධමහාලි යනාදිය වදාළෝ. මහාලිය, මේශාසනයෙහි මහණතෙමේ සත්කායදෘෂ්ටිආදිත්‍රිවිධබන්ධනයන්සර්‍වප්‍රකාරයෙන්ක්‍ෂයකිරීමෙන් හෙවත් සමුච්ඡෙදප්‍රහාණයෙන් නැතිකිරීමෙන් සෝවාත්වේද හෙවත් මාර්‍ගශ්‍රොතයට පැමිණියේ වේද, සතරඅපායයන්හි නූපදනා සවභාවය ඇත්තේ වේද, මාර්‍ගධර්‍ම නියමයෙන් නියතවූයේ වේද, මත්තෙහිවූ සකෘදගාම්‍යාදිමාර්‍ගත්‍රය සඞ්ඛ්‍යාතවූ සම්බොධිය පරමගති කොට ඇත්තේ වේද, මහාලිය, යම්ධර්‍මයක් සාක්‍ෂාත්කිරීම හෙතු කොටගෙණ භික්‍ෂූහු මාකෙරෙහි බ්‍රහ්මචර්‍ය්‍යය කෙරෙත්ද, එසේවූ මේ සෝවාන් බැව් සඞ්ඛ්‍යාතවූ ධර්‍මයද තෙල සමාධීන්ට වඩා අතිශයින් උසස් වේ. අතිශයින් ප්‍රණීතද වේ. මහාලිය, තවද අන්කරුණක් ඇත්තේය. මහණතෙමේ සත්කායදෘෂ්ටිආදි ත්‍රිවිධ බන්ධනයන්සියලු අයුරින්ක්‍ෂයකිරීමෙන් රාගද්වෙෂමොහයන්ගේ විරලත්වයෙන් හෙවත් තුණීබැවින් සකෘදගාමී වේද, එකවරක්ම මේ කාමලොකයට උත්පත්ති වශයෙන් පැමිණෙන ස්වභාව ඇත්තේ සියලු සසරදුක කෙළවර කෙරේද, මහාලිය, යම්ධර්‍මයක් සාක්‍ෂාත්කිරීමපිණිස භික්‍ෂූහු මා කෙරෙහි බ්‍රහ්මචර්‍ය්‍යය කෙරෙත්ද, එසේවූ මේ අනාගාමිභාව සඞ්ඛ්‍යාතවූ ධර්‍මයද තෙල සමාධීන්ට වඩා අතිශයින් උසස් වේ. අතිශයින් ප්‍රණීතද වේ. මහාලිය, තවද අන්කරුණක් ඇත්තේය. මහණතෙමේ ඕරම්භාගීයවූ හෙවත් කාමභවය භජනයකරන්නාවූ පස්වැදෑරුම් බන්ධනයන් හාන්පසින් ක්‍ෂයකිරීමෙන් ඔපපාතික වේද හෙවත් අණ්ඩජාදි සෙසු යොනියක නූපදනා ස්වභාව ඇත්තේ වේද.

තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකා. අයම්පි ඛො මහාලි ධම්මො උත්තරිතරො ච පණීතතරො ච යස්ස සච්ඡිකිරියාහෙතු භික්ඛූ මයි බ්‍රහ්මචරියං චරන්ති. පුන ච පරං මහාලි භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. අයම්පි ඛො මහාලි ධම්මො උත්තරිතරො ච පණීතතරො ච යස්ස සච්ඡිකිරියාහෙතු භික්ඛූ මයි බ්‍රහ්මචරියං චරන්ති. ඉමෙ ඛො තෙ මහාලි ධම්මා උත්තරිතරා ච පණීතතරා ච යෙසං සච්ඡිකිරියාහෙතු භික්ඛූ මයි බ්‍රහ්මචරියං චරන්තීති.

14. අත්ථි පන භන්තෙ මග්ගො, අත්ථි පටිපදා එතෙසං ධම්මානං සච්ඡිකිරියායාති. අත්ථි ඛො මහාලි මග්ගො, අත්ථි පටිපදා එතෙසං ධම්මානං සච්ඡිකිරියායාති. කතමො පන භන්තෙ මග්ගො.

ඒ ශුද්ධාවාසබ්‍රහ්මලොකයෙහිදීම පිරිනිවන්පානාස්වභාවය ඇත්තේවේද, ඒබ්‍රහ්මලොකයෙන් නැවත පිළිසිඳගැණීම්වශයෙන්මෙහි නොඑන ස්වභාව ඇත්තේ වේද, මහාලිය, යම්ධර්මයක් සාක්‍ෂාත්කිරීම හෙතු කොටගෙණ භික්‍ෂූහු මාකෙරෙහි බ්‍රහ්මචර්‍ය්‍යය කෙරෙත්ද, එසේවූ මේ අනාගාමිභාව සඞ්ඛ්‍යාතවූ ධර්මයද තෙල සමාධින්ට වඩා අතිශයින් උසස් වේ. අතිශයින් ප්‍රණීතද වේ. මහාලිය, තවද අන්කරුණක් ඇත්තේය. මහණතෙමේ ආශ්‍රවයන් සමුච්ඡෙදප්‍රහාණයෙන් ක්‍ෂය කිරීමෙන් හෙවත් සහමුලින් වනසාලීමෙන් ආශ්‍රවරහිතවූ සියලු ක්ලෙශබන්ධනයන්ගෙන් මිදුනාවූ අර්හත්ඵලචිත්තයද, එසේමවූ අර්හත්ඵල ප්‍රඥාවද, මෙම අත්බැව්හි තෙමේම විශිෂ්ටඥානයෙන් සාක්‍ෂාත්කොට පැමිණ හෙවත් ලබාගෙණ වෙසේද, මහාලිය, යම්ධර්මයක් සාක්‍ෂාත්කිරීම හෙතුකොටගෙණ භික්‍ෂූහු මාකෙරෙහි බ්‍රහ්මචර්‍ය්‍යය කෙරෙත්ද, එසේවූ මේ අර්හත්ඵලවිමුක්ති සඞ්ඛ්‍යාතවූ ධර්මයද තෙල සමාධින්ට වඩා අතිශයින් උසස්වේ. අතිශයින් ප්‍රණීතවේ. මහාලිය, යම්ධර්මකෙනෙකුන් සාක්‍ෂාත්කිරීම හෙතුකොටගෙණ භික්‍ෂූහු මාකෙරෙහි බ්‍රහ්මචර්‍ය්‍යය කෙරෙත්ද, ඒ තෙල සමාධින්ට වඩා අතිශයින් උසස්වූද අතිශයින් ප්‍රණීතවූද ධර්මයෝ මොව්හුයයි වදාළසේක.

14. ස්වාමීන්වහන්ස, තෙල සෝවාන්ඵල ආදි ධර්මයන් ප්‍රත්‍යක්‍ෂ කරගැණීමට මාර්ගයක් ඇත්ද, පිළිපැදීමක් ඇත්දැයි ඇසීය. මහාලිය, තෙල සෝවාන්ඵල ආදි ධර්මයන් ප්‍රත්‍යක්‍ෂකිරීමපිණිස මාර්ගයක්ඇත්තේමය. පිළිපැදීමක් ඇත්මැයි වදාළසේක. ස්වාමීන්වහන්ස, තෙල ධර්මයන් ප්‍රත්‍යක්‍ෂකිරීමපිණිසවූ ඒ මාර්ගය කවරේද,

කතමාපටිපදා,එතෙසං ධම්මානං සච්ඡිකිරියායාති.අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො සෙය්‍යථිදං,සම්මාදිට්ඨිසම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි. අයං ඛො මහාලි මග්ගො, අයං පටිපදා එතෙසං ධම්මානං සච්ඡිකිරියාය.

15. එකමිදාහං මහාලි සමයං කොසම්බියං විහරාමි ඝොසිතාරාමෙ. අථ ඛො ද්වෙ පබ්බජිතා මණ්ඩිස්සො ච පරිබ්බාජකො ජාලියො ච දාරුපත්තිකන්තෙවාසී යෙනාහං තෙනුපසංකමිංසු, උපසඞ්කමිත්වා මම සද්ධිංසම්මොදිංසු,සම්මොදනීයං කථංසාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං අට්ඨංසු.එකමන්තංඨිතාඛොතෙ ද්වෙ පබ්බජිතා මං එතදවොචුං. කින්නුඛො ආවුසො ගොතම තං ජීවං තං සරීරං උදාහු අඤ්ඤං ජීවං අඤ්ඤංසරීරන්ති. තෙනහාවුසොසුණාථසාධුකංමනසිකරොථභාසිස්සාමීති. එවමාවුසොති ඛො තෙ ද්වෙ පබ්බජිතා මම පච්චස්සොසුං. අථ ඛොවාහං එතදවොචං.

ඒප්‍රතිපදාවකවරිදැයිවිචාළේය. මේආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගයමැයි.ඒනම්, සම්‍යග්දෘෂ්ටිය,සම්‍යක්සංකල්පනාය සම්‍යග්වචනය,සම්‍යක්කර්මාන්තය සම්‍යගාජීවය,සම්‍යග්ව්‍යායාමය, සම්‍යක්ස්මෘතිය, සම්‍යක්සමාධිය යන අටයි. මහාලිය, තෙල උත්තරිතරවූ ප්‍රණීතතරවූ සෝවාන්ඵල ආදි ධර්මයන්සාක්ෂාත්කරගැණීමපිණිස මේඅරිඅටඟිමඟ වූ මාර්ගයවේ.මෙයම ප්‍රතිපදාව වේ. (මෙසේ වදාරා මේ ලිච්ඡවි රජ්ජුරුවන් රූපය ආත්මය යන දෘෂ්ටිඇත්තෙක් බැවින් එය බැහැරකරණුපිණිස කාරණයක්ද ගෙණහැරදක්වනසේක් 'එකමිදාහං' යන ආදිය වදාළසේක.)

15. මහාලිය, මම එක්කාලයෙක්හි කොසඹෑනුවර සමීපයෙහිවූ ඝොසිතසිටුහු විසින් කරවා පිළිගන්වනලද ඝොසිතාරාමයෙහි වාසය කෙළෙමි. ඉක්බිත්තෙන් මණ්ඩිස්සනම් පරිබ්‍රාජකතෙමේද දඹුවෙන් කළ පාත්‍රයක් ගෙණ පිඩුසිඟායන්නාවූ පිරිවැජියෙකුගේ අතවැසියෙක් බැවින් දරුපත්තිකන්තෙවාසීයයි ප්‍රසිද්ධවූ ජාලියනම් පරිබ්‍රාජකතෙමේද යන දෙපැවිද්දෝ මම යම්තැනෙක්හිද එතැනට එළඹුනාහ, එළඹ මාහා සමග ඔබිමොබ සුවදුක් විචාරීමෙන් සමව සතුටුවූහ- සතුටුවියයුතුවූ සිහිකටයුතුවූ සුවදුක් විචාරීම් ආදීවූ කථාව කොට නිමවා එකත්පස්ව සිටියෝය. එකත්පස්ව සිටියාවූ ඒ දෙපැවිද්දෝ කිමෙක්ද ආයුෂ්මත් ගෞතමයාණෙනි, ජීවයත් හේමද, ශරීරයත් හේමද නොහොත් ජීවය අනෙකෙක්ද, ශරීරය අනෙකෙක්දැයි යන මෙය මට කීහ. හෙවත් මා විචාළාහ. ඇවැත්නි, එසේනම් අසව්. සකසා මෙනෙහිකරව්. මම් කියන්නෙමැයි වදාළෙමි. එසේය ඇවැත්නියි. ඒ දෙපැවිද්දෝ මට ප්‍රතිවචන දුන්හ. මම මෙය කීවෙමි.

16. ඉධාවුසො තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධො ...පෙ... යථා සාමඤ්ඤඵලෙ එවං විත්ථාරෙතබ්බං. එවං ඛො ආවුසො භික්ඛු සීලසම්පන්නො හොති. ...පෙ... පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති. යො නුඛො අවුසො භික්ඛු එවං ජානාති. එවං පස්සති, කල්ලං නුඛො තස්සේතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති. යො සො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති කල්ලං තස්සෙතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති. අහං ඛො පනෙතං ආවුසො එවං ජානාමි එවං පස්සාමි. අථ ච පනාහං න වදමි තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්තිවාති.

17. දුතියජ්ඣානං ...පෙ... තතියජ්ඣානං චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරති. යො ඛො ආවුසො භික්ඛු එවං ජානාති. එවං පස්සති කල්ලං නුඛො තස්සෙතං වචනාය තංජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්තිවාති.

---

16. ඇවැත්නි, අර්හත්වූ සම්‍යක්සම්බුද්ධවූ—පෙ—තථාගතයන් වහන්සේ මේ සත්ත්වලොකයෙහි උපදනාසේක්ද, (සාමඤ්ඤඵලසූත්‍රයෙහි මෙන් විස්තර කටයුතු.) ඇවැත්නි, මහණතෙමේ මෙසේ ශීල සම්පත්තියට පැමිණියේ වේද—පෙ—ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේද ඇවැත්නි, යම් මහණෙක්තෙම මෙසේ දනිද, මෙසේ දකීද, ඒ මහණහට හේම ජීවය හේම ශරිරයයි හෝ ජීවය අනෙකෙක ශරිරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට යුතුදැයි හෙවත් වටීදැයි ඇසීමි. ඇවැත්නි, යම් ඒ මහණෙක්තෙමේ මෙසේ දනිද, මෙසේ දකීද, ඔහට හේම ජීවය හේම ශරිරයයි හෝ ජීවය අනෙකෙක ශරිරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට වටීයයි ඒ දෙපැවිද්දෝ කීහ. ඇවැත්නි, මමවූකලි මෙය මෙසේ දනිමි. මෙසේ දකිමි. එතකුදු වූවත් මම හේම ජීවය හේම ශරිරයයි හෝ ජීවය අනෙකෙක ශරිරය අනෙකෙකැයි හෝ නොකියමි.

17. දෙවන ධ්‍යානයට—පෙ—තුන්වන ධ්‍යානයට, සතරවන ධ්‍යානයට පැමිණ වෙසේද. ඇවැත්නි, යම් මහණෙක් මෙසේ දනිද මෙසේ දකීද, ඒ මහණහට හේම ජීවය හේම ශරිරයයි හෝ ජීවය අනෙකෙක ශරිරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට වටීදැයි ඇසීමි.

යො සො ආවුසො භික්ඛු එවංජානාති. එවං පස්සති කල්ලං තස්සෙතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති. අහං බො පනෙතං ආවුසො එවං ජානාමි එවං පස්සාමි, අථ ච පනාහං න වදාමි තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

18. ඤාණදස්සනාය චිත්තං අභිනිහරති අභිනින්නාමෙති. යො බො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති, කල්ලං නුබො තස්සෙතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්තිවාති. යො සො ආවුසො භික්ඛු එවං ජානාති. එවං පස්සති කල්ලං තස්සෙතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්තිවාති. අහං බො පනෙතං ආවුසො එවං ජානාමි එවං පස්සාමි. අථ ච පනාහං න වදාමි තං ජීවං තං සරීරන්තිවා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

ඇවැත්නි, යම් ඒ මහණෙක්තෙම මෙසේ දනිද, මෙසේ දකිද, ඔහට හේම‍ජීවය හේමශරීරයයි හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට වටීයයි කිහ. ඇවැත්නි, මමවූකලී මෙය මෙසේ දනිමි. මෙසේ දකිමි. එතෙකුදුවූවත් මම හේමජීවය හේමශරීරයයි හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැයි හෝ නොකියමි.

18. ඥානදර්ශනය පිණිස චිදර්ශනාචිත්තය එලවා තබාද, ඥනදර්ශනයට බරව සිතනමාද, ඇවැත්නි, යම් මහණෙක්තෙමේ මෙසේ දනිද, මෙසේ දකිද, ඔහට හේමජීවය හේමශරීරයයි හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට වටීදැයි ඇසීමි. ඇවැත්නි, යම් ඒ මහණෙක්තෙම මෙසේ දනිද, මෙසේ දකිද එබදු ඥනදර්ශනඇති මහණහට හේමජීවය හේමශරීරයයි හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට නොවටීයයි කීහ. ඇවැත්නි, මමවූකලි මෙය මෙසේ දනිමි. මෙසේ දකිමි. එතෙකුදුවූවත් මම හේමජීවය හේමශරීරයි හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැයි හෝ නොකියමි.

19. නාපරං ඉත්ථත්තායාති පජානාති. යො නු ඛො ආවුසො භික්ඛු එවං ජානාති. එවං පස්සති කල්ලං නු ඛො තස්සේතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති. යො සො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති න කල්ලං තස්සේතං වචනාය තං ජීවං තං සරීරන්තිවා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති. අහං ඛො පනෙතං ආවුසො එවං ජානාමි එවං පස්සාමි. අථ ච පනාහං න වදාමි තං ජීවංතං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්තිවාති. ඉදමවොච භගවා අත්තමනො ඔට්ඨද්ධො ලිච්ඡවි භගවතො භාසිතං අභිනන්දීති.

මහාලිසුත්තං නිට්ඨිතං

ඡට්ඨං.

---

19. මේ ක්ලෙශක්ෂයපිණිස අන්‍යවූ මාර්ග භාවනාකෘත්‍යයෙක් නැතැයි දනිද, ඇවැත්නි, යම් මහණෙක්තෙම මෙසේ දනිද, මෙසේ දකිද, එබඳුවූ ප්‍රත්‍යවේක්ෂාඥානයෙන් දක්නාවූ රහත් මහණහට හේමජීවය හේමශරීරයයි හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට වටීදැයි ඇසීම්. ඇවැත්නි, යම් ඒ මහණකෙනෙක්තෙම මෙසේ දනිද, මෙසේ දකිද, ඒ රහත් මහණහට හේමජීවය හේමශරීරයයි හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට නොවටීයයි කීහ. ඇවැත්නි, මමවූ කලි මෙය මෙසේ දනිමි. මෙසේ දකිමි. එතෙකුදුවුවත් මම හේම ජීවය හේමශරීරයයි හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැයි හෝ නොකියමි. භාග්‍යවතුන්වහන්සේ මේ සූත්‍රධර්මය වදාළසේක. මෙසින් සතුටුසිත් ඇත්තාවූ ඔට්ඨද්ධයයි ප්‍රසිද්ධවූ මහාලි ලිච්ඡවිරජතෙමේ භාග්‍යවතුන්වහන්සේගේ දෙශනාව සතුටින් පිළිගත්තේය.

සවෙනිවූ මහාලිසූත්‍රාර්ථව්‍යාඛ්‍යාව නිමියේයි.

VII ජාලියසුත්තං.

——○⁑○——

1. එවං මෙ සුතං. එකං සමයං භගවා කොසම්බියං විහරති ඝොසිතාරාමෙ. තෙනඛොපනසමයෙන ද්වෙපබ්බජිතාමණ්ඩිස්සොචපරිබ්බාජකොජාලියොචදාරුපත්තිකන්තෙවාසියෙනභගවා තෙනුපසංකමිංසු. උපසංකමිත්වා භගවතා සද්ධිං සම්මොදිංසු, සම්මොදනීයංකථංසාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං අට්ඨංසු. එකමන්තං ඨිතා ඛො තෙ ද්වෙ පබ්බජිතාභගවන්තංඑතදවොචුං. කිංනුඛොආවුසොගොතමතංජීවංතංසරීරං උදාහු අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති. තෙනහාවුසො සුණාථ සාධුකං මනසිකරොථ භාසිස්සාමීති. එවමාවුසොති ඛො තෙ ද්වෙ පබ්බජිතා භගවතො පච්චස්සොසුං භගවා එතදවොච.

2. ඉධාවුසො තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධො ......පෙ...... යථා සාමඤ්ඤඵලෙ එවං විත්ථාරෙතබ්බං. එවං ඛො ආවුසො භික්ඛු සීලසම්පන්නො හොති ......පෙ......

ජාලියසූත්‍රාර්ථව්‍යාඛ්‍යා.

——○⁑○——

1. මේ සූත්‍රධර්මය මාවිසින් මෙසේ අසනලදී. එක්කාලයෙක්හි භාග්‍යවතුන්වහන්සේ කොසඹෑනුවර ඝොෂිතසිටානන්විසින් කරවා පිළිගන්වනලද ආරාමයෙහි වාසයකරණසේක. ඒකාලයෙහිදී මණ්ඩිස්සනම් පරිබ්‍රාජකතෙමේද දඹුවෙන් කළ පාත්‍රයක් ගෙණ පිඬුසිඟා යන්නාවූපිරිවැජියෙකුගේඅතවැසිවූහෙයින්දාරුපත්තිකන්තෙවාසියයි ප්‍රසිද්ධවූ ජාලියනම් පරිබ්‍රාජකතෙමේද යන දෙපැවිද්දෝ භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එතනට එළඹියාහුය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටුවූහ. සතුටුවියයුතුවූ සිහිකටයුතුවූ කථාව කොට නිමවා එකත්පසෙක සිටියාහුය. එකත්පසෙකසිටියාවූ ඒ දෙපැවිද්දෝ භාග්‍යවතුන්වහන්සේට මේ කාරණය සැලකළාහුය. කිමෙක්ද ආයුෂ්මත් ගෞතමයානෙනි, ජීවයත් හේමද ශරීරයත් හේමද නොහොත් ජීවය අනෙකෙක්ද ශරීරයඅනෙකෙක්දැයි කියායි. ඇවැත්නි, එහෙනම් අසව්. මනාකොට මෙනෙහිකරව්. කියන්නෙමියි වදාළෝ. ආයුෂ්මත, එසේයයි ඒ දෙපැවිද්දෝ භාග්‍යවතුන්වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන්වහන්සේ මේ ධර්මය වදාළසේක.

2. ඇවැත්නි, අර්හත්වූ සම්‍යක්සම්බුද්ධවූ—පෙ—තථාගතයන් වහන්සේ මේ සත්වලොකයෙහි උපදනාසේක්ද, (සාමඤ්ඤඵලසූත්‍රයෙහි මෙන් විස්තර කටයුතු.) ඇවැත්නි, මහණතෙමේ මෙසේ ශීල සම්පත්තියට පැමිණියේ වේද සෙස්සකීනතින් දතයුතු.

පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති. යො නු බො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති, කල්ලං නු බො තස්සෙව තං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති. සො එසා ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති, කල්ලං නු බො තස්සෙව තං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති. අහං බො පනෙතං ආවුසො එවං ජානාමි එවං පස්සාමි, අථ ච පනාහං න වදාමි තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

3. දුතියජ්ඣානං—පෙ—තතියජ්ඣානං චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරති. යො නු බො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති, කල්ලං නු බො තස්සෙව තං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති. යො සො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති, කල්ලං තස්සෙව තං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති. අහං බො පනෙතං ආවුසො එවං ජානාමි එවං පස්සාමි. අථ ච පනාහං න වදාමි තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

ප්‍රථමධ්‍යානයටපැමිණ වෙසේද ඇවැත්නි, යම් මහණෙක්තෙම මෙසේ දනිද, මෙසේ දකීද, ඒමහණහට හේමජීවය හේමශරීරයයි හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැයිහෝයන මෙය කියන්නට යුතුදැයි හෙවත් වටීදැයි ඇසීමි. ඇවැත්නි, යම් ඒ මහණෙක්තෙමේ මෙසේ දනිද, මෙසේ දකිද, ඕහටහේමජීවය හේමශරීරයයි හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට වටියයි ඒ දෙපැවිද්දෝ කීහ. ඇවැත්නි, මමවූකලී මෙය මෙසේ දනිමි. මෙසේ දකිමි. එතෙකුදුවුවත් මම හේමජීවය හේමශරීරයයි හෝ ජීවය අනෙකෙක ශරීරයඅනෙකෙකැයි හෝ නොකියමි.

3. දෙවන ධ්‍යානයට—පෙ—තුන්වන ධ්‍යානයට, සතරවන ධ්‍යානයට පැමිණ වෙසේද. ඇවැත්නි, යම් මහණෙක් මෙසේ දනිද, මෙසේ දකීද, ඒ මහණහට හේම ජීවය හේමශරීරයයි හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට වටීදැයි ඇසීමි. ඇවැත්නි, යම් ඒ මහණෙක්තෙම මෙසේ දනිද, මෙසේ දකීද, ඕහට හේමජීවය හේමශරීරයයි හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට වටීදැයි කීහ. ඇවැත්නි, මමවූකලි මෙය මෙසේ දනිමි. මෙසේ දකිමි. එතෙකුදුවුවත් මම හේමජීවය හේමශරීරයයි හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැයි හෝ නොකියමි.

4. ඤාණදස්සනාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො නු බො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති, කල්ලන්නු බො තස්සෙතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති. යො සො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති, කල්ලන්නු බො තස්සෙතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්තිවාති. අහං බො පනෙතං ආවුසො එවං ජානාමි එවං පස්සාමි, අථ ච පනාහං න වදාමි තං ජීවං තං සරීරන්තිවා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්තිවාති.

5. නාපරං ඉත්ථත්තායාති පජානාති යො නුබො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති කල්ලන්නු බො තස්සෙතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

---

4. ඥානදර්ශනයපිණිස විදර්ශනා චිත්තය එලවා තබාද, ඥාන දර්ශනයට බරව සිත නමාද. ඇවැත්නි, යම් මහණෙක්තෙමේ මෙසේ දනීද, මෙසේ දකීද, ඕහට හේමජීවය හේමශරීරයයි හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට වටීදැයි ඇසීමි. ඇවැත්නි, යම් ඒ මහණෙක්තෙම මෙසේ දනීද, මෙසේ දකීද, එබඳු ඥානදර්ශනඇති මහණහට හේමජීවය හේමශරීරයයි හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට නොවටීයයි කීහ. ඇවැත්නි, මමවූකලි මෙය මෙසේ දනිමි. මෙසේ දකිමි. එතෙකුදුවුවත් මම හේම ජීවය හේමශරීරයයි හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැයි හෝ නොකියමි.

5. මේ ක්ලෙශක්ෂයපිණිස අන්‍යවූ මාර්ගභාවනා කෘත්‍යයෙක් නැතැයි දනීද. ඇවැත්නි, යම් මහණෙක්තෙම මෙසේ දනීද, මෙසේ දකීද, එබඳුවූ ප්‍රත්‍යවෙක්ෂාඥානයෙන් දක්නාවූ රහත් මහණහට හේමජීවය හේමශරීරයයි හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට වටීදැයි ඇසීමි.

යො සො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති, න කල්ලං තස්සෙතංවචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති. අහං බො පනෙතං ආවුසො එවං ජානාමි එවං පස්සාමි, අථ ච පනාහං න වදාමි තං ජීවං තං සරීරන්තිවා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති. ඉදමවොච භගවා. අත්තමනා තෙ ච පබ්බජිතා භගවතො භාසිතං අභිනන්දුන්ති.

ජාලියසුත්තං නිට්ඨිතං සත්තමං.

ඇවැත්නි, යම් ඒ මහණකෙනෙක්තෙම මෙසේ දනීද, මෙසේ දකීද, ඒ රහත් මහණහට හේමජීවය හේමශරීරයයි හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට නොවටීයයි කීහ. ඇවැත්නි, මමවූකලි මෙය මෙසේ දනිමි. මෙසේ දකිමි. එතෙකුදු වුවත් මම හේමජීවය හේමශරීරයයි හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැයි හෝ නොකියමි.භාග්‍යවතුන්වහන්සේ මේ සූත්‍රධර්මය වදාළසේක සතුටුසිත්ඇත්තාවූඒපැවිද්දෝදෙදෙනභාග්‍යවතුන්වහන් සේගේ ධර්මදෙශනාව සතුටින් පිළිගත්හ.

සත්වෙනිවූ ජාලියසූත්‍රාර්ථව්‍යාඛ්‍යාව නිමියේයි.

VIII කස්සපසීහනාදසුත්තං.

1. එවං මෙ සුතං.එකං සමයං භගවා උජුඤ්ඤායං විහරති කණ්ණකත්ථලෙ මිගදායෙ. අථ ඛො අචෙලො කස්සපො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි, සම්මොදනියං කථං සාරාණියං වීතිසාරෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො අචෙලො කස්සපො භගවන්තං එතදවොච.

2. සුතං මෙතං භො ගොතම. සමණො ගොතමො සබ්බං තපං ගරහති, සබ්බං තපස්සිං ලූඛාජීවිං එකංසෙන උපක්කොසති උපවදතීති. යෙ තෙ භො ගොතම එවමාහංසු. සමණො ගොතමො සබ්බං තපං ගරහති, සබ්බං තපස්සිං ලූඛාජීවිං එකංසෙන උපක්කොසති උපවදතීති, කච්චි තෙ භොතො ගොතමස්ස වුත්තවාදිනො.

කාශ්‍යපසිංහනාදසූත්‍රාර්ථව්‍යාඛ්‍යා.

1. මේ සූත්‍රධර්මය මා විසින් මෙසේ අසනලදි. එක් කාලයෙක්හි භාග්‍යවතුන්වහන්සේ උජුඤ්ඤනම් නුවර සමීපයෙහිවූ මෘගයන්ට අභයපිණිස දෙනලද හෙයින් මිගදායනම්වූ කණ්ණකත්ථලනම් රමණීය භූමිභාගයෙහි වැඩවසනසේක. එකල්හිදී අචෙලපරිව්‍රාජක කාශ්‍යප තෙමේ භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙක්හිද එතනට එළඹියේය. එළඹ භාග්‍යවතුන්වහන්සේ සමග සතුටුවූයේය. සතුටුවියයුතුවූ සිහිකටයුතුවූ කථාවකොට නිමවා එකත්පසෙක සිටියේය. එකත් පසෙකසිටියාවූ අචෙලපරිව්‍රාජක කාශ්‍යපතෙමේ භාග්‍යවතුන්වහන් සේට මේ වචනය සැලකළේය.

2. පින්වත් ගෞතමය, ගොයුම්ගොත් මහණතෙමේ සියලු තපසට ගරහයි,අචෙලක මුත්තාචාරාදිවශයෙන් රූක්ෂාජීව වෘත්තිඇති සියලු තපස්විහට එකාන්තයෙන් හෙළාදකියි හෙවත් පරිභවකෙරෙයි. අවඥපූර්වක අපවාද කෙරෙයි. යන මේකාරණය මා විසින් අසන ලද්දේය. පින්වත් ගෞතමය ගොයුම්ගොත් මහණතෙමේ සියලු තපසට ගරහයි. අචෙලකමුත්තාචාරාදිවශයෙන් රූක්ෂාජීව වෘත්ති ඇති සියලු තපස්විහට එකාන්තයෙන් හෙළාදකියි හෙවත් පරිභව කෙරෙයි අවඥපූර්වක අපවාද කෙරේයයි යම් ඒ කෙනෙක් මෙසේ කීවෝද, කිමෙක්ද, ඔව්හු පින්වත් ගෞතමයන්විසින් කියනලද් දක් කියත්තෝද.

න ච භගවන්තං ගොතමං අභූතෙන අබ්භාචික්ඛන්ති, ධම්මස්සචානු ධම්මං ව්‍යාකරොන්ති,න ච කොචි සහධම්මිකො වාදානුවාදො ගාරය්හං ඨානං ආගච්ඡති, අනබ්භක්ඛාතුකාමාහි මයං භගවන්තං ගොතමන්ති.

3. යෙ තෙ කස්සප එවමාහංසු සමණො ගොතමො සබ්බං තපං ගරහති, සබ්බං තපස්සිං ලූඛාජීවිං එකංසෙන උපක්කොසති උපවදතීති. න මෙ තෙ වුත්තවාදිනො, අබ්භාචික්ඛන්ති ච පන මන්තෙ අසතා අභූතෙන. ඉධාහං කස්සප එකච්චං තපස්සිං ලූඛාජීවිං පස්සාමි, දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන-පෙ-කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නං. ඉධ පනාහං කස්සප එකච්චං තපස්සිං ලූඛාජීවිං පස්සාමි දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන-පෙ-කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උප්පන්නං

නැතහොත් පින්වත් ගෞතමයාහට නැතිනූපන් බොරුවෙන් අභිභවනය කොට නිඃශුවශයෙන් කියත්නෝද, පින්වත් ගෞතමයන් විසින් කියනලද කාරණයට අනුව කරුණු කියද්ද, නැතහොත් කරුණුසහිතවූ කිසියම් වාදානුවාදයෙක් අන්‍යයන් කියනලද කාරණයෙන් කාරණා සහිතවූ නුවනැත්තන්විසින් ගැරහියයුතු කරුණකට ස්වල්පමාත්‍රයකුදු නොපැමිණේද, අපි පින්වත් ගෞතමයා හට බොරුවෙන් අභිභවනයකොට නොකියනු කැමැත්තෝමය.

3· කාශ්‍යපය, ගොයුම්ගොත්මහණතෙමේ සියලු තපසට ගරහයි අචෙලකමුත්තාචාරාදිවශයෙන් රූක්ෂාජීව වෘත්ති ඇති සියලු තපස්වීහට එකාන්තයෙන් උග්‍රභාෂ්‍යවශයෙන් පරිභව කෙරෙයි. අවඥපූර්වක අපවාද කෙරේයයි යම් ඒ කෙනෙක් මෙසේ කීවෝද, ඔව්හු මාකීවක් කියන්නෝ නොවෙත්.ඔව්හු මට නැති නූපන් බොරුවෙන් අභිභවනය කොට කියන්නෝ වෙත්. කාශ්‍යපය, මම මේ ලොකයෙහි තණගොම අනුභව කිරීම්ආදී රූක්ෂාජීවවෘත්තිඇති අචෙලකතාදී තපොධර්මනිශ්‍රිත බැවින්තපස්වීවූ කිසිවෙකු කාබුන්මරණින්මතු සැපයෙන් පහවූ දුකටපිහිටවූ විවසවපතිතවන්නාවූ නරකයෙහි උපන්නා මිනිසැස ඉක්මපවත්නාවූ පිරිසිදුවූ දිවැසින් දකිමි. කාශ්‍යපය, මම මේ ලොකයෙහි තණගොම අනුභවකිරීම් ආදී රූක්ෂාජීවිකා ඇතිඅචෙලකතාදිතපොධර්මනිශ්‍රිතබැවින් තපස්වීවූ කිසිවෙකු කාබුන් මරණින්මතු යහපත්ගති ඇත්තාවූ ස්වර්ගලොකයෙහි උපන්නා මිනිසැසඉක්ම පවත්නාවූ පිරිසිදුවූ දිවැසින් දකිමි.

ඉධාහං කස්සප එකච්චං තපස්සිං අප්පදුක්ඛවිහාරිං පස්සාමි දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන—පෙ—කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නං. ඉධ පනාහං කස්සප එකච්චං තපස්සිං අප්පදුක්ඛවිහාරිං පස්සාමි දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන—පෙ—කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නං. සොහං කස්සප ඉමෙසං තපස්සීනං එවං ආගතිඤ්ච ගතිඤ්ච චුතිඤ්ච උපපත්තිඤ්ච යථාභූතං පජානාමි, සොහං කිං සබ්බං තපං ගරහිස්සාමි, සබ්බං තපස්සිං ලූඛාජීවිං එකංසෙන උපක්කොසිස්සාමි උපවදිස්සාමි.

4. සන්ති කස්සප එකෙ සමණබ්‍රාහ්මණා පණ්ඩිතා නිපුණා කතපරප්පවාදා වාලවෙධිරූපා වොභින්දන්තා මඤ්ඤෙ චරන්ති පඤ්ඤාගතෙන දිට්ඨිගතානි තෙහි පි මෙ සද්ධිං එකච්චෙසු ඨානෙසු සමෙති, එකච්චෙසු ඨානෙසු න සමෙති. යනෙත එකච්චං වදෙන්ති සාධූති මයම්පි තං එකච්චං වදෙම සාධූති. යනෙත එකච්චං වදෙන්ති න සාධූති.

කාශ්‍යපය, මම මේ ලොකයෙහි තීව්‍රිකාචාරයෙන් යුක්තවූ හෝ ජිනනපරිව්‍රාජකවූ හෝ සවල්පවූ දුඃඛ විහරණඇති කිසිතපස්වියකු කාබුන් මරණින්මතු සැපයෙන් පහවූ දුකටපිහිටවූ ව්‍යශවපතිතවත්නාවූ නරකයෙහි උපන්නා මිනිසැස ඉක්මපවත්නාවූ පිරිසිදුවූ දිවැසින් දකිමි. කාශ්‍යපය, මම මේ ලොකයෙහි තීව්‍රිකාචාරයෙන් යුක්තවූ හෝ ජිනනපරිව්‍රාජකවූ හෝ සවල්පදුඃඛ විහරණඇති කිසිතපස් වියෙකු කාබුන්මරණින්මතු යහපත්ගතිඇති සවගිලොකයෙහි උපන්නහු මිනිසැසඉක්මපවත්නාවූ පිරිසිදුවූ දිවැසින් දකිමි. කාශ්‍යපය, යම්බඳුවූ මම මෙසේ මේ තපස්වීන්ගේ මතුජතියෙන් මේ ජාතියට පැමිණීමද, දූත් මෙයින් යායුතුතැනද, එයින් චුතවීමද එයින් චුතවූවන්ගේ නැවත ඉපදීමද තත්වූපරිද්දෙන් දනිම්ද, ඒ මම කුමට සියලු තපසට ගරහන්නෙම්ද, අවෙලක මූත්‍රනාචාරාදිවශයෙන් රූක්ෂාජීව වෘත්තිඇති සියලු තපස්විහට එකාන්තයෙන් උග්‍රහාස්‍යවශයෙන් කුමකට පරිභව කරන්නෙම්ද, කුමකට නින්‍දා පූර්වක අවඥකෙරෙම්ද.

4. කාශ්‍යපය,පණ්ඩිතවූ සූක්ෂ්මබුද්ධිඇත්තාවූ මෙරමා සමග කරණලද වාදඇත්තාවූ වාලවෙධි ධනුර්ධරයන්වැනිවූ සමහර මහණබමුණෝ වෙත්ද, ඔව්හු තමන්ගේ ප්‍රඥායෙන් අන්‍යයන්ගේ මිථ්‍යාලබ්ධීන් බිඳින්නාවුන්මෙන් හැසිරෙත්. සමහර කාරණයන්හි මාගේ ධර්‍මය ඔවුන්ගේ ධර්‍මය හාද සමවෙයි. සමහර කාරණයන්හි සම නොවෙයි. ඔව්හු යම් සමහර ධර්‍ම මැනවැයි කියත්ද, අපිදු ඒ සමහර ධර්‍ම මැනවැයි කියම්හ. ඔව්හු යම් සමහර ධර්‍ම නොමැනවැයි කියත්ද.

මයම්පි තං එකච්චං වදෙම න සාධූති. යනෙන එකච්චං වදෙ න්ති සාධූති, මයං තං එකච්චං වදෙම න සාධූති. යනෙන එකච්චං වදෙන්ති න සාධූති, මයං තං එකච්චං වදෙම සාධූති. යං මයං එකච්චං වදෙම සාධූති, පරෙපි තං එකච්චං වදන්ති සාධූති. යං මයං එකච්චං වදෙම න සාධූති, පරෙපි තං එකච්චං වදෙන්ති න සාධූති. යං මයං එකච්චං වදෙම සාධූති, පරෙපි තං එකච්චං වදෙන්ති න සා සාධූති. යං මයං එකච්චං වදෙම න සාධූති, පරෙපි තං එකච්චං වදෙන්ති සාධූති.

5. ත්‍යාහං උපසංකමිත්වා එවං වදාමි. යෙසු නො ආවුසො ඨා නෙසු න සමෙති, තිඪන්තු තානි ඨානානි. යෙසු ඨානෙසු සමෙති, තත්‍ථ විඤ්ඤූ සමනුයුඤ්ජන්තං සමනුගාහන්තං සමනුභාසන්තං සත්‍ථාරා වා සත්‍ථාරං සඞ්ඝෙන වා සඞ්ඝං යෙ ඉමෙසං භවතං ධම්මා අකු සලා අකුසලසංඛාතා, සාවජ්ජා සාවජ්ජසංඛාතා අසෙවිතබ්බා අසෙවි තබ්බසංඛාතා නාලමරියා නාලමරියසංඛාතා කණ්හා කණ්හසංඛා තා, කො ඉමෙ ධම්මෙ අනවසෙසං පහාය වත්තති, සමණො වා ගොතමො පරෙ, වා පන භොනො ගණාචරියාති.

අපිදු ඒ සමහර ධර්‍ම නොමැනවැයි කියම්හ. ඔව්හු යම් සමහර ධර්‍ම මැනවැයි කියත්ද, අපි ඒ සමහර ධර්‍ම නොමැනවැයි කියම්හ. ඔව්හු යම් සමහර ධර්‍ම නොමැනවැයි කියත්ද, අපි ඒ සමහර ධර්‍ම මැනවැයි කියම්හ. අපි යම් සමහර ධර්‍ම මැනවැයි කියම්ද, අන්‍යයෝද, ඒ සම හර ධර්‍ම මැනවැයි කියත්. අපි යම් සමහර ධර්‍ම නොමැනවැයි කියම්ද, අන්‍යයෝද, ඒ සමහර ධර්‍ම නොමැනවැයි කියත්. අපි යම් සමහර ධර්‍ම මැනවැයි කියම්ද, අන්‍යයෝ ඒ සමහර ධර්‍ම නොමැන වැයි කියත්. අපි යම් සමහර ධර්‍ම නොමැනවැයි කියම්ද, අන්‍යයෝ ඒ සමහර ධර්‍ම මැනවැයි කියත්.

5. මම ඔවුන් කරා එළඹ මෙසේ කියමි ඇවැත්නි, යම් කාරණ යන්හි අපේ ධර්‍මය සම නොවේද, ඒ කාරණයෝ නවතිත්වා. යම් කාරණයන්හි සමවේද, එහි මේ පින්වතුන්ගේ යම් ධර්‍මකෙනෙක් අකුසල්හුද, අකුසල්හුයයි වෙන්කොට තබනලද්දාහුද සාවද්‍යයෝද, සාවද්‍යයෝයයි වෙන්කොට තබනලද්දාහුද, සෙවනය නොකට යුත්තෝද, සේවනය නොකට යුත්තෝයයි වෙන්කොට තබන ලද්දාහුද ආර්‍ය්‍යකරණයට නොපොහොසත්හුද, ආර්‍ය්‍යකරණයට නොපොහොසත්හුයයි වෙන්කොට තබනලද්දාහුද, කෘෂ්ණධර්‍මයෝද කෘෂ්ණධර්‍මයෝයයි වෙන්කොට තබනලද්දාහුද, කවරෙක් මේ ධර්‍ම යන් නිරවශෙෂව දුරුකොට පවතීද. ගෞතම ශ්‍රමණ හෝ වේද. අන්‍යවූ පින්වත් ගණාචාර්‍ය්‍යයෝ හෝ වෙත්දැයි මෙසේ නුවණැත්තෝ (පින්වත් අන්‍ය ගණාචාර්‍ය්‍ය) ශාස්තෘවරයකු සමග ලා ගෞතම ශාස්තෘවරයා හෝ පින්වත් අන්‍ය ගණාචාර්‍ය්‍ය ශ්‍රාවක සඞ්ඝයා සමග ලා ගෞතම ශ්‍රාවක සඞ්ඝයාගේ ලබ්ධිය විචාරත්වා. කරුණු විචා රත්වා. ලබ්ධිය හා කරුණුද විචාරත්වායි.

6. ඨානං ඛො පනෙතං කස්සප විජ්ජති යං විඤ්ඤූ සමනුයුඤ්ජන්තා සමනුගාහන්තා සමනුභාසන්තා එවං වදෙය්‍යුං. යෙ ඉමෙසං භවතං ධම්මා අකුසලා අකුසලසංඛාතා සාවජ්ජා සාවජ්ජසංඛාතා අසෙවිතබ්බා අසෙවිතබ්බසංඛාතා නාලමරියා නාලමරියසංඛාතා කණ්හා කණ්හසංඛාතා, සමණො ගොතමො ඉමෙ ධම්මෙ අනවසෙසං පහාය වත්තති,යං වා පනභොන්තො පරෙ ගණාචරියාති.ඉතිහ කස්සප විඤ්ඤූ සමනුයුඤ්ජන්තා සමනුගාහන්තා සමනුභාසන්තා අම්හෙව තත්ථ යෙභුය්‍යෙන පසංසෙය්‍යුං.

7. අපරම්පි නො කස්සපවිඤ්ඤූසමනුයුඤ්ජන්තා සමනුගාහන්තා සමනුභාසන්තා සත්ථාරා සත්ථාරං සඞ්ඝෙනවා සඞ්ඝං. යෙ ඉමෙසං භවතං ධම්මා කුසලා කුසලසංඛාතා අනවජ්ජා අනවජ්ජසංඛාතා සෙවිතබ්බා සෙවිතබ්බසංඛාතා.

---

6. කාශ්‍යපය, නුවණැත්තෝ ලබ්ධිය විචාරන්නාහු කරුණු විචාරන්නාහු ලබ්ධිය හා කරුණුද විචාරන්නාහු මේ භවතුන්ගේ යම් ධර්මකෙනෙක් අකුසල්හුද, අකුසල්හුයයි වෙන්කොට තබනලද්දාහුද, සාවද්‍යයෝද, සාවද්‍යයෝයයි වෙන්කොට තබනලද්දාහුද, සෙවනය නොකටයුත්තෝද, සෙවනයනොකටයුත්තෝයයි වෙන්කොට තබන ලද්දාහුද, ආර්‍ය්‍යකරණයට නොපොහොසත්හුද, ආර්‍ය්‍යකරණයට නොපොහොසත්යයි වෙන්කොට තබනලද්දාහුද, කෘෂ්ණධර්මයෝද කෘෂ්ණධර්මයෝයයි වෙන්කොට තබනලද්දාහුද, ගෞතම ශ්‍රමණතෙම මේ ධර්මයන් නිරවශෙෂව දුරුකොට පවතී. පින්වත්වූ අන්‍ය ගණාචාර්‍ය්‍යයෝ ස්වල්පමාත්‍රයක් දුරුකොට පවතිත්යයි මෙසේ කියන්නාහුය යන යම්කාරණයෙක් ඇද්ද, මේ කාරණය වනාහි විද්‍යමාන වේමය. කාශ්‍යපය, මෙසේ නුවණැත්තෝ ලබ්ධිය විචාරන්නාහු කරුණු විචාරන්නාහු ලබ්ධිය හා කරුණුද විචාරන්නාහු අපටම ඒ කාරණයෙහි බෙහෙවින් පසසන්නෝය.

7. කාශ්‍යපය, අනිකෙක්ද ඇත. නුවණැත්තෝ (ඒ පින්වත් අන්‍ය ගණාචාර්‍ය්‍ය ශාස්තෲවරයකු සමගලා ගෞතම ශාස්තෲවරයා හෝ පින්වත් අන්‍ය ගණාචාර්‍ය්‍ය ශ්‍රාවක සඞ්ඝයා සමග ලා ගෞතම ශ්‍රාවක සඞ්ඝයා හෝ අප ලබ්ධිය විචාරත්වා. කරුණු විචාරත්වා. ලබ්ධිය හා කරුණුද විචාරත්වා. මේ භවතුන්ගේයම් ධර්මකෙනෙක් කුසල්හුද, කුසල්හුයයි වෙන්කොටතබනලද්දාහුද,අනවද්‍යයෝද, අනවද්‍යයෝයයි වෙන්කොට තබනලද්දාහුද, සෙවනයකටයුත්තෝද, සෙවනය කටයුත්තෝයයි වෙන්කොට තබනලද්දාහුද.

අලමරියා අලමරියසංඛාතා සුක්කා සුක්කසංඛාතා, කො ඉමෙ ධම්මෙ අනවසෙසං සමාදාය වත්තති සමණො වා ගොතමො, පරෙ වා පන භොන්තො ගණාචරියාති.

8. ඨානං ඛො පනෙතං කස්සප විජ්ජති යං විඤ්ඤූ සමනුයුඤ්ජන්තා සමනුගාහන්තා සමනුභාසන්තා එවං වදෙය්‍යුං. යෙ ඉමෙසං භවතං ධම්මා කුසලා කුසලසංඛාතා අනවජ්ජා අනවජ්ජසංඛාතා සෙවිතබ්බා සෙවිතබ්බසංඛාතා අලමරියා අලමරියසංඛාතා සුක්කා සුක්කසංඛාතා, සමණො ගොතමො ඉමෙ ධම්මෙ අනවසෙසං සමාදාය වත්තති. යං වා පන භොන්තො පරෙ ගණාචරියාති. ඉතිහ කස්සප විඤ්ඤූ සමනුයුඤ්ජන්තා සමනුගාහන්තා සමනුභාසන්තා අම්හාකං තත්‍ථ යෙ භුය්‍යෙන පසංසෙය්‍යුං.

ආය්‍ය්‍යීකරණයට පොහොසත්හුද, ආය්‍ය්‍යීකරණයට පොහොසත්හුයයි වෙන්කොට තබනලද්දහුද, ශුක්ලධර්‍මයෝද, ශුක්ලධර්‍මයෝයයි වෙන්කොට තබනලද්දහුද, කවරෙක් මේ ධර්‍මයන් නිරවශෙෂයෙන් සමාදන්ව පවතිද. ගෞතම ශ්‍රමණහෝ වේද, පින්වත්වූ අන්‍ය ගණාචාය්‍ය්‍යීයෝ හෝ වෙත්දැයි.

8. කාශ්‍යපය, නුවණැත්තෝ ලබ්ධිය විචාරන්නාහු කරුණු විචාරන්නාහු ලබ්ධිය හා කරුණුද විචාරන්නාහු මේ පින්වතුන්ගේ යම් ධර්‍මකෙනෙක් කුසල්හුද, කුසල්හුයයි වෙන්කොට තබන ලද්දහුද, අනවද්‍යයෝද, අනවද්‍යයෝයයි වෙන්කොට තබන ලද්දහුද, සෙවනය කටයුත්තෝද, සෙවනය කටයුත්තෝයයි වෙන් කොට තබනලද්දහුද, ආය්‍ය්‍යීකරණයට පොහොසත්හුද, ආය්‍ය්‍යීකරණයට පොහොසත්හුයයි වෙන්කොට තබනලද්දහුද, ශුක්ලධර්‍මයෝද, ශුක්ලධර්‍මයෝයයි වෙන්කොට තබනලද්දහුද, ගෞතම ශ්‍රමණතෙම මේ ධර්‍මයන් නිරවශෙෂයෙන් සමාදන්ව පවතී. පින්වත්වූ අන්‍යගණාචාය්‍ය්‍යීයෝ තුමූ ස්වල්පමාත්‍රයක් සමාදන්ව පවතිත්යයි මෙසේ කියන්නාහුය යන යම්කාරණයෙක් ඇද්ද, මේ කාරණය වනාහි විද්‍යමාන වේමය. කාශ්‍යපය, මෙසේ මේ කාරණයෙහි නුවණැත්තෝ ලබ්ධිය විචාරන්නාහු කරුණු විචාරන්නාහු ලබ්ධිය හා කරුණුද විචාරන්නාහු ඒකාරණයෙහි අපට බෙහෙවින් පසසන්නෝය.

9. අපරම්පි නො කස්සප විඤ්ඤූ සමනුයුඤ්ජන්තා සමනුගාහන්තා සමනුභාසන්තා සත්ථාරා වා සත්ථාරං සඞ්ඝෙන වා සඞ්ඝං, යෙ ඉමෙසං භවතං ධම්මා අකුසලා අකුසලසංඛාතා සාවජ්ජා සාවජ්ජසංඛාතා අසෙවිතබ්බා අසෙවිතබ්බසංඛාතා නාලමරියා නාලමරියසංඛාතා කණ්හා කණ්හසංඛාතා. කො ඉමෙ ධම්මෙ අනවසෙසම්පහාය වත්තති, ගොතමසාවකසඞ්ඝො වා, පරෙ වා පන භොන්තො ගණාචරියසාවකසඞ්ඝාති.

10. ඨානං ඛො පනෙතං කස්සප විජ්ජති යං විඤ්ඤූ, සමනුයුඤ්ජන්තා සමනුගාහන්තා සමනුභාසන්තා එවං වදෙය්‍යුං. යෙ ඉමෙසං භවතං ධම්මා අකුසලා අකුසලසංඛාතා සාවජ්ජා සාවජ්ජසංඛාතා අසෙවිතබ්බා අසෙවිතබ්බසංඛාතා නාලමරියා න ලමරියසංඛාතා.

---

9. කාශ්‍යපය, අනිකෙක්ද ඇත, නුවනැත්තෝ මේ භවතුන්ගේ යම් ධර්මකෙනෙක් අකුසල්හුද, අකුසල්හුයයි වෙන්කොට තබනලද්දාහුද සාවද්‍යයෝද, සාවද්‍යයෝයයි වෙන්කොට තබනලද්දාහුද, සෙවනය නොකටයුත්තෝද, සෙවනය නොකටයුත්තෝයයි වෙන්කොට තබනලද්දාහුද, ආර්‍ය්‍යකරණයට නොපොහොසත්හුද, ආර්‍ය්‍යකරණයට නොපොහොසත්හුයයි වෙන්කොට තබනලද්දාහුද, කෘෂ්ණධර්මයෝද, කෘෂ්ණධර්මයෝයයි වෙන්කොට තබනලද්දාහුද, කවරෙක් මේ ධර්මයන් නිරවශෙෂව දුරුකොට පවත්නේද ගෞතමශ්‍රාවකසඞ්ඝයා හෝ වේද, පින්වත්වූ අන්‍යගණාචාර්‍ය්‍ය ශ්‍රාවකසඞ්ඝයා හෝ වේදැයි පින්වත් අන්‍යගණාචාර්‍ය්‍ය ශාස්තෘවරයෙකු සමගලා ගෞතමශාස්තෘවරයාද, පින්වත් අන්‍ය ගණාචාර්‍ය්‍ය ශ්‍රාවකසඞ්ඝයා සමගලා ගෞතමශ්‍රාවකසඞ්ඝයාදැයි අප ලබ්ධිය විචාරත්වා කරුණු විචාරත්වා ලබ්ධිය හා කරුණු ආදිය විචාරත්වා.

10. කාශ්‍යපය, මේ කාරණය ඇත්තේය. යම්හෙයකින් නුවනැත්තෝ ලබ්ධිය විචාරන්නාහු කරුණු විචාරන්නාහු ලබ්ධිය හා කරුණු විචාරන්නාහු මෙසේ කියන්නාහුද මේ පින්වතුන්ගේ යම් ධර්ම කෙනෙක් අකුසල්හුද, අකුසල්හුයයි වෙන්කොට තබනලද්දාහුද, සාවද්‍යයෝද, සාවද්‍යයෝයයි වෙන්කොට තබනලද්දාහුද, සෙවනය නොකට යුත්තෝද, සෙවනය නොකට යුත්තෝයයි වෙන්කොට තබනලද්දාහුද, ආර්‍ය්‍යකරණයට නොපොහොසත්හුද, ආර්‍ය්‍යකරණයට නොපොහොසත්හුයයි වෙන්කොට තබනලද්දාහුද,

කණ්හා කණ්හසංඛාතා ගොතමසාවකසඞ්ඝො ඉමෙ ධම්මෙ අනවසෙසං පහාය වත්තති, යං වා පන භොන්තො පරෙ ගණාචරිය සාවකසඞ්ඝාති. ඉතිහ කස්සප විඤ්ඤූ සමනුයුඤ්ජන්තා සමනුගාහන්තා සමනුභාසන්තා අම්හෙව තත්ථ යෙභුය්‍යෙන පසංසෙය්‍යුං.

11. අපරම්පි නො කස්සප විඤ්ඤූ සමනුයුඤ්ජන්තං සමනුගාහන්තං සමනුභාසන්තං සත්ථාරා වා සත්ථාරං සඞ්ඝෙන වා සඞ්ඝං. යෙ ඉමෙසං භවතං ධම්මා කුසලා කුසලසංඛාතා අනවජ්ජා අනවජ්ජසංඛාතා සෙවිතබ්බා සෙවිතබ්බසංඛාතා අලමරියා අලමරියසංඛාතා සුක්කා සුක්කසංඛාතා, කො ඉමෙ ධම්මෙ අනවසෙසං සමාදාය වත්තති, ගොතමසාවකසඞ්ඝො වා පරෙ වා පන භොන්තො ගණාචරිය සාවකසඞ්ඝොති.

කෘෂ්ණධර්මයෝද, කෘෂ්ණධර්මයෝයයි වෙන්කොට තබනලද්දහුද, ගෞතමශ්‍රාවකසඞ්ඝතෙම මේ ධර්මයන් නිරවශෙෂයෙන් දුරුකොට පවතී. පින්වත්වූ අන්‍යගණාචාර්‍ය්‍යශ්‍රාවකසඞ්ඝතෙම ස්වල්පමාත්‍රයක් දුරුකොට පවතීය යන කාරණයයි. කාශ්‍යපය, මෙසේ මේ කාරණයෙහි නුවණැත්තෝ ලබ්ධිය විචාරන්නාහු කරුණු විචාරන්නාහු ලබ්ධිය හා කරුණු විචාරන්නාහු අපටම ඒ කාරණයෙහි බෙහෙවින් පසසන්නාහුය.

11. කාශ්‍යපය, අනිකෙක්ද ඇත. මේ භවතුන්ගේ යම් ධර්මකෙනෙක් කුසල්හුද කුසල්හුයයි වෙන්කොට තබනලද්දහුද, අනවද්‍යයෝද, අනවද්‍යයෝයයි වෙන්කොට තබනලද්දහුද, සෙවනය කටයුත්තෝද, සෙවනය කටයුත්තාහුයයි වෙන්කොට තබනලද්දහුද, අර්‍ය්‍යකරණයට පොහොසත්හුද, ආර්‍ය්‍යකරණයට පොහොසත්හුයයි වෙන්කොට තබනලද්දහුද, ශුක්ලධර්මයෝද, ශුක්ලධර්මයෝයයි වෙන්කොට තබනලද්දහුද, කවරෙක් මේ ධර්මයන් නිරවශෙෂයෙන් සමාදන්ව පවතීද, ගෞතමශ්‍රාවකසඞ්ඝ හෝ වේද, පින්වත්වූ අන්‍යගණාචාර්‍ය්‍යශ්‍රාවකසඞ්ඝ හෝ වේදැයි පින්වත් අන්‍යගණාචාර්‍ය්‍යශාස්තෘවරයකුසමගලා ගෞතමශාස්තෘවරයා හෝ අන්‍යගණාචාර්‍ය්‍යශ්‍රාවකසඞ්ඝයා සමගලා ගෞතමශ්‍රාවකසඞ්ඝයා හෝ අප ලබ්ධිය විචාරත්වා කරුණු විචාරත්වා ලබ්ධිය හා කරුණු විචාරත්වා.

12. ඨානං ඛො පනෙතං කස්සප විජ්ජති යං විඤ්ඤූ සමනුයුඤ්ජන්තා සමනුගාහන්තා සමනුභාසන්තා එවං වදෙය්‍යුං. යෙ ඉමෙසං භවතං ධම්මා කුසලා කුසලසංඛාතා අනවජ්ජා අනවජ්ජසංඛාතා සෙවිතබ්බා සෙවිතබ්බසංඛාතා අලමරියා අලමරියසංඛාතා සුක්කා සුක්කසංඛාතා, ගොතම සාවකසඞ්ඝො ඉමෙ ධම්මෙ අනවසෙසං සමාදාය වත්තති, යං වා පන භොන්තො පරෙ වා ගණාචරියසාවකසඞ්ඝාති. ඉතිහ කස්සප විඤ්ඤූ සමනුයුඤ්ජන්තා සමනුගාහන්තා සමනුභාසන්තා අම්හෙව තත්ථ යෙභුය්‍යෙන පසංසෙය්‍යුං.

13. අත්ථි කස්සප මග්ගො. අත්ථි පටිපදා, යථා පටිපන්නො සාමඤ්ඤෙව ඤස්සති සාමං දක්ඛිති. සමණො ච ගොතමො කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදීති

---

12. කාශ්‍යපය, නුවණැත්තෝ ලබ්ධිය විචාරන්නාහු කරුණු විචාරන්නාහු ලබ්ධිය හා කරුණු විචාරන්නාහු මේ පින්වතුන්ගේ යම් ධර්මකෙනෙක් කුසල්හුද, කුසල්හුයයි වෙන්කොට තබන ලද්දාහුද, අනවද්‍යයෝද, අනවද්‍යයෝයයි වෙන්කොට තබනලද්දාහුද, සෙවනය කටයුත්තෝද, සෙවනය කටයුත්තාහුයයි වෙන් කොට තබනලද්දාහුද, ආර්‍ය්‍යකරණයට පොහොසත්හුද, ආර්‍ය්‍ය කරණයට පොහොසත්හුයයි වෙන්කොට තබනලද්දාහුද, ශුක්ල ධර්මයෝද, ශුක්ලධර්මයෝයයි වෙන්කොට තබනලද්දාහුද, ගෞතම ශ්‍රාවකසඞ්ඝතෙම මේ ධර්මයන් නිරවශෙෂයෙන් සමාදන්ව පවතී, පින්වත්වූ අන්‍යගණාචාර්‍ය්‍ය ශ්‍රාවකසමූහයෝ ස්වල්පමාත්‍රයක් සමාදන්ව පවතින්යයි මෙසේ කියන්නාහුය යන යම් කාරණයෙක් ඇද්ද මේකාරණය වනාහි විද්‍යමානවේමය. කාශ්‍යපය, මෙසේ මේකාරණයෙහි නුවණැත්තෝ ලබ්ධිය විචාරන්නාහු කරුණුවිචාරන්නාහු ලබ්ධිය හා කරුණු විචාරන්නාහු අපටම ඒ කාරණයෙහි බොහෙවින් පසසන්නාහුය.

13. කාශ්‍යපය, ගෞතමශ්‍රමණතෙම කියයුතුකල් සලකා කියන්නේය, සත්‍යය කියන්නේය, අර්ථනිශ්‍රිතවම කියන්නේය, නවලොකොත්තර ධර්මනිශ්‍රිතවම කියන්නේය, සංවරප්‍රහාණවිනය නිශ්‍රිතවම කියන්නේයයි යම්සේ පිළිපන්නේ තෙමේම දන්නේද, තෙමේම දක්නේද, එබඳුවූ ලොකොත්තරමාර්ගයෙක් ඇත්තේය. එබඳු පූර්වභාගප්‍රතිපදාවක් ඇත්තීය.

කතමො ච කස්සප මග්ගො, කතමා පටිපදා, යථා පටිපන්නො සාමංයෙව ඤස්සති සාමං දක්ඛති. සමණො ච ගොතමො කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදීති. අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො, සෙය්‍යථීදං සම්මාදිට්ඨි සම්මා සංකප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි. අයං බො කස්සප මග්ගො අයං පටිපදා යථා පටිපන්නො ච සාමංයෙව ඤස්සති සාමං දක්ඛති. සමණො ච ගොතමො කාලවාදී භූතවාදී ධම්මවාදී විනයවාදීති.

14. එවං වුත්තෙ අචෙලො කස්සපො භගවන්තං එතදවොච. ඉමෙ බො ආවුසො ගොතම තපොපක්කමා එකෙසං සමණබ්‍රාහ්මණානං සාමඤ්ඤසංඛාතා ච බ්‍රහ්මඤ්ඤසංඛාතා ච. අචෙලකො හොති මුත්තාචාරො හත්ථාපලෙඛනො, න එහි භදන්තිකො න තිට්ඨ භදන්තිකො නාභිහටං න උද්දිස්සකටං න නිමන්තණං සාදියති.

කාශ්‍යපය. ගෞතමශ්‍රමණතෙම කියයුතුකල් සලකා කියන්නේය, සත්‍යය කියන්නේය, අර්‍ථනිශ්‍රිතවම කියන්නේය, නව ලොකොත්තරධර්‍මනිශ්‍රිතවම කියන්නේය, සංවරප්‍රහාණවිනය නිශ්‍රිතවම කියන්නේයයි යම්සේ පිළිපන්නේ තෙමේම දන්නේද, තෙමේම දක්නේද, එබඳුවූ ලොකොත්තරමාර්‍ගය කවරේද, පූර්‍වභාග ප්‍රතිපදාව කවරිද, මේ ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්‍ගයම වෙයි. ඒ කවරේද? සම්‍යග්දෘෂ්ටිය, සම්‍යග්සංකල්පනාවය, සම්‍යග් වචනය, සම්‍යක්කර්‍මාන්තය, සම්‍යග්ආජීවය, සම්‍යග්ව්‍යායාමය, සම්‍යක්ස්මෘතිය, සම්‍යක්සමාධියද වේ. කාශ්‍යපය, ගෞතමශ්‍රමණ තෙම කියයුතුකල් සලකා කියන්නේය, සත්‍යය කියන්නේය, අර්‍ථ නිශ්‍රිතවම කියන්නේය, නවලොකොත්තරධර්‍මනිශ්‍රිතවම කියන් නේය, සංවරප්‍රහාණවිනය නිශ්‍රිතවම කියන්නේයයි යම්සේ පිළි පන්නේ තෙමේම දන්නේද, තෙමේම දක්නේද, මේ වනාහි ඒ ලොකොත්තර මාර්‍ගය වෙයි. මේ පූර්‍වභාග ප්‍රතිපදාව වෙයි වදාළ සේක.

14. මෙසේ වදාළකල්හි අචෙලකාශ්‍යපතෙම භාග්‍යවතුන්වහන් සේට මේ කාරණය සැලකළේය. ආයුෂ්මත් ගෞතමය, සමහර මහණ බමුණන්ගේ ශ්‍රමණකර්‍මසංඛ්‍යාතවූද, බ්‍රාහ්මණකර්‍මසංඛ්‍යාතවූද, මේ තපඃකර්‍මයෝ වෙත් ඔව්හු කවරහුදයත්, අචෙලක හෙවත් නග්නවූයේ වෙයි හරණලද ආචාර ඇත්තේ අතේ ආහාර ඉවරවූකල්හි අත ලෙව්නේ නොහොත් මලපහරා අතින් මලමග පිසදමන්නේ වෙයි. භික්‍ෂාග්‍රහණයපිණිස එව ස්වාමීනි, කීකල්හි නොඑන්නේ වෙයි. සිටුව ස්වාමිනි කීකල්හි නොසිටින්නේ වෙයි, කාලයට පළමු ගෙණවුත් එලවූ ආහාර නොගණී. තමන් උදෙසා කළ ආහාර නොගණී. නිමන් ත්‍රණය කොට දුන් ආහාර නොගණී.

සො න කුම්භිමුඛා පතිගණ්හාති, න කළොපිමුඛා පතිගණ්හාති, න එළකමන්තරං, න දණ්ඩමන්තරං, න මුසලමන්තරං, න ද්වින්නං භුඤ්ජමානානං, න ගබ්භිනියා, න පායමානාය, න පුරිසන්තරගතාය, න සංකිත්තිසු, න යත්ථ සා උපට්ඨිතො හොති, න යත්ථ මක්ඛිකා සණ්ඩසණ්ඩචාරිනී, න මච්ඡං, න මංසං, න සුරං, න මෙරයං, න ථුසොදකං පිවති, සො එකාගාරිකො වා හොති එකාලොපිකො, ද්වාගාරිකො වා හොති ද්වාලොපිකො, සත්තාගාරිකො වා හොති සත්තාලොපිකො, එකිස්සා පි දත්තියා යාපෙති, ද්වීහිපි දත්තීහි යාපෙති, සත්තහි පි දත්තීහි යාපෙති. එකාහිකං පි ආහාරං ආහාරෙති, ද්වීහිකම්පි ආහාරං ආහාරෙති, සත්තාහිකම්පි ආහාරං ආහාරෙති, ඉති එවරූපං අඩ්ඪමාසිකම්පි පරියායභත්තභොජනානුයොග මනුයුත්තො විහරති.

හෙතෙම සැළිමුවින් නගාදෙන ආහාර නොපිළිගණී. පැස මුවින් නගාදෙන ආහාර නොපිළිගණී. එළිපත අතරෙහි කොට දෙනුලබන්නක් නොගණී, දණ්ඩක් අතරෙහි කොට දෙනුලබන්නක් නොගණී. මෙහොලක් අතරෙහි කොට දෙනුලබන්නක් නොගණී. ආහාර අනුභවකරන්නාවූ දෙදෙනෙකුන් අතුරෙන් එක්කෙනෙක් නැගිට ආහාර දෙනකල්හි නොගණී. ගැබින්නගෙන් නොගණී. කිරිපොවන්නියගෙන් නොගණී. පුරුෂයකු අතරට පැමිණි ස්ත්‍රියගෙන් නොගණී. සමාදන්කොට පිසූකල්හි එයින් නොගණී. යම්තැනෙක්හි බල්ලෙක් ආහාර ලබන්නෙම්යි එළඹ සිටියේද, එහි ඔහටනොදී තමහට එලවූ ආහාර නොගණී. සැළිමුව ආදි යම්තැනෙක්හි සැඟවී සිටි මැස්සෝ සමූහ සමූහවී හැසිරෙන්නෝද, ඉන් නගාගෙණ ආහාර නොගණී. මස් නොගණී. මාංස නොගණී. සුරා නොගණී. මෙරය නොගණී. සර්වධාන්‍යසම්භාරයෙන් කළ ථුසොදකනම් කාඩි විශෙෂය පානය නොකෙරෙයි. හෙතෙම එක් ගෙයකම ආහාර ලැබ නවත්නේ හෝ එක් පිඩකින් ජීවත්වන්නේ හෝ වෙයි. ගෙවල් දෙකක ආහාර ලැබ නවත්නේ හෝ පිඩු දෙකකින් ජීවත්වන්නේ හෝ වෙයි. ගෙවල් සතක ආහාර ලැබ නවත්නේ හෝ පිඩු සතකින් ජීවත්වන්නේ හෝ වෙයි. භික්ෂාදානපාත්‍ර සතකින්ද යැපෙයි. දත්තිනම්වූ දෙතුන්පිඩක් පමණ ගන්නා කුඩා භික්ෂාදාන පාත්‍රයක බතින් යැපෙන්නේ වෙයි. දත්තිනම්වූ භික්ෂාදාන පාත්‍රවයක බතින් යැපෙන්නේ වෙයි. දිනක් හැර දිනකවූ ආහාර අනුභවකෙරෙයි. දෙදිනක් හැර දිනකවූ ආහාර අනුභවකෙරෙයි. සත්දිනක් හැර දිනකවූ ආහාර අනුභවකෙරෙයි. මෙසේ අඩමසක් හැර දිනකවූ ආහාරදැයි මෙබඳුවූ වාර බත් අනුභවකිරීමෙහි යෙදෙමින් වාසයකෙරෙයි.

ඉමෙ හි ඛො ආවුසො ගොතම තපොපක්කමා එකෙසං සමණ
බ්‍රාහ්මණානං සාමඤ්ඤසඞ්ඛාතා ච බ්‍රහ්මඤ්ඤසඞ්ඛාතා ච. සාක
භක්ඛො වා හොති, සාමාකභක්ඛො වා හොති නීවාරභක්ඛො වා
හොති, දද්දුලභක්ඛො වා හොති, හටභක්ඛො වා හොති,
කණභක්ඛො වා හොති, ආචාමභක්ඛො වා හොති, පිඤ්ඤාක
භක්ඛො වා හොති, තිණභක්ඛො වා හොති, ගොමයභක්ඛො
වා හොති වනමූලඵලාහාරො යාපෙති පවත්තඵලභොජී. ඉමෙ
හි ඛො ආවුසො ගොතම තපොපක්කමා එකෙසං සමණබ්‍රාහ්ම
ණානං සාමඤ්ඤසඞ්ඛාතා ච බ්‍රහ්මඤ්ඤසඞ්ඛාතා ච. සාණානි පි ධාරෙති,
මසාණානි පි ධාරෙති, ඡවදුස්සානි පි ධාරෙති, පංසුකූලානිපි ධාරෙති,
තිරීටානි පි ධාරෙති, අජිනානි පි ධාරෙති, අජිනක්ඛිපං පි ධාරෙති,
කුසචීරම්පි ධාරෙති, වාකචීරම්පි ධාරෙති, ඵලකචීරම්පි ධාරෙති,
කෙසකම්බලම්පි ධාරෙති, වාලකම්බලම්පි ධාරෙති, උලූකපක්ඛම්පි
ධාරෙති, කෙසමස්සුලොචකො පි හොති කෙසමස්සුලොචනානුයොග
මනුයුත්තො, උබ්භට්ඨකො පි හොති, ආසනපටික්ඛිත්තො,

ආයුෂ්මත් ගෞතමය, මොව්හුද මේ මහණබමුණන්ගේ ශ්‍රමණ ධර්ම
සඞ්ඛ්‍යාතවූද, බ්‍රාහ්මණධර්මසඞ්ඛ්‍යාතවූද, තපඃකර්මයෝ වෙත්.
නොපිසූ පලා අනුභවකරන්නේ හෝ වෙයි. බඩහමුනම් තෘණ
ධාන්‍ය අනුභවකරන්නේ හෝ වෙයි. සයඤ්ජාත ධාන්‍ය අනු
භවකරන්නේ හෝ වෙයි. සම්කරුවන් ලියාලූ සම්කසට කන්නේ
හෝ වෙයි. මැලියම් කන්නේ හෝ වෙයි. කුඩුකන්නේ හෝ වෙයි.
සැළි සෝදලූ තැන දඹු බත් කන්නේ හෝ වෙයි. මුරුවට කන්නේ
හෝ වෙයි. තණ කන්නේ හෝ වෙයි. ගොම කන්නේ හෝ වෙයි.
වනමුල් ඵල ආහාර කොට ඇත්තේ සයංපතිත ඵල අනුභවකරණ
සුලුවූයේ යැපෙයි. ආයුෂ්මත් ගෞතමය, මොව්හුද මේ මහණබමුණන්
ගේ ශ්‍රමණධර්මසඞ්ඛ්‍යාතවූද, බ්‍රාහ්මණධර්ම සඞ්ඛ්‍යාතවූද තපඃකර්ම
යෝ වෙත්. හණවැහැරි රෙදිද දරයි, හණවැහැරිමුසු රෙදිද දරයි, මිනී
යෙන් බැහැරකල රෙදි නොහොත් එරුතණ ආදියෙන් කළ ලාමක
රෙදිද දරයි, පාංශුකූල රෙදි හෙවත් බිමලූ මාලූ රෙදිද දරයි, රිටිසුඹු
ලුද දරයි, අඳුන්දිවිසම්ද දරයි, මැද පලාලූ අඳුන්දිවිසම්ද දරයි,
කුසවැහැරිද දරයි, නියදවැහැරිද දරයි, පෝරුවැහැරිද දරයි, කෙහෙ
යෙන් කළ කම්බිලිද දරයි, අස්ලොමින් කළ කම්බිලිද දරයි, බකා
මූනු පියාපතින් කළ නිවාසනද දරයි, ඉසකේ රැවුල් ඉදිරිමෙහි
යෙදුනේ ඉසකේ රැවුල් උදුරන්නේද වෙයි, ආසනප්‍රතික්ෂෙපකෙළේ
නැගිටසිටින්නේද වෙයි,

උක්කුටිකො පි හොති උක්කුටිකප්පධානමනුයුත්තො කණ්ටකාපස්සයිකො පි හොති කණ්ටකාපස්සෙ සෙය්‍යං කප්පෙති, ඵලකසෙය්‍යම්පි කප්පෙති ථණ්ඩිලසෙය්‍යම්පි කප්පෙති එකපස්සයිකො පි හොති රජොජල්ලධරො අබ්භොකාසිකො පි හොති යථාසන්ථතිකො, වෙකටිකො පි හොති විකටභොජනානුයොගමනුයුත්තො, අපානකො පි හොති අපානකත්තමනුයුත්තො සායතතියකම්පි උදකොරොහනානුයොගමනුයුත්තො විහරතීති.

15. අචෙලකො චෙපි කස්සප හොති මුත්තාචාරො හත්ථාපලෙඛනො ....පෙ.... ඉති එවරූපං අඩ්ඪමාසිකම්පි පරියායභත්තභොජනානුයොගමනුයුත්තො විහරති, තස්ස චායං සීලසම්පදා චිත්තසම්පදා පඤ්ඤාසම්පදා අභාවිතා හොති අසච්ඡිකතා, අථ ඛො සො ආරකාව සාමඤ්ඤා, ආරකාව බ්‍රහ්මඤ්ඤා. යතො ඛො කස්සප භික්ඛු අවෙරං අබ්‍යාපජ්ඣං මෙත්තාචිත්තං භාවෙති, ආසවානං ඛයා.

උක්කුටිකවීර්‍ය්‍යයෙහි යෙදුනේ උක්කුටික වූයේද වෙයි, කටුමත්තෙහි ශයනයකරන්නේ කටුමත්තෙහි හැසිරීම් ආදියද කරන්නේ වෙයි, පෝරුමත්තෙහි ශයනයකරන්නේද වෙයි, පිල්කඩ ශයනය කරන්නේද වෙයි, එක්ඇලයකින් ශයනයකරන්නේද වෙයි, රජස්දූලි දරන්නේද වෙයි, අභ්‍යවකාශයෙහි (එළියේ) වසන්නේද වෙයි, පළමු අතුළ පරිදි වෙනස්නොකොට අස්නෙහි ඉන්නේද වෙයි, ගූථානුභවයෙහි යෙදුනේ ගූථානුභවකරන්නේද වෙයි, සිහිල් දිය නොබීමෙහි යෙදුනේ දුරුකළ සිහිල් දිය පීම්ඇත්තේද වෙයි, ත්‍රිසන්ධ්‍යායෙහි හෝ උදය, දවල්, සවස යන කාලත්‍රයෙහි පාපප්‍රවාහය කරන්නෙමියි දියේගැලීමෙහි යෙදුනේ වාසයකෙරේ යයි කීයේය.

15. කාශ්‍යපය, ඉදින් අචෙලක හෙවත් නග්නවූයේ හෝ වේද, හරණලද ආචාරඇත්තේ අත්හිවූ ආහාර නිම්කළ අත ලෙවනේ නොහොත් මලපහරු අතින් මලමග පිසදමන්නේ—පෙ—මෙසේ අඩමසක් හැර දිනකවූ ආහාරදූසී මෙබඳුවූ වාර බත් අනුභවකිරීමෙහි යෙදුනේ වාසය කෙරේද, ඔහුවිසින් මේ ශීලසම්පත්තියද, මේ චිත්තසම්පත්තියද, මේ ප්‍රඥාසම්පත්තියද, නොවඩනලද්දී සාක්ෂාත් නොකරණලද්දී වෙයි. කුමක්වේද? හෙතෙම ශ්‍රමණකර්මයෙන් දුරුවූයේම වෙයි, බ්‍රාහ්මණකර්මයෙන් දුරුවූයේම වෙයි. කාශ්‍යපය, යම්හෙයකින් භික්ෂුතෙම වෛෂ වෛර රහිතවූ දෞර්මනස්‍යව්‍යාපාද රහිතවූ මෛත්‍රීසිත් වඩාද ආශ්‍රව ක්ෂයකිරීමෙන්.

අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති, අයං වුච්චති කස්සප භික්ඛු සමණො ඉති පි බ්‍රාහ්මණො ඉතිපි. සාකභක්ඛො චෙපි කස්සප හොති, සාමාකභක්ඛො චෙපි කස්සප හොති නීවාරභක්ඛො......පෙ...... වනමූලඵලාහාරො යාපෙති පවත්තඵලභොජී, තස්ස චායං සීලසම්පදා චිත්තසම්පදා පඤ්ඤාසම්පදා අභාවිතා හොති අසච්ඡිකතා, අථ ඛො සො ආරකාව සාමඤ්ඤා ආරකාව බ්‍රහ්මඤ්ඤා. යතො ඛො කස්සප භික්ඛු අවෙරං අබ්‍යාපජ්ඣං මෙත්තචිත්තං භාවෙති ආසවානඤ්ච ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති, අයං වුච්චති කස්සප භික්ඛු සමණො ඉති පි බ්‍රාහ්මණො ඉතිපි. සාණානි චෙපි කස්සප ධාරෙති, මසාණානි පි ධාරෙති......පෙ......සායතතියකම්පි උදකොරොහනානුයොගමනුයුත්තො විහරති, තස්ස චායං සීලසම්පදා චිත්තසම්පදා පඤ්ඤාසම්පදා අභාවිතා හොති අසච්ඡිකතා.

ආශ්‍රවරහිතවූ ඵලසමාධියද ඵලප්‍රඥාවද ඉහාත්මභාවයෙහිම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්‍ෂකොට ඊට පැමිණ වාසයකෙරේද. කාශ්‍යපය, මේ භික්‍ෂුතෙම මේකාරණයෙන් ශ්‍රමණයයිද මේකාරණයෙන් බ්‍රාහ්මණයයිද කියනුලැබේ. කාශ්‍යපය, ඉදින් නොපිසූපලා අනුභවකරන්නේ වේද—පෙ—වනමුල්ඵල ආහාරකොට ඇත්තේ සයංපතිත ඵල අනුභව කරණ සුලුවූයේ වේද, ඔහුවිසින්ද මේ ශීලසම්පත්තියද, මේ චිත්ත සම්පත්තියද, මේ ප්‍රඥාසම්පත්තියද, නොවඩනලද්දී සාක්‍ෂාත්නොකරණලද්දී වෙයි. කුමක්වේද? හෙතෙම ශ්‍රමණකර්මයෙන් දුරුවූයේම වෙයි. බ්‍රාහ්මණකර්මයෙන් දුරුවූයේම වෙයි. කාශ්‍යපය, යම්හෙයකින් භික්‍ෂුතෙම වෛෂ වෛර රහිතවූ දෞර්මනස්‍යව්‍යාපාද රහිතවූ මෛත්‍රීසිත් වඩාද ආශ්‍රවයන්ගේ ක්‍ෂයකිරීමෙන් ආශ්‍රවරහිතවූ ඵලසමාධියද, ඵලප්‍රඥාවද, ඉහාත්මභාවයෙහිම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්‍ෂකොට ඊට පැමිණ වාසයකෙරේද. කාශ්‍යපය, මේ භික්‍ෂුතෙම ශ්‍රමණයයිද බ්‍රාහ්මණයයිද කියනුලැබේ කාශ්‍යපය, ඉදින් හණවැහැරිරෙදි දරාද, හණවැහැරි මුසු රෙදි දරාද—පෙ—ත්‍රිසන්ධ්‍යායෙහිත් පාපප්‍රවාහය කරන්නෙමියි දියේගැලීමෙහි යෙදුනේ වාසයකෙරේද, ඔහුවිසින්ද මේ ශීලසම්පත්තියද, මේ චිත්තසම්පත්තියද, මේ ප්‍රඥාසම්පත්තියද, නොවඩනලද්දී සාක්‍ෂාත්නොකරණලද්දී වෙයි. කුමක්වේද?

අථ ඛො සො ආරකාව සාමඤ්ඤා ආරකාව බ්‍රහ්මඤ්ඤා. යතො ඛො කස්සප භික්ඛු අවෙරං අබ්‍යාපජ්ඣං මෙත්තචිත්තං භාවෙති, ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති, අයං වුච්චති කස්සප භික්ඛු සමණො ඉති පි බ්‍රාහ්මණො ඉතිපීති.

16. එවං වුත්තෙ අචෙලො කස්සපො භගවන්තං එතදවොච. දුක්කරං භො ගොතම සාමඤ්ඤං දුක්කරං බ්‍රාහ්මඤ්ඤන්ති. පකති ඛො එසා කස්සප ලොකස්මිං දුක්කරං සාමඤ්ඤං දුක්කරං බ්‍රහ්මඤ්ඤන්ති. අචෙලකො චෙ පි කස්සප හොති, මුත්තාචාරො හත්ථාපලෙඛනො......පෙ......ඉති එවරූපං අඩ්ඪමාසිකම්පි පරියායභත්තභොජනානුයොගමනුයුත්තො විහරති, ඉමාය ච කස්සප මත්තාය ඉමිනා ච තපොපක්කමෙන සාමඤ්ඤං වා අභවිස්ස බ්‍රහ්මඤ්ඤං වා දුක්කරං සුදුක්කරං.

හෙතෙම ශ්‍රමණ කර්මයෙන් දුරුවූයේමවෙයි. බ්‍රාහ්මණ කර්මයෙන් දුරුවූයේම වෙයි. කාශ්‍යපය, යම්හෙයකින් භික්ෂුතෙම වෙෂ වෛර රහිතවූ දෞර්මනස්‍යව්‍යාපාද රහිතවූ මෛත්‍රීසිත් වඩාද, ආශ්‍රවයන්ගේ ක්ෂයකිරීමෙන් ආශ්‍රවරහිතවූ ඵලසමාධියද, ඵලප්‍රඥාවද, ඉහාත්මභාව යෙහිම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසයකෙරේද. කාශ්‍යපය, මේ භික්ෂුතෙම ශ්‍රමණයයිද බ්‍රාහ්මණයයිද කියනුලැබේ.

16. මෙසේ වදාළකල්හි අචෙලකාශ්‍යපතෙම පින්වත් ගෞතමය, ශ්‍රමණකර්මය දුෂ්කරවෙයි. බ්‍රාහ්මණකර්මය දුෂ්කරවේයයි භාග්‍ය වතුන්වහන්සේහට මේ වචනය සැලකළේය. කාශ්‍යපය, ශ්‍රමණ කර්මය දුෂ්කරය, බ්‍රාහ්මණ කර්මය දුෂ්කරය යන මේ කථාතොමෝ ලොක යෙහි ප්‍රකෘති කථාවෙයි. කාශ්‍යපය, ඉදින් අචෙලක හෙවත් නග්න හෝ වේද, හරණලද ආචාර ඇත්තේ අතෙහි ආහාර ඉවරවූකල අත ලෝතේ නොහොත් මලපහරු අතින් මලමග පිසදමන් .න් සෙස්සකීක්‍රමයයි. මෙසේ අඩමසකින් දිනකවූ ආහාරදූයි මෙබඳු වාර භක්තානුභවයෙහි යෙදුනේ වාසයකෙරේද. කාශ්‍යපය, මේ මදවූ ප්‍රතිපත්ති ක්‍රමයෙන්ද, මේ තපස් කර්මයෙන්ද, ශ්‍රමණ කර්මය හෝ බ්‍රාහ් මණ කර්මයහෝ දුෂ්කරවූයේ ඉතා දුෂ්කරවූයේ වන්නේද.

නෙතංඅභවිස්සකල්ලංවචනායදුක්කරංසාමඤ්ඤංදුක්කරංබ්‍රහ්මඤ්ඤන්ති. සක්කාචපනෙතංඅභවිස්සකාතුංගහපතිනා වා ගහපතිපුත්තෙන වා අන්තමසො කුම්භදාසියා පි. හඤ්හං අචෙලකො හොමි මුත්තාචාරො හත්ථාපලෙඛනො—පෙ—ඉති එවරූපං අඩ්ඪමාසිකම්පි පරියායභත්තභොජනානුයොගමනුයුත්තො විහරාමීති. යස්මා ච ඛො කස්සප අඤ්ඤත්‍රෙව ඉමාය මත්තාය අඤ්ඤත්‍ර ඉමිනා තපොපක්කමෙන සාමඤ්ඤං වා හොති බ්‍රහ්මඤ්ඤං වා දුක්කරං සුදුක්කරං, තස්මා එතං කල්ලං, වචනාය දුක්කරං සාමඤ්ඤං දුක්කරං බ්‍රහ්මඤ්ඤන්ති. යතො ඛො කස්සප භික්ඛු අවෙරං අබ්‍යාපජ්ඣං මෙත්තචිත්තං භාවෙති. ආසවානං ච ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති, අයං වුච්චති කස්සප භික්ඛු සමණො ඉති පි බ්‍රාහ්මණො ඉති පි. සාකභක්ඛො චෙ පි කස්සප හොති, සාමාකභක්ඛො—පෙ—වනමූලඵලාහාරො යාපෙති පවත්තඵලභොජී,

---

එපමණකින් ශ්‍රමණකර්මය දුෂ්කරය, බ්‍රාහ්මණකර්මය දුෂ්කරයයි යන මේ වචනය කීමටසුදුසුනොවේ.එසේනම් මම හරණලද ආචාර ඇත්තෙම් අතෙහිවූ ආහාර ඉවරවූකලඅත ලෝනේ නොහොත් මලපහරා අතින් මලමග පිසදමන්නාවූ නග්න වෙමි. සෙස්සකීනසිති මෙසේ අඩමසක් හැර දිනකවූ ආහාරදැයි මෙබඳු වාර බත් අනුභවයෙහි යෙදුනේ වෙසෙමියි කියා ගෘහපතියෙකුවිසින් හෝ ගෘහපතිපුත්‍රයෙකුවිසින් හෝ යටත්පිරිසෙයින් කුම්භදාසියකුවිසින්ද මේ ශ්‍රමණකර්මය හෝ බ්‍රාහ්මණ කර්මය හෝ කරණුහැකිද වන්නේය. කාශ්‍යපය, යම්හෙයකින් මේ මදවූ ප්‍රතිපත්තික්‍රමයෙන් තොරවම මේ තපස්කර්මයෙන් තොරවම ශ්‍රමණ කර්මය හෝ බ්‍රාහ්මණකර්මය දුෂ්කරවූයේ ඉතා දුෂ්කරවූයේ වේනම් එහෙයින් ශ්‍රමණකර්මය දුෂ්කරය, බ්‍රාහ්මණ කර්මය දුෂ්කරයයි මේ වචනය කීමට සුදුසුවෙයි. කාශ්‍යපය, යම්හෙයකින් භික්ෂුතෙම වෛෂ වෛර රහිතවූ දෞර්මනස්‍යව්‍යාපාද රහිතවූ මෙත්සිත් වඩාද, ආශ්‍රවක්ෂයකිරීමෙන් ආශ්‍රව රහිතවූ ඵලසමාධියද, ඵලප්‍රඥාවද, ඉහාත්මභාවයෙහිම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසයකෙරේද. කාශ්‍යපය, මේ භික්ෂුතෙම ශ්‍රමණයයිද, බ්‍රාහ්මණයයිද කියනුලැබේ. කාශ්‍යපය, ඉදින් නොපිසූ පලා අනුභවකරන්නේ හෝ බඩහමුනම්වූ තෘණධාන්‍ය අනුභවකරන්නේ හෝ—පෙ—සයම්පතිත ඵලඅනුභවකරණුසුලුවූයේ වනමුල් ඵල ආහාරකොට ඇත්තේ යැපේද.

ඉමාය ච කස්සප මත්තාය ඉමිනාච තපොපක්කමෙන සාමඤ්ඤං වා අභවිස්ස බ්‍රහ්මඤ්ඤං වා දුක්කරං සුදුක්කරං නෙතං අභවිස්ස කල්ලං වචනාය දුක්කරං සාමඤ්ඤං දුක්කරං බ්‍රහ්මඤ්ඤන්ති. සක්කා ච පනෙතං අභවිස්ස කාතුං ගහපතිනා වා ගහපතිපුත්තෙන වා අන්තමසො කුම්භදාසියාපි. හන්දාහං සාකභක්ඛො වා හොමි සාමාකභක්ඛො ...පෙ... වනමූලඵලාහාරො යාපෙමි පවත්තඵලභොජීති. යස්මා ච ඛො අඤ්ඤත්‍රෙව ඉමාය මත්තාය අඤ්ඤත්‍ර ඉමිනා තපොපක්කමෙන සාමඤ්ඤං වා හොති බ්‍රහ්මඤ්ඤං වා දුක්කරං සුදුක්කරං, තස්මා එතං කල්ලං වචනාය දුක්කරං සාමඤ්ඤං දුක්කරං බ්‍රහ්මඤ්ඤන්ති. යතො ඛො කස්සප භික්ඛු අවෙරං අබ්‍යාපජ්ඣං මෙත්තචිත්තං භාවෙති, ආසවානං ච ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති, අයං වුච්චති කස්සප භික්ඛු සමණො ඉති පි බ්‍රාහ්මණො ඉති පීති.

කාශ්‍යපය, මේ මදවූ ප්‍රතිපත්තික්‍රමයෙන්ද, මේ තපස් කර්මයෙන්ද, ශ්‍රමණකර්මය හෝ බ්‍රාහ්මණකර්මය දුෂ්කරවූයේ ඉතා දුෂ්කරවූයේ වන්නේද, එපමණකින් ශ්‍රමණකර්මය දුෂ්කරය, බ්‍රාහ්මණකර්මය දුෂ්කරයයි මේ වචනය කීමට සුදුසු නොවේ. එසේනම්, මම නොපිසූ පලා අනුභවකරන්නේ හෝ බඩහමුනම් තෘණධාන්‍ය අනුභවකරන්නේ හෝ—පෙ—සයම්පතිතඵල අනුභවකරණ සුලු වූයේ වනමුල්ඵල ආහාරකොට ඇත්තෙමියැපෙමි කියාගෘහපතියෙකු විසින් හෝ ගෘහපතිපුත්‍රයෙකුවිසින් හෝ යටත්පිරිසෙයින් කුම්භදාසියෙකුවිසින්ද, මේ තපස් කර්මය කරණුහැකිද වන්නේය. කාශ්‍යපය· යම්හෙයකින් මේ මදවූ ප්‍රතිපත්තික්‍රමයෙන් තොරවම මේ තපස් කර්මයෙන් තොරවම ශ්‍රමණ කර්මය හෝ බ්‍රාහ්මණකර්මය දුෂ්කරවූයේ ඉතා දුෂ්කරවූයේවේනම් එහෙයින් ශ්‍රමණකර්මය දුෂ්කරය, බ්‍රාහ්මණකර්මය දුෂ්කරයයි මේ වචනය කීමට සුදුසු වෙයි. කාශ්‍යපය යම්හෙයකින් භික්ෂුතෙම ද්වේෂ වෛර රහිතවූ දෞර්මනස්‍යව්‍යාපාද රහිතවූ මෛත්සිත් වඩාද, ආශ්‍රවයන්ගේ ක්ෂයකිරීමෙන් ආශ්‍රව රහිතවූ ඵලසමාධියද, ඵලප්‍රඥාවද, ඉහාත්මභාවයෙහිම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට ඊටපැමිණ වාසයකෙරේද. කාශ්‍යපය, මේ භික්ෂුතෙම ශ්‍රමණයයිද, බ්‍රාහ්මණයයිද කියනුලැබේ.

සාණානි වෙපි කස්සප ධාරෙති, මසාණානිපි ධාරෙති ...පෙ... සායතතියකම්පි උදකොරොහණානුයොගමනුයුත්තො විහරති, ඉමාය ච කස්සප මත්තාය ඉමිනා තපොපක්කමෙන සාමඤ්ඤං වා අභවිස්ස බ්‍රහ්මඤ්ඤං වා දුක්කරං සුදුක්කරං නෙතං අභවිස්ස කල්ලං වචනාය දුක්කරං සාමඤ්ඤං දුක්කරං බ්‍රහ්මඤ්ඤන්ති සක්කා ච පනෙතං අභවිස්ස කාතුං ගහපතිනා වා ගහපතිපුත්තෙන වා අන්තමසො කුම්භදාසියාපි _ හන්දාහං සාණානි පි ධාරෙමි මසාණානිපි ධාරෙමි ...පෙ... සායතතියකම්පි උදකොරොහණානුයොගමනුයුත්තො විහරාමීති. යස්මා ච ඛො කස්සප අඤ්ඤත්‍රෙව ඉමාය මත්තාය අඤ්ඤත්‍ර ඉමිනා තපොපක්කමෙන සාමඤ්ඤං වා හොති බ්‍රහ්මඤ්ඤං වා දුක්කරං සුදුක්කරං තස්මා එතං කල්ලං වචනාය දුක්කරං සාමඤ්ඤං දුක්කරං බ්‍රහ්මඤ්ඤන්ති. යතො ඛො කස්සප භික්ඛු අවෙරං අබ්‍යාපජ්ඣං මෙත්තචිත්තං භාවෙති, ආසවානඤ්ච ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති, අයං වුච්චති. කස්සප භික්ඛු සමණො ඉතිපි බ්‍රාහ්මණො ඉතිපීති.

කාශ්‍යපය, ඉදින් හණවැහැරිරෙදි දරාද හණවැහැරිමුසුරෙදි දරාද,—පෙ—ත්‍රිසන්ධ්‍යායෙහිත් පාපප්‍රවාහය කරන්නෙමියි දියේ ගැලීමෙහි යෙදෙමින් වාසය කෙරේද, කාශ්‍යපය, මේ මදවූ ප්‍රතිපත්තික්‍රමයෙන් මේ තපස් කර්මයෙන් ශ්‍රමණ කර්මය හෝ බ්‍රාහ්මණ කර්මය හෝ දුෂ්කරවූයේ ඉතාදුෂ්කරවූයේ වන්නේද, එහෙයින් ශ්‍රමණ කර්මය දුෂ්කරය බ්‍රාහ්මණ කර්මය දුෂ්කරයයි මේ වචනය කීමට සුදුසු නොවන්නේය. එසේනම් මම හණවැහැරිරෙදිද දරමි හණවැහැරිමුසු රෙදිද දරමි—පෙ—ත්‍රි සන්ධ්‍යායෙහිත් පාපප්‍රවාහය කරන්නෙමියි දියේ ගැලීමෙහි යෙදෙමින් වෙසෙමි. කියා ගෘහපතියකු විසින් හෝ ගෘහපතිපුත්‍රයෙකු විසින් හෝ යටත්පිරිසෙයින් කුම්භදාසියකුවිසින්ද මේ ශ්‍රමණ කර්මය කරන්නුහැකිද වන්නේය. කාශ්‍යපය, යම්හෙයකින් මේ මදවූ ප්‍රතිපත්තික්‍රමයෙන් තොරවම මේ තපස් කර්මයෙන් තොරවම ශ්‍රමණ කර්මය හෝ බ්‍රාහ්මණ කර්මය හෝ දුෂ්කරවූයේ ඉතාදුෂ්කරවූයේවේනම් එහෙයින් ශ්‍රමණ කර්මය දුෂ්කරයබ්‍රාහ්මණකර්මයදුෂ්කරයයිමේවචනය කීමට සුදුසුවෙයි. කාශ්‍යපය, යම්හෙයකින් භික්ෂුතෙම වෛෂවෛරරහිතවූ දෞර්මනස්‍ය ව්‍යාපාද රහිතවූ මෛත්‍රීසිත් වඩාද, ආශ්‍රවයන්ගේ ක්‍ෂයකිරීමෙන් ආශ්‍රව රහිතවූ ඵලසමාධියද, ඵලප්‍රඥාවද, ඉහාත්මභාවයෙහිමතෙමේවිශිෂ්ටඥානයෙන් ප්‍රත්‍යක්‍ෂකොට දැන ඊට පැමිණවාසය කෙරේද, කාශ්‍යපය, මේ භික්ෂුතෙම ශ්‍රමණයයිද බ්‍රාහ්මණයයිද කියනු ලැබේ.

17. එවං වුත්තෙ අචෙලො කස්සපො භගවන්තං එතදවොච. දුජ්ජානො භො ගොතම සමණො දුජ්ජානො බ්‍රාහ්මණොති. පකතිඛො එසා කස්සප ලොකස්මිං දුජ්ජානො සමණො. දුජ්ජානො බ්‍රාහ්මණොති. අචෙලකො චෙපි කස්සප හොති, මුත්තාචාරො හත්ථාපලෙඛනො ...පෙ... ඉති එවරූපං අඩ්ඪමාසිකම්පි පරියාය භත්තභොජනානුයොගමනුයුත්තො විහරති, ඉමාය ච කස්සප මත්තාය ඉමිනා තපොපක්කමෙන සමණො වා අභවිස්ස බ්‍රාහ්මණො වා දුජ්ජානො සුදුජ්ජානො, නෙතං අභවිස්ස කල්ලං වචනාය දුජ්ජානො සමණො දුජ්ජානො බ්‍රාහ්මණොති. සක්කා ච පන සො අභවිස්ස ඤාතුං ගහපතිනා වා ගහපතිපුත්තෙන වා අන්තමසො කුම්භදාසියාපි අයං අචෙලකො මුත්තාචාරො හත්ථාපලෙඛනො ...පෙ... ඉති එවරූපං අඩ්ඪමාසිකම්පි පරියායභත්තභොජනානුයොගමනුයුත්තො විහරතීති. යස්මා ච ඛො කස්සප අඤ්ඤත්‍රෙව ඉමාය මත්තාය.

---

17. මෙසේ වදාළකල්හි අචෙල කාශ්‍යපතෙම පින්වත් ගෞතමය ශ්‍රමණතෙම දුකසේ දැනගතයුතුවෙයි. බ්‍රාහ්මණතෙම දුකසේ දැනගතයුතු වේයයි භාග්‍යවතුන්වහන්සේට මේ වචනය සැලකළේය. කාශ්‍යපය, ශ්‍රමණතෙම දුකසේ දැනගතයුතුය බ්‍රාහ්මණතෙම දුකසේ දැනගතයුතුයයි මේ කථාතොමෝ ලොකයෙහි ප්‍රකෘති කථාවෙයි. කාශ්‍යපය, ඉදින් අචෙලක හෙවත් නග්න හෝ වේදහරණලද ආචාර ඇත්තේ අතලෙව්නේ නොහොත් මලපහරු අතින් මලමග පිස දමන්නේ—පෙ—මෙසේ අඩමසක්හැර දිනකවූ ආහාරදූයි මෙබඳුවූ වාරබත් අනුභවකිරීමෙහි යෙදෙමින් වාසය කෙරේද, කාශ්‍යපය, මෙබඳුවූ ප්‍රතිපත්ති ක්‍රමයෙන්ද, මේ තපස් කර්මයෙන්ද, ශ්‍රමණ හෝ බ්‍රාහ්මණ හෝ දුකසේ දැනගතයුත්තේ ඉතාදුකසේ දැනගතයුත්තේ වන්නේද එපමණකින් ශ්‍රමණතෙම දුකසේ දැනගතයුත්තේය. බ්‍රාහමණතෙම දුකසේ දැනගතයුත්තේයයි මේ වචනය කීමට සුදුසුනොවෙයි. මේතෙම හරණලද ආචාරඇත්තේ අතෙහි ආහාර ඉවරවූකල අතලෙව්නේ නොහොත් මලපහරු අතින් මලමග පිස දමන්නේ—පෙ—මෙසේ අඩමසක්හැර දිනකවූ ආහාරදූයි මෙබඳුවූ වාරබත් අනුභවකිරීමෙහි යෙදුනේ වෙසෙයි අචෙලක වෙයි කියා හෙතෙම ගැහැවියෙකු විසින් හෝ ගැහැවිපුතෙකු විසින් හෝ යටත් පිරිසෙයින් කුම්භදාසියක් විසින්ද, දැනගණුහැකිද වන්නේය. කාශ්‍යපය, යම් හෙයකින් මේ මදවූ ප්‍රතිපත්තියෙන් තොරවම.

අඤ්ඤත්‍ර ඉමිනා තපොපක්කමෙන සමණොවා බ්‍රාහ්මණොවා දුජ්ජානො සුදුජ්ජානො, තස්මා එතං කල්ලං වචනාය දුජ්ජානො සමණො දුජ්ජානො බ්‍රාහ්මණොති. යතො ඛො කස්සප භික්ඛු අවෙරං අබ්‍යාපජ්ඣං මෙත්තචිත්තං භාවෙති, ආසවානඤ්ච ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති, අයං වුච්චති කස්සප භික්ඛු සමණො ඉතිපි බ්‍රාහ්මණො ඉතිපීති. සාකභක්ඛො චෙපි කස්සප හොති සාමාකභක්ඛො ...පෙ... වනමූලඵලහාරො යාපෙති පවත්තඵලභොජී ඉමායච කස්සප මත්තාය ඉමිනා තපොපක්කමෙන සමණොවා අභවිස්ස බ්‍රාහ්මණො වා දුජ්ජානො සුදුජ්ජානො නෙතං අභවිස්ස කල්ලං වචනාය දුජ්ජානො සමණො දුජ්ජානො බ්‍රාහ්මණොති. සක්කා ච පන සො අභවිස්ස ඤාතුං ගහපති වා ගහපතිපුත්තො වා අන්තාමසො කුම්භදාසියා පි අයං සාකභක්ඛො වා සාමාකභක්ඛො ...පෙ... වනමූලඵලාහාරො යාපෙති පවත්තඵලභොජීති.

මේතපස්කර්මයෙන්තොරව මේශ්‍රමණ හෝ බ්‍රාහ්මණ හෝ දුකසේ දැනගත යුත්තේ ඉතා දුකසේ දැනගතයුත්තේ වේනම් එහෙයින් ශ්‍රමණ තෙම දුකසේ දැනගතයුතුය බ්‍රාහ්මණතෙම දුකසේ දැනගතයුතුයයි මේ වචනය කියන්ට වටී. කාශ්‍යපය, යම්හෙයකින් භික්ෂුතෙම වෛෂ වෛර රහිතවූ දෞර්මනස්‍ය ව්‍යාපාදරහිතවූ මෛත්සිත් වඩාද ආශ්‍රව යන්ගේ ක්ෂයකිරීමෙන් ආශ්‍රව රහිතවූ ඵලසමාධියද ඵලප්‍රඥාවද ඉහාත්මභාවයෙහිම තෙමේවිශිෂ්ටඥානයෙන්දැනප්‍රත්‍යක්ෂකොටර්ටපැමිණ වාසයකෙරේද, කාශ්‍යපය, මේ භික්ෂුතෙම ශ්‍රමණයයිද බ්‍රාහ්මණයයිද කියනුලැබේ. කාශ්‍යපය ඉදින්නොපිසූපලාඅනුභවකරන්නේබඩහමු නම් තෘණධාන්‍ය අනුභවකරන්නේ—පෙ— සයං පතිතඵල අනුභව කරණ සුලුවූයේ වනමුල්ඵල ආහාරකොට ඇත්තේ යැපේද, කාශ්‍යපය, මේමදවූ ප්‍රතිපත්තික්‍රමයෙන්ද, මේතපස් ක්‍රමයෙන්ද, ශ්‍රමණ හෝ බ්‍රාහ්මණ හෝ දුකසේ දැනගතයුතුවූයේ ඉතාදුකසේ දැනගත යුතුවූයේ වන්නේද, එපමණකින් ශ්‍රමණතෙම දුකසේ දැනගතයුත්තේය. බ්‍රාහ්මණතෙම දුකසේ දැනගත යුත්තේයයි මේ වචනය කියන්ට සුදුසු නොවෙයි. මේතෙම නොපිසූ පලාඅනුභවකරන්නේ වෙයි බඩහමුනම් තෘණධාන්‍ය අනුභවකරන්නේ හෝ වෙයි —පෙ—සයං පතිතඵල අනුභවකරණ සුලුවූයේ වනමුල්ඵල ආහාර කොට ඇත්තේ යැපෙයි කියා හෙතෙම ගෘහපතියකු විසින් හෝ ගෘහපති පුත්‍රයෙකු විසින්හෝ යටත්පිරිසෙයින් කුම්භදාසියකුවිසින්ද දැනගත හැකිද වන්නේය.

යස්මාච ඛො කස්සප අඤ්ඤත්‍රෙව ඉමාය මත්තාය අඤ්ඤත්‍ර ඉමිනා තපොපක්කමෙන සමණො වා හොති බ්‍රාහ්මණො වා හොති දුජ්ජානො සුදුජ්ජානො. තස්මා එතං කල්ලං වචනාය දුජ්ජානො සමණො දුජ්ජානො බ්‍රාහ්මණොති. යතො ඛො කස්සප භික්ඛු අවෙරං අබ්‍යාපජ්ඣං මෙත්තචිත්තං භාවෙති, ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති, අයං වුච්චති කස්සප භික්ඛු සමණො ඉතිපි බ්‍රාහ්මණො ඉතිපි. සාණානිපි කස්සප ධාරෙති...පෙ...ආයතනියකම්පි උදකොරොහණානුයොගමනුයුත්තො විහරති ඉමාය ච කස්සප මත්තාය ඉමිනා තපොපක්කමෙන සමණො වා බ්‍රාහ්මණො වා අභවිස්ස දුජ්ජානො සුදුජ්ජානො නෙතං අභවිස්ස කල්ලං වචනාය න දුජ්ජානො සමණො න දුජ්ජානො බ්‍රාහ්මණොති සක්කාච එතෙසො අභවිස්ස ඤාතුං ගහපතිනා වා ගහපතිපුත්තෙන වා අන්තමසො කුම්භදාසියාපි අයං සාණානි පි ධාරෙති මසාණානි පි ධාරෙති...පෙ...ආයතනියකම්පි උදකොරොහණානුයොගමනුයුත්තො විහරතීති.

කාශ්‍යපය, යම්හෙයකින් මේමදවූ ප්‍රතිපත්තික්‍රමයෙන් තොරවම මේතපස් කර්මයෙන් තොරවම ශ්‍රමණහෝ බ්‍රාහ්මණ හෝ දුකසේ දැනගතයුතුවූයේ ඉතාදුකසේ දැනගතයුතුවූයේවේ නම් ශ්‍රමණතෙම දුකසේ දැනගතයුතුය බ්‍රාහ්මණතෙම දුකසේ දැනගත යුතුයයි මේ වචනය කියන්ට වටී. කාශ්‍යපය, යම්හෙයකින් භික්ෂුතෙම ද්වේෂ වෛර රහිතවූ දෞර්මනස්‍ය ව්‍යාපාද රහිතවූ මෙත්සිත් වඩාද ආශ්‍රවයන්ගේ ක්ෂයකිරීමෙන් ආශ්‍රවරහිතවූ ඵලසමාධියද ඵලප්‍රඥාවද ඉහාත්මභාවයෙහිම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට ඊටපැමිණ වාසය කෙරේද, කාශ්‍යපය, මේ භික්ෂුතෙම ශ්‍රමණයයිද බ්‍රාහ්මණයයිද කියනු ලැබේ. කාශ්‍යපය, ඉදින් හණවැහැරිරෙදි දරාද හණවැහැරිමුසුරෙදි දරාද—පෙ—ත්‍රිසන්ධ්‍යායෙහිත් පාපප්‍රවාහය කරන්නෙමියි දියේගැලීමෙහි යෙදුනේ වාසය කෙරේද, කාශ්‍යපය, මේමදවූ ප්‍රතිපත්තික්‍රමයෙන්ද මේ තපස් කර්මයෙන්ද ශ්‍රමණ හෝ බ්‍රාහ්මණ හෝ දුකසේදැනගතයුතුවූයේ ඉතාදුකසේ දැනගතයුතුවූයේ වන්නේද එප මණකින් ශ්‍රමණතෙම දුකසේ දැනගත යුත්තේය.බ්‍රාහ්මණතෙම දුකසේ දැනගත යුත්තේයයි මේ වචනය කියන්ට නොවටී. මේතෙම හණවැහැරිරෙදි දරයි හණවැහැරි මුසුරෙදි දරයි—පෙ—ත්‍රිසන්ධ්‍යායෙහිත් පාපප්‍රවාහයකරන්නෙමියි දියේගැලීමෙහි යෙදුනේ වාසය කෙරේයයි හෙතෙම ගෘහපතියෙකු විසින් හෝ ගෘහපති පුත්‍රයෙකු විසින් හෝ යටත් පිරිසෙයින් කුම්භදාසියකුවිසින්ද දැනගත හැකිදවන්නේය.

යස්මාච ඛො කස්සප අඤ්ඤත්‍රෙව ඉමාය මත්තාය අඤ්ඤත්‍ර ඉමිනා තපොපක්කමෙන සමණො වා හොති බ්‍රාහ්මණො වා දුජ්ජානො සුදුජ්ජානො, තස්මා එතං කල්ලං වචනාය දුජ්ජානො සමණො දුජ්ජානො බ්‍රාහ්මණොති. යතො ඛො කස්සප භික්ඛු අවෙරං අබ්‍යාපජ්ඣං මෙත්තචිත්තං භාවෙති, ආසවානඤ්ච ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙවධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති අයං වුච්චති කස්සප භික්ඛු සමණො ඉතිපි බ්‍රාහ්මණො ඉතිපීති.

18. එවං වුත්තෙ අචෙලො කස්සපො භගවන්තං එතදවොච. කතමා පන සා භො ගොතම සීලසම්පදා, කතමා චිත්තසම්පදා, කතමා පඤ්ඤා සම්පදාති. ඉධ කස්සප තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධො.........පෙ.........භයදස්සාවී, සමාදාය සික්ඛති සික්ඛාපදෙසු, කායකම්මවචීකම්මෙන සමන්නාගතො කුසලෙන, පරිසුද්ධාජීවො සීලසම්පන්නො, ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො, සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො සන්තුට්ඨො. කථඤ්ච කස්සප භික්ඛු සීලසම්පන්නො හොති.

කාශ්‍යපය, යම් හෙයකින් මේමදවූ ප්‍රතිපත්තික්‍රමයෙන් තොර වම මේතපස් කර්‍මයෙන් තොරවම ශ්‍රමණ හෝ බ්‍රාහ්මණ හෝ දුකසේ දැනගතයුතුවූයේ ඉතා දුකසේ දැනගතයුතුවූයේ වේනම් ශ්‍රමණ තෙම දුකසේ දැනගතයුත්තේය බ්‍රාහමණතෙම දුකසේ දැනගත යුත්තේයයි මේ වචනය කියන්ට වටී. කාශ්‍යපය, යම් හෙයකින් භික්‍ෂුතෙම වෛරවෛරරහිතවූ දෞර්‍මනස්‍යව්‍යාපාදරහිතවූ මෙත් සිත්වඩාද ආශ්‍රවයන්ගේ ක්‍ෂයකිරීමෙන් ආශ්‍රවරහිතවූ ඵලසමාධියද ඵලප්‍රඥාවද ඉහාත්මභාවයෙහිමතෙමේ විශිෂ්ටඥානයෙන්දන ප්‍රත්‍යක්‍ෂ කොට ඊට පැමිණ වාසයකෙරේද, කාශ්‍යපය, මේභික්‍ෂුතෙම ශ්‍රමණයයිද බ්‍රාහ්මණයයිද කියනු ලැබේ.

18. මෙසේවදාළකල්හි අචෙලකාශ්‍යපතෙම පින්වත් ගෞතමය, ඒ ශීලසම්පදා තොමෝ කවරිද චිත්තසම්පදා තොමෝකවරිද, ප්‍රඥා සම්පදා තොමෝ කවරිදැයි භාග්‍යවතුන්වහන්සේ මේ වචනය විචාළේය. කාශ්‍යපය, අභිත්වූ සම්‍යක් සම්බුද්ධවූ තථාගතතෙම මේ ලොකයෙහි උපදී–පෙ–බියදක්නා සුලුවූයේ සමාදන්වශික්‍ෂාපදයන්හි හික්මෙයි කුසල්වූකාය කර්‍ම වචීකර්‍මයෙන් යුක්තවූයේ පිරිසිදුවූ ආජීවය ඇත්තේ ශීලයෙන්යුක්තවූයේ ඉන්ද්‍රියයන්හි වසනලද ද්වාර ඇත්තේ ලදදෙයකින් සතුටුවූයේ වෙයි. කාශ්‍යපය, භික්‍ෂුතෙම කෙසේ ශීලයෙන් යුක්තවූයේ වේදයත්.

ඉධ කස්සප භික්ඛු පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති, නිහිතදණ්ඩො, නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බපාණභූතහිතානුකම්පී විහරති. ඉදම්පිස්ස හොති සීලසම්පදාය. යථා සාමඤ්ඤඵලෙ එවං විත්ථාරෙ තබ්බං. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා, තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති. සෙය්‍යථිදං, සන්තිකම්මං පණිධිකම්මං—පෙ—ඔසධීනං පටිමොක්ඛො ඉතිවා. ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති ඉදමස්ස හොති සීලසම්පදාය. ස ඛො සො කස්සප භික්ඛු එවං සීලසම්පන්නො න කුතොචි භයං සමනුපස්සති, යදිදං සීලසංවරතො. සෙය්‍යථාපි කස්සප රාජා ඛත්තියො මුද්ධාවසිත්තො නිහතපච්චාමිත්තො න කුතොචි භයං සමනුපස්සති, යදිදං පච්චත්ථිකතො, එවමෙව ඛො කස්සප භික්ඛු එවං සීලසම්පන්නො න කුතොචි භයං සමනුපස්සති, යදිදං සීලසංවරතො.

කාශ්‍යපය, මේ ශාසනයෙහි භික්‍ෂුතෙම ප්‍රාණඝාතය දුරුකොට ප්‍රාණඝාතයෙන් වැළැක්කේ වෙයිද ඒ පිණිස දඬුගෙණ නොපවත්නා බැවින් තබනලද දඬුඇත්තේ වෙයිද තබනලද ශස්ත්‍රඇත්තේ වෙයිද පාපයෙහි ලජ්ජාඇත්තේ වෙයිද දයාවට පැමිණියේ වෙයිද සකල ප්‍රාණීවූවන් කෙරෙහි හිතයෙන් අනුකම්පා ඇතිව වාසය කෙරෙයිද මේද ඒ භික්‍ෂුහුගේ ශීලසම්පත්තිය වෙයි. සාමඤ්ඤඵල සූත්‍රයෙහිමෙන් විස්තර කටයුතුයි. යම්බඳුවූ සමහර පින්වත් මහණබමුණු කෙනෙක් ඇද්ද ඔව්හු සැදැහැයෙන් දුන් භොජනයන් අනුභවකොට මෙබඳුවූ තිරශ්චීනවිද්‍යාහෙතුකොටගෙණ ලාමක ජීවිකාවෙන් ජීවිකාව කෙරෙත්. ඒ කවරේද, ශාන්තිකර්මය ප්‍රණිධිකර්මය—පෙ—ඖෂධාපනයයි මෙසේ හෝ මෙබඳු තිරශ්චීන විද්‍යාහෙතුකොටගෙණ ලාමකජීවිකාවෙන් වැළැක්කේ වෙයිද මෝ තොමෝ ඒ භික්‍ෂුහුගේ ශීලසම්පත්තිය වෙයි. කාශ්‍යපය, මෙබඳුසිල් ඇත්තාවූ මේ භික්‍ෂුතෙම යම් මේ ශීලසංවරයෙක් ඇද්ද ඒ කිසිශීලසංවරයකින් බිය නොදකී. කාශ්‍යපය, යම්සේ නසනලද පසමිතුරන් ඇත්තාවූ රාජ්‍යාභිෂෙකකරණලදක්‍ෂත්‍රියරජෙක් යම් මේපසමිතුරන්ගේභයෙක් ඇද්ද ඒකිසිපසමිතුරෙකුකෙරෙන් බිය නොදකීද. කාශ්‍යපය, එපරිද්දෙන්ම මෙබඳු සිල්ඇත්තාවූ භික්‍ෂුතෙම යම් මේ ශීලසංවරයෙක්ඇද්ද ඒකිසි ශීලසංවරයකින් බියක් නොදකී.

සො ඉමිනා අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො අජ්ඣත්තං අනවජ්ජසුඛං පටිසංවෙදෙති. එවං ඛො කස්සප භික්ඛු සීලසම්පන්නො හොති. අයං ඛො සා කස්සප සීලසම්පදා—පෙ—පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති ඉදමස්ස හොති චිත්තසම්පදාය. —පෙ— දුතියජ්ඣානං—පෙ—තතියජ්ඣානං—පෙ— චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරති ඉදම්පිස්ස හොති චිත්තසම්පදාය. අයං ඛො කස්සප චිත්තසම්පදා. සො එවං සමාහිතෙ චිත්තෙ—පෙ—ඤාණදස්සනාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. ඉදමස්ස හොති පඤ්ඤාසම්පදාය—පෙ—නාපරං ඉත්ථත්තායාති පජානාති. ඉදම්පිස්ස හොති පඤ්ඤාසම්පදාය. අයං ඛො සා කස්සප පඤ්ඤාසම්පදා. ඉමාය ච කස්සප සීලසම්පදාය චිත්තසම්පදාය පඤ්ඤාසම්පදාය අඤ්ඤා සීලසම්පදා චිත්තසම්පදා පඤ්ඤාසම්පදා උත්තරිතරා වා පණීතතරා වා නත්ථි.

19. සන්ති කස්සප එකෙ සමණබ්‍රාහ්මණා සීලවාදා. තෙ අනෙකපරියායෙන සීලස්ස වණ්ණං භාසන්ති. යාවතා කස්සප අරියං පරමං සීලං, නාහං තත්ථ අත්තනො සමසමං සමනුපස්සාමි.

හෙතෙම මේ නිරුපක්ලේශවූ ශීලස්කන්ධයෙන් යුක්තවූයේ තමා තුළවූ අනවද්‍යසුඛය විඳී. කාශ්‍යපය, මෙසේ වනාහි භික්ෂුතෙම ශීලයෙන් යුක්තවූයේ වෙයි. කාශ්‍යපය, මේ වනාහි ශීලසම්පත් වෙයි.—පෙ—ප්‍රථමධ්‍යානය උපදවා වාසයකෙරෙයි. මේ මොහුගේ චිත්තසම්පත් වෙයි.—පෙ—ද්විතීයධ්‍යානය තෘතීයධ්‍යානය චතුර්ථධ්‍යානය උපදවා වාසයකෙරෙයිද මේද මොහුගේ චිත්තසම්පත් වෙයි. කාශ්‍යපය, මේ වනාහි චිත්තසම්පත් වෙයි. හෙතෙම මෙසේ සිත එකඟවූකල්හි—පෙ—ඥාණදර්ශනලාභයපිණිස සිත එලවයි, නමයි, ඒ මොහුගේ ප්‍රඥාසම්පත්වෙයි—පෙ—වර්තමානස්කන්ධපරම්පරායෙන් අන්‍යවූ ස්කන්ධ පරම්පරාවක් නැත්තේයයි දනී, මේද මොහුගේ ප්‍රඥාසම්පත්තිය වෙයි. කාශ්‍යපය, මේවනාහි ප්‍රඥාසම්පත්වෙයි. කාශ්‍යපය, මේ ශීලසම්පත්තියටද මේ චිත්තසම්පත්තියටද මේ ප්‍රඥාසම්පත්තියටද අතිශයින් උතුම්වූ හෝ අතිශයින් උත්කෘෂ්ටවූ අන්‍ය ශීලසම්පත්තියක්ද චිත්තසම්පත්තියක්ද ප්‍රඥාසම්පත්තියක්ද නැත්තීය.

19. කාශ්‍යපය, ශීලවාදීවූ සමහර මහණබමුණුකෙනෙක් වෙත්ද ඔව්හු නොයෙක් කාරණයෙන් ශීලයෙහි ගුණකියත්. කාශ්‍යපය යම්පමණ නිරුපක්ලේශීවූ උතුම්වූ ශීලයෙක් වේද, මම ඒ ශීලයෙහි තමාගේ ශීලය වැනි ශීලයෙන් සමවූවෙකු නොදක්නෙමි,

කුතො භිය්‍යො. අථ ඛො අහමෙව තත්‍ථ භිය්‍යො යදිදං අධිසීලං. සන්ති කස්සප එකෙ සමණබ්‍රාහ්මණා තපොජිගුච්ඡාවාදා. තෙ අනෙකපරියායෙන තපොජිගුච්ඡාය වණ්ණං භාසන්ති. යාවතා කස්සප අරියා පරමා තපොජිගුච්ඡා නාහං තත්‍ථ අත්තනො සමසමං සමනුපස්සාමි කුතො භිය්‍යො. අථ ඛො අහමෙව තත්‍ථ භිය්‍යො යදිදං අධිජෙගුච්ඡං. සන්ති කස්සප එකෙ සමණබ්‍රාහ්මණා පඤ්ඤාවාදා. තෙ අනෙකපරියායෙන පඤ්ඤාය වණ්ණං භාසන්ති. යාවතා කස්සප අරියා පරමා පඤ්ඤා, නාහං තත්‍ථ අත්තනො සමසමං සමනුස්සාමි කුතො භිය්‍යො. අථ ඛො අහමෙව තත්‍ථ භිය්‍යො යදිදං අධිපඤ්ඤා. සන්ති කස්සප එකෙ සමණබ්‍රාහ්මණා විමුත්තිවාදා. තෙ අනෙකපරියායෙන විමුත්තියා වණ්ණං භාසන්ති යාවතා කස්සප අරියා පරමා විමුත්ති, නාහං තත්‍ථ අත්තනො සමසමං සමනුපස්සාමි කුතො භිය්‍යො. අථ ඛො අහමෙව තත්‍ථ භිය්‍යො යදිදං අධිවිමුත්ති.

උත්තමයෙක් කොයින් වේද, එසේකල යම් මේ අධිශීලයෙක් හෙවත් උත්තම ශීලයෙක් වේද, ඒ ශීලයෙහි මමම උතුම්වෙමි. කාශ්‍යපය, කෙලෙස් තැවීම් ගැරහීම් වාදඇත්තාවූ සමහර මහණබමුණු කෙනෙක් ඇත්තාහ. ඔව්හු නොයෙක් කාරණයෙන් කෙලෙස් තැවීම් ගැරහීම්හි ගුණකියත්. කාශ්‍යපය, යම් පමණ නිර්දොෂවූ උතුම්වූ කෙලෙස් තැවීම් ගැරහීම් වෙත්ද, මම එහි තමහට සමසමයක්හු නොදක්නෙමි. උතුම්වූවෙක් කොයින් වේද, එසේකල යම් ඒ අධිකවූ ගැරහීමක් වේද, මමම එහි උතුම් වූයේ වෙමි. කාශ්‍යපය, කම්මස්සකවිපස්සනා පඤ්ඤාසඞ්ඛ්‍යාතවූ ප්‍රඥාවාදීවූ සමහර මහණබමුණුකෙනෙක් ඇත්තාහ. ඔව්හු නොයෙක් කාරණයෙන් කම්මස්සකවිපස්සනාසඞ්ඛ්‍යාතවූ ප්‍රඥායෙහි ගුණකියත්. කශ්‍යපය, යම්පමණ මාර්ගඵල සම්ප්‍රයුක්ත නික්ලෙශවූ උතුම්වූ ප්‍රඥාවක් වේද, මම එහි තමන්ගේ ප්‍රඥාව වැනි ප්‍රඥාවෙන් සමවූවෙකු නොදක්නෙමි. උතුම්වූවෙක් කොයින්වේද, එසේකල යම් මේ මාර්ගඵල සම්ප්‍රයුක්ත අධිප්‍රඥාවෙක් වේද එහි මමම උතුම්වූයේවෙමි. කාශ්‍යපය, තදඞ්ගවික්ඛම්භන විමුක්තිවාදීවූ සමහරමහණබමුණුකෙනෙක් ඇත්ල, ඔහුතුමූ නොයෙක් කාරණයෙන් තදඞ්ගවික්ඛම්භන විමුක්තියෙහි ගුණකියත්. කාශ්‍යපය, යම් පමණ සමුච්ඡෙද පටිප්පස්සද්ධිනිස්සරණ සඞ්ඛ්‍යාතවූ නිර්දොෂවූ උතුම්වූ විමුක්තියක් වේද මම එහි තමාගේවිමුක්තිය වැනි විමුක්තියෙන් සමවූවක්හු නොදක්නෙමි. උතුම්වූවෙක් කොයින් වේද එසේකල යම් මේ සමුච්ඡෙදපටිප්පස්සද්ධිනිස්සරණ සඞ්ඛ්‍යාතවූ අධිවිමුක්තියක් වේද, එහි මමම උතුම්වූයේ වෙමි.

20. ඨානං බො පනෙතං කස්සප විජ්ජති යං අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං වදෙය්‍යුං. සීහනාදං බො සමණො ගොතමො නදති, තඤ්ච බො සුඤ්ඤාගාරෙ නදති නො පරිසාසූති. තෙ මාහෙ වනාහි අස්සු වචනීයා සීහනාදඤ්ච සමණො ගොතමො නදති පරිසාසු ච නදතීති එවමස්සු කස්සප වචනීයා. ඨානං බො පනෙතං කස්සප විජ්ජති යං අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං වදෙය්‍යුං සීහනාදඤ්ච සමණො ගොතමො නදති, පරිසාසු ච නදති, නච බො විසාරදො ච නදති විසාරදො ච නදති…පෙ…නච ඛො නං පඤ්හං පුච්ඡන්ති පඤ්හඤ්ච නං පුච්ඡන්ති…පෙ…නච බො පනෙතං පඤ්හං පුට්ඨො ව්‍යාකරොති පඤ්හඤ්ච තෙසං පුට්ඨො ව්‍යාකරොති…පෙ…නච බො පඤ්හස්ස වෙය්‍යාකරණෙන චිත්තං ආරාධෙති පඤ්හස්සච වෙය්‍යාකරණෙන චිත්තං ආරාධෙති…පෙ…

20. කාශ්‍යපය, ගෞතමශ්‍රමණතෙම අභීතවූ සිංහනාද කෙරෙයි. ඒ නාදයද ජනශූන්‍ය ස්ථානයෙහි හුදකලාව ඉඳ කෙරෙයි අෂ්ටපර්ෂද්හි නොකෙරේයයි අන්‍යතීර්ථික පරිව්‍රාජකයෝ මෙසේ කියන්නාහුය යන යම් කාරණයෙක් ඇද්ද මේ කාරණය විද්‍යමාන වේමය. එතකුදුවුවත් ඔවුහු මෙසේ කියනුහැක්කෝ නොවන්නාහුමය. කාශ්‍යපය, ගෞතමශ්‍රමණතෙම අභීතවූ සිංහනාදද කෙරෙයි අෂ්ටපර්ෂද්හිද නාදකෙරේයයි මෙසේ කියනුහැකිවන්නාහුය කාශ්‍යපය, ගෞතමශ්‍රමණතෙම සිංහනාදද කෙරෙයි. අෂ්ටපර්ෂද්හිද නාද කෙරෙයි විසාරදව හෙවත් විගතලොමහර්ෂව නාදකෙරෙයි. අන්‍යතීර්ථික පරිව්‍රාජකයෝ මෙසේ කියන්නාහුය යන යම් කාරණයෙක් වේද මේ කාරණය වනාහි විද්‍යමාන නොවේ. එතකුදුවුවත් ඔවුහු මෙසේ කියනුහැක්කෝ නොවන්නාහුමය. කාශ්‍යපය, ගෞතම ශ්‍රමණතෙම අභීතවූ සිංහනාදද කෙරෙයි අෂ්ටපර්ෂද්හිද නාදකෙරෙයි. විසාරදව හෙවත් විගතලොමහර්ෂවද නාදකෙරේයයි මෙසේ කියනුහැක්කෝ වන්නාහුමය. කාශ්‍යපය, ගෞතමශ්‍රමණතෙම අභීතවූ සිංහනාදද කෙරෙයි. අෂ්ටපර්ෂද්හිද නාදකෙරෙයි, විසාරදව හෙවත් විගතලොමහර්ෂවද නාදකෙරෙයි, ඒ ගෞතමශ්‍රමණයන් අතින් පණ්ඩිත දිව්‍යමනුෂ්‍යයෝ ප්‍රශ්න නොවිචාරත්—පෙ—ඒ ගෞතමශ්‍රමණයන් අතින් පණ්ඩිත දිව්‍යමනුෂ්‍යයෝ ප්‍රශ්නද විචාරත්, ඔවුන්විසින් ප්‍රශ්න විචාරණලද්දේ නොවිසඳයි. ඔවුන්විසින් ප්‍රශ්න විචාරණලද්දේ විසඳයි. ප්‍රශ්න විසඳීමෙන් සිත්නොගණී. ප්‍රශ්න විසර්ජනයෙන් සිත්ගැණීමද කෙරෙයි.

නච බො සොතබ්බං අස්ස මඤ්ඤන්ති. සො තබ්බං චස්ස මඤ්ඤන්ති …පෙ… නච බො සුත්වා පසීදන්ති සුත්වා චස්ස පසීදන්ති …පෙ… නච බො පසන්නා පසන්නාකාරං කරොන්ති පසන්නාකාරඤ්ච කරොන්ති …පෙ… නච බො තථත්තාය පටිපජ්ජන්ති, තථත්තායච පටිපජ්ජන්ති …පෙ… නච බො පටිපන්නා ආරාධෙන්තීති. තෙ මාහෙවං අස්සු වචනීයා. සීහනාදඤ්ච සමණො ගොතමො නදති, පරිසාසු ච නදති, විසාරදො ච නදති, පඤ්හඤ්ච නං පුච්ඡන්ති. පඤ්හඤ්ච නෙසං පුට්ඨො ව්‍යාකරොති, පඤ්හස්ස වෙය්‍යාකරණෙන චිත්තං ආරාධෙති, සො තබ්බං චස්ස මඤ්ඤන්ති, සුත්වා ච පසීදන්ති, පසන්නා ච පසන්නාකාරං කරොන්ති, තථත්තාය ච පටිපජ්ජන්ති, පටිපන්නා ච ආරාධෙන්තීති, එවමස්සු කස්සප වචනීයා.

21. එකමිදාහං කස්සප සමයං රජගහෙ විහරාමි ගිජ්ඣකූටෙ පබ්බතෙ. තත්‍ර මං අඤ්ඤතරො තපොබ්‍රහ්මචාරී නිග්‍රොධො නාම අධිජෙගුච්ඡෙ පඤ්හං පුච්ඡි. තස්සාහං අධිජෙගුච්ඡෙ පඤ්හං පුට්ඨො ව්‍යාකාසිං

මොහුගේ වචන ඇසියයුතුයයි නොහඟිත්. මොහුගේ වචන ඇසියයුතුයයිද හඟිත්. අසා නොපහදිත්. අසාද පහදිත්. පහන් ආකාරයක් නොකෙරෙත්. පහන්ආකාරයක්ද කෙරෙත්. දෙසූ ධර්මයසේවනුපිණිස පිළිනොපදිත්. දෙසූධර්මය සේවනුපිණිස පිළිපැදීමද කෙරෙත්. දෙසූධර්මයසේ පිළිපදින්නාහු ගෞතමශ්‍රමණයන්ගේ සිත්නොගණිත්යයි ඔහුතුමූ මෙසේ කියනුහැක්කෝ නොවන්නාහුමය. ගෞතමශ්‍රමණතෙම අභීතවූ සිංහනාදද කෙරෙයි, අෂ්ටපර්ෂද්හිද නාදකෙරෙයි, විසාරදව හෙවත් විගතලොමහර්ෂීවද නාදකෙරෙයි ඒ ගෞතමශ්‍රමණයන් අතින් පණ්ඩිත දිව්‍යමනුෂ්‍යයෝ ප්‍රශ්නද විචාරත්. ඔවුන්විසින් ප්‍රශ්න විචාරණලද්දේ විසඳීමද කෙරෙයි. ප්‍රශ්න විසර්ජනයෙන් සිත්ගැණීමද කෙරෙයි. මොහුගේ වචන ඇසියයුතුයයිද හඟිත්. අසාද පහදිත්. පහන්ආකාරද කෙරෙත්. දෙසූධර්මය සේවනුපිණිස පිළිපදිත්. දෙසූධර්මය සේවනුපිණිස පිළිපදින්නාහු ගෞතමශ්‍රමණයන්ගේ සිත්ගණිත්යයි කාශ්‍යපය, මෙසේකියනුහැක්කෝ වන්නාහුය.

21. කාශ්‍යපය, මම එක්කාලයෙක්හි මෙහි රජගහනුවර සමීපයෙහිවූ ගිජුකුළුපව්වෙහි වෙසෙමි. එහි නිග්‍රොධනම්වූ තපොබ්‍රහ්මචාරියෙක් අධිජෙගුච්ඡවීර්‍යයෙහි මා ප්‍රශ්න විචාළේය. ඔහුවිසින් අධිජෙගුච්ඡවීර්‍යයෙහි ප්‍රශ්න විචාරණලද්දාවූ මම විසඳූයෙමි.

ව්‍යාකතෙ ච පන මෙ අත්තමනො අහොසි, පරං විය මත්තායාති. කොහි භන්තෙ භගවතො ධම්මං සුත්වා න අත්තමනො අස්ස පරං විය මත්තාය. අහම්පි භන්තෙ භගවතො ධම්මං සුත්වා අත්තමනො පරං විය මත්තාය. අභික්කන්තං භන්තෙ, අභික්කන්තං භන්තෙ. සෙය්‍යථාපි භන්තෙ නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නං වා විවරෙය්‍ය මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති. එවමෙවං භගවතා අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භන්තෙ භගවන්තං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. ලභෙය්‍යාමහං භන්තෙ භගවතො සන්තිකෙ පබ්බජ්ජං, ලභෙය්‍යං උපසම්පදන්ති.

22. යො ඛො කස්සප අඤ්ඤතිත්ථියපුබ්බො ඉමස්මිං ධම්මවිනයෙ ආකඞ්ඛති පබ්බජ්ජං ආකඞ්ඛති උපසම්පදං. සො චත්තාරො මාසෙ පරිවසති, චතුන්නං මාසානං අච්චයෙන ආරද්ධචිත්තා භික්ඛූ පබ්බාජෙන්ති උපසම්පාදෙන්ති භික්ඛුභාවාය. අපි ච මෙත්ථ පුග්ගලවෙමත්තතා විදිතාති.

මාවිසින් විසඳනු ලැබූකල්හි ඉතා වැඩියක්ම සතුටුසිත් ඇත්තේවූයේ යයි වදාළසේක. ස්වාමීනි, භාග්‍යවතුන්වහන්සේගේ ධර්මය අසා කව රෙක්නම් ඉතාවැඩියක් සතුටුසිත් ඇත්තේ නොවන්නේද? ස්වාමීනි, මමද භාග්‍යවතුන්වහන්සේගේ ධර්මය අසා ඉතා වැඩියක්ම සතුටුසිත් ඇත්තෙක්වීමි. ස්වාමීනි, දම්දෙසුම ඉතා මැනව. ස්වාමීනි, ඒ ඉතාමැනව. ස්වාමීනි, යටිකුරුකරණලද්දක් උඩුකුරුකරන්නේ හෝ වසනලද්දක් විවෘතකරන්නේ හෝ මංමුළාවූවෙකුට මාර්ගය කියන්නේ හෝ ඇස් ඇත්තෝ රූපයන් දකිත්වායි අඳුරෙහි තෙල් පහනක් දරන්නේ හෝ යම්සේද. එපරිද්දෙන්ම භාග්‍යවතුන්වහන්සේවිසින් නොයෙක් කාරණයෙන් ධර්මය ප්‍රකාශකරණලද්දේය. ස්වාමීනි, ඒ මම භාග්‍ය වතුන්වහන්සේද ධර්මයද භික්‍ෂුසඞ්ඝයාද සරණකොට යමි. ස්වාමීනි, මම භාග්‍යවතුන්වහන්සේගේ සමීපයෙහි පැවිද්ද ලබන්නෙමි. උප සම්පදාවද ලබන්නෙමියි සැලකළේය.

22. කාශ්‍යපය. අන්‍යතීර්ථිකවූ යමෙක් මේ ශාසනයෙහි පැවිද්ද කැමතිවේද, උපසම්පදාව කැමතිවේද, හෙතෙම සාරමසක් පිරිවෙස් කෙරේ. සාරමසක්හුගේ ඇවෑමෙන් සතුටුකරණුලැබූ භික්‍ෂූහු ඔහු පැවිදි කෙරෙත්. භික්‍ෂුභාවයපිණිස උපසම්පදා කෙරෙත්. එතකුදු වුවත් මවිසින් මෙහි පුද්ගල නානාත්වය දන්නාලද්දේයයි වදාළසේක.

සචෙ භන්තෙ අඤ්ඤතිත්ථියපුබ්බා ඉමස්මිං ධම්මවිනයෙ ආකඞ්ඛන්ති පබ්බජ්ජං ආකඞ්ඛන්ති උපසම්පදං චත්තාරො මාසෙ පරිවසන්ති, චතුන්නං මාසානං අච්චයෙන ආරද්ධචිත්තා භික්ඛූ පබ්බාජෙන්ති උපසම්පාදෙන්ති භික්ඛුභාවාය, අහං චත්තාරි වස්සානි පරිවසිස්සාමි, චතුන්නං වස්සානං අච්චයෙන ආරද්ධචිත්තා භික්ඛූ පබ්බාජෙන්තු උපසම්පාදෙන්තු භික්ඛුභාවායාති. අලත්ථ ඛො අචෙලො කස්සපො භගවතො සන්තිකෙ පබ්බජ්ජං අලත්ථූපසම්පදං. අචිරූපසම්පන්නො ඛො පනායස්මා කස්සපො එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො, න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති අබ්භඤ්ඤාසි. අඤ්ඤතරො ච ඛො පනායස්මා කස්සපො අරහතං අහොසීති.

කස්සපසීහනාදසුත්තං

නිට්ඨිතං අට්ඨමං.

ස්වාමීනි, ඉදින් අන්‍යතීර්ථකවිරුහු මේ ශාසනයෙහි ප්‍රව්‍රජ්‍යාව කැමති වෙත්ද, උපසම්පදාව කැමතිවෙත්ද, ඔහුතුමූ සාරමසක් පිරිවෙසෙත්ද සාරමසක්හුගේ ඇවෑමෙන් සතුටුකරණලද සිත්ඇති භික්ෂූහු ඔහු පැවිදිකරත්ද, භික්ෂුභාවයපිණිස උපසම්පදා කෙරෙත්ද, මම සිව්වසක් පිරිවෙස්කරමි සිව්වසක්හුගේ ඇවෑමෙන් සතුටුකරණලද සිත් ඇති භික්ෂූහු මා පැවිදි කෙරෙත්වා. භික්ෂුභාවයපිණිස උපසම්පදා කෙරෙත්වායි කීයේය. අචෙලකාශ්‍යපතෙම භාග්‍යවතුන්වහන්සේගේ සමීපයෙහි ප්‍රව්‍රජ්‍යාව ලැබූයේමය. උපසම්පදාවද ලැබූයේමය. මෑත උපසම්පදාවූ ආයුෂ්මත් කාශ්‍යපතෙම තනිවූයේ සමූහයාංගෙන් තොර වූයේ අප්‍රමාදවූයේ කෙලෙස්තවන වීර්‍ය්‍යඇත්තේ හරණලද ආත්මාලය ඇතිව වාසයකරන්නේ යමක් සඳහා කුලපුත්‍රයෝ ගිහිගෙයින් නික්ම ශාසනයෙහි මනාකොට පැවිදිවෙත්ද, බ්‍රහ්මචර්‍ය්‍යාව කෙළවර කොටඇති නිරුත්තරවූ ඒ අර්හත්වය නොබෝකලකින්ම තෙමේ ඉහාත්මයෙහි විශිෂ්ටඥානයෙන් දැනප්‍රත්‍යක්ෂකොට ඊටපැමිණවාසයකෙළේය උත්පත්තිතොමෝ ක්ෂයවිය. මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව වැස නිමවනලද්දීය. කටයුතුකොට නිමවනලද්දේය. මේ ස්කන්ධසන්තානයපිණිස අනිකක් නැත්තේයයි දත්තේය. ආයුෂ්මත් කාශ්‍යපතෙම රහතන් වහන්සේලාට ඇතුළත් කෙනෙක්ම වූයේය.

අටවෙනිවූ කාශ්‍යපසිංහනාදසූත්‍රාර්ථව්‍යාඛ්‍යාව

නිමියේයි.

IX පොට්ඨපාදසුත්තං.

1. එවං මෙ සුතං. එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන පොට්ඨපාදො පරිබ්බාජකො සමයප්පවාදකෙ තින්දුකාචීරෙ එකසාලකෙ මල්ලිකාය ආරාමෙ පටිවසති මහතියා පරිබ්බාජකපරිසාය සද්ධිං තිංසමත්තෙහි පරිබ්බාජකසතෙහි.

2. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සාවත්ථිං පිණ්ඩාය පාවිසි. අථ ඛො භගවතො එතදහොසි. අතිප්පගො ඛො තාව සාවත්ථියං පිණ්ඩාය චරිතුං, යන්නූනාහං සමයප්පවාදකො තින්දුකාචීරො එකසාලකො මල්ලිකාය ආරාමො යෙන පොට්ඨපාදො පරිබ්බාජකො තෙනුපසංකමෙය්‍යන්ති.

පොට්ඨපාදසූත්‍රාර්ථව්‍යාඛ්‍යා.

1. මේ සූත්‍රධර්මය මාවිසින් මෙසේ අසනලදී. එක්කාලයෙක්හි භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවරසමීපයෙහිවූ අනේපිඬුමහසිටානන්විසින් කරවා පිළිගන්වනලද දෙව්රම්වෙහෙර වැඩවාසයකරණසේක. ඒකාලයෙහිදී පොට්ඨපාදනම් පරිබ්‍රාජකතෙම බමුණුනිවට අසෙල් පිරිවැජියන් රැස්වඉඳ තමතමන් සමය ප්‍රකාශකරණබැවින් සමයප්පවාදකනම්වූ තිඹිරිරුක්පෙළින් වටකළහෙයින් තින්දුකාචීරනම්වූ පළමු එක්ශාලාවක්වූ බැවින් එකශාලකනම්වූ පසේනදිකොසොල්රජ්ජුරුවන්ගේ දේවියවූ මල්ලිකාවගේ උයනෙහිවූ ආරාමයෙහි තුන්දහසක් පිරිවැජියන්ඇති මහත් පිරිවැජිපිරිස සමග වාසයකෙරෙයි.

2. එකල්හිදී භාග්‍යවතුන්වහන්සේ පෙරවරුකාලයෙහි හැඳපොරවා අතින් පාත්‍රය හා කයින් සිවුරුගෙණ සැවැත්නුවරට පිඬුපිණිස පිවිසිසේක. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේට මෙබඳුසිතිවිල්ලෙක් පහළවිය. පළමුකොට සැවැත්නුවර පිඬුපිණිස හැසිරීමට කල් ඉතා බොහෝවෙයි. එහෙයින් ඉදින් මම සමයපපවාදකනම්වූද, තින්දුකාචීරනම්වූද, එකශාලකනම්වූද, මල්ලිකාවගේ උයනෙහිවූ ආරාමය යම්තැනෙක්හිද පොට්ඨපාද පරිබ්‍රාජකතෙම යම්තැනෙක්හිද එතනට එළඹෙන්නෙම්නම් ඉතා යෙහෙකැයි කියාති.

අථඛො භගවා යෙන සමයප්පවාදකො තින්දුකාචීරො එකසාලකො මල්ලිකාය ආරාමො තෙනුපසඞ්කමි.

3. තෙන ඛො පන සමයෙන පොට්ඨපාදො පරිබ්බාජකො මහතියා පරිබ්බාජකපරිසාය සද්ධිං නිසින්නො හොති උන්නාදිනියා උච්චාසද්දමහාසද්දාය අනෙකවිහිතං තිරච්ඡානකථං කථෙන්තියා, සෙය්‍යථිදං, රාජකථං චොරකථං මහාමත්තකථං සෙනාකථං භයකථං යුද්ධකථං අන්නකථං පානකථං වත්ථකථං සයනකථං ගන්ධකථං මාලාකථං ඤාතිකථං යානකථං ගාමකථං නිගමකථං නගරකථං ජනපදකථං ඉත්ථිකථං සූරකථං විසිඛාකථං කුම්භට්ඨානකථං පුබ්බපෙතකථං නානත්තකථං ලොකක්ඛායිකං සමුද්දක්ඛායිකං ඉතිභවාභවකථං ඉතිවාති.

4. අද්දසා ඛො පොට්ඨපාදො පරිබ්බාජකො භගවන්තං දූරතොව ආගච්ඡන්තං.

ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ සමයප්පවාදකනම්වූද තින්දුකාචීරනම්වූද එකශාලකනම්වූද මල්ලිකාවගේ උයනෙහිවූ ආරාමය යම් තැනෙක්හිද එතනට එළඹිසේක.

3. ඒකාලයෙහිදී පොට්ඨපාදපරිබ්‍රාජකතෙම ස්වර්ගමොක්ෂබාධකවූ නානාවිධ තිරශ්චීන කථාකරන්නාවූ උස් මහත් හඬින් උසස්ව නාද කරන්නාවූ මහත් පරිබ්‍රාජක පිරිසක්සමග උන්නේ වේ. ඒ කවරේද යත්, රජදරුවන් අරබයා පැවති කථාය, සොරුන් අරබයා පැවති කථාය, මහඇමතියන් අරබයා පැවති කථාය, සෙනානිශ්‍රිත කථාය, භයනිශ්‍රිත කථාය, යුද්ධනිශ්‍රිත කථාය, ආහාරනිශ්‍රිත කථාය, පානනිශ්‍රිත කථාය, වස්ත්‍රනිශ්‍රිත කථාය, ශයනනිශ්‍රිත කථාය, මාලානිශ්‍රිත කථාය, ගන්ධනිශ්‍රිත කථාය, ඥාතිනිශ්‍රිත කථාය, යානනිශ්‍රිත කථාය, ග්‍රාමනිශ්‍රිත කථාය, නිගමනිශ්‍රිත කථාය, නගරනිශ්‍රිත කථාය, ජනපදනිශ්‍රිත කථාය, ස්ත්‍රීනිශ්‍රිත කථාය, යොධනිශ්‍රිත කථාය, වීථිනිශ්‍රිත කථාය, කුම්භදාසීන්නිශ්‍රිත කථාය, මළනෑයන් අරබයා පැවති කථාය, නානාභාවඇති ව්‍යර්ථ කථාය, ලෝකායතසංලාපකථානම්වූ ලොකාඛ්‍යායිකකථාය, සමුද්‍රයපිළිබඳ ව්‍යර්ථකථානම්වූ සමුද්‍රාඛ්‍යායික කථාය, භවනම්වෘද්ධිය අභවනම් පරිහාණියයි මෙබඳු භවාභව කථා හැර නිරර්ථක කාරණයන් දක්වා මේ කාරණයෙන් භවය, මේ කාරණයෙන් අභවයයි මෙසේ පැවති කථායි.

4. පොට්ඨපාද පරිබ්‍රාජකතෙම ඒ වඩනා භාග්‍යවතුන්වහන්සේ දුර දීම දුටුයේමය.

දිස්වා සකං පරිසං සණ්ඨාපෙසි. අප්පසද්දා භොන්තො හොන්තු. මා භොන්තො සද්දමකත්ථ. අයං සමණො ගොතමො ආගච්ඡති, අප්පසද්දකාමො ඛො පන සො ආයස්මා අප්පසද්දස්ස වණ්ණවාදී, අප්පෙව නාම අප්පසද්දං පරිසං විදිත්වා උපසඞ්කමිතබ්බං මඤ්ඤෙය්‍යාති. එවං වුත්තෙ තෙ පරිබ්බාජකා තුණ්හී අහෙසුං.

5. අථ ඛො භගවා යෙන පොට්ඨපාදො පරිබ්බාජකො තෙනුපසඞ්කමි. අථ ඛො පොට්ඨපාදො පරිබ්බාජකො භගවන්තං එතදවොච. එතු ඛො භන්තෙ භගවා, සාගතං භන්තෙ භගවතො. චිරස්සං ඛො භන්තෙ භගවා, ඉමං පරියායමකාසි යදිදං ඉධාගමනාය. නිසීදතු භන්තෙ භගවා ඉදමාසනං පඤ්ඤත්තන්ති. නිසීදි භගවා පඤ්ඤත්තෙ ආසනෙ. පොට්ඨපාදො ඛො පරිබ්බාජකො අඤ්ඤතරං නීචං ආසනං ගහෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො පොට්ඨපාදං පරිබ්බාජකං භගවා එතදවොච. කායනුත්ථ පොට්ඨපාද එතරහි කථාය සන්නිසින්නා, කා ච පන වො අන්තරා කථා විප්පකතාති.

දැක පින්වත්හු ස්වල්ප ශබ්දඇත්තෝ වව්, පින්වත්හු ශබ්ද නොකරව්, මේ ගෞතම ශ්‍රමණතෙම එයි, ඒ ආයුෂ්මත්තෙම ශබ්දයට නොකැමැත්තේ ශබ්දනොකිරීමෙහි ගුණ කියන සුළුවූයේ වෙති, පිරිස ශබ්දරහිතවූවා දැන එළඹියයුතුයි සිතන්නේනම් මැනවැයි, සියපිරිස හික්මවාලූයේය. මෙසේ කීකල්හි ඒ පරිබ්‍රාජකයෝ නිශ්ශබ්දවූහ.

5. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ පොට්ඨපාද පරිබ්‍රාජකතෙම යම්තැනෙක්හිද එතනට එළඹිසේක. එකල්හි පොට්ඨපාද පරිබ්‍රාජකතෙම භාග්‍යවතුන්වහන්සේට මේ කාරණය සැලකළේය. ස්වාමීනි, භාග්‍යවතුන්වහන්ස, මෙහි වඩනාසේක්වා. ස්වාමීනි, භාග්‍යවතුන්වහන්සේට ආරොග්‍යද, භාග්‍යවතුන්වහන්සේගේ පැමිණීම අපට ප්‍රීතියකි. ස්වාමීනි, මෙහි යම් මේ වැඩමවීමක් වීනම් මේ වැඩමවීම භාග්‍යවත්තෙම බොහෝකලකින් කළසේක. ස්වාමීනි, භාග්‍යවතුන්වහන්ස, වැඩහිඳිනාසේක්වා. මේ අස්න පණවනලද්දේය කියායි. භාග්‍යවතුන්වහන්සේ පණවනලද අස්නෙහි වැඩහුන්සේක. පොට්ඨපාද පරිබ්‍රාජකතෙමේද එක් නිචාශනයක්ගෙණ එකත්පසක උන්නේය. එකත්පසකඋන්නාවූ පොට්ඨපාද පරිබ්‍රාජකයා භාග්‍යවතුන්වහන්සේ මේ කාරණය විචාළේය. පොට්ඨපාදය, දැන් මෙහි කිනම් කථාවකින් යුක්තව උන්නහුද, තොපගේ කිනම් අතර කථාවක් අඩාළවිද්දැයි යනුයි.

6. එවං වුත්තෙ පොට්ඨපාදො පරිබ්බාජකො භගවන්තං එතදවොච. තිට්ඨතෙසා භන්තෙ කථා යාය මයං එතරහි කථාය සන්නිසින්නා, නෙසා භන්තෙ කථා භගවතො දුල්ලභා භවිස්සති පච්ඡාපි සවණාය. පුරිමානි භන්තෙ දිවසානි පුරිමතරානි නානාතිත්ථියානං සමණබ්‍රාහ්මණානං කුතූහලසාලාය සන්නිසින්නානං සන්නිපතිතානං අභිසඤ්ඤානිරොධෙ කථා උදපාදි. කථංනු ඛො භො අභිසඤ්ඤානිරොධො හොතීති. තත්‍රෙකච්චෙ එවමාහංසු. අහෙතූ අප්පච්චයා පුරිසස්ස සඤ්ඤා උප්පජ්ජන්තිපි නිරුජ්ඣන්ති පි. යස්මිං සමයෙ උප්පජ්ජන්ති සඤ්ඤී තස්මිං සමයෙ හොති. යස්මිං සමයෙ නිරුජ්ඣන්ති, අසඤ්ඤී තස්මිං සමයෙ හොතීති. ඉත්ථෙකෙ අභිසඤ්ඤානිරොධං පඤ්ඤාපෙන්ති. තමඤ්ඤො එවමාහ. න ඛො නාමෙතං භො එවං භවිස්සති සඤ්ඤා හි භො පුරිසස්ස අත්තා, සා ච ඛො උපෙති පි අපෙති පි. යස්මිං සමයෙ උපෙති සඤ්ඤී තස්මිං සමයෙ හොති, යස්මිං සමයෙ අපෙති අසඤ්ඤී තස්මිං සමයෙ හොතීති. ඉත්ථෙකෙ අභිසඤ්ඤානිරොධං පඤ්ඤාපෙන්ති.

---

6. මෙසේ වදාළකල්හි පොට්ඨපාදපරිව්‍රාජකතෙම භාග්‍යවතුන්වහන්සේට මේ වචනය සැළකළේය. ස්වාමීනි, අපි දැන් යම් කථාවකින් යුක්තව උන්නමෝද ඒ කථාතොමෝ තිබුනා වේ. ස්වාමීනි, මේ කථාතොමෝ භාග්‍යවතුන්වහන්සේට පසුවත් අසන්නට දුලබ නොවන්නීය. ස්වාමීනි, පූර්වූද, ඉතා පූර්වූද, දවස්හි මේතෙම කුමක් කියාද මේතෙම කුමක් කියාදැයි අසනු කැමති කථා පවත්නාබැවින් කොතුහලකතාම්වූ ශාලාවක රැස්වඋන්නාවූ නොයෙක් තිර්ථකයන් හා මහණබමුණන් සම්බන්ධව පින්වත කෙසේ සංඥනිරොධය වේදැයි සංඥනිරොධකථාවක් පහලවීය, එහි සමහරු මෙසේ කීහු. පුරුෂයාගේ සංඥවෝ තුමූ හෙතු ප්‍රත්‍යයරහිතයෙන් උපදින්නාහුද නිරුඬවන්නාහුද වෙත්. යම්කලක සංඥවෝ උපදින්නාහුද එකල පුරුෂතෙම සංඥ හෙවත් සිහි ඇත්තේ වේ. යම් කලක සංඥවෝ නිරුඬවන්නාහුද එකල පුරුෂතෙම සංඥහෙවත් සිහිනැත්තේ වේයයි මෙසේ සමහරු සංඥනිරොධය ප්‍රකාශකෙරෙත්. ඔහට අනිකෙක් මෙසේ කියයි. පින්වත, මේ කාරණය වනාහි මෙසේ නොවන්නේය. පින්වත, සංඥතොමෝම පුරුෂයාගේ ආත්මය වෙයි. ඒ සංඥතොමෝ පහවන්නිද පැමිණෙන්නිද වෙයි. යම්කලක සංඥතොමෝ පහවන්නීද එකල පුරුෂතෙම සංඥරහිත වෙයි. යම්කලක සංඥතොමෝ පැමිණෙන්නීද එකල පුරුෂතෙම සංඥඇත්තේවේයයි මෙසේ සමහර කෙනෙක් සංඥානිරොධය ප්‍රකාශ කෙරෙත්.

තමඤ්ඤෙදු එවමාහ. නබො නාමෙතං භො එවම්භවිස්සති. සන්තිහි භො සමණබ්‍රාහ්මණා මහිද්ධිකා මහානුභාවා. තෙ ඉමස්ස පුරිසස්ස සඤ්ඤං උපකඩ්ඪන්ති පි අපකඩ්ඪන්ති පි. යස්මිං සමයෙ උපකඩ්ඪන්ති සඤ්ඤී තස්මිං සමයෙ හොති. යස්මිං සමයෙ අපකඩ්ඪන්ති අසඤ්ඤී තස්මිං සමයෙ හොතීති. ඉත්ථෙකෙ අභිසඤ්ඤා නිරොධං පඤ්ඤපෙන්ති. තමඤ්ඤෙදු එවමාහ. න ඛො නාමෙතං භො එවං භවිස්සති. සන්තිහි භො දෙවතා මහිද්ධිකා මහානුභාවා. තා ඉමස්ස පුරිසස්ස සඤ්ඤං උපකඩ්ඪන්ති පි අපකඩ්ඪන්ති පි. යස්මිං සමයෙ උපකඩ්ඪන්ති සඤ්ඤී තස්මිං සමයෙ හොති, යස්මිං සමයෙ අපකඩ්ඪන්ති අසඤ්ඤී තස්මිං සමයෙ හොතීති. ඉත්ථෙකෙ අභිසඤ්ඤානිරොධං පඤ්ඤපෙන්ති. තස්ස මය්හං භන්තෙ භගවන්තං යෙව ආරබ්භ සති උදපාදි. අහො නූන භගවා සුගතො, යො ඉමෙසං ධම්මානං සුකුසලොති. භගවා පකතඤ්ඤූ අභිසඤ්ඤා නිරොධස්ස. කථන්නු බො භන්තෙ අභිසඤ්ඤා නිරොධො හොතීති.

ඕහට අනිකෙක් මෙසේ කියයි. පින්වත, මේ කාරණය වනාහි මෙසේ නොවන්නේය. කෙසේවන්නේදයත් පින්වත, මහත්සෘඩිඇත්තාවූ මහත් ආනුභාව ඇත්තාවූ මහණබමුණෝ ඇත්තාහුය. ඒමහණබමුණෝමේපුරුෂයාගේ සංඥව මේ පුරුෂයාවෙතටද අදිත්. මේ පුරුෂයාගෙන් ඉවතටද අදිත්.යම්කලක වෙතට අදිද්ද එකල පුරුෂතෙම සංඥ ඇත්තේ වේ. යම්කලක ඉවතට අදිත්ද එකල පුරුෂතෙම සංඥරහිත වේයයි මෙසේ සමහරු සංඥනිරොධය ප්‍රකාශකෙරෙත්. ඕහට අනිකෙක් මෙසේ කියයි. පින්වත, මේ කාරණය මෙසේ නොවන්නේය. කෙසේවන්නේදයත්.පින්වත, මහත් සෘඩිඇත්තාවූ මහානුභාවඇත්තාවූ දෙවතාවෝ වන්නාහුමය. ඒ දෙවතාවෝ මේ පුරුෂයාගේ සංඥව මේ පුරුෂයා වෙතටද අදිත්. මේ පුරුෂයාගෙන් ඉවතටද.අදිත් යම් කලක වෙතට අදිත්ද එකල සංඥඇත්තේ වෙයි. යම් කලක ඉවතට අදිත්ද එකල සංඥරහිත වේයයි මෙසේ සමහරු සංඥනිරොධය ප්‍රකාශ කෙරෙත්. යමෙක් මේ නිරොධධර්මයන් සම්බන්ධව ඉතා දක්‍ෂවේද ඒකාන්තයෙන් ඒ භාග්‍යවතුන්වහන්සේ මේ සංඥනිරොධය කියන්නේය ඒකාන්තයෙන් ඒ සුගතතෙම මේ සංඥනිරොධය කියන්නේයයි මෙසේ සිහිකරන්නාවූ මට ස්වාමීනි, භාග්‍යවතුන්වහන්සේම අරබයා සිහිඋපන. ස්වාමීනි, භාග්‍යවත්තෙම සංඥනිරොධය සම්බන්ධවදක්‍ෂසේක.ප්‍රකෘතියදක්නාසේක. ස්වාමීනි, කෙසේනම් සංඥනිරොධය වේදැයි විචාළේය.

7. තත්‍ර පොට්ඨපාද යෙ තෙ සමණබ්‍රාහ්මණා එවමාහංසු, අහෙතූ අප්පච්චයා පුරිසස්ස සඤ්ඤා උප්පජ්ජන්තිපි නිරුජ්ඣන්තිපීති. ආදිතොව තෙසං අපරද්ධං. තං කිස්සහෙතු. සහෙතූ හි පොට්ඨපාද සප්පච්චයා පුරිසස්ස සඤ්ඤා උප්පජ්ජන්තිපි නිරුජ්ඣන්තිපි. සික්ඛා එකා සඤ්ඤා උප්පජ්ජන්ති, සික්ඛා එකා සඤ්ඤා නිරුජ්ඣන්ති. කා ච සික්ඛාති. භගවා අවොච. ඉධ පොට්ඨපාද තථාගතො ලොකෙ උප්පජ්ජති, අරහං සම්මා සම්බුද්ධො ...පෙ... යථා සාමඤ්ඤඵලෙ එවං විත්ථාරෙතබ්බං එවං ඛො පොට්ඨපාද භික්ඛු, සීලසම්පන්නො හොති. ...පෙ... තස්සිමෙ පඤ්ච නීවරණෙ පහීණෙ අත්තනි සමනුපස්සතො පාමුජ්ජං ජායති, පමුදිතස්ස පීති ජායති පීති මනස්ස කායො පස්සම්භති පස්සද්ධකායො සුඛං වෙදෙති සුඛිනො චිත්තං සමාධියති. සො විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති.

---

7. පොට්ඨපාදය, යම් ඒ මහණබමුණුකෙනෙක් පුරුෂයාගේ සංඥාවෝ හෙතුප්‍රත්‍යයරහිතව උපදින්නාහුද නිරුද්ධවන්නාහුද වෙත්යයිමෙසේ කීවාහුද පළමුකොටම ඔවුන්විසින් අපරාධයක් කරණලද්දේය, ඊටහෙතු කවරේද. පොට්ඨපාදය, පුරුෂයාගේ සංඥාවෝ හෙතුප්‍රත්‍යය සහිතවම උපදින්නාහුද නිරුද්ධවන්නාහුද වෙත්. ශික්ෂායෙන් ඇතැම් සංඥාවක් උපදින්නීය, ශික්ෂායෙන් ඇතැම් සංඥාවක් නිරුද්ධවන්නීය, ශික්ෂාතොමෝ කවරීදැයි විචාළේය. භාග්‍යවතුන්වහන්සේ වදාළසේක. පොට්ඨපාදය, මේ ලොකයෙහි අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන්වහන්සේ උපදීද,—පෙ—සාමඤ්ඤඵලසූත්‍රයෙහි මෙන් විස්තරකට යුතුයි. පොට්ඨපාදය, මෙසේ වනාහි භික්ෂුතෙම ශීලසම්පන්න වෙයි—පෙ—තමාකෙරෙහි ප්‍රහීණවූ මේ පඤ්චනීවරණයන් දක්නාවූ ඔහට ප්‍රමොද්‍යය හටගණී. ප්‍රමුදිතවූවාහට ප්‍රීතිය හටගණී. ප්‍රීතිසිත්ඇත්තහුගේ කය දරථාභාවයෙන් සංසිඳෙයි. සංසිඳුනු ශරීර ඇත්තේ සැපවිඳී. සැපඇත්තහුගේ සිත සමාධියට පැමිණේ. හෙතෙම වස්තුකාමක්ලෙශකාමයන්කෙරෙන් වෙන්වම කාමච්ඡන්දනීවරණාදි අකුශලධර්මයන් කෙරෙන් වෙන්වම අරමුණටසිත නැඟීම ලක්ෂණකොට ඇති විතර්ක සහිතවූ අරමුණෙහි සිත හැසිරවීමලක්ෂණකොටඇති විචාරසහිතවූ විවෙකයෙන් හටගත්තාවූ ප්‍රීතියහා සැප ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාසයකෙරෙයි.

තස්ස යා පුරිමා කාමසඤ්ඤා සා නිරුජ්ඣති. විවෙකජපීතිසුඛ සුඛුම සච්චසඤ්ඤා තස්මිං සමයෙ හොති, විවෙකජ පීතිසුඛ සුඛුමසච්චසඤ්ඤී යෙව තස්මිං සමයෙ හොති. එවම්පි සික්ඛා එකා සඤ්ඤා උප්පජ්ජන්ති සික්ඛා එකා සඤ්ඤා නිරුජ්ඣන්ති. අයං සික්ඛාති භගවා අවොච.

8. පුනචපරං පොට්ඨපාද භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියජ්ඣානං උපසම්පජ්ජ විහරති. තස්ස යා පුරිමා විවෙකජපීතිසුඛ සුඛුමසච්චසඤ්ඤා සා නිරුජ්ඣති. සමාධිජපීතිසුඛසුඛුමසච්චසඤ්ඤා තස්මිං සමයෙ හොති, සමාධිජපීති සුඛසුඛුමසච්චසඤ්ඤී යෙව තස්මිං සමයෙ හොති. එවම්පි සික්ඛා එකා සඤ්ඤා උප්පජ්ජන්ති, සික්ඛා එකා සඤ්ඤා නිරුජ්ඣන්ති. අයං සික්ඛාති භගවා අවොච.

ඔහුගේ යම්පළමුපැවති කාමසංඥාවක්වේද. ඒ කාමසංඥාතොමෝ නිරුඬවෙයි. ඒප්‍රථමධ්‍යානසමයෙහිවිවෙකයෙන්හටගත් ප්‍රීතියහාසැප ඇති කාමච්ඡන්දාදිවූ ඖදාරිකාඞ්ගයන්ගේ ප්‍රහාණවශයෙන් සියුම්වූ ලබනලද සංඥා තොමෝ ඇතිවෙයි. ඒ ප්‍රථමධ්‍යාන සමයෙහි විවෙකයෙන් හටගත්තාවූ ප්‍රීතිය හා සැපඇති කාමච්ඡන්දාදීවූ ඖදාරිකාඞ්ගයන්ගේ ප්‍රහාණවශයෙන් සියුම්වු සංඥාඇතිවූයේම වෙයි. මෙසේද ශික්‍ෂාසංඛ්‍යාත ප්‍රථමධ්‍යානයෙන් ඇතැම් සංඥාවක් උපදී. ශික්‍ෂාසංඛ්‍යාතප්‍රථමධ්‍යානයෙන් ඇතැම්සංඥාවක් නිරුඬවෙයි. මෝතොමෝ ශික්‍ෂායයි භාග්‍යවතුන්වහන්සේ වදාළසේක.

8. පොට්ඨපාදය, නැවතද භික්‍ෂුතෙම විතර්ක විචාරදෙදෙනාගේ සංසිඳීමෙන් තමාතුළ විතර්කවිචාර දෙදෙනාගේ කැළඹීමක් නැත්තෙන් චිත්තයාගේ පැහැදීම කරන්නාවූ චිත්තයාගේ එකලාව උපදින සමාධීන් වඩන්නාවූ විතර්කරහිතවූ විචාර රහිතවූ සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැප ඇති ද්විතීයධ්‍යානය උපදවා වාසයකෙරෙයි. ඔහුගේයම්පළමු පැවති විවෙකයෙන් හටගත්තාවූ ප්‍රීතිය හා සැපයෙන් යුක්තවූ ඖදාරිකාඞ්ගයන්ගේ ප්‍රහාණවශයෙන් සියුම්වූ සංඥාවක්ඇත්තිද. ඒ සංඥාතොමෝ නිරුඬවෙයි ඒ ද්විතීයධ්‍යාන සමයෙහි සමාධියෙන් හටගත්තාවූ ප්‍රීතිය හා සැපයෙන් යුක්තවූ ඖදාරිකාඞ්ගයන්ගේ ප්‍රහාණවශයෙන් සියුම්වූ සංඥාඇතිවූයේම වෙයි. මෙසේද ශික්‍ෂා සංඛ්‍යාතද්විතීයධ්‍යානයෙන් ඇතැම් සංඥාවක් උපදී. ශික්‍ෂාසංඛ්‍යාතද්විතීයධ්‍යානයෙන් ඇතැම් සංඥාවක් නිරුඬවෙයි. මෝතොමෝ ශික්‍ෂායයි භාග්‍යවතුන්වහන්සේ වදාළසේක.

9. පුනචපරං පොට්ඨපාද භික්ඛු පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති සතො ච සම්පජානො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති යන්තං අරියා ආචික්ඛන්ති. උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති තතියජ්ඣානං උපසම්පජ්ජ විහරති. තස්ස යා පුරිමා සමාධිජ පීතිසුඛ සුඛුමසච්චසඤ්ඤාසා නිරුජ්ඣති. උපෙක්ඛාසුඛසුඛුමසච්චසඤ්ඤා තස්මිං සමයෙ හොති, උපෙක්ඛාසුඛසුඛුමසච්චසඤ්ඤීයෙව තස්මිං සමයෙ හොති. එවම්පි සික්ඛා එකා සඤ්ඤා උප්පජ්ජන්ති. සික්ඛා එකා සඤ්ඤා නිරුජ්ඣන්ති. අයං සික්ඛාති. භගවා අවොච.

10. පුනචපරං පොට්ඨපාද භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛාසති පාරිසුද්ධිං චතුජ්ඣානං උපසම්පජ්ජ විහරති.

---

9. පොට්ඨපාදය, නැවතද භික්ෂුතෙම ප්‍රීතිහුගේ ඉක්මීමෙන් හා විතර්කවිචාරදෙදෙනාගේ සංසිඳීමෙන් ෂඩඞ්ගොපෙක්ෂාදිවූ දශවිධ උපෙක්ෂාවන් අතුරෙන් ධ්‍යානොපෙක්ෂා ඇත්තේ සිහි නුවණද ඇත්තේ වෙසෙසි. නාමකායයෙන් චෛතසිකසුඛයද ඉන්කායිකසුඛ හෙතුවූ රූපය ඉපදීමෙන් කායික සුඛයද අනුභවකෙරෙයි. යම් ධ්‍යානයක් හෙතුකොටගෙණ ධ්‍යානොපෙක්ෂාවෙන් යුක්තවූ සිහි ඇත්තේ සැපවිහරණ ඇත්තේයයි ඒ තෘතීයධ්‍යාන සමඞ්ගී පුද්ගලයා බුද්ධාදි ආර්‍ය්‍යයෝ ප්‍රකාශ කෙරෙත්ද ඒ තෘතීයධ්‍යානය උපදවා වාසය කෙරෙයි. ඔහුගේ යම් පළමු සමාධියෙන් උපන්නාවූ ප්‍රීතිය හා සැප ඇති ඖදාරිකාඞ්ගයන්ගේ ප්‍රහාණවශයෙන් සියුම්වූ සංඥවක් ඇතිවීද ඒ සංඥාතොමෝ නිරුද්ධවෙයි. ඒ තෘතියධ්‍යාන සමයෙහි උපෙක්ෂාසුඛයෙන් යුක්තවූ ඖදාරිකඞ්ගයන්ගේ ප්‍රහාණවශයෙන් සියුම්වූ සංඥාතොමෝ ඇතිවූවා වෙයි. ඒ තෘතියධ්‍යාන සමයෙහි උපෙක්ෂාසුඛයෙන් යුක්තවූ ඖදාරිකාඞ්ගයන්ගේ ප්‍රහාණවශයෙන් සියුම්වූ සංඥාඇතිවූයේම වෙයි. මෙසේද ශික්ෂායෙන් ඇතැම් සංඥාවක් උපදී. ඇතැම් සංඥාවක් නිරුද්ධ වෙයි. මෝතොමෝද ශික්ෂායයි භාග්‍යවත්තෙමේ වදාළසේක.

10. පොට්ඨපාදය, නැවතද භික්ෂුතෙම කායික සුඛයාගේ දුරුවීමෙන්ද කායික දුඃඛයාගේ දුරුවීමෙන්ද පෙරම සෞමනස්‍යදෞර්මනස්‍ය දෙදෙනාගේ දුරුවීමෙන් දුක්රහිතවූ සැපරහිතවූ උපෙක්ෂායෙන් හටගත් ස්මෘතියගේ පිරිසිදුභාවය ඇත්තාවූ චතුර්ථධ්‍යානය උපදවා වාසය කෙරෙයි.

තස්ස යා පුරිමා උපෙඛාසුඛසුඛුමසච්චසඤ්ඤා නිරුජ්ඣති. අදුක්ඛමසුඛසුඛුමසච්චසඤ්ඤා තස්මිං සමයෙ හොති, අදුක්ඛමසුඛසුඛුමසච්චසඤ්ඤී යෙව තස්මිං සමයෙ හොති. එවම්පි සික්ඛා එකා සඤ්ඤා උප්පජ්ජති සික්ඛා එකා සඤ්ඤා නිරුජ්ඣති. අයං සික්ඛාති භගවා අවොච.

11. පුනචපරං පොට්ඨපාද භික්ඛු සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසොති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති. තස්ස යා පුරිමා රූපසඤ්ඤා සා නිරුජ්ඣති. ආකාසානඤ්චායතනසුඛසුඛුමසච්චසඤ්ඤා තස්මිං සමයෙ හොති, ආකාසනඤ්චායතනසුඛසුඛුමසච්චසඤ්ඤී යෙව තස්මිං සමයෙ හොති. එවම්පි සික්ඛා එකා සඤ්ඤා උප්පජ්ජන්ති, සික්ඛා එකා සඤ්ඤා නිරුජ්ඣන්ති. අයං සික්ඛාති භගවා අවොච.

12. පුනචපරං පොට්ඨපාද භික්ඛු සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති.

ඔහුගේ යම් පෙර උපෙක්ෂාසුඛයෙන් යුක්තවූ ඖදරිකාඞ්ගයන්ගේ ප්‍රහාණවශයෙන් සියුම්වූ සංඥාවක් ඇතිවීද ඒසංඥාතොමෝ නිරුද්ධ වෙයි. ඒ චතුර්ථධ්‍යාන සමයෙහි දුක්නුවූ සැපනුවූ මැදහත්සුවයෙන් යුක්තවූ ඖදරිකාඞ්ගයන්ගේප්‍රහාණවශයෙන් සියුම්වූ සංඥතොමෝ වූවාවෙයි. ඒ චතුර්ථධ්‍යාන සමයෙහි දුක්නුවූ සැපනුවූ මැදහත් සුවයෙන් යුක්තවූ ඖදරිකාඞ්ගයන්ගේ ප්‍රහාණවශයෙන් සියුම්වූ සංඥාඇතිවූයේම වෙයි. මෙසේද ශික්ෂායෙන් ඇතැම් සංඥවක් උපදී. ඇතැම්සංඥාවක් නිරුද්ධවෙයි. මෝතොමෝද ශික්ෂායයි භාග්‍යවත් තෙම වදාළසේක.

11. පොට්ඨපාදය, නැවතද භික්ෂුතෙම සර්වප්‍රකාරයෙන් රූපසංඥාවන්ගේදුරුවීමෙන්ප්‍රතිඝසංඥාවන්ගේදුරුවීමෙන්නානත්තසංඥවන්ගේමෙනෙහිනොකිරීමෙන් ආකාශයතෙමඅනන්තයයිආකාශානඤ්චායතනයඋපදවා වාසයකෙරෙයි. ඔහුගේ යම් පූර්ව සංඥාවක්වීනම් ඒ සංඥාතොමෝ නිරුද්ධවෙයි. එසමයෙහි ආකාශානඤ්චායතනයෙන් යුක්තවූ ඖදරිකාඞ්ගයන්ගේ ප්‍රහාණයෙන් සියුම්වූ සංඥාඇතිවූයේ වෙයි. මෙසේද ශික්ෂායෙන් ඇතැම් සංඥාවක් උපදී. ඇතැම් සංඥවක් නිරුද්ධවෙයි. මෝතොමෝ ශික්ෂායයි භාග්‍යවත්තෙම වදාළසේක.

12. පොට්ඨපාදය, නැවතද භික්ෂුතෙම සර්වප්‍රකාරයෙන් ආකාශානඤ්චායතනය ඉක්මවා විඤ්ඤාණය අනන්තයයි විඤ්ඤාණඤ්චායතනය උපදවා වාසයකෙරෙයි.

තස්සා යා පුරිමා ආකාසානඤ්චායතනසුඛුමසච්චසඤ්ඤා, සා නිරුජ්ඣති. විඤ්ඤාණඤ්චායතනසුඛුමසච්චසඤ්ඤා තස්මිං සමයෙ හොති, විඤ්ඤාණඤ්චායතනසුඛුමසච්චසඤ්ඤී යෙව තස්මිං සමයෙ හොති. එවං පි සික්ඛා එකා සඤ්ඤා උප්පජ්ජති. සික්ඛා එකා සඤ්ඤා නිරුජ්ඣති. අයං සික්ඛාති භගවා අවොච.

13. පුනචපරං පොට්ඨපාද භික්ඛු සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. තස්ස යා පුරිමා විඤ්ඤාණඤ්චායතනසුඛුමසච්චසඤ්ඤා, සා නිරුජ්ඣති. ආකිඤ්චඤ්ඤායතනසුඛුමසච්චසඤ්ඤා තස්මිං සමයෙ හොති, ආකිඤ්චඤ්ඤායතනසුඛුමසච්චසඤ්ඤී යෙව තස්මිං සමයෙ හොති. එවම්පි සික්ඛා එකා සඤ්ඤා උප්පජ්ජති, සික්ඛා එකා සඤ්ඤා නිරුජ්ඣති. අයං සික්ඛාති භගවා අවොච.

ඔහුගේ යම් පළමු පැවති ආකාශානඤ්චායතනයෙන් යුක්තවූ ඖදාරිකාඞ්ගයන්ගේ ප්‍රහාණයෙන් සියුම්වූ සංඥාවක් ඇතිවීද, ඒ සංඥාතෙමෝ නිරුද්ධවෙයි. එසමයෙහි විඤ්ඤාණඤ්චායතනයෙන් යුක්තවූ ඖදාරිකාඞ්ගයන්ගේ ප්‍රහාණයෙන් සියුම්වූ සංඥාතොමෝ ඇතිවූවා වෙයි. එසමයෙහි විඤ්ඤාණඤ්චායතන සුඛයෙන් යුක්තවූ ඖදාරිකාඞ්ගයන්ගේ ප්‍රහාණයෙන් සියම්වූ සංඥා ඇතිවූයේම වෙයි. මෙසේද ශික්ෂායෙන් ඇතැම් සංඥාවක් උපදී. ඇතැම් සංඥාවක් නිරුද්ධ වෙයි. මෝ තොමෝද ශික්ෂායයි භාග්‍යවත්තෙම වදාළසේක.

13. පොට්ඨපාදය, නැවතද භික්ෂුතෙම සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතනය උපදවා වාසයකෙරෙයි. ඔහුගේ යම් පළමු පැවති විඤ්ඤාණඤ්චායතනයෙන් යුක්තවූ ඖදාරිකාඞ්ගයන්ගේ ප්‍රහාණයෙන් සියුම්වූ සංඥාවක් ඇතිවීද. ඒ සංඥාතොමෝ නිරුද්ධවෙයි. එසමයෙහි ආකිඤ්චඤ්ඤායතනයෙන් යුක්තවූ ඖදාරිකාඞ්ගයන්ගේ ප්‍රහාණයෙන් සියුම්වූ සංඥාතොමෝ ඇතිවූවා වෙයි. එසමයෙහි ආකිඤ්චඤ්ඤායතනයෙන් යුක්තවූ ඖදාරිකාඞ්ගයන්ගේ ප්‍රහාණයෙන් සියුම්වූ සංඥා ඇත්තේම වෙයි. මෙසේද ශික්ෂායෙන් ඇතැම් සංඥාවක් උපදී. ඇතැම් සංඥාවක් නිරුද්ධවෙයි. මෝ තොමෝද ශික්ෂායයි භාග්‍යවත්තෙම වදාළසේක.

14. යතො ඛො පොඨපාද භික්ඛු ඉධ සකසඤ්ඤී හොති, සො තතො අමුත්‍ර තතො අමුත්‍ර අනුපුබ්බෙන සඤ්ඤග්ගං ඵුසති. තස්ස සඤ්ඤග්ගෙ ඨිතස්ස එවං හොති. චෙතයමානස්ස මෙ පාපියො, අචෙතයමානස්ස මෙ සෙය්‍යො. අහඤ්චෙව ඛොපන චෙතෙය්‍යං අභිසංඛරෙය්‍යං, ඉමා ච මෙ සඤ්ඤා නිරුජ්ඣෙය්‍යුං අඤ්ඤා ච ඔළාරිකා සඤ්ඤා උප්පජ්ජෙය්‍යුං යන්නූනාහං න චෙතෙය්‍යං න අභිසඞ්ඛරෙය්‍යන්ති. සො න චෙව චෙතෙති. න අභිසංඛරොති. තස්ස අචෙතයතො අනභිසඞ්ඛරතො තා චෙව සඤ්ඤා නිරුජ්ඣන්ති, අඤ්ඤා ච ඔළාරිකා සඤ්ඤා නුප්පජ්ජන්ති. සො නිරොධං ඵුසති. එවං ඛො පොඨපාද අනුපුබ්බාභිසඤ්ඤා නිරොධසම්පජානසමාපත්ති හොති.

---

14. පොඨපාදය, යම්හෙයකින් මේ ශාසනයෙහි භික්ෂුතෙම තමන්ගේ ප්‍රථමධ්‍යානසංඥවෙන් සංඥඇත්තේ වේද, හෙතෙම ඒ ප්‍රථමධ්‍යානයෙන් අන්‍යවූ ද්විතියධ්‍යානයෙහිද එයින් අන්‍යවූ තෘතියධ්‍යානයෙහි දැයි මෙසේ ඒ ඒ ධ්‍යානසංඥයෙන් සංඥඇත්තේවී පිළිවෙළින් සංඥාග්‍රයට හෙවත් ආකිඤ්චඤ්ඤායතනයට පැමිණෙයි. සංඥාග්‍රයෙහි හෙවත් ආකිඤ්චඤ්ඤායතනයෙහි සිටියාවූ ඕහට මෙබඳු සිතෙක්වෙයි. සිතන්නාවූ හෙවත් ධ්‍යානයට සමවදින්නාවූ මාගේ සමවැදීම ලාමක වෙයි. නොසිතන්නාවූ හෙවත් සමනොවදින්නාවූ මාගේ ඒ සම නොවැදීම උතුම්වෙයි. මම වනාහි සිතන්නෙම්නම් හෙවත් ධ්‍යානයට සමවදින්නෙම්නම් මතු සමවත්පිණිස කැමති උපදවන්නෙම්නම් මාගේ මේ ආකිඤ්චඤ්ඤායතන සංඥාවෝ නිරුඬවන්නාහ. අන්‍යවූ ඖදාරිකභවාඞ්ගසංඥාවෝ උපදින්නාහුය. මම නොසිතන්නෙම්නම් හෙවත් ධ්‍යානයට සමනොවදින්නෙම්නම් මතු සමවත්පිණිස කැමති නූපදවන්නෙම්නම් මැනවැයි හෙතෙම නොසිතයි හෙවත් සමනොවදී, මතු සමවත්පිණිස කැමතිනූපදවයි. නොසිතන්නාවූ හෙවත් ධ්‍යානයට සමනොවදින්නාවූ මතු සමවත්පිණිස කැමති නූපදවන්නාවූ ඔහුගේ ඒ ධ්‍යානසංඥාවෝද නිරුඬවෙත්. අන්‍යවූද ඖදාරිකභවාඞ්ග සංඥාවෝ නූපදිත්. මෙසේ පිළිපන්නාවූ ඒ භික්ෂුතෙම සංඥාවෙන් දතයුතුවූ නිරොධය ස්පර්ශකෙරෙයි හෙවත් ලබයි. පොඨපාදය, මෙසේ වනාහි පණ්ඩිතභික්ෂුහුගේ පිළිවෙළින් නිරොධසමාපත්තිය වෙයි වදාළෝ.

15. තං කිමමඤ්ඤසි, පොට්ඨපාද අපිනු තෙ ඉතො පුබ්බෙ එවරූපා අනුපුබ්බාභිසඤ්ඤානිරොධසම්පජානසමාපත්ති සුතපුබ්බාති. නො හෙතම්භන්තෙ එවං ඛො අහං භන්තෙ භගවතො භාසිතං ආජානාමි. යතො ඛො පොට්ඨපාද භික්ඛු ඉධ සකසඤ්ඤී හොති, සො තතො අමුත්‍ර තතො අමුත්‍ර අනුපුබ්බෙන සඤ්ඤග්ගං ඵුසති. තස්ස සඤ්ඤග්ගෙ ඨිතස්ස එවං හොති. චෙතයමානස්ස මෙ පාපියො, අචෙතයමානස්ස මෙ සෙය්‍යො. අහඤ්චෙව ඛො පන චෙතෙය්‍යං අභිසඞ්ඛරෙය්‍යං ඉමා ච මෙ සඤ්ඤා නිරුජ්ඣෙය්‍යුං, අඤ්ඤා ච ඔළාරිකා සඤ්ඤා උප්පජ්ජෙය්‍යුං. යන්නූනාහං න චෙතෙය්‍යං න අභිසඞ්ඛරෙය්‍යන්ති. සො න චෙව චෙතෙති, න අභිසඞ්ඛරොති තස්ස අචෙතයතො අනභිසඞ්ඛරොතො තා චෙව සඤ්ඤා නිරුජ්ඣන්ති, අඤ්ඤා ච ඔළාරිකා සඤ්ඤා න උප්පජ්ජන්ති. සො නිරොධං ඵුසති.

---

15. පොට්ඨපාදය, ඒ කුමකැයි සිතන්නෙහිද, කිමෙක්ද, තාවිසින් මින්පෙර මෙබඳුවූ පණ්ඩිතභික්ෂුහුගේ පිළිවෙළින් සංඥානිරොධසමාපත්තියක් ඇසූවිරූද්දැයි විචාළසේක. ස්වාමීනි, නොඅසනලදවිරූය. ස්වාමීනි, මෙසේ මම භාග්‍යවතුන්වහන්සේගේ කථාව දනිමි. පොට්ඨපාදය, යම්හෙයකින් භික්ෂුතෙම තමන්ගේ ප්‍රථමධ්‍යානසංඥාවෙන් සංඥාඇත්තේ වේද, හෙතෙම ඒ ප්‍රධමධ්‍යානයෙන් අන්‍යවූ ද්විතියධ්‍යානයෙහිද ඉන් අන්‍යවූ තෘතීයධ්‍යානයෙහිදැයි මෙසේ ඒ ඒ ධ්‍යානසංඥායෙන් සංඥාඇත්තේවී පිළිවෙළින් සංඥාග්‍රයට හෙවත් ආකිඤ්චඤ්ඤායතනයට පැමිණෙයි. සංඥාග්‍රයෙහි හෙවත් ආකිඤ්චඤ්ඤායතනයෙහි සිටියාවූ ඔහට මෙබඳුසිතෙක් වෙයි සිතන්නාවූ හෙවත් ධ්‍යානයට සමවදින්නාවූ මාගේ සමවැදීම ලාමක වෙයි. නොසිතන්නාවූ හෙවත් ධ්‍යානයට සමනොවදින්නාවූ මාගේ සමනොවැදීම උතුම්වෙයි. මම වනාහි සිතන්නෙම්නම් හෙවත් ධ්‍යානයට සමවදින්නෙම්නම් මතු සමවත්පිණිස කැමතිවන්නෙම්නම් මාගේ මේ ආකිඤ්චඤ්ඤායතනසංඥාවෝ නිරුද්ධවන්නාහ. අන්‍යවූ ඖදාරිකභවාඞ්ගසංඥාවෝ උපදින්නාහුය. මම නොසිතන්නෙම්නම් හෙවත් ධ්‍යානයට සමනොවදින්නෙම්නම් මතු සමවත්පිණිස කැමතිනොවන්නෙම්නම් මැනවැයි හෙතෙම නොම සිතයි හෙවත් ධ්‍යානයට සමනොවදියි මතු සමවත්පිණිස කැමති නොවෙයි. නොසිතන්නාවූ හෙවත් ධ්‍යානයට සමනොවදින්නාවූ මතු සමවත්පිණිස කැමති නූපදවන්නාවූ ඔහුගේ ඒ ධ්‍යානසංඥාවෝ නිරුද්ධවෙත්, අන්‍යවූ ඖදාරිකභවාඞ්ගසංඥාවෝද නූපදිත්, මෙසේ පිළිපන්නාවූ ඒ භික්ෂුතෙම සංඥායෙන් දතයුතුවූ නිරොධය ස්පර්ශකරෙයි හෙවත් ලබයි.

එවං ඛො පොට්ඨපාද අනුපුබ්බාභිසඤ්ඤානිරොධසම්පජානසමාපත්ති හොතීති. එවං ඛො පොට්ඨපාදාති.

16. එකං යෙව නුඛො භන්තෙ භගවා සඤ්ඤග්ගං පඤ්ඤපෙති, උදාහු පුථූපි සඤ්ඤග්ගෙ පඤ්ඤපෙතීති. එකම්පි ඛො අහං පොට්ඨපාද සඤ්ඤග්ගං පඤ්ඤපෙමි, පුථූපි සඤ්ඤග්ගෙ පඤ්ඤපෙමීති, යථා කථං පන භන්තෙ භගවා එකම්පි සඤ්ඤග්ගං පඤ්ඤපෙති, පුථූපි සඤ්ඤග්ගෙ පඤ්ඤපෙතීති. යථා යථා ඛො පොට්ඨපාද නිරොධං ඵුසති තථා තථාහං සඤ්ඤග්ගං පඤ්ඤපෙමි, එවං ඛො අහං පොට්ඨපාද එකම්පි සඤ්ඤග්ගං පඤ්ඤපෙමි. පුථූපි සඤ්ඤග්ගෙ පඤ්ඤපෙමීති.

17. සඤ්ඤානුඛො භන්තෙ පඨමං උප්පජ්ජති, පච්ඡා ඤාණං. උදාහු ඤාණං පඨමං උප්පජ්ජති, පච්ඡා සඤ්ඤා, උදාහු සඤ්ඤා ච ඤාණඤ්ච අපුබ්බං අචරිමං උප්පජ්ජන්තීති. සඤ්ඤා ඛො පොට්ඨපාද පඨමං උප්පජ්ජති, පච්ඡා ඤාණං, සඤ්ඤුප්පාදා ච පන ඤාණුප්පාදො හොති සො එවං පජානාති. ඉදප්පච්චයා කිර මෙ ඤාණං උදපාදීති.

---

16. පොට්ඨපාදය, මෙසේ පණ්ඩිතභික්ෂුහුගේ පිළිවෙළින් සංඥානිරොධ සමාපත්තිය වෙයි, භාග්‍යවතුන්වහන්සේ පොට්ඨපාදය, එසේයයි වදාළසේක. ස්වාමීනි, භාග්‍යවතුන්වහන්සේ එකම ආකිඤ්චඤ්ඤායතනායම සංඥග්‍රයයි පණවනසේක්ද නොහොත් අවශෙෂ සමාපත්තීන්හි බොහෝවූ සංඥග්‍රයන් පණවනසේක්දැයි විචාළේය. පොට්ඨපාදය, මම සංඥග්‍ර එකක්ද පණවමි. බොහෝවූ සංඥග්‍රයන්ද පණවමියි වදාළසේක. ස්වාමීනි, භාග්‍යවත්තෙම කෙසේනම් එක් සංඥාග්‍රයක් පණවනසේක්ද, කෙසේ බොහෝවූ සංඥග්‍රයන් පණවනසේක්දැයි විචාළේය. පොට්ඨපාදය, පෘථිවිකසිනාදීන් අතුරෙන් යම් යම් කසිනයකින් හෝ ප්‍රථමධ්‍යානාදීන් අතුරෙන් යම් යම් ධ්‍යානයකින් හෝ නිරොධය ස්පර්‍ශකෙරේද, ඒ ඒ කසිනයකින් හෝ ඒ ඒ ධ්‍යානයකින් මම සංඥාග්‍රය පණවමි. පොට්ඨපාදය, මම එසේ එක් සංඥාග්‍රයක්ද බොහෝවූ සංඥාග්‍රයන්ද පණවමියි වදාළසේක.

17. ස්වාමීනි, නිරොධයෙන් නැගීසිටින්නාවූ භික්ෂුහට අහිත්ඵල සංඥාව පළමු උපදීද, පසුව ප්‍රත්‍යවෙක්ෂාඥානය උපදීද නොහොත් ප්‍රත්‍යවෙක්ෂාඥානය පළමු උපදීද, අර්හත්ඵලසංඥාව පසුව උපදීද නොහොත් අර්හත්ඵලසංඥාව හා ප්‍රත්‍යවෙක්ෂාඥානය පෙරපසුනොව එකවිටම උපදීදැයි විචාළේය. පොට්ඨපාදය, අර්හත්ඵලසංඥාව වනාහි පළමු උපදියි. ප්‍රත්‍යවෙක්ෂාඥානය පසුව උපදියි. අර්හත්ඵලසංඥාවගේ ඉපදීමෙන් ප්‍රත්‍යවෙක්ෂාඥානයාගේ ඉපැද්ම වෙයි. අර්හත්ඵලසමාධිසංඥාව හෙතුකොටගෙණ මාගේ ප්‍රත්‍යවෙක්ෂාඥානය උපන්නේයයි ඒ භික්ෂුතෙම දනියි.

ඉමිනාඛො එතං පොට්ඨපාද පරියායෙන වෙදිතබ්බං යථා සඤ්ඤා පඨමං උප්පජ්ජති පච්ඡා ඤාණං, සඤ්ඤුප්පාදා ච පන ඤාණුප්පාදො හොතීති.

18. සඤ්ඤානුඛො භන්තෙ පුරිසස්ස අත්තා, උදහු, අඤ්ඤා සඤ්ඤා, අඤ්ඤො අත්තාති. කං පන ත්වං පොට්ඨපාද අත්තානං පච්චෙසීති. ඔළාරිකං ඛො අහං භන්තෙ අත්තානං පච්චෙමි රූපිං චාතුම්මහාභූතිකං කබළීකාරාහාරභක්ඛන්ති. ඔළාරිකොචහි තෙ පොට්ඨපාද අත්තා අභවිස්ස රූපී චාතුම්මහාභූතිකො කබළීකාරාහාරභක්ඛො, එවං සන්තං ඛො තෙ පොට්ඨපාද අඤ්ඤාව සඤ්ඤා භවිස්සති අඤ්ඤො අත්තාති. තදමිනාපෙතං පොට්ඨපාද පරියායෙන වෙදිතබ්බං යථා අඤ්ඤාව සඤ්ඤා භවිස්සති අඤ්ඤො අත්තා. තිට්ඨතෙවායං පොට්ඨපාද ඔළාරිකො අත්තා රූපී චාතුම්මහාභූතිකො කබළීකාරාහාරභක්ඛො, අථ ඉමස්ස පුරිසස්ස අඤ්ඤාව සඤ්ඤා උප්පජ්ජන්ති අඤ්ඤාව සඤ්ඤා නිරුජ්ඣන්ති. ඉමිනාපිඛො එතං පොට්ඨපාද පරියායෙන වෙදිතබ්බං යථා අඤ්ඤාව සඤ්ඤා භවිස්සති, අඤ්ඤො අත්තාති.

පොට්ඨපාදය, අර්හත්ඵලසමාධිසංඥා තොමෝ පළමු උපදියි. ප්‍රත්‍යවෙක්‍ෂාඥානය පසුව උපදියි. අර්හත්ඵලසංඥාහුගේ ඉපදීමෙන් ප්‍රත්‍යවෙක්‍ෂාඥානයාගේ ඉපැද්ම වේයයි මෙසේ මේ ක්‍රමයෙන් මෙය දතයුතුයයි වදාළසේක.

18. ස්වාමිනි, සංඥාතොමෝ පුරුෂයාගේ ආත්මය වේද නොහොත් සංඥාතොමෝ අනිකක් වේද, ආත්මයතෙම අනිකෙක් වේදැයි විචාළේය. පොට්ඨපාදය, තෝ කුමක්නම් ආත්මයයි දැනගන්නෙහිදැයි විචාළසේක. ස්වාමිනි, මම ආත්මය ඖදාරිකවූ සතරමහාභූතයන්ගෙන් උපන්නාවූ රූපවත්වූ කබලිඞ්කාරාහාර අනුභවකරන්නකැයි දැනගණිම්යි සැලකළේය. පොට්ඨපාදය, ඖදාරිකවූ සතරමහාභූතයන්ගෙන් උපන්නාවූ රූපවත්වූ කබලිඞ්කාරාහාරානුභව කරන්නේත් ආත්මයයි තාගේ දැනගැණිම වන්නේද, පොට්ඨපාදය, එසේ ඇතිකල්හි තට සංඥාව අනිකක්ම වන්නීය, ආත්මය අනිකක්ම වන්නේය, පොට්ඨපාදය, යම්සේ සංඥාව අනිකක් වන්නීද. ආත්මය අනිකෙක් වන්නේද, මේ ක්‍රමයෙන්ද ඒ මේ කාරණය දතයුතුය. පොට්ඨපාදය, මේ ඖදාරිකවූ සතරමහාභූතයන්ගෙන් උපන්නාවූ රූපවත්වූ කබලිඞ්කාරාහාර අනුභවය කරන්නාවූ ඒ මේ ආත්මය නවතීවා. එසේකල්හි මේ පුරුෂයාහට අන්‍යවූ සංඥාවෝ උපදිත්. අන්‍යවූ සංඥාවෝ නිරුද්ධවෙත්. පොට්ඨපාදය, යම්සේ සංඥාතොමෝ අනිකක්ම වන්නීද, ආත්මයතෙම අනිකෙක්ම වන්නේද, මෙසේ මේ ක්‍රමයෙන් මේ කාරණය දතයුතුයයි වදාළසේක.

19. මනොමයං බො අහං භන්තෙ අත්තානං පච්චෙමි සබ්බඞ්ගපච්චඞ්ගිං අහීනින්ද්‍රියන්ති. මනොමයොචහි තෙ පොට්ඨපාද අත්තා අභවිස්ස සබ්බඞ්ගපච්චඞ්ගී අහීනින්ද්‍රියො. එවං සන්තම්පි බො තෙ පොට්ඨපාද අඤ්ඤාව සඤ්ඤා භවිස්සති අඤ්ඤා අත්තා. තදමිනාපෙතං පොට්ඨපාද පරියායෙන වෙදිතබ්බං, යථා අඤ්ඤාව සඤ්ඤා භවිස්සති අඤ්ඤා අත්තා. තිට්ඨතෙවායං පොට්ඨපාද මනොමයො අත්තා සබ්බඞ්ගපච්චඞ්ගී අහීනින්ද්‍රියො. අථ ඉමස්ස පුරිසස්ස අඤ්ඤා ච සඤ්ඤා උප්පජ්ජන්ති අඤ්ඤා ච සඤ්ඤා නිරුජ්ඣන්ති. ඉමිනා පි බො එතං පොට්ඨපාද පරියායෙන වෙදිතබ්බං යථා අඤ්ඤා ච සඤ්ඤා භවිස්සති අඤ්ඤා අත්තාති.

20. අරූපිං බො අහං භන්තෙ අත්තානං පච්චෙමි සඤ්ඤාමයන්ති. අරූපීචහි තෙ පොට්ඨපාද අත්තා අභවිස්ස සඤ්ඤාමයො, එවං සන්තම්පි බො තෙ පොට්ඨපාද පරියායෙන වෙදිතබ්බං යථා අඤ්ඤා ච සඤ්ඤා භවිස්සති අඤ්ඤා අත්තා. තිට්ඨතෙවායං පොට්ඨපාද අරූපී අත්තා සඤ්ඤාමයො.

---

19. ස්වාමීනි, මම ආත්මය සකලාඞ්ගප්‍රත්‍යඞ්ගයන් ඇත්තාවූ ඉඳුරන්ගෙන් නොපිරිහුණාවූ මනොමයයයි දනගණිමියි කීයේය. පොට්ඨපාදය, ආත්මයතෙම සකලාඞ්ගප්‍රත්‍යඞ්ගයන් ඇත්තාවූ ඉඳුරන් ගෙන් නොපිරිහුණාවූ මනොමයයි කියාත් තාගේ දනගැණීම වේද, පොට්ඨපාදය, එසේඇතිකලත් තට සංඥාව අනිකක් වන්නිය. ආත්මය අනිකෙක් වන්නේය. පොට්ඨපාදය, යම්සේ සංඥාතොමෝ අනිකක්ම වන්නිද, ආත්මය අනිකෙක් වන්නේද, මෙසේ මේ ක්‍රමයෙන්ද ඒ මේ කාරණය දතයුතුය. පොට්ඨපාදය, ඒ මෙ ආත්මය සකලාඞ්ගප්‍රත්‍යඞ්ගයන් ඇත්තාවූ ඉඳුරන්ගෙන් නොපිරිහුණාවූ මනොමය යනු තිබුනාවේ. එසේකලැ මේ පුරුෂයාහට අන්‍යවූ සංඥාවෝ උපදිත්· අන්‍යවූ සංඥාවෝ නිරුඬවෙත්යයි වදළසේක.

20. ස්වාමීනි,මම ආත්මයතෙම අරූපීවූ සංඥාමයයි දනිමියි කීයේය. පොට්ඨපාදය, තට ආත්මයතෙම අරූපීවූ සංඥාමය වේද. පොට්ඨපාදය, එසේඇතිකල්හිද තට සංඥාව අනිකක් වන්නිය. ආත්මයතෙම අනිකෙක් වන්නේය. පොට්ඨපාදය, යම්සේ සංඥාව අනිකක්ම වන්නිද. ආත්මයතෙම අනිකෙක්ම වන්නේද. මෙසේ මේ ක්‍රමයෙන්ද ඒ මේ කාරණය දතයුතුය. පොට්ඨපාදය, මේ ආත්මය අරූපීවූ සංඥාමයයනු තිබුනාවේ,

අථ ඉමස්ස පුරිසස්ස අඤ්ඤාච සඤ්ඤා උප්පජ්ජන්ති, අඤ්ඤා ච සඤ්ඤා නිරුජ්ඣන්ති. ඉමිනාපි බො එතං පොට්ඨපාද පරියායෙන වෙදිතබ්බං යථා අඤ්ඤා ච සඤ්ඤා භවිස්සති අඤ්ඤා අත්තාති.

21. සක්කා පනෙතං භන්තෙ මයා ඤාතුං සඤ්ඤා පුරිසස්ස අත්තාති වා අඤ්ඤා සඤ්ඤා අඤ්ඤා අත්තා ති වා. දුජ්ජානං බො එතං පොට්ඨපාද තයා අඤ්ඤදිට්ඨිකෙන අඤ්ඤඛන්තිකෙන අඤ්ඤරුචිකෙන අඤ්ඤත්‍රායොගෙන අඤ්ඤත්‍රාචරියකෙන සඤ්ඤා පුරිසස්ස අත්තාති වා, අඤ්ඤා සඤ්ඤා අඤ්ඤා අත්තාති වාති.

22. සචෙ තං භන්තෙ මයා දුජ්ජානං අඤ්ඤදිට්ඨිකෙන අඤ්ඤඛන්තිකෙන අඤ්ඤරුචිකෙන අඤ්ඤත්‍රායොගෙන අඤ්ඤත්‍රාචරියකෙන සඤ්ඤා පුරිසස්ස අත්තාති වා අඤ්ඤා සඤ්ඤා අඤ්ඤා අත්තාති වා, කිං පන භන්තෙ සස්සතො ලොකො. ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති.

එසේ ඇතිකල මේ පුරුෂයාහට අන්‍යවූ සංඥවෝ උපදිත්. අන්‍යවූ සංඥවෝ නිරුඬවෙත්. පොට්ඨපාදය, යම්සේ සංඥව අනිකක්ම වන්නීද, ආත්මය අනිකෙක්ම වන්නේද, මෙසේ මේ ක්‍රමයෙන්ද ඒ මේ කාරණය දතයුතුයයි වදාළසේක.

21. ස්වාමිනි, සංඥාව පුරුෂයාගේ ආත්මයදැයි කියා හෝ සංඥාව අනිකක්මය, ආත්මය අනිකෙක්දැයි කියා හෝ මාවිසින් දැනගත හැක්කේයයි විචාළේය. පොට්ඨපාදය, අන් ආකාරයකින් පැවති ලබ්ධි ඇත්තාවූ අනිකක් කැමැත්තාවූ අනිකක් රුචිවූ අන්‍ය ප්‍රතිපත්තියක යෙදුනාවූ අන්‍ය තීර්ථායතනයක ඇදුරුවූ තාවිසින් සංඥාව පුරුෂයාගේ ආත්මයදැයි කියා හෝ සංඥාව අනිකක ආත්මය අනිකෙක්දැයි කියා හෝ මේ කාරණය දැනගණු නොහැක්කේයයි වදාළසේක.

22. ස්වාමිනි, ඉදින් අන් ආකාරයකින් පැවති ලබ්ධි ඇත්තාවූ අනිකක් කැමතිවූ අනිකක් රුචිවූ අන්‍ය ප්‍රතිපත්තියක යෙදුනාවූ අන්‍ය තීර්ථායතනයක ඇදුරුවූ මාවිසින් සංඥාව පුරුෂයාගේ ආත්මයදැයි කියා හෝ සංඥාව අනිකක ආත්මය අනිකෙක්දැයි කියා හෝ මේ කාරණය දැනගණු නොහැකිවේනම් කිමෙක්ද ස්වාමීනි, ලොකය හෙවත් ආත්මය සදාකාලිකය යන මේ කීමම සත්‍යද සදාකාලික නොවෙයි යන අනික් කීම අසත්‍යයදැයි විචාළේය.

අබ්‍යාකතං ඛො පොට්ඨපාද මයා සස්සතො ලොකො, ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති. කිං පන භන්තෙ, අසස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති. එතං පි ඛො පොට්ඨපාද මයා අබ්‍යාකතං අසස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති. කිං පන භන්තෙ අන්තවා ලොකො ....පෙ.... අනන්තවා ලොකො තං ජීවං තං සරීරං අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං හොති තථාගතො පරම්මරණා න හොති තථාගතො පරම්මරණා, හොති ච න ච හොති තථාගතො පරම්මරණා නෙව හොති න න හොති තථාගතො පරම්මරණා ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති. එවම්පි ඛො පොට්ඨපාද මයා අබ්‍යාකතං නෙව හොති න න හොති තථාගතො පරම්මරණා ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති.

23. කස්මා පනෙතං භන්තෙ භගවතා අබ්‍යාකතන්ති. න හෙතං පොට්ඨපාද අත්ථසංහිතං න ධම්මසංහිතං නාදිබ්‍රහ්මචරියකං,

---

පොට්ඨපාදය, ලොකය හෙවත් ආත්මය සදාකාලිකය යන මේ කීමම සත්‍යය සදාකාලික නොවෙයි යන අනිත් කීම අසත්‍යයයි මාවිසින් ප්‍රකාශනොකරණලද්දේයයි වදාළසේක. කිමෙක්ද ස්වාමීනි, ලොකය හෙවත් ආත්මය සදාකාලික නොවෙයි යන මේ කීමම සත්‍යද සදාකාලිකය යන අනිත්කීම අසත්‍යදැයි විචාළේය. පොට්ඨපාදය; ලොකය හෙවත් ආත්මය සදාකාලික නොවෙයි යන මේ කීමම සත්‍යය සදාකාලිකය යන අනිත් කීම අසත්‍යය යන මේද මාවිසින් ප්‍රකාශනොකරණලද්දේයයි වදාළසේක. කිමෙක්ද ස්වාමීනි, ලොකය හෙවත් ආත්මයතෙම කෙළවරඇත්තේද—පෙ—ජීවය හෙවත් ප්‍රාණය හේම වෙයි. ඒ ශරීරය හේම වෙයි. ජීවය අනිකක් වෙයි. ශරීරය අනිකක් වෙයි. සත්වතෙම මරණින්මතු උපදනේය. සත්වතෙම මරණින්මතු නූපදනේය, සත්වතෙම මරණින්මතු උපදනේත් නොවෙයි, නූපදනේත් නොවෙයි යන මේ කීමම සත්‍යද අනිත්කීම අසත්‍යදැයි විචාළේය. පොට්ඨපාදය, සත්වතෙම මරණින්මතු උපදනේත් නොවෙයි නූපදනේත් නොවෙයි යන මේ කීමම සත්‍යය අනිත් කීම අසත්‍යය යන මේද මාවිසින් ප්‍රකාශනොකරණලද්දේයයි වදාළසේක.

23. ස්වාමීනි, කවරකාරණයකින් භාග්‍යවතුන්වහන්සේ විසින් මේ කාරණය ප්‍රකාශනොකළසේක්දැයි විචාළේය. පොට්ඨපාදය මේ ලොකය සදාකාලිකය යනාදි දෘෂ්ටියතෙම ආත්මාර්ථපරාර්ථනිශ්‍රිත නොවෙයි. නවලොකොත්තරධර්මනිශ්‍රිත නොවෙයි, ශාසනබ්‍රහ්මචර්‍ය්‍යාවගේ අධිශීල ශික්‍ෂාමාත්‍රයකුදු නොවෙයි,

න නිබ්බිදාය න විරාගාය න නිරෝධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බෝධාය න නිබ්බාණාය සංවත්තති. තස්මා තං මයා අබ්‍යාකතන්ති

24. කිං පන භන්තෙ භගවතා බ්‍යාකතන්ති. ඉදං දුක්ඛන්ති බෝ පොඨපාද මයා බ්‍යාකතං අයං දුක්ඛසමුදයොති බෝ පොඨපාද මයා බ්‍යාකතං. අයං දුක්ඛනිරොධොති බෝ පොඨපාද මයා බ්‍යාකතං අයං දුක්ඛනිරොධගාමිනීපටිපදාති බෝ පොඨපාද මයා බ්‍යාකතන්ති.

25. කස්මා පනෙතං භන්තෙ භගවතා බ්‍යාකතන්ති. එතංහි බෝ පොඨපාද අත්ථසංහිතං එතං ධම්මසංහිතං එතං ආදිබ්‍රහ්මචරියකං එතං නිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බාණාය සංවත්තති.

සංසාරවෘතතියසම්බන්ධී කලකිරීම පිණිස නොපවතියි. සංසාරවෘතයෙහි නොඇලීමපිණිස නොපවතියි, සංසාරවෘතයාගේනිරොධයපිණිස නොපවතියි, සංසාරවෘතයාගේ ව්‍යපසමනයපිණිස නොපවතියි, සංසාරවෘතය ප්‍රත්‍යක්‍ෂකිරීමපිණිස නොපවතියි, සංසාරවෘතයාගේ අවබොධය පිණිස නොපවතියි, අමාමහනිවන් පසක්කිරීමපිණිස නොපවතියි, එබැවින් ඒ මාවිසින් ප්‍රකාශනොකරණලද්දේයයි වදාළසේක.

24. ස්වාමිනි, භාග්‍යවතුන්වහන්සේ කුමක් ප්‍රකාශකරණලද්දේදැයි විචාළේය. පොඨපාදය, මාවිසින් දුක මේයයි ප්‍රකාශකරණ ලද්දේය. පොඨපාදය, මාවිසින් දුක්හටගැණීමේ කාරණය මේයයිප්‍රකාශකරණලද්දේය. පොඨපාදය, මාවිසින් දුක්නිරුඬකිරීම මේයයි ප්‍රකාශකරණලද්දේය. පොඨපාදය, මාවිසින් දුක්නිරුඬකිරීමට පමුණුවන් නාවූ පිළිපැදීම මේයයි ප්‍රකාශකරණලද්දේයයි වදාළසේක.

25. ස්වාමිනි, භාග්‍යවතුන්වහන්සේ විසින් මේ කුමට ප්‍රකාශකරණලද්දේදැයි විචාළේය. පොඨපාදය, මේ වනාහි ආත්මාර්‍ථනිශ්‍රිතවෙයි. නවලොකොත්තරධර්‍මනිශ්‍රිත වෙයි. ශාසනබ්‍රහ්මචර්‍ය්‍යාවගේ අධිශීලශික්‍ෂාව වෙයි. සංසාර වෘතයට කලකිරීමපිණිස පවතියි. සංසාර වෘතයෙහි නොඇල්මපිණිස පවතියි. සංසාරවෘතයාගේ නිරොධයපිණිස පවතියි. සංසාර වෘතයාගේ ව්‍යපසමනය පිණිස පවතියි. සංසාරවෘතයාගේ ප්‍රත්‍යක්‍ෂකිරීමපිණිස පවතියි. සංසාරවෘතයාගේ අවබොධය පිණිස පවතියි. අමාමහනිවන් පසක් කිරීමපිණිස පවතියි.

තස්මා එතං මයා බ්‍යාකතන්ති. එවමෙතං භගවා එවමෙතං සුගත. යස්‍ස දානි භන්තෙ භගවා කාලං මඤ්ඤසීති. අථ ඛො භගවා උට්ඨායා සනා පක්කාමි.

26. අථ ඛො තෙ පරිබ්බාජකා අචිරපක්කන්තස්‍ස භගවතො පොට්ඨපාදං පරිබ්බාජකං සමන්තතො වාචා සන්නිතොදකෙහි සඤ්ජම්භරිමකංසු. එවමෙව පනායං භවං පොට්ඨපාදො යඤ්ඤදෙව සමණො ගොතමො භාසති තං තදෙවස්‍ස අබ්භනුමොදති. එවමෙතං භගවා එවමෙතං සුගතාති. න ඛො පන මයං කිඤ්චි සමණස්‍ස ගොතමස්‍ස එකංසිකං ධම්මං දෙසිතං ආජානාම සස්‍සතො ලොකොති වා අසස්‍සතො ලොකොති වා අන්තවා ලොකොති වා අනන්තවාලොකොති වා තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා හොති තථාගතො පරම්මරණාති වා, න හොති තථාගතො පරම්මරණාති වා හොති ච නච හොති තථාගතො පරම්මරණාති වා නෙව හොති න නහොති තථාගතො පරම්මරණාති වාති. එවං වුත්තෙ පොට්ඨපාදො පරිබ්බාජකො තෙ පරිබ්බාජකෙ එතදවොච.

එබැවින් මාවිසින් මේතෙම ප්‍රකාශකරණලද්දේයයි වදාළසේක. භාග්‍යවතුන්වහන්ස, ඒ එසේය සුගතයන්වහන්ස, ඒ එසේය. ස්වාමීනි, භාග්‍යවත්තෙම යම් ගමනකට කැමැත්තේනම් දැන් ඊට කල්දන්නාසේක්වායි කීයේය. ඉක්බිත්තෙන් භාග්‍යවත්තෙම හුනස්නෙන් නැගිට වැඩිසේක.

26. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ වැඩ නොබෝකලකින් ඒ පරිව්‍රාජකයෝ පොට්ඨපාද පරිව්‍රාජකයාහට වචන නැමැති කෙවිටිවලින් මතුමත්තෙහි ඇන්නෝය. ගෞතමශ්‍රමණතෙම යමක්කියාද, මේ ගෞතමශ්‍රමණයින්ගේ ඒ්කීම භාග්‍යවතුන්වහන්ස, ඒ එසේය සුගතයන්වහන්ස, ඒ එසේයයි මේ පින්වත්පොට්ඨපාදතෙම අනුමෝදන්වෙත්යයි.එසේමය ලොකය හෙවත් ආත්මය සදාකාලිකයයි කියා හෝ ලොකය හෙවත් ආත්මය සදාකාලික නොවේයයි කියා හෝ ලොකය හෙවත් ආත්මයතෙම කෙළවර ඇත්තේයයි කියා හෝ ලොකය හෙවත් ආත්මයතෙම කෙළවර නැත්තේයයි කියා හෝ ජීවය හෙවත් ප්‍රාණය හේමය ශරීරය හේමයයි කියා හෝ ජීවය හෙවත් ප්‍රාණය අනිකක ශරීරය අනිකකැයි කියා හෝ මරණින්මතු සත්වතෙම උපදනේය කියා හෝමරණින්මතු සත්වතෙම නූපදනේය කියා හෝ මරණින්මතු සත්වතෙම උපදනේත් නොවෙයි නූපදනේත් නොවෙයි. කියා හෝ ගෞතමශ්‍රමණයාගේ එකාන්තකොට දෙශනාකරණලද්දාවූ කිසි ධර්මයක් අපිනොදනිමුයි. මෙසේකී කල්හි පොට්ඨපාද පරිබ්‍රාජකතෙම ඒපරිබ්‍රාජකයන්ට මේ කාරණය දැන්වීය. කෙසේද.

අහංපිඛො හො නකිඤ්චි සමණස්ස ගොතමස්ස එකංසිකං ධම්මං දෙසිතං ආජානාමි සස්සතො ලොකොතිවා අසස්සතො ලොකොතිවා ...පෙ... නෙව හොති න නහොති තථාගතො පරම්මරණාති වා. අපි ච සමණො ගොතමො භූතං තච්ඡං තථං පටිපදං පඤ්ඤපෙති ධම්මට්ඨිතං ධම්මනියාමකං. භූතං ඛො පන තච්ඡං තථං පටිපදං පඤ්ඤාපෙන්තස්ස ධම්මට්ඨිතං ධම්මනියාමකං. කථං හි නාම මාදිසො විඤ්ඤූ සමණස්ස ගොතමස්ස සුභාසිතං සුභාසිතතො නාබ්භනුමොදෙය්‍යාති.

27. අථ ඛො ද්වීහතීහස්ස අච්චයෙන චිත්තො ච හත්ථිසාරිපුත්තො පොට්ඨපාදො ච පරිබ්බාජකො යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා චිත්තො හත්ථිසාරිපුත්තො භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි, පොට්ඨපාදො පන පරිබ්බාජකො භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො පොට්ඨපාදො පරිබ්බාජකො භගවන්තං එතදවොච. තදා මං භන්තෙ පරිබ්බාජකා අභිරපක්කන්තස්ස භගවතො සමන්තතො වාචාසන්නිතොදකෙහි සඤ්ඡම්භරිමකංසු.

ඒ භාග්‍යවත්තෙම ආදියෙහි සොභනවූ හෙවත් නිරවද්‍යවූ මධ්‍යයෙහි සොභනවූ හෙවත් නිරවද්‍යවූ අවසානයෙහි සොභනවූ හෙවත් නිරවද්‍යවූ සතරසතිපට්ඨානාදීන් නිශ්‍රිත හෙයින් අර්ථ සහිතවූ සිථිල ධනිතාදි දශවිධ ව්‍යඤ්ජනයන් සම්පූර්ණකොට දෙසන හෙයින් ව්‍යඤ්ජන සහිතවූ සියල්ලෙන් පිරුණාවූ පිරිසුදුවූ ධර්මය දෙශනා කරණ සේක්ද. ශික්‍ෂාත්‍රය සංගෘහිත සකල ශාසන බ්‍රහ්මචර්‍ය්‍යාව ප්‍රකාශ කෙරේද. ගෘහපතියෙක් හෝ ගෘහපති පුත්‍රයෙක් හෝ අන් කුලයන් අතුරෙන්එක්තරාකුලයකඋපන්නෙක් හෝ ඒ දහම් අසාද. හෙතෙම ඒ පිරිසුදු දහම් අසා තථාගතයන්වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව ලබාද ශ්‍රද්ධාප්‍රතිලාභයෙන් යුක්තවූ ඒ පුද්ගල තෙම මෙසේ කල්පනා කෙරෙයි. ගිහිගෙයි විසීම කුසල් කිරීම පිණිස අවකාශ නැති බැවින් පීඩා සහිතය. කෙලෙස් රජසුන්ගේ සන්නිපාතස්ථානය හෙයින් රජෝමාර්ගයෙක. ප්‍රව්‍රජ්‍යාව අභ්‍යවකාශයි නිර්මලභාවයෙන් ධෞත සඞ්ඛයක් හා සමානවූ එකාන්තයෙන් පරිපූර්ණවූ එකාන්ත පරිශුද්ධවූ මේ බ්‍රහ්මචර්‍ය්‍යායෙහි හැසිරෙන්නට පහසුනොවෙයි. මම ඉසකේ දැළිරැවුලුහරවා කාසාය වස්ත්‍රයන් ඇඳපොරවා ගිහිගෙන්නික්ම සසුන්හි පැවිදිවන්නෙම්නම් ඉතා යෙහෙකැයි කියාය. හෙතෙම මෑත කාලයෙහි ස්වල්පවූ හෝ භොනරාශිය හැර බොහෝවූ හෝ භොගරාශියහැර මදවූ හෝ ඥාති සමූහයා හැර මහත්වූ හෝ ඥාතිසමූහයා හැර ඉසකේ දැළිරැවුලු බහා කාසාය වස්ත්‍රයන් හැඳ පොරවා පීඩාසහිතවූ ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිවේ.

8. සොඑවං පබ්බජිතො සමානො පාතිමොක්ඛ සංවර සංවුතො විහරති ආචාර ගොචර සම්පන්නො අනුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු කායකම්මවචීකම්මෙන සමන්නාගතො කුසලෙන පරිසුද්ධාජීවො සීලසම්පන්නො ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො සන්තුට්ඨො කථඤ්ච මාණව භික්ඛු සීලසම්පන්නො හොති. ඉධ මාණව භික්ඛු පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති නිහිත දණ්ඩො නිහිත සත්ථො ලජ්ජී දයාපන්නො සබ්බපාණභූත හිතානුකම්පී විහරති. යම්පි මාණව භික්ඛු පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජීදයාපන්නො සබ්බපාණභූත හිතානුකම්පී විහරති ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

8. හෙතෙම මෙසේ පැවිදිවූයේ ප්‍රාතිමොක්ෂ සංවරයෙන් යුක්තවූයේ ආචාරයෙන් හා ගොචරයෙන් යුක්තවූයේ ස්වල්ප මාත්‍රවූද අකුශල ධර්මයන් විෂයෙහි භය දක්නා සුලුවූයේ කුසල්වූ කායකර්ම වචීකර්මදෙකින් යුක්තවූයේ ශික්ෂාපදයන් මනාකොට ගෙණ ඒ ඒ ශික්ෂාපදයන් කෙරෙහි හික්මෙයි. පිරිසුදුවූ ජීවිකාව ඇත්තේ තුන්වැදෑරුම් ශීලයෙන් යුක්තවූයේ, ෂඩ්විධවූ ඉන්ද්‍රියයන් කෙරෙහි වසනලද දොරටු ඇත්තේ, ඉදිරි ගමනය ආපසුගමනය යනාදි සප්තස්ථානයෙහි ස්මෘති සම්‍යක් ඥානයෙන් යුක්තවූයේ චීවරාදි චතුර්විධ ප්‍රත්‍යයෙහි ත්‍රිවිධසන්තොෂයෙන් යුක්තවූයේ වෙසෙයි. මාණවකය, කෙසේනම් භික්ෂුතෙම ශීලයෙන් යුක්තවූයේ වේද? මාණවකය, මේසස්නෙහි ශ්‍රමණයෙක් ප්‍රාණඝාතය හැර ප්‍රාණඝාතයෙන් වැළැක්කේවේද පරොපඝාතනය පිණිස දඬුගෙණ නොපවත්නා බැවින් බහා තබනලද දඬු ඇත්තේවේද, පරොපඝාතනය පිණිස ශස්ත්‍රගෙණ නොපවත්නා බැවින් බහාතබනලද ආයුධ ඇත්තේවේද පාපයෙහි පිළිකුල් කිරීම ලක්ෂණකොට ඇති ලජ්ජායෙන් යුක්තවූයේ වේද මෙත් සිතට පැමිණියේ වේද සියලු සතුන් කෙරෙහි හිතයෙන් අනුකම්පාකරමින් වාසයකෙරේද. මාණවකය, යම්හෙයකින් මහණතෙම ප්‍රාණඝාතයහැර ප්‍රාණඝාතයෙන් විශෙෂයෙන්, වැළැක්කේවේද බහාතබනලද දඬු ඇත්තේ වේද බහා තබනලද ආයුධ ඇත්තේ වේද පාපයෙහි ලජ්ජාඇත්තේවේද කරුණාවෙන් යුක්තවූයේවේද, සියලු සත්වයන්කෙරෙහි හිතයෙන් අනුකම්පා කරමින් වාසයකෙරේද, මේද ඒ ශ්‍රමණයාගේ ශීලයවෙයි.

අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො හොති දින්නාදායී දින්නපාටිකඞ්ඛී අථෙනෙන සුචිභූතෙන අත්තනා විහරති ... පෙ ... ඉදම්පිස්ස හොති සීලස්මිං. අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී හොති ආරාචාරී විරතො මෙථුනා ගාමධම්මා ඉදම්පිස්සහොති සීලස්මිං. මුසාවාදං පහාය මුසාවාදාපටිවිරතො හොති සච්චවාදී සච්චසන්ධො ථෙතො පච්චයිකො අවිසංවාදකො ලොකස්ස. ඉදම්පිස්ස හොති සීලස්මිං.

9. පිසුණාවාචම්පහාය පිසුණායවාචාය පටිවිරතො හොති. ඉතො සුත්වා න අමුත්‍රඅක්ඛාතා ඉමෙසම්භෙදාය අමුත්‍රවා සුත්වා න ඉමෙසං අක්ඛාතා අමූසම්භෙදාය ඉති භින්නානං වා සන්ධාතා සහිතානං වා අනුප්පදාතා සමග්ගාරාමො සමග්ගරතො සමග්ගනන්දි සමග්ගකරණිං වාචම්භාසිතා හොති ඉදම්පිස්ස හොති, සීලස්මිං.

අදත්තාදානය හැර අදත්තා දානයෙන් වැළැක්කෝ වේද, දුන්දෙයම ගන්නා සුලුවේද, සිතින්ද දෙනලද්දක්ම කැමැතිවන සබ භාව ඇත්තේවේද චෞර්‍ය්‍යාරහිතවූ පවිත්‍රවූ ආත්මභාවයෙන් යුක්තව වෙසේද---පෙ---මේද ඒ ශ්‍රමණයාගේ ශීලය වෙයි. ලාමකවූ චර්‍ය්‍යාවහැර අබ්‍රහ්මචර්‍ය්‍යාවෙන් දුරුව හැසිරෙණ සබභාව ඇත්තේ, ගම්වැස්සන්ගේ සබභාවවූ මෛථුනයෙන් වැළැක්කෝ,ශ්‍රෙෂ්ඨවූචර්‍ය්‍යාවෙහි හැසිරෙණ සබභාව ඇත්තේද, මේද ඒශ්‍රමණයාගේ ශීලයවෙයි. මුසාවාදය හැර මුසාවාදයෙන් විශෙෂයෙන් වැළැක්කෝ සත්‍යය කියන සුළුවූයේ අතරතුර බොරුනොකියා සත්‍යයෙන් සත්‍යය ගළපන සුලුවූයේ වචන දෙකක් නොකියන හෙයින් ස්ථිරවූ කථාඇත්තේ, ඇදහියයුතු වචන ඇත්තේ ලොකයා නොරවටන්නේ වේද, මේද ඒ ශ්‍රමණයාගේ ශීලය වෙයි.

9. කේලාම්කීමෙන් ප්‍රිය භාවය නැතිකරණ වචන කීමෙන් විශෙෂයෙන් වැළැක්කෝවේද. මෙතනින් අසා මොවුන්ගේ භෙදය පිණිස එතැන්හි නොකියන්නේද. එතැනින් හෝ අසා ඔවුන්ගේ භෙදය පිණිස මොවුන්ට නොකියන්නේද. මෙසේ භෙදවූවන්ගේ ගැළපීම හෝ කරන්නේ සමගිවූවන්ට අනුබලදෙන්නේ සමගිවූවන් අතුරෙහි වාසයකරන්නේ සමගිවූවන් කෙරෙහි ඇළුනේ සමගිවූවන් දැකද, අසාද, සතුටුවන සුලුවූයේ සමගියෙහි ගුණපහළකරණ වචනයන් කියන්නේවේද, මේද ඔහුගේ ශීලයවෙයි.

ඵරුසාවාචම්පහාය ඵරුසාය වාචාය පටිවිරතො හොති යාසා වාචා නෙලාකණ්ණසුඛා පෙමනීයාහදයඞ්ගමාපොරිබහුජනකන්තාබහුජන මනාපා තථාරූපිං වාචංභාසිතා හොති, ඉදම්පිස්ස හොති සිලස්මිං. සම්ඵප්පලාපංපහාය සම්ඵප්පලාපා පටිවිරතො හොති කාලවාදී භූතවාදි අත්ථවාදී ධම්මවාදී විනයවාදී නිධානවතිං වාචං භාසිතා කාලෙන සාපදෙසං පරියන්තවතිං අත්ථසංහිතං ඉදම්පිස්ස හොති සීලස්මිං. බීජගාම භූතගාම සමාරම්භා පටිවිරතො හොති එකභත්තිකො හොති රත්තූපරතො විරතො විකාලභොජනා නච්චගීතවාදිතවිසූකදස්සනා පටිවිරතො හොති මාලාගන්ධ විලෙපන ධාරණ මණ්ඩණ විභූසනට්ඨානා පටිවිරතො හොති උච්චාසයන මහාසයනා පටිවිරතො හොති. ජත රූප රජත පටිග්ගහණා පටිවිරතො හොති.

පරුෂවචනයෙන්දුරුව පරුෂවචනෙන් වැළැක්කේ වේද. යම්බඳුවූ වචනයෙක්දොෂරහිතද, කන්වලට සැපවන්නිද, අර්ථමධුර න්‍යායෙන් සියල්සිරුරෙහි කොපය නූපදවාප්‍රෙමය උපදවනබැවින්ප්‍රෙමකටයුත්තිද, නොපැකිළසිතට සැපසේ වදනා හෙයින් සිත්කලුවන්නිද, නගරවාසීන්ගේ කථාවමෙන් සුකුමාරවන්නිද, බොහෝ දනන්හට ප්‍රියවන්නිද, බොහෝ ජනයාගේ මනවැඩීම කරන්නිද, එබඳුවූ වචන කියන්නේ වේද, මේද ඒ මහණහුගේ ශීලය වෙයි. නිරර්ථකවූ කථාව හැර නිරර්ථකවූ කථාව කෙරෙන් විශෙෂයෙන් වැළකුනේ වේද, කියයුතු කල් සලකා කියනසුලුද, සත්‍යවූ ඇතිදෙයම කියනසුලුද, මෙලොව පරලොව පිළිබඳවූ අර්ථය ආශ්‍රයකොටම කියන සුලුද, නවලොවිතුරු දහම් ඇසුරුකොටම කියන සවභාව ඇත්තේද. සංවරවිනය පහාණවිනය නිශ්‍රිතකොට කියන සුලුද සුදුසු කල්බලා කරුණා සහිතවූ අවසානය ඇත්තාවූ අර්ථයෙන් යුක්තවූ ලයෙහි පිහිටුවියයුතු වචන කියන සවභාව ඇත්තේ වේද. මේද ඒ මහණහුගේ ශීලය වේ. තෘණවෘක්ෂලතාදීන්ගේ සිඳීම් බිඳීම් ආදි විකොපනයෙන් විශෙෂයෙන් වැළකුනේ වේද. රාත්‍රිභොජනයෙන් වැළකුනේ විකල්බොදුනෙන් වෙසෙසින් වැළකුනේ එක්වේලේ වළඳන බත් ඇත්තේ වේද. නැටීම් ගීකීම් වැයීම් විසුලුදස්නෙන් වැළකුනේවේද. මල්ය සුගන්ධජාතිය ශරීරයෙහි ආලෙපකරණදෑය යන මේ සියල්ල දුරීමද අඩුතැන් පිරීමයයි කියනලද, මණ්ඩනයද, සුගන්ධවශයෙන් හා ඡවිරාගවශයෙන් අලඞ්කාර කිරීමය යන මෙයින් වැළකුනේ වේද. උසසුත් මහඅස්නෙහි වැළකුනේවේද, රන්රිදීමසු කහවණු පිළිගැන්මෙන් වැළකුනේ වේද,

ආමකධඤ්ඤ පටිග්ගහණා පටිවිරතො හොති. ආමකමංස
පටිග්ගහණා පටිවිරතො හොති. ඉත්ථිකුමාරික පටිග්ගහණා පටිවිර
තො හොති. දාසිදාස පටිග්ගහණා පටිවිරතො හොති. අජෙළක
පටිග්ගහණා පටිවිරතො හොති. කුක්කුට සූකර පටිග්ගහණා පටිවිර
තො හොති හත්ථිගවාස්සවළවා පටිග්ගහණා පටිවිරතො හොති.
ඛෙත්ත වත්ථු පටිග්ගහණා පටිවිරතො හොති. දූතෙය්‍යපහිණගම
නානුයොගා පටිවිරතො හොති. කයවික්කයා පටිවිරතො හොති. තුලා
කූට කංස කූට මානකූටා පටිවිරතො හොති. උක්කොටන වඤ්චන
නිකතිසාචියොගා පටිවිරතො හොති. ඡෙදන වධබන්ධන විපරාමොස
ආලොප සහසාකාරා පටිවිරතො හොති යම්පි මාණව භික්ඛු ඡෙදන
වධබන්ධන විපරාමොස ආලොප සහසාකාරා පටිවිරතො හොති
ඉදම්පිස්ස හොති සීලස්මිං.

සාලිව්‍රීහි ආදිසප්තවිධආමක ධාන්‍යපිළිගැන්මෙන් වැළකුනේ වේද.
ආමක මත්ස්‍ය මාංස ප්‍රතිග්‍රහණයෙන් වැළකුනේ වේද. පුරුෂාන්තර
ගත ස්ත්‍රීන් හා පුරුෂයන් කරා නොපැමිණි කුමරියන් පිළිගැණී
මෙන් වැළකුනේ වේද, දාසිදාස වනයෙන්ම දාසි දාසයන්ගේ පිළිගැ
ණීමෙන් වැළකුනේ වේද. තිරෙළුවන් හා එළුවන් පිළිගැණීමෙන්
වැළකුනේ වේද. කුකුළන් හා ඌරන්පිළිගැණීමෙන් වැළකුනේවේද.
ඇත් ගවඅස් වෙළඹු යන මොවුන්ගේ පිළිගැණීමෙන් වැළකුනේ
වේද. කෙත් වත් පිළිගැණීමෙන් වැළකුනේ වේද. ගිහින්ගේ පත්‍ර
හෝ හසුන් හෝ ගෙණ ඒ ඒ තන්හි යාමයයි කියනලද දූතකම්හි
හා ගෙයින් ගෙට යානකුදු මහත් මෙහෙවර කිරීමෙන් වැළැක්කේ
වේද. ක්‍රයවික්‍රයයි කියනලද ගණුදෙනු කිරීමෙන් වැළැක්කේ
වේද. තරාදි ආදියෙන් වඤ්චාකොට ගැණීම හා දීමද රන්ගැ
තලි රන්තලියයි කියා වඤ්චාකොට දීමද, තලසහල් ආදිය වඤ්චා
කොට මැණ ගැණීම හා දීමද, යන මෙයින් වැළකුනේ වේද. අහිමි
යන් හිමියන් කිරීමට අත්ලස් ගැණීමද, ඒ ඒ උපාය වලින් අනුන්
වඤ්චාකිරීමද, මායා වසයෙන් රත්රන් නොවන්නක් රත්රන්යයි
කියා වඤ්චා කිරීමද, යන මේ කුටිලයෝගයෙන් වැළකුනේ වේද
අත්සිඳීම් ආදියද, වධකිරීමය රජ්ජුබන්ධනාදියෙන් බැඳීමය; වස්ත්‍ර
පැහැර ගැණීමය ගම් නියම්ගම් ආදීන්ගේ පැහැරීමය ගෙටවැද
මිනිසුන්ගේ ළයෙහි ආයුධ තබා කැමැතිවනලද බඩුගැණීමයයි කියන
නලද, සාහසික ක්‍රියාකිරීමය යන මෙයින් වැළකුනේ වේද. මාණ
වකය යම් හෙයකින්මහණ තෙමේ සිඳීමය. වධකිරීමය. බැඳීමය.
වස්ත්‍ර පැහැර ගැණීමය. ගම්පැහැරීමය. සාහසික ක්‍රියා කිරීමය.
යන මෙයින් වැළකුනේ වේද. මේද ඒමහණ හුගේ ශීලය වේ.

10. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං බීජගාම භූතගාම සමාරම්භං අනුයුත්තා විහරන්ති සෙය්‍යථිදං මූලබීජං ඛන්ධබීජං ඵලුබීජං අග්ගබීජං බීජබීජමෙව පඤ්චමං ඉති එවරූපා බීජගාම භූතගාම සමාරම්භා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථිදං අන්නසන්නිධිං පානසන්නිධිං වත්ථසන්නිධිං යානසන්නිධිං සයනසන්නිධිං ගන්ධසන්නිධිං ආමිසසන්නිධිං ඉතිවා ඉති එවරූපා සන්නිධිකාර පරිභොගා පටිවිරතො හොති ඉදම්පිස්ස හොති සීලස්මිං. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විසූකදස්සනං අනුයුත්තා විහරන්ති සෙය්‍යථිදං නච්චං ගීතං වාදිතං පෙක්ඛං අක්ඛානං පාණිස්සරං.

---

10. යම්බඳුවූ හෝ ඇතම් පින්වත් ශ්‍රමණබ්‍රාහ්මණයෝ වෙද්ද. ඔහු කම්ඵලාදිය අදහා දෙනලද භොජනයන් අනුභවකොට මෙබඳුවූ බීජගාම භූතගාම සමාරම්භයෙහි යෙදුනාහු වෙසෙත්. ඒනම්, කසා හිඟුරු යන මේ ආදි මූලබීජය, ඇසටු නුග යන මේ ආදි ඛන්ධබීජය, උක් හුණ යන මේ ආදි ඵලු බීජය, හෙල අඳු මූරුවා යන මේ ආදි අග්ගබීජය, පස්වැනිවූ මුං උඳු හැල් යන මේ ආදි බීජ බීජය, මෙසේ මේබඳුවූ බීජගාම භූතගාම සමාරම්භයෙන් වැළකුනේ වේද මේද ඒ මහණහුගේ ශීලය වේ. යම්බඳුවූ හෝ ඇතැම් පින්වත් ශ්‍රමණබ්‍රාහ්මණයෝ වෙද්ද. ඔහු කම්ඵලාදිය අදහා දෙනලද භොජනයන් අනුභවකොට මෙබඳුවූ සන්නිධිකාර පරිභොගයෙහි යෙදුනාහු වෙසෙත් ඒ මෙසේයි, පිළිගන්නාලද ආහාර දෙවෙනිදිනයටතබා වැළඳීමය, පිළිගන්නාලද පානවර්ග දෙවෙනිදිනයටතබා වැළඳීමය, අධිෂ්ඨාන විකප්පනය නොකරණලද සිවුරුලැබ තබා ප්‍රයොජන විඳීමය, දෙක කට අධිකවූ වහන් ලැබ මතු ප්‍රයොජනයට තැබීමය, ඇඳන් දෙක කට වැඩියෙන් ලැබ තබා මතු ප්‍රයොජන විඳීමය, සුගන්ධ ද්‍රව්‍ය තබා ප්‍රයොජන විඳීමය, තල සහල් ආදිය රැස්කොට තබා ප්‍රයොජන විඳීමය, මෙසේ මෙබඳුවූ සන්නිධිකාර පරිභොගයෙන් විශෙෂයෙන් වැළකුනේ වේද, මේද ඒ ශ්‍රමණයාගේ ශීලය වේ. යම්බඳුවූ හෝ ඇතැම් ශ්‍රමණබ්‍රාහ්මණයෝ වෙද්ද. ඔහු කම්ඵලාදිය අදහා දෙනලද භොජනයන් අනුභවකොට මෙබඳුවූ විසුලු දස්නෙහි යෙදුනාහු වෙසෙත්. ඒ කවරේද? නැටීමය, ගීකීමය, වැයීමය, නෘත්‍යමණ්ඩල සැරහීමය, භාරත රාමායනාදි කථා ඇසීමය, අත්තල ගැසීමය.

වෙතාළං කුම්භං ථූනං සොභනකරකං චණ්ඩාලං වංසං ධොවනං හත්ථියුද්ධං අස්සයුද්ධං මහිසයුද්ධං උසභයුද්ධං මෙණ්ඩකයුද්ධං කුක්කුට යුද්ධං වට්ටකයුද්ධං දණ්ඩයුද්ධං මුට්ඨියුද්ධං නිබ්බුද්ධං උය්‍යොධිකං බලග්ගං සෙනාබ්‍යූහං අනීක දස්සනං ඉතිවා ඉති එවරූපා විසූකදස්සනා පටි විරතො හොති ඉදම්පිස්ස හොති සීලස්මිං.

11. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං ජූතප්පමාදට්ඨානානුයොගං අනු යුත්තා විහරන්ති. සෙය්‍යථිදං අට්ඨපදං දසපදං ආකාසං පරිහාරපථං සන්තිකං ඛලිකං ඝටිකං සලාකහත්ථං අක්ඛංපඞ්ගචීරං වඞ්කකං මො ක්ඛචිකං චිඞ්ගුලකං පත්තාළ්හකං රථකං ධනුකං අක්ඛරිකං මනෙ සිකං යථාවජ්ජං ඉතිවා

මන්ත්‍රයෙන් මෘතශරීර නඟාසිටුවීමය, කලබෙරගැසීමය, ප්‍රතිභාන චිත්‍රවිචිත්‍රය, චණ්ඩාලයන්ගේ සණ්ඩාධොවන ක්‍රීඩාවය, උණගස් ඔසවා ක්‍රීඩා කිරීමය, මිනිඇට සෝද සුවඳගල්වා තැබීමය, ඇතුන් හා යුද්ධ කිරීමය, අසුන් හා යුද්ධකිරීමය, මීවුන් හා යුද්ධකිරීමය, වෘෂභයන් හා යුද්ධකිරීමය, පොරගසන එළුවන් හා යුද්ධකිරීමය, කුකුළන් හා යුද්ධ කිරීමය, වටුවන් හා යුද්ධකිරීමය, දඬු ආදියෙන් යුද්ධකිරීමය, මුෂ්ටි යුද්ධය, මල්ලව යුද්ධය, යුද්ධකිරීමය, හස්ත්‍යාදීන් ගණන්කරණතැනය, සෙනාවන්රැස්වෙනතැනය, යුද්ධසෙනාව දැකීමද්දැයි යන මෙසේ මෙබඳුවූ විසුලු දැක්මෙන් දුරුවූයේ වේද මේද ඒ ශ්‍රමණයාගේ ශීලයයි.

11. යම්බඳුවූහෝ ඇතැම් පින්වත් ශ්‍රමණබ්‍රාහ්මණයෝ වෙද්ද, ඔහු කම් ඵලාදිය අදහා දෙනලද භොජනයන් අනුභවකොට මෙබඳුවූ ප්‍ර මාදයට කාරණාවූ දූ කෙළියෙහි යෙදුනාහු වෙසෙත්ද ඒ කවරේද, දූ පෝරු රාජවිල් පෝරු ආදියෙහි ක්‍රීඩා කිරීමය, අසූගැබක් ඇති දූ පෝරු රාජවිල් පෝරු ආදියෙහි ක්‍රීඩාකිරීමය, දූ පෝරු රාජවිල් පෝරු ආදියෙහිමෙන් අහසෙහිම ක්‍රීඩාකිරීමය. බිම මණ්ඩල වශ යෙන් නොයෙක් තැන ඉරි ඇඳ පැනපැන ක්‍රීඩාකිරීමය, එක්කොට තබනලද දූ කැටහෝ කැබිලිතිහෝ නොසොල්වා නියෙත්ම ඉවත් කොට හෝ ගසා ක්‍රීඩාකිරීමය, පසඇටවලින් ක්‍රීඩාකිරීමය, සිංක්‍රීඩා කිරීමය, භූමියෙහිහෝ භිත්තියෙහිහෝ ඉරටම්ටි ගසා ඇත් අස් ආදි රූපදක්වා ක්‍රීඩාකිරීමය, පත්දුක්‍රීඩාවය, පත්කුලල් පිඹ ක්‍රීඩාකිරීමය, ගම්දරුවන්කෙළනා කුඩා නගුල්ගෙණ සීසෑම්වශයෙන් ක්‍රීඩාකිරී මය, කරණම් පිනීමය තල්පත් ආදියෙන් කන්නන්ගුරුවා ඉදිකොට ක්‍රීඩා කිරීමය, පත් නැලියෙන් වැලි ආදිය මැණ ක්‍රීඩාකිරීමය, කුඩා රියෙන් ක්‍රීඩාකිරීමය, කුඩා දුන්නෙන් ක්‍රීඩාකිරීමය, අහසෙහි හෝ පිට හෝ අකුරු ඇඳ දක්වා ක්‍රීඩාකිරීමය,සිතින් යමක් සිතා මා සිතින් සිතුදෙය දතුද යනාදීන් දක්වා ක්‍රීඩා කිරීමය, කණ කොර පිළි ආදි වශයෙන් ඒ ඒ දෙෂ රූප යොදා දක්වා ක්‍රීඩාකිරීමයයි.

ඉති එවරූපා ජූතප්පමාදට්ඨානානුයොගා පටිවිරතො හොති ඉදම්පිස්ස හොති සීලස්මිං. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං උච්චාසයනමහාසයනං අනුයුත්තා විහරන්ති සෙය්‍යථීදං ආසන්දිං පල්ලඞ්කං ගොණකං චිත්තකං පටිකං පටලිකං විකතිකං උද්දලොමිං එකන්තලොමිං කට්ටිස්සං කොසෙය්‍යං කුත්තකං හත්ථත්ථරං අස්සත්ථරං රථත්ථරං අජිනප්පවෙණිං කාදලිමිගපවරපච්චත්ථරණං සඋත්තරච්ඡදං උභතො ලොහිත කූපධානං ඉතිවා ඉති එවරූපා උච්චාසයන මහාසයනා පටිවිරතො හොති ඉදම්පිස්සහොති සීලස්මිං.

12. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං මණ්ඩනවිභූසනට්ඨානානුයොගං අනුයුත්තා විහරන්ති සෙය්‍යථීදං, උච්ඡාදනං පරිමද්දනං.

මෙසේමෙබඳුවූ ප්‍රමාදයට කාරණාවූ දූකෙළියෙහි යෙදීමෙන් වැළකුනේ වේද, මේද ඒ මහණහුගේ ශීලයවේ. යම්බඳු වූහෝ ඇතැම් පින්වත් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ වෙද්ද, ඔහු කර්මඵල ආදිය අදහා දෙනලද භොජනයන් අනුභවකොට මෙබඳුවූ උසසුන් මහ අස්නෙහි යෙදුනාහු වෙසෙත්, ඒ කවරේද, පමණ ඉක්මූත් දික් හඟලා අමුය, පාවල සිංහ ව්‍යාඝ්‍රාදි රූප පිහිටුවා කරණලද පය්‍යීඞ්කය, සතරඟුලෙත් දික්ලොම් ඇති ඇතිරිය, වීමෙන් විසිතුරු එළු ලොම් ඇතිරිය, එළු ලොම්වලින් වියනලද සුදු ඇතිරිය, එළු ලොම්වලින් කරණලද ඝන පුප් ඇති ඇතිරිය, තිලිය, සිංහ ව්‍යාඝ්‍රාදි රූපවලින් විසිතුරුකරණලද එළු ලොම් ඇතිරිය, එක් පිටක ලොම් ඇති එළු ලොම් ඇතිරිය, දෙපිට ලොම් ඇති එළුලොම් ඇතිරිය, රන් කසුකම් කොට කැටිතිහිරි හුයින් කළ පස තරණය, රන් කසුකම්කොට තිහිරි හුසිත් කළ පස තරණය, නාටිකාවන් සොළොස්දෙනෙකු සිට නැටියහැකි එළු ලොම් ඇතිරිය,ඇතුන්පිට අතුරණ ඇතිරිය, අසුන්පිට අතුරණ ඇතිරිය, පිට අතුරණ ඇතිරිය, අඳුන්දිවි සමින් කළ පසතරණය, කදලි මෘග චර්මයෙන් කරණලද උතුම්වූ පසතරණය, මත්තෙහි බඳනාලද රත්වියන් සහිතවූ ඉස්දෙර පාමුල යන දෙපසෙහි තබනාලද රක්තවර්ණ්පාධාන ඇති ආසනයයි මෙසේ මෙබඳුවූ උසසුන් මහ අස්නෙන් වැළකුනේ වේද, මේද ඒ මහණ බමුණහුගේ ශීලයවේ.

12. යම් බඳුවූ හෝ ඇතැම් පින්වත් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ වෙද්ද, ඔහු කර්මඵලාදිය අදහාදෙනලද භොජනයන් අනුභවකොට මෙබඳුවූ සැරසීමය. උණුතැන් පිරීමය යන මෙහි යෙදුනාහු වෙසෙත්. ඔහු කවරේද, සුවඳසුණු ආදියෙන් ඉලීමය. පිරිමැදීමය.

නහාපනං සම්බාහණං ආදාසං අඤ්ජනං පච්චඤ්ජනං මාලාවිලෙපනං මුඛචුණ්ණකං මුඛාලෙපං හත්ථබන්ධං සිඛාබන්ධං දණ්ඩකං නාළිකං ඛග්ගං ඡත්තං චිත්‍රුපාහනං උණ්හීසං මණිං වාලවීජනිං ඔදාතානි වත්ථානි දීඝදසානි ඉතිවා ඉති එවරූපා මණ්ඩණවිභූසනට්ඨානානුයොගා පටිවිරතො හොති ඉදම්පිස්ස හොති සීලස්මිං. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං තිරච්ඡානකථං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං රාජකථං චොරකථං මහාමත්තකථං සෙනාකථං භයකථං යුද්ධකථං අන්නකථං පානකථං වත්ථකථං සයනකථං මාලාකථං ගන්ධකථං ඤාතිකථං යානකථං ගාමකථං නිගමකථං නගරකථං

සුවඳ ආදියෙන් නැහැවීමය. අත් පා මුගුරු ආදියෙන් තළා මස්වැඩීමය. කැඩපත් පරිහරණය කිරීමය. අඳුන්තෙල් පරිහරණය කිරීමය. ගෙතූනොගෙතූමල්හාවිලවුන් පරිහරණයකිරීමය. මුවසුණුග, මුවෙල් හිගල්වන ආලෙපය, හස්තාභරණාදියපැළඳීමය, රන්හුආදියෙන්කුඩුම්බිය සිසාරබැඳීමය, අලඞ්කාරදඬුගෙණ හැසිරීමය, ස්ත්‍රී පුරුෂ රූපාදියෙන් විසිතුරුවූ බෙහෙත්නල දසරුවෙහි එල්වාගෙණ ඇවිදීමය නන්වැදෑරුම් රන්කම්කරණලද කොපුඇති ඉතාතියුණු මුවහත්ඇති කඩු උරෙහි බැඳඑල්වා ඇවිදීමය, පස්වණක්හුයින්වෙලා, මෝරදූනි ආදියෙන් විසිතුරු කුඩගෙණ හැසිරීමය, විසිතුරු වහන්පයලා ඇවිදීමය, නළල්පටබැඳීමය, සිළුමිණි පැළඳීමය, වල්විදුනා දෑරීමය, දික්දහඇති සුදුපිළිඇඳීම් ආදියයි මෙසේමෙබඳුවූ සැරසීම්ය, අඩුතැන්පිරීමය යන මේ කාරණයෙහි යෙදීමෙන් වැලකුනේ වේද, මේද ඒ මහණහුගේශීලයවේ. යම්බඳුවූහෝඇතැම්පින්වත්ශ්‍රමණබ්‍රාහ්මණයෝ වෙද්ද, ඔහු කර්මඵලාදිය අදහා දෙනලද භොජනයන් අනුභවකොට මෙබඳුවූ තිරශ්චීන කථායෙහි යෙදුනාහු වෙසෙත්. ඔහු කවරේද, - රජුන් පිළිබඳකථාය, සොරුන් පිළිබඳ කථාය, මහඇමතියන් පිළිබඳ කථාය, සෙනා පිළිබඳ කථාය, බිය පිළිබඳ කථාය, යුද්ධ පිළිබඳ කථාය, ආහාර පිළිබඳ කථාය, පානවර්ග පිළිබඳ කථාය, වස්ත්‍ර පිළිබඳ කථාය, සයන පිළිබඳ කථාය, මල් පිළිබඳ කථාය, සුගන්ධ ද්‍රව්‍ය පිළිබඳ කථාය, නෑයන් පිළිබඳ කථාය, යානා පිළිබඳ කථාය, ගම්පිළිබඳ කථාය, නියම්ගම් පිළිබඳ කථාය, නුවර පිළිබඳ කථාය,

ජනපදකථං ඉත්‍ථිකථං සූරකථං විසිඛාකථං කුම්භට්ඨානකථං පුබ්බපෙතකථං නානත්තකථං ලොකක්ඛායිකං සමුද්දක්ඛායිකං ඉති භවාභවකථං ඉතිවා ඉති එවරූපාය තිරච්ඡානකථාය පටිවිරතො හොති ඉදම්පිස්ස හොති සීලස්මිං.

13. යථාවා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විග්ගාහිකකථං අනුයුත්තා විහරන්ති. නත්වං ඉමං ධම්මවිනයං ආජානාසි අහං ඉමං ධම්මවිනයං ආජානාමි කිං ත්වං ඉමං ධම්මවිනයං ආජානිස්සසි. මිච්ඡාපටිපන්නො ත්වමසි අහමස්මි සම්මාපටිපන්නො සහිතමෙම අසහිතන්තෙ පුරෙවචනීයං පච්ඡා අවච පච්ඡාවචනීයං පුරෙ අවච ආචිණ්ණන්තෙ විපරාවත්තං ආරොපිතො තෙ වාදො නිග්ගහිතොසි චරවාදප්පමොක්ඛාය නිබ්බෙඨෙහි වා සචෙ පහොසීති ඉති එවරූපාය විග්ගාහිකකථාය පටිවිරතො හොති ඉදම්පිස්ස හොති සීලස්මිං.

දනව් පිළිබඳ කථාය, සත්‍රීන් පිළිබඳ කථාය, යොධයන් පිළිබඳ කථාය, වීථි පිළිබඳ කථාය, කුම්භදාසීන් හෝ උදකතීර්ථ පිළිබඳ කථාය, පෙරමළ නෑයන්පිළිබඳ කථාය, නානාප්‍රකාර නිරර්ථක කථාය, විතණ්ඩ සල්ලාප නම්වූ ලොකාඛ්‍යායික කථාය, සමුද්‍රය පිළිබඳ කථාය, මේ කාරණයෙන් භවය මේ කාරණයෙන් අභවයයි භවාභව දෙක පිළිබඳ කථායයි මෙසේමෙබඳුවූ තිරිසන්කථායෙන් වැළකුනේ වේද, මේද ඒ මහණහුගේ ශීලය වේ.

13. යම්බඳුවූ හෝ ඇතැම් පින්වත් ශ්‍රමණබ්‍රාහ්මණයෝ වෙද්ද. ඔහු කම්ඵලාදිය අදහා දෙනලද භොජනයන් අනුභවකොට මෙබඳුවූ සදෙෂ කථායෙහි යෙදුනාහු වෙසෙත්. ඒ කවරේද? තෝ මේ ධර්මවිනය දෙක නොදන්නෙහිය. මම මේ ධර්මවිනය දෙක දනිමි තෝ මේ ධර්මවිනය දෙක කුමකැයි දන්නෙහිද, තෝ වරදවා පිළිපන්නෙහිය. මම මනාව පිළිපන්නෙම් වෙමි. මාගේ වචනය සිලුටුය අර්ථයෙන් යුක්තය. තාගේ වචනය නොසිලුටුය, අර්ථයෙන් යුක්ත නොවෙයි. පළමුකොට කියයුත්ත පසුව කියෙහිය. පසුව කියයුත්ත පළමුකොට කීයෙහිය. යමක් තාවිසින් බොහෝකලක් පුරුදුකිරීම් වශයෙන් ප්‍රගුණකරණලද්දේද ඒ සියල්ල මාගේ එකවචනයෙන්ම පෙරළී සිස්වගියේය. මාවිසින් තට දෙසක් නගනලද්දේය. නිග්‍රහකරණලද්දෙහිය, දෙෂයෙන් මිදෙනපිණිස ඒ ඒතැන නොස් උගණුව. ඉදින් සමර්ථයෙහිනම් දැන්ම තෝ වාදයෙන් ගැලවියයි මෙසේ මෙබඳුවූ දෙෂාරොපණ කථායෙන් වැළකුනේ වේද, මේද ඒ මහණහුගේ ශීලය වේ.

යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං දූතෙය්‍ය පහිනගමනානුයොගං අනුයුත්තා විහරන්ති සෙය්‍යථිදං රඤ්ඤං රාජමහාමත්තානං ඛත්තියානං බ්‍රාහ්මණානං ගහපතිකානං ඉධ ගච්ඡ අමුත්‍රාගච්ඡ ඉදංහර අමුත්‍ර ඉදං ආහරාති ඉති එවරූපා දූතෙය්‍ය පහිනගමනානුයොගා පටිවිරතො හොති, ඉදම්පිස්ස හොති සීලස්මිං. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ කුහකාච හොන්ති ලපකාච නෙමිත්තිකාච නිප්පෙසිකාච ලාභෙන ලාභං නිජිගිංසිතාරො ඉති එවරූපා කුහනලපනා පටිවිරතො හොති, ඉදම්පිස්ස හොති සීලස්මිං.

14. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡාන විජ්ජාය.

යම්බඳුවූ හෝ ඇතැම් පින්වත් ශ්‍රමණබ්‍රාහ්මණයෝ වෙද්ද, ඔහු කර්‍මඵලාදිය අදහා දෙනලද භොජනයන් අනුභවකොට මෙබඳුවූ දූතභාවය ගෙපින්ගෙට යාමය යන මෙහි යෙදුනාහු වෙසෙත්. ඒ කවරේද? රජුන්ගේද, රාජමහාමාත්‍යයන්ගේද, ක්‍ෂත්‍රියයන්ගේද, බ්‍රාහ්මණයන්ගේද, ගෘහපතීන්ගේද, කුමාරයන්ගේද, හසුන්පත් පඬුරු ආදිය ගෙණ මෙතැනින් අසවල්තැනට යව, එතැනින් අසවල්තැනට එව, මෙතනින් මෙනම් දෙයක් ගෙණ යව, අසවල්තැනින් මෙනම්දෙය මෙහි ගෙණෙවයි මෙසේ මෙබඳුවූ දූතෙය්‍යපහිනගමනය යන මෙහි යෙදීමෙන් වැළකුනේ වේද, මේද ඒ මහණහුගේ ශීලය වේ. යම්බඳුවූ හෝ ඇතැම් පින්වත් ශ්‍රමණබ්‍රාහ්මණයෝ වෙද්ද, ඔහු කර්‍මඵලාදිය අදහා දෙනලද භොජනයන් අනුභවකොට කුහකභාවයෙන් යුක්තවූවාහුද වෙති. ලාභසත්කාර කැමැතිව කථාකරන්නාහුද වෙති. ලාභසත්කාර සඳහන්කරවීම ස්වභාවකොට ඇත්තාහුද වෙති. පරලාභාදිය නිසා කීම ස්වභාවකොට ඇත්තාහුද වෙති. ලාභයකින් ලාභයක් සොයන්නාහුද වෙති, මෙසේ මෙබඳුවූ කුහනලපනාදියෙන් වැළකුනේ වේද, මේද ඒ මහණහුගේ ශිලය වේ.

14. යම්බඳුවූ හෝ ඇතැම් පින්වත් ශ්‍රමණබ්‍රාහ්මණයෝ වෙද්ද, ඔහු කර්‍මඵලාදිය අදහා දෙනලද භොජනයන් අනුභවකොට මෙබඳුවූ තිරශ්චීන විද්‍යාව හෙතුකොටගෙණ.

මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති. සෙය්‍යථීදං, අඞ්ගං නිමිත්තං උප්පාදං සුපිනං ලක්ඛණං මූසිකච්ඡින්නං අග්ගිහොමං දබ්බිහොමං ථුසහොමං කණ හොමං තණ්ඩුලහොමං සප්පිහොමං තෙලහොමං මුඛහොමං ලොහිත හොමං අඞ්ගවිජ්ජා වත්ථුවිජ්ජා ඛත්තවිජ්ජා සිවවිජ්ජා භූත විජ්ජා භූරිවිජ්ජා අහිවිජ්ජා විසවිජ්ජා විච්ඡිකවිජ්ජා මූසිකවිජ්ජා සකුණවිජ්ජා වායසවිජ්ජා පක්කජ්ඣානං සරපරිත්තානං මිගචක්කං ඉතිවා ඉතිඑවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති, ඉදම්පිස්ස හොති සීලස්මිං.

ලාමකජීවිකාවෙන් ජීවිකාව කෙරෙත්. ඒ කවරේද, සාමුද්‍රිකාලක්‍ෂණ යයි කියනලද අඞ්ග ශාස්ත්‍රයද, ඒ ඒ කායශ්‍රී පරීක්‍ෂාකොට කියන් නාවූ නිමිත්ත ශාස්ත්‍රයද, මෙබඳු අසනිපාතයෙන් මෙසේ මෙසේවූ ශුභාශුභයෙක් වන්නේයයි ප්‍රකාශකරන්නාවූ උත්පාද ශාස්ත්‍රයද, මෙබඳු ස්වප්නයක් දුටු අයට මෙබඳු විපාකවන්නේයයි ප්‍රකාශ කරන්නාවූ ස්වප්න ශාස්ත්‍රයද, ලක්‍ෂණ ශාස්ත්‍රය, මූෂික ශාස් ත්‍රය, ගිනිපිදීමය, මෙබඳු සැන්දකින් වහ්නිපූජාකළ කල මෙබඳු විපාකයෙක් වන්නේයයි කරන්නාවූ දබ්බිහොමය, මෙබඳු පොත් තකින් ගිනිපිදූකල්හි මෙබඳු විපාකවන්නේ යයි කරන්නාවූ ථුසහොමය, මෙබඳු කුඩකින් යාගකළ කල මෙබඳු විපාකයයි කරන්නාවූ කණහොමය, මෙබඳු සාලකින් යාගකළකල්හි මෙනම්දෙය වන්නේයයි කරන්නාවූ තණ්ඩුලහොමය, මෙබඳු ගිතෙ ලකින් යාගකළකල්හි මෙසේවන්නේයයි කරන්නාවූ සප්පිහොමය, මෙබඳු තෙලකින් යාගකළකල්හි මෙබන්දෙක් වන්නේයයි පැවති තෙලහොමය, මුඛයෙන් අබ ආදිය ගෙණ ගින්නෙහි ලීම හෝ මන්ත්‍රපිරුවා යාගකිරීම හෝයයි කියනලද මුඛහොමය, දකුණු දස රුවෙහි ලේ ආදියෙන් හොමකිරීමවූ ලොහිත හොමය, ශරීරලක්‍ෂණ දැක මන්ත්‍රපිරුවා කුලපුත්‍රාදි භාවය හා ශ්‍රීසම්පත්තියෙන් යුක්තබැව් ආදිය කියන්නාවූ අඞ්ගවිද්‍යාවය, ගෘහ වස්තු ආරාම වස්තු ආදීන්ගේ ගුණදොස් සලකන්නාවූ වස්තු විද්‍යාවය, අබෙගය්‍යමාසුරක්ඛාදි නීති ශාස්ත්‍රය, සිගාලරුත විද්‍යාවය, යක්‍ෂාහ්වානාදිය කරන්නාවූ භූත විද්‍යාවය, බිම්ගෙයි වසන්නහු විසින් උගතයුතු මන්ත්‍රය, සර්පයන් දෂ්ටකරණලද්දවුන්ට පිළියම්කරණ විද්‍යාව හා සර්පයන් ලඟට කැඳ වන විද්‍යාවද, විෂ විද්‍යාවද, වෘශ්චික විෂට පිළියම්කරණ විද්‍යාවය, මී විෂට පිළියම්කරණ විද්‍යාවය, සකුණ විද්‍යාවය, කපුටුරැව් පිළිබඳව පවත්නා වායස විද්‍යාවය, මෙතෙම මෙතෙක්කල් ජීවත්වන්නේයයි මෙසේ පැවති අරිෂ්ටකනම්වූ පක්කජ්ඣානය, ශරයන්ගෙන් ආරක්‍ෂා වන සරපරිත්තාණය, පක්‍ෂීන් හා සිවුපාජාතීන්ගේ ශබ්දය දැනීම් වශ යෙන් පැවති විද්‍යාවයයි මෙසේ මෙබඳුවූ තිරශ්චීන විද්‍යාව හෙතු කොටගෙණ ලාමකජීවිකාවෙන් වැළකුනේ වේද, මේද ඒ මහණ හුගේ ශිලය වේ.

යථාවා පනෙකෙ හොනෙතා සමණබ්‍රාහ්මණා සඬාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කපෙපනාති සෙය්‍යථිදං, මණිලක්ඛණං දණ්ඩලක්ඛණං වත්‍ථලක්ඛණං අසිලක්ඛණං උසුලක්ඛණං ධනුලක්ඛණං ආවුධලක්ඛණං ඉත්‍ථිලක්ඛණං පුරිසලක්ඛණං කුමාරලක්ඛණං කුමාරිලක්ඛණං දාසලක්ඛණං දාසිලක්ඛණං හත්‍ථිලක්ඛණං අස්සලක්ඛණං මහිසලක්ඛණං උසභලක්ඛණං ගොලක්ඛණං අජලක්ඛණං මෙණ්ඩකලක්ඛණං කුක්කුටලක්ඛණං වට්ටකලක්ඛණං ගොධා ලක්ඛණං කණ්ණිකා ලක්ඛණං කච්ඡප ලක්ඛණං මිග ලක්ඛණං ඉතිවා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති,ඉදම්පිස්ස හොති සීලස්මිං.

15. යථාවා පනෙකෙ හොනෙතා සමණබ්‍රාහ්මණා සඬාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කපෙපනාති සෙය්‍යථිදං.

යම්බඳුවූ හෝ ඇතැම් පින්වත් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ වෙද්ද, ඔහු කම්ඵලාදිය අදහා දෙනලද භොජනයන් අනුභවකොට මෙබඳුවූ තිරශ්චීන විද්‍යාව හෙතුකොටගෙණ ලාමකවූ ජීවිකායෙන් ජීවිකාව කෙරෙත්. ඒ කවරේද, මෙබඳුවූ මාණික්‍යය ප්‍රශස්තය මෙබඳුවූ මාණික්‍යය ප්‍රශස්තය නොවෙයි යනාදි වශයෙන් මාණික්‍යාදීන්ගේ ශුභාශුභ ලකුණු දැනීමය, මෙබඳුවූ දඬුගෙණ හැසිරීමෙහි මෙබඳු ශුභාශුභ වේයයි කියනලද දණ්ඩ ලක්‍ෂණය, වස්ත්‍ර ලක්‍ෂණය, අශිලක්‍ෂණය, ශරලක්‍ෂණය, ධනුලක්‍ෂණය, ආයුධලක්‍ෂණය, ස්ත්‍රීලක්‍ෂණය, පුරුෂලක්‍ෂණය, කුමාරලක්‍ෂණය, කුමාරිලක්‍ෂණය, දාසලක්‍ෂණය, දාසිලක්‍ෂණය, හස්තිලක්‍ෂණය, අශ්වලක්‍ෂණය, මහිෂලක්‍ෂණය, වෘෂභලක්‍ෂණය, ගොලක්‍ෂණය, අජලක්‍ෂණය, මෙණ්ඩකලක්‍ෂණය, කුක්කුටලක්‍ෂණය, වට්ටකලක්‍ෂණය, ගොධාලක්‍ෂණය, කර්ණිකාලක්‍ෂණය, කච්ඡපලක්‍ෂණය, මෘගලක්‍ෂණ යයි මෙසේ මෙබඳුවූ තිරශ්චීන විද්‍යාව හෙතුකොටගෙණ ලාමකවූ ජීවිකායෙන් වැලකුනේ වේද, මේද ඒ මහණහුගේ ශීලය වේ.

15. යම්බඳුවූ හෝ ඇතැම් පින්වත් ශ්‍රමණබ්‍රාහ්මණයෝ වෙද්ද, ඔහු කම්ඵලාදිය අදහා දෙනලද භොජනයන් අනුභවකොට මෙබඳුවූ තිරශ්චීන විද්‍යාව හෙතුකොටගෙණ ලාමකවූ ජීවිකායෙන් ජීවිකාව කෙරෙත්. ඒ කවරේද.

රඤ්ඤං නිය්‍යානං භවිස්සති රඤ්ඤං අනිය්‍යානං භවිස්සති අබ්භන්තරානං රඤ්ඤං උපයානං භවිස්සති බාහිරානං රඤ්ඤං අපයානං භවිස්සති බාහිරානං රඤ්ඤං උපයානං භවිස්සති අබ්භන්තරානං රඤ්ඤං අපයානං භවිස්සති අබ්භන්තරානං රඤ්ඤං ජයො භවිස්සති බාහිරානං රඤ්ඤං පරාජයො භවිස්සති බාහිරානං රඤ්ඤං ජයො භවිස්සති අබ්භන්තරානං රඤ්ඤං පරාජයො භවිස්සති ඉති ඉමස්ස ජයො ඉමස්ස පරාජයො භවිස්සති ඉතිවා ඉති එවරූපාය තිරච්ඡාන විජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති ඉදම්පිස්ස හොති සීලස්මිං. යථාවා පනෙකෙ භොන්තොසමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වාතෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති සෙය්‍යථිදං, චන්දග්ගාහො භවිස්සති සූරියග්ගාහො භවිස්සති නක්ඛත්තග්ගාහො භවිස්සති චන්දිමසූරියානං පථගමනං භවිස්සති චන්දිමසූරියානං උප්පථගමනං භවිස්සති නක්ඛත්තානං පථගමනං භවිස්සති නක්ඛත්තානං උප්පථගමනං භවිස්සති උක්කාපාතො භවිස්සති දිසාඩාහො භවිස්සති භූමිචාලො භවිස්සති දෙවදුන්දුභි භවිස්සති චන්දිමසූරියනක්ඛත්තානං උග්ගමනං ඔගමනං සඞ්කිලෙසං ඔදානං භවිස්සති.

අසවල්දින අසවල් නැකතින් අසවල් රජහුගේ නික්මීමවන්නේය, අසවල් දින අසවල් නැකතින් අසවල් රජහුගේ නුවරට නැවත පැමිණීමවන්නේය, ඇතුළුනුවර උන් සතුරුරජකරු අප රජ්ජුරුවන්ගේ පැමිණීම වන්නේය, බාහිර රජ්ජුන්ගේ නික්මයාම වන්නේය, බාහිර රජ්ජුන්ගේ ඇතුළුනුවරට පැමිණීම වන්නේය, ඇතුළුනුවර රජ්ජුන්ගේ පෙරළායාම වන්නේය, ඇතුළුනුවර රජ්ජුන්ට ජයවන්නේය, බාහිර රජ්ජුන්ට පරාජය වන්නේය, බාහිර රජ්ජුන්ට ජයවන්නේය, ඇතුළුනුවර රජ්ජුන්ට පරාජය වන්නේය, මෙසේ මොහුට ජයවන්නේය, මොහුට පරාජයවන්නේයයි කියාහෝ මෙසේ මෙබඳුවූ තිරශ්චීන විද්‍යාව හෙතුකොටගෙණ ලාමකජීවිකායෙන් වැළකුනේ වේද, මේද ඒ මහණහුගේ ශීලය වේ. යම්බඳුවූ හෝ ඇතැම් පින්වත් ශ්‍රමණ බ්‍රාහමණයෝ වෙද්ද, ඔහු කර්මඵලාදිය අදහා දෙනලද භොජනයන් අනුභවකොට මෙබඳුවූ තිරශ්චීන විද්‍යාව හෙතුකොටගෙණ ලාමකවූ ජීවිකායෙන් ජීවිකාව් කෙරෙත්. ඒ කවරේද, අසවල්දින රාහු සඳුගන්නේය, සූර්‍ය්‍යග්‍රහණය වන්නේය අඞ්ගාරකාදිග්‍රහසමාගමය වන්නේය, චන්ද්‍රසූර්‍ය්‍යයන්ගේ මාර්ගයෙහි ගමනවන්නේය, චන්ද්‍රසූර්‍ය්‍යයන්ගේ අමාර්ගයෙහි ගමනවන්නේය, තාරකාවන්ගේ මාර්ගයෙහි ගමනවන්නේය, තාරකාවන්ගේ නොමග ගමනවන්නේය, අහසින් තාරකාවන්ගේ වැටීම වන්නේය, දිශාකාලුෂ්‍යය වන්නේය, පෘථිවිචලනය වන්නේය, අසනිපාත වශයෙන් අහස්හි ශුෂ්කවලාහක ගර්ජනාව වන්නේය, චන්ද්‍රසූර්‍ය්‍ය නක්ෂත්‍රයන්ගේ නැගීමද, අස්තයට යාමද, නොපිරිසිදු බවද, පිරිසිදුබවද, වන්නේය.

එවං විපාකො චන්‍දගගාහො භවිස්සති එවං විපාකො සුරියගගාහො භවිස්සති එවං විපාකො නක්ඛත්තගගාහො භවිස්සති එවං විපාකං චන්‍දිමසුරියානං පථගමනං භවිස්සති එවං විපාකං චන්‍දිමසුරියානං උප්පථගමනං භවිස්සති එවං විපාකං නක්ඛත්තානං පථගමනං භවිස්සති එවං විපාකං නක්ඛත්තානං උප්පථගමනං භවිස්සති එවං විපාකො උක්කාපාතො භවිස්සති එවං විපාකො දිසාඩාහො භවිස්සති එවං විපාකො භූමිචාලො භවිස්සති එවං විපාකො දෙවදුන්දුභි භවිස්සති එවං විපාකං චන්‍දිමසුරිය නක්ඛත්තානං උග්ගමනං ඔගමනං සංකිලෙසං ඔදානං භවිස්සති ඉතිවා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති ඉදම්පිස්ස හොති සීලස්මිං.

16. යථාවා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති සෙය්‍යථීදං, සුබ්බුට්ඨිකා භවිස්සති දුබ්බුට්ඨිකා භවිස්සති සුභික්ඛං භවිස්සති දුබ්භික්ඛං භවිස්සති ඛෙමං භවිස්සති භයං භවිස්සති රොගං භවිස්සති ආරොග්‍යං භවිස්සති මුද්දාගණනා සඞ්ඛානං කාවෙය්‍යං ලොකායතං ඉතිවා ඉති එවරූපාය තිරච්ඡාන විජ්ජාය.

මෙබඳුවූ සැපදුක් එළවන චන්ද්‍රග්‍රහණයෙක් වන්නේය, සූය්‍ය්‍ය ග්‍රහණය මෙබඳු විපාක ඇතිවන්නේය, අඞ්ගාරකාදි ග්‍රහසමාගමය මෙබඳු විපාක ඇතිවන්නේය, චන්ද්‍රසූය්‍ය්‍යයන්ගේ මාර්‍ගයෙහි ගමන මෙබඳු විපාක ඇතිවන්නේය, චන්ද්‍රසූය්‍ය්‍යයන්ගේ නොමගගමන මෙබඳු විපාක ඇතිවන්නේය, තාරකාවන්ගේ මාර්‍ගයෙහි ගමන මෙබඳු විපාක ඇතිවන්නේය. තාරකාවන්ගේ නොමගගමන මෙබඳු විපාක ඇතිවන්නේය. තාරකාපතනය උල්කාපාතය මෙබඳු විපාක ඇතිවන්නේය, දිසාඩාහය මෙබඳු විපාක ඇතිවන්නේය, පෘථිවිචලනය මෙබඳු විපාක ඇතිවන්නේය, ශුෂ්කවලාහක ගජිනාව මෙබඳු විපාක ඇතිවන්නේය, චන්ද්‍රසූය්‍ය්‍ය නක්‍ෂත්‍රයන්ගේ නැගීමද, අස්තයට යාමද, නොපිරිසිදු බවද, පිරිසිදු බවද, මෙබඳු විපාක ඇතිවන්නේයයි කියා හෝ මෙසේ මෙබඳුවූ තිරශ්චීන විද්‍යාව හෙතුකොටගෙණ ලාමකවූ ජීවිකාවෙන් වැළකුනේ වේද, මේද ඒ මහණහුගේ ශීලය වේ.

16. යම්බඳුවූ හෝ ඇතැම් පින්වත් ශ්‍රමණබ්‍රාහ්මණයෝ වෙද්ද, ඔහු කර්‍මඵලාදිය අදහා දෙනලද භොජනයන් අනුභවකොට මෙබඳුවූ තිරශ්චීන විද්‍යාව හෙතුකොටගෙණ ලාමකවූ ජීවිකාසෙන් ජීවිකාව කෙරෙත්. ඒ කවරේද, යහපත් වැසි ඇතිවන්නේය, යහපත් වැසි නොමඇතිවන්නේය, සුභික්‍ෂවන්නේය, දුර්භික්‍ෂවන්නේය, නිර්භය ඇතිවන්නේය, භයඇතිවන්නේය, රොගඇතිවන්නේය, රොගනැතිවන්නේය, හස්තමුද්‍රා ගණන්කිරීමය, ගිණීමය, පිණ්ඩගණනාය, කාව්‍යකිරීමය, විතණ්ඩශාස්ත්‍ර ඉගෙණීමයයි කියා හෝ මෙසේ මෙබඳුවූ තිරශ්චීන විද්‍යාව හෙතුකොටගෙණ.

මිච්ඡාජීවා පටිවිරතො හොති, ඉදම්පිස්ස හොති සීලස්මිං. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති. සෙය්‍යථිදං, ආවාහණං විවාහනං සංවදනං විවදනං සංකිරණං විකිරණං සුභගකරණං දුබ්භගකරණං විරුද්ධගබ්භකරණං ජිව්හා නිබන්ධනං හනුසංහණනං හත්ථාභිජප්පනං කණ්ණජප්පනං ආදාසපඤ්හං දෙවපඤ්හං ආදිච්චුපට්ඨානං මහතුපට්ඨානං අබ්භුජ්ජලනං සිරව්හායනං ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති, ඉදම්පිස්ස හොති සීලස්මිං.

ලාමකවූ ජීවිකාවෙන් වැළකුනේ වේද,මේදඒ මහණහුගේ ශීලයවේ. යම්බඳුවූ හෝ ඇතැම් පින්වත් ශ්‍රමණබ්‍රාහ්මණයෝ වෙද්ද, ඔහු කම් ඵලාදිය අදහා දෙනලද භොජනයන් අනුභවකොට මෙබඳුවූ තිරශ්චීන විද්‍යාව හෙතුකොටගෙණ ලාමකවූ ජීවිකායෙන් ජීවිකාව කෙරෙත්.ඒකවරේද,මෙදරකයාහට අසවල් කුලයෙන් අසවල් නැකතින් දරිකාවක් ගෙණෙව්යයි ආවාහකරවීමය, මේ දරිකාව අසවල්නම් දරකයාහට අසවල් නැකතින් දෙව්යයි විවාහකරවීමය, අද නැකත යහපත්වෙයි, අදමසමගිවව්, මෙසේවූකල වියොගනොවන්නේ යයි කියා මෙසේ සමගිකරවීමය, ඉදින් වෙන්වෙනු කැමැත්තව්නම් අදම වෙන්වව්, මෙසේ කළ කල්හි තොපගේ නැවත එක්විම නොවන්නේයයි වියොගකරවීමය, ධනරුස්කරවීමය, ධනය ප්‍රයොජන ගැන්වීමය, සශ්‍රිකකරවීමය, දුප්පත්කරවීමය, නස්නාවූ ගර්භය නැවත නොනස්නාපිණිස බෙහෙත්දීමය, මන්ත්‍රයෙන්දිව සොල්වාගතනොදී තදකිරීමය, මුඛබන්ධන මන්ත්‍රයෙන් යම්සේ හණුව සොල්වන්ට නොහැකිවෙද්ද, එපරිද්දෙන් තදකිරීමය, අත්පෙරළවන පිණිස මන්ත්‍ර ජපකිරීමය, කන්වලින් ශබ්දනොඇසීම පිණිස මන්ත්‍ර ජප කිරීමය, ආදාසයෙහි කැඳපත දෙවතාරොපණය කොට ප්‍රශ්න විචාරීමය, කුමාරිකාවගේ ශරීරයෙහි දෙවතාරොපණය කොට ප්‍රශ්න විචාරීමය, දෙවදාසියගේ ශරීරයෙහි යකුන්නංවා ප්‍රශ්න විචාරීමය, ජීවිකාවපිණිස සූය්‍යයාට නමස්කාරකිරීමය, ජීවිකාවපිණිස මහාබ්‍රහ්මයාට නමස්කාරකිරීමය, උපස්ථාන කිරීමය, මන්ත්‍රබලයෙන් මුඛයෙන් ගිනිදූල් පිටත්කිරීමය, ශ්‍රීදෙවිය එව මාගේ හිසෙහි පිහිටුවයි මෙසේ මස්තකයෙන් ශ්‍රීදෙවිය කැඳවීමයයි කියා හෝ මෙසේ මෙබඳුවූ තිරශ්චීනවිද්‍යාව හෙතුකොටගෙණ ලාමකවූ ජීවිකාවෙන් වැළකුනේ වේද, මේද ඒ මහණහුගේ ශීලය වේ.

17. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහමණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති. සෙය්‍යථිදං, සන්තිකම්මං පණිධිකම්මං භූරිකම්මං වස්සකම්මං වොස්සකම්මං වත්ථුකම්මං වත්ථුපරිකිරණං ආචමනං නහාපනං ජුහණං වමනං විරෙචනං උද්ධවිරෙචනං අධොවිරෙචනං විසවිරෙචනං කණ්ණතෙලං නෙත්තතප්පණං නත්ථුකම්මං අඤ්ජනං පච්චඤ්ජනං සාලාකියං සල්ලකත්තිකං දාරකතිකිච්ඡා මූලභෙසජ්ජානං අනුප්පදානං ඔසධීනං පටිමොක්ඛං ඉතිවා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති ඉදම්පිස්ස හොති සීලස්මිං.

17. යම්බඳුවූ හෝ ඇතැම් පින්වත් ශ්‍රමණබ්‍රාහ්මණයෝ වෙද්ද, ඔහු කර්මඵලාදිය අදහා දෙනලද භොජනයන් අනුභවකොට මෙබඳුවූ තිරශ්චීන විද්‍යාව හෙතුකොටගෙණ ලාමකවූ ජීවිකායෙන් ජීවිකාව කෙරෙත්. ඒ කවරේද, දෙවස්ථානයට ගොස් ඉදින් මට මෙනම්දෙය සිඬවීනම් නුඹවහන්සේට මෙනම් මෙනම් දෙයකින් පූජාසත්කාර කරන්නෙමියි කියා කටයුතු ශාන්ති ප්‍රතිඥත කර්මය, ප්‍රාර්ථනාව සමෘඬවූකල ඊට කළයුතුවූ ප්‍රණිධිකර්මය, බිම්ගෙයි වාසයකොට උගත් මන්ත්‍රයාගේ ප්‍රයොගකිරීමය, පණ්ඩකයා පුරුෂකිරීමය, පුරුෂයා පණ්ඩකකිරීමය, පළමු ගෙවල් නොකළ බිම ගෙවල් පිහිටුවීමය, මේ මේ දෙය ගෙණෙව්යයි කියා එහි ග්‍රහබලි විධානකිරීමය, ජලයෙන් මුඛශුඬකිරීමය, අන්‍යයන් නැහැවීමය, අනුන්ගේ කටයුතු සඳහා ගිනිපිදීමය, බෙහෙත්යොග දී වමනකිරීමය, බෙහෙත්යොග දී විරෙකකරවීමය, නාභියෙන් මත්තෙහි දොෂහැරීමට කරණ ඌර්ධ්ව විරෙචනය, නාභියෙන් යට දොෂහැරීමට කරණ අධොවිරෙචනය, ශිරොවිරෙචනය, කන්වැඩීමපිණිස හෝ වණ සුවවීමපිණිස බෙහෙත් තෙල් දීමය, නෙත්‍රතර්පණ තෛලය, තෙල් යොදා නස්‍යකිරීමය, ක්ෂාරාඤ්ජන ඉදිකිරීමය, සිහිල් බෙහෙත් අඳුන් ඉදිකිරීමය, සැත්කටුලා කටයුතු වෙදකමය, ශල්‍යවෛද්‍යයන් විසින් කටයුතු වෙදකමය, බාලදරුවන්ගේ පොෂ්‍යයපිණිස කරණ වෙදකමය, ශරීරචිකිත්සාය, සුදුසු තද බෙහෙත් දී ඊට සුදුසු පැගණන් ඉක්මුණුකල බෙහෙත් පහකිරීමයයි කියා හෝ මෙසේ මෙබඳුවූ තිරශ්චීන විද්‍යාව හෙතුකොටගෙණ ලාමකවූ ජීවිකායෙන් වැළකුනෝ වේද, මේද ඒ මහණහුගේ ශීලය වේ.

18. සඛො සො මාණව භික්ඛු එවං සීලසම්පන්නො නකුතොචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතො සෙය්‍යථාපි මාණව රාජා ඛත්තියො මුද්ධාවසිත්තො නිහතපච්චාමිත්තො න කුතොචි භයං සමනුපස්සති යදිදං පච්චත්ථිකතො එවමෙව ඛො මාණව භික්ඛු එවං සීලසම්පන්නො න කුතොචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතො සො ඉමිනා අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො අජ්ඣත්තං අනවජ්ජසුඛං පටිසංවෙදෙති එවං ඛො මාණව භික්ඛු සීලසම්පන්නො හොති අයං ඛො සො මාණව අරියො සීලක්ඛන්ධො යස්ස සො භගවා වණ්ණවාදී අහොසි එත්ථච ඉමං ජනතං සමාදපෙසි නිවෙසෙසි පතිට්ඨාපෙසි අත්ථිචෙව උත්තරිං කරණීයන්ති අච්ඡරියං භො ආනන්ද අබ්භුතං භො ආනන්ද සො චායං භො ආනන්ද අරියො සීලක්ඛන්ධො පරිපුණ්ණො නො අපරිපුණ්ණො එවං පරිපුණ්ණඤ්චාහං භො ආනන්ද අරියං සීලක්ඛන්ධං ඉතො බහිද්ධා අඤ්ඤෙසු සමණබ්‍රාහමණෙසු න සමනුපස්සාමි.

---

18. මාණවකය, මෙසේ ශීලයෙන් යුක්තවූ ඒ මේ භික්ෂුතෙම අසංවරය මුල්කොට ඇති යම් ඒ භයකාරණයෝ ඒ භික්ෂුහට උපදින්නාහුද ඔවුන් අතුරෙන් එක් බියකුදු කිසිතැනකදී මේ ශීලසංවරය හෙතුකොටගෙණ නොදක්නේය. මාණවකය, ක්ෂත්‍රියාභිෂෙකයෙන් මුදුනෙහි අභිෂෙකකරණලද නසනලද පසමිතුරන් ඇති ක්ෂත්‍රිය රජෙක් නසනලද පසමිතුරන්ඇතිහෙයින් කිසියම් සතුරෙකුගෙන් කිසිතැනකදී කිසියම් භයක් නොදක්නේ යම්සේද. මාණවකය, එපරිද්දෙන්ම මෙසේ ශීලයෙන් යුක්තවූ භික්ෂුතෙම ශීලසංවරය හෙතුකොටගෙණ කිසිතැනකදී භයක් නොදක්නේය. හෙතෙම මේ ආර්‍ය්‍යවූ ශීලස්කන්ධයෙන් යුක්තවූයේ තමාගේ සන්තානයෙහි නිරවද්‍යවූ කායිකචෛතසික සැපය විඳියි. මාණවකය, මෙසේ වනාහි මහණතෙම ශීලයෙන් යුක්තවූයේ වෙයි. ඒ භාග්‍යවතුන්වහන්සේ යම් ශීලසමූහයක ගුණකියන සුලුවූසේක්ද මාණවකය, ඒ මේ ආර්‍ය්‍යවූ ශීලස්කන්ධය වෙයි. මෙහිද මේ ජනසමූහයා යෙදවූසේක. නිවෙසනයකරවූසේක. පිහිටුවූසේක. මෙහි මෙයින්මත්තෙහි වනාහි කටයුතුවූ අනිකෙක්ද ඇත්තේමය. පින්වත් ආනන්දස්ථවිරයන්වහන්ස, ආශ්චර්‍ය්‍ය වේ. පින්වත් ආනන්දස්ථවිරයන්වහන්ස, අද්භූත වේ. පින්වත් ආනන්දස්ථවිරයන්වහන්ස, ඒ මේ ආර්‍ය්‍යවූ ශීලස්කන්ධය තෙමේද පරිපූර්ණවෙයි. අපරිපූර්ණවූයේ නොවෙයි. පින්වත් ආනන්දස්ථවිරයන්වහන්ස, මෙසේ හාත්පසින් පිරුණාවූ ආර්‍ය්‍යවූ ශීලරාශියක් මේ බුදුසස්නෙන් පිටත අන්‍යවූ ශ්‍රමණබ්‍රාහ්මණයන් අතුරෙහි මම නොදක්නෙමි.

එවං පරිපුණ්ණඤ්ච හො ආනන්ද අරියං සීලක්ඛන්ධං ඉතො බහිද්ධා අඤ්ඤෙ සමණබ්‍රාහ්මණා අත්තනි සමනුපස්සෙය්‍යුං තෙ තාවතකෙනෙව අත්තමනා අස්සු අලමෙත්තාවතා කතමෙත්තාවතා අනුප්පත්තො නො සාමඤ්ඤත්ථො නත්ථිනො කිඤ්චි උත්තරිං කරණීයන්ති. අථ ච පන භවං ආනන්දො එවමාහ අත්ථි චෙවෙත්ථ උත්තරිං කරණීයන්ති.

පඨමක භාණවාරං.

19. කතමො පන සො භො ආනන්ද අරියො සමාධික්ඛන්ධො යස්ස සො භවං ගොතමො වණ්ණවාදී අහොසි යත්ථ ඉමං ජනතං සමාදපෙසි නිවෙසෙසි පතිට්ඨපෙසීති. කථඤ්ච මාණව භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති ඉධ මාණව භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුව්‍යඤ්ජනග්ගාහී යත්වාධිකරණ මෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං තස්ස සංවරාය පටිපජ්ජති රක්ඛති චක්ඛුන්ද්‍රියං චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති.

පින්වත් ආනන්දස්ථවිරයන්වහන්ස, මෙසේ පරිපූර්ණවූ ආය්‍ය්‍ර්‍ය ශීලස්කන්ධය මේ බුදුසස්නෙන් පිටත අන්‍යවූ ශ්‍රමණබ්‍රාහ්මණ කෙණෙක් තමාකෙරෙහි දක්නාහුනම් ඔහු මෙපමණකින්ම ප්‍රයොජනවෙයි. මෙපමණකින් කරණලද්දේය අපට ශ්‍රමණභාවයාගේ අර්ථයතෙම පැමිණියේය. අපවිසින් කටයුතුවූ කිසිවකුදු නැතැයිකියා එපමණකින්ම සතුටුසිත්ඇතිවන්නාහුය. නැවතද පින්වත් ආනන්දස්ථවිරයන්වහන්සේ මෙසේ කීයේය. මෙහි මෙයින් මත්තෙහිද කටයුතුවූ අතිකෙක් ඇත්තේමයයි.

පළමුවන බණවරයි.

19. පින්වත් ආනන්දස්ථවිරයන්වහන්ස, ඒ භවද්ගෞතමයානන් වහන්සේ යම්කගේ ගුණකියන සුලුවූසේක්ද, යම්තැනක මේ ජනසමූහයා යෙදවූසේක්ද, නිවෙසනයකරවූසේක්ද, පිහිටුවූසේක්ද, ඒ ආය්‍ය්‍ර්‍යවූ සමාධිස්කන්ධයතෙම කවරෙක්ද. මාණවකය, භික්ෂුතෙම කෙසේනම් ඉන්ද්‍රියයන් කෙරෙහි වසනලද දොර ඇත්තේවේද. මාණවකය, මේ ශාසනයෙහි භික්ෂුතෙම ඇසින් රූපය දැක නිමිත්තග්‍රහණය නොකරන්නේ වේද, අනුව්‍යඤ්ජනග්‍රහණය නොකරන්නේ වේද, යම්කාරණයකින් චක්ෂුරින්ද්‍රියයෙහි සංවරනොමැතිව නිවස්නාවූ ඒ පුහුලහු අභිද්‍යාදෞර්මනස්‍යාදි ලාමකවූ අකුශල ධර්මයෝ ලුහුබඳනාහුද, ඒ චක්ෂුරින්ද්‍රියයාගේ සංවරයපිණිස පිළිපදිද්ද, චක්ෂුරින්ද්‍රියය රක්‍ෂා කෙරේද්ද, චක්ෂුරින්ද්‍රිය කෙරෙහි සංවරය පැමිණේද.

සොතෙන සද්දං සුත්වා ඝාණෙන ගන්ධං ඝායිත්වා ජිව්හාය රසං සායිත්වා කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති, නානුබ්‍යඤ්ජනග්ගාහී යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං තස්සසංවරාය පටිපජ්ජති රක්ඛති මනින්ද්‍රියං මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති සො ඉමිනා අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො අජ්ඣත්තං අව්‍යාසෙකසුඛං පටිසංවෙදෙති. එවං ඛො මාණව භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති කථඤ්ච මාණව භික්ඛු සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො හොති ඉධ මාණව භික්ඛු අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී හොති ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී හොති සම්මිඤ්ජිතෙ පසාරිතෙ සම්පජානකාරී හොති සඞ්ඝාටිපත්තචීවරධාරණෙ සම්පජානකාරී හොති අසිතෙ පීතෙ ඛායිතෙ සායිතෙ සම්පජානකාරී හොති උච්චාරපස්සාවකම්මෙ සම්පජානකාරී හොති ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ.

කණින් ශබ්දයක් අසා ඝ්‍රාණයෙන් ගන්ධයක් ආඝ්‍රාණය කොට දිවින් රසාස්වාදනය කොට කයින් ස්පර්ශයක් ස්පර්ශකොට සිතින් ධර්මයක් දැන නිමිත්තග්‍රහණය නොකරන්නේ වේද, අනුව්‍යඤ්ජනග්‍රහණය නොකරන්නේ වේද, යම්කාරණයකින් මේ මනින්ද්‍රියෙහි සංවර නොමැතිව නිවස්නාවූ පුද්ගලහු අභිධ්‍යාදෞර්මනස්‍යාදි ලාමකවූ අකුශල ධර්මයෝ ලුහුබඳනාහුද, ඒ මනින්ද්‍රියයාගේ සංවරයපිණිස පිළිපදීද, මනින්ද්‍රිය රකීද මනින්ද්‍රියෙහි සංවරයට පැමිණේද, ඒ මහණතෙම මේ ආර්‍යවූ ඉන්ද්‍රියසංවරයෙන් යුක්තවූයේ තමාගේ සන්තානයෙහි පරිශුද්ධවූ අධිචිත්ත සුඛය විඳිදී. මාණවකය, මෙසේ වනාහි භික්ෂුතෙම ඉන්ද්‍රියයන් කෙරෙහි වසනලද දොරඇත්තේ වෙයි. මාණවකය, භික්ෂුතෙම කෙසේනම් ස්මෘතිසම්‍යක්ඥානයෙන් යුක්තවූයේ වේද. මාණවකය, මේ සස්නෙහි මහණෙක් ඉදිරියට යාමෙහිද, ආපසු ඊමෙහිද, සම්‍යක්ඥානයෙන් යුක්තව කරණ සුලුවේද, ඉදිරිබැලීමෙහිද, ඔබමොබ බැලීමෙහිද, සම්‍යක්ඥානයෙන් යුක්තව කරණ සුලුවේද, අත්පා ඇකිළීමෙහිද, අත්පා දිගුකිරීමෙහිද, සම්‍යක්ඥානයෙන් යුක්තව කරණ සුලුවේද, සඞ්ඝාටිපාත්‍ර චීවරදැරීමෙහිද සම්‍යක්ඥානයෙන් යුක්තව කරණ සුලුවේද, අනුභවකිරීමෙහිද, පානයකිරීමෙහිද, කෑමෙහිද, රසවිඳීමෙහිද, සම්‍යක්ඥානයෙන් යුක්තව කරණ සුලුවේද, මලමූත්‍රකිරීමෙහිද, සම්‍යක්ඥානයෙන් යුක්තවකරණ සුලුවේද, යාමෙහිද, සිටීමෙහිද, හිඳීමෙහිද, නිදීමෙහිද, නිදිදුරුකෙරීමෙහිද, කථාකිරීමෙහිද, නිඃශබ්දභාවයෙහිද.

සම්පජානකාරී හොති. එවං ඛො මාණව භික්ඛු සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො හොති.

20. කථඤ්ච මාණව භික්ඛු සන්තුට්ඨො හොති ඉධ මාණව භික්ඛු සන්තුට්ඨො හොති, කායපරිහාරිකෙන චීවරෙණ කුච්ඡිපරිහාරිකෙන පිණ්ඩපාතෙන සො යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති සෙය්‍යථාපි මාණව පක්ඛිසකුණො යෙන යෙනෙව ඩෙති සපත්තභාරොව ඩෙති එවමෙව ඛො මාණව භික්ඛු සන්තුට්ඨො හොති, ~~කාය~~ පරිහාරිකෙන චීවරෙන කුච්ඡිපරිහාරිකෙන පිණ්ඩපාතෙන සො යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති එවං ඛො මාණව භික්ඛු සන්තුට්ඨො හොති. සො ඉමිනා ච අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො ඉමිනා ච අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො ඉමිනා ච අරියෙන සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො ඉමාය ච අරියාය සන්තුට්ඨියා සමන්නාගතො විවිත්තං සෙනාසනං භජති අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං.

සම්‍යක්ඥානයෙන් යුක්තව කරණසුලුවේද, මාණවකය, මෙසේ වනාහි භික්ෂුතෙම ස්මෘති සම්‍යක්ඥානයෙන් යුක්තවූයේවෙයි.

20. මාණවකය, භික්ෂුතෙම කෙසේනම් ඉතරෙතර ප්‍රත්‍යය සන්තොෂයෙන් යුක්තවූයේ වේද. මාණවකය, මෙසස්නෙහි භික්ෂුතෙම ශරීරපරිහරණයට ප්‍රමාණවූ සිවුරෙන්ද කුක්ෂිපරහරණයට ප්‍රමාණවූ පිණ්ඩපාතාහාරයෙන්ද සතුටුසිත් ඇත්තේ වේද. ඒ භික්ෂුතෙම යම් යම් තැනකමයේද, අටපිරිකර රැගෙණම යෙයි මාණවකය, පියාපත්වලින් යුක්තවූ පක්ෂිතෙම යම් යම් තැනකම යේද, ඒ යන හැමතන්හි පියාපත්බරින් යුක්තවූයේම පියාඹන්නේය. එසේද, මාණවකය, එපරිද්දෙක්ම භික්ෂුතෙම කායපරිහරණ මාත්‍රවූ චීවරයෙන්ද, කුක්ෂිපරිහරණ මාත්‍රවූ පිණ්ඩපාතාහාරයෙන්ද, යන මේ ඉතරෙතර ප්‍රත්‍යය සන්තොෂයෙන් සතුටුවූයේ වේද. ඒ භික්ෂුතෙම යම් යම් තැනකටයේද, අෂ්ටපරිස්කාරයන් රැගෙණම යෙයි. මාණවකය, භික්ෂුතෙම මෙසේවනාහි සතුටුසිත් ඇත්තේ වෙයි. ඒ භික්ෂුතෙම මේ ආය්‍ර්‍යවූ ශීලස්කන්ධයෙන්ද යුක්තවූයේ මේ ආය්‍ර්‍යවූ ඉන්ද්‍රියසංවරයෙන්ද යුක්තවූයේ මේ ආය්‍ර්‍යවූ ස්මෘතිසම්‍යක් ඥානයෙන්ද යුක්තවූයේ මේ ආය්‍ර්‍යවූ ඉතරෙතර ප්‍රත්‍යය සන්තොෂයෙන්ද සතුටුසිත් ඇත්තේ අරණ්‍යයද, ජනශූන්‍යවෘක්ෂ මූලද, පර්වතද ජලයෙන් බිඳුනුපර්වත ප්‍රදෙශද, පර්වතගුහාද, සොහොන්ද, දුරුවූ සෙනසුන්ද, අභ්‍යවකාශස්ථානද, පිදුරුවලින් කරණලද ගෘහද, යන මේ ජනශූන්‍ය සෙනාසන සෙවනය කෙරෙයි.

සො පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා සො අභිජ්ඣං ලොකෙ පහාය විගතාභිජ්ඣෙන චෙතසා විහරති, අභිජ්ඣාය චිත්තං පරිසොධෙති ව්‍යාපාදපදොසං පහාය අව්‍යාපන්නචිත්තො විහරති සබ්බපාණභූතහිතානුකම්පී ව්‍යාපාදපදොසා චිත්තං පරිසොධෙති ථිනමිද්ධං පහාය විගතථිනමිද්ධො විහරති, ආලොකසඤ්ඤී සතො සම්පජානො ථිනමිද්ධා චිත්තං පරිසොධෙති උද්ධච්ච කුක්කුච්චං පහාය අනුද්ධතො විහරති, අජ්ඣත්තං උපසන්තචිත්තො උද්ධච්චකුක්කුච්චා චිත්තං පරිසොධෙති විචිකිච්ඡංපහාය තිණ්ණවිචිකිච්ඡො විහරති, අකථංකථී කුසලෙසු ධම්මෙ විචිකිච්ඡා චිත්තං පරිසොධෙති සෙය්‍යථාපි මාණව පුරිසො ඉණං ආදාය කම්මන්තෙ පයොජෙය්‍ය.

ඒ භික්ෂුතෙම පිණ්ඩපාතයෙන් ආපසුආයේ පස්වරු පලක්බැඳ ශරීරය සෘජුව පිහිටුවා කර්මස්ථානයට අභිමුඛකොට ස්මෘතිය පිහිටුවාගෙණ හිඳියි. ඒ භික්ෂුතෙම ලොකයයි කියනලද පඤ්චවිධ උපාදානස්කන්ධයෙහි විසම ලොභය පහකොට පහවූ විසම ලොභඇති සිතින් යුක්තව වාසය කෙරෙයි. විසම ලොභය කෙරෙන් සිතපිරිසිදු කෙරෙයි. විකෘතියට පැමිණි මෙන් දූෂ්‍යකරන්නාවූ ක්‍රොධය පහකොට ක්‍රොධරහිත සිත්ඇත්තේ සියලු සතුන් කෙරෙහි හිතයෙන් අනුකම්පාකරණ සුලුවූයේ වාසය කෙරෙයි. දූෂ්‍යකරන්නාවූ ක්‍රොධයකෙරෙන් සිත පිරිසිදු කෙරෙයි කායචිත්ත දෙදෙනාගේ ක්‍රියා නොකිරීමයයි කියනලද ථිනමිද්ධය දුරුකොට පහවූ ථිනමිද්ධයඇත්තේ ආලොක සංඥයෙන් යුක්තවූයේ ස්මෘති සම්‍යක් ඥානයෙන් යුක්තවූයේ වාසය කොරෙයි. ථිනමිද්ධ නිවරණය කෙරෙන් සිත පිරිසිදු කෙරෙයි. වික්ෂිප්ත භාවය හා කුකුසදයි කියනලද උද්ධච්ච කුක්කුච්ච නීවරණය දුරුකොට පහවූ වික්ත භාවය හා කුකුසද ඇත්තේ තමාගේ සන්තානයෙහි සංසිඳුනාවූ සිත් ඇත්තේ වාසය කෙරෙයි. උද්ධච්චකුක්කුච්ච නිවරණය කෙරෙන් සිතපිරිසිදු කෙරෙයි. බුද්ධාදි අටතන්හි කරණලද සැකයයි කියනලද විචිකිච්ඡා නිවරණය දුරුකොට එතරකරණලද විචිකිච්ඡා ඇත්තේ කුශල ධර්මයන්කෙරෙහි මේ කෙසේද මේ කෙසේදැයි මෙසේ පැවති සැකනැතිව වාසය කෙරෙයි. විචිකිච්ඡානිවරණය කෙරෙන් සිත පිරිසිදු කෙරෙයි. මාණවකය, යම්සේ පුරුෂයෙක් අභිවෘද්ධිය පිණිස නයගෙණ කර්මාන්තයන් යොදන්නේද.

තස්සතෙ කම්මන්තා සම්පජ්ජෙය්‍යුං සො යානිච තෙ පොරාණානි ඉණමූලානි තානිච ව්‍යන්තීකරෙය්‍ය සියාචස්ස උත්තරිං අවසිට්ඨං දාරභරණාය තස්ස එවමස්ස අහං ඛො පුබ්බෙ ඉණං ආදාය කම්මන්තෙ පයොජෙසිං තස්ස මෙ තෙ කම්මන්තා සමිජ්ඣිංසු සොහං යානිච පොරාණානි ඉණමූලානි තානිච ව්‍යන්තී අකාසිං අත්ථිච මෙ උත්තරිං අවසිට්ඨං දාරභරණායාති සො තතො නිදානං ලභෙථ පාමුජ්ජං අධිගච්ඡෙ සොමනස්සං.

21. සෙය්‍යථාපි මාණව පුරිසො ආබාධිකො දුක්ඛිතො බාළ්හගිලානො භත්තඤ්චස්ස නච්ඡාදෙය්‍ය නචස්ස කායෙ බලමත්තා සො අපරෙන සමයෙන තම්හා ආබාධා මුච්චෙය්‍ය භත්තඤ්චස්ස ඡාදෙය්‍ය සියා චස්ස කායෙ බලමත්තා තස්ස එවමස්ස අහං ඛො පුබ්බෙ ආබාධිකො අහොසිං දුක්ඛිතො බාළ්හගිලානො භත්තඤ්චමෙ නච්ඡාදෙසි නච මෙ ආසි කායෙ බලමත්තා සොම්හි එතරහි තම්හා ආබාධා මත්තො භත්තඤ්ච මෙ ඡාදෙති අත්ථිච මෙ කායෙ බලමත්තාති සො තතො නිදානං ලභෙථ පාමුජ්ජං අධිගච්ඡෙ සොමනස්සං.

ඔහුගේ ඒ කර්මාන්තයෝ සමෘද්ධවන්නාහුනම් ඒ පුරුෂතෙම පුරාණවූ යම් ණයමුදල් වෙත්ද, ඒ සියල්ල ගෙවන්නේය. අඹුදරුවන් පොෂ්‍යය කිරීමපිණිස වැඩිමුදලක් ඔහට ඉතුරුවූයේද එසේ ඇතිකල්හි ඔහට මෙබඳු සිතක්වන්නේය. මමවනාහි පෙර ණයගෙණ කර්මාන්තයන් යෙදවූයෙමි. මාගේ ඒ කර්මාන්තයෝ සමෘද්ධවූවාහුය. ඒ මම පුරාණවූ යම් ණයමුදල් වෙත්ද ඒ සියල්ලද ගෙවීම කෙළෙමි. අඹු දරුවන් පොෂ්‍යය කිරීමපිණිසද, වැඩිමුදලක් මට ඉතුරුවිද ඇතැයි ඒ පුරුෂතෙම ඒ ඒ ණය නැතිබවට කාරණාකොට ගෙණ ප්‍රමොද්‍යය ලබන්නේය. සොම්නසටද පැමිණෙන්නේය.

21. මාණවකය, යම්සේ පුරුෂයෙක් ආබාධ ඇත්තේ, දුක් ඇත්තේ, දැඩිවූ ගිලන්බැව් ඇත්තේ, වන්නේද, ඔහට බත්ද රුචිනොවන්නේද, ඔහුගේ ශරීරයෙහි බලය නැත්තේද, ඒ පුරුෂතෙම මෑත කාලයෙහි ඒ ආබාධයකෙරෙන් මිදින්නේද, ඔහට ආහාරද රුචිවන්නේනම් ඔහුගේ ශරීරයෙහි බලයද ඇතිවන්නේනම් එකල ඔහට මෙබඳු සිතෙක් වන්නේය. මම වනාහි පෙර ආබාධ ඇත්තෙම් දුක් ඇත්තෙම් දැඩිගිලන් බැව් ඇත්තෙම්ද වූයෙමි. ආහාරද මට රුචිනුවූයේය, මාගේ ශරීරයෙහි බලද නැතිවිය ඒමම දැන් ඒ ආබාධයෙන් මිදුනෙම් වෙමි. ආහාරද මට රුචිවිය මාගේ ශරීරයෙහි බලයද ඇත්තේයයි ඒ පුරුෂතෙම ඒ ආරොග්‍ය භාවයම කාරණාකොටගෙණ ප්‍රමොද්‍යය ලබන්නේය. සොම්නසටද පැමිණෙන්නේය.

සෙය්‍යථාපි මාණව පුරිසො බන්ධනාගාරෙබද්ධො අස්ස සො. අපරෙණ සමයෙන තම්හා පන බන්ධනාගාරාමුච්චෙය්‍ය සොත්ථිනා අව්‍යයෙන න චස්ස කිඤ්චි භොගානංවයො තස්ස එවමස්ස අහං ඛො පුබ්බෙ බන්ධනාගාරෙබද්ධො අහොසිං සොම්හි එතරහි තම්හාබන්ධනාගාරාමුත්තො සොත්ථිනා අව්‍යයෙන නත්ථි ච මෙ කිඤ්චි භොගානංවයොති සො තතො නිදානං ලභෙථ පාමුජ්ජං අධිගච්ඡෙ සොමනස්සං. සෙය්‍යථාපි මාණව පුරිසො දාසො අස්ස අනත්තාධීනො පරාධීනො න යෙන කාමංගමො සො අපරෙන සමයෙන තම්හා දාසව්‍යා මුච්චෙය්‍ය අත්තාධීනො අපරාධීනො භුජිස්සො යෙන කාමංගමො තස්ස එවමස්ස අහං ඛො පුබ්බෙදාසො අහොසිං අනත්තාධීනො පරාධීනො නයෙන කාමංගමො සොම්හි එතරහි තම්හාදාසව්‍යාමුත්තො අත්තාධීනො අපරාධීනො භුජිස්සො යෙන කාමංගමොති. සො තතො නිදානං ලභෙථ පාමුජ්ජං අධිගච්ඡෙ සොමනස්සං.

මාණවකය, යම්සේ පුරුෂයෙක් බන්ධනාගාරයෙහි බඳනාලද්දේ වූයේද, ඒ පුරුෂතෙම මෑතකාලයෙහි වියදන් නැතිව සැප තින් යුක්තව ඒ බන්ධනාගාරයෙන් මිදෙන්නේද, භොගසම්පත්තින් සම්බන්ධවූ කිසිවියදනෙක් ඕහට නොවන්නේනම් එකල ඕහට මෙබදු සිතෙක් වන්නේය. මම වනාහි පෙර බන්ධනාගාරයෙහි බඳනාලද්දෙම් වීමි. දැන්වනාහි ඒ මම වියදනක් නොමැති සැපතින් යුක්තව ඒ බන්ධනාගාරයෙන් මිදුනෙම් වෙමි. භොගසම්පත්තින් සම්බන්ධවූ කිසි වියදනෙක්ද නොවීයයි ඒ පුරුෂතෙම ඒ බන්ධනාගාරයෙන් මිදීම කරණකොටගෙණ ප්‍රමොද්‍යය ලබන්නේය.සොම්නසටද පැමිණෙන්නේය.මාණවකය,යම්සේ සියකැමැත්තෙන් කිසිවක් කිරීමට නොලැබෙන්නාවූ අන්‍යයාගේම කැමැත්තලෙස පැවතියයුතුවූ කැමැති තැනකට යානොහැකිවූ දාස පුරුෂයෙක් වන්නේද ඒ දාස පුරුෂතෙම මෑතකාලයෙහි ඒ දාස භාවයෙන් මිදෙන්නේද තමා අයිති පැවතුම් ඇත්තේ වේද. අනුන්ට යටත් පැවතුම් නැත්තේ වේද. දාසයෙක් නොවූයේ වේද. සිය කැමැත්තෙන් කැමති තැනකට යාහැකි වන්නේද, එකල ඕහට මෙබඳු සිතක්වන්නේය. මම වනාහි පෙර තමාකෙරෙහි අධිපතිභාවයක් නැත්තාවූ අනුන්ට යටත්වූ පැවතුම් ඇත්තාවූ සිය කැමැත්තෙන් යානොහැකිවූ දාසපුරුෂයෙක් වීමි. ඒ මම දැන්වනාහි ඒ දාසභාවයෙන් මිදුනෙම් වෙමි. තමා අධිපතිකොට ඇත්තෙම් වෙමි. අනුන්අයත් පැවතුම් නැත්තෙම් වෙමි. දාසයෙක්ද නොවෙමි. සිය කැමැත්තෙන් කැමැතිතැනකට යන්නෙම්ද වෙමියි ඒ පුරුෂතෙම ඒභුජිෂ්‍යභාවයම කාරණාකොටගෙණ ප්‍රමොද්‍යය ලබන්නේය සොම්නසටද පැමිණෙන්නේය.

22. සෙය්‍යථාපි මාණව පුරිසො සධනො සභොගො කන්තාරද්ධානමග්ගං පටිපජ්ජෙය්‍ය දුබ්භික්ඛං සප්පටිභයං. සො අපරෙන සමයෙන තං කන්තාරං නිත්ථරෙය්‍ය සොත්ථිනා ගාමන්තං අනුපාපුණෙය්‍ය ඛෙමං අප්පටිභයං. තස්ස එවමස්ස අහං ඛො පුබ්බෙ සධනො සභොගො කන්තාරද්ධානමග්ගං පටිපජ්ජිං දුබ්භික්ඛං සප්පටිභයං. සොම්හි එතරහි කන්තාරං නිත්තිණ්ණො සොත්ථිනා ගාමන්තං අනුප්පත්තො ඛෙමං අප්පටිභයන්ති. සො තතො නිදානං ලභෙථ පාමුජ්ජං අධිගච්ඡෙය්‍ය සොමනස්සං. එවමෙව ඛො මාණව භික්ඛු යථා ඉණං යථාරොගං යථාබන්ධනාගාරං යථාදාසව්‍යං යථාකන්තාරද්ධානමග්ගං ඉමෙ පඤ්ච නීවරණෙ අප්පහීණෙ අත්තනි සමනුපස්සති සෙය්‍යථාපි මාණව ආණණ්‍යං යථා ආරොග්‍යං යථාබන්ධනාමොක්ඛං යථා භුජිස්සං යථා ඛෙමන්තභූමිං. එවමෙව ඛො භික්ඛු ඉමෙ පඤ්චනීවරණෙ පහීණෙ අත්තනි සමනුපස්සති. තස්සි මෙ පඤ්චනීවරණෙ පහීණෙ අත්තනි සමනුපස්සතො පාමුජ්ජං ජායති.

22. මාණවකය, යම්සේ ධනසහිතවූ භොගසහිතවූ පුරුෂයෙක් දුකසේ ලැබියයුතු භික්‍ෂාඇති ප්‍රතිභයසහිතවූ ජලරහිත දීර්ඝමාර්ගයකට පැමිණෙන්නේද, ඒ පුරුෂතෙම මෑතකාලයෙහි ඒ ජලරහිත දීර්ඝ මාර්ගය පසුකරයන්නේනම් නිර්භයවූ ප්‍රතිභයරහිතවූ ග්‍රාමාන්තයකට සැපතින් යුක්තව පිළිවෙළින් පැමිනෙන්නේද, එකල ඔහට මෙබඳු සිතක් වන්නේය. මමවනාහි පෙර ධනසහිතවූයෙම් භොගසම්පත්ති සහිතවූයෙම් දුකසේ ලැබියයුතු භික්‍ෂාඇති ප්‍රතිභයසහිතවූ ජලරහිත දීර්ඝමාර්ගයකට පැමිණියෙමි. ඒමම දැන්වනාහි ඒ ජලරහිත දීර්ඝමාර්ගය පසුකෙළෙමි. නිර්භයවූ භයටකාරණානැත්තාවූ ග්‍රාමාන්තයකට සැපතින් යුක්තව පැමිණියෙමියි ඒ පුරුෂතෙම ඒ නිර්භය භූමියට පැමිණීම කාරණාකොටගෙණ ප්‍රමොද්‍යය ලබන්නේය. සොම්නසටද පැමිණෙන්නේය. මාණවකය, ණය යම්සේද, රොගය යම්සේද බන්ධනාගාරය යම්සේද, දාසභාවය යම්සේද, ජලරහිත දීර්ඝමාර්ගය යම්සේද, එපරිද්දෙන්ම භික්‍ෂුතෙම ප්‍රහීණනොකරණලද මේ පඤ්චනිවරණ ධර්මයන් තමාකෙරෙහි දකියි. මාණවකය, ණයනැතිබව යම්සේද, නිරොගිභාවය යම්සේද, බන්ධනාගාරයෙන් මිදීම යම්සේද, අදාස භාවය යම්සේද, නිර්භයභූමිය යම්සේද, මාණවකය, එපරිද්දෙන්ම භික්‍ෂුතෙම ප්‍රහීණකරණලද පඤ්චනීවරණධර්මයන් තමා කෙරෙහි නැතිබව මනාකොට දකියි. ප්‍රහීණකරණලද මේ පඤ්චනිවරණ ධර්මයන් තමාකෙරෙහි නැතැයි මනාකොට දක්නාවූ ඒ භික්‍ෂුහට සතුටුඅයුර උපදියි.

පමුදිතස්ස පීති ජායති පීතිමනස්ස කායො පස්සම්භති පස්සද්ධකායො සුඛං වෙදෙති සුඛිනො චිත්තං සමාධියති. සො විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස විවෙකජෙන පීතිසුඛෙන අප්ඵුටං හොති, සෙය්‍යථාපි මාණව දක්ඛො නහාපකො වා නහාපකන්තෙවාසී වා කංසථාලෙ නහානීයචුණ්ණානි ආකිරිත්වා උදකෙන පරිප්ඵොසකං පරිප්ඵොසකං සන්නෙය්‍ය සාස්ස නහානීයපිණ්ඩි ස්නෙහානුගතා ස්නෙහපරෙතා සන්තරබාහිරා ඵුටා ස්නෙහෙන න ච පග්ඝරණී.

සතුටුවූවාහුගේ සකලශරීරය කලඹමින් ප්‍රීතිය උපදියි. ප්‍රීතියෙන් යුක්ත සිත්ඇතිපුද්ගලයාගේ නාමකායතෙම බැහැරගිය දහ ඇත්තේ වෙයි. නිවුණුදහයඇතිතැනැත්තේ කායිකවෙත සික සැපවිදියි. සැපතටපැමිණි තැනැත්තහුගේ සිත උපචාර වශයෙන් හා අර්පණාවශයෙන්ද එකඟවෙයි. ඒ භික්ෂුතෙම, පඤ්ච කාමගුණයන්ගෙන් වෙන්වම අකුශලධර්මයන්ගෙන් වැළකම විතර්කසහිතවූ විචාරසහිතවූ විවෙකහෙතුවෙන් උපන්නාවූ කායචිත්ත දෙදෙනාගේ පිණවීම කරන්නාවූ ප්‍රීතිය හා සැපඇත්තාවූ ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කෙරෙයි. ඒ භික්ෂුතෙම මේ කයම විවෙකහෙතුවෙන් උපන්නාවූ ප්‍රීතියෙන් හා සැපයෙන් හැමතන්හි පවත්නා ප්‍රීතිය හා සැපතින් යුක්තවූවක් කෙරෙයි. හාත්පසින් තෙමයි. වාතයෙන් භස්ත්‍රාවමෙන් සම්පූර්ණකෙරෙයි. හාත්පසින් ස්පර්ශකෙරෙයි සකලකොටාසවත්වූ මේ භික්ෂුහුගේ ශරීරය සම්බන්ධවූ සිවිමස් ලේ අනුවගියාවූ සවල්පමාත්‍රවූද ස්ථානයක් ප්‍රථමධ්‍යාන සැපයෙන් ස්පර්ශනොකරණලද්දේනම් නොවෙයි. මාණවකය, යම්සේ ස්නානයට යොග්‍යවූ චූර්ණයකරන්ට හා යොදන්ටද, දක්ෂවූ ස්නානද්‍රව්‍යසම්පාදකයෙක් හෝ ස්නානද්‍රව්‍ය සම්පාදකයෙකුගේ අතවැස්සෙක් හෝ ලොහභාජනයක ස්නානයට යොග්‍යවූ ද්‍රව්‍යයන් බහා ජලය ඉස ඉසවමතින් ලොහභාජනය අල්වාගෙණ දකුණතින් ප්‍රමාණජලය ඉස ඉස පිරිමදිමින් පිඩුකරන්නේද, ඒ ස්නානපිණ්ඩය ජලයෙන් යුක්තවීනම් ජලයෙන් හාත්පසින් යුක්තවීනම් ඇතුළත පිටතදෙක හැම තැනම ජලයෙන් ස්පර්ශකරණලද්දීනම් ජලය බින්දුවශයෙන් නොවැගිරෙන්නිය.

එවමෙව ඛො මාණව භික්ඛු ඉමමෙව කායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස විවෙකජෙන පීතිසුඛෙන අප්ඵුටං හොති. යම්පි මාණව භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස විවෙකජෙන පීතිසුඛෙන අප්ඵුටං හොති. ඉදම්පිස්ස හොති සමාධිස්මිං.

23. පුනචපරං මාණව භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියජ්ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං සමාධිජෙන පීතිසුඛෙන.

මාණවකය, එපරිද්දෙන්ම භික්ෂුතෙම මේ ශරීරයම විවෙක හෙතුවෙන් උපන්නාවූ ප්‍රීතිය හා සැපයෙන් තෙමයි. හාත්පසින් තෙමයි. හාත්පසින් සම්පූර්ණකෙරෙයි. හාත්පසින් ස්පර්ශ කෙරෙයි. සකල කොට්ඨාසවත්වූ මේ භික්ෂුහුගේ ශරීරය සම්බන්ධවූ සිවි මස් ලේ අනුව පවත්නාවූ ස්වල්පමාත්‍රවූද ස්ථානයක් ප්‍රථමධ්‍යාන සැපයෙන් ස්පර්ශ නොකරණලද්දේනම් නොවෙයි. මාණවකය, යම් හෙයකින් භික්ෂුතෙම කාමයන් කෙරෙන් වෙන්වම අකුශලධර්මයන් කෙරෙන් වෙන්ව විතර්කසහිතවූ විචාරසහිතවූ විවෙකයෙන් උපන් නාවූ ප්‍රීතිය හා සැපතින්යුක්තවූ ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කෙරේද, ඒ භික්ෂුතෙම මේ ශරීරයම විවෙකයෙන් උපන්නාවූ ප්‍රීතිසුඛයෙන් තෙමයි. හාත්පසින් තෙමයි. හාත්පසින් සම්පූර්ණ කෙරෙයි. හාත්පසින් ස්පර්ශ කෙරෙයි. සකලකොට්ඨාසවත්වූ ඒභික්ෂු හුගේ ශරීරය සම්බන්ධවූ සිවිමස් ලේ යනමොවුන් අනුවපවත්නාවූ ස්වල්පමාත්‍රවූද ස්ථානයෙක් විවෙකයෙන්හටගත් ප්‍රීතිසැපයෙන් ස්පර්ශ නොකරණලද්දේ නොවෙයි. මේද ඒ මහණහුගේ සමාධිය වෙයි.

23. නැවතද මාණවකය, භික්ෂුතෙම විතර්කවිචාර දෙදෙනාගේ සංසිඳීමෙන් තමාතුළ සිතපැහැදීම කරන්නාවූ චිත්තයාගේ එකාග්‍රබව ඇති විතර්කරහිතවූ විචාර රහිතවූ සමාධියෙන් හටගන්නාවූ ප්‍රීතිය හා සැපතින් යුක්තවූ ද්විතීයධ්‍යානයට පැමිණ වාසයකෙරෙයි. ඒ භික්ෂුතෙම මේශරීරයම සමාධියෙන් හටගත්නාවූ ප්‍රීතියෙන්හා සැපයෙන්

අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස සමාධිජෙන පීතිසුඛෙන අප්ඵුටං හොති, සෙය්‍යථාපි මාණව උදකරහදො උබ්භිදොදකො තස්ස නෙවස්ස පුරත්ථිමාය දිසාය උදකස්සාය මුඛං න පච්ඡිමාය දිසාය උදකස්සාය මුඛං න උත්තරාය දිසාය උදකස්සාය මුඛං න දක්ඛිණාය දිසාය උදකස්සාය මුඛං දෙවො ච න කාලෙන කාලං සම්මාධාරං අනුප්පවෙච්ඡෙය්‍ය, අථ ඛො තම්හාව උදකරහදා සීතා වාරිධාරා උබ්භිජ්ජිත්වා තමෙව උදකරහදං සීතෙන වාරිනා අභිසන්දෙය්‍ය පරිසන්දෙය්‍ය පරිපූරෙය්‍ය පරිප්ඵරෙය්‍ය නාස්ස කිඤ්චි සබ්බාවතො උදකරහදස්ස සීතෙන වාරිනා අප්ඵුටං අස්ස. එවමෙව ඛො මාණව භික්ඛු ඉමමෙව කායං සමාධිජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස සමාධිජෙන පීතිසුඛෙන අප්ඵුටං හොති—පෙ—ඉදම්පිස්ස හොති සමාධිස්මිං—

හැමතැන්හි පවත්නාවූ ප්‍රීතියහා සැපතින් යුක්තවූවක් කෙරෙයි. හාත්පසින් තෙමයි, හාත්පසන් සම්පූර්ණ කෙරෙයි, හාත්පසින් ස්පර්ශ කෙරෙයි, සකල කොට්ඨාසවත්වූ මේ භික්ෂුහුගේ ශරීරය සම්බන්ධිවූ සිවි මස් ලේ අනුවපවත්නාවූ සවල්පමාත්‍රවූද ස්ථානයක් විතීය ධ්‍යාන සැපයෙන් ස්පර්ශනොකරණලද්දේනම් නොවෙයි. මාණව කය, ඇතුලතම උපදින ජලයඇත්තාවූ දියවිලක් යම්සේද, ඒ විලට පෙරදිගින් ජලය පැමිණෙන මාර්ගයෙක් නැත්තේද, අවරදිගින්ද ජලය පැමිණෙන මාර්ගයෙක් නැත්තේද, උතුරුදිගින්ද ජලය පැමිණෙන මාර්ගයෙක් නැත්තේද, දකුණුදිගින්ද ජලය පැමිණෙන මාර්ගයෙක් නැත්තේද, මේඝයද කලින්කල මනාකොට වර්ෂාධාරාව ප්‍රවෙශ කරන්නේද එසේ ඇතිකල්හි ඒ විලෙන්ද සිහිල්දිය ඒ විල පුරවමින් ඉපිද ඒ විලම සිහිල් දියෙන් හැමතැන පවත්නා ජලය ඇත්තක්කෙරෙයි. හාත්පසින් වගුරුවයි හාත්පසින් සම්පූර්ණකෙරෙයි, හාත්පසින් ස්පර්ශකෙ රෙයි, විලපිළිබඳ සියලුතැන් සිහිල් දිය පැතිරපවත්නේ වෙයි, මාණවකය, එපරිද්දෙන්ම භික්ෂුතෙම මේ කයම සමාධියෙන් හටගත්තාවූ ප්‍රීතියෙන් හා සැපයෙන් හැමතන්හි පවත්නාවූ ප්‍රීතිය හා සැපඇත්තක් කෙරෙයි, හාත්පසින් තෙමයි, හාත්පසින් සම්පූර්ණකෙරෙයි, හාත්පසින් ස්පර්ශ කෙරෙයි, සකල කොට්ඨාසවත්වූ ඒ භික්ෂුහුගේ ශරීරය සම්බන්ධිවූ සිවි මස් ලේ අනුව පවත්නාවූ සවල්පමාත්‍රවූද ස්ථානයක් විතීයධ්‍යාන සැපයෙන් ස්පර්ශනොකරණලද්දේ නොවෙයි,—පෙ—මේද ඒ මහණහුගේ සමාධිය වෙයි.

24. පුනචපරං මාණව භික්ඛු පීතියාච විරාගා උපෙක්ඛකො ච විහ
රති. සතො සම්පජානො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති යං තං
අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛ විහාරීති තතියජ්ඣානං
උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං නිප්පීතිකෙන සුඛෙන අභි
සන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති නාස්ස කිඤ්චි සබ්බාවතො
කායස්ස නිප්පීතිකෙන සුඛෙන අප්ඵුටං හොති, සෙය්‍යථාපි මාණව
උප්පලිනියං වා පදුමිනියං වා පුණ්ඩරිකිනියං වා අප්පෙකච්චානි
උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානිවා උදකෙ ජාතානි උදකෙ
සංවඩ්ඪානි උදකානුග්ගතානි අන්තො නිමුග්ගපොසීනි. තානි යාව
චග්ගා යාව ච මූලා සීතෙන වාරිනා අභිසන්නානි පරිසන්නානි පරි
පූරානි පරිප්ඵුටානි නාස්ස කිඤ්චි සබ්බාවතං උප්පලානං වා පදුමානං
වා පුණ්ඩරිකානං වා සීතෙන වාරිනා අප්ඵුටං අස්ස. එවමෙව ඛො
මාණව භික්ඛුඉමමෙවකායං නිප්පීතිකෙන සුඛෙන අභිසන්දෙති පරි
සන්දෙති පරිපූරෙති පරිප්ඵරති.

---

24. නැවතද මාණවකය, භික්ෂුතෙම ප්‍රීතියෙන්ද විරාගයෙන්
හෙවත් එහි නොඇලීමෙන් මධ්‍යස්ථස්වභාව ඇත්තේ වාසයකෙරෙයි
සිහි ඇත්තේද, නුවණ ඇත්තේද, කයින් සැප විඳියි, යම්හෙයකින්
උපෙක්‍ෂා ඇත්තේය,සිහිඇත්තේය, සැපවිහරණ ඇත්තේයයි ආර්‍ය්‍ය
යෝ යමක්සඳහා කියද්ද,ඒ තෘතීයධ්‍යානයට පැමිණ වාසය කෙරෙයි.
ඒ භික්ෂුතෙම ප්‍රීතිරහිතවූ සැපයෙන් මේ කයම තෙමයි, හාත්පසින්
තෙමයි, හාත්පසින් සම්පූර්ණකෙරෙයි, හාත්පසින් ස්පර්‍ශකෙරෙයි,
සකල කොඨාසවත්වූ ඒ භික්ෂුහුගේ ශරීරය සම්බන්ධවූ සිවි මස් ලේ
අනුව පවත්නාවූ ස්වල්ප මාත්‍රවූද ස්ථානයක් ප්‍රීතිරහිතවූ තෘතීයධ්‍යාන
සැපයෙන් ස්පර්‍ශනොකරණලද්දේනම් නොවෙයි. මාණවකය,
යම්සේ උපුල් විලකහෝ හෙලපියුම් විලකහෝ දියෙහි හටගන්නාවූ
දියෙහි වැඩුනාවූ දියෙන් උඩට නොනැගුනාවූ දියතුළ ගැලී
වැඩෙන්නාවූ සමහර උපුල්හෝ වෙද්ද, සමහර පියුම්හෝ වෙද්ද,
සමහර හෙලපියුම්හෝ වෙද්ද ඒ උත්පලාදිහු අගදක්වාද, මුලදක්වාද
ශීතොදකයෙන් තෙමුනාහු, හාත්පසින් ජලයෙහි ගැලුනාහු, හාත්
පසින් සම්පූර්ණවූවාහු හාත්පසින් ස්පර්‍ශකරණලද්දාහු වෙත්. උත්
පල, පදුම, පුණ්ඩරීක, යන මොවුන් සම්බන්ධවූ සියල් පෙදෙස සිහිල්
දියෙන් ස්පර්‍ශකරණ ලද්දේවෙයි, මාණවකය, එපරිද්දෙන්ම භික්ෂු
තෙම මේ ශරීරයම ප්‍රීතිරහිතවූ තෘතීයධ්‍යාන සැපයෙන් තෙමයි
හාත්පසින් තෙමයි, හාත්පසින් සම්පූර්ණකෙරෙයි, හාත්පසින් ස්පර්‍ශ
කෙරෙයි.

නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස නිප්පීතිකෙන සුඛෙන අප්ඵුටං හොති...පෙ...ඉදම්පිස්ස හොති සමාධිස්මිං. පුනච පරං මාණව භික්ඛු සුඛස්සච පහාණා දුක්ඛස්සච පහාණා පුබ්බෙව සොමනස්ස දොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන ඵරිත්වා නිසින්නො හොති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන අප්ඵුටං හොති. සෙය්‍යථාපි මාණව පුරිසො ඔදාතෙන වත්ථෙන සසීසං පාරුපිත්වා නිසින්නො අස්ස. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස ඔදාතෙන වත්ථෙන අප්ඵුටං අස්ස. එවමෙවඛො මාණව භික්ඛු ඉමමෙව කායං පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන ඵරිත්වා නිසින්නො හොති නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන අප්ඵුටං හොති.

සකල කොට්ඨාසවත්වූ ඒ භික්ෂුහුගේ ශරීරයසම්බන්ධිවූ සිවි මස් ලේ යන මොවුන් අනුවපවත්නාවූ සවල්පමාත්‍රවූද ස්ථානයක් ප්‍රීතිරහිතවූ තෘතීයධ්‍යාන සැපයෙන් ස්පර්ශනොකරණලද්දේනම් නොවෙයි. — පෙ — මේද ඒ මහණහුගේ සමාධිය වෙයි, නැවතද මාණවකය, භික්ෂුතෙම කායහටගන්නා සැපය පහකිරීමෙන්ද, කායිකදුඃඛයාගේ ප්‍රහාණයෙන්ද පූර්වයෙහිම සොම්නස් දොම්නස් දෙදෙනාගේ අස්තඞ්ගමයෙන් පූර්වයෙහිම දුක්නොවූ සැපනොවූ උපෙක්ෂාස්මෘතියන මොවුන්ගේ පිරිසිදුබැව් ඇත්තාවූ චතුර්ථධ්‍යානයට පැමිණ වාසයකෙරෙයි. ඒ භික්ෂුතෙම මේ ශරීරයම කෙලෙස් නොමැතිහෙයින් පිරිසිදුවූ අතිශයින් බබලන බැවින් පර්‍ය්‍යවදාතවූ ධ්‍යාන චිත්තයෙන් පතුරුවා උන්නේවෙයි. සකල කොට්ඨාසවත්වූ ඒ භික්ෂුහුගේ ශරීරය සම්බන්ධිවූ සිවි මස් ලේ අනුව පවත්නාවූ සවල්පමාත්‍රවූද ස්ථානයක් පිරිසිදුවූ පර්‍ය්‍යවදාතවූ චතුර්ථධ්‍යානසුඛයෙන් ස්පර්ශනොකරණලද්දේනම් නොවෙයි. මාණවකය, යම්සේ පුරුෂයෙක් නොකිලිටි පිරිසිදු වතකින් හිස වසා පොරවා උන්නේවේද, සකල කොට්ඨාසවත්වූ ඔහුගේ ශරීරය සම්බන්ධිවූ සිවි මස් ලේ අනුව පවත්නාවූ සවල්පමාත්‍රවූද ස්ථානයක් නොකිලිටි පිරිසිදු වතින් ස්පර්ශනොකරණලද්දේනොවෙයි, මාණවකය, එපරිද්දෙන්ම භික්ෂුතෙම මේ ශරීරයම පිරිසිදුවූ පර්‍ය්‍යවදාතවූ ධ්‍යානචිත්තයෙන් පතුරුවා උන්නේවේ. සකල කොට්ඨාසවත්වූ ඒ භික්ෂුහුගේ ශරීරය සම්බන්ධිවූ සිවි මස් ලේ අනුව පවත්නාවූ සවල්පමාත්‍රවූද ස්ථානයක් පිරිසිදුවූ පර්‍ය්‍යවදාතවූ චතුර්ථධ්‍යාන සුඛයෙන් ස්පර්ශනොකරණලද්දේනම් නොවෙයි.

යම්පි මාණව භික්ඛු සුඛස්සච පහණා දුක්ඛස්ස ච පහාණා පුබ්බෙව සොමනස්ස දොමනස්සානං අත්ථගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛාසති පාරිසුද්ධිං චතුත්ථජ්ඣානං උපසම්පජ්ජවිහරති, සො ඉමමෙව කායං පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන ඵරිත්වා නිසින්නො හොති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන අප්ඵුටං හොති, ඉදම්පිස්ස හොති සමාධිස්මිං.

25. අයං ඛො සො මාණව අරියො සමාධික්ඛන්ධො යස්ස භගවා වණ්ණවාදී අහොසි. එත්ථච ඉමං ජනතං සමාදපෙසි නිවෙසෙසි පතිට්ඨපෙසි. අත්ථිචෙවෙත්ථ උත්තරිං කරණීයන්ති. අච්ඡරියම්භො ආනන්ද අබ්භුතම්භො ආනන්ද සො චායම්භො ආනන්ද අරියො සමාධික්ඛන්ධො පරිපුණ්ණො නො අපරිපුණ්ණො. එවං පරිපුණ්ණඤ්චාහම්භො ආනන්ද අරියං සමාධික්ඛන්ධං ඉතො බහිද්ධා අඤ්ඤෙසු සමණබ්‍රාහ්මණෙසු න සමනුපස්සාමි.

මාණවකය, යම්හෙයකින් භික්ෂුතෙම කයහටගන්නා සැපය පහකිරීමෙන්ද කායිකදුඃඛයාගේ ප්‍රහාණයෙන්ද පූර්වයෙහිම සොම්නස් දොම්නස් දෙදෙනාගේ අස්තඞ්ගමයෙන් පූර්වයෙහිම දුක්නොවූ සැපනොවූ උපෙක්ෂාස්මෘති යන මොවුන්ගේ පිරිසිදුබැව් ඇත්තාවූ චතුර්ථධ්‍යානයට පැමිණ වාසයකෙරේද, ඒ භික්ෂුතෙම මේ ශරීරයම පිරිසිදුවූ පයර්‍යවදාතවූ ධ්‍යාන චිත්තයෙන් පතුරුවා උන්නේවේද, සකලකොඨාසවත්වූ ඒ භික්ෂුහුගේ ශරීරය සම්බන්ධිවූ සිවි මස් ලේ අනුව පවත්නාවූ සවල්පමාත්‍රවූද සථානයක් පිරිසිදුවූ පයර්‍යවදාතවූ චතුර්ථධ්‍යානසුඛයෙන් ස්පර්ශනොකරණලද්දේනම් නොවේද, මේද ඒ මහණහුගේ සමාධිය වේ.

25. මාණවකය, ඒ භාග්‍යවතුන්වහන්සේ යම් සමාධිස්කන්ධයක ගුණකියන සුලුවූසේක්ද, මේ වනාහි ඒ සමාධිස්කන්ධය වෙයි. මෙහිද මේ ජනසමූහයා යෙදවූසේක. නිවෙසනය කරවූසේක. පිහිටුවූසේක. මෙහි මෙයින්මත්තෙහි කටයුතු අනිකෙක්ද ඇත්තේමය. පින්වත්ආනන්දස්ථවිරයන්වහන්ස,ආශ්චර්‍යය වේ. පින්වත් ආනන්දස්ථවිරයන්වහන්ස. අද්භූතවේ. පින්වත් ආනන්දස්ථවිරයන්වහන්ස, ඒ මේ ආර්‍යවූ සමාධිස්කන්ධය වනාහි පරිපූර්ණවූයේ වෙයි. පරිපූර්ණනොවූයේනොවෙයි. පින්වත්ආනන්දස්ථවිරයන්වහන්ස,මෙසේ හාත්පසින් පිරුණාවූ ආර්‍යවූ සමාධිස්කන්ධයක් මේ බුදුසස්නෙන් පිටත අන්‍යවූශ්‍රමණබ්‍රාහ්මණයන් විෂයෙහි මම නොදක්නෙමි.

එවං පරිපුණ්ණඃඛව හො ආනන්ද අරිඃං සමාධික්ඛන්ධං ඉතො බහිඩා අඤ්ඤ සමණබ්‍රාහමණා අත්තනි සමනුපස්සෙයයුං තෙ තාව තකෙනෙව අත්තමනා අස්සු අලමෙත්තාවතා අනුප්පතෙතා සාමඤ්ඤ ත්‍ථො නත්ථි නො කිඤ්චි උත්තරිං කරණීයනති. අථව පන භවං ආනන්‍දෙ එවමාහ අත්‍ථිචෙවෙත්‍ථ උත්තරිං කරණීයන්ති. කතමො පන සො හො ආනන්ද අරියො පඤ්ඤක්ඛන්ධො යස්ස සො භවං ගොතමො වණ්ණවාදි අහොසි. යත්‍ථච ඉමං ජනතං සමාදපෙසි නිවෙසෙසි පතිඨපෙසීති.

26. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුධෙ පරියොදාතෙ අනඞ්ග ණෙ විගතුපපක්කිලෙසෙ මුදුභූතෙ කම්මණියෙ ඨිතෙ ආනෙඤ්ජප්ප තෙත ඤාණදස්සනාය චිත්තං අභිනිහරති අභිනින්නාමෙති සො එවං පජානාති. අයං ඛො මෙ කායො රූපී චාතුමමහාභූතිකො මාතා පෙත්තිකසම්භවො.

පින්වත් ආනන්දස්ථවිරයන්වහන්ස, මෙසේ හාත්පසින් පිරුණාවූ ආයඹීවූ සමාධිස්කන්ධයක් මේබුදුසස්නෙන් පිටත අන්‍යවූ ශ්‍රමණ බ්‍රාහ් මණ කෙනෙක් තමාකෙරෙහි මනාකොට දක්නාහුනම් ඒ ශ්‍රමණබ්‍රාහ් මණයෝ මෙපමණකින් අපටප්‍රයොජන වෙයි. මෙපමණකින් අවිය කරණලද්දේය. අපට ශ්‍රමණභාවයාගේ අවියතෙම පැමිණියේය. අප විසින් මත්තෙහි කටයුතුවූ කිසිවකුදු නැත්තේයයි කියා එපමණ කින්ම සතුටුසිත් ඇතිවන්නාහුය. නැවතද පින්වත් ආනන්දස්ථවිර යන්වහන්සේ මෙසේ කියේය. මේ බුදුසස්නෙහි මෙයින් මත්තෙහි කටයුතුවූ අනිකකුදු ඇත්තේමයයි. පින්වත් ආනන්දස්ථවිරයන් වහන්ස, ඒ භවද් ගෞතමයන්වහන්සේ යම් ප්‍රඥස්කන්ධයක ගුණ කියන සුලුවූසේක්ද, යම් තැනක මේ ජනසමූහයා යෙදවූසේක්ද, නිවෙසනය කරවූසේක්ද පිහිටුවූසේක්ද, ඒ ආයඹීවූ ප්‍රඥස්කන්ධය තෙම කවරේදැයි මාණවකතෙම විචාළේය.

26. ඒ ධ්‍යානලාභි භික්ෂුතෙම මෙසේ සිත එකඟවූකල්හි පිරිසිදුවූ කල්හි බබලනකල්හි කෙලෙස් රහිතවූකල්හි පහවූ උපක්ලෙශයන් ඇතිකල්හි මෘදුවූ කල්හි කර්‍මයට සුදුසුවූකල්හි කම්පාමව සිටිකල්හි නිශ්චලභාවයටපැමිණි කල්හි විදර්‍ශනාඥනය නිපදවීමපිණිස සිත එලවයි. විශෙෂයෙන් සිතනැමීම කෙරෙයි. ඒ භික්ෂුතෙම මෙසේදැන ගණියි. මාගේ මේශරීරයතෙම ආකාරඇත්තේ වෙයි. සතරමහාභූත යන්ගෙන් හටගත්තේ වෙයි. මවුපියදෙදෙනානිසා හටගත්තේ වෙයි.

ඔදනකුම්මාසූපචයො අනිච්චුච්ඡාදන පරිමද්දන භෙදන විද්ධංසනධම්මො ඉදඤ්ච පන මෙ විඤ්ඤාණං එත්ථසිතං එත්ථපටිබද්ධං. සෙය්‍යථාපි මාණව මණිවෙළුරියො සුභො ජාතිමා අට්ඨංසො සුපරිකම්මකතො අච්ඡො විප්පසන්නො සබ්බාකාරසම්පන්නො. තත්‍රාස්ස සුත්තං ආවුතං නීලං වා පීතං වා ලොහිතං වා ඔදාතං වා පණ්ඩුසුත්තං වා. තමෙනං චක්ඛුමා පුරිසො හත්ථෙ කරිත්වා පච්චවෙක්ඛෙය්‍ය, අයං ඛො මණිවෙළුරියො සුභො ජාතිමා අට්ඨංසො සුපරිකම්මකතො අච්ඡො විප්පසන්නො සබ්බාකාරසම්පන්නො. තත්‍රිදං සුත්තං ආවුතං නීලං වා පීතං වා ලොහිතං වා ඔදාතං වා පණ්ඩුසුත්තං වාති. එවමෙව ඛො මාණව භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ඤාණදස්සනාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති සො එවං පජානාති අයං ඛො මෙ කායො රූපී චාතුම්මහාභූතිකො මාතාපෙත්තිකසම්භවො.

බතින් හා කොමුආදියෙන් වැඩුනේ වෙයි. අනිත්‍ය භාවය ඉලීමය, පිරිමැදීමය, බිඳීමය, විසිරීමය, යන මේ ස්වභාවකොට ඇත්තේය. මාගේ මෙ විඥානයවනාහි මේ ශරීරය නිශ්‍රිතවූයේ වෙයි. මේ කයපිළිබඳවූයේයයි කියාය. මාණවකය, යහපත්වූ පිරිසිදු අයුරින් නැගීසිටියාවූ අටැස්වූ මනාකොට පරිකර්මකරණලද්දවූ පිරිසිදුවූ අතිප්‍රසන්නවූ සර්වාකාරයෙන් සම්පූර්ණවූ වෛරෝඩිණක් යම්සේද ඒ මාණික්‍යයෙහි නිලවර්ණවූ හෝ පීතවර්ණවූ හෝ රක්තවර්ණවූ හෝ ශ්වෙතවර්ණවූ හෝ පාණ්ඩුවර්ණවූ හෝ හුයක්අමුණනලද්දේවේද. ඒ මේ මාණික්‍යය ඇස්ඇති පුරුෂයෙක් අතෙහිකොට මෙසේ සලකන්නේය. කෙසේද, මේ වෛඩූර්‍ය්‍ය මාණික්‍යය වනාහි යහපත් වෙයි. පිරිසිදු අයුරින් හටගත්තේ වෙයි. අටැස් ඇත්තේ වෙයි. මනාකොට පරිකර්ම කරණලද්දේය. පිරිසිදු වෙයි. අති ප්‍රසන්න වෙයි. සර්වාකාරයෙන් යුක්තවෙයි. ඒ මාණික්‍යයෙහි නිලවර්ණවූ හෝ පීතවර්ණවූ හෝ රක්තවර්ණවූ හෝ ශ්වෙතවර්ණවූ හෝ මේ හුයක් අමුණනලද්දේයයි කියාය. මාණවකය' එපරිද්දෙන්ම භික්ෂුතෙම මෙසේසිත එකඟවූකල්හි පිරිසිදුවූ කල්හි බබලනකල්හි කෙලෙස් රහිතවූකල්හි පහවූ උපක්ලෙශයන් ඇතිකල්හි මෘදුවූ කල්හි කර්මක්ෂමවසිටිකල්හි නිශ්චලභාවයට පැමිණිකල්හි විදර්ශනාඥානය නිපදවීමපිණිස සිත එලවයි. විශෙෂයෙන් සිතනැමීම කෙරෙයි. ඒ භික්ෂුතෙම මෙසේ දැනගණියි. කෙසේද, මාගේ මේ ශරීරයවනාහි ආකාර ඇත්තේ වෙයි. සතරමහාභූතයන්ගෙන් හටගත්තේය. මවුපිය දෙදෙනානිසා හටගත්තේය.

ඔදනකුම්මාසූපචයො අනිච්චුච්ඡාදන පරිමද්දන භෙදන විද්ධංසනධම්මො. ඉදඤ්ච පන මෙ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධං යම්පි මාණව භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මණියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ඤාණදස්සනාය චිත්තං අභිනිහරති අභිනින්නාමෙති සො එවංජානාති අයං ඛො මෙ කායො රූපී චාතුම්මහාභූතිකො මාතාපෙත්තිකසම්භවො ඔදනකුම්මාසූපචයො අනිච්චුච්ඡාදන පරිමද්දන භෙදන විද්ධංසනධම්මො ඉදඤ්ච පන මෙ විඤ්ඤාණං එත්ථසිතං එත්ථපටිබද්ධන්ති. ඉදම්පිස්ස හොති පඤ්ඤාය.

27. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මණියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ මනොමයාභිනිම්මාණාය චිත්තං අභිනිහරති අභිනින්නාමෙති සො ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිණාති රූපිං මනොමයං සබ්බඞ්ගපච්චඞ්ගිං.

බත් හා කොමු ආදියෙන් වැඩුනේය. අනිත්‍ය භාවය. ඉලීමය, පිරිමැදීමය, බිඳීමය, විසිරීමය, යන මේ ස්වභාවකොට ඇත්තේය. මාගේ මේ විඥානයවනාහි ශරීරය නිශ්‍රිතවූයේ වෙයි. මේ කයපිළිබඳවූයේයයි කියාය. මාණවකය, යම් හෙයකින් භික්ෂුතෙම සිතඑකඟවූකල්හි පිරිසිදුවූකල්හි බබලනකල්හි කෙලෙස් රහිතවූ කල්හි පහවූ උපක්ලෙශයන් ඇතිකල්හි මෘදුවූකල්හි කර්මක්ෂමව සිටිකල්හි නිශ්චලභාවයට පැමිණිකල්හි විදර්ශනඥානය නිපදවීමපිණිස සිතඑලවාද. විශෙෂයෙන් සිතනැම්ම කෙරේද. ඒ භික්ෂුතෙම මෙසේ දනගණියි. මාගේ මේශරීරයතෙමආකාරඇත්තේවෙයි, සතරමහාභූතයන් ගෙන්හටගත්තේය. මවුපියදෙදෙනානිසා හටගත්තේය. බතින්හාකොමු ආදියෙන් වැඩුනේය, අනිත්‍ය භාවයද, ඉලීමද, පිරිමැදීමද, බිඳීමය, විසිරීමය, යන මේස්වභාවකොට ඇත්තේය. මාගේ මේ විඥානය වනාහි මේ ශරීරය නිශ්‍රිතවූයේ වෙයි. මේකය පිළිබඳවූයේ යයි කියාය මේද ඒ මහණහුගේ ප්‍රඥාව වෙයි.

27. ඒ භික්ෂුතෙම මෙසේ සිතඑකඟවූකල්හි පිරිසිදුවූකල්හි බබලනකල්හි කෙලෙස්රහිතකල්හි පහවූ උපක්ලෙශයන්ඇතිකල්හි මෘදුවූකල්හි කර්මක්ෂමවසිටිකල්හි නිශ්චලභාවයට පැමිණිකල්හි මනොමයකයක් මැවීමපිණිස සිතඑලවාතබයි විශෙෂයෙන් සිතනැම්ම කෙරෙයි. ඒ භික්ෂුතෙම මේ ප්‍රත්‍යක්ෂබැවින් ඉමම්හායි කියනලද භික්ෂුහුගේකරජකායයෙන් සෘද්ධිමයරූපවත්බැවින් රූපීවූ අභිඥ මනසින් නිපදවනලද බැවින් මනොමයවූ සියලු අඞ්ගප්‍රත්‍යඞ්ගවත්වූ.

අභිනිප්ඵුප්‍රියං. සෙය්‍යථාපි මාණව පුරිසො මුඤ්ජම්හා ඉසිකං පවාහෙය්‍ය. තස්ස එවමස්ස අයං මුඤ්ජො අයං ඉසිකා අඤ්ඤො මුඤ්ජො අඤ්ඤා ඉසිකා මුඤ්ජම්හාත්වෙව ඉසිකා පවාළ්හාති, සෙය්‍යථාපි මාණව පුරිසො අසිං කොසියා පවාහෙය්‍ය. තස්ස එවමස්ස අයං අසි අයං කොසි අඤ්ඤො අසි අඤ්ඤා කොසි කොසියාත්වෙව අසි පවාළ්හොති, සෙය්‍යථාපි මාණව පුරිසො අහිං කරණ්ඩා උද්ධරෙය්‍ය තස්ස එවමස්ස අයං අහි අයං කරණ්ඩො අඤ්ඤො අහි අඤ්ඤො කරණ්ඩො කරණ්ඩාත්වෙව අහි උබ්භතොති. එවමෙවඛො මාණව භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මණියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ මනොමයාභිනිම්මාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති සො ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිණාති රූපිං මනොමයං සබ්බඞ්ගපච්චඞ්ගිං අහීනින්ද්‍රියං. ඉදම්පිස්ස හොති පඤ්ඤාය.

28. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මණියෙ ඨිතෙ.

සවහන් වශයෙන් විකලනොවූ ඉන්ද්‍රියඇති අන් මනොමය කයක් නිර්මිතකෙරෙයි. මාණවකය, යම්සේපුරුෂයෙක්මුදුතණින්ඉසිකාවක්සම්පාදනයකරන්නේද මේමුදුතණය, මේ ඉෂිකාවය, මුදුතණ අනිකෙක, ඉෂිකාව අනිකෙක, මුදුතණින් ඉෂිකාව සම්පාදනයකරණලද්දියයි ඕහට මෙබඳු සිතෙක් වන්නේද. මාණවකය, පුරුෂයෙක් කඩු කොපුවෙන් කඩුව යම්සේ අදනේද, එකල ඕහට මෙබඳු සිතෙක් ඇතිවන්නේය. මේ කඩුවය, මේ කඩු කොපුවය, කඩුව අනිකෙක, කඩු කොපුව අනිකෙක, කඩු කොපුවෙන් කඩුව නගනලද්දේය කියාය. මාණවකය, යම්සේ පුරුෂයෙක් සපියකු සැවයෙන් නගන්නේද එකල ඕහට මෙබඳු සිතෙක් වන්නේය. මේ සපියාය, මේ සපි සැවය, සපියා අනිකෙක, සපි සැවය අනිකෙකි, සැවයකෙරෙන් සපි තෙම නගනලද්දේය කියාය. මාණවකය, එපරිද්දෙන්ම භික්ෂුතෙම මෙසේ සිතඑකඟවූකල්හි පිරිසිදුවූකල්හි බබලනකල්හි කෙලෙස්රහිතවූකල්හි පහවූ උපක්ලෙශයන්ඇතිකල්හි මෘදුවූකල්හි කර්මක්‍ෂමව සිටිකල්හි නිශ්චලභාවයට පැමිණිකල්හි මනොමයකයක් අභිනිර්මාණයකිරීමපිණිස සිත එලවයි. විශෙෂයෙන් සිතනැම්ම කෙරෙයි. ඒ භික්ෂුතෙම රූපිවූ මනොමයවූ සියලු අඞ්ගප්‍රත්‍යඞ්ගවත්වූ පිහිටීම් වශයෙන් විකලනොවූ ඉන්ද්‍රියයන්ඇති අන් මනොමයකයක් නිර්මිත කෙරෙයි. මේද ඒ මහණහුගේ ප්‍රඥාව වේ.

28. ඒ භික්ෂුතෙම මෙසේ සිත එකඟවූකල්හි පිරිසිදුවූකල්හි බබලනකල්හි කෙලෙස්රහිතකල්හි පහවූ උපක්ලෙශයන්ඇතිකල්හි මෘදුවූකල්හි කර්මක්‍ෂමවසිටිකල්හි.

ආනෙඤ්ජප්පත්තෙඉද්ධිවිධාය චිත්තං අභිනීහරතිඅභිනින්නාමෙති. සො අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති එකොපි හුත්වා බහුධා හොති බහුධාපි හුත්වා එකොහොති ආවිභාවංතිරොභාවංතිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡති, සෙය්‍යථාපි ආකාසෙ පඨවියාපි උම්මුජ්ජනිමුජ්ජං කරොති, සෙය්‍යථාපි උදකෙ උදකෙපි අභෙජ්ජමානො ගච්ඡති, සෙය්‍යථාපි පඨවියං ආකාසෙපි පල්ලඞ්කෙන කමති, සෙය්‍යථාපි පක්ඛීසකුණො ඉමෙපි චන්දිමසුරියෙ එවං මහිද්ධිකෙ එවං මහානුභාවෙ පාණිනා පරිමසති පරිමජ්ජති යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති.

29. සෙය්‍යථාපි මාණව දක්ඛො කුම්භකාරො වා කුම්භකාරන්තෙවාසී වා සුපරිකම්මකතාය මත්තිකාය යං යදෙව භාජනවිකතිං ආකඞ්ඛෙය්‍ය.

නිශ්චලභාවයට පැමිණිකල්හි ඍද්ධිවිධඥානයපිණිස සිත එළවයි. වෙසෙසින් සිත නැම්ම කෙරෙයි. මෙසේ කරණලද චිත්තාභිනීහාර ඇති ඒ භික්ෂුතෙම අනෙකවිධවූ ඍද්ධිකොඨාසය වලඳයි, ඍද්ධිකරණයෙන් පූර්වයෙහිම ප්‍රකෘතියෙන් එකෙක්ව් බොහෝ දෙනාගේ සමීපයෙහි සක්මන්කරණු කැමැත්තේ හෝ සජ්ඣායනාකරණුකැමැත්තේ හෝ ප්‍රශ්න හෝ විචාරණු කැමැත්තෙක්මව් සියයක්හුදු දහසක්හුදු වෙයි. බොහෝ පරිද්දෙන්වී නැවත එකෙක්වෙමියි කැමතිවන්නහුවිසින් පාදකධ්‍යානයට සම වැදී එයින් නැගිට එකෙක්වෙම්යි පරිකර්මකොට නැවත සමවැදී නැගිට එකෙක්වෙම්යි අධිෂ්ඨානකිරීමෙන් අධිෂ්ඨානසිත සමඟම එකෙක් වෙයි. ප්‍රකට ප්‍රාතිහාර්‍ය්‍යයද, අප්‍රකට ප්‍රාතිහාර්‍ය්‍යයද කෙරෙයි. ගෘහභිත්තිහුගේ පරභාගයටද, ගෘහවිහාරග්‍රාමාදීන් වටකොට බඳනාලද ප්‍රාකාරයන්ගේ පරභාගයටද, පාංශුපර්වත හෝ පාෂාණපර්වතයන්ගේ පරභාගයටද අහසෙහි මෙන් අලග්නව යෙයි. දියෙහි මෙන් පොළවෙහිද ගැලීම හා නැගීමද කෙරෙයි. පොළවෙහි මෙන් දියෙහිද නොගැලී ගමන්කෙරෙයි. පියාපත් ඇත්තාවූ පක්ෂියෙක් අහසපියාඹන්නේ යම්සේද එපරිද්දෙන්ම අහස හාත්පසින් ඌරුබද්ධාසනයෙන් ගමන්කෙරෙයි. දෙසාළිස්දහසක් යොදුන්මත්තෙහි හැසිරෙණහෙයින් ප්‍රසිද්ධ මහත් ඍද්ධිඇත්තාවූ තුන්දිව එකවිට ආලොකකරණහෙයින් ප්‍රසිද්ධ මහානුභාව ඇත්තාවූ මේ චන්ද්‍රසූර්‍ය්‍යයන්ද අතින් පිරිමදියි. හාත්පසින් ආදාස තලයක් මෙන් පිරිමදියි. බ්‍රහ්මලොක සීමාකොට තමාගේ වශයෙහි පවත්වයි.

29. මාණවකය, යම්සේ කුම්භකාරයෙක් හෝ කුම්භකාරයකුගේ අතවැස්සෙක් හෝ මනාකොට පිළියෙළකරණලද මැටියෙන් යම් භාජනවිකෘතියක් කැමතිවන්නේ නම්.

තං තදෙවකරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය. සෙය්‍යථාපිවාපන මාණව දක්ඛො දන්තකාරොවා දන්තකාරන්තෙවාසීවා සුපරිකම්මකතස්මිං දන්තස්මිං යඤ්ඤදෙව දන්තවිකතිං ආකංඛෙය්‍ය තං තදෙව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය. සෙය්‍යථාපිවාපන මාණව දක්ඛො සුවණ්ණකාරොවා සුවණ්ණකාරන්තෙවාසීවා සුපරිකම්මකතස්මිං සුවණ්ණස්මිං යඤ්ඤදෙව සුවණ්ණවිකතිං ආකංඛෙය්‍ය තං තදෙව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය, එවමෙවඛො මාණව භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මණියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ඉද්ධිවිධාය චිත්තං අභිනිහරති අභිනින්නාමෙති සො අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති එකොපි හුත්වා බහුධාහොති බහුධාපි හුත්වා එකො හොති.

ඒ ඒ භාජන විකෘතියම කරන්නේද, නිපදවන්නේද. මාණවකය, යම්සේ දක්‍ෂවූ දන්තකාරයෙක් හෝ දන්තකාරයකුගේ අතවැස්සෙක් හෝ මනාකොට පිළියෙළකරණලද දන්තයෙක්හි යම් යම් දන්තවිකෘතියක් සම්පාදනය කිරිමට කැමතිවන්නේනම් ඒ ඒ දන්තවිකෘතියම කරන්නේද. මාණවකය, යම්සේ දක්‍ෂවූ රන්කරුවෙක් හෝ රන්කරුවකුගේ අතවැස්සෙක් හෝ මනාකොට පිළියෙළකරණලද සුවර්ණයෙක්හි යම් යම් රන්වෙසෙසක් සම්පාදනයකිරීමට කැමතිවන්නේනම් ඒ ඒ සුවර්ණවිකෘතියම කරන්නේද. නිපදවන්නේද. මාණවකය, එපරිද්දෙන්ම භික්‍ෂුතෙම සිතඑකඟවූකල්හි පිරිසිදුවූකල්හි බබලනකල්හි කෙලෙස්රහිතකල්හි පහවූ උපක්ලෙශයන්ඇතිකල්හි මෘදුවූකල්හි කර්‍මක්‍ෂමවසිටිකල්හි නිශ්චලභාවයට පැමිණිකල්හි ඍද්ධිවිධඥානය පිණිස සිතඑළවයි. වෙසෙසින් සිතනැම්මකෙරෙයි. මෙසේකරණලද චිත්තාභිනිහාරඇති ඒ භික්‍ෂුතෙම අනෙකවිධවූ ඍද්ධිකොට්ඨාසය වලඳයි. ඍද්ධිකරණයෙන් පූර්‍වයෙහිම ප්‍රකෘතියෙන් එකෙක්වී බොහෝ දෙනාගේ සමීපයෙහි සක්මන්කරණු කැමැත්තේ හෝ සජ්ඣායනා කරණු කැමැත්තේ හෝ ප්‍රශ්න හෝ විචාරණු කැමැත්තෙක්මවී සියයකුදු දහසකුදු වෙයි. බොහෝපරිද්දෙන්වී නැවත එකෙක් වෙමියි කැමතිවන්නහුවිසින් පාදකධ්‍යානයට සමවැදී එයින් නැගිට එකෙක්වෙමියි පරිකර්‍මකොට නැවත සමවැදී නැගිට එකෙක් වෙමියි අධිෂ්ඨානකිරීමෙන් අධිෂ්ඨාන සිත හා සමගම එකෙක් වෙයි.

ආවිභාවං තිරොභාවං තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අස
ජ්ජමානො ගච්ඡති. සෙය්‍යථාපි ආකාසෙ පඨවියාපි උම්මුජ්ජනිමුජ්ජං ක
රොති සෙය්‍යථාපි උදකෙ උදකෙපි අභෙජ්ජමානො ගච්ඡති සෙය්‍යථාපි
පඨවියා ආකාසෙපි පල්ලඞ්කෙන කමති, සෙය්‍යථාපි පක්ඛිසකුණො
ඉමෙපි චන්දිමසුරියෙ එවං මහිද්ධිකෙ එවං මහානුභාවෙ පාණිනා පරි
මසති පරිමජ්ජති යාවබ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති ඉදම්
පිස්ස හොති පඤ්ඤාය.

30. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ග
ණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්ප
ත්තෙ දිබ්බාය සොතධාතුයා චිත්තං අභිනීහරති අභිනින්නාමෙති
සො දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය උභො
සද්දෙ සුණාති දිබ්බෙ ච මානුසෙ ච යෙ දූරෙ සන්තිකෙ ච.

ප්‍රකට ප්‍රාතිහාර්‍ය්‍යයද අප්‍රකටප්‍රාතිහාර්‍ය්‍යයද කෙරෙයි. ගෘහභිත්තීහුගේ
පරභාගයටද, ගෘහවිහාරග්‍රාමාදීන් වටකොට බඳනාලද ප්‍රාකාර
යන්ගේ පරභාගයටද, පාංශුපර්වත හෝ පාෂාණපර්වතයන්ගේ පර
භාගයටද, අහසෙහි මෙන් අලග්නව යෙයි. දියෙහි මෙන් පොළො
වෙහිද, ගැලීම හා නැගීමද කෙරෙයි. පොළොවෙහි මෙන් දියෙහිද
නොගැලී ගමන්කෙරෙයි. පියාපත්ඇත්තාවූ පක්ෂියෙක් අහස
පියාඹන්නේ යම්සේද, එපරිද්දෙන්ම අහස්හි හාත්පසින් ඌරු
බද්ධාසනයෙන් ගමන්කෙරෙයි. දෙසාළිස්දහසක් යොදුන්මත්
තෙහි හැසිරෙණහෙයින් ප්‍රසිද්ධ මහත් ඍද්ධිඇත්තාවූ තුන්දිව එක
විට ආලොකකරණහෙයින් ප්‍රසිද්ධ මහානුභාව ඇත්තාවූ මේ චන්ද්‍ර
සූර්‍ය්‍යයන්ද අතින් පිරිමදියි. හාත්පසින් ආදාස තලයක් මෙන් පිරි
මදියි. බ්‍රහ්මලොකය සීමාකොට තමාගේ වශයෙහි පවත්වයි. මේද
ඒ මහණහුගේ ප්‍රඥාව වෙයි.

30. ලබනලද චතුර්ථධ්‍යාන ඇති ඒ භික්ෂුතෙම මෙසේ සිත එකඟවූ
කල්හි පිරිසිදුවූකල්හි, බබලනකල්හි, කෙලෙස්රහිත කල්හි පහවූ
උපක්ලෙශයන්ඇතිකල්හි මෘදුවූකල්හි කර්‍මක්ෂමවසිටිකල්හි නිශ්චල
භාවයට පැමිණිකල්හි දිව්‍යශ්‍රොත්‍රධාතුලාභයපිණිස සිත එළවයි.
වෙසෙසින් සිතනැම්ම කෙරෙයි. මෙසේ කරණලද චිත්තාභිනිහාර
ඇති ඒ භික්ෂුතෙම පිරිසිදුවූ මනුෂ්‍යොපචාරය ඉක්මවා ශබ්දශ්‍රව
ණයකරණහෙයින් මානුසිකමාංසශ්‍රොත්‍ර ධාතුව ඉක්මපැවැත්තාවූ
දිව්‍යශ්‍රොත්‍ර ධාතුවෙන් දෙවියන්ගේද, මිනිසුන්ගේද, ශබ්දද පරසක්
වළ පවත්නා දුරවූ ශබ්දයන් හා යටත්පිරිසෙයින් සියසිරුර ඇසුරු
කළ පණුවන් පවත්වන සම්පශබ්දයන්ද ශ්‍රවණය කෙරෙයි.

සෙය්‍යථාපි මාණවපුරිසො අද්ධානමග්ග පටිපන්නො සො සුණෙය්‍ය භෙරිසද්දම්පි මුතිඞ්ග සද්දම්පි සඞ්ඛපණවදෙණ්ඩිමසද්දම්පි. තස්ස එවමස්ස භෙරිසද්දො ඉතිපි මුතිඞ්ගසද්දො ඉතිපි සඞ්ඛපණවදෙණ්ඩිමසද්දො ඉතිපීති. එවමෙව ඛො මාණව භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මණියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ දිබ්බාය සොතධාතුයා චිත්තං අභිනීහරති අභිනින්නාමෙති සො දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය උභො සද්දෙ සුණාති දිබ්බෙ ච මානුසෙ ච යෙ දූරෙ සන්තිකෙ ච. ඉදම්පිස්ස හොති පඤ්ඤාය.

31. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මණියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ චෙතොපරියඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති සො

මාණවකය, යම්සේ පුරුෂයෙක් දීර්ඝමාර්ගයකට පිළිපන්නේ වේද, ඒ පුරුෂතෙම බෙරහඬක්ද, මිහිඟු බෙරහඬක්ද, සඞ්ඛය, පණාබෙරය, ඉකිළිබෙරය යන මොවුන්ගේ හඬක්ද, අසන්නේද එකල ඔහට මෙබඳු සිතෙක් වන්නේය. මේ බෙරහඬය, මේ සක්ය, පණාබෙරය, ඉකිළිබෙරය යන මොවුන්ගේ හඬය කියාය. මාණවකය, එපරිද්දෙන්ම භික්ෂුතෙම සිතඑකඟවූකල්හි පිරිසිදුවූකල්හි බබලනකල්හි කෙලෙස්රහිතවූකල්හි පහවූ උපක්ලෙශයන්ඇතිකල්හි මෘදුවූකල්හි කර්මක්ෂමවසිටිකල්හි නිශ්චලභාවයට පැමිණිකල්හි දිව්‍යශ්‍රොත්‍රධාතුලාභයපිණිස සිත එළවයි. වෙසෙසින් සිතනැමීමකෙරෙයි. මෙසේ කරණලද චිත්තාභිනිහාරඇති ඒ භික්ෂුතෙම පිරිසිදුවූ මනුෂ්‍යොපචාරය ඉක්මවා ශබ්දශ්‍රවණයකරණහෙයින් මානුසික මාංශශොත්‍ර ධාතුව ඉක්මපැවැත්තාවූ දිව්‍යශ්‍රොත්‍ර ධාතුවෙන් දෙවියන්ගේ හා මිනිසුන්ගේ ශබ්දද පරසක්වල පවත්නා දුරවූ ශබ්දයන් හා යටත්පිරිසෙයින් සිය සිරුර ඇසුරුකළ පණුවන් පවත්වන සමීප ශබ්දයන්ද ශ්‍රවණයකෙරෙයි. මේද ඒ මහණහුගේ ප්‍රඥාව වෙයි.

31. චතුර්ථධ්‍යානලාභී ඒ භික්ෂුතෙම මෙසේ සිත එකඟවූකල්හි පිරිසිදුවූකල්හි බබලනකල්හි කෙලෙස්රහිතකල්හි පහවූ උපක්ලෙශයන් ඇති කල්හි මෘදුවූ කල්හි කර්මක්ෂමවූකල්හි නිශ්චල භාවයට පැමිණි කල්හි චෙතොපරිය ඥාණය සඳහා සිත එළවයි. වෙසෙසින් සිත නැමීම කෙරෙයි. ඒ ධ්‍යානලාභී භික්ෂුතෙම.

පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච ජානාති සරාගංවා චිත්තං සරාගං චිත්තන්ති පජානාති වීතරාගංවා චිත්තං වීතරාගං චිත්තන්ති පජානාති සදොසං වා චිත්තං සදොසං චිත්තන්ති පජානාති වීතදොසංවා චිත්තං වීතදොසං චිත්තන්ති පජානාති සමොහං වා චිත්තං සමොහං චිත්තන්ති පජානාති වීතමොහං වා චිත්තං වීතමොහං චිත්තන්ති පජානාති සඞ්ඛිත්තං වා චිත්තං සඞ්ඛිත්තං චිත්තන්ති පජානාති වික්ඛිත්තං වා චිත්තං වික්ඛිත්තං චිත්තන්ති පජානාති මහග්ගතං වා චිත්තං මහග්ගතං චිත්තන්ති පජානාති අමහග්ගතං වා චිත්තං අමහග්ගතං චිත්තන්ති පජානාති ස උත්තරං වා චිත්තං ස උත්තරං චිත්තන්ති පජානාති අනුත්තරං වා චිත්තං අනුත්තරං චිත්තන්ති පජානාති සමාහිතං වා චිත්තං සමාහිතං චිත්තන්ති පජානාති අසමාහිතං වා චිත්තං අසමාහිතං චිත්තන්ති පජානාති විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානාති.

තමන්හැර අවශෙෂ සත්වයන් ගේද, අන්‍ය පුද්ගලයන්ගේද, සිත තමාගේ සිතෙන් පිරිසිඳ රාගාදීන්ගේ වශයෙන් හා නානාප්‍රකාර යෙන් දනිති. අටවැදෑරුම්වූ ලොභ සහගත චිත්තය හෝ අටවැදෑරුම් ලොභය හා එක්වපැවති සිතයයි දන්නේය. ලෞකික කුශලප්‍රකාශ චිත්තයයි කියනලද පහවූ රාගඇති සිත හෝ පහවූ රාගඇති සිත යයි දන්නේය. දෙවැදෑරුම්වූ දෞම්නස් සහගතසිත දෞම්නස් සහගතසිතයයි දන්නේය. ලෞකික කුසල ප්‍රකාශ චිත්තය හෝ ලෞකික කුශලප්‍රකාශ චිත්තයයි දන්නේය. විචිකිච්ඡාව හා උද්ධච්චය සමග පැවති අකුශල චිත්තය හො විචිකිච්ඡාව හා උද්ධච්චය සහගතවූසිතයයි දන්නේය. ලෞකික කුශලප්‍රකාශ චිත්තය හෝ ලෞකික කුශලප්‍රකාශචිත්තයයි දන්නේය. ථිනමිද්ධය හා අනුව පැවති චිත්තය හෝ ථින මිද්ධය හා අනුවපැවති සිතයයි දන්නේය. උද්ධච්චය හා සමග පැවති වික්ෂිප්ත සිත හෝ උද්ධච්චය හා සමග පැවති සිත යයි දන්නේය. රූපාවචර අරූපාවචර සිත හෝ රූපාවචර අරූපාවචර බ්‍රහ්මලොකවල පැවති සිතයයි දන්නේය. කාමාවචර චිත්තය හෝ කාමවචර ලොකයෙහි පැවති සිතයයි දන්නේය. කාමාවචර සිත හෝ කාමවචරලොකයෙහි පැවති සිතයයි දන්නේය. රූපාවචර අරූපාවාචරචිත්තය හෝ රූපාවචර අරූපාවචර සිතයයි දන්නේය. අර්පණාසමාධි උපචාර සමාධිස හිතවූ සිත හෝ අර්පණාසමාධි උපචාර සමාධිසහිත සිතයයි දන්නේය. අර්පණා උපචාර යන උභය සමාධියෙන් තොරවූ සිත හෝ උභය සමාධියෙන් තොරවූ සිතයයි දන්නේය. තදඞ්ගවිෂ්කම්භණවිමුක්තිවයෙන් මිදුනාවූ සිත හෝ තදඞ්ගවිෂ්කම්භණ විමුක්තිවශෙන් මිදුනාවූ සිතයයි දන්නේය.

අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති. සෙය්‍යථාපි මාණව ඉත්ථී වා පුරිසො වා දහරො වා යුවා වා මණ්ඩනජාතිකො ආදාසෙ වා පරිසුද්ධෙ පරියොදාතෙ අච්ඡෙ වා උදපත්තෙ සකං මුඛනිමිත්තං පච්චවෙක්ඛමානො සකනිකං වා සකනිකන්ති ජානෙය්‍ය අකනිකං වා අකනිකන්ති ජානෙය්‍ය.

32. එවමෙව ඛො මාණව භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මණියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ චෙතොපරියඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානාති සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති වීතරාගං වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානාති සදොසං වා චිත්තං සදොසං චිත්තන්ති පජානාති වීතදොසං වා චිත්තං වීතදොසං චිත්තන්ති පජානාති සමොහං වා චිත්තං සමොහං චිත්තන්ති පජානාති.

තදඞ්ගවිෂ්කම්භණ උභය විමුක්තියෙන් යුක්තනොවූ චිත්තය හෝ ක්ලෙශයන් හා එක්ව පවත්නා සිතයයි දන්නේය. මාණවකය, සැරසීම් ස්වභාවකොට ඇත්තාවූ ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ තරුණයෙක් හෝ යෞවනයෙන් යුක්තවූවෙක් හෝ පිරිසිදුවූ බබලන්නාවූ කැඩපතක හෝ නිර්මලවූ ජලභාජනයක හෝ තමාගේ මුහුණ බලන්නේ තලකැලල් ආදියෙන් දූෂ්‍යවූ මුහුණ හෝ තලකැලල් ආදියෙන් දූෂ්‍යවූ මුහුණයයි යම්සේ දැනගන්නේද. තලකැලල් රහිතවූ මුහුණ හෝ තලකැලල් රහිත මුහුණයයි යම්සේ දැනගන්නේද.

32. මාණවකය, එපරිද්දෙන්ම ධ්‍යානලාභිවූ ඒ භික්ෂුතෙම මෙසේ සිතඑකඟවූකල්හි පිරිසිදුවූකල්හි බබලනකල්හි කෙලෙස්රහිතකල්හි පහවූ උපක්ලෙශයන්ඇතිකල්හි මෘදුවූකල්හි කර්මක්ෂමවූකල්හි නිශ්චලභාවයට පැමිණිකල්හි චෙතොපරියඤාණය සඳහා සිත එළවයි. වෙසෙසින් සිත නැමීම කෙරෙයි. චෙතොපරියඤාණලාභී ඒ භික්ෂුතෙම තමත් හැර අවශෙෂ සත්වයන්ගේද, අන්‍යපුද්ගලයන්ගේද, සිත තමාගේ සිතින් පිරිසිඳ රාගාදීන්ගේ වශයෙන් හා නානාප්‍රකාර වශයෙන්ද,වෙසෙසින් දනියි. මේ අටවැදෑරුම්වූ ලොභසහගත සිත හෝ අටවැදෑරුම් ලොභය හා එක්ව පැවති සිතයයි දන්නේය. මේ ලෞකික කුශලප්‍රකාශ චිත්තයයි කියනලද පහවූ රාගඇති සිත හෝ පහවූ රාගඇති සිතයයි දන්නේය.මේ දෙවැදෑරුම් දෞර්මනස් සහගත සිත හෝ මේ දෙවැදෑරුම් දෞර්මනස්සහගත සිතයයි දන්නේය. මේ ලෞකිකකුශලප්‍රකාශ චිත්තය හෝ ලෞකිකකුශලප්‍රකාශ චිත්තයයි දන්නේය. මේ විචිකිච්ඡාව හා උද්ධච්චය සමග පැවති අකුශල චිත්තය හෝ විචිකිච්ඡාව හා උද්ධච්චය සහගතවූ සිතයයි දන්නේය.

වීතමොහං වා චිත්තං වීතමොහං චිත්තන්ති පජානාති සඞ්ඛිත්තං වා චිත්තං සඞ්ඛිත්තං චිත්තන්ති පජානාති විකඛිත්තං වා චිත්තං වික්ඛිත්තං චිත්තන්ති පජානාති මහග්ගතං වා චිත්තං මහග්ගතං චිත්තන්ති පජානාති අමහග්ගතං වා චිත්තං අමහග්ගතං චිත්තන්ති පජානාති ස උත්තරං වා චිත්තං ස උත්තරං චිත්තන්ති පජානාති අනුත්තරං වා චිත්තං අනුත්තරං චිත්තන්ති පජානාති සමාහිතං වා චිත්තං සමාහිතං චිත්තන්ති පජානාති අසමාහිතං වා චිත්තං අසමාහිතං චිත්තන්ති පජානාති විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානාති අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති. ඉදම්පිස්ස හොති පඤ්ඤාය.

33. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මණියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ පුබ්බෙනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති.

මේ ලෞකිකකුශලප්‍රකාශ චිත්තය හෝ ලෞකිකකුශලප්‍රකාශ චිත්තයයි දන්නේය. මේ ථිනමිද්ධය හා අනුව පැවති චිත්තය හෝ ථිනමිද්ධය හා අනුව පැවති සිතයයි දන්නේය. මේ උද්ධච්චය සමග පැවති වික්ෂිප්ත සිත හෝ උද්ධච්චය සමග පැවති සිතයයි දන්නේය. මේ රූපාවචර අරූපාවචර සිත හෝ රූපාවචර අරූපාවචර බ්‍රහ්මලොකවල පැවති සිතයයි දන්නේය. මේ කාමාවචර චිත්තය හෝ කාමාවචර ලොකයෙහි පැවති සිතයයි දන්නේය. මේ රූපාවචර අරූපාවචර චිත්තය හෝ රූපාවචර අරූපාවචර සිතයයි දන්නේය. මේ අර්පණසමාධි උපචාරසමාධි සහිතවූ සිත හෝ අර්පණසමාධි උපචාරසමාධි සහිත සිතයයි දන්නේය. මේ අර්පණ උපචාර යන උභයසමාධියෙන් තොරවූ සිත හෝ අර්පණ උපචාර යන උභයසමාධියෙන් තොරවූ සිතයයි දන්නේය. මේ තදඞ්ගවිෂ්කම්භණ විමුක්තිවශයෙන් යුක්තවූ සිත හෝ තදඞ්ගවිෂ්කම්භණ විමුක්තීන් මිදී සිටි සිතයයි දන්නේය. මේ තදඞ්ගවිෂ්කම්භණ විමුක්ති දෙකින් යුක්තනොවූ සිත හෝ ක්ලේශයන් හා එක්වපවත්නා සිතයයි දන්නේය. මේද ඒ මහණහුගේ ප්‍රඥාව වෙයි.

33. ඒ ධ්‍යානලාභී භික්ෂුතෙම මෙසේ සිත එකඟවූකල්හි පිරිසිදුවූකල්හි බබලනකල්හි කෙලෙස්රහිතවූකල්හි පහවූ උපක්ලේශයන් ඇතිකල්හි මෘදුවූකල්හි කර්මක්ෂමවූකල්හි නිශ්චලභාවයට පැමිණිකල්හි පෙරවිසූ කඳපිළිවෙළ දැනගන්නා නුවණලැබීමපිණිස සිත එළවයි. වෙසෙසින් සිතනැම්ම කෙරෙයි.

සො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සෙය්‍යථීදං, එකම්පි ජාතිං වෙපි ජාතියො තිස්සොපි ජාතියො චතස්සොපි ජාතියො පඤ්චපි ජාතියො දසපි ජාතියො වීසතිම්පි ජාතියො තිංසම්පි ජාතියො චත්තාළීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාතිසතම්පි ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි අනෙකෙපි සංවට්ටකප්පෙ අනෙකෙපි විවට්ටකප්පෙ අනෙකෙපි සංවට්ටවිවට්ටකප්පෙ අමුත්‍රාසිං එවංනාමො එවං ගොත්තො එවං වණ්ණො එවමාහාරො එවං සුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො සො තතො චුතො අමුත්‍ර උපපාදිං තත්‍රාපාසිං එවං නාමො එවං ගොත්තො එවං වණ්ණො එවමාහාරො එවං සුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො සො තතො චුතො ඉධූපපන්නොති ඉති සාකාරං සවුද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති.

ඒ භික්ෂුතෙම අනෙකප්‍රකාරයෙන් පවත්වනලද අනතුරු ඉක්මුණු භවය ආදිකොට ඇති ඒ ඒ ජාතිවල පැවති පරම්පරාව කඳපිළිවෙළින් හෝ චුතිප්‍රතිසන්ධි වශයෙන් සිහිකෙරෙයි. ඒ කෙසේද, එක්ප්‍රතිසන්ධියක් මුල්කොටඇති චුතිය කෙළවරකොටඇති එක්භවයකට ඇතුළත්වූ ස්කන්ධපරම්පරාවයයි කියනලද එක්ජාතියක්ද, ජාති දෙකක්ද, ජාතිතුණක්ද, ජාති සතරක්ද, ජාති පසක්ද, ජාති දසයක්ද, ජාති විස්සක්ද, ජාති තිසක්ද, ජාති සතළිසක්ද, ජාති පණසක්ද, ජාති සියයක්ද, ජාති දහසක්ද, ජාතිලක්ෂයක්ද, නොයෙක් පිරිහෙණ කල්පයන්ද, නොයෙක් සංවර්ත්ථායි කල්පයන්ද, නොයෙක් වැඩෙන කල්පයන්ද, නොයෙක් විවර්ත්ථායි කල්පයන්ද, නොයෙක් සංවර්තවිවර්ත කල්පයන්ද, සිහිකෙරෙයි. මම අසවල්තැන උපන්නෙමි, මෙබඳු නම් ඇත්තෙම් වීමි, මෙබඳු ගොත්‍ර ඇත්තෙම් වීමි, මෙබඳු ශරීරවර්ණ ඇත්තෙම් වීමි, මෙබඳු ආහාර ඇත්තෙම් වීමි, මෙබඳු සැපදුක් විඳීම ස්වභාවකොට ඇත්තෙම් වීමි, මෙබඳු සැපදුක් වින්දෙම් වීමි, මෙබඳු ආයුෂයක් කෙළවරකොට ඇත්තෙම් වීමි, ඒ මම එයින් චුතවූයෙම් අසවල්තැන උපන්නෙමි, එහිද මෙනම් ඇත්තෙමි, මෙබඳු ගොත්‍ර ඇත්තෙමි, මෙබඳු ශරීරවර්ණ ඇත්තෙමි, මෙබඳු ආහාර ඇත්තෙමි, මෙබඳු සැපදුක් වින්දෙම්ද වීමි, මෙබඳු ආයුෂ කෙළවරකොට ඇත්තෙම් වීමි, ඒ මම එයින් චුතවූයෙම් මේ ආත්මභාවයෙහි උපන්නෙමියි මෙසේ වර්ණාදිවශයෙන් ආකාරසහිතවූ නාමගොත්‍රවශයෙන් උද්දෙස සහිතවූ අනෙකප්‍රකාරයෙන් පවත්වනලද පූර්වෙනිවාසය සිහිකෙරෙයි.

සෙය්‍යථාපි මාණව පුරිසො සකම්හා ගාමා අඤ්ඤං ගාමං ගච්ඡෙය්‍ය තම්හාපි ගාමා අඤ්ඤං ගාමං ගච්ඡෙය්‍ය සො තම්හා ගාමා සකංයෙව ගාමං පච්චාගච්ඡෙය්‍ය, තස්ස එවමස්ස, අහං ඛො සකම්හා ගාමා අමුං ගාමං අගඤ්ඡිං තත්‍ර එවං අට්ඨාසිං එවං නිසීදිං එවං අභාසිං එවං තුණ්හී අහොසිං තම්හාපි ගාමා අමුංගාමං අගඤ්ඡිං තත්‍රාපි එවං අට්ඨාසිං එවං නිසීදිං එවං අභාසිං එවං තුණ්හී අහොසිං, සොම්හි තම්හා ගාමා සකංයෙව ගාමං පච්චාගතොති. එවමෙවඛො මාණව භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මණියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ පුබ්බෙනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනිහරති අභිනින්නාමෙති. සො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සෙය්‍යථිදං, එකම්පි ජාතිං ද්වෙපි ජාතියො තිස්සොපි ජාතියො චතස්සොපි ජාතියො පඤ්චපි ජාතියො දසපි ජාතියො වීසතිම්පි ජාතියො තිංසතිම්පි ජාතියො චත්තාළීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාතිසතම්පි ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි අනෙකෙපි සංවට්ටකප්පෙ අනෙකෙපි විවට්ටකප්පෙ අනෙකෙපි සංවට්ටවිවට්ටකප්පෙ.

මාණවකය, යම්සේ පුරුෂයෙක් සිය ගමින් අන් ගමකට යන්නේද, ඒ ගමින්ද අන් ගමකට යන්නේද, ඒ ගමින් සිය ගමටම නැවත එන්නේද, එකල ඔහට මෙබඳු සිතෙක් වන්නේය. මම වනාහි සිය ගමින් අසවල්ගමට ගියෙමි, එහි මෙසේ සිටියෙමි, මෙසේ උන්නෙමි, මෙසේ කථාකෙළෙම්, මෙසේ නිශ්ශබ්ද වීම්, ඒ ගමින්ද අසවල්ගමට ගියෙමි, එහිද මෙසේ සිටියෙමි, මෙසේ උන්නෙමි, මෙසේ කථා කෙළෙමි, මෙසේ නිශ්ශබ්ද වීමි, ඒ මම ඒ ගමින් සියගමටම නැවත ආයෙම් වෙමියි. මාණවකය, එපරිද්දෙන්ම භික්ෂුතෙම මෙසේ සිත එකඟවූකල්හි පිරිසිදුවූකල්හි බබලනකල්හි කෙලෙස්රහිතවූකල්හි පහවූ උපක්ලෙශයන්ඇතිකල්හි මෘදුවූකල්හි කර්මක්ෂමවූකල්හි නිශ්චලභාවයට පැමිණිකල්හි පෙරවිසූ කඳපිළිවෙළ දැනගන්නා නුවණලැබීමපිණිස සිත එළවයි. වෙසෙසින් සිතනැමීමද කෙරෙයි. ඒ පූර්වේනිවාසඥානලාභී භික්ෂුතෙම අනෙකප්‍රකාරයෙන් පවත්වනලද පූර්වේනිවාසය සිහිකෙරෙයි. ඒ කෙසේද? එක් ජාතියක්ද, ජාති දෙකක්ද, ජාති තුණක්ද, ජාති සතරක්ද, ජාති පසක්ද, ජාති දසයක්ද, ජාති විස්සක්ද, ජාති තිසක්ද, ජාති සතළිසක්ද, ජාති පණසක්ද, ජාති සියයක්ද. ජාති දහසක්ද, ජාති ලක්ෂයක්ද, නොයෙක් පිරිහෙණ කල්පයන්ද, නොයෙක් සංවට්ටඨායී කල්පයන්ද, නොයෙක් වැඩෙන කල්පයන්ද, නොයෙක් විවට්ටඨායී කල්පයන්ද, නොයෙක් සංවතීවිවතීකල්පයන්ද, සිහිකෙරෙයි.

අමුත්‍රාසිං එවං නාමො එවං ගොත්තො එවං වණ්ණො එවමාහාරො එවං සුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො සො තතො චුතො ඉධූපපන්නොති.ඉතිසාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති, ඉදම්පිස්ස හොති පඤ්ඤාය.

34. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මණියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නා මෙති. සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති.

මම අසවල්තැන උපන්නෙම්, මෙබඳු නම් ඇත්තෙම් වීම්, මෙබඳු ගොත් ඇත්තෙම් වීම්,මෙබඳු ශරීරවර්ණ ඇත්තෙම් වීම්,මෙබඳු ආහාර ඇත්තෙම් වීම්,මෙබඳු සැපදුක්විඳින සුලුවූයෙම් වීම්,මෙබඳු ආයුෂයක් කෙළවරකොට ඇත්තෙම් විම්, ඒ මම එයින් චුතවූයෙම් අසවල් තැන උපන්නෙමි, එහිද මෙනම් ඇත්තෙම් වීම්, මෙබඳු ගොත් ඇත් තෙම් වීම්,මෙබඳු ශරීරවර්ණ ඇත්තෙම් විම්, මෙබඳු ආහාර ඇත්තෙම් විම්, මෙබඳු සැපදුක් වින්දෙම් වීම්, මෙබඳු ආයුෂකෙළවරකොට ඇත් තෙම් වීම්, ඒ මම එයින් චුතවූයෙම් මේ ආත්මභාවයෙහි උපන්නෙ මියි මෙසේ වර්ණාදිවශයෙන් ආකාරසහිතවූ නාමගොත්‍රවශයෙන් උද් දෙස සහිතවූ අනෙකප්‍රකාරයෙන් පවත්වනලද පූර්වේනිවාසය සිහි කෙරෙයි. මේද ඒ මහණහුගේ ප්‍රඥාව වෙයි.

34. ඒ භික්‍ෂුතෙම මෙසේ ධ්‍යානයෙන් සිත එකඟවූකල්හි පිරිසිදුවූ කල්හි බබලනකල්හි කෙලෙස්රහිතකල්හි පහවූ උපක්ලෙශයන්ඇති කල්හි මෘදුවූකල්හි කර්‍මක්‍ෂමවූකල්හි නිශ්චලභාවයට පැමිණිකල්හි සත්වයන්ගේ චුතිඋත්පත්තිය දැනගන්නා දිව්‍යඥනලාභයපිණිස පරිකර්‍මචිත්තය එළවයි. වෙසෙසින් නැම්ම කෙරෙයි. කරණලද චිත් තාභිනිහාරඇති ඒ භික්‍ෂුතෙම පිරිසිදුවූ මනුෂ්‍ය ඇස ඉක්මපවත්නාවූ දිවැසින් චුතවන්නාවූද, උපදින්නාවූද, සත්වයන් දකියි. මොහ යෙන් යුක්තබැවින් හීනවූ ජාතිකුලභොගාදීන්ගේවශයෙන් අවඥ කරණලද සත්වයන්ද, අමොහයෙන් යුක්තබැවින් ගණනොකරණ ලද උතුම් සත්වයන්ද,ක්‍රොධරහිතබැවින් සුන්දරවර්ණඇති සත්වයන්ද, ක්‍රොධයෙන්යුක්තබැවින් දුර්වර්ණ සත්වයන්ද, අලොභයෙන්යුක්ත බැවින් ආඪ්‍යවූ මහඩනඇති මනාගතිඇති සත්වයන්ද, ලොභයෙන් යුක්තබැවින් දිළිඳුවූ සවල්පආහාරපානවගීඇති දුගතියටපැමිණි සත්වයන්ද, රැස්කරණලද කර්‍මයවූ පරිද්දෙන් සුගතියට හා දුගතියට පැමිණි සත්වයන්ද, ප්‍රකාරයෙන් දනියි.

ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නාති. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති. සෙය්‍යථාපි මාණව මජ්ඣෙ සිඞ්ඝාටකෙ පාසාදො තත්ථ චක්ඛුමා පුරිසො ඨිතො පස්සෙය්‍ය මනුස්සෙ ගෙහං පවිසන්තෙපි නික්ඛමන්තෙපි.

ඒකාන්තයෙන් මේ සත්වයෝ කායදුශ්චරිතයෙන් යුක්තවූවාහුය, වාක්දුශ්චරිතයෙන් යුක්තවූවාහුය, මනොදුශ්චරිතයෙන් යුක්තවූවාහුය, බුද්ධප්‍රත්‍යෙකබුද්ධබුද්ධශ්‍රාවක යන ආය්‍ර්‍යයන්ට හෝ යටත්පිරිසෙයින් ගෘහස්ථශ්‍රොත ආපන්නයන්ට මොවුන්ට ශ්‍රමණ ධර්‍මයෙක් නැත. මොහු අශ්‍රමණයෝයයි අන්තිම වස්තුවෙන් හා මොවුන්ට ධ්‍යානයක් හෝ විමොක්‍ෂයක් හෝ මාර්‍ගයක් හෝ ඵලයක් නැතැයි ගුණනැසීම්වශයෙන්ද, ගර්හාකරන්නාහුය, මිථ්‍යාදෘෂ්ටිකයෝය, මිථ්‍යාදෘෂ්ටිකකර්‍මසමාදාන ඇත්තෝය, ඒ සත්වයෝ ශරීරභෙදයෙන් මරණින්මතු සැපයෙන් පහවූ දුර්‍ගතිඇත්තාවූ විවසවපතිතවන්නාවූ නිරයෙහි උපන්නාහුය. මේ පින්වත් සත්වයෝ වනාහි කායසුචරිතයෙන් යුක්තවූවාහුය, වචීසුචරිතයෙන් යුක්තවූවාහුය, මනොසුචරිතයෙන් යුක්තවූවාහුය, ආය්‍ර්‍යයන්ට ගර්හානොකරන්නාහුය, සම්‍යක්දෘෂ්ටිඇත්තාහුය, සම්‍යක්දෘෂ්ටිකර්‍මසමාදාන ඇත්තෝය, ඒ සත්වයෝ ශරීරභෙදයෙන් මරණින්මතු මනාගති ඇත්තාවූ සැපතින් අග්‍රවූ දිව්‍යලොකයෙහි උපන්නාහුයයි මෙසේ මිනිස්ඇස ඉක්මපවත්නාවූ පිරිසිදුවූ දිවැසින් චුතවන්නාවූද, උපදින්නාවූද, සත්වයන් දකියි. හීනවූ ජාතිකුලභෙදාදියනිසා හීනවූ සත්වයන්ද, උතුම්වූ සත්වයන්ද, සුන්දරවර්‍ණඇති සත්වයන්ද, දුර්‍වර්‍ණ සත්වයන්ද, ආඪ්‍යවූ මහධනඇති මනාගතිඇති සත්වයන්ද, දුගතියටපැමිණි සත්වයන්ද, රැස්කරණලද කර්‍මයවූපරිද්දෙන් සුගතියට හා දුග්තියටපැමිණි සත්වයන්ද, ප්‍රකාරයෙන් දනියි. මාණවකය, යම්සේ නුවරමැද මාර්‍ගසන්ධියෙක්හි ප්‍රාසාදයෙක් වන්නේද, ඒ ප්‍රාසාදයෙහි ඇස්ඇති පුරුෂයෙක් සිටියේ ගෙට ප්‍රවිෂ්ටවන්නාවූද, ගෙයින් පිටතට නික්මෙන්නාවූද.

රථිකායපි විතිසඤ්චරන්තෙ මජ්ඣෙ සිඞ්ඝාටකෙ නිසින්නෙ. තස්ස එවමස්ස එතෙ මනුස්සා ගෙහං පවිසන්ති එතෙ නික්ඛමන්ති එතෙ රථිකාය වීතිසඤ්චරන්ති එතෙ මජ්ඣෙ සිඞ්ඝාටකෙ නිසින්නාති. එවමෙව ඛො මාණව භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති, චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති. ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා.

වීථියෙහි ඔබමොබ හැසිරෙන්නාවූද, නුවරමැද උන්නාවූද, මනුෂ්‍යයන් දක්නේද, එකල ඕහටමෙබදුසිතෙක් වන්නේය. මේ මනුෂ්‍යයෝ ගෙට ප්‍රවිෂ්ට වෙත්, මොහු ගෙයින් පිටතට නික්මෙත්, මොහු වීථියෙහි ඔබමොබ හැසිරෙත්, මොහු නුවරමැද මාගීසන්ධියෙහි උන්නාහුයයි. මාණවකය, එපරිද්දෙන්ම භික්‍ෂුතෙම ධ්‍යානයෙන් සිතඑකඟවූකල්හි පිරිසිදුවූකල්හි බබලනකල්හි කෙලෙස්රහිතවූකල්හි පහවූ උපක්ලෙශයන්ඇතිකල්හි මෘදුවූකල්හි කර්‍මක්‍ෂමවූකල්හි නිශ්චලභාවයටපැමිණිකල්හි සත්ත්වයන්ගේ චුතිඋත්පත්ති දැනගන්නා දිව්‍යඥානලාභයපිණිස පරිකර්‍මචිත්තය එළවයි. වෙසෙසින් නැමීම කෙරෙයි. චුතිඋත්පත්ති ඥානලාභීවූ ඒ භික්‍ෂුතෙම පිරිසිදුවූ මිනිස්ඇස ඉක්මපවත්නාවූ දිව්‍යැසින් චුතවන්නාවූද, උපදින්නාවූද, සත්වයන් දකියි. හීනවූ සත්වයන්ද, උතුම්වූ සත්වයන්ද, සුන්‍දරවර්‍ණඇති සත්වයන්ද, දුර්‍වර්‍ණ සත්වයන්ද, මනාගතිඇති සත්වයන්ද, දුර්‍ගති සත්වයන්ද, රැස්කරණලද කර්‍මයවූපරිද්දෙන් සුගතියට හා දුගතියටපැමිණි සත්වයන්ද, ප්‍රකාරයෙන් දනියි. එකාන්තයෙන් මේ සත්වයෝ කායදුශ්චරිතයෙන් යුක්තවූවාහුය, වාක්දුශ්චරිතයෙන් යුක්තවූවාහුය, මනොදුශ්චරිතයෙන් යුක්තවූවාහුය, ආයර්‍යයන්ට ගර්හාකරන්නාහුය, මිථ්‍යාදෘෂ්ටිකයෝය, මිථ්‍යාදෘෂ්ටිකර්‍මසමාදාන ඇත්තෝය, ඒ සත්වයෝ ශරීරභෙදයෙන් මරණින්මතු සැපයෙන් පහවූ දුර්‍ගතිවූ විවශවපතිතවන්නාවූ නිරයෙහි උපන්නාහුය.

35. ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නාති. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති, ඉදම්පිස්ස හොති පඤ්ඤාය. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති අයං දුක්ඛසමුදයොති යථාභූතං පජානාති අයං දුක්ඛනිරොධොති යථාභූතං පජානාති අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති.

---

35. මේ පින්වත් සත්වයෝ වනාහි කායසුචරිතයෙන් යුක්තවූවාහුය. වචීසුචරිතයෙන් යුක්තවූවාහුය. මනොසුචරිතයෙන් යුක්තවූවාහුය. ආර්‍ය්‍යයන්ට ගැරහීම නොකරන්නාහුය. සම්‍යක්දෘෂ්ටි ඇත්තාහුය, සම්‍යක්දෘෂ්ටිකර්මසමාදාන ඇත්තෝය. ඒ සත්වයෝ ශරීර භෙදයෙන් මරණින්මතු මනාගතිඇත්තාවූ සැපතින් අග්‍රවූ දිව්‍ය ලොකයෙහි උපන්නාහුයයි මෙසේ මිනිස්ඇස ඉක්මපවත්නාවූ පිරිසිදුවූ දිවැසින් චුතවන්නාවූද, උපදින්නාවූද, සත්වයන් දකියි. හීනවූ සත්වයන්ද, උතුම්වූ සත්වයන්ද, සුන්දරවර්ණඇති සත්වයන්ද, දුර්වර්ණ සත්වයන්ද, මනාගතිඇති සත්වයන්ද, දුගතියට පැමිණි සත්වයන්ද, රැස්කරණලද කර්මයවූ පරිද්දෙන් සුගතියට හා දුගතියට පැමිණි සත්වයන්ද, ප්‍රකාරයෙන් දනියි. මේද ඒ මහණහුගේ ප්‍රඥාව වේ. ඒ භික්ෂුතෙම මෙසේ සිතඑකඟවූ කල්හි පිරිසිදුවූ කල්හි බබලන කල්හි කෙලෙස්රහිතකල්හි පහවූ උපක්ලෙශයන් ඇතිකල්හි මෘදුවූකල්හි කර්මක්ෂමවූ කල්හි නිශ්චල භාවයට පැමිණිකල්හි ආශ්‍රවක්ෂයකරඥානය නිපදවීමපිණිස විදර්ශනාචිත්තය එළවයි. මෙසෙ සිත් සිතනැම්ම කෙරෙයි. ඒ භික්ෂුතෙම මේ දුඃඛසත්‍යයයි තත්වූ පරිද්දෙන් දනියි. දුකඋපදවන්නාවූ තෘෂ්ණාව මේ දුඃඛ සමුදය සත්‍යයයි තත්වූපරිද්දෙන් දනියි. දුඃඛසත්‍යය දුඃඛසමුදයසත්‍ය යන මොවුන්ගේ පැවැත්මක් නැත්තාවූ නිර්වාණය මේ දුඃඛනිරොධසත්‍යයයි තත්වූපරිද්දෙන් දනියි. නිර්වාණයට පමුණුවන්නාවූ ආර්‍ය්‍යමාර්ගය මේ දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදාර්‍ය්‍ය සත්‍යයයි තත්වූපරිද්දෙන් දනියි.

ඉමෙ ආසවාති යථාභූතං පජානාති අයං ආසවසමුදයොති යථාභූතං පජානාති අයං ආසවනිරොධොති යථාභූතං පජානාති අයං ආසවනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති. තස්ස එවං ජානතො එවං පස්සතො කාමාසවාපි චිත්තං විමුච්චති භවාසවාපි චිත්තං විමුච්චති අවිජ්ජාසවාපි චිත්තං විමුච්චති විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති, ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාති.

36. සෙය්‍යථාපි මාණව පබ්බතසඞ්ඛෙපෙ උදකරහදො අච්ඡො විප්පසන්නො අනාවිලො. තත්‍ථ චක්ඛුමා පුරිසො තීරෙ ඨිතො පස්සෙය්‍ය සිප්පිසම්බුකම්පි සක්ඛරකඨලම්පි මච්ඡගුම්බම්පි චරන්තම්පි තිඨන්තම්පි.තස්ස එවමස්ස, අයං ඛො උදකරහදො අච්ඡො විප්පසන්නො අනාවිලො, තත්‍රිමෙ සිප්පි සම්බුකාපි සක්ඛරකඨලාපි මච්ඡගුම්බාපි චරන්තිපි තිඨන්තිපි. එවමෙවඛො මාණව භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ.

මොහු ආශ්‍රවයෝයයි තත්වූපරිද්දෙන් දනියි. මේ ආශ්‍රවයන්ගේ පහළවීමයයි තත්වූපරිද්දෙන් දනියි. මේ ආශ්‍රවයන්ගේ නිරුද්ධකිරීමයයි තත්වූපරිද්දෙන් දනියි. මේ ආශ්‍රවයන් නැතිකිරීමට පමුණුවන ප්‍රතිපදාවයයි තත්වූපරිද්දෙන් දනියි. මෙසේ දන්නාවූ මෙසේ දක්නාවූ ඒ භික්ෂුහුගේ සිත කාමාශ්‍රවය කෙරෙන්ද මිදෙයි. භවාශ්‍රවය කෙරෙන්ද, සිත මිදෙයි. අවිද්‍යාශ්‍රවයකෙරෙන්ද සිත මිදෙයි. ආශ්‍රවයන් කෙරෙන් සිතමිදුනුකල්හි ක්ලෙශයන් කෙරෙන් සිත මිදුනේයයි ප්‍රත්‍යවෙක්‍ෂාඥානය ඇතිවෙයි. ඒ ඥානයෙන් ක්‍ෂීණාශ්‍රවතෙම ප්‍රත්‍යවෙක්‍ෂා කරන්නේ ජාතිතොමෝ ක්‍ෂය විය. මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යාව වැසනිමවනලද්දේය. චතුස්සත්‍යයන්කෙරෙහි චතුර්විධමාර්ගයෙන් පරිඥාප්‍රහාණාදිවශයෙන් ෂොඩශවිධකෘත්‍යය නිමවනලද්දේය. වර්ත්මානස්කන්ධපරම්පරාවෙන් අන්‍ය ස්කන්ධපරම්පරාවක් මටනැතැයි දනියි.

36. මාණවකය, යම්සේ පර්වතමස්තකයෙක්හි නිර්මලවූ විශෙෂයෙන් ප්‍රසන්නවූ නොකැලඹුනාවූ දියවිලෙක් ඇත්තේද, ඒ විල්තෙර ඇස් ඇති පුරුෂයෙක් සිටියේ එහි හැසිරෙන්නාවූද, සිටින්නාවූද, සිප්පිබෙල්ලන් හා රන්වන් බෙල්ලන්ද කැට හා කැබිලිතිද, මත්ස්‍ය සමූහයාද, යම්සේ දක්නේද, එකල ඔහට මෙබඳු සිතෙක් වන්නේය. මේ දියවිලවනාහි නිර්මලවූයේ විශෙෂයෙන් ප්‍රසන්නවූයේ කැළඹීමෙක් නැත්තේද වෙයි. එහි මේ සිප්පිබෙල්ලන්හා රන්වන් බෙල්ලෝද, කැටහා කැබිලිතිද මත්ස්‍ය සමූහයෝද, හැසිරීමද කෙරෙත්. සිටීමද කෙරෙත්යයි මාණවකය,එපරිද්දෙන්ම භික්‍ෂුතෙම මෙසේ සිත එකඟවූකල්හි පිරිසිදුවූ කල්හි බබලන කල්හි.

අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති අයං දුක්ඛසමුදයොති යථාභූතං පජානාති අයං දුක්ඛනිරොධොති යථාභූතං පජානාති අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති, ඉමෙ ආසවාති යථාභූතං පජානාති අයං ආසව සමුදයොති යථාභූතං පජානාති අයං ආසවනිරොධොති යථාභූතං පජානාති අයං ආසවනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති. තස්ස එවං ජානතො එවං පස්සතො කාමාසවාපි චිත්තං විමුච්චති භවාසවාපි චිත්තං විමුච්චති අවිජ්ජාසවාපි චිත්තං විමුච්චති විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාති.

37. යම්පි මාණව භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ.

කෙලෙස් රහිතකල්හි පහවූ උපක්ලේශයන් ඇතිකල්හි මෘදුවූකල්හි කර්මක්ෂමවූකල්හි නිශ්චලභාවයට පැමිණිකල්හි ආශ්‍රවක්ෂයකරඥානය නිපදවීමපිණිස විදර්ශනා චිත්තය එලවයි. වෙසෙසින් සිතනැමීමද කෙරෙයි. ඒ ආශ්‍රවක්ෂය කරඥානලාභී භික්ෂුතෙම මේ දුඃඛසත්‍යයයි තත්වූපරිද්දෙන් දනියි. දුක්උපදවන්නාවූ තෘෂ්ණාව මේ දුඃඛසමුදය සත්‍යයයි තත්වූපරිද්දෙන් දනියි. දුඃඛසත්‍යය දුඃඛසමුදය සත්‍යය යන මොවුන්ගේ පැවැත්මක් නැත්තාවූ නිර්වාණය මේ දුඃඛනිරොධ සත්‍යයයි තත්වූපරිද්දෙන් දනියි. නිර්වාණයට පමුණුවන්නාවූ ආර්‍ය්‍යමාර්ගය මේ දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදාර්‍ය්‍යසත්‍යයයි තත්වූපරිද්දෙන් දනියි. මොහු ආශ්‍රවයෝයයි තත්වූපරිද්දෙන් දනියි, මේ ආශ්‍රවයන්ගේ පහළවීමයයි තත්වූපරිද්දෙන් දනියි. මේ ආශ්‍රවයන්ගේ නිරුද්ධ කිරීමයයි තත්වූපරිද්දෙන් දනියි. මේ ආශ්‍රවයන්ගේ නැතිකිරීමට පමුණුවන ප්‍රතිපදාවයයි තත්වූපරිද්දෙන් දනියි. මෙසේ දන්නාවූ මෙසේ දක්නාවූ ඒ භික්ෂුහුගේ සිත කාමාශ්‍රවය කෙරෙන්ද, මිදෙයි. භවාශ්‍රවය කෙරෙන්ද, සිත මිදෙයි. අවිද්‍යාශ්‍රවය කෙරෙන්ද සිත මිදෙයි. ආශ්‍රවයන් කෙරෙන් සිත මිදුනු කල්හි ක්ලේශයන් කෙරෙන් සිත මිදුනේයයි ප්‍රත්‍යවෙක්ෂා ඥානය ඇතිවෙයි. ඒ ඥානයෙන් ක්ෂීණාශ්‍රවතෙම ප්‍රත්‍යවෙක්ෂාකරන්නේ ජාතිතොමෝ ක්ෂයවීය. මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යාව වැස නිමවන ලද්දේය. චතුස්සත්‍යයන් කෙරෙහි චතුර්විධමාර්ගයෙන් පරිඥාප්‍රහාණාදිවශයෙන් ෂොඩශවිධ කෘත්‍යයකොට නිමවන ලද්දේය. වර්තමානස්කන්ධපරම්පරාවෙන් අන්‍යවූ ස්කන්ධපරම්පරාවක් මට නැතැයි දනියි.

37. මාණවකය, යම්හෙයකින් භික්ෂුතෙම මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූකල්හි, බබලනකල්හි, කෙලෙස්රහිතකල්හි,

විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මණියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ
ආසවානං ඛයඤාණාය චිත්තං අභිනිහරති අභිනින්නාමෙති.
සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති අයං දුක්ඛසමුදයොති
යථාභූතං පජානාති අයං දුක්ඛනිරොධොති යථාභූතං පජානාති අයං
දුක්ඛනිරොධගාමිනීපටිපදාති යථාභූතං පජානාති, ඉමෙ ආසවාති යථා
භූතං පජානාති අයං ආසවසමුදයොති යථාභූතං පජානාති අයං
ආසවනිරොධොති යථාභූතං පජානාති අයං ආසවනිරොධගාමිනී පටි
පදාති යථාභූතං පජානාති, තස්ස එවං ජානතො එවං පස්සතො
කාමාසවාපි චිත්තං විමුච්චති භවාසවාපි චිත්තං විමුච්චති අවිජ්ජාසවාපි
චිත්තං විමුච්චති විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති ඛීණා ජාති
වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජා
නාති, ඉදම්පිස්ස හොති පඤ්ඤාය.

පහවූඋපක්ලෙශයන් ඇතිකල්හි මෘදුවූකල්හි කර්මක්ෂමවූකල්හිනිශ්චල
භාවයට පැමිණිකල්හි ආශ්‍රවක්ෂයකරඥානය නිපදවීමපිණිස විදර්ශනා
චිත්තය එලවාද වෙසෙසින් සිතනැමීම කෙරේද, ඒ ආශ්‍රවක්ෂය
කරඥානලාභී භික්ෂුතෙම මේදුඃඛසත්‍යයයි තත්වූපරිද්දෙන් දනීද,
දුක්උපදවන්නාවූ තෘෂ්ණාව මේ දුඃඛසමුදය සත්‍යයයි තත්වූපරිද්
දෙන් දනීද දුඃඛසත්‍යය, දුඃඛසමුදය සත්‍යය යනමොවුන්ගේ පැවැත්
මක්නැත්තාවූ නිර්වාණය මේ දුඃඛනිරොධසත්‍යයයි තත්වූපරිද්දෙන්
දනීද, නිර්වාණයට පමුණුවන්නාවූ ආර්‍ය්‍යමාර්ගය මේ දුඃඛනිරොධගා
මිනී ප්‍රතිපදාර්‍ය්‍යසත්‍යයයි තත්වූපරිද්දෙන් දනීද, මොහු ආශ්‍රවයෝ
යයි තත්වූපරිද්දෙන් දනීද, මේ ආශ්‍රවයන්ගේ පහළවීමයයි තත්වූප
රිද්දෙන් දනීද, මේ ආශ්‍රවයන්ගේ නිරුද්ධකිරීමයයි තත්වූපරිද්දෙන්
දනීද, මේ ආශ්‍රවයන්ගේ නැතිකිරීමට පමුණුවන්නාවූ ප්‍රතිපදාවයයි
තත්වූපරිද්දෙන් දනීද, මෙසේ දන්නාවූ මෙසේ දක්නාවූ ඒ භික්ෂුහුගේ
සිත කාමාශ්‍රවයකෙරෙන්ද මිදේ. භවාශ්‍රවයකෙරෙන්ද සිතමිදේ,
අවිද්‍යාශ්‍රවය කෙරෙන්ද සිත මිදේ, ආශ්‍රවය කෙරෙන් සිත මිදුනුකල්හි
ක්ලෙශයන්කෙරෙන් සිත මිදුනේයයි විමුක්තිඥානය ඇතිවේ
ඒ ඥානයෙන් ක්ෂීණාශ්‍රවතෙම ප්‍රත්‍යවෙක්ෂාකරන්නේ ජාති
තොමෝ ක්ෂයවිය; මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යාව වැස නිමවනලද්දේය, චතුස්ස
ත්‍යයන් කෙරෙහි චතුර්විධමාර්ගයෙන් පරිඥා ප්‍රහාණාදිවශයෙන්
ෂොඩශවිධ කෘත්‍යයකොට නිමවන ලද්දේය, මේ මාර්ගඵල ලාභය
පිණිස අන්කටයුතු කෘත්‍යයෙක් නැත්තේයයි දනීද, මේද ඒ
මහණහුගේ ප්‍රඥාව වෙයි.

38. අයංඛො සො මාණව අරියො පඤ්ඤක්ඛන්ධො යස්ස සො භගවා වණ්ණවාදී අහොසි එතෙව ඉමං ජනතං සමාදපෙසි නිවෙසෙසි පතිට්ඨපෙසි නත්ථි චෙවෙත්ථ උත්තරිං කරණීයන්ති, අච්ඡරියං භො ආනන්ද අබ්භුතං භො ආනන්ද අරියො පඤ්ඤක්ඛන්ධො පරිපුණ්ණො නො අපරිපුණ්ණො. එවං පරිපුණ්ණඤ්චාහං භො ආනන්ද අරියං පඤ්ඤක්ඛන්ධං ඉතො බහිධා අඤ්ඤෙසු සමණබ්‍රාහ්මණෙසු න සමනුපස්සාමි නත්ථිචෙවෙත්ථ උත්තරිං කරණීයන්ති. අභික්කන්තං භො ආනන්ද අභික්කන්තං භො ආනන්ද, සෙය්‍යථාපි භො ආනන්ද නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නංවා විවරෙය්‍ය මූළ්හස්සවා මග්ගං ආචික්ඛෙය්‍ය අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති. එව මෙව ඛො භොතා ආනන්දෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො.

38. මාණවකය, ඒ භාග්‍යවතුන්වහන්සේ යම් ප්‍රඥාවකගේ ගුණ කියන සුලුවූසේක්ද, මාණවකය, ඒ මේ ආර්‍ය්‍යවූ ප්‍රඥාස්කන්ධය වෙයි, මෙහිද මේ ජනසමූහයා යෙදවූසේක, නිවෙසනය කරවූසේක, පිහිටුවූසේක, මෙහි මෙයින් මත්තෙහි කටයුතුවූ අනිකෙක්ද නැත්තේම යයි කියේය, පින්වත් ආනන්දස්ථවිරයන්වහන්ස, ආශ්චර්‍ය්‍යයි, පින්වත් ආනන්දස්ථවිරයන්වහන්ස, අද්භූතයි, පින්වත් ආනන්දස්ථවිරයන්වහන්ස, ආර්‍ය්‍යවූ ප්‍රඥාස්කන්ධයතෙම සම්පූර්ණවූයේ අපරිපූර්ණවූයේ නොවෙයි, පින්වත් ආනන්දස්ථවිරයන්වහන්ස, මෙසේ හාත්පසින් පිරුණාවූද අර්‍ය්‍යවූ ප්‍රඥාස්කන්ධයක් මේ බුදුසස්නෙන් පිටත අන්‍යවූ ශ්‍රමණබ්‍රාහ්මණයන් විෂයෙහි මම නොදක්නෙමි. මෙහි මෙයින් මත්තෙහි කටයුතුවූ අනිකෙක්ද නැත්තේමැයි, පින්වත් ආනන්දස්ථවිරයන්වහන්ස, දම්දෙසුම ඉතාමැනව, පින්වත් ආනන්දස්ථවිරයන්වහන්ස, දම්දෙසුම ඉතාමැනව. පින්වත් ආනන්දස්ථවිරයන්වහන්ස යටිකුරුකරණ ලද්දක් උඩුකුරුකරන්නේහෝ යම්සේද, වසන ලද්දෙක් විවෘතකරන්නේ හෝ යම්සේද, මංමුළාවූවෙකුට මග කියන්නේ හෝ යම්සේද, ඇස් ඇත්තෝ රූපයන් දකිත්වායි අන්ධකාරයෙහි තෙල් පහනක් දරන්නේ හෝ යම්සේද, එපරිද්දෙන්ම පින්වත් ආනන්දස්ථවිරයන්වහන්සේ විසින් අනෙකප්‍රකාරයෙන් ධර්‍මය ප්‍රකාශකරණලද්දේය.

එසාහං භො ආනන්ද භගවන්තං ගොතමං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භවං ආනන්දො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

සුභසුත්තං නිට්ඨිතං දසමං.

පින්වත් ආනන්දස්ථවිරයන්වහන්ස, මේ මම භාග්‍යවත්ගෞතම යානන්වහන්සේද ධර්‍මයද, භික්ෂුසඞ්ඝයාද සරණකොට යෙමි· පින්වත් ආනන්දස්ථවිරයන්වහන්සේ අද පටන් දිවිහිමියෙන් සරණගිය උපාසකයෙකැයි මාදරාගන්නා සේක්වායි තොදෙය්‍ය පුත්‍රවූ ශුභමාණවකතෙම සැලකළේය.

දසවෙනිවූ ශුභසූත්‍රාර්ථව්‍යාඛ්‍යාව නිමියේයි.

XI. කෙවට්ටසුත්තං.

—:0:—

1. එවං මෙ සුතං එකං සමයං භගවා නාලන්දායං විහරති පාවාරිකම්බවනෙ අථ ඛො කෙවට්ටො ගහපතිපුත්තො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො කෙවට්ටො ගහපතිපුත්තො භගවන්තං එතදවොච. අයං භන්තෙ නාලන්දා ඉද්ධා චෙව ඵීතා ච බහුජනා ආකිණ්ණමනුස්සා භගවති අභිප්පසන්නා සාධු භන්තෙ භගවා එකං භික්ඛුං සමාදිසතු යො උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං කරිස්සති එවායං නාලන්දා භිය්‍යොසො මත්තාය භගවති අභිප්පසීදිස්සතීති එවං වුත්තෙ භගවා කෙවට්ටං ගහපතිපුත්තං එතදවොච නඛො අහං කෙවට්ට භික්ඛූනං එවං ධම්මං දෙසෙමි. එථ තුම්හෙ භික්ඛවෙ ගිහීනං ඔදාතවසනානං උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං කරොථාති.

කෙවට්ට සූත්‍රාර්ථව්‍යාඛ්‍යා.

—:0:—

1. මේ සූත්‍රධර්මය මා විසින් මෙසේ අසනලදී. එක්කාලයෙක්හි භාග්‍යවතුන්වහන්සේ නාලන්දානුවරට සමීපයෙහිවූ පාවාරිකසිටානන්ගේ අඹවනවෙහෙර වැඩවාසය කරණසේක. ඉක්බිත්තෙන් කෙවට්ටනම් ගෘහපති පුත්‍රතෙම භාග්‍යවතුන්වහන්සේ යම් තැනකද එතනට එළඹියේය. එළඹ භාග්‍යවතුන්වහන්සේ සකසාවැඳ එකත්පසෙක උන්නේය. එකත්පසෙක උන්නාවූ කෙවට්ට ගෘහපති පුත්‍රතෙමේ භාග්‍යවතුන්වහන්සේට මේ කාරණය සැළකළේය. ස්වාමීනි, මේ නාලන්දානොමෝ සමෘඬවිය. දියුණුවට පැමිණියේය. බොහෝ ජනයන් ඇත්තිය. මිනිසුන්ගෙන් ගැවසීගත්තීය. භාග්‍යවතුන්වහන්සේ කෙරෙහි විශෙෂයෙන් ප්‍රසන්නයහ, ස්වාමීනි, භාග්‍යවතුන්වහන්සේ යමෙක් උත්තරි මනුෂ්‍යධර්මයෙන් ඍද්ධි ප්‍රාතිහාර්‍ය්‍යය කරන්නේද, එබඳුඑක්භික්ෂුවක් ප්‍රාතිහාර්‍ය්‍ය කරණයට නියමකරණසේක්වා. මැනවි. මෙසේ ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍ය පැවැත්වූ කල්හි මේ නාලන්දා වැසිජන්තානොමෝ බොහෝ සෙයින් භාග්‍යවතුන්වහන්සේ කෙරෙහි විශෙෂයෙන් ප්‍රසන්නවන්නිය කියාය. මෙසේ සැළකළ කල්හි භාග්‍යවතුන්වහන්සේ කෙවට්ට ගෘහපති පුත්‍රයාට මේ කාරණය වදාළසේක. කෙවට්ටය, මම මෙසේ භික්ෂූන්ට ධර්ම දෙශනා නොකරමි. කෙසේද, එව්මහණෙනි, තොපි සුදුපිළිඅඳින්නාවූ ගිහීන්ට උත්තරි මනුෂ්‍ය ධර්මයෙන් ඍද්ධි ප්‍රාතිහාර්‍ය්‍යය කරව්යයි කියාය.

දුතියම්පි ඛො කෙවට්ටො ගහපතිපුත්තො භගවන්තං එතදවොච. නාහං භන්තෙ භගවන්තං ධංසෙමි අපිච එවං වදාමි. අයං භන්තෙ නාලන්දා ඉද්ධා චෙව ඵීතා ච බහුජනා ආකිණ්ණමනුස්සා භගවති අභිප්පසන්නා සාධු භන්තෙ භගවා එකං භික්ඛුං සමාදිසතු යො උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං කරිස්සති එවායං නාලන්දා භිය්‍යොසො මත්තාය භගවති අභිප්පසීදිස්සතීති.

2, දුතියම්පි ඛො භගවා කෙවට්ටං ගහපතිපුත්තං එතදවොච න ඛො අහං කෙවට්ට භික්ඛූනං එවං ධම්මං දෙසෙමි එථ තුම්හෙ භික්ඛවෙ ගිහීනං ඔදාතවසනානං උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං කරොථාති තතියම්පි ඛො කෙවට්ටො ගහපතිපුත්තො භගවන්තං එතදවොච නාහං භන්තෙ භගවන්තං ධංසෙමි අපිච එවං වදාමි අයං භන්තෙ නාලන්දා ඉද්ධා චෙව ඵීතා ච බහුජනා ආකිණ්ණමනුස්සා භගවති අභිප්පසන්නා.

දෙවනුවද කෙවට්ට ගෘහපති පුත්‍රතෙම භාග්‍යවතුන්වහන්සේට මේ කාරණය සැලකළේය. ස්වාමීනි, මම භාග්‍යවතුන්වහන්සේ පිළිබඳ ගුණ නොනසමි. නැවතද මෙසේ සැලකරමි. ස්වාමීනි, මේ නාලන්දා තොමෝ සමෘද්ධිය. නානාභාණ්ඩ උත්සන්නතායෙන් දියුණුවට පැමිණියේය. බොහෝ ජනයන් ඇත්තීය. මිනිසුන්ගෙන් ගැවසිගත්තීය. භාග්‍යවතුන්වහන්සේ කෙරෙහි විශෙෂයෙන් ප්‍රසන්නයහ. ස්වාමීනි, භාග්‍යවතුන්වහන්සේ යමෙක් උත්තර මනුෂ්‍ය ධර්මයෙන් සෘද්ධි ප්‍රාතිහාර්‍ය්‍යය කරන්නේද එබඳුවූ එක්භික්ෂුවක් ප්‍රාතිහාර්‍ය්‍ය කරණයට නියමකරණ සේක්වා. මැනවි, මෙසේ සෘද්ධි ප්‍රාතිහාර්‍ය්‍යය පැවැත්වූකල්හි මේ නාලන්දා වැසිජනතා තොමෝ බොහෝ සෙයින් භාග්‍යවතුන්වහන්සේ කෙරෙහි විශෙෂයෙන් ප්‍රසන්නවන්නියයි කියාය.

2. දෙවනුවද භාග්‍යවතුන්වහන්සේ කෙවට්ට ගෘහපති පුත්‍රයාට මේකාරණය කීසේක. කෙවට්ටය, මම භික්ෂූන්ට මෙසේ ධර්ම දෙශනා නොකරමි, කෙසේද, එව් මහණෙනි, තොපි සුදුපිළිඅඳින්නාවූ ගිහීන්ට උත්තරි මනුෂ්‍ය ධර්මයෙන් සෘද්ධිප්‍රාතිහාර්‍ය්‍ය කරව්ය කියාය. තුන්වෙනුවද, කෙවට්ට ගෘහපති පුත්‍රතෙම භාග්‍යවතුන්වහන්සේට මේ කාරණය සැලකෙළේය. ස්වාමීනි, මම භාග්‍යවතුන්වහන්සේ පිළිබඳගුණ නොනසමි. නැවතද මෙසේ සැලකරමි. ස්වාමීනි, මේ නාලන්දා තොමෝ සමෘද්ධිය නානා භාණ්ඩ උත්සන්නතායෙන් දියුණුවට පැමිණියේය. බොහෝ ජනයන් ඇත්තීය- මිනිසුන්ගෙන් ගැවසීගත්තීය. භාග්‍යවතුන්වහන්සේ කෙරෙහි විශෙෂයෙන් ප්‍රසන්නයහ.

සාධුභන්තෙ භගවා එකං භික්ඛුං සමාදිසතු යො උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං කරිස්සති එවායං නාලන්දා භිය්‍යො සො මත්තාය භගවති අභිප්පසීදිස්සතීති තීණිඛො ඉමානි කෙවට්ට පාටිහාරියානි මයා සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදිතානි කතමානි තීණි ඉද්ධිපාටිහාරියං ආදෙසනාපාටිහාරියං අනුසාසනීපාටිහාරියං කතමඤ්ච කෙවට්ට ඉද්ධිපාටිහාරියං.

3. ඉධ කෙවට්ටභික්ඛු අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති එකොපි හුත්වා බාහුධාහොති බාහුධාපිහුත්වා එකොපිහොති ආවිභාවං තිරොභාවං තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡති, සෙය්‍යථාපි ආකාසෙ පඨවියාපි උම්මුජ්ජනිමුජ්ජං කරොති, සෙය්‍යථාපි උදකෙ උදකෙපි අභිජ්ජමානො ගච්ඡති. සෙය්‍යථාපි පඨවියංආකාසෙපි පල්ලඞ්කෙන කමති,සෙය්‍යථාපිපක්ඛිසකුණො ඉමෙපි.

ස්වාමිනි, භාග්‍යවතුන්වහන්සේ යමෙක් උත්තරි මනුෂ්‍ය ධර්මයෙන් ඍද්ධි ප්‍රාතිහාර්‍ය්‍ය කරන්නේද, එබඳුවූ එක්භික්ෂුවක් ප්‍රාතිහාර්‍ය්‍ය කරණයට නියමකරණ සේක්වා. මැනවි, මෙසේ ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍ය පැවැත්වූ කල්හි මේ නාලන්‍ද වැසිජනතා තොමෝ බොහෝ සෙයින් භාග්‍යවතුන්වහන්සේ කෙරෙහි විශෙෂයෙන් ප්‍රසන්නවන්නී යයි කියාය. කෙවට්ටය, මාවිසින් තෙමේම විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්‍ෂකොට ප්‍රකාශකරණලද මේ ප්‍රාතිහාර්‍ය්‍යයෝ තුන්දෙනෙක් වෙත්, කවර තුන්දෙනෙක්දයත්, ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍ය ආදෙශනා ප්‍රාතිහාර්‍ය්‍ය අනුශාසනි ප්‍රාතිහාර්‍ය්‍ය යන තුණයි. කෙවට්ටය, ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍ය කවරේද.

3. කෙවට්ටය, මේ ශාසනයෙහි භික්ෂුතෙම අනෙකවිධවූ ඍද්ධි කොට්ඨාසය වළඳයි හෙවත් ඊටපැමිණෙයිද, ඒ කෙසේද එක්කෙනෙක්වී බොහෝ පරිද්දෙන් වෙයි. බොහෝ පරිද්දෙන්දවී නැවත එක්කෙණෙක්ද වෙයි. ප්‍රකට ප්‍රාතිහාර්‍ය්‍යයද, අප්‍රකට ප්‍රාතිහාර්‍ය්‍යයද, කෙරෙයි. ගෘහභිත්තිහුගේ පරභාගයටද ගෘහවිහාර ග්‍රාමාදීන් වටකොට බඳනාලද ප්‍රාකාරයන්ගේ පරභාගයටද, පාංශුපර්වත හෝ පාෂාණ පර්වතයන්ගේ පරභාගයටද, අහසෙහිමෙන් විදගෙණයන බැවින් කිසිතැනක අලග්නවයෙයි දියෙහිමෙන් පොළවෙහිද, ගැලී මහා නැගීමද, කෙරෙයි. පොළවෙහිමෙන් දියෙහිද, නොගැලී ගමන් කෙරෙයි. පියාපත් ඇත්තාවූ පක්‍ෂියෙක් අහස පියාඹන්නේ යම්සේද එපරිද්දෙන්ම අහස හාත්පසින් ඌරුබඩාසනයෙන් ගමන් කෙරෙයි.

චන්දිමසූරියෙ එවං මහිද්ධිකෙ එවං මහානුභාවෙ පාණිනා පරිමසති පරිමජ්ජති. යාව බ්‍රහ්මලොකාපි කායෙන වසංවත්තෙතීති තමෙනං අඤ්ඤතරො සද්ධො පසන්නො පස්සති තං භික්ඛුං අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොන්තං එකොපි හුත්වා බහුධාභොන්තං බහුධාපිහුත්වා එකොහොන්තං ආවිභාවං තිරොභාවං තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානං ගච්ඡන්තං. සෙය්‍යථාපි ආකාසෙ පඨවියාපි උම්මුජ්ජනිම්මුජ්ජං කරොන්තං. සෙය්‍යථාපි උදකෙ උදකෙපි අභිජ්ජමානං ගච්ඡන්තං. සෙය්‍යථාපි පඨවියං ආකාසෙ පල්ලඞ්කෙන කමන්තං. සෙය්‍යථාපි පක්ඛිසකුණො ඉමෙපි චන්දිමසූරියෙ එවං මහිද්ධිකෙ එවං මහානුභාවෙ පාණිනා පරිමසන්තං යාවබ්‍රහ්මලොකාපි කායෙන වංසවත්තෙන්තං.

දෙසාළිස්දහසක් යොදුන්මත්තෙහි හැසිරෙණහෙයින් ප්‍රසිද්ධවූ මහත් සෘද්ධිඇත්තාවූ තුන්ලොව එකවිට ආලොකකරණ හෙයින් ප්‍රසිද්ධ මහානුභාව ඇත්තාවූ මේ චන්‍ද්‍ර සූර්‍ය්‍යයන්ද, අතින්පිරිමදියි. බ්‍රහ්ම ලොකය සීමාකොට තමාගේකයින් වසයෙහි පවත්වයි මෙසේ අනෙක විධවූ සෘද්ධිකොඨාසයන් වලඳන්නාවූ එකෙක්දවි,බොහෝ පරිද්දෙන් වන්නාවූ බොහෝ පරිද්දෙන්දවි, නැවත එකෙක්වන්නාවූ ප්‍රකට ප්‍රාතිහාර්‍ය්‍යයටද, අප්‍රකට ප්‍රාතිහාර්‍ය්‍යයටද, පැමිණෙන්නාවූ ගෘහභිත්ති හුගේ පරභාගයටද, ගෘහවිහාර ග්‍රාමාදීන්වටකොට බඳනාලද ප්‍රාකාරයන්ගේ පරභාගයටද, පාංශුපර්‍වත හෝ පාෂාණපර්‍වතයන්ගේ පරභාගයටද. අහසෙහිමෙන් විදගෙණයනබැවින් කිසිතැනක අලග්නව යන්නාවූ දියෙහිමෙන් පොළවෙහිද, ගැළීම හා නැගීමද, කරන්නාවූ පොළවෙහි මෙන් දියෙහිද දියෙහි නොගැළී ගමන්තරන්නාවූ පියාපත්වලින්යුත් පක්ෂියෙක් අහසපියාඹන්නේ යම්සේද, එපරිද්දෙන්ම අහස හාත්පසින් ඌරුබද්ධාසනයෙන් ගමන්කරන්නාවූ දෙසාළිස් දහසක් යොදුන්මත්තෙහි හැසිරෙණ හෙයින් මෙසේ මහද් සෘද්ධි ඇත්තාවූ තුන්දිව එකවිට ආලොක කරණ හෙයින් ප්‍රසිද්ධ මහානුභාව ඇත්තාවූ මේ චන්ද්‍ර සූර්‍ය්‍යයන්ද අතින් පිරිමදින්නාවූ බ්‍රහ්ම ලොකය සීමාකොට තමාගේ කයින් වශයෙහි පවත්නාවූ.

තමෙනං සො සද්ධො පසන්නො අඤ්ඤතරස්ස අස්සද්ධස්ස අප්පසන්නස්ස ආරොචෙති. අච්ඡරියං වත භො අබ්භුතං වත භො සමණස්ස මහිද්ධිකතා මහානුභාවතා අමාහං භික්ඛුං අද්දසං අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොන්තං එකොපිහුත්වා බහුධාභොන්තං...පෙ... යාව බ්‍රහ්මලොකාපි කායෙන වසංවත්තෙන්තං තමෙනං.

4. සො අස්සද්ධො අප්පසන්නො තං සද්ධං පසන්නං එවං වදෙය්‍ය අත්ථි ඛො භො ගන්ධාරීනාමවිජ්ජා තායසො භික්ඛු අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති. එකොපි හුත්වා බහුධාහොති...පෙ...යාව බ්‍රහ්මලොකාපි කායෙන වසංවත්තෙතීති. තං කිංමඤ්ඤසි, කෙවට්ට අපිනු සො අස්සද්ධො අප්පසන්නො තං සද්ධං පසන්නං එවං වදෙය්‍යාති වදෙය්‍ය භන්තෙති, ඉමං ඛො අහං කෙවට්ට ඉද්ධිපාටිහාරියෙ ආදීනවං සම්පස්සමානො ඉද්ධිපාටිහාරියෙන අට්ටීයාමි හරායාමි ජිගුච්ඡාමි කතමඤ්ච කෙවට්ට ආදෙසනා පාටිහාරියං.

ඒ ඍද්ධිමත් භික්ෂුහු ප්‍රසන්නවූ එක්තරා ශ්‍රද්ධාවන්තයෙක් දක්නේද ඒ පැහැදුනාවූ සැදැහැවත් තැනැත්තේ අනෙකවිධවූ ඍද්ධිකොඨාසයන් වලඳන්නාවූ එකෙක්දවී, බොහෝ පරිද්දෙන් වන්නාවූ සෙස්සකීනයින් දතයුතු, බ්‍රහ්මලොකය සීමාකොට තමාගේකයින් වශයෙහි පවත්වන්නාවූ මේ භික්ෂුවක් මම දුටුයෙමියි. ශ්‍රද්ධානැත්තාවූ අප්‍රසන්නවූ එක්තරා එකකුට ශ්‍රමණයාගේ මහත් ඍද්ධිඇතිබවද මහානුභාව ඇතිබවද, පින්වත, ඒකාන්තයෙන් ආශ්චර්ය්‍යී වෙයි. පින්වත ඒකාන්තයෙන් අද්භූත වේයයි දන්වාද.

4. ඒ ශ්‍රද්ධානැත්තාවූ අප්‍රසන්නවූ තැනැත්තේ ඒ ප්‍රසන්නවූ සැදැහැවත් තැනැත්තාට මෙසේ කියන්නේය. පින්වත, ගන්ධාරීනම් විද්‍යාවක් ඇත්තීය. ගන්ධාරරට බොහෝ ඍෂිහු විසූහ. ඔවුන්තුරෙහි එකකු විසින් කරණලද විද්‍යාවක් ගන්ධාරීනම් විය, ඒ විද්‍යායෙන් ඒ භික්ෂුතෙම අනෙකවිධවූ ඍද්ධිකොඨාසය වලඳයි. එකෙක්දවී,බොහෝපරිද්දෙන් වෙයි. සෙස්ස කීනයින් දතයුතු. බ්‍රහ්මලොකය සීමාකොට තමාගේ කයින් වසයෙහි පවත්වායි කියාය. කෙවට්ටය, ඒ කුමකැයි සිතන්නෙහිද, ඒ ශ්‍රද්ධානැත්තාවූ අප්‍රසන්නවූ තැනැත්තේ ඒ සැදැහැවත් ප්‍රසන්න තැනැත්තාට මෙසේ කියන්නේදැයි ඇසූසේක. ස්වාමීනි, කියන්නේයයි කීයේය. කෙවට්ටය, මම ඍද්ධිප්‍රාතිහාර්ය්‍යයෙහි මේ දොෂය මනාකොට දන්නෙමි ඍද්ධිප්‍රාතිහාර්ය්‍යයෙන් පීඩිතවූවකු වෙමි ලජ්ජාවෙමි. අසූචිදැක්මෙන් ජිගුප්සා උපදවමි. කෙවට්ටය, ආදෙශනා ප්‍රාතිහාර්ය්‍යය කවරේද?

ඉධ කෙවට්ට භික්ඛු පරසත්තානං පරපුග්ගලානං චිත්තම්පි ආදිසති චෙතසිකම්පි ආදිසති විතක්කිතම්පි ආදිසති විචාරිතම්පි ආදිසති. එවම්පි තෙ මනො ඉත්ථම්පි තෙ මනො ඉතිපි තෙ චිත්තන්ති තමෙනං අඤ්ඤතරො සද්ධො පසන්නො පස්සති. තං භික්ඛුං පරසත්තානං පරපුග්ගලානං චිත්තම්පි ආදිසන්තං චෙතසිකම්පි ආදිසන්තං විතක්කිතම්පි ආදිසන්තං විචාරිතම්පි ආදිසන්තං එවම්පි තෙ මනො ඉත්ථම්පි තෙ මනො ඉතිපි තෙ චිත්තන්ති තමෙනං සො සද්ධො පසන්නො අඤ්ඤතරස්ස අස්සද්ධස්ස අප්පසන්නස්ස ආරොචෙති. අච්ඡරියං වත භො අබ්භුතං වත භො සමණස්ස මහිද්ධිකතා මහානුභාවතා අමාහං භික්ඛුං අද්දසං පරසත්තානං පරපුග්ගලානං චිත්තම්පි ආදිසන්තං චෙතසිකම්පි ආදිසන්තං විතක්කිතම්පි ආදිසන්තං විචාරිතම්පි ආදිසන්තං එවම්පි තෙ මනො ඉත්ථම්පි තෙ මනො ඉතිපි තෙ චිත්තන්ති තමෙනං.

කෙවට්ටය, මේ ශාසනයෙහි භික්ෂුතෙම අන්‍යසත්වයන්ගේද, අන්‍යපුද්ගලයන්ගේද, සිතදැන කියයි. සිතෙහි හටගත් සොම්නස හා දොම්නස දැන කියයි. විතර්කකරණලද්ද දැන කියයි. විචාරකරණලද්ද දැන කියයි. තාගේ මනස මෙසේ කාමවිතර්කාදියෙන් යුක්තවූයේ වෙයි. තාගේ මනස මේ ආකාරද වෙයි. තාගේ සිත මේ මේ අර්ථයක් සිතමින් පැවැත්තේයයිද කියයි. මෙසේ අන්‍යසත්වයන්ගේද, අන්‍යපුද්ගලයන්ගේද, සිතදැන කියන්නාවූ සිතෙහි හටගත් සොම්නස හා දොම්නස දැන කියන්නාවූ විතර්කකරණලද්ද දැන කියන්නාවූ විචාරකරණලද්ද දැන කියන්නාවූ තාගේ මනස මෙසේ කාමවිතර්කාදියෙන් යුක්තවූයේයයිද, තාගේ මනස මේ ආකාරයෙන් පැවැත්තේයයිද, තාගේ සිත මෙසේ මෙනම් මෙනම් අර්ථයක් සිතමින් පැවැත්තේයයි කියන්නාවූද, ඒ භික්ෂුව ප්‍රසන්නවූ එක්තරා සැදැහැවතෙක් දකීද. අන්‍යසත්වයන්ගේද, අන්‍ය පුද්ගලයන්ගේද, සිත කියන්නාවූ සිතෙහි හටගත් සොම්නස හා දොම්නසද කියන්නාවූ විතර්කකරණලද්ද කියන්නාවූ විචාරකරණලද්ද කියන්නාවූ තාගේ මනස මෙසේ කාමවිතර්කාදියෙන් යුක්තවූයේයයිද, තාගේ මනස මේ ආකාරයෙන් පැවැත්තේයයිද, තාගේ සිත මෙසේ මෙනම් මෙනම් අර්ථයක් සිතමින් පැවැත්තේයයිද කියන්නාවූ මේ භික්ෂුවක් මම දුටුයෙමියි. ඒ ශ්‍රද්ධාවත් ප්‍රසන්නතැනැත්තේ ශ්‍රද්ධානැත්තාවූ අප්‍රසන්නවූ එක්තරා එකක්හට ශ්‍රමණයාගේ මහත් ඍද්ධිඇතිබවද, මහානුභාවඇතිබවද, පින්වත, ඒකාන්තයෙන් ආශ්චර්‍ය්‍ය වෙයි. පින්වත, ඒකාන්තයෙන් අද්භූතවේයයි දන්වාද.

5. සො අසද්ධො අප්පසන්නො තං සද්ධං පසන්නං එවං වදෙය්‍ය අත්ථි බො හො මණිකානාම විජ්ජා තාය සො භික්ඛු පරසත්තානං පරපුග්ගලානං චිත්තම්පි ආදිසති චෙතසිකම්පි ආදිසති---පෙ---එවම්පි තෙ මනො ඉත්ථම්පි තෙ මනො ඉතිපි තෙ චිත්තන්ති තං කිං මඤ්ඤසි. කෙවට්ට අපිනුසො අසද්ධො අප්පසන්නො තං සද්ධං පසන්නං එවං වදෙය්‍යාති වදෙය්‍ය භන්තෙති. ඉමං බො අහං කෙවට්ට ආදෙසනා පාටිහාරියෙ ආදීනවං සම්පස්සමානො ආදෙසනා පාටිහාරියෙන අට්ටියාමි හරායාමි ජිගුච්ඡාමි. කතමඤ්ච කෙවට්ට අනුසාසනීපාටිහාරියං ඉධ කෙවට්ට භික්ඛු එවමනුසාසති එවං විතක්කෙථ මා එවං විතක්කයිත්ථ එවං මනසිකරොථ. මා එවං මනසාකත්ථ ඉදං පජහථ ඉදං උපසම්පජ්ජවිහරථාති ඉදම්පි වුච්චති කෙවට්ට අනුසාසනීපාටිහාරියං.

5. ඒ ශ්‍රද්ධානැත්තාවූ අප්‍රසන්නවූ තැනැත්තේ ඒ සැදැහැවත් පැහැදුනු තැනැත්තාට මෙසේ කියන්නේය. පින්වත චින්තාමණි නම් එක් විද්‍යාවක් ඇත, ඒ විද්‍යායෙන් ඒ භික්‍ෂුතෙම අන්‍යසත්‍වයන්ගේද අන්‍යපුද්ගලයන්ගේද සිත කියයි. සිත පිළිබඳ සොම්නසහා දොම්නසද කියයි, සෙස්සකිනයින් දතයුතු. තාගේ මනස මෙසේ කාම විතර්කාදියෙන් යුක්තවූයේයයිද තාගේ මනස මේ ආකාරයෙන් පැවැත්තේයයිද තාගේ සිත මෙනම් මෙනම් අර්ථයක් සිතමින් පැවැත්තේයයිද කියයි, කෙවට්ටය, ඒ කුමකැයි සිතන්නෙහිද, ඒ සැදැහැ නැත්තාවූ අප්‍රසන්නවූ තැනැත්තේ ඒ සැදැහැවත් පැහැදුනුතැනැත්තාට මෙසේ කියන්නේද, ස්වාමීනි කියන්නේයයි කීයේය. කෙවට්ටය, මම ආදෙශනා ප්‍රාතිහාර්‍ය්‍යයෙහි මේ දොෂය මනාකොට දක්නෙම් ආදෙශනා ප්‍රාතිහාර්‍ය්‍යය හාසමග පීඩිතවූවකුමෙන්වෙමි, ලජ්ජාවෙමි, අසූචියක් දුකමෙන් ජුගුප්සා උපදවමි. කෙවට්ටය, අනුශාසනීප්‍රාතිහාර්‍ය්‍යය කවරේද, කෙවට්ටය, මේශාසනයෙහි භික්‍ෂුතෙම මෙසේ අනුශාසනාකෙරෙයි, මෙසේ නෛෂ්ක්‍රම්‍ය විතර්කාදීන් මෙසේ පවත්වන්නේ විතර්කණය කරව්. මෙසේ කාම විතර්කාදීන් පවත්වන්නෝ විතර්කණය නොකරව්මෙසේ අනිත්‍යසංඥවහා දුඃඛසංඥාදීන් අතුරෙහි එක්තරා එකක් සිත්හි කරව්, නිත්‍යය යනාදි ක්‍රමයෙන් සිත්හි නොකරව් පඤ්චකාමගුණ පිළිබඳ රාගය දුරුකරව්, මේ චතුර්විධ මාර්‍ගඵල ප්‍රභෙදවූ ලොකොත්තරධර්‍මයම පැමිණ නිපදවා වාසයකරව්යයි කියාය. කෙවට්ටය, මේද අනුශාසනී ප්‍රාතිහාර්‍ය්‍යයයි කියනුලැබේ.

පුනචපරං කෙවට්ට ඉධ තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධො —පෙ— යථාසාමඤ්ඤඵලෙ එවං විත්ථාරෙතබ්බං —පෙ— එවං ඛො කෙවට්ට භික්ඛු සීලසම්පන්නො හොති —පෙ— පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති ඉදම්පිවුච්චති කෙවට්ට අනුසාසනී පාටිහාරියං, දුතියජ්ඣානං තතියජ්ඣානං චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරති. ඉදම්පිවුච්චති කෙවට්ට අනුසාසනී පාටිහාරියං —පෙ— ඤාණදස්සනාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති —පෙ— ඉදම්පි වුච්චති කෙවට්ට අනුසාසනී පාටිහාරියං නාපරං ඉත්ථත්තායාති. පජානාති ඉදම්පි වුච්චති කෙවට්ට අනුසාසනීපාටිහාරියං ඉමානි ඛො කෙවට්ට තීණි පාටිහාරියානි මයා සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදිතානි.

6. භූතපුබ්බං කෙවට්ට ඉමස්මිඤ්ඤෙව භික්ඛුසඞ්ඝෙ අඤ්ඤතරස්ස භික්ඛුනො එවං චෙතසො පරිවිතක්කො උදපාදි කත්ථනුඛො ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථිදං පඨවිධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති.

කෙවට්ටය, නැවතද අර්හත්වූ සම්‍යක්සම්බුද්ධවූ තථාගතයන් වහන්සේ මේ සත්වලොකයෙහි පහළවනසේක්ද? සෙස්සකීනයින් දතයුතු. සාමඤ්ඤඵල සූත්‍රයෙහි යම්සේද, එපරිද්දෙන් විස්තර කට යුතු, කෙවට්ටය, භික්‍ෂුතෙම මෙසේ සීලයෙන් යුක්තවූයේ වෙයි සෙස්සකීනයින් දතයුතු, ප්‍රථමධ්‍යානයට පැමිණ වාසයකෙරේද, කෙවට්ටය, මේද අනුශාසනී ප්‍රාතිහාර්‍ය්‍යයයි කියනුලැබේ. ද්විතීයධ්‍යානයටද තෘතීයධ්‍යානයටද චතුර්ථධ්‍යානයටද පැමිණ වාසයකෙරේද කෙවට්ටය, මේද අනුශාසනී ප්‍රාතිහාර්‍ය්‍යයයි කියනුලැබේ. සෙස්සකීනයින් දතයුතු ඥානදර්ශනය පිණිස සිත එළවයිද, වෙසෙසින් සිතනැම්ම කෙරේද. කෙවට්ටය, මේද අනුශාසනී ප්‍රාතිහාර්‍ය්‍යයයි කියනුලැබේ. සෙස්සකීනයින් දතයුතු මේ මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යාව පිණිස අනිකක් නැත්තේයයි දනීද, කෙවට්ටය, මේ අනුශාසනී ප්‍රාතිහාර්‍ය්‍යයයි කියනුලැබේ, කෙවට්ටය, මේ ප්‍රාතිහාර්‍ය්‍යයෝ තුන්දෙන මා විසින් තෙමේම විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්‍ෂකොට ප්‍රකාශකරණ ලද්දාහුය.

6. කෙවට්ටය, පෙරවූදෙයක් කියමි, මේ භික්‍ෂුසඞ්ඝයා අතුරෙහිම එක්තරා භික්‍ෂුවක්හට සිත පිළිබඳවූ මෙවැනි කල්පනාවෙක් පහළවූයේය. පෘථිවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු යනමේ සතරමහාභූතයෝ කවර තැනෙක්හි කුමකට පැමිණ කුමකට පැමිණිතැනැත්තාහට නිරවශෙෂව අප්‍රවෘත්ති වශයෙන් නිරුද්ධවන්නාහුදැයි කියාය.

අථ ඛො සො කෙවට්ට භික්ඛු තථාරූපං සමාධිං සමාපජ්ජි යථා සමාහිතෙ චිත්තෙ දෙවයානියො මග්ගො පාතුරහොසි. අථ ඛො සො කෙවට්ට භික්ඛු යෙන චාතුම්මහාරාජිකා දෙවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා චාතුම්මහාරාජිකෙ දෙවෙ එතද වොච. කත්ථ නු ඛො ආවුසො ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති. සෙය්‍යථීදං පඨවිධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති. එවං වුත්තෙ කෙවට්ට චාතුම්මහාරාජිකා දෙවානං භික්ඛුං එතදවොචුං. මයම්පි ඛො භික්ඛු න ජානාම යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති. සෙය්‍යථීදං පඨවිධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති. අත්ථි ඛො භික්ඛු චත්තාරො මහාරාජානො අම්හෙහි අභික්කන්තතරුච පණීතතරුච. තෙ ඛො එතං ජානෙය්‍යුං යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති. සෙය්‍යථීදං පඨවිධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති. අථ ඛො සො කෙවට්ට භික්ඛු යෙන චත්තාරො මහාරාජානො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා චත්තාරො මහාරාජෙ එතදවොච.

කෙවට්ටය, ඉක්බිත්තෙන් ඒ භික්ෂුතෙම යම්පරිද්දෙකින් සිත එකඟවූ කල්හි දිව්‍යලොකයට යන මාර්ගයයි කියනලද ඍද්ධිවිධ ඥානය පහළවූයේද එබඳුවූ සමාධියකට සමවැදුනේය. කෙවට්ටය, ඉක්බිත්තෙන්, ඒ භික්ෂුතෙම චාතුර්මහාරාජික දෙවියෝ යම්තැනකද එතනට එළඹියේය, එළඹ චාතුර්මහාරාජිකා දෙවියන්ගෙන් මේ කාරණය විචාළේය. ඇවැත්නි පෘථිවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු යනමේ සතරමහාභූතයෝ කවරතැනෙක්හි කුමකට පැමිණ කුමකට පැමිණි තැනැත්තාහට නිරවශෙෂව අප්‍රවෘත්තිවශයෙන් නිරුද්ධවන්නාහුදැයි කියාය. කෙවට්ටය, මෙසේකී කල්හි චාතුර්මහාරාජික දෙවියෝ ඒ භික්ෂුවට මේවචනය කීවෝය, මහණ, පෘථිවිධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු යන මේ සතරමහාභූතයෝ යම්තැනක නිරවශෙෂව අප්‍රවෘත්තිවශයෙන් නිරුද්ධවන්නාහුද යන මේ කාරණය අපිද නොදනුම්හයි කියාය, මහණ, අපට වඩා රූප සම්පත්තියෙන් හා ප්‍රඥාප්‍රතිභානාදී ගුණවලින් යුක්තවූද වර්ණයශෛශ්වර්‍ය්‍යාදියෙන් අතිශයින් උත්තමවූද සතරවරම් රජකෙනෙක් ඇත්තාහුය පෘථිවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු යනමේ සතරමහාභූතයෝ යම්තැනක නිරවශෙෂව අප්‍රවෘත්තිවශයෙන් නිරුද්ධවන්නාහුද යනමේ කාරණය ඒ සතවරම් මහරජහු න්නාහුය. කෙවට්ටය, ඉක්බිත්තෙන් ඒ භික්ෂුතෙම සතරවරම් රජහු යම්තැනකද එතනට එළඹියේය. එළඹ සතරවරම් රජුන්ගෙන් මේකාරණය විචාළේය,

කත්ථනුඛො ආවුසො ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති. සෙය්‍යථිදං පඨවිධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති. එවං වුත්තෙ කෙවට්ට චත්තාරො මහාරාජානො තං භික්ඛුං එතදවොචුං. මයම්පි ඛො භික්ඛු නජානාම යත්ථ මෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති. සෙය්‍යථිදං පඨවිධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති අත්ථිඛො භික්ඛු තාවතිංසා නාම දෙවා අම්හෙහි අභික්කන්තතරාච පණීතතරාච.

7. තෙ ඛො එතං ජානෙය්‍යුං යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පඨවිධාතු—පෙ—වායොධාතූති. අථ ඛො සො කෙවට්ට භික්ඛු යෙන තාවතිංසා දෙවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තාවතිංසෙ දෙවෙ එතදවොච, කත්ථනුඛො ආවුසො ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පඨවිධාතු—පෙ—වායොධාතූති. එවං වුත්තෙ කෙවට්ට තාවතිංසා දෙවා තං භික්ඛුං එතදවොචුං.

ඇවැත්නි, පෘථිවීධාතු, ආපොධාතු, තෙජොධාතු, වායොධාතු යන මේ සතරමහාභූතයෝ කවරතැනෙක්හි කුමකට පැමිණ කුමකට පැමිණි තැනැත්තාහට නිරවශෙෂව අප්‍රවෘත්තිවශයෙන් නිරුද්ධවන්නාහුදැයි කියාය, කෙවට්ටය, මෙසේ විචාළකල්හි සතරවරම්රජහු ඒ භික්ෂුවට මේ වචනය කීවෝය, මහණ පෘථිවිධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු යනමේ සතරමහාභූතයෝ යම් තැනක නිරවශෙෂව අප්‍රවෘත්ති වශයෙන් නිරුද්ධවන්නාහුද යන මේ කාරණය අපිදු නොදනුම්හයි කියාය. මහණ අපට වඩා ඉතා රූපසම්පත්ත්‍යාදියෙන් යුක්තවූද, වර්ණයශෛශ්වය්‍ය්‍යාදියෙන් උත්තමතරවූද තාවතිංසනම් දෙවිකෙනෙක් ඇත්තාහුය.

7. පඨවිධාතු, ආපොධාතු, තෙජොධාතු, වායොධාතු යන මේ සතරමහාභූතයෝ යම්තැනක නිරවශෙෂව අප්‍රවෘත්තිවශයෙන් නිරුද්ධවන්නාහුද යන මේ කාරණය ඒ දෙවියෝ දන්නාහුය. කෙවට්ටය, ඉක්බිත්තෙන් ඒ භික්ෂුතෙම තව්තිසාවැසි දෙවියෝ යම්තැනකද එතනට එළඹියේය එළඹ තව්තිසාවැසි දෙවියන්ගෙන් මේ කාරණය විචාළේය. ඇවැත්නි, පඨවිධාතු, ආපොධාතු, තෙජොධාතු, වායොධාතු යන මේ සතරමහාභූතයෝ කවරතැනෙක්හි කුමකට පැමිණ කුමකට පැමිණිතැනැත්තාහට නිරවශෙෂව අප්‍රවෘත්තිවශයෙන් නිරුද්ධවන්නාහුදැයි කියාය. කෙවට්ටය, මෙසේ විචාළකල්හි තව්තිසාවැසි දෙවියෝ ඒ භික්ෂුවට මේ වචනය කීවෝය.

මයම්පි බො භික්ඛු නජානාමි, යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති. සෙය්‍යථිදං පඨවීධාතු—පෙ—වායොධාතූති. අත්ථි බො භික්ඛු සක්කො නාම දෙවානමින්‍දො අම්හෙහි අභික්කන්තතරොච පණීතතරොච සො බො එතං ජානෙය්‍ය, යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පඨවිධාතු—පෙ—වායොධාතූති. අථ බො සො කෙවට්ට භික්ඛු යෙන සක්කො දෙවානමින්‍දො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා සක්කං දෙවානමින්‍දං එතදවොච. කත්ථනුබො ආවුසො ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පඨවිධාතු—පෙ—වායොධාතූති. එවං වුත්තෙ කෙවට්ට සක්කො දෙවානමින්‍දො තං භික්ඛුං එතදවොච අහම්පි බො භික්ඛු නජානාමි යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පඨවිධාතු—පෙ—වායොධාතූති. අත්ථි බො භික්ඛු යාමානාමදෙවා අම්හෙහි අභික්කන්තතරාච පණීතතරාච.

මහණ, පඨවිධාතු, ආපොධාතු, තෙජොධාතු, වායොධාතු යන මේ සතර මහාභූතයෝ යම්තැනක නිරවශෙෂව අප්‍රවෘත්තිවශයෙන් නිරුද්ධවත් නාහුද යන මේ කාරණය අපිදු නොදනුම්හ. මහණ, අපටවඩා ඉතා රූප සම්පත්ත්‍යාදියෙන් යුක්තවූද, වර්‍ණයශෛශ්වය‍ර්‍ය්‍යාදියෙන් උත්තමතර වූද, ශක්‍රදෙවෙන්‍ද්‍රයෙක් ඇත්තේය. පඨවීධාතු, ආපොධාතු, තෙජො ධාතු, වායොධාතු යන මේ සතරමහාභූතයෝ යම්තැනක නිරවශෙෂව අප්‍රවෘත්තිවශයෙන් නිරුද්ධවත්නාහුද යන මේ කාරණය ඒ ශක්‍රදෙවෙ න්‍ද්‍රතෙම දන්නේය. කෙවට්ටය, ඉක්බිත්තෙන් ඒ භික්‍ෂුතෙම ශක්‍ර දෙවෙන්‍ද්‍රතෙම යම්තැනකද එතනට එළඹියේය. එළඹ ශක්‍රදෙවෙන්‍ද්‍ර යාගෙන් මේ කාරණය විචාළේය. ඇවැත්නි, පඨවිධාතු, ආපොධාතු, තෙජොධාතු, වායොධාතු යන මේ සතරමහාභූතයෝ කවරතැනෙක්හි කුමකට පැමිණ කුමකට පැමිණිතැනැත්තාහට නිරවශෙෂව අප්‍ර වෘත්තිවශයෙන් නිරුද්ධවත්නාහුදැයි කියාය. කෙවට්ටය, මෙසේ විචාළකල්හි ශක්‍රදෙවෙන්‍ද්‍රතෙම ඒ භික්‍ෂුවට මේ වචනය මෙසේ කියේය. මහණ, පඨවිධාතු, ආපොධාතු, තෙජොධාතු, වායොධාතු යන මේ සතරමහාභූතයෝ යම්තැනක නිරවශෙෂව අප්‍රවෘත්තිවශ යෙන් නිරුද්ධවත්නාහුදැයි යන මේ කාරණය මමද නොදනිමි. මහණ, අපටවඩා ඉතා රූපසම්පත්ත්‍යාදියෙන් යුක්තවූද, වර්‍ණයශෛශ්වය‍ර්‍ය්‍යා දියෙන් උත්තමතරවූද, යාමනම් දෙවිකෙනෙක් ඇත්තාහුය.

තෙ ඛො එතං ජානෙය්‍යුං යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථීදං පඨවීධාතු—පෙ—වායොධාතු. අථ ඛො සො කෙවට්ට භික්ඛු යෙන යාමාදෙවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා යාමෙ දෙවෙ එතදවොච.

8. කත්ථ නු ඛො ආවුසො ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථීදං පඨවීධාතු—පෙ— වායොධාතූති. එවං වුත්තෙ කෙවට්ට යාමාදෙවා තං භික්ඛුං එතදවොචුං. මයම්පි ඛො භික්ඛු න ජානාම යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථීදං පඨවිධාතු—පෙ—වායොධාතු අත්ථි ඛො භික්ඛු සුයාමො නාම දෙවපුත්තො අම්හෙහි අභික්කන්තතරො ච පණීතතරො ච සො ඛො එතං ජානෙය්‍ය යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථීදං පඨවිධාතු—පෙ—වායොධාතූති. අථ ඛො සො කෙවට්ට භික්ඛු යෙන සුයාමො දෙවපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා සුයාමං දෙවපුත්තං එතදවොච.

පඨවිධාතු, ආපොධාතු, තෙජොධාතු, වායොධාතු යන මේ සතරමහාභූතයෝ යම්තැනක නිරවශෙෂව අප්‍රවෘත්තිවශයෙන් නිරුද්ධවන්නාහුද යන මේ කාරණය ඒ යාමදෙවියෝ දන්නාහුය. කෙවට්ටය, ඉක්බිත්තෙන් ඒ භික්ෂුතෙම යාමදෙවියෝ යම්තැනකද එතනට එළඹියේය. එළඹ යාමදෙවියන්ගෙන් මේ කාරණය විචාළේය.

8. ඇවැත්නි, පඨවිධාතු, ආපොධාතු, තෙජොධාතු, වායොධාතු යන මේ සතරමහාභූතයෝ කවරතැනෙක්හි කුමකට පැමිණ කුමකට පැමිණිතැනැත්තාහට නිරවශෙෂව අප්‍රවෘත්තිවශයෙන් නිරුද්ධවන්නාහුදැයි කියාය. කෙවට්ටය, මෙසේ විචාළකල්හි යාමදෙවියෝ ඒ භික්ෂුවට මේ වචනය කීවෝය. මහණ, යම්තැනක පඨවිධාතු, ආපොධාතු, තෙජොධාතු, වායොධාතු යන මේ සතරමහාභූතයෝ නිරවශෙෂව අප්‍රවෘත්තිවශයෙන් නිරුද්ධවන්නාහුද යන මේ කාරණය අපිදු නොදනිමු. මහණ, අපටවඩා ඉතා රූපසම්පත්ත්‍යාදියෙන් යුක්තවූද, වර්ණයශෛශ්චර්‍ය්‍යාදියෙන් උත්තමතරවූද, සුයාමනම් දිව්‍යපුත්‍රයෙක් ඇත්තේය. ඒ දිව්‍යපුත්‍රතෙම යම්තැනක පඨවිධාතු, ආපොධාතු, තෙජොධාතු, වායොධාතු යන මේ සතරමහාභූතයෝ නිරවශෙෂව අප්‍රවෘත්තිවශයෙන් නිරුද්ධවන්නාහුද යන මේ කාරණය දන්නේය. කෙවට්ටය, ඉක්බිත්තෙන් ඒ භික්ෂුතෙම සුයාමදිව්‍යපුත්‍රතෙම යම්තැනකද එතනට එළඹියේය. එළඹ සුයාමදිව්‍යපුත්‍රයාගෙන් මේ කාරණය විචාළේය.

කත්ථනුඛො ආවුසො ඉමෙ චත්තාරෙ මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පඨවීධාතු ...පෙ... වායොධාතූති. එවං වුත්තෙ කෙවට්ට සුයාමො දෙවපුත්තො තං භික්ඛුං එතදවොච. අහම්පි ඛො භික්ඛු න ජානාමි යත්ථ මෙ චත්තාරෙ මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පඨවීධාතු ...පෙ... වායොධාතූති. අත්ථි ඛො භික්ඛු තුසිතානාමදෙවා අම්හෙහි අභික්කන්තතරාච පණීතතරාච තෙ ඛො එතං ජානෙය්‍යුං යත්ථ මෙ චත්තාරෙ මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පඨවීධාතු ...පෙ... වායොධාතූති. අථ ඛො සො කෙවට්ට භික්ඛු යෙන තුසිතාදෙවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තුසිතෙ දෙවෙ එතදවොච. කත්ථනු ඛො ආවුසො ඉමෙ චත්තාරෙ මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පඨවීධාතු ...පෙ... වායොධාතූති. එවං වුත්තෙ කෙවට්ට තුසිතාදෙවා තං භික්ඛුං එතදවොචුං.

ඇවැත්නි, පඨවීධාතු, ආපොධාතු, තෙජොධාතු, වායොධාතු යන මේ සතරමහාභූතයෝ කවරතැනෙක්හි කුමකට පැමිණ කුමකට පැමිණිතැනැත්තාහට නිරවශෙෂව අප්‍රවෘත්තිවශයෙන් නිරුඬවන්නාහුදැයි කියාය. කෙවට්ටය, මෙසේ විචාළකල්හි සුයාමදිව්‍යපුත්‍රතෙම ඒ භික්ෂුවට මේ වචනය කීයේය. මහණ, පඨවිධාතු, ආපොධාතු, තෙජොධාතු, වායොධාතු යන මේ සතරමහාභූතයෝ යම්තැනක නිරවශෙෂව අප්‍රවෘත්තිවශයෙන් නිරුඬවන්නාහුද යන මේ කාරණය මමද නොදනිමි. මහණ, අපට වඩා ඉතා රූපසම්පත්ත්‍යාදියෙන් යුක්තවූද, වර්ණයශෙශ්වය්‍ය්‍යාදියෙන් උත්තම්තරවූද, තුසිතනම් දෙව්‍යෙකනෙක් ඇත්තාහුය. පඨවීධාතු, ආපොධාතු, තෙජොධාතු, වායොධාතු යන මේ සතරමහාභූතයෝ යම්තැනක නිරවශෙෂව අප්‍රවෘත්තිවශයෙන් නිරුඬවන්නාහුද යන මේ කාරණය ඒ තුසිත දෙවියෝ දන්නාහුය. කෙවට්ටය, ඉක්බිත්තෙන් ඒ භික්ෂුතෙම තුසිපුරවැසි දෙවියෝ යම්තැනෙක්හිද එතනට එළඹියේය. එළඹ තුසිපුරවැසි දෙවියන්ගෙන් මේ කාරණය විචාළේය. ඇවැත්නි, පඨවීධාතු, ආපොධාතු, තෙජොධාතු යන මේ සතරමහාභූතයෝ කවරතැනෙක්හි කුමකට පැමිණ කුමකට පැමිණිතැනැත්තාහට නිරවශෙෂව අප්‍රවෘත්තිවශයෙන් නිරුඬවන්නාහුදැයි කියාය. කෙවට්ටය, මෙසේ විචාළකල්හි තුසිපුරවැසි දෙවියෝ ඒ භික්ෂුවට මේ වචනය කීවෝය.

9. මයම්පි ඛො භික්ඛු න ජානාම යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථීදං පඨවීධාතු ...පෙ... වායොධාතූති. අත්ථි ඛො භික්ඛු සන්තුසිතො නාම දෙවපුත්තො අම්හෙහි අභික්කන්තතරො ච පණීතතරො ච සො ඛො එතං ජානෙය්‍ය. යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථීදං පඨවිධාතු ...පෙ... වායොධාතූති. අථ ඛො සො කෙවට්ට භික්ඛු යෙන සන්තුසිතො නාම දෙවපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා සන්තුසිතං දෙවපුත්තං එතදවොච කත්ථ නු ඛො ආවුසො ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථීදං පඨවීධාතු ...පෙ... වායොධාතූති. එවං වුත්තෙ කෙවට්ට සන්තුසිතො දෙවපුත්තො තං භික්ඛුං එතදවොච. අහම්පි ඛො භික්ඛු න ජානාමි, යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථීදං පඨවීධාතු ...පෙ... වායොධාතූති. අත්ථි ඛො භික්ඛු නිම්මානරතී නාම දෙවා අම්හෙහි අභික්කන්තතරා ච පණීතතරා ච.

---

9. මහණ, පඨවිධාතු, ආපොධාතු, තෙජොධාතු, වායොධාතු යන මේ සතරමහාභූතයෝ යම්තැනක නිරවශෙෂව අප්‍රවෘත්තිවශයෙන් නිරුද්ධවන්නාහුද යන මේ කාරණය අපිද නොදනුම්හ. මහණ, අපට වඩා ඉතා රූපසම්පත්ත්‍යාදියෙන් යුක්තවූද, වර්ණයශෛශ්වර්‍ය්‍යාදියෙන් උත්තමතරවූද, සන්තුෂිතනම් දිව්‍යපුත්‍රයෙක් ඇත්තේය. පඨවිධාතු, ආපොධාතු, තෙජොධාතු, වායොධාතු යන මේ සතරමහාභූතයෝ යම්තැනක නිරවශෙෂව අප්‍රවෘත්තිවශයෙන් නිරුද්ධවන්නාහුද යන මේ කාරණය ඒ සන්තුෂිත දිව්‍යපුත්‍රතෙම දන්නේය. කෙවට්ටය, ඉක්බිත්තෙත් ඒ භික්ෂුතෙම සන්තුෂිත දිව්‍යපුත්‍රතෙම යම්තැනකද එතනට එළඹියේය. එළඹ සන්තුෂිත දිව්‍යපුත්‍රයාගෙන් මේ කාරණය විචාළේය. ඇවැත්නි, පඨවිධාතු, ආපොධාතු, තෙජොධාතු, වායොධාතු යන මේ සතරමහාභූතයෝ කවරතැනෙක්හි කුමකට පැමිණ කුමකට පැමිණිතැනැත්තාහට නිරවශෙෂව අප්‍රවෘත්තිවශයෙන් නිරුද්ධවන්නාහුදැයි කියාය. කෙවට්ටය, මෙසේ විචාළකල්හි සන්තුෂිත දිව්‍යපුත්‍රතෙම ඒ භික්ෂුවට මේ වචනය කීයේය. මහණ, පඨවීධාතු, ආපොධාතු, තෙජොධාතු, වායොධාතු යන මේ සතරමහාභූතයෝ යම්තැනක නිරවශෙෂව අප්‍රවෘත්තිවශයෙන් නිරුද්ධවන්නාහුද යන මේ කාරණය මමද නොදනිමි. මහණ, අපට වඩා ඉතා රූපසම්පත්ත්‍යාදියෙන් යුක්තවූද, වර්ණයශෛශ්වර්‍ය්‍යාදියෙන් උත්තමතරවූද, නිර්මාණරතීනම් දෙවිකෙනෙක් ඇත්තාහුමය.

තෙ ඛො එතං ජානෙය්‍යුං. යත්‍ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථීදං පඨවීධාතු—පෙ—වායොධාතූති. අථ ඛො සො කෙවට්ට භික්ඛු යෙන නිම්මානරතී දෙවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්‍වා නිම්මානරතී දෙවෙ එතදවොච. කත්‍ථනු ඛො ආවුසො ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථීදං පඨවීධාතු—පෙ—වායොධාතූති. එවං වුත්තෙ කෙවට්ට නිම්මානරතී දෙවා තං භික්ඛුං එතදවොචුං. මයම්පි ඛො භික්ඛු නජානාම යත්‍ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථීදං පඨවීධාතු—පෙ—වායොධාතූති. අත්‍ථි ඛො භික්ඛු සුනිම්මිතො නාම දෙවපුත්තො අම්හෙහි අභික්කන්තතරොච පණීතතරොච සො ඛො එතං ජානෙය්‍ය යත්‍ථිමෙචත්තාරො මහාභූතාඅපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථීදං පඨවීධාතු—පෙ—වායොධාතූති. අථ ඛො සො කෙවට්ට භික්ඛු යෙන සුනිම්මිතො දෙවපුත්තො තෙනුපසඞ්කමි,

---

පඨවීධාතු, ආපොධාතු, තෙජොධාතු, වායොධාතු යන මේ සතරමහා භූතයෝ යම්තැනක නිරවශෙෂව අප්‍රවෘත්තිවශයෙන් නිරුඬවන්නා හුද යන මේ කාරණය ඒ දෙවියෝ දන්නාහුය. කෙවට්ටය, ඉක්බිත්තෙන් ඒ භික්ෂුතෙම නිර්‍මාණරතී දෙවියෝ යම්තැනකද එත නට එළඹියේය. එළඹ නිර්‍මාණරතී දෙවියන්ගෙන් මේ කාරණය විචාළේය. ඇවැත්නි, පඨවීධාතු, ආපොධාතු, තෙජොධාතු, වායොධාතු යන මේ සතරමහා භූතයෝ කවරතැනෙක්හි කුමකට පැමිණ කුම කට පැමිණිතැනැත්තාහට නිරවශෙෂව අප්‍රවෘත්තිවශයෙන් නිරුඬ වන්නාහුදැයි කියාය. කෙවට්ටය, මෙසේ විචාළකල්හි නිර්‍මාණරතී දෙවියෝ ඒ භික්ෂුවට මේ කාරණය කීවෝය. මහණ, පඨවීධාතු, ආපොධාතු, තෙජොධාතු, වායොධාතු යන මේ සතරමහාභූතයෝ යම්තැනක නිරවශෙෂව අප්‍රවෘත්තිවශයෙන් නිරුඬවන්නාහුද යන මේ කාරණය අපිද නොදනුම්හ. මහණ, අපටවඩා ඉතා රූපසම් පත්ත්‍යාදියෙන් යුක්තවූද, වර්‍ණයශෞශ්වර්‍ය්‍යාදියෙන් උත්තමතරවූද සුනිර්මිතනම් දිව්‍යපුත්‍රයෙක් ඇත්තේය. පඨවීධාතු, ආපොධාතු, තෙජොධාතු, වායොධාතු යන මේ සතරමහාභූතයෝ යම්තැනක නිරුඬවන්නාහුද යන මේ කාරණය ඒ සුනිර්මිත දිව්‍යපුත්‍රතෙම දන්නේය. කෙවට්ටය, ඉක්බිත්තෙන් ඒ භික්ෂුතෙම සුනිර්මිත දිව්‍ය පුත්‍රතෙම යම්තැනකද එතනට එළඹියේය. එළඹ සුනිර්මිත දිව්‍යපුත්‍ර යාගෙන් මේ කාරණය විචාළේය.

10. කත්ථ නු ඛො ආවුසො ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථීදං පඨවීධාතු—පෙ—වායොධාතූති. එවං වුත්තෙ කෙවට්ට සුනිම්මිතො දෙවපුත්තො තං භික්ඛුං එතදවොච අහම්පි ඛො භික්ඛු න ජානාමි යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථීදං පඨවීධාතු—පෙ—වායොධාතූති. අත්ථි ඛො භික්ඛු පරනිම්මිතවසවත්ති නාම දෙවා අම්හෙහි අභික්කන්තතරා ච පණීතතරා ච තෙ ඛො එතං ජානෙය්‍යුං. යත්ථ මෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථීදං පඨවීධාතු—පෙ—වායොධාතූති. අථ ඛො සො කෙවට්ට භික්ඛු යෙන පරනිම්මිතවසවත්තිදෙවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පරනිම්මිතවසවත්තිදෙවෙ එතදවොච, කත්ථ නු ඛො ආවුසො ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථීදං පඨවීධාතු—පෙ—වායොධාතූති. එවං වුත්තෙ කෙවට්ට පරනිම්මිතවසවත්තිදෙවා තං භික්ඛුං එතදවොචුං.

---

10. ඇවැත්නි, පඨවීධාතු, ආපොධාතු, තෙජොධාතු, වායොධාතු යන මේ සතරමහාභූතයෝ කවරතැනෙක්හි ක්‍රමකට පැමිණ ක්‍රමකට පැමිණීතැනැත්තාහට නිරවශෙෂව අප්‍රවෘත්තිවශයෙන් නිරුඬවන්නාහුදැයි කියාය. කෙවට්ටය, මෙසේ විචාළකල්හි සුනිර්මිතනම්වූ දිව්‍යපුත්‍රතෙම ඒ භික්ෂුවට මෙසේ කීයේය. මහණ, පඨවීධාතු, ආපොධාතු, තෙජොධාතු, වායොධාතු යන මේ සතරමහාභූතයෝ යම්තැනක නිරවශෙෂව අප්‍රවෘත්තිවශයෙන් නිරුඬවන්නාහුදැයි යන මේ කාරණය මමද නොදනිමි. මහණ, අපටවඩා ඉතා රූපසම්පත්ත්‍යාදියෙන් යුක්තවූද, වර්ණයශෛශ්වර්‍ය්‍යාදියෙන් උත්තමතරවූද, පරනිර්මිතවශවර්ති නම් දෙවිකෙනෙක් ඇත්තාහුය. පඨවීධාතු, ආපොධාතු, තෙජොධාතු, වායොධාතු යන මේ සතරමහාභූතයෝ යම්තැනක නිරවශෙෂව අප්‍රවෘත්තිවශයෙන් නිරුඬවන්නාහුදැයි යන මේ කාරණය ඒ පරනිර්මිතවශවර්තිදෙවියෝ දන්නාහුය. කෙවට්ටය, ඉක්බිත්තෙන් ඒ භික්ෂුතෙම පරනිර්මිතවශවර්තිදෙවියෝ යම්තැනකද එතනට එළඹියේය. එළඹ පරනිර්මිතවශවර්ති දෙවියන්ගෙන් මේ කාරණය විචාළේය. ඇවැත්නි, පඨවීධාතු, ආපොධාතු, තෙජොධාතු, වායොධාතු යන මේ සතරමහාභූතයෝ කවරතැනෙක්හි ක්‍රමකට පැමිණ ක්‍රමකට පැමිණීතැනැත්තාහට අප්‍රවෘත්තිවශයෙන් නිරුඬවන්නාහුදැයි කියාය. කෙවට්ටය, මෙසේ විචාළකල්හි පරනිර්මිතවශවර්ති දෙවියෝ ඒ භික්ෂුවට මේ වචනය කීවෝය.

මයම්පි ඛො භික්ඛු නජානාම යත්‍ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථිදං පඨවීධාතු—පෙ—වායො ධාතූති. අත්‍ථි ඛො භික්ඛු වසවත්ති නාම දෙවපුත්තො අම්හෙහි අභික්කන්තතරොච පණීතතරොච. සො ඛො එතං ජානෙය්‍ය යත්‍ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පඨවිධාතු—පෙ—වායොධාතූති. අථ ඛො සො කෙවට්ට භික්ඛු යෙන වස වත්ති දෙවපුත්තො තෙනුපසඞ්කමි උපසඞ්කමිත්‍වා වසවත්තිං දෙව පුත්තං එතදවොච. කත්‍ථනු ඛො ආවුසො ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පඨවීධාතු—පෙ—වායො ධාතූති. එවං වුත්තෙ කෙවට්ට වසවත්ති දෙවපුත්තො තං භික්ඛුං එතදවොච අහම්පි ඛො භික්ඛු නජානාමි යත්‍ථිමෙ චත්තාරො මහා භූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථිදං පඨවීධාතු—පෙ— වායොධාතූති. අත්‍ථි ඛො භික්ඛු බ්‍රහ්මකායිකානාම දෙවා අම්හෙහි අභික්කන්තතරාච පණීතතරාච.

මහණ, පඨවීධාතු, ආපොධාතු, තෙජොධාතු, වායොධාතු යන මේ සත රමහාභූතයෝ යම්තැනක නිරවශෙෂව අප්‍රවෘත්තිවශයෙන් නිරුඬ වන්නාහුද යන මේ කාරණය අපිද නොදනුම්හ. මහණ, අපටවඩා ඉතා රූපසම්පත්ත්‍යාදියෙන් යුක්තවූද, වර්‍ණයශෞශව‍ය‍ෂ්‍යාදියෙන් උත්තමතරවූද, වශවර්තිනම් දිව්‍යපුත්‍රයෙක් ඇත්තේමය. පඨවිධාතු, ආපොධාතු, තෙජොධාතු, වායොධාතු යන මේ සතරමහාභූතයෝ යම්තැනක නිරවශෙෂව අප්‍රවෘත්තිවශයෙන් නිරුඬවන්නාහුද යන මේ කාරණය ඒ වශවර්තිදිව්‍යපුත්‍රතෙම දන්නේය. කෙවට්ටය, ඉක් බිත්තෙන් ඒ භික්ෂුතෙම වශවර්තිදිව්‍යපුත්‍රතෙම යම්තැනකද එත නට එළඹියේය. එළඹ වශවර්තිදිව්‍යපුත්‍රයාගෙන් මේ කාරණය විචා ළේය. ඇවැත්නි, පඨවීධාතු, ආපොධාතු, තෙජොධාතු, වායොධාතු යන මේ සතරමහාභූතයෝ කවරතැනෙක්හි ක්‍රමකට පැමිණ ක්‍රමකට පැමිණීතැනැත්තාහට නිරවශෙෂව අප්‍රවෘත්තිවශයෙන් නිරුඬවන් නාහුදැයි කීයාය. කෙවට්ටය, මෙසේ විචාළකල්හි වශවර්තිදිව්‍යපුත්‍ර තෙම ඒ භික්ෂුවට මේ වචනය කීයේය. මහණ, පඨවීධාතු, ආපො ධාතු, තෙජොධාතු, වායොධාතු යන මේ සතරමහාභූතයෝ යම් තැනක නිරවශෙෂව අප්‍රවෘත්තිවශයෙන් නිරුඬවන්නාහුද යන මේ කාරණය මමද නොදනිමි. මහණ, අපටවඩා ඉතා රූපසම්පත්ත්‍යාදි යෙන් යුක්තවූද, වර්‍ණයශෞශව‍ය‍ෂ්‍යාදියෙන් උත්තමතරවූද, බ්‍රහ්ම කායිකනම් දෙවිකෙනෙක් ඇත්තාහුය.

11. තෙ ඛො එතං ජානෙය්‍යුං යත්‍ථ මෙ චත්තාරො මහාභූතා අප රිසෙසා නිරුජ්ඣන්‍ති. සෙය්‍යථිදං පඨවීධාතු—පෙ—වායොධා තූති. අථ ඛො සො කෙවට්ට භික්ඛු තථාරූපං සමාධිං සමාපජ්ජිත්වා යථා සමාහිතෙ චිත්තෙ බ්‍රහ්මයානියො මග්ගො පාතුරහොසි අථ ඛො සො කෙවට්ට භික්ඛු යෙන බ්‍රහ්මකායිකා දෙවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා බ්‍රහ්මකායිකෙ දෙවෙ එතදවොච කත්‍ථනුඛො ආවුසො ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්‍ති. සෙය්‍යථිදං පඨ විධාතු—පෙ—වායොධාතූති. එවං වුත්තෙ කෙවට්ට බ්‍රහ්මකා යිකා දෙවා තං භික්ඛුං එතදවොචුං මයම්පි ඛො භික්ඛු නජානාම යත්‍ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්‍ති සෙය්‍යථිදං පඨවීධාතු—පෙ—වායොධාතූති අත්‍ථි ඛො භික්ඛු බ්‍රහ්මා මහා බ්‍රහ්මා අභිභූ අනභිභූතො අඤ්ඤදත්‍ථු දසො වසවත්ති ඉස්සරො කත්තා නිම්මිතා සෙට්ඨො සජ්ජිතා වසීපිතා භූතභව්‍යානං අම්හෙහි අභික්කන්තතරො ච පණීතතරො ච.

---

11. පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු යනමේ සතර මහාභූතයෝ යම්තැනක නිරවශෙෂව අප්‍රවෘත්ති වශයෙන් නිරුඬ වන්නාහුද යන මේ කාරණා ඒ බ්‍රහ්මකායික දෙවියෝ දන්නාහුය, කෙවට්ටය, ඉක්බිත්තෙන් ඒ භික්ෂුතෙම යම්පරිද්දෙකින් සිත එකඟ වූකල්හි බ්‍රහ්ම සෘඬිවිධඥනයයි කියනලද බඹලොවට යන මාර්ගය තෙම පහළවූයේද එබඳුවූ සමාධියට සමවැදුනේය, කෙවට්ටය, ඉක් බිත්තෙන් ඒ භික්ෂුතෙම බ්‍රහ්මකායික දෙවියෝ යම්තැනකද එතනට එළඹියේය. එළඹ බ්‍රහ්මකායික දෙවියන්ගෙන් මේකාරණය විචා ළේය. ඇවැත්නි, පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු යන මේ සතරමහාභූතයෝ කවරතැනෙක්හි කුමකට පැමිණ කුමකට පැමිණි තැනැත්තාහට නිරවශෙෂව අප්‍රවෘත්තිවශයෙන් නිරුඬවන් නාහුද්‍යයි කියාය. කෙවට්ටය, මෙසේ විචාළකල්හි බ්‍රහ්මකායික දෙවියෝ ඒ භික්ෂුවට මේ වචනය කීවෝය, මහණ, පඨවීධාතු ආපො ධාතු තෙජොධාතු වායොධාතු යනමේ සතරමහාභූතයෝ යම්තැනක නිරවශෙෂව අප්‍රවෘත්ති වශයෙන් නිරුඬවන්නාහුද යනමේ කාර ණය අපිද නොදනුම්හ, මහණ, අපට වඩා ඉතා රූපසම්පත්‍යාදියෙන් යුක්තවූද වර්ණයශෙශවයශ්‍යාදියෙන් උත්තමතරවූද සියල්ලන් මැඩ පවත්වා සිටියාවූද අන්‍යයන්විසින් මැඩපැවැත්විය නොහැක්කාවූද එකාන්තයෙන් සියල්ල සියලුජනයා වසයෙහි පවත්වන්නාවූ ලොක යෙහිඊශ්වරවූ ලොකයට කර්තෘවූ ලොකය නිර්මාණය කරන්නාවූ ලොක යාට උත්තමවූ සත්වයන් කොට්ඨාසවලට බෙදන්නාවූ පුරුදුකරණ ලද වසිතාවන් ඇත්තාවූ උපන්නාවූද උපදින්නාවූද සියලු සත්ව යන්ටපියවූ මහාබ්‍රහ්මවූ බ්‍රහ්මයෙක් ඇත්තේය.

සො ඛො එතං ජිනෙය්‍ය යත්පි මෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථීදං පඨවීධාතු-පෙ-වායොධාතූති කහං පනාවුසො එතරහි සො මහාබ්‍රහ්මාති මයම්පි ඛො භික්ඛු නජානාම යත්‍ථ බ්‍රහ්මා යෙනවා බ්‍රහ්මායතිවො බ්‍රහ්මා අපිච භික්ඛුයථා නිමිත්තා දිස්සන්ති ආලොකො සඤ්ජායති ඔභාසො පාතුභවති බ්‍රහ්මා පාතු භවිස්සති, බ්‍රහ්මුනො එකං පුබ්බනිමිත්තං පාතුභාවාය යදිදංආලොකො සඤ්ජායති ඔභාසො පාතුභවතීති. අථ ඛො සො කෙවට්ට මහා බ්‍රහ්මා නචිරස්සෙව පාතුරහොසි අථ ඛො සො කෙවට්ට භික්ඛු යෙන සො මහාබ්‍රහ්මාතෙනුපසඞ්කමි උපසඞ්කමිත්‍වා බ්‍රහ්මාණං එතදවොචකත්‍ථනුඛො ආවුසො ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථීදංපඨවීධාතු-පෙ-වායොධාතූති.

12. එවං වුත්තෙ කෙවට්ට සො මහාබ්‍රහ්මානං භික්ඛුං එතදවොච අහමස්මි භික්ඛු බ්‍රහ්මා මහාබ්‍රහ්මා අභිභූ අනභිභූතො අඤ්ඤදත්‍ථුදසො වසවත්ති ඉස්සරො.

පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු යනමේ සතර මහාභූතයෝ යම්තැනක නිරවශෙෂව අප්‍රවෘත්තිවශයෙන් නිරුඬ වන්නාහුද යනමේ කාරණය හෙතෙම දන්නේය. ඇවැත්නි, ඒ මහාබ්‍රහ්මතෙම දූත් කොතැන්හිදැයි ඇසූයේය. මහණ බ්‍රහ්මතෙම යම්තැනකදැයි කියාහෝ බ්‍රහ්මතෙම යමස්ථානයකදැයි කියාහෝ බ්‍රහ්මතෙම යම්බඳුතැනකයයි කියාහෝ අපි නොදනුම්හ. මහණ, එසේද වුවත් යම්සේ නිමිති දක්නා ලැබෙත්ද ආලෙකයෙක් හටගණීද ඔභාෂයෙක් පහළවේද එකල බ්‍රහ්මතෙම පහළවන්නේය. ආලොකය හටගණීද ඔභාෂයෙක් පහළවේද යනමේ එක් පූර්විනිමිත්තෙක් බ්‍රහ්මයාගේ පළවීම පිණිස ඇත්තේය. කෙවට්ටය, ඉක්බිත්තෙන් ඒ මහාබ්‍රහ්මතෙම නොබෝ වේලාවකින්ම පහළවූයේය. කෙවට්ටය, ඉක්බිත්තෙන් ඒ භික්ෂුතෙමේ මහාබ්‍රහ්මතෙම යම්තැනකද එතනට එළඹියේය, එළඹ බ්‍රහ්මයාගෙන් මේකාරණය විචාළේය, ඇවැත්නි. පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු යනමේ සතරමහාභූතයෝ කවරතැනෙක්හි කුමකට පැමිණ කුමකට පැමිණී තැනැත්තාහට නිරවශෙෂව අප්‍රවෘත්ති වශයෙන් නිරුඬවන්නාහුදැයි කියාය.

12. කෙවට්ටය, මෙසේ විචාළකල්හි ඒ මහාබ්‍රහ්මතෙම ඒ භික්ෂුහට මෙසේ කීයේය. මහණ, මම බ්‍රහ්ම වෙමි, මහාබ්‍රහ්ම වෙමි, සියල්ලන් මැඩපවත්වා සිටින්නාවූ ජ්‍යෙෂ්ඨ වෙමි, අන්‍යයන්විසින් මැඩ පැවැත්වියනොහැක් කෙම් වෙමි, එකාන්තයෙන් සියල්ල දක්නෙමි සියලුජනයා වසගයෙහි පවත්වමි, ලොවට ඊශ්වර වෙමි,

කත්තා නිම්මාතා සෙට්ඨො සඤ්ජිතා වසී පිතා භූතභව්‍යානන්ති. දුතියම්පි ඛො කෙවට්ට සො භික්ඛු තං බ්‍රහ්මානං එතදවොච. නඛො අහං තං ආවුසො එවං පුච්ඡාමි ත්වමසි බ්‍රහ්මා මහාබ්‍රහ්මා අභිභූ අනභිභූතො අඤ්ඤදත්ථු දසො වසවත්ති ඉස්සරො කත්තා නිම්මාතා සෙට්ඨො සඤ්ජිතා වසී පිතා භූතභව්‍යානන්ති. එවඤ්ච ඛො අහං තං ආවුසො පුච්ඡාමි කත්ථනුඛො ආවුසො ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථීදං, පඨවිධාතු ...පෙ... වායොධාතූති. දුතියම්පි ඛො කෙවට්ට සො මහාබ්‍රහ්මා තං භික්ඛුං එතදවොච. අහමස්මි භික්ඛු බ්‍රහ්මා මහාබ්‍රහ්මා අභිභූ අනභිභූතො අඤ්ඤදත්ථු දසො වසවත්ති ඉස්සරො කත්තා නිම්මාතා සෙට්ඨො සඤ්ජිතා වසී පිතා භූතභව්‍යානන්ති.

ලොකයට කර්තෘ වෙමි, ලොකයනිර්මාණයකරන්නෙක් වෙමි, ලොකයාට උත්තම වෙමි, සත්ත්වයන් කොට්ඨාසවලට බෙදන්නෙක් වෙමි, පුරුදු කරණලද වසිතා ඇත්තෙමි, උපන්නාවූද උපදින්නාවූද සියලු සත්ත්වයන්ට පිය වෙමි, කෙවට්ටය, දෙවනුවද ඒ භික්ෂුතෙම ඒ මහාබ්‍රහ්මයාට මේ කාරණය කීයේය. ඇවැත්නි, මම තා මෙසේ නොවිචාරමි. කෙසේද, තෝ බ්‍රහ්මවූයෙහිද, මහාබ්‍රහ්මවූයෙහිද, සියල්ලන් මැඩ පවත්වාසිටින ජ්‍යෙෂ්ඨවූයෙහිද, අන්‍යයන්විසින් මැඩපැවැත්විය නොහැක්කෙක්වූයෙහිද, එකාන්තයෙන් සියල්ලදක්නෙක්වූයෙහිද, සියලුජනයා වසයෙහි පවත්වන්නෙක්වූයෙහිද, ලොවට ඊශ්වරවූයෙහිද, ලොකයට කර්තෘවූයෙහිද, ලොකය නිර්මාණකරන්නෙක්වූයෙහිද, ලොකයට උත්තමවූයෙහිද, සත්ත්වයන් කොට්ඨාසවලට බෙදන්නෙක්වූයෙහිද, පුරුදුකරණලද වසිතා ඇත්තෙක්වූයෙහිද, උපන්නාවූද උපදින්නාවූද සියලු සත්ත්වයන්ට පියවූයෙහිදැයි කියායි. ඇවැත්නි, මම තා මෙසේ විචාරමි. ඇවැත්නි, පඨවිධාතු, ආපොධාතු, තෙජොධාතු, වායොධාතු යන මේ සතරමහාභූතයෝ කවරතැනෙක්හි කුමකට පැමිණ කුමකට පැමිණිතැනැත්තාහට නිරවශෙෂව අප්‍රවෘත්තිවශයෙන් නිරුද්ධවන්නාහුදැයි කියාය. කෙවට්ටය, දෙවනුවද ඒ මහාබ්‍රහ්මතෙම ඒ භික්ෂුහට මෙසේ කීයේය. මහණ, මම බ්‍රහ්ම වෙමි, මහාබ්‍රහ්ම වෙමි, සියල්ලන් මැඩපවත්වා සිටින්නාවූ ජ්‍යෙෂ්ඨ වෙමි; අන්‍යයන්විසින් මැඩපැවැත්වියනොහැක්කෙම් වෙමි. එකාන්තයෙන් සියල්ලදක්නෙමි, සියලුජනයා මාගේ වසයෙහි පවත්වමි, ලොවට ඊශ්වර වෙමි, ලොකයට කර්තෘ වෙමි, ලොකය නිර්මාණය කරන්නෙම් වෙමි, ලොකයාට උත්තම වෙමි, සත්ත්වයන් කොට්ඨාසවලට බෙදන්නෙක් වෙමි, පුරුදුකරණලද වසිතාවන් ඇත්තෙමි, උපන්නාවූද උපදින්නාවූද සියලු සත්ත්වයන්ට පියවෙමි කියාය.

තතියම්පි බො කෙවට්ට සො භික්ඛු නං මහාබ්‍රහ්මානං එතදවොච. නබො අහං තං ආවුසො එවං පුච්ඡාමි. ත්වමසි බ්‍රහ්මා මහාබ්‍රහ්මා අභිභූ අනභිභූතො අඤ්ඤදත්ථු දසො වසවත්තී ඉස්සරො. කත්තා නිම්මාතා සෙට්ඨො සජ්ජිතා වසී පිතා භූතභව්‍යානන්ති. එවඤ්ච බො අහං තං ආවුසො පුච්ඡාමි කත්ථනුබො ආවුසො ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං, පඨවිධාතු—පෙ—වායො ධාතූති.

13. අථ බො සො කෙවට්ට මහාබ්‍රහ්මා නං භික්ඛුං බාහාය ගහෙත්වා එකමන්තං අපනෙත්වා නං භික්ඛුං එතදවොච. ඉමෙ බො මං භික්ඛු බ්‍රහ්මකායිකා දෙවා එවං ජානන්ති නත්ථි කිඤ්චි බ්‍රහ්මුනො අදිට්ඨං නත්ථි කිඤ්චි බ්‍රහ්මුනො අවිදිතං නත්ථි කිඤ්චි බ්‍රහ්මුනො අසච්ඡිකතන්ති. තස්මා අහං තෙසං සම්මුඛා න ව්‍යාකාසිං.

කෙවට්ටය, තුන්වෙනුවද ඒ භික්ෂුතෙම ඒ මහාබ්‍රහ්මයාට මෙසේ කීයේය. ඇවැත්නි, මම තා මෙසේ නොවිචාරමි. කෙසේද, තෝ බ්‍රහ්මවූයෙහිද, මහාබ්‍රහ්මවූයෙහිද, සියල්ලන් මැඩපවත්වාසිටින්නාවූ ජ්‍යෙෂ්ඨවූයෙහිද, අන්‍යයන්විසින් මැඩපැවැත්වියනොහැක්කෙක්වූයෙහිද, එකාන්තයෙන් සියල්ලදක්නෙක්වූයෙහිද, සියලුජනයා තමාගේ වසයෙහි පවත්නෙක්වූයෙහිද, ලොවට ඊශ්වරවූයෙහිද. ලොකයාට කර්තෘවූයෙහිද, ලොකය නිර්මාණයකරන්නෙක්වූයෙහිද, ලෝකයාට උත්තමවූයෙහිද, සත්වයන් කොට්ඨාසවලට බෙදන්නෙක්වූයෙහිද, පුරුදුකරණලද වසිතාවන් ඇත්තෙක්වූයෙහිද, උපන්නාවූද උපදින්නාවූද සියලු සත්වයන්ට පියවූයෙහිදැයි කියායි. ඇවැත්නි, මම තා මෙසේද විචාරමි. ඇවැත්නි, පඨවිධාතු, ආපොධාතු, තෙජොධාතු, වායොධාතු යන මේ සතරමහාභූතයෝ කවරතැනෙක්හි කුමකට පැමිණ කුමකට පැමිණිතැනැත්තාහට නිරවශෙෂව අප්‍රවෘත්තිවශයෙන් නිරුද්ධවන්නාහුදැයි කියායි.

13. කෙවට්ටය, ඉක්බිත්තෙන් ඒ මහාබ්‍රහ්මතෙම ඒ භික්ෂුව අත ගෙණ එකත්පසකට පමුණුවා ඒ භික්ෂුවට මේ කාරණය කීයේය. මහණ, මේ බ්‍රහ්මකායික දෙවියෝ මා මෙසේ දනිත්. මහාබ්‍රහ්මයාවිසින් නොදක්නාලද කිසිවක් නැත්තේය. මහාබ්‍රහ්මයාවිසින් නොදන්නාලද කිසිවකුත් නැත්තේය. මහාබ්‍රහ්මයාවිසින් ප්‍රත්‍යක්‍ෂනොකරණලද කිසිවකුත් නැත්තේයයි කියායි. එහෙයින් මම ඔවුන්ගේ ඉදිරියෙහි මේ කාරණය නොදන්නාබව ප්‍රකාශ නොකෙළෙමි.

අහම්පි ඛො භික්ඛු නජානාමි. යත්ථ ඉමෙ චත්තාරො මහා භූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථීදං, පඨවීධාතු—පෙ—වායොධාතූති, තස්මාතිහ භික්ඛු තුම්හෙවෙතං දුක්කතං තුම්හෙවෙතං අපරද්ධං යං ත්වං තං භගවන්තං අතිසිත්වා බහිද්ධා පරියෙට්ඨිං ආපජ්ජසි ඉමස්ස පඤ්හස්ස වෙය්‍යාකරණාය. ගච්ඡ ත්වං භික්ඛු තමෙව භගවන්තං උපසඞ්කමිත්වා ඉමං පඤ්හං පුච්ඡ. යථාච තෙ භගවා ව්‍යාකරෙති තථා නං ධාරෙය්‍යාසීති. අථ ඛො සො කෙවට්ට භික්ඛු සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය. එවමෙව ඛො බ්‍රහ්මලොකෙ අන්තරහිතො මම පුරතො පාතුරහොසි. අථ ඛො සො කෙවට්ට භික්ඛු මං අභිවාදෙත්වා එකමන්තං නිසීදි එකමන්තං නිසින්නො ඛො කෙවට්ට සො භික්ඛු මං එතදවොච. කත්ථනුඛො භන්තෙ ඉමෙ චත්තාරො මහා භූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථීදං, පඨවීධාතු, ආපොධාතු, තෙජොධාතු, වායොධාතූති.

මහණ, පඨවිධාතු, ආපොධාතු, තෙජොධාතු, වායොධාතු යන මේ සතර මහාභූතයෝ යම්තැනක නිරවශෙෂව අප්‍රවෘත්තිවශයෙන් නිරුද්ධවන්නාහුද යන මේ කාරණය මමද නොදනිමියි කියායි. මහණ, යම්හෙයකින් තුඹවහන්සේ ඒ භාග්‍යවතුන්වහන්සේ ඉක්මවා මේ ප්‍රශ්නය විසඳීමපිණිස බඹලොවදක්වා පිටත සෙවීමට පැමිණීයෙහිද මහණ, එබැවින් තුඹවහන්සේවිසින්ම මේ කාරණය වරදවා කරණලද්දේය. තුඹවහන්සේවිසින්ම මේ අපරාධයෙක් කරණලද්දේය. මහණ, තුඹවහන්සේ වැඩියමැනව. ඒ භාග්‍යවතුන්වහන්සේ වෙතටම එළඹ මේ ප්‍රශ්නය විචාළමැනව, යම්පරිද්දෙකින් භාග්‍යවතුන්වහන්සේ තුඹවහන්සේට ප්‍රකාශකරණසේක්ද, එපරිද්දෙන් එය දරාගතමැනවයි මහාබ්‍රහ්මතෙම කියේය. කෙවට්ටය, ඉක්බිත්තෙන් ඒ භික්ෂුතෙම බලඇත්තාවූ පුරුෂයෙක් හක්කළ අතක් දිගුකරන්නේ හෝ යම්සේද, දිගුකළ අතක් හකුළන්නේ හෝ යම්සේද, එපරිද්දෙන්ම බ්‍රහ්මලොකයෙන් අතුරුදහන්වූයේම මාගේ ඉදිරියෙහි පහළවූයේය. කෙවට්ටය, ඉක්බිත්තෙන් ඒ භික්ෂුතෙම මට අභිවාදනය කොට එකත්පසෙක උන්නේය. කෙවට්ටය, එකත්පසෙක උන්නාවූ ඒ භික්ෂුතෙම මා මේ ප්‍රශ්නය විචාළේය. ස්වාමිනි, පඨවිධාතු, ආපොධාතු, තෙජොධාතු, වායොධාතු යන මේ සතරමහාභූතයෝ කවරතැනෙක්හි කුමකට පැමිණ කුමකට පැමිණිතැනැත්තාහට නිරවශෙෂව අප්‍රවෘත්තිවශයෙන් නිරුද්ධවන්නාහුදැයි කියායි.

14. එවං වුත්තෙ අහං කෙවට්ට තං භික්ඛුං එතදවොචං. භූතපුබ්බං භික්ඛු සාමුද්දිකා වාණිජා තීරදස්සිං සකුණං ගහෙත්වා නාවාය සමුද්දං අජ්ඣොගාහන්ති. තෙ අතීරදක්ඛිනියා නාවාය තීරදස්සිං සකුණං මුඤ්චන්ති. සො ගච්ඡතෙව පුරත්ථිමං දිසං ගච්ඡති දක්ඛිණං දිසං ගච්ඡති පච්ඡිමං දිසං ගච්ඡති උත්තරං දිසං ගච්ඡති උඩ්ඪං ගච්ඡති අනුදිසං. සචෙ සො සමන්තා තීරං පස්සති. තථාගතකොව හොති සචෙ පන සො සමන්තා තීරං න පස්සති තමෙව නාවං පච්චාගච්ඡති. එවමෙව ඛො ත්වං භික්ඛු යතො යාව බ්‍රහ්මලොකා පරියෙසමානො ඉමස්ස පඤ්හස්ස වෙය්‍යාකරණං නාජ්ඣගා. අථ මමඤ්ඤෙව සන්තිකෙ පච්චාගතො, නඛො සො භික්ඛු පඤ්හො එවං පුච්ඡිතබ්බො කත්ථ නුඛො භන්තෙ ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථීදං, පඨවීධාතු, ආපොධාතු, තෙජොධාතු, වායොධාතූති. එවඤ්ච ඛො එසො භික්ඛු පඤ්හො පුච්ඡිතබ්බො.

---

14. කෙවට්ටය, මෙසේ විචාළකල්හි මම ඒ භික්ෂුහට මේ කාරණය කීවෙමි. මහණ, පෙර පැවති කරුණක් කියමි. සමුද්‍රයෙහි යාත්‍රාකරන් නාවූ වෙළෙන්දෝ තීරය දක්නාසුලුවූ කවුඩු, උකුසු යන මොවුන් අතුරෙන් පක්ෂියෙකු ගෙණ නැවින් සමුද්‍රයට බැසගණිත්ද ඔව්හු තීරය නොදක්නාවූ නැවින් තීරය දක්නාසුලුවූ පක්ෂියා මුදත්. ඒ පක්ෂිතෙම පෙරදිගටද යෙයි, දකුණුදිගටද යෙයි, පැළදිගටද යෙයි, උතුරුදිගටද යෙයි, උඩටද යෙයි, අනුදිගටද යෙයි, ඉදින් ඒ පක්ෂිතෙම හාත්පසින් තීරය දක්නේද එපරිද්දෙන් ගියේම වෙයි. ඉදින් ඒ පක්ෂිතෙම හාත්පසින් තීරයනොදක්නේනම් ඒ නැවටම ආපසු එයි. මහණ, එපරිද්දෙන්ම තෝ යම්හෙයකින් බ්‍රහ්මලොකයදක්වා සොයන්නේ මේ ප්‍රශ්නය විසඳන්නෙකු වෙතට නොපැමිණියෙහිද එහෙයින් නැවත මාගේ සමීපයටම පෙරළා ආයෙහිය. මහණ, ඒ ප්‍රශ්නයතෙම මෙසේ නොවිචාළයුතු. කෙසේද? ස්වාමීනි, පඨවීධාතු, ආපොධාතු, තෙජොධාතු, වායොධාතු යන මේ සතරමහාභූතයෝ කවර තැනෙක්හි කුමකට පැමිණ කුමකට පැමිණිතැනැත්තාහට නිරවශෙෂව අප්‍රවෘත්තිවශයෙන් නිරුඩවන්නාහුදැයි කියායි. මහණ, මේ ප්‍රශ්නයවූකලි මෙසේ විචාළයුතු.

කත්ථ ආපො ච පඨවී තෙජෝ වායො න ගාධති
කත්ථ දීඝඤ්ච රස්සඤ්ච අණුං ථූලං සුභාසුභං
කත්ථ නාමඤ්ච රූපඤ්ච අසෙසං උපරුජ්ඣතීති

තත්‍ර වෙය්‍යාකරණං භවති

විඤ්ඤාණං අනිදස්සනං අනන්තං සබ්බතො පභං
එත්ථ ආපො ච පඨවී තෙජෝ වායො න ගාධති
එත්ථ දීඝඤ්ච රස්සඤ්ච අණුං ථූලං සුභාසුභං
එත්ථ නාමඤ්ච රූපඤ්ච අසෙසං උපරුජ්ඣති
විඤ්ඤාණස්ස නිරොධෙන එත්ථෙතං උපරුජ්ඣතීති

ඉදමවොච භගවා. අත්තමනො කෙවට්ටො ගහපතිපුත්තො භගවතො භාසිතං අභිනන්දීති.

කෙවට්ට සුත්තං නිට්ඨිතං
එකාදසමං.

කවරතැනෙක්හි හෙවත් කුමකටපැමිණ ආපො, පඨවි, තෙජෝ, වායො යන සතරමහාභූතයෝ නොපිහිටත්ද හෙවත් පිහිටනොලබත්ද, කවර තැනෙක්හි දීඝිවූ හෝ හ්‍රස්වවූ හෝ සියුම්වූ හෝ මහත්වූ හෝ ඉෂ්ටානිෂ්ටවූ හෝ උපාදාය රූපරැස නොපිහිටාද, නාමරූප ධර්මයෝ කවර තැනෙක්හි අනුත්පාදනිරොධයට පැමිණෙත්දැයි කියායි.

එහි විසරණය මෙසේ වෙයි.

උත්තම ආර්‍ය්‍යමාර්ගඥානයෙන් ප්‍රත්‍යක්‍ෂවශයෙන් දතයුතුහෙයින් විඤ්ඤාණනම්වූ ඇසින්නොදක්කහැකි හෝ උපමාරහිතහෙයින් අනිදස්සනනම්වූ උත්පාදාදීන්ගේ වශයෙන් අන්‍යථාත්වයක් හෝ කෙළවරක්නැතිහෙයින් අනන්තනම්වූ අටතිස්වැදෑරුම් කර්මස්ථාන මුඛාදීන්ගේ වශයෙන් සියලුදෙසින් බැසගැන්මටහැකි හෙයින් තොටක්වැනිවූ හෝ අත්‍යන්ත නිර්මලවූ යම් නිර්වාණධර්මයෙක් ඇද්ද, මේ නිර්වාණධර්මයෙහි හෙවත් මේ නිර්වාණධර්මයට පැමිණ ආපො, පඨවී, තෙජෝ, වායො යන සතරමහාභූතයෝ පිහිට නොලබත්. මේ නිර්වාණ ධර්මයෙහි දිඝිවූ හෝ හ්‍රස්වවූ හෝ කුඩාවූ හෝ මහත්වූ හෝ ඉෂ්ටානිෂ්ට වූ හෝ උපාදාය රූපයෝ නොපිහිටත්. නාමරූපයෝ මේ නිර්වාණ යෙහි අනුත්පාදනිරොධයට පැමිණෙත් හෙවත් ච්‍යුතිප්‍රතිසන්ධි වශයෙන් භවපරම්පරාලාභයපිණිස නොපවතිත්. චරමවිඥානනිරොධයෙන් මේ නාමරූපධර්මරාශිය මේ නිර්වාණයෙහි අනුත්පාදනිරොධයට පැමිණේයයි වදාළෝ.

භාග්‍යවතුන්වහන්සේ මේ ධර්මය වදාළසේක. සතුටුසිත්ඇති කෙවට්ටනම් ගැහැවි පුත්තෙමේ භාග්‍යවතුන්වහන්සේගේ ධර්මභාෂිතය සතුටින් පිළිගත්තේය.

එකොළොස්වෙනිවූ කෙවට්ට සූත්‍රාර්ථ ව්‍යාඛ්‍යාව
නිමියේයි.

XII ලොහිච්ච සුත්තං.

—:0:—

1. එවමෙමසුතං. එකං සමයං භගවා කොසලෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛු සතෙහි යෙන සාලවතිකා තදවසරි. තෙන ඛොපන සමයෙන ලොහිච්චො බ්‍රාහමණො සාලවතිකං අජ්ඣාවසති සත්තුස්සදං සතිණකට්ඨොදකං සධඤ්ඤං රාජභොග්ගං රඤ්ඤා පසෙනදිනා කොසලෙන දින්නං රාජදායං බ්‍රහමදෙය්‍යං.

2 තෙන ඛො පන සමයෙන ලොහිච්චස්ස බ්‍රාහ්මණස්ස එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං හොති. ඉධ සමණො වා බ්‍රාහමණො වා කුසලං ධම්මං අධිගච්ඡෙය්‍ය. කුසලං ධම්මං අධිගන්ත්වා න පරස්ස ආරොචෙය්‍ය. කිංහි පරො පරස්ස කරිස්සති. සෙය්‍යථාපිනාම පුරාණං බන්ධනං ඡින්දිත්වා අඤ්ඤං නවං බන්ධනං කරෙය්‍ය.

ලොහිච්ච සූත්‍රාර්ථව්‍යාඛ්‍යා.

—:0:—

1. මේ සූත්‍රධර්මය මාවිසින් මෙසේ අසනලදි. එක්කාලයෙක්හි භාග්‍යවතුන්වහන්සේ භික්‍ෂූන් පන්සියයක් පමණවූ මහද් භික්‍ෂුසඞ්ඝයා සමග කොසොල්දනව්හි සැරිසරා වඩනාසේක්, සාලවතිකානම් ගම සම්තැනෙක්හිද එතැනට වැඩිසේක. ඒ කාලයෙහි දී ලොහිච්ච බ්‍රාහ්මණතෙම පසෙනදි කොසොල්රජහුවිසින් දෙනලද්දාවූ නොයෙක් සත්වයන්ගේ උත්සන්නතා ඇති නොහොත් නොයෙක් සත්වයන්ගෙන් ගැවසීගත්තාවූ තණ දැව ආදිය හා පුෂ්කරණීන් සහිතවූ ධාන්‍ය සහිතවූ රජහුකෙරෙන් ලදින් අනුභව කටයුතුවූ රජහුවිසින් දෙනලද දායාදයවූ ශ්‍රෙෂ්ඨවශයෙන් දෙනලද්දාවූ නොහොත් රාජස්වරූපයෙන් පරිභොගකටයුතුවූ සාලවතිකා නම් ගම අධිපතිව වෙසෙයි.

2. ඒකාලයෙහිදී ලොහිච්චනම් බ්‍රාහ්මණයාහට ලාමකවූ මෙබඳු ලබ්ධිමාත්‍රයක් උපන්නේ වේ. මේලොකයෙහි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ නික්ලෙශවිමොක්‍ෂ ධර්මයට පැමිණෙන්නේද කුශල ධර්මයට පැමිණ පරහට නොම සැලකරන්නේය. අන්‍ය යමෙක් අනුශාසනා කෙරේද, අනුශාසකවූ හෙතෙම පරහට කුමක් කරන්නේද පැරණි බැම්මක් සිඳ අන්‍යවූ අලුත් බැම්මක් යම්සේ කරන්නේද.

එවං සම්පදමිදං පාපකං ලොභධම්මං වදාමි. කිං හි පරො පරස්ස කරිස්සති.

3. අස්සොසි ඛො ලොහිච්චො බ්‍රාහ්මණො සමණො ඛලු භො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො කොසලෙසු චාරිකං චරමානො මහතා භික්ඛු සඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛු සතෙහි සාලවතිකං අනුප්පත්තො. තං ඛො පන භගවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො. ඉතිපි සො භගවා අරහං සම්මා සම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්ම සාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා. සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං ස ස්සමණ බ්‍රාහ්මණිං පජං සදෙව මනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති, සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙ කල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවල පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති. සාධු ඛො පන තථාරූපානං අරහතං දස්සනං හොතීති.

මේ ලාමකවූ ලොභධර්‍මය එසේමයයි කියමි. අන් යමෙක් අනුශාසනා කෙරේද, අනුශාසකවූ හෙතෙම පරහට කුමක් කරන්නේදැයි කියායි.

3. ශාක්‍යපුත්‍රවූ ශාක්‍යකුලයෙන්නික්ම පැවිදිවූ ශ්‍රමණ භවද්ගෞතමයන්වහන්සේ භික්‍ෂූන් පන්සියයක් පමණවූ මහද් භික්‍ෂුසඞ්ඝයාසමග කොසොල් දනව්හි සැරිසරා වඩනාසේක් සාලවතිකානම් ගමට වැඩිසේක. ඒ භාග්‍යවත් ගෞතමයානන්වහන්සේ පිළිබඳවූ මෙබඳු මනොඥවූ කීර්ති ශබ්දයෙක් පැනනැංගේයයි ලොහිච්චනම් බ්‍රාහ්මණ තෙම ඇසූයේමය. ඒනම්, ඒ භාග්‍යවතුන්වහන්සේ සංසාර චක්‍රයාගේ අරකැපූසේක. සර්‍වප්‍රකාරයෙන් සර්‍වධර්‍මයන් මනාකොට තෙමම දත්සේක. අෂ්ටවිද්‍යා පසළොස්චරණ ධර්‍මයන්ගෙන් සම්පූර්‍ණසේක. ශොභන ගමන් ඇතිසේක. තුන්ලොව දත්නාසේක. ශීලසමාධ්‍යාදි ගුණයෙන් ශ්‍රෙෂ්ඨවූ සේක. පුරුෂයන් දමනය කිරීමෙහි දක්‍ෂවූසේක. දෙවිමිනිසුන්ට අනුශාසනා කරණසේක. චතුස්සත්‍යාවබොධය කළසේක. සකලක්ලෙශයන් භග්නකළ සේක. ඒ භාග්‍යවතුන්වහන්සේ දෙවියන් සහිතවූ මරුන්සහිතවූ බඹුන්සහිතවූ මෙලොවද ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිතවූ දෙවිමිනිසුන් සහිතවූ සත්වවර්‍ගයාද තෙමේ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්‍ෂ කොට ප්‍රකාශ කරණසේක. ඒ භාග්‍යවතුන්වහන්සේ මුල යහපත්වූද, මැද යහපත්වූද, අග යහපත්වූද, අර්‍ථ සහිතවූ ව්‍යඤ්ජන සහිතවූ අර්‍ථසම්පූර්‍ණවූ ධර්‍මය දෙශනාකරණ සේක. පරිශුද්ධවූ බ්‍රහ්මචර්‍ය්‍යාව ප්‍රකාශකරණසේකැයි. ලොහිච්චනම් බ්‍රාහ්මණතෙම මෙමය අසා එබඳුවූ රහතුන්ගේ දැකීම මනා වේයයි සිතී.

4. අථ ඛො ලොහිච්චො බ්‍රාහ්මණො රොසිකං නහාපිතං ආමන්තෙසි. එහි ත්වං සම්ම රොසික යෙන සමණො ගොතමො. තෙනුපසඞ්කම. උපසඞ්කමිත්වා මම වචනෙන සමණං ගොතමං අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡ. ලොහිච්චො භො ගොතම බ්‍රාහ්මණො භගවන්තං ගොතමං අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡතීති. එවඤ්ච වදෙහි අධිවාසෙතු කිර භවං ගොතමො ලොහිච්චස්ස බ්‍රාහ්මණස්ස ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනාති.

5. එවං භන්තෙති ඛො රොසිකො නහාපිතො ලොහිච්චස්ස බ්‍රාහ්මණස්ස පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො රොසිකො නහාපිතො භගවන්තං එතදවොච. ලොහිච්චො භන්තෙ බ්‍රාහ්මණො භගවන්තං අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡති.

---

4 ඉක්බිත්තෙන් ලොහිච්චනම්බ්‍රාහ්මණතෙම රොසිකනම් කරනැවැමියා ඇමතුයේය. යහලුව රොසිකය තෝ මෙහි එව, ශ්‍රමණ භවද් ගෞතමයන්වහන්සේ යම් තැනෙක්හිද එතැනට එළඹෙව. එළඹ මාගේ වචනයෙන් ශ්‍රමණ ගෞතමයන්වහන්සේ පිළිබඳවූ ස්වල්පාබාධ ඇතිබවද ස්වල්ප රොග ඇතිබවද සැහැල්ලු පැවතුම් ඇතිබවද ශරීරශක්තිය ඇතිබවද සැපවිහරණයද පිළිවිස. භවද් ගෞතමයන්වහන්ස ස්වල්පාබාධ ඇත්තාවූ ස්වල්ප රොග ඇත්තාවූ සැහැල්ලු පැවතුම් ඇත්තාවූ ශරීර ශක්තිය ඇත්තාවූ භවද් ගෞතමයන්වහන්සේ පිළිබඳවූ සැපවිහරණය ලොහිච්චනම් බ්‍රාහ්මණතෙම පිළිවිසීයයිද ලොහිච්චනම් බ්‍රාහ්මණයාගේ බත සෙට දවසට භවද්ගෞතමයන්වහන්සේ භික්ෂුසඞ්ඝයා සමග ඉවසනසේක්වායිද මෙසේද සැළ කරව.

5. ස්වාමීනි, එසේයයි රොසිකනම් කරනැවැමිතෙම ලොහිච්චනම් බ්‍රාහ්මණයාගේ වචනය සතුටින් පිළිගෙණ භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙක්හිද එතැනට එළඹියේය. එළඹ භාග්‍යවතුන් වහන්සේට නමස්කාරකොට එකත් පසෙක උන්නේය. එකත් පසෙක උන්නාවූ රොසිකනම් කරනැවැමිතෙම භාග්‍යවතුන්වහන්සේට මෙපවත් සැළකෙළේය. ස්වාමීන්වහන්ස, ස්වල්පාබාධ ඇත්තාවූ ස්වල්ප රොග ඇත්තාවූ සැහැල්ලු පැවතුම් ඇත්තාවූ ශරීරශක්ති ඇත්තාවූ භාග්‍යවතුන්වහන්සේ පිළිබඳවූ සැපවිහරණය ලොහිච්චනම් බ්‍රාහ්මණතෙම පිළිවිසියි.

එවඤ්ච වදෙති අධිවාසෙතු කිර භන්තෙ භගවා ලොහිච්චස්ස බ්‍රාහ්මණස්ස ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛු සඞ්ඝෙනාති, අධිවාසෙසි භගවා තුණ්හි භාවෙන.

6. අථ ඛො රොසිකො නහාපිතො භගවතො අධිවාසනං විදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා යෙන ලොහිච්චො බ්‍රාහ්මණො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ලොහිච්චං බ්‍රාහ්මණං එතදවොච. අවොචුම්හ මයං භන්තෙ තව වචනෙන තං භගවන්තං ලොහිච්චො භන්තෙ බ්‍රාහ්මණො භගවන්තං අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡති, එවඤ්ච වදෙති. අධිවාසෙතු කිර භන්තෙ භගවා ලොහිච්චස්ස බ්‍රාහ්මණස්ස ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනාති. අධිවුත්ථඤ්ච පන තෙන භගවතාති.

7. අථ ඛො ලොහිච්චො බ්‍රාහ්මණො තස්සා රත්තියා අච්චයෙන සකෙ නිවෙසනෙ පණීතං ඛාදනීයං භොජනීයං පටියාදපෙත්වා රොසිකං නහාපිතං ආමන්තෙසි. එහි ත්වං සම්ම රොසික.

ස්වාමිනි, භාග්‍යවතුන්වහන්ස, ලොහිච්චනම් බ්‍රාහ්මණයාගේ බත සෙට දවසට භික්ෂුසඞ්ඝයා සමග ඉවසාවදාරණසේක්වායි මෙසේද සැළකෙරෙයි. භාග්‍යවතුන්වහන්සේ නිශ්ශබ්ද භාවයෙන් ඉවසා වදාළසේක.

6. එකල්හි රොසිකනම් කරනැවැමිතෙම භාග්‍යවතුන්වහන්සේගේ ඉවසීම දැන හුනස්නෙන් නැගිට භාග්‍යවතුන්වහන්සේ වැඳ පැදකුණුකොට ලොහිච්චනම් බ්‍රාහ්මණතෙම යම් තෙනෙක්හිද, එතැනට එළඹියේය. එළඹ ලොහිච්ච බ්‍රාහ්මණයාහට මෙපවත් කීයේය, පින්වත ඔබගේ වචනයෙන් ඒ භාග්‍යවතුන්වහන්සේට ස්වාමින්වහන්ස ස්වල්පාබාධ ඇත්තාවූ ස්වල්පරෙග ඇත්තාවූ සැහැල්ලු පැවතුම් ඇත්තාවූ ශරීරශක්තිය ඇත්තාවූ භාග්‍යවතුන්වහන්වහන්සේ පිළිබඳ සැපවිහරණය ලොහිච්චනම් බ්‍රාහ්මණතෙම පිළිවිසියි. ස්වාමිනි භාග්‍යවතුන්වහන්ස ලොහිච්ච බ්‍රාහ්මණයාගේ බත සෙට දවසට භික්ෂු සඞ්ඝයා සමග ඉවසා වදාරණ සේක්වායි මෙසේද දන්වායයි අපි සැළකෙළෙමු. භාග්‍යවතුන්වහන්සේ විසින් ඒ ඉවසා වදාරණලද්දේය.

7. ඉක්බිත්තෙන් ලොහිච්චනම් බ්‍රාහ්මණතෙම ඒ රාත්‍රිහුගේ ඇවෑමෙන් සිය නිවෙසෙහි ප්‍රණීතවූ කෑයුතුදෑද බුදියයුතුදෑද පිළියෙළ කරවා රොසිකනම් කරනැවැමියා ඇමතුයේය. යහළුව රොසිකය තෝ මෙහි එව.

යෙන සමණො ගොතමො තෙනුපසඞ්කම. උපසඞ්කමිත්වා සමණස්ස ගොතමස්ස කාලං ආරොචෙහි කාලො භො ගොතම නිට්ඨිතං භත්තන්ති. එවං භන්තෙති බො රොසිකො නහාපිතො ලොහිච්චස්ස බ්‍රාහ්මණස්ස පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො බො රොසිකො නහාපිතො භගවතො කාලං ආරොචෙසි කාලො භන්තෙ නිට්ඨිතං භත්තන්ති. අථ බො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවර මාදාය සද්ධිං භික්ඛුසඞ්ඝෙන යෙන සාලවතිකා තෙනුපසඞ්කමි.

8. තෙන බො පන සමයෙන රොසිකො නහාපිතො භගවන්තං පිට්ඨිතො පිට්ඨිතො අනුබද්ධො හොති. අථ බො රොසිකො නහාපිතො භගවන්තං එතදවොච. ලොහිච්චස්ස භන්තෙ බ්‍රාහ්මණස්ස එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං. ඉධ සමණොවා බ්‍රාහ්මණොවා කුසලං ධම්මං අධිගච්ඡෙය්‍ය, කුසලං ධම්මං අධිගන්ත්වා.

ශ්‍රමණ භවද් ගෞතමයන්වහන්සේ යම්තැනෙක්හිද එතැනට එළඹෙව. එළඹ ශ්‍රමණ ගෞතමයානන්වහන්සේට භවද් ගෞතමයන්වහන්ස බත නිමවනලද්දේය. ඒට කාලයයි කාලය සැළකරව, ස්වාමීනි එසේයයි කියා රොසිකනම් කරනැවැමිතෙම ලොහිච්ච බ්‍රාහ්මණයාගේ වචනය පිළිගෙණ භාග්‍යවතුන්වහන්සේ යම්තැනෙක්හිද එතැනට එළඹියේය. එළඹ භාග්‍යවතුන්වහන්සේට නමස්කාරකොට එකත් පසෙක සිටියේය, එකත් පසෙක සිටියාවූ රොසිකනම් කරනැවැම්තෙම ස්වාමීන්වහන්ස බත නිමවනලද්දේය. ඒටකාලයයි භාග්‍යවතුන්වහන්සේට කාලය සැළ කෙළේය, ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ පෙරවරු කාලය හැඳ පොරවා පාසිවුරුගෙණ භික්ෂු සඞ්ඝයා සමග සාලවතිකා නම් ගම යම්තැනෙක්හිද එතැනට එළඹිසේක.

8. ඒ කාලයෙහි රොසිකනම් කරනැවැම්තෙම භාග්‍යවතුන්වහන්සේ පසුපස්සෙන් ලුහුබැන්දේ වේ. ඉක්බිත්තෙන් රොසිකනම් කරනැවැම්තෙම භාග්‍යවතුන්වහන්සේට මෙපවත් සැළකෙළේය. ස්වාමීන්වහන්ස ලොහිච්චනම් බ්‍රාහ්මණයාහට ලාමකවූ මෙබඳු ලබ්ධිමාත්‍රයක් උපන, මේලොකයෙහි ශ්‍රමණයෙක්හෝ බ්‍රාහ්මණයෙක්හෝ කුශල ධර්‍මයට පැමිණෙන්නේද. කුශලධර්‍මයට පැමිණ

න පරස්ස ආරොචෙය්‍ය, කිං හි පරො පරස්ස කරිස්සති. සෙය්‍යථාපි නාම පුරාණං බන්ධනං ඡින්දිත්වා අඤ්ඤං නවං බන්ධනං කරෙය්‍ය, එවං සම්පදමිදං පාපකං ලොභධම්මං වදාමි. කිංහි පරො පරස්ස කරිස්සති. සාධු භන්තෙ භගවා ලොහිච්චං බ්‍රාහ්මණං එතස්මා පාපකා දිට්ඨිගතා විවෙචෙතූති. අප්පෙව නාම සියා රොසිකෙ. අප්පෙව නාම සියා රොසිකෙති.

9. අථ ඛො භගවා යෙන ලොහිච්චස්ස බ්‍රාහ්මණස්ස නිවෙසනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. අථ ඛො ලොහිච්චො බ්‍රාහ්මණො බුද්ධපමුඛං භික්ඛුසඞ්ඝං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙසි සම්පවාරෙසි. අථ ඛො ලොහිච්චො බ්‍රාහ්මණො භගවන්තං භුත්තාවිං ඔනීතපත්තපාණිං අඤ්ඤතරං නීචං ආසනං ගහෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ලොහිච්චං බ්‍රාහ්මණං භගවා එතදවොච. සච්චං කිර තෙ ලොහිච්ච එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං. ඉධ සමණො වා බ්‍රාහ්මණො වා කුසලං ධම්මං අධිගච්ඡෙය්‍ය, කුසලං ධම්මං අධිගන්ත්වා, න පරස්ස ආරොචෙය්‍ය. කිංහි පරො පරස්ස කරිස්සති.

පරහට නොම සැලකරන්නේය. අන්‍ය යමෙක් අනුශාසනා කෙරේද අනුශාසකවූ හෙතෙම පරහට කුමක් කරන්නේද පැරණි බැම්මක් සිඳ අන්‍යවූ අලුත්බැම්මක් කරන්නේ යම්සේද, මේලාමකවූ ලොභධර්මය එසේමයයි වදාරමි. අන් යමෙක් අනුශාසනා කෙරේද, අනුශාසකවූ හෙතෙම පරහට කුමක් කරන්නේදැයි, කියාය. ස්වාමීනි භාග්‍යවතුන්වහන්ස, ලොහිච්චනම් බ්‍රාහ්මණයා ලාමකවූ මේ ලබ්ධිමාත්‍රයෙන් මුදවනසේක්වා, රොසිකය ඉතා යහපත් වන්නේය, රොසිකය ඉතා යහපත්වන්නේයයි වදාළසේක.

9. ඉක්බිත්තෙන් භාග්‍යවතුන්වහන්සේ ලොහිච්චනම් බ්‍රාහ්මණයාගේ නිවෙස යම් තැනෙක්හිද එතැනට එළඹිසේක. එළඹ පණවනලද අස්නෙහි වැඩහුන්සේක. එකල්හි ලොහිච්චනම් බ්‍රාහ්මණතෙම බුදුන් ප්‍රමුඛවූ භික්ෂුසඞ්ඝයා ප්‍රණීතවූ ඛාද්‍යභොජ්‍යයෙන් සියනිත් සන්තර්පණය කෙළේය. මනාකොට පැවරූයේය. ඉක්බිත්තෙන් ලොහිච්චනම් බ්‍රාහ්මණතෙම වළඳා නිමකරණලද්දවූ පාත්‍රයෙන් ඉවත්කරණලද අත්ඇත්තාවූ භාග්‍යවතුන්වහන්සේ දැන එක්තරා නීචාසනයක්ගෙණ එකත්පසෙක උන්නේය. එකත් පසෙක උන්නාවූ ලොහිච්ච බ්‍රාහ්මණයාහට භාග්‍යවතුන් වහන්සේ මෙපවත් වදාළසේක. ලොහිච්චය, මේ ලොකයෙහි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ කුශල ධර්මයට පැමිණෙන්නේද. කුශල ධර්මයට පැමිණ පරහටනොම සැලකරන්නේය. අන්‍ය යමෙක් අනුශාසනා කරන්නේද අනුශාසකවූ හෙතෙම පරහට කුමක් කරන්නේද.

සෙය්‍යථාපි නාම පුරාණං බන්ධනං ඡින්දිත්වා අඤ්ඤං නවං බන්ධනං කරෙය්‍ය, එවං සම්පදමිදං පාපකං ලොභ ධම්මං වදාමි. කිංහි පරො පරස්ස කරිස්සතීති, එවං භො ගොතම.

10. තං කිං මඤ්ඤසි ලොහිච්ච. නනු ත්වං සාලවතිකං අජ්ඣාවසසීති, එවං භො භො ගොතම. යොනු ඛො ලොහිච්ච එවං වදෙය්‍ය. ලොහිච්චො බ්‍රාහ්මණො සාලවතිකං අජ්ඣාවසති. යා සාලවතිකාය සමුදය සඤ්ජාති ලොහිච්චොව තං බ්‍රාහ්මණො එකකො පරිභුඤ්ජෙය්‍ය,න අඤ්ඤෙසං දදෙය්‍යාති.එවංවාදී සො යෙ තං උපජීවන්ති තෙසංඅන්තරාය කරො වා හොති. නො වාති? අන්තරාය කරො භො ගොතම අන්තරාය කරො සමානො හිතානුකම්පී වා තෙසං හොති අහිතානුකම්පීවාති? අහිතානුකම්පී භො ගොතම. අහිතානුකම්පිස්ස මෙත්තං වා තෙසු චිත්තං පච්චුපට්ඨිතං හොති, සපත්තකං වාති, සපත්තකං භො ගොතම. සපත්තකෙ චිත්තෙ පච්චුපට්ඨිතෙ මිච්ඡාදිට්ඨි වා හොති.

පැරණි බැම්මක් සිඳ අන්‍යවූ අලුත් බැම්මක් කරන්නේ යම්සේද මේ ලාමකවූ ලොභ ධර්‍මය එසේමයයි වදාරමි. අන්‍යයෙක් අනුශාසනා කෙරේද, අනුශාසකවූ හෙතෙම පරහට කුමක් කරන්නේද,යනමෙබඳුවූ ලාමකලබ්ධිමාත්‍රයක්තට උපන්නෝ සැබෑද? භවද් ගෞතමයන්වහන්ස, එසේයයි සැළකළෝ.

10. ලොහිච්චය, ඒ කුමකැයි සිතන්නෙහිද? තෝ සාලවතිකානම් ගම අධිපතිව වාසය කරන්නෙහි නොවෙහිද, භවද් ගෞතමයන්වහන්ස, එසේය. ලොහිච්චය, යමෙක් මෙසේ කියන්නේද. ලොහිච්චනම් බ්‍රාහ්මණතෙම සාලවතිකානම් ගම අධිපතිව වෙසෙයි. සාලවතිකානම් ගමෙහි යම්පමණ භොග හටගණීද, එය ලොහිච්චනම් බ්‍රාහ්මණතෙමේ හුදකලාවම පරිභොග කරන්නේය. අනුන්ට නොදෙන්නේයයි මෙසේ කියන්නාවූ හෙතෙම යම් කෙනෙක් එවුහු ඔහුනිසා ජීවත්වෙත්ද. ඔවුන්ට ලාභාන්තරාය කරන්නේ හෝ වේද, නොහොත් ලාභාන්තරාය නොකරන්නේ හෝ වේද, භවද් ගෞතමයන්වහන්ස, ලාභාන්තරායකරන්නේ වේ. ලාභාන්තරායකරන්නෙක්වූයේම ඔවුන්ගේ හිතවැඩ කැමැත්තේ හෝ වේද, නොහොත් හිතවැඩ නොකැමැත්තේ හෝ වේද, භවද් ගෞතමයන්වහන්ස, හිතවැඩ නොකැමැත්තෙක් වේ. හිතවැඩ නොකැමැත්තේ ඔවුන් කෙරෙහි මෙත් සිත හෝ එළඹසිටියේ වේද නොහොත් ක්‍රොධසිත පිහිටියේ වේද, භවද් ගෞතමයන්වහන්ස, ක්‍රොධසිත පිහිටියේ වේ. ක්‍රොධසිත එළඹ සිටිකල්හි මිථ්‍යාදෘෂ්ටි ඇත්තේ හෝ වේද,

සම්මාදිට්ඨිවාති? මිච්ඡාදිට්ඨි භො ගොතම. මිච්ඡාදිට්ඨිස්ස ඛො අහං ලොහිච්ච ද්වින්නං ගතීනං අඤ්ඤතරං ගතිං වදමි නිරයං වා තිරච්ඡාන යොනිං වා.

11. තං කිම්මඤ්ඤසි ලොහිච්ච නනු රාජා පසෙනදි කොසලො කාසිකොසලං අජ්ඣාවසතීති, එවං භො ගොතම. යො නු ඛො ලොහිච්ච එවං වදෙය්‍ය, රාජා පසෙනදි කොසලො කාසිකොසලං අජ්ඣාවසති. යා කාසිකොසලෙ සමුදයසඤ්ජාති. රාජාව තං පසෙනදිකොසලො එකකො පරිභුඤ්ජෙය්‍ය, න අඤ්ඤෙසං දදෙය්‍යාති, එවං වාදී සො යෙ රාජානං පසෙනදිං කොසලං උපජීවන්ති, තුම්හෙ චෙව අඤ්ඤෙ ච තෙසං අන්තරායකරො වා හොති, නො වාති? අන්තරායකරො භො ගොතම. අන්තරායකරො සමානො හිතානුකම්පී වා තෙසං හොති, අහිතානුකම්පී වාති? අහිතානුකම්පී භො ගොතම අහිතානුකම්පිස්ස මෙත්තං වා තෙසු චිත්තං පච්චුපට්ඨිතං හොති, සපත්තකං වාති? සපත්තකං භො ගොතම.

සම්‍යග් දෘෂ්ටි ඇත්තේ හෝ වේද? භවද් ගෞතමයන්වහන්ස, මිථ්‍යාදෘෂ්ටි ඇත්තේ වේ. ලොහිච්චය, මිථ්‍යාදෘෂ්ටි ඇත්තහුට නරක ගතිය හෝ තිරිසන්ගතිය යන ද්විප්‍රකාරගති අතුරෙන් එක්තරා ගතියක් මම වදාරමි.

11. ලොහිච්චය, ඒ කුමකැයි සිතන්නෙහිද, පසෙනදිකොසොල් රජතෙම කසී කොසොල් දෙරටෙහි අධිපතිව වසන්නේ නොවේද, භවද් ගෞතමයන්වහන්ස, එසේය, ලොහිච්චය, යමෙක් මෙසේ කියන්නේද. පසෙනදි කොසොල් රජතෙම කසී කොසොල් දෙරටෙහි අධිපතිව වෙසෙයි. කසී කොසොල් දෙරටෙහි යම් වස්තුවක්හට ගණීද, හෙවත් භොගොත්පත්තියක් ඇද්ද, එය පසෙනදි කොසොල්රජතෙම හුදකලාවම පරිභොගකරන්නේය. අනුන්ට නොදෙන්නේයයි මෙසේ කියන්නාවූ හෙතෙම යම් කෙනෙක් ඒ රජහුනිසා ජීවත්වෙත්ද. තෙපි, හෝ අන්‍යයෝ හෝ වෙත්ද ඔවුන්ට ලාභාන්තරාය කරන්නේ හෝ වේද, නොහොත් ලාභාන්තරාය නොකරන්නේ වේද, භවද් ගෞතමයන්වහන්ස, ලාභාන්තරාය කරන්නේ වේ. ලාභාන්තරාය කරන්නෙක්වූයේම ඔවුන්ගේ හිතවැඩ කැමැත්තේ හෝ වේද, නොහොත් හිතවැඩ නොකැමැත්තේ වේද, භවද් ගෞතමයන්වහන්ස, හිතවැඩ නොකැමැත්තේ වේ. හිතවැඩ නොකැමැතිවූයේ ඔවුන්කෙරෙහි මෙත් සිත හෝ එලඹසිටියේ වේද, නොහොත් ක්‍රොධසිත එලඹසිටියේ වේද, භවද් ගෞතමයන්වහන්ස, ක්‍රොධසිත පිහිටියේ වේ.

සපත්තකෙ චිත්තෙ පච්චුපට්ඨිතෙ, මිච්ඡාදිට්ඨිවා හොති සම්මාදිට්ඨිවාති. මිච්ඡාදිට්ඨි ඛො ගොතම? මිච්ඡාදිට්ඨිස්ස ඛො අහං ලොහිච්චමිනනං ගතිනං අඤ්ඤතරං ගතිං වදාමි නිරයං වා තිරච්ඡානයොනිංවා.

12. ඉතිකිර ලොහිච්චායො එවං වදෙය්‍ය ලොහිච්චො බ්‍රාහ්මණො සාලවතිකං අජ්ඣාවසති. යා සාලවතිකාය සමුදය සඤ්ජාති ලොහිච්චොව තං බ්‍රාහ්මණො එකකො පරිභුඤ්ජෙය්‍ය, නච අඤ්ඤෙසං දදෙය්‍යාති.එවං වාදි සො යෙ තං උපජීවන්ති,තෙසං අන්තරාය කරො හොති, අන්තරාය කරො සමානො අහිතානු කම්පී හොති, අහිතානුකම්පිස්ස සපත්තකං චිත්තං පච්චුපට්ඨිතං හොති, සපත්තකෙ චිත්තෙ පච්චුපට්ඨිතෙ මිච්ඡාදිට්ඨිහොති.

13. එවමෙව ඛො ලොහිච්ච යො එවං වදෙය්‍ය, ඉධ සමණො වා බ්‍රාහ්මණො වා කුසලං ධම්මං අධිගච්ඡෙය්‍ය, කුසලං ධම්මං අධිගන්ත්වා න පරස්ස ආරොචෙය්‍ය, කිංහි පරො පරස්ස කරිස්සති,

---

ක්‍රොධසිතඑළඹසිටිකල්හි මිථ්‍යාදෘෂ්ටි ඇත්තේ හෝ වේද,නොහොත් සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වේද. භවද් ගෞතමයන්වහන්ස, මිථ්‍යාදෘෂ්ටි ඇත්තේවේ. ලොහිච්චය, මිථ්‍යාදෘෂ්ටිඇත්තහුට නරකගතිය හෝ තිරිසන් ගතිය යන විප්‍රකාරගති අතුරෙන් එක්තරා ගතියක් මම කියමි.

12. ලොහිච්චය, මෙතෙකින් යමෙක් මෙසේ කියන්නේද. ලොහිච්චබ්‍රාහ්මණතෙමේ සාලවතිකානම් ගම අධිපතිව වෙසෙයි. සාලවතිකානම් ගම හටගන්නා යම්පමණ භොග වේද එය ලොහිච්චනම් බ්‍රාහ්මණතෙම හුදකලාවම පරිභොග කරන්නේය. අනුන්ට නොදෙන්නේයයි මෙසේ කියන්නාවූ හෙතෙම යමෙක් ඒ ලොහිච්චනම් බ්‍රාහ්මණයා නිසා ජීවත් වෙත්ද. ඔවුන්ට ලාභාන්තරාය කරන්නේ වේ. ලාභාන්තරාය කරන්නෙක්වූයේ හිතවැඩ නොකැමැත්තේ හෝ වේ. හිතවැඩ නොකැමැත්තහුට ක්‍රොධ සිත එළඹසිටියේ වෙයි. ක්‍රොධසිත එළඹ සිටිකල්හි මිථ්‍යාදෘෂ්ටි ඇත්තේවෙයි.

13. ලොහිච්චය, එපරිද්දෙන්ම යමෙක් මෙසේ කියන්නේද. මේ ලොකයෙහි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ කුශලධර්මයට පැමිණෙන්නේද. කුශලධර්මයට පැමිණ පරහට නොම සැලකරන්නේය. අන් යමෙක් අනුශාසනාකෙරේද, අනුශාසකවූ හෙතෙම පරහට කුමක්කරන්නේද.

සෙය්‍යථාපි නාම පුරාණං බන්ධනං ඡින්දිත්වා අඤ්ඤං නවං බන්ධනං කරෙය්‍ය. එවං සම්පදමිදං පාපකං ලොභධම්මං වදාමි. කිංහි පරො පරස්ස කරිස්සතීති. එවං වාදී සො යෙ තෙ කුලපුත්තා තථාගතප්පවෙදිතං ධම්මවිනයං ආගම්ම එවරූපං උළාරං විසෙසං අධිගච්ඡන්ති සොතාපත්ති ඵලම්පි සච්ඡිකරොන්ති, සකදාගාමි ඵලම්පි සච්ඡිකරොන්ති, අනාගාමි ඵලම්පි සච්ඡිකරොන්ති, අරහත්තම්පි සච්ඡිකරොන්ති, යෙචි මෙ දිබ්බා ගබ්භා පරිපාචෙන්ති. දිබ්බානං භවානං අභිනිබ්බත්තියා, තෙසං අන්තරාය කරො හොති, අන්තරායකරො සමානො අහිතානුකම්පී හොති, අහිතානුකම්පිස්ස සපත්තකං චිත්තං පච්චුපට්ඨිතං හොති, සපත්තකෙ චිත්තෙ පච්චුපට්ඨිතෙ මිච්ඡාදිට්ඨි හොති. මිච්ඡාදිට්ඨිස්ස ඛො අහං ලොහිච්ච ද්වින්නං ගතීනං අඤ්ඤතරං ගතිං වදාමි. නිරයං වා තිරච්ඡානයොනිං වා.

14. ඉති කිර ලොහිච්ච යො එවං වදෙය්‍ය. රාජා පසෙනදි කොසලො කාසිකොසලං අජ්ඣාවසති. යා කාසි කොසලෙ සමුදය සඤ්ජාති, රාජාව තං පසෙනදි කොසලො එකකො පරිභුඤ්ජෙය්‍ය, න අඤ්ඤෙසං දදෙය්‍යාති.

පුරාණ බන්ධනයක් සිඳ අන්‍යවූ අභිනවබන්ධනයක් කරන්නේ යම්සේද මේ ලාමකවූ ලොභධර්මය එසේමයයි කියමි. අන් යමෙක් අනුශාසනාකෙරේද, අනුශාසකවූ හෙතෙම පරහට කුමක් කරන්නේද කියායි. මෙසේ කියන්නාවූ යම් ඒ කුලපුත්‍රයෝ තථාගතයන්වහන්සේවිසින් ප්‍රකාශකරණලද ධර්මවිනයඇති ශාසනයට පැමිණ මෙබඳුවූ මහත්වූ වෙනසකට පැමිණෙත්. ශ්‍රොතආපත්තිඵලයද සාක්ෂාත්කෙරෙත්. සකෘදගාමිඵලයද සාක්ෂාත්කෙරෙත්. අනාගාමිඵලයද සාක්ෂාත්කෙරෙත්. අර්හත්ඵලයද සාක්ෂාත්කෙරෙත්. යම් කෙනෙක් මේ දිව්‍යගර්භයෙහි මුහුකිරීමට පැමිණෙත්ද. දිව්‍යවූ භවයන්ගේ ඉපැද්මෙන් ඔවුන්ට අන්තරායකරවේ, අන්තරායකරවූයේ හිත්වැඩ නොකැමැත්තේ වේ, හිතවැඩ නොකැමැත්තහුට ක්‍රොධසිත එළඹසිටියේ වේ, ක්‍රොධසිත එළඹසිටිකල්හි මිථ්‍යාදෘෂ්ටිඇත්තේ වේ, ලොහිච්චය, මිථ්‍යාදෘෂ්ටිඇත්තාහට නරකගතිය හෝ තිරිසන්ගතිය යන ද්විප්‍රකාරගති අතුරෙන් එක්තරා ගතියක් මම වදාරමි.

14. ලොහිච්චය, මෙතෙකින් යමෙක් මෙසේ කියන්නේද. පසෙනදි කොසොල්රජතෙම කසීකොසොල් දෙරටෙහි අධිපතිව වෙසෙයි. කසීකොසොල් දෙරටෙහි යම් භොගොත්පත්තියක් ඇද්ද, එය පසෙනදිකොසොල්රජතෙම හුදකලාවම පරිභොගකරන්නේය. අනුන්ට නොදෙන්නේය කියායි.

එවං වාදී සො යෙ රාජානං පසෙනදිං කොසලං උපජීවන්ති, තුම්හෙචෙව අඤ්ඤෙච තෙසං අන්තරායකරො හොති, අන්තා රායකරො සමානො අහිතානුකම්පී හොති, අහිතානුකම්පිස්ස සපත්ත කං චිත්තං පච්චුපට්ඨිතං හොති, සපත්තකෙ චිත්තෙ පච්චුපට්ඨිතෙ මිච්ඡාදිට්ඨි හොති.

15. එවමෙව ඛො ලොහිච්ච යො එවං වදෙය්‍ය, ඉධ සමණොවා බ්‍රාහ්මණොවා කුසලං ධම්මං අධිගච්ඡෙය්‍ය, කුසලං ධම්මං අධිගන්ත්වා න පරස්ස ආරොචෙය්‍ය, කිංහි පරො පරස්ස කරිස්සති, සෙය්‍යථාපි නාම පුරාණං බන්ධනං ඡින්දිත්වා,අඤ්ඤං නවං බන්ධනං කරෙය්‍ය, එවං සම්පදමිදං පාපකං ලොභධම්මං වදාමි.කිංහි පරො පරස්ස කරිස්සතීති, එවං වාදීසො යෙ තෙ කුලපුත්තා තථාගතප්පවෙදිතං ධම්මවිනයං ආගම්ම එවරූපං උළාරං විසෙසං අධිගච්ඡන්ති, සොතාපත්ති ඵලම්පි සච්ඡිකරොන්ති, සකදාගාමි ඵලම්පි සච්ඡිකරොන්ති, අනාගාමි ඵලම්පි සච්ඡිකරොන්ති, අරහත්තම්පි සච්ඡිකරොන්ති, යෙචි මෙ දිබ්බා ගබ්භා පරිපාචෙන්ති දිබ්බානං භවානං අභිනිබ්බත්තියා තෙසං අන්තා රාය කරො හොති.

මෙසේ කියන්නාවූ හෙතෙම තොපි හෝ අන්‍යයෝ හෝ යමෙක් ඒ පසෙනදි කොසොල් රජුනිසා ජීවත්වෙත්ද. ඔවුන්ට අන්තරාය කර වේ.අන්තරායකරවූයේ හිතවැඩ නොකැමැත්තේ වේ. හිත වැඩ නොකැමැත්තහුට සතුරුසිත එළඹසිටියේ වේ. සතුරුසිත එළඹ සිටිකල්හි මිථ්‍යාදෘෂ්ටි ඇත්තේ වේ.

15. ලොහිච්චය, එපරිද්දෙන්ම යමෙක් මෙසේ කියන්නේද. මේ ලොකයෙහි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ කුශලධර්‍මයට පැමිණෙන්නේද. කුශලධර්‍මයටපැමිණ පරහට නොමසැළකරන් නේය. අන් යමෙක් අනුශාසනාකෙරේද, අනුශාසකවූ හෙතෙම පරහට කුමක්කරන්නේද, පැරණිබැම්මක් සිඳ අන්‍යවූ අභිනව බන්ධනයක්කරන්නේ යම්සේද, මේ ලාමකවූ ලොභ ධර්‍මය එසේමයයි කියමි. අන් යමෙක් අනුශාසනාකෙරේද, අනුශාස කවූ හෙතෙම පරහට කුමක්කරන්නේදැයි මෙසේ කියන්නාවූ යම් ඒ කුලපුත්‍රයෝ තථාගතයන්වහන්සේවිසින් ප්‍රකාශකරණලද ධර්‍ම විනය ඇති ශාසනයට පැමිණ මෙබඳුවූ මහත්වූ වෙනසකට පැමි ණෙත්. ශ්‍රොතආපත්තිඵලයද, සාක්‍ෂාත්කෙරෙත්,—පෙ—අර්හත් ඵලයද සාක්‍ෂාත්කෙරෙත්, යම්කිසිවෙක් මේ දිව්‍යගර්භයෙහි නනා හොත් සදෙව්ලොවෙහි මුහුකිරීමට පැමිණෙත්ද. දිව්‍යවූ භවයන්ගේ ඉපැද්මෙන් ඔවුන්ට අන්තරායකර වේ.

අනතරාය කරො සමානො අහිතානුකම්පී හොති, අහිතානුකම්පිස්ස සපත්තකං චිත්තං පච්චුපට්ඨිතං හොති, සපත්තකෙ චිත්තෙ පච්චුපට්ඨිතෙ මිච්ඡාදිට්ඨි හොති. මිච්ඡාදිට්ඨිස්ස ඛො අහං ලොහිච්ච ද්වින්නං ගතීනං අඤ්ඤතරං ගතිං වදාමි, නිරයං වා තිරච්ඡාන යොනිං වා.

16. තයො ඛො මෙ ලොහිච්ච සත්ථාරො යෙ ලොකෙ චොදනාරහා, යො ච පනෙවරූපෙ සත්ථාරෙ චොදෙති, සා චොදනා භූතා තච්ඡා ධම්මිකා අනවජ්ජා. කතමෙ තයො, ඉධ ලොහිච්ච එකච්චො සත්ථා යස්සත්ථාය අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති, ස්වාස්ස සාමඤ්ඤත්ථො අනනුප්පත්තො හොති. සො තං සාමඤ්ඤත්ථං අනනුපාපුණිත්වා සාවකානං ධම්මං දෙසෙති ඉදං වො හිතාය ඉදං වො සුඛායාති. තස්ස තෙ සාවකා න සුස්සූසන්ති, න සොතං ඔදහන්ති, න අඤ්ඤා චිත්තං උපට්ඨපෙන්ති, වොක්කම්ම ච සත්ථුසාසනා වත්තන්ති. සො එවමස්ස චොදෙතබ්බො. ආයස්මා ඛො යස්සත්ථාය අගාරස්මා අනගාරියං පබ්බජිතො,

---

අන්තරායකරවූයේම හිතවැඩ නොකැමැත්තේ වේ. හිතවැඩ නොකැමැත්තහුට සතුරුසිත එළඹසිටියේ වේ. සතුරුසිත එළඹසිටිකල්හි මිථ්‍යාදෘෂ්ටිඇත්තේ වේ. ලොහිච්චය, මිථ්‍යාදෘෂ්ටි ඇත්තහුට නරකගතිය හෝ තිරිසන්ගතිය යන ද්විප්‍රකාරගති අතුරෙන් එක්තරා ගතියක් මම වදාරමි.

16. ලොහිච්චය, එබඳුවූ මේ ශාස්තෘවරයෝ තිදෙනෙක් වෙත්. යම් කෙනෙක් මේ ලොකයෙහි චොදනාවට සුදුස්සෝ වෙත්ද, යමෙක් මෙබඳුවූ ශාස්තෘවරයන්ට චොදනාකෙරේද,ඒ චොදනාතොමෝ විද්‍යමානවන්නීය, සැබෑවන්නීය, ධාර්මිකවන්නීය, නිරවද්‍යවන්නීය. කවර තිදෙනෙක්දයත්, ලොහිච්චය, මේ ලොකයෙහි ඇතැම් ශාස්තෘකෙනෙක් යම් අර්හත්ඵලලාභයක්පිණිස ගිහිගෙන් නික්ම අනගාරිකශාසනයෙහි පැවිදිවූයේ වේද, ඔහුවිසින් ඒ ශ්‍රාමාණ්‍යාර්ථය නොහොත් අර්හත්ඵලය නොලබනලද්දේවේද,හෙතෙම ඒ ශ්‍රාමාණ්‍යාර්ථයට නොපැමිණ තොපට මේ හිතපිණිසය, තොපට මේ සැපපිණිසයයි ශ්‍රාවකයන්ට ධර්මදෙශනා කෙරේද, ඔහුගේ ඒ ශ්‍රාවකයෝ එය නොඅසත්ද, ඒ ධර්මය ඇසීමපිණිස කන්නොනමත්ද, ඒ ධර්මය දැනගැණීමපිණිස සිත එළඹ නොසිටුවත්ද, ශාස්තෘ ශාසනයෙන් බැහැරව පවතිත්ද, හෙතෙම මෙසේ චොදනාකටයුතු වන්නේය. ආයුෂ්මත්තෙම යම් අර්හත්ඵලලාභයක් පිණිස ගිහිගෙන් නික්ම අනගාරිකශාසනයෙහි පැවිදිවූයේද.

සො තෙ සාමඤ්ඤත්ථෙ අනනුප්පත්තො, තං ත්වං සාමඤ්ඤත්ථං අනනුපාපුණිත්වා සාවකානං ධම්මං දෙසෙසි ඉදං වො හිතාය ඉදං වො සුඛායාති. තස්ස තෙ සාවකා න සුස්සූසන්ති, න සොතං ඔදහන්ති, න අඤ්ඤා චිත්තං උපට්ඨපෙන්ති, වොක්කම්ම ච සත්ථුසාසනා වත්තන්ති. සෙය්‍යථාපිනාම ඔසක්කන්තියා වා උස්සුක්කෙය්‍ය, පරම්මුඛිං වා ආලිඞ්ගෙය්‍ය, එවං සම්පදමිදං පාපකං ලොභධම්මං වදාමි, කිංහි පරො පරස්ස කරිස්සතීති,අයං ඛො ලොහිච්ච පඨමො සත්ථා යො ලොකෙ චොදනාරහො, යොච පනෙව රූපං සත්ථාරං චොදෙති, සා චොදනා භූතා තච්ඡා ධම්මිකා අනවජ්ජා.

17. පුනචපරං ලොහිච්ච ඉධෙකච්චො සත්ථා යස්සත්ථාය අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති. ස්වාස්ස සාමඤ්ඤත්ථො අනනුප්පත්තො හොති සො තං සාමඤ්ඤත්ථං අනනුපාපුණිත්වා සාවකානං ධම්මං දෙසෙති, ඉදං වො හිතාය ඉදං වො සුඛායාති, තස්ස තෙ සාවකා සුස්සූසන්ති,සොතං ඔදහන්ති, අඤ්ඤා චිත්තං උපට්ඨපෙන්ති.

නාවිසින් ඒ අර්හත්ඵලය නොලබනලද්දේය. තෝ ඒ ශ්‍රාමාණ්‍යාර්ථයට නොපැමිණ තොපට මේ හිතපිණිසය,තොපට මේ සැපපිණිසයයි ශ්‍රාවකයන්ට ධර්මදෙශනා කෙරෙහිද, ඔහුගේ ඒ ශ්‍රාවකයෝ ඒ ධර්මය නොඅසත්, ඒ ධර්මශ්‍රවණයට කන් නොනමත්, ඒ ධර්මය දැනගැණීම පිණිස සිතඑලඹ නොසිටුවත්, ශාස්තෘ ශාසනයෙන් බැහැරවද පවතිත්, බැහැරයන්නියක් වෙතට එලඹෙන්නේ හෝ නොකැමැත්තෙන් කැමතිවන්නේද, පරාඞ්මුඛවූ තැනැත්තියක් වැලඳගන්නේ හෝ යම්සේද, ලොභධර්මය එසේමයයි වදාරමි. අන් යමෙක් අනුශාසනාකෙරේද, අනුශාසකවූ හෙතෙම පරහට කුමක්කරන්නේද. ලොහිච්චය, යමෙක් මේ ලොකයෙහි චොදනාකිරීමට සුදුස්සෙක් වේද,මේ දක්වනලද්දේ ඒ පළමුවෙනි ශාස්තෘතෙමේයි.යමෙක් මෙබඳු ශාස්තෘවරයාට චොදනාකෙරේද, ඒ චොදනාතොමෝ විද්‍යමානවන්නිය, සැබෑවන්නිය, ධාර්මිකවන්නීය, නිරවද්‍යවන්නිය.

17. ලොහිච්චය, නැවතද අනිකක් කියමි. මේ ලොකයෙහි සමහර ශාස්තෘවරයෙක් යම් අර්හත්ඵලලාභයක්පිණිස ගිහිගෙන් නික්ම අනගාරිකශාසනයෙහි පැවිදිවූයේ වේද, හෙතෙම ඒ ශ්‍රාමාණ්‍යාර්ථයට නොපැමිණියේ වේද, හෙතෙම ඒ ශ්‍රාමාණ්‍යාර්ථයට නොපැමිණ තොපට මේ හිතපිණිසය, තොපට මේ සැපපිණිසයයි ශ්‍රාවකයන්ට ධර්මය දෙශනා කෙරෙහිද, ඒ ශ්‍රාවකයෝ ඔහුගේ ඒ ධර්මය අසත්ද, ඒ ධර්මය දැනගැණීමපිණිස කන්නමත්ද, ඒ ධර්මය දැනගැණීමට සිත් එලඹ සිටුවත්ද.

නච වොක්කම්ම සත්ථුසාසනා වත්තන්තීති. සො එවමස්ස චොදෙතබ්බො. ආයස්මා ඛො යස්සත්ථාය. අගාරස්මා අනගාරියං පබ්බජිතො සො තෙ සාමඤ්ඤත්ථො අනනුප්පත්තො, තං ත්වං සාමඤ්ඤත්ථං අනනුපාපුණිත්වා සාවකානං ධම්මං දෙසෙසි. ඉදං වො හිතාය, ඉදං වො සුඛායාති. තස්ස තෙ සාවකා සුස්සූසන්ති, සො තං ඔදහන්ති, අඤ්ඤා චිත්තං උපට්ඨපෙන්ති, නච වොක්කම්ම සත්ථුසාසනා වත්තන්ති, සෙය්‍යථාපි නාම සකං ඛෙත්තං ඔහාය පරං ඛෙත්තං නිද්දායිතබ්බං මඤ්ඤෙය්‍ය, එවං සම්පදමිදං පාපකං ලොභධම්මං වදාමි, කිංහි පරො පරස්ස කරිස්සතීති, අයං ඛො ලොහිච්ච දුතියො සත්ථා යො ලොකෙ චොදනාරහො, යොච පනෙවරූපං සත්ථාරං චොදෙති, සා චොදනා භූතා තච්ඡා ධම්මිකා අනවජ්ජා.

18. පුනචපරං ලොහිච්ච ඉධෙකච්චො සත්ථා යස්සත්ථාය අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති. ස්වාස්ස සාමඤ්ඤත්ථො අනනුප්පත්තො හොති. සො තං සාමඤ්ඤත්ථං අනනුපාපුණිත්වා සාවකානං ධම්මං දෙසෙසි. ඉද වො හිතාය ඉදං වො සුඛායාති.

ශාස්තෘ ශාසනයෙන් බැහැරව නොපවතිත්ද, හෙතෙම මෙසේ චෝදනාකටයුතු වන්නේය. ආයුෂ්මත්තෙම වනාහි යම් අර්හත්ඵල ලාභයක් පිණිස ගිහිගෙන් නික්ම අනගාරිකශාසනයෙහි පැවිදිවූයේද, තාවිසින් ඒ ශ්‍රාමාණ්‍යාර්ථය නොලබනලද්දේය. තෝ ඒ ශ්‍රාමාණ්‍යාර්ථයට නොපැමිණ තොපට මේ හිතපිණිසය, තොපට මේ සැපපිණිසයයි ශ්‍රාවකයන්ට ධර්මය දෙශනා කෙරෙහිද, ඒ ශ්‍රාවකයෝ තාගේ ධර්මය අසත්ද, කන්නමත්ද, ඒ ධර්මය දැනගැණීමපිණිස සිතඑලඹ සිටුවත්ද, ඒ ශාස්තෘ ශාසනයෙන් බැහැරව නොපවතින්ද, සිය කුඹුර හැර පර කුඹුරක් ශෂ්‍යදූෂක තෘණ උදුරා පිරිසිදු කටයුතුකොට යම්සේ හගින්නේද, මේලාමකවූ ලොභධර්මය එසේමයයි වදාරමි. අන් යමෙක් අනුශාසනා කෙරේද, අනුශාසකවූ හෙතෙම පරහට කුමක්කරන්නේදැයි කියායි. ලොහිච්චය, යමෙක් මේ ලොකයෙහි චොදනාකිරීමට සුදුස්සෙක් වේද, මේ දක්වනලද්දේ ඒ දෙවෙනි ශාස්තෘවරතෙමේයි. යමෙක් මෙබඳුවූ ශාස්තෘවරයෙකුහට චොදනාකෙරේද, ඒ චොදනාතොමෝ විද්‍යමානවන්නිය, සැබෑවන්නිය, ධාර්මිකවන්නිය, වරදරහිතවන්නිය.

18. ලොහිච්චය, නැවතද අනිකක් කියමි. මේ ලොකයෙහි ඇතැම් ශාස්තෘවරකෙනෙක් යම් අර්හත්ඵලලාභයක්පිණිස ගිහිගෙන්නික්ම අනගාරිකශාසනයෙහි පැවිදිවූයේ හෙතෙම ඒ ශ්‍රාමාණ්‍යාර්ථයට නොපැමිණියේ වේද, හෙතෙම ඒ ශ්‍රාමාණ්‍යාර්ථයට නොපැමිණ තොපට මේ හිතපිණිසය, තොපට මේ සැපපිණිසයයි ශ්‍රාවකයන්ට ධර්මය දෙශනා කෙරේද.

තස්ස තෙ සාවකා න සුස්සූසන්ති, න සොතං ඔදහන්ති, අඤ්ඤා චිත්තං උපට්ඨපෙන්ති, වොක්කම්ම සත්ථුසාසනා වත්තන්ති. සො එවමස්ස චොදෙතබ්බො. ආයස්මා ඛො යස්සත්ථාය අගාරස්මා අනගාරියං පබ්බජිතො සො තෙ සාමඤ්ඤත්ථො අනනුප්පත්තො, තං ත්වං සාමඤ්ඤත්ථං අනනුපාපුණිත්වා සාවකානං ධම්මං දෙසෙසි. ඉදං වො හිතාය ඉදං වො සුඛායාති. තස්ස තෙ සාවකා න සුස්සූසන්ති, න සොතං ඔදහන්ති න අඤ්ඤා චිත්තං උපට්ඨපෙන්ති, වොක්කම්ම ච සත්ථුසාසනා වත්තන්ති. සෙය්‍යථාපි නාම පුරාණං බන්ධනං ඡින්දිත්වා අඤ්ඤං නවං බන්ධනං කරෙය්‍ය, එවං සම්පදමිදං පාපකං ලොභධම්මං වදාමි, කිංහි පරො පරස්ස කරිස්සතීති, අයං ඛො ලොහිච්ච තතියො සත්ථා යො ලොකෙ චොදනාරහො, යො ච පනෙවරූපං සත්ථාරං චොදෙති, සා චොදනා භූතා තච්ඡා ධම්මිකා අනවජ්ජා. ඉමෙ ඛො ලොහිච්ච තයො සත්ථාරො යෙ ලොකෙ චොදනාරහා, යො ච පනෙවරූපෙ සත්ථාරෙ චොදෙති, සා චොදනා භූතා තච්ඡා ධම්මිකා අනවජ්ජා.

ඒ ශ්‍රාවකයෝ ඔහුගේ ඒ ධර්‍මය නොඅසත්ද, ඒ ධර්‍මශ්‍රවණයට කන් නොනමත්ද, ඒ ධර්‍මයදැනගැණීමපිණිස සිතඑලඹනොසිටුවත්ද, ශාස්තෘ ශාසනයෙන් බැහැරව පවතිත්ද, හෙතෙම මෙසේ චොදනා කටයුතු වන්නේය. ආයුෂ්මත්තෙම යම් අර්හත්ඵලලාභයක් පිණිස ගිහිගෙන් නික්ම අනගාරිකශාසනයෙහි පැවිදිවූයේද, තාවිසින් ඒ ශ්‍රාමාණ්‍යඵලය නොලබනලද්දේය. තෝද ඒ ශ්‍රාමාණ්‍යඵලයට නොපැමිණ තොපට මේ හිතපිණිසය, තොපට මේ සැපපිණිසයයි ශ්‍රාවකයන්ට ධර්‍මදෙශනා කෙරෙහිද, ඒ ශ්‍රාවකයෝ ඔහුගේ ඒ ධර්‍මය නොඅසත්ද, කන්නොන මත්ද, ඒ ධර්‍මය දැනගැණීමපිණිස සිතඑලඹ නොසිටුවත්ද, ශාස්තෘ ශාසනයෙන් බැහැරව පවතිත්ද, පුරාණ බන්ධනයක් සිඳ අන්‍යවූ අභිනව බන්ධනයක් කරන්නේ යම්සේද, මේ ලාමකවූ ලොභධර්‍මය එසේමයයි වදරමි. අන් යමෙක් අනුශාසනා කෙරේද, අනුශාසකවූ හෙතෙම පරහට කුමක්කරන්නේදැයි කියායි. ලොහිච්චය, ලොකයෙහි යමෙක් චොදනාකිරීමට සුදුසුවේද, මේ දක්වනලද්දේ ඒ තුන්වෙනි ශාස්තෘතෙමේයි. යමෙක්තෙම මෙබඳුවූ ශාස්තෘවරයාට චොදනා කෙරේද, ඒ චොදනාතොමෝ විද්‍යමානවන්නිය, සැබෑවන්නිය, ධාර්මිකවන්නිය, වරදරහිතවන්නිය. ලොහිච්චය, යම්බඳුවූ මේ ශාස්තෘවරයෝ තුන්දෙනා ලොකයෙහි චොදනාකිරීමට සුදුසුයහ. යමෙක් මෙබඳුවූ ශාස්තෘවරයන්ට චොදනාකෙරේද ඒ චොදනාතොමෝ විද්‍යමානවන්නිය, සැබෑවන්නිය, ධාර්මිකවන්නිය, වරදරහිතවන්නිය, කියායි.

19. එවං වුත්තෙ ලොහිච්චො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච. අත්ථි පන භො ගොතම කොචි සත්ථා යො ලොකෙ න චොදනාරහොති, අත්ථි ඛො ලොහිච්ච සත්ථා යො ලොකෙ න චොදනාරහොති කතමො පන සො භො ගොතම සත්ථා යො ලොකෙ න චොදනාරහොති. ඉධ ලොහිච්ච තථාගතො ලොකෙ උප්පජ්ජති. අරහං සම්මා සම්බුද්ධො විජ්ජාචරණ සම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්ම සාරථී සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති. යථා සාමඤ්ඤඵලං එවං විත්ථාරෙ තබ්බං.

20. තස්සිමෙ පඤ්චනීවරණෙ පහීණෙ අත්තනි සමනුපස්සතො පාමුජ්ජං ජායති, පමුදිතස්ස පීති ජායති, පීතිමනස්ස කායො පස්සම්භති, පස්සද්ධකායො සුඛං වෙදෙති, සුඛිනො චිත්තං සමාධියති, සො විවිච්චෙව කාමෙහි.

---

19. මෙසේ වදාළකල්හි ලොහිච්ච බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේට මෙපවත් සැලකෙළේය. භවද්ගෞතමයන්වහන්ස, ලොකයෙහි යමෙක් චොදනාකිරිමට නුසුදුසු වේද, එබඳුවූ කිසියම් ශාස්තෘවරයෙක් ඇත්තේද, ලොහිච්චය, ලොකයෙහි යමෙක් චොදනාකිරිමට නුසුදුසුවේද, එබඳුවූ ශාස්තෘවරයෙක් ඇත්තේමය. භවද්ගෞතමයන්වහන්ස, ලොකයෙහි යමෙක් චොදනාකිරීමට නුසුදුසු වේද, ඒ ශාස්තෘතෙම කවරේද? ලොහිච්චය, මේ ලොකයෙහි සංසාරචක්‍රයාගේ අර කැපූවාවූ සර්ව්ප්‍රකාරයෙන් සර්ව්ධර්ම්යන් ස්වයම්භූඥානයෙන් අවබොධකළාවූ අෂ්ටවිද්‍යාපසළොස්චරණධර්ම්යන්ගෙන් සම්පූර්ණවූ, ශොභනගමන්ඇත්තාවූ, ලොවදන්නාවූ, නිරුත්තරවූ, පුරුෂයන්දමනයකරන්ට සමර්ථවූ, දෙව්මිනිසුන්ට ශාස්තෘවූ, චතුස්සත්‍යාවබොධය කළාවූ, සකලක්ලෙශයන් භග්නකළාවූ, තථාගතතෙම උපදිද, සාමඤ්ඤඵලසූත්‍රයෙහි මෙන් විස්තරකටයුතුයි.

20. ප්‍රහීණවූ නිවරණපස තමාකෙරෙහි නැතැයි මොනවට නුවණින් දක්නාවූ ඒ ශාස්තෘවරයාහට ප්‍රමොද්‍යය උපදියි. ප්‍රමොද්‍යයට පැමිණියාහට සියල් සිරුර කළඹමින් ප්‍රීතිය උපදියි. ප්‍රීතියෙන් යුක්ත සිත්ඇත්තාහුගේ නාමකාය පහවූ දහඇත්තේ වේ. නාමකාය පිළිබඳ දහය මැඩලූ තැනැත්තේ කයෙහි උපදනාවූද, සිතෙහි උපදනාවූද, සැපය විඳියි. සැපඇත්තාහුගේ සිත උපචාර වශයෙන් හා අර්පණා වශයෙන් එකඟවේ. ඒ තථාගතයන්වහන්සේ වස්තූන්ගේ ලොභනීයට හෙතුවූ ප්‍රියරූපාදි වස්තූන් කෙරෙන්ද තෘෂ්ණාදිසංක්ලෙශ ධර්ම්යන් කෙරෙන්ද නොහොත් සංක්ලෙශවස්තූයයි කියනලද අවිඤ්ඤාණක සවිඤ්ඤාණක සියලු වස්තුකාමයන් කෙරෙන් වෙන්වම හෙවත් කායවිවෙකයට පැමිණ.

විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති. පරිපූරෙති පරිප්ඵරති, නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස විවෙකජෙන පීතිසුඛෙන අප්ඵුටං හොති.

21. සෙය්‍යථාපි ලොහිච්ච දක්ඛො නහාපකො වා නහාපකන්තෙවාසී වා කංසථාලෙ නහානීය චුණ්ණානි ආකිරිත්වා උදකෙන පරිප්ඵොසකං පරිප්ඵොසකං සන්නෙය්‍ය. සාස්ස නහානීය පිණ්ඩි ස්නෙහානුගතා.

කාමච්ඡන්දනිවරණාදියෙන්ද අකුශලභාවයට හෙතුවූ අයොනිසො මනස්කාරාදියෙන් හා සියලු අකුශලධර්මයන් කෙරෙන් චිත්ත විවෙකයට පැමිණ හෙවත් විෂ්කම්භණ විවෙක වශයෙන් වෙන්ව ද්‍රොහෝ නොහොත් තෘෂ්ණාවෙන් හා ඒ සමග යෙදුන අකුශලය, ලොභසම්ප්‍රයුක්ත අෂ්ටචිත්තොත්පාදය යන මොවුන් කෙරෙන්ද,ධ්‍යානභාවනාවන්ට කාරණාවූ පූර්වයොගාදි වශයෙන් සිඬ කරණලද තෘෂ්ණාප්‍රතාපයෙන් හා අවිද්‍යාවෙන්ද, ද්වෙෂය හා යෙදුන දෙසිතය, මොහය මුල්කොට ඇති දෙසිතය යන සිව්වැදෑරුම්වූ අකුශල චිත්තයන් කෙරෙන්ද, වෙන්වම කිසි අරමුණෙක සිත එලවා එහි කල්පනා වශයෙන් සිත පිහිටුවන ස්වභාවඇති විතර්ක සහිතවූ අරමුණු පිරිමැදීම ලක්‍ෂණකොටඇති විචාරසහිතවූ, තනිව සිත විවෙකවීමෙන් නිවරණයන් කෙරෙන් දුරුවීම හෙතුකොටගෙණ උපන්නාවූ ප්‍රීතියම සැපකොට ඇත්තාවූ ප්‍රථමධ්‍යාන කුශලචිත්තය සන්තානයෙහි ඉපදවීම් වශයෙන් ඊට පැමිණ වාසයකෙරේ. ඒ තථාගතතෙමේ මේ කයම විවෙකයෙන් හටගන්නාවූ ප්‍රීතිසැපයෙන් තෙමයි හෙවත් සියලුතන්හි ප්‍රීතිසැපඇති කෙරෙයි. හාත්පසින් වැඩියක් සම්පූර්ණ කෙරෙයි, හාත්පසින් ස්පර්ශකෙරෙයි. සියලුකොටස් ඇත්තාවූ ඒ තථාගතයානන්ගේ කයපිළිබඳ ලේ මස් ඇතුළත්වූ ස්වල්පවූද ස්ථානයක් ප්‍රථමධ්‍යාන සැපයෙන් පහස්නානොලද්දේ නොවේ නොහොත් යම් යම් තැනෙක්හි කර්මජරූපය පවතිද ඒ සියලු තන්හි චිත්තජරූපය පැතිර පවතී.

21. ලොහිච්චය, යම්සේ නැමට සුදුසුවූ චූර්ණයන්කරන්ට හා යොදන්ට සමර්ථවූ ස්නානද්‍රව්‍යසම්පාදනය කරන්නෙක් හෝ ස්නාන ද්‍රව්‍ය සම්පාදකයෙකුගේ අතවැසියෙක් හෝ ලොහෝ තලියෙක්හි නැමට සුදුසුවූ චූර්ණයන් වගුරුවා ජලයෙන් ඉස ඉස පිඩුකරන්නේද ඒ මේ ස්නානචූර්ණපිණ්ඩය ජලයෙන් යුක්ත වන්නීය.

ස්නෙහපරෙතා, සන්තරබාහිරා, ඵුඨා ස්නෙහෙන නච පග්ඝරණී, එව මෙව ඛො ලොහිච්ච භික්ඛු ඉමමෙව කායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්දෙති, පරිසන්දෙති පරිපූරෙති, පරිප්ඵරති, නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස විවෙකජෙන පීතිසුඛෙන අප්ඵුටං හොති. යස්මිං ඛො ලොහිච්ච සත්ථරි සාවකො එවරූපං උළාරං විසෙසං අධිගච්ඡති,අයම්පි ඛො ලොහිච්ච සත්ථා යො ලොකෙ න චොදනාරහො යොච පනෙවරූපං සත්ථාරං චොදෙති, සා චොදනා අභූතා අතච්ඡා අධම්මිකා සාවජ්ජා.

22. පුනචපරං ලොහිච්ච භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියජ්ඣානං.......පෙ.......තතියජ්ඣානං.

ජලයභාත්පසින් ඇතුළත්වන්නේය.ඒ සුණුපිඩෙහිඇතුළතභාපිටත සියලුතන්හිම ජලයෙන් පහස්නාලද්දී වේ. නමුත් බින්දුවශයෙන් ජලය නොවැගිරෙන්නීය.ලොහිච්චය, එපරිද්දෙන්ම භික්‍ෂුතෙමේ මේ ශරීරයම නිවරණයන්ගේ අභාවයෙන් විෂ්කම්භණ විවෙකවශයෙන් හටගත්තාවූ ප්‍රීතිසැපයෙන් තෙමයි. හෙවත් සියලුතැන පැතිර පවත්නා සැප ඇති කෙරෙයි.භාත්පසින් වගුරුවයි සුලභින් කඹුරු සම පුරවන්නාක්මෙන් භාත්පසින් සම්පූර්ණ කෙරෙයි. භාත්පසින් ශ්පර්ශ කෙරෙයි. සියලුකොටස් ඇත්තාවූ ඒ භික්‍ෂුහුගේ කය පිළිබඳ ලේ මස් ආදිය ඇතුළත්වූ ස්වල්පවූද තැනක් ප්‍රථමධ්‍යාන සැපයෙන් පහස්නා නොලද්දේ නොවේ. හෙවත් සකලශරීරය ප්‍රථමධ්‍යාන සැපයෙන් සම්පූර්ණ කෙරේ. ලොහිච්චය, යම් ශාස්තෘවරයෙකු කෙරෙහි ශ්‍රාවකතෙම මෙබඳුවූ මහත් වෙනසකට පැමිණේද. ලොහිච්චය, මේ ලොකයෙහි යමෙක් චොදනාකිරීමට සුදුසු නොවේද. මේදක්වනලද්දේ ඒ පළමුවෙනි ශාස්තෘ තෙමේයි. යමෙක් මෙබඳු ශාස්තෘවරයාට චොදනා කෙරේද, ඒචොදනාතොමෝ විද්‍යමානනොවන්නීය. සැබෑ නොවන්නිය. ධාර්මික නොවන්නිය. වරදසහිත වන්නීය.

22, ලොහිච්චය, නැවතද අනිකක් කියමි. භික්‍ෂුතෙම අරමුණට සිතනැගීම ලක්‍ෂණකොට ඇති විතර්කය අරමුණු පිරිමැදීම ලක්‍ෂණකොටඇති විචාරය යන දෙදෙනාගේ සංසිඳීමෙන් තමාගේ චිත්ත සන්තානයෙහි මනාපැහැදීම ඇති සිත පිළිබඳවූ එකභාවය ඇති විතර්ක රහිතවූ විචාර රහිතවූ සමාධියෙන් හටගත්තාවූ ප්‍රීතිසැපඇති ද්විතීයධ්‍යාන චිත්තයට පැමිණවාසයකෙරේද තෘතීයධ්‍යාන චිත්තයට —පෙ—

චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරති. යස්මිං ඛො ලොහිච්ච සත්ථරි සාවකො එවරූපං උළාරං විසෙසං අධිගච්ඡති, අයම්පි ඛො ලොහිච්ච සත්ථා යො ලොකෙ න චොදනාරහො. යොචපනෙව රූපං සත්ථාරං චොදෙති, සා චොදනා අභූතා අතච්ඡා අධම්මිකා සාවජ්ජා ...පෙ...

23. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ඤාණදස්සනාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. යස්මිං ඛො ලොහිච්ච සත්ථරි සාවකො එවරූපං උළාරං විසෙසං අධිගච්ඡති, අයම්පිඛො ලොහිච්ච සත්ථා යො ලොකෙ න චොදනාරහො යොච පනෙවරූපං සත්ථාරං චොදෙති, සා චොදනා අභූතා අතච්ඡා අධම්මිකා සාවජ්ජා ...පෙ...

24. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති.

චතුර්ථධ්‍යානචිත්තයට පැමිණ වාසය කෙරෙයි. ලොහිච්චය, යම් ශාස්තෘවරයකු කෙරෙහි ශ්‍රාවකතෙම මෙබඳු මහත්වෙනසකට පැමිණේද. ලොහිච්චය, යම්බඳුවූ මේශාස්තෘතෙමේද ලොකයෙහි චොදනා කිරීමට සුදුසුනොවේ. යමෙක් මෙබඳුවූ ශාස්තෘවරයාහට චොදනා කෙරේද. ඒ චොදනාතොමෝ අවිද්‍යමාන වන්නීය. අභූතවන්නීය. අධාර්මික වන්නීය වරද සහිත වන්නීය. සෙස්සකිනයින් දතයුතු.

23. ධ්‍යානලාභී ඒ තථාගතතෙම මෙසේ ධ්‍යානයෙන් සිත එකඟවූ කල්හි පිරිසිදුවූකල්හි දීප්තිමත්වූ කල්හි කෙලෙස් රහිතවූ කල්හි පහවූ උපක්ලෙශඇති කල්හි මෘදුවූ කල්හි කර්‍මයට සුදුසුව සිටිකල්හි අකම්ප්‍ය භාවයට පැමිණිකල්හි සර්‍වප්‍රකාරයෙන් විදර්‍ශනඥාන දර්‍ශනලාභයපිණිසසිතඑලවයි. මනාසේසිතනමයි. ලොහිච්චය, යම්ශාස්තෘවරයෙකු කෙරෙහි ශ්‍රාවකතෙම මෙබඳුවූ මහත් වෙනසකට පැමිණේද ලොහිච්චය, යම් බඳුවූ මේ ශාස්තෘතෙම ලොකයෙහි චොදනා කිරීමට සුදුසු නොවේ. යමෙක්තෙම මෙබඳුවූ ශාස්තෘ වරයාහට චොදනා කෙරේද, ඒ චොදනාතොමෝ අවිද්‍යමාන වන්නීය. අභූත වන්නීය. අධාර්මික වන්නීය. වරද සහිත වන්නීය. සෙස්සකිනයිනි.

24. ඒ ධ්‍යාන ලාභී තථාගතතෙමේ. මෙසේ ධ්‍යානයෙන් සිත එකඟවූ කල්හි පිරිසිදුවූ කල්හි දීප්තිමත්වූ කල්හි කලෙස්රහිතවූ කල්හි පහවූ උපක්ලේශ ඇතිවූ කල්හි මෘදුවූකල්හි කර්‍මයට යොග්‍යව සිටිකල්හි අකම්ප්‍යභාවයට පැමිණිකල්හි ආශ්‍රවක්ෂයකරඥානයට අභිමුඛව සිත එලවයි. මනාසේ සිත නමයි.

සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති. නාපරං ඉත්ථත්තායාති පජානාති. යස්මිං ඛො ලොහිච්ච සත්ථරි සාවකො එවරූපං උළාරං විසෙසං අධිගච්ඡති, අයම්පි ඛො ලොහිච්ච සත්ථා යො ලොකෙ න චොදනාරහො. යො ච පනෙවරූපං සත්ථාරං චොදෙති, සා චොදනා අභූතා අතච්ඡා අධම්මිකා සාවජ්ජාති.

25. එවං වුත්තෙ ලොහිච්චො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච. සෙය්‍යථාපි භො ගොතම පුරිසො පුරිසං නරකප්පපාතෙ පතන්තං කෙසෙසු ගහෙත්වා උද්ධරිත්වා ථලෙ පතිට්ඨපෙය්‍ය, එවමෙවාහං භොතා ගොතමෙන නරකප්පපාතෙ පපතන්තො උද්ධරිත්වා ථලෙ පතිට්ඨාපිතො. අභික්කන්තං භො ගොතම, අභික්කන්තං භො ගොතම. සෙය්‍යථාපි භො ගොතම, නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය, චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති.

ඒතථාගතතෙමේ තත්වූ පරිද්දෙන් මේදුකයයි දැනගණියි. මේභාවය පිණිසඅනිකක් නැත්තේයයි දැනගණියි, ලොහිච්චය, යම් ශාස්තෲවරයෙකුංකෙරෙහි මෙපරිදිවිද්‍යමානවේද ශ්‍රාවකතෙමේ මෙබඳු මහත්වූ වෙනසකට පැමිණේ. ලොහිච්චය, යම් මේ ශාස්තෲතෙම ලොකයෙහි චොදනාකිරීමට සුදුසු නොවේ. යමෙක් මෙබඳුවූ ශාස්තෲවරයාහට චොදනා කෙරේද ඒ චොදනාතොමෝ අවිද්‍යමානවන්නීය. අභූතවන්නීය, අධාර්මිකවන්නීය, වරදසහිත වන්නීය.

25. මෙසේ වදාළකල්හි ලොහිච්ච බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේට මෙපවත් සැලකළේය. නරකප්‍රපාතයෙක්හි වැටෙන්නාවූ පුරුෂයෙකු යම් ශක්තිමත් පුරුෂයෙක් කෙස්වැටියෙන් අල්වා ගෙණ ගොඩනගා පෘථිවීතලයෙහි පිහිටුවන්නේ යම්සේද එපරිද්දෙන්ම නරකප්‍රපාතයෙහිවැටෙන්නාවූමමඉන්උපුටා හෙවත් වලකා භාග්‍යවතුන්වහන්සේ විසින් දෙව්ලොතෙලෙහි පිහිටුවනලද්දේය. ගොයුම්ගොත් ස්වාමීන්වහන්ස, දම්දෙසුම මැනව. ගොයුම්ගොත් ස්වාමීන් වහන්ස, දම්දෙසුම මැනව. භවත් ස්වාමීන්වහන්ස, මුනින් තබනලද භාජනයක් උඩුකුරුකොට තබන්නේහෝ යම්සේද වැසිතිබුනු යමක් විවෘතකොට දක්වන්නේ හෝ යම්සේද. මන්මුලාවූවෙකුට මගකියන්නේ හෝ යම්සේද, ඇස් ඇත්තෝ රූපයන් දකිත්වායි අඳුරෙහි තෙල්පහනක් දරන්නේහෝ යම්සේද,

එව මෙව හොතා ගොතමෙන අනෙකපරියායෙන ධමෙමා පකාසිතො. එසාහං භගවන්තං ගොතමං සරණං ගච්ඡාමි,ධම්මඤ්ච භික්ඛු සඞ්ඝඤ්ච. උපාසකං මං භවං ගොතමො ධාරෙතු,අජ්ජතගෙග පාණුපෙතං සරණං ගතන්ති.

ලොහිච්ච සුත්තං නිඨිතං ද්වාදසමං.

එපරිද්දෙන්ම භාග්‍යවතුන්වහන්සේවිසින් නොයෙක් ප්‍රකාරයෙන් ධර්මය දෙශනාකරණලද්දේය. මේ මම භාග්‍යවතුන්වහන්සේද ධර්මයද භික්‍ෂුසඞ්ඝයාද පිහිටකොට යමි.භාග්‍යවතුන්වහන්සේ අද පටන් දිවිහිම්කොට සරණගිය උපාසකයෙකැයි මා දරාගන්නාසේක්වා.

දොළොස්වෙනිවූ ලොහිච්චසූත්‍රාර්ථ ව්‍යාඛ්‍යාව නිමියේයි.

XIII තෙවිජ්ජ සුත්තං.

——:0:——

1. එවමෙමසුතං. එකං සමයං භගවා කොසලෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සඞ්ං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි යෙන මනසාකටං නාම කොසලානං බ්‍රාහ්මණගාමො තදවසරි. තත්‍ර සුදං භගවා මනසාකටෙ විහරති. උත්තරෙන මනසාකටස්ස අචිරවතියා නදියා තීරෙ අම්බවනෙ.

2. තෙන ඛො පන සමයෙන සම්බහුලා අභිඤ්ඤාතා අභිඤ්ඤාතා බ්‍රාහ්මණමහාසාලා මනසාකටෙ පටිවසන්ති. සෙය්‍යථීදං, චඞ්කී බ්‍රාහ්මණො තාරුක්ඛො බ්‍රාහ්මණො පොක්ඛරසාති බ්‍රාහ්මණො. ජානුස්සොණි බ්‍රාහ්මණො. තොදෙය්‍යබ්‍රාහ්මණො අඤ්ඤෙ ච අභිඤ්ඤාතා අභිඤ්ඤාතා බ්‍රාහ්මණමහාසාලා.

තෙවිජ්ජසූත්‍රාර්ථව්‍යාඛ්‍යා.

——:0:——

1. මේ සූත්‍රධර්මය මා විසින් මෙසේ අසනලදි. එක්කාලයෙක්හි භාග්‍යවතුන්වහන්සේ පන්සියයක් භික්ෂූන්වූ මහද්භික්ෂුසඞ්ඝයා සමග කොසොල්දනව්හි සැරිසරා වඩනාසේක් මනසාකට නම්වූ කොසොල් දනව් වැස්සන්ගේ බමුණුගම යම් තැනෙක්හිද එතනට එලඹිසේක. එහි භාග්‍යවතුන්වහන්සේ මනසාකටබමුණුගමට සමීපවූ උතුරුපසෙහි අචිරවතිනදීතීරයෙහිවූ අඹවෙනෙහි වාසය කරණසේක.

2. ඒ කාලයෙහි බොහෝවූ කුලචාරිත්‍රාදිසම්පත්තියෙන් ප්‍රසිද්ධාතිප්‍රසිද්ධවූ මහාසාරකුලවත් බ්‍රාහ්මණයෝ මනසාකට බමුණුගමෙහි වාසය කෙරෙත්. ඔව්හු කවරහුදයත්, චඞ්කීබ්‍රාහ්මණතෙමේද තාරුක්ඛ බ්‍රාහ්මණතෙමේද, පොක්ඛරසාතී බ්‍රාහ්මණතෙමේද, ජානුස්සොණි බ්‍රාහ්මණතෙමේද, තොදෙය්‍ය බ්‍රාහ්මණ තෙමේද, මෙසින් අන්‍යවූද ප්‍රසිද්ධාතිප්‍රසිද්ධවූ බමුණුමහසල් කුලයෝයි.

3. අථඛො වාසෙඪ භාරද්වාජානං ජඞ්ඝාවිහාරං අනුචඞ්කමන්තානං අනුවිචරන්තානං මග්ගාමග්ගෙ කථා උදපාදි.

4. අථ ඛො වාසෙඪො මාණවො එවමාහ. අයමෙව උජුමග්ගො අයං අඤ්ජසායනො නිය්‍යාණිකො නිය්‍යාති තක්කරස්ස බ්‍රහ්මසහව්‍යතාය ය්වායං අක්ඛාතො බ්‍රාහ්මණෙන පොක්ඛරසාතිනා.

5. භාරද්වාජො මාණවො එවමාහ. අයමෙව උජුමග්ගො අයමඤ්ජසායනො නිය්‍යාණිකො නිය්‍යාති. තක්කරස්ස බ්‍රහ්මසහව්‍යතාය ය්වායං අක්ඛාතො බ්‍රාහ්මණෙන තාරුක්ඛෙනාති,

6. නෙවඛො අසක්ඛි වාසෙඪො මාණවො භාරද්වාජං මාණවං සඤ්ඤාපෙතුං. න පන අසක්ඛි භාරද්වාජො මාණවො වාසෙඪං මාණවං සඤ්ඤාපෙතුං,

---

3. ඉක්බිත්තෙන් බොහෝවේලා නිසිදනය කළහෙයින් ක්ලාන්ත දුරුකිරීමපිණිස ජඞ්ඝාවිහරණයෙහි ඔබිමොබ නැවත නැවත සක්මන් කරන්නාවූ ඔබි මොබ හැසිරෙන්නාවූ පොක්ඛරසාති තාරුක්ඛ බ්‍රාහ්මණ දෙදෙනාගේ අතවැසිවූ වාසෙඪභාරද්වාජදෙදෙනාසම්බන්ධව මාර්‍ගා මාර්‍ග දෙක අරබයා කථාවක් පහළවිය.

4. ඉක්බිත්තෙන් වාසෙඪමාණවකතෙම මෙසේ කීයයි. පොක්ඛරසාතී බ්‍රාහ්මණයාවිසින් යම් මේ මාර්‍ගයක් කියනලද්දේනම් මෙයම සෘජු මාර්‍ගය වේ. මෙ මාර්‍ගයම නෛර්‍ය්‍යාණිකවූයේ ඒ කරන්නහුගේ හෙවත් ඒ ශ්‍රෙෂ්ඨමාර්‍ගයෙහි පිළිපදින්නහුගේ බ්‍රහ්මයා සමග එකතැන්හි පහළවීමපිණිස හෙවත් බ්‍රහ්මාත්මලාභයපිණිස පවතීය යනුයි.

5. භාරද්වාජ මාණවකතෙම මෙසේ කියයි. තාරුක්ඛබ්‍රාහ්මණයාවිසින් යම් මේ මාර්‍ගයක් කියනලද්දේනම් මෙයම සෘජු මාර්‍ගය වේ. මේ මාර්‍ගයම නෛර්‍ය්‍යාණිකවූයේ ඒ කරන්නහුගේ හෙවත් ඒ ශ්‍රෙෂ්ඨ මාර්‍ගයෙහි පිළිපදින්නහුගේ බ්‍රහ්මයා සමග එකතැන්හි පහළවීම පිණිස හෙවත් බ්‍රහ්මාත්මලාභයපිණිස පවතීය යනුයි.

6. වාසෙඪ මාණවකතෙමේ භාරද්වාජ මාණවකයාට ඔහුගේකථාව පිළිගන්වන්ට නොහැකිවූයේමය, භාරද්වාජ මාණවකතෙමේද වාසෙඪ මාණවකයාට ඔහු ගේ කථාව පිළිගන්වන්ට නොහැකිවිය.

7, අථඛො වාසෙට්ඨො මාණවො භාරද්වාජං මාණවං ආමන්තෙසි. අයං ඛො භාරද්වාජ සමණො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො මනසාකටෙ විහරති. උත්තරෙණ මනසාකටස්ස අචිරවතියා නදියා තීරෙ අම්බවනෙ. තං ඛො පන භගවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො, ඉතිපි සො භගවා අරහං සම්මා සම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිස දම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති. ආයාම භො භාරද්වාජ යෙන සමණො ගොතමො තෙනුපසඞ්කමාම. උපසඞ්කමිත්වා එතමත්ථං සමණං ගොතමං පුච්ඡිස්සාම යථා නො සමණො ගොතමො ව්‍යාකරිස්සති. තථා නං ධාරෙස්සාමාති. එවං භොති ඛො භාරද්වාජො මාණවො වාසෙට්ඨස්ස මාණවස්ස පච්චස්සොසි.

8. අථඛො වාසෙට්ඨභාරද්වාජා මාණවා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදිංසු. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා,

---

7. ඉක්බිත්තෙන් වාසෙට්ඨමාණවකතෙමේ භාරද්වාජ මාණවකයා ඇමතුයේය. භාරද්වාජය, ශාක්‍යරාජපුත්‍රවූ ශාක්‍යකුලයෙන් නික්ම පැවිදිවූ ප්‍රසිද්ධවූ මේ ශ්‍රමණ ගෞතමයන්වහන්සේ මනසාකටනම් බමුණුගම ඊට සමීපවූ උතුරු පසෙහි අචිරවතීගඞ්ගාතීරයෙහිවූ අඹවෙනෙහි වාසයකරණසේක. ඒ භගවත් ගෞතමයන්වහන්සේ සම්බන්ධව මෙසේ යහපත්කීර්තිඝෝෂාවක් උස්ව නැංගේය. ඒභාග්‍යවතුන්වහන්සේ මේ කාරණයෙන් අර්හත් සේක. සම්‍යක් සම්බුද්ධසේක. අෂ්ටවිද්‍යා පසළොස් චරණ ධර්මයන්ගෙන් සම්පූර්ණ සේක. ශොභන ගමන් ඇතිසේක. ලොකත්‍රය දන්නාසේක. ශ්‍රෙෂ්ඨවූ චණ්ඩ පුරුෂයන් දමනය කිරිමෙහි දක්‍ෂසේක. දෙවිමිනිසුන්ට අනුශාසනා කරණසේක. සම්‍යක් සම්බුද්ධසේක. භාග්‍යවත්සේකැයි කියායි. පින්වත් භාරද්වාජය, යමු. ශ්‍රමණගෞතමයන්වහන්සේ යම් තැනෙක්හිද එතනට එළඹෙමු. එළඹ මේකාරණය ශ්‍රමණගෞතමයන්වහන්සේ විචාරන්නෙමු. ශ්‍රමණ ගෞතමයන්වහන්සේ යම්පරිද්දෙකින් අපට ප්‍රකාශකරන්නේද, එසේ මේකාරණය දරාගන්නෙමුයි. පින්වත, එසේයයි භාරද්වාජ මාණවකතෙමේ වාසෙට්ඨ මාණවකයාට පිළිවදන් දුන්නේය.

8. ඉක්බිත්තෙන් වාසෙට්ඨභාරද්වාජමාණවකයෝ භාග්‍යවතුන්වහන්සේ යම්තැනෙක්හිද එතනට එළඹියාහුය. එළඹ භාග්‍යවතුන්වහන්සේ සමග සතුටුවූහ. සතුටුවියයුතුවූ සිහිකටයුතුවූ කථාවකොට නිමවා.

එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නො ඛො වාසෙට්ඨො මාණවො භගවන්තං එතදවොච. ඉධ භො ගොතම අම්හාකං ජඞ්ඝාවිහාරං අනුචඞ්කමන්තානං අනුවිචරන්තානං මග්ගාමග්ගෙ කථා උදපාදි. අහං එවං වදාමි. අයමෙව උජුමග්ගො අයමඤ්ජසායනො නිය්‍යාණිකො නිය්‍යාති තක්කරස්ස බ්‍රහ්මසහබ්‍යතාය ය්වායං අක්ඛාතො බ්‍රාහ්මණෙන පොක්ඛරසාතිනාති. භාරද්වාජො මාණවො එවමාහ. අයමෙව උජුමග්ගො අයමඤ්ජසායනො නිය්‍යාණිකො නිය්‍යාති. තක්කරස්ස බ්‍රහ්මසහබ්‍යතාය ය්වායං අක්ඛාතො බ්‍රාහ්මණෙන තාරුක්ඛෙනාති. එත්ථ භො ගොතම අත්ථෙව විග්ගහො අත්ථි විවාදො අත්ථිනානා වාදොති.

9. ඉති කිර වාසෙට්ඨ ත්වං එවං වදෙසි අයමෙව උජුමග්ගො අයමඤ්ජසායනො නිය්‍යාණිකො නිය්‍යාති තක්කරස්ස බ්‍රහ්මසහබ්‍යතාය ය්වායං අක්ඛාතො බ්‍රාහ්මණෙන පොක්ඛරසාතිනාති.

එකත්පසෙක උන්හ. සම්පවූ එක් පෙදෙසෙක්හි උන්නාවූ වාසෙට්ඨ මාණවකතෙමේ භාග්‍යවතුන්වහන්සේට මේකාරණය සැලකළේය. භවද්ගෞතමයන්වහන්ස, මෙහි ජඞ්ඝාවිහරණයෙහි ඔබ මොබ සක්මන්කරන්නාවූ, ඔබ මොබ හැසිරෙන්නාවූ අප සම්බන්ධව මාර්‍ගාමාර්‍ගදෙක අරබයා කථාවක් උපන්නේය,මම මෙසේ කියමි. පොක්ඛරසාතිබ්‍රාහ්මණයාවිසින් යම් මේ මාර්‍ගයක් කියනලද්දේද මෙයම සෘජුමාර්‍ගය වේ. මේ මාර්‍ගයම නෛර්‍යාණිකවූයේ. ඒ මාර්‍ගයෙහි පිළිපදින්නහුගේ, බ්‍රහ්මයා සමග එකතැන්හි පහළවීමපිණිස පවතීය යනුයි. භාරද්වාජ මාණවකතෙමේ මෙසේ කියයි, තාරුක්ඛබ්‍රාහ්මණයා විසින් යම් මේ මාර්‍ගයක් කියනලද්දේනම් මෙයම සෘජුමාර්‍ගය වේ. මේ මාර්‍ගයම නෛර්‍යාණිකවූයේ ඒ මාර්‍ගයෙහි පිළිපදින්නහුගේ බ්‍රහ්මයා සමග එකතැන්හි පහලවීම පිණිස හෙවත් බ්‍රහ්මාත්මලාභය පිණිස පවතීය යනුයි. භවද් ගෞතමයන්වහන්ස, මේ මාර්‍ගාමාර්‍ග දෙක අරබයා පළමුකොටම විරුඬ ග්‍රහණයෙක් ඇත්තේමය. විරුඬ වශයෙන් ඔවුනොවුන් සම්බන්ධව පැවති විවාදයක් ඇත්තේමය, නොයෙක් ආචාර්‍ය්‍යයන් පිළිබඳ නෙයින් නානාවිධ වාදයක් ඇත්තේමය.

9. වාසෙට්ඨය, තෝ මෙසේනම් කියන්නෙහිද, ඒනම්, පොක්ඛරසාතිබ්‍රාහ්මණයා විසින් යම් මේ මාර්‍ගයක් කියනලද්දේනම් මෙයම සෘජුමාර්‍ගයවේ. මේ මාර්‍ගයම නෛර්‍යාණිකවූයේ ඒ මාර්‍ගයෙලෙස පිළිපදින්නාහුගේ බ්‍රහ්මසහභාවයපිණිස පවතීය යනුයි.

භාරද්වාජො මාණවො එවමාහ. අයමෙව උජුමග්ගො, අයමඤ්ජ
සායනො නිය්‍යාණිකො නිය්‍යාති. තක්කරස්ස බ්‍රහ්මසහබ්‍යතාය
ය්වායං අක්ඛාතො බ්‍රාහ්මණෙන තාරුක්ඛෙනාති. අථ කිස්මිං පන
වො වාසෙට්ඨ විග්ගහො කිස්මිං විවාදො කිස්මිං නානා වාදොති.

10. මග්ගා මග්ගෙ භො ගොතම. කිඤ්චාපි භො ගොතම බ්‍රාහ්මණා
නානාමග්ගෙ පඤ්ඤපෙන්ති. අද්ධරියා බ්‍රාහ්මණා තිත්තිරියා බ්‍රාහ්
මණා ඡන්දොකා බ්‍රාහ්මණා ඡන්දවා බ්‍රාහ්මණා බ්‍රහ්මචරියා බ්‍රාහ්මණා.
අථ ඛො සබ්බානි තානි නිය්‍යානිකානි නිය්‍යන්ති තක්කරස්ස බ්‍රහ්ම
සහබ්‍යතාය, සෙය්‍යථාපි භො ගොතම ගාමස්සවා නිගමස්සවා අවිදූරෙ.

භාරද්වාජමාණවකතෙම මෙසේ කියයි, ඒනම් තාරුක්ඛබ්‍රාහ්ම
ණයා විසින් යම් මේ මාර්ගයක් කියනලද්දේනම් මෙයම ඍජු මාර්ගයවේ
මේ මාර්ගයම නෛර්‍ය්‍යාණිකවේ. ඒ මාර්ගයලෙස පිළිපදින්නහුගේ
බ්‍රහ්මාත්ම ලාභයපිණිස පවතිය යනුයි. වාසෙඨය එසේ ඇතික
ල්හි කවර කරුණෙක්හිනම් තොප දෙදෙනා සම්බන්ධව විවිධග්‍රාහ
යෙක්වීද, කවරකරුණෙක්හි විවාදයෙක්ද කවර කරුණෙක්හි
නානාවාදයෙක් වීදැයි විචාළේය.

10. භවද්ගෞතමයන්වහන්ස, මාර්ග අමාර්ග දෙක්හියි නොහොත්කව
රක් ඍජුමාර්ගයද, කවරක් වඞ්කමාර්ගයදැයි කියායි. භවද්ගෞතමයන්
වහන්ස, යම්සේ බ්‍රාහ්මණයෝ නානාමාර්ගයන් පණවත්ද, ඒනම්,
යජුර්වෙදයෙහි නියමිත අධ්වරියනම් යාගවිශෙෂය කරන්නාවූ බ්‍රාහ්
මණයෝ ඇත්තාහුය. යජුර්වෙදයෙහිම දක්වනලද තිත්තිරියනම්
ඍෂිහු විසින්කරණලද මන්ත්‍රයන් හදාරන්නාවූ තිත්තිරියනම් බ්‍රාහ්ම
ණයෝ ඇත්තාහ. සාමවෙදයෙහි කියනලද අනුසාරයෙන් මන්ත්‍ර
හදාරන්නාවූ ඡන්දොකානම් බ්‍රාහ්මණයෝ ඇත්තාහ. ගායත්‍රි ආදි
ඡන්දසෙහි කියූපරිද්දෙන් වෙද හදාරන්නාවූ බ්‍රාහ්මණයෝ ඇත්තාහ.
ඍග්වෙදයෙහි දක්වනලද පරිද්දෙන් මන්ත්‍රහදාරමින් පරමමාත්‍ර
ශිලශුද්ධියපිණිස බඹසරකරන්නාවූ බ්‍රහ්මචරියනම් බ්‍රාහ්මණයෝ ඇත්
තාහ. නොහොත් ඔවුන්පිළිබඳ නානාවිධ මාර්ගයෝ ඇත්තාහ. එසේ
ඇතිකල්හි ඒ සියලු මාර්ගයෝ නෛර්‍ය්‍යාණිකවූවෝ ඒ මාර්ගයෙහි පිළි
පදින්නහුගේ බ්‍රහ්මාත්මලාභයපිණිස පැමිණෙත්. කෙසේද, භවද්
ගෞතමයන්වහන්ස, යම්සේ ගමකට හෝ නියම්ගමකට හෝ නුදුරු
තන්හි,

බහූනිවෙපි නානා මග්ගානි භවන්ති. අථ ඛො සබ්බානි තානි ගාමසමොසරණානි භවන්ති. එවමෙව ඛො භො ගොතම කිඤ්චාපි බ්‍රාහ්මණා නානා මග්ගෙ පඤ්ඤපෙන්ති. අද්ධරියා බ්‍රාහ්මණා තිත්තිරියා බ්‍රාහ්මණා ඡන්දොකා බ්‍රාහ්මණා ඡන්දවා බ්‍රාහ්මණා බ්‍රහ්මචරියා බ්‍රාහ්මණා. අථ ඛො සබ්බානි තානි නිය්‍යානිකානි නිය්‍යන්ති තක්කරස්ස බ්‍රහ්ම සහව්‍යතායාති.

11. නිය්‍යන්තීති වාසෙට්ඨ වදෙසි. නිය්‍යන්තීති භො ගොතම වදාමි. නිය්‍යන්තීති වාසෙට්ඨ වදෙසි. නිය්‍යන්තීති භො ගොතම වදාමි. කිං නිය්‍යන්තීති වාසෙට්ඨ වාදෙසි. නිය්‍යන්තීති භො ගොතම වදාමි. කිං පන වාසෙට්ඨ අත්ථි කොචි තෙවිජ්ජානං බ්‍රාහ්මණානං එක බ්‍රාහ්මණොපි යෙන බ්‍රහ්මා සක්ඛිදිට්ඨොති. නොහිදං භො ගොතම.

12. කිං පන වාසෙට්ඨ අත්ථි කොචි තෙවිජ්ජානං බ්‍රාහ්මණානං එකාචරියොපි යෙන බ්‍රහ්මා සක්ඛිදිට්ඨොති.

බොහෝවූ නොයෙක් මාර්ගයෝ වෙත්ද, එසේඇතිකල්හි ඒ සියලු මාර්ගයෝ ගමටඇතුළත්වන්නාහුම වෙත්ද, භවද්ගෞතමයන්වහන්ස, එපරිද්දෙන්ම යම්සේ බ්‍රාහ්මණයෝ නානාමාර්ගයන් පණවත්ද. ඒනම්, අද්ධරියබ්‍රාහ්මණයෝය, තිත්තිරිය බ්‍රාහ්මණයෝය, ඡන්දොකා බ්‍රාහ්මණයෝය, ඡන්දවානම් බ්‍රාහ්මණයෝය, බ්‍රහ්මචරිය බ්‍රාහ්මණයෝය යන මොව්හුයි. එසේඇතිකල්හි නෛර්‍ය්‍යාණිකවූ ඒ සියලු මාර්ගයෝ ඒ මාර්ගයෙහි පිළිපදින්නාහුගේ බ්‍රහ්මාත්මලාභයපිණිස පැමිණෙත්.

11. වාසෙඨය, කිමෙක්ද, නෛර්‍ය්‍යාණිකයයි කියන්නෙහිදැයි විචාළසේක. භවද්ගෞතමයන්වහන්ස, නෛර්‍ය්‍යාණිකයයි කියමි. වාසෙඨය කිමෙක්ද, නෛර්‍ය්‍යාණිකයයි කියන්නෙහිදැයි දෙවනුවද විචාළසේක. භවද්ගෞතමයන්වහන්ස, නෛර්‍ය්‍යාණිකයයි කියමි. වාසෙඨය, කිමෙක්ද, නෛර්‍ය්‍යාණිකයයි කියන්නෙහිදැයි තුන්වෙනුවද විචාළසේක. භවද්ගෞතමයන්වහන්ස, නෛර්‍ය්‍යාණිකයයි කියමි.

12. වාසෙඨය, කිමෙක්ද, යමෙකුවිසින් බ්‍රහ්මතෙමේ ඇසින් දක්නාලද්දේද, ත්‍රිවිද්‍යක බ්‍රාහ්මණයන් අතුරෙන් එබඳු කිසියම් බ්‍රාහ්මණයෙක් ඇත්තේදැයි විචාළසේක. භවද්ගෞතමයන්වහන්ස, මෙය නොවේමය නොහොත් එබන්දෙක් නැතැයි සැලකළේය. වාසෙඨය, කිමෙක්ද, යමෙකුවිසින් බ්‍රහ්මතෙමේ ඇසින් දක්නාලද්දේද, ත්‍රිවිද්‍යක බ්‍රාහ්මණයන් අතුරෙන් එබඳු කිසියම් එක් ආචාර්‍ය්‍ය බ්‍රාහ්මණයෙක් වත් ඇත්තේදැයි විචාළසේක.

නොහිදං භො ගොතම. කිං පන වාසෙට්ඨ අත්ථි කොචි තෙවිජ්ජානං බ්‍රාහ්මණානං එකාචරියපාචරියොපි යෙන බ්‍රහ්මා සක්ඛිදිට්ඨොති. නොහිදං භො ගොතම. කිං පන වාසෙට්ඨ අත්ථි කොචි තෙවිජ්ජානං බ්‍රාහ්මණානං යාවසත්තමා ආචරියමහායුගා යෙන බ්‍රහ්මා සක්ඛිදිට්ඨොති. නොහිදං භො ගොතම.

13. කිං පන වාසෙට්ඨ යෙපි තෙවිජ්ජානං බ්‍රාහ්මණානං පුබ්බකා ඉසයො මන්තානං කත්තාරො මන්තානං පවත්තාරො යෙසමිදං එතරහි තෙවිජ්ජා බ්‍රාහ්මණා පොරාණං මන්තපදං ගීතං පවුත්තං සමිහිතං තදනුගායන්ති තදනුභාසන්ති භාසිතමනුභාසන්ති වාචිතමනුවාචෙන්ති සෙය්‍යථීදං, අට්ඨකො වාමකො වාමදෙවො වෙස්සාමිත්තො යමතග්ගී අඞ්ගීරසො භාරද්වාජො වාසෙට්ඨො කස්සපො භගු. තෙපි එවමාහංසු මයමෙතං ජානාම මයමෙතං පස්සාම යත්ථ වා බ්‍රහ්මා යෙන වා බ්‍රහ්මා යහිං වා බ්‍රහ්මාති. නොහිදං භො ගොතම.

භවද්ගෞතමයන්වහන්ස, එබන්දෙක් නැතැයි සැලකළේය. වාසෙඨය, කිමෙක්ද, යමෙකුවිසින් බ්‍රහ්මතෙම ඇසින් දක්නාලද්දේද, ත්‍රිවිද්‍යක බ්‍රාහ්මණයන් අතුරෙන් එබඳු කිසියම් එක් ආචාර්ය්‍ය ප්‍රාචාර්ය්‍ය බ්‍රාහ්මණයෙක්වත් ඇත්තේදැයි විචාළසේක. භවද්ගෞතමයන්වහන්ස, එබන්දෙක් නැත්තේයයි සැලකළේය. වාසෙඨය, කිමෙක්ද, යමෙකුවිසින් බ්‍රහ්මතෙම ඇසින් දක්නාලද්දේද, ත්‍රිවිද්‍යක බ්‍රාහ්මණයන්ගේ සත්වෙනි ආචාර්ය්‍ය මහායුගලය දක්වා එබඳු කිසියම් එක් බ්‍රාහ්මණයෙක්වත් ඇත්තේදැයි විචාළසේක. භවද්ගෞතමයන්වහන්ස, එබන්දෙක් නැතැයි සැලකළේය.

13. වාසෙඨය, කිමෙක්ද, මන්ත්‍රකර්තෘවූ මන්ත්‍ර පැවැත්තුවාවූ නොහොත් ගායත්‍රිආදි ඡන්දානුගතව මන්ත්‍ර ප්‍රකාශකළාවූ ත්‍රිවිද්‍යක බ්‍රාහ්මණයන්ගේ යම් ඒ පූර්ව ඍෂිහු වෙත්ද, ඒ කවරහුදයත්. දැන් ත්‍රිවිද්‍යකබ්‍රාහ්මණයෝ යම්කෙනෙකුන්ගේ පුරාණවූ මන්ත්‍රපදයටද ගීතයටද උච්චස්වරාදිවශයෙන් උතුම්කොට කියනලද්දටද සම්හිතයටදැයි ඔවුන්විසින් කියනලද්දට අනුව ගායනා කෙරෙත්ද, ඔවුන්ට අනුව කියත්ද. ඔවුන්විසින් කියනලද්දට අනුව කියත්ද. ඔවුන්විසින් කියවන ලද්දට අනුව කියවත්ද. ඔව්හු කවරහුදයත්, අට්ඨකය, වාමකය, වාමදෙවය, වෙස්සාමිත්තය, යමතග්ගිය, අඞ්ගීරසය, භාරද්වාජය, වාසෙඨය, කස්සපය, භගුය යන මොව්හුයි. ඔව්හුද බ්‍රහ්මතෙමේ යම්තැනක වේද, යමක්කරණකොටගෙණ බ්‍රහ්ම වේද, යම් ලොකයෙක්හි බ්‍රහ්මතෙමේ වේද, අපි මෙය දනිමුය අපි මෙය දකිමුයයි මෙසේ කීවාහුදැයි විචාළසේක. භවද් ගෞතමයන්වහන්ස, මෙය නොවේමය. නොහොත් මෙසේ නොකීවාහුමය.

14. ඉති කිර වාසෙට්ඨ නත්‍ථි කොචි තෙවිජ්ජානං බ්‍රාහ්මණානං එකබ්‍රාහ්මණොපි යෙන බ්‍රහ්මා සක්ඛිදිට්ඨො. නත්‍ථි කොචි තෙවිජ්ජානං බ්‍රාහ්මණානං එකාචරියොපි යෙන බ්‍රහ්මා සක්ඛිදිට්ඨො. නත්‍ථි කොචි තෙවිජ්ජානං බ්‍රාහ්මණානං එකාචරියපාචරියොපි යෙන බ්‍රහ්මා සක්ඛිදිට්ඨො, නත්‍ථි කොචි තෙවිජ්ජානං බ්‍රාහ්මණානං යාව සත්තමා ආචරියමහායුගා යෙන බ්‍රහ්මා සක්ඛිදිට්ඨො. යෙපි කිර තෙවිජ්ජානං බ්‍රාහ්මණානං පුබ්බකා ඉසයො මන්තානං කත්තාරො මන්තානං පවත්තාරො යෙසමිදං එතරහි තෙවිජ්ජා බ්‍රාහ්මණා පොරාණං මන්තපදං ගීතං පවුත්තං සමිහිතං තදනුගායන්ති තදනුභාසන්ති භාසිතමනුභාසන්ති වාචිතමනුවාචෙන්ති. සෙය්‍යථීදං, අට්ඨකො වාමකො වාමදෙවො වෙස්සාමිත්තො යමතග්ගී අඞ්ගීරසො භාරද්වාජො කස්සපො භගු. තෙපි න එවමාහංසු මයමෙතං ජානාම මයමෙතං පස්සාම යත්‍ථ වා බ්‍රහ්මා යෙන වා බ්‍රහ්මා යහිං වා බ්‍රහ්මාති.

---

14. වාසෙට්ඨය, මෙසේ ඇතිකල්හි යමෙකුවිසින් බ්‍රහ්මතෙමේ ඇසින් දක්නාලද්දේද, ත්‍රිවිද්‍යක බ්‍රාහ්මණයන්අතුරෙන් එබඳු එක් බ්‍රාහ්මණයෙකුත් නැත්තේය. යමෙකුවිසින් බ්‍රහ්මතෙමෙ ඇසින් දක්නාලද්දේද, ත්‍රිවිද්‍යක බ්‍රාහ්මණයන් අතුරෙන් එබඳු එක් ආචාර්‍ය්‍ය බ්‍රාහ්මණයෙක්වත් නැත්තේය. යමෙකුවිසින් බ්‍රහ්මතෙමේ ඇසින් දක්නාලද්දේද, ත්‍රිවිද්‍යක බ්‍රාහ්මණයන් අතුරෙන් එබඳු එක් ආචාර්‍ය්‍ය ප්‍රාචාර්‍ය්‍ය බ්‍රාහ්මණයෙක්වත් නැත්තේය. ත්‍රිවිද්‍යක බ්‍රාහ්මණයන්ගේ සත්වෙනි ආචාර්‍ය්‍ය මහායුගලයදක්වා පැවැත්තවුන්විසින්ද බ්‍රහ්මතෙමේ ඇසින් නොදක්නාලද්දේය. මන්ත්‍ර කර්තෘවූ මන්ත්‍ර පැවැත්තුවාවූ නොහොත් ගායත්‍රී ආදී ඡන්දානුගතව මන්ත්‍ර ප්‍රකාශකළාවූ ත්‍රිවිද්‍යක බ්‍රාහ්මණයන්ගේ යම් ඒ පූර්වඍෂිහු වෙත්ද, ඒ කවරහුදයත්. දැන් ත්‍රිවිද්‍යක බ්‍රාහ්මණයෝ යම්කෙනෙකුන්ගේ පුරාණවූ මන්ත්‍රපදය වද, ගීතයවද, උච්චස්වරාදිවශයෙන් උතුම්කොට කියනලද්දවද, සම්හිතයවදැයි ඔවුන්විසින් කියනලද්දට අනුව ගායනාකෙරෙත්ද. ඔවුන්ට අනුව කියත්ද. ඔවුන්විසින් කියනලද්දට අනුව කියත්ද. ඔවුන් විසින් කියවනලද්දට අනුව කියවත්ද, ඔව්හු කවරහුදයත්. අට්ටකය, වාමකය, වාමදෙවය, වෙස්සාමිත්තය, යමතග්ගීය, අඞ්ගිරසය, භාරද්වාජය, වාසෙට්ඨය, කස්සපය, භගුය, යන මොව්හුයි. බ්‍රහ්මතෙමේ යම් තැනක වේද, යමක් කරණකොටගෙණ බ්‍රහ්මවේද, යම්ලොකයෙක්හි බ්‍රහ්මතෙමේ වේද, අපි මෙය දනිමුය. අපි මෙය දකිමුයයි ඔව්හුද මෙසේ නොකීවාහුය.

තෙ වත තෙවිජ්ජා බ්‍රාහමණා එවමාහංසු යං න ජානාම යං න පස්සාම තස්ස සහව්‍යතාය මග්ගං දෙසෙම, අයමෙව උජුමග්ගො අයමඤ්ජසායනො නිය්‍යාණිකො නිය්‍යාති තක්කරස්ස බ්‍රහ්ම සහව්‍යතායාති. තං කිමමඤ්ඤසි වාසෙට්ඨ නනු එවං සන්තෙ තෙවිජ්ජානං බ්‍රාහ්මණානං අප්පාටිහිරකතං භාසිතං සම්පජ්ජතීති. අද්ධාඛො භො ගොතම එවං සන්තෙ තෙවිජ්ජානං බ්‍රාහ්මණානං අප්පාටිහිරකතං භාසිතං සම්පජ්ජතීති.

15. තෙ වත වාසෙට්ඨ තෙවිජ්ජා බ්‍රාහ්මණා යං න ජානන්ති යං න පස්සන්ති තස්ස සහව්‍යතාය මග්ගං දෙසෙස්සන්ති. අයමෙව උජුමග්ගො අයමඤ්ජසායනො නිය්‍යාණිකො නිය්‍යාති තක්කරස්ස බ්‍රහ්මසහව්‍යතායාති, නෙතං ඨානං විජ්ජති. සෙය්‍යථාපි වාසෙට්ඨ අන්ධවෙණි පරම්පර සංසත්තා පුරිමොපි න පස්සති මජ්ඣිමොපි න පස්සති පච්ඡිමොපි න පස්සති. එවමෙවඛො වාසෙට්ඨ අන්ධවෙණූපමඤ්ඤෙ තෙවිජ්ජානං බ්‍රාහ්මණානං භාසිතං.

එකාන්තයෙන් ඒ ත්‍රිවිද්‍යකබ්‍රාහ්මණයෝ මෙසේ කිහ. අපි යමක් නොදනිමුද යමක් නොදක්නෙමුද ඔහුගේ සහභාවය පිණිස මාර්ගය කියමු. කෙසේද, මේම ඍජු මාර්ගයයි මේමාර්ගයම නෛර්‍ය්‍යාණිකවූයේ මේ නෛර්‍ය්‍යාණිකමාර්ගයලෙස පිළිපදින්නහුගේ බ්‍රහ්මාත්මලාභයපිණිස පවතිය කියායි. වාසෙෂ්ඨය, ඒ කුමකැයි හඟනෙහිද, මෙසේඇතිකල්හි ත්‍රිවිද්‍යක බ්‍රාහ්මණයන්ගේ භාෂිතය ප්‍රතිහරණය නොකටහැකි බවට නොපැමිණේද, භවද් ගෞතමයන්වහන්ස, එකාන්තයෙන් මෙසේ ඇතිකල්හි ත්‍රිවිද්‍යක බ්‍රාහ්මණයන්ගේ භාෂිතය ප්‍රතිහරණය නොකටහැකිබවට පැමිණේමයයි සැලකළේය.

15. වාසෙෂ්ඨය, එකාන්තයෙන් ඒත්‍රිවිද්‍යකබ්‍රාහමණයෝ යමක් නොදනිත්ද. යමක් නොදකිත්ද, ඔහුගේ සහභාවයපිණිස හෙවත් එය ලැබීම පිණිස මාර්ගය දෙසනාකරන්නාහුය. මේම ඍජුමාර්ගයවේ. මේමාර්ගයම නෛර්‍ය්‍යාණිකවූයේ මේ නෛර්‍ය්‍යාණිකමාර්ගයලෙස පිළිපදින්නහුගේ බ්‍රහ්මාත්මලාභයපිණිස පවතීය කියායි. මේ කාරණයවූකල් විද්‍යමාන නොවේ. වාසෙෂ්ඨය, එක්අන්ධයෙකුවිසින් ගන්නාලද සැරයටිකොණ තවත් අන්ධයෙක්දැයි මෙසේ පණසක් සැටක් පමණවූ අන්ධ පඞ්ක්තියක් අන්‍යොන්‍යසම්බන්ධතා ඇත්තී පෙරටුව යන තැනැත්තේත් නොදකීද, මැදයන තැනැත්තේත් නොදකීද, පසුව යන තැනැත්තේත් නොදකීද, වාසෙෂ්ඨය, එපරිද්දෙන්ම ඒ ත්‍රිවිද්‍යක බ්‍රාහ්මණයන්ගේ භාෂිතය අන්ධපඞ්ක්තියකට බඳු උපමාඇත්තේ වේ.

පුරිමොපි න පස්සති මජ්ඣිමොපි න පස්සති පච්ඡිමොපි න පස්සති. තෙසමිදං තෙවිජ්ජානං බ්‍රාහ්මණානං භාසිතං හස්සකඤ්ඤෙව සම්පජ්ජති නාමකං යෙව සම්පජ්ජති රිත්තකඤ්ඤෙව සම්පජ්ජති තුච්ඡකඤ්ඤෙව සම්පජ්ජති.

16. තං කිම්මඤ්ඤසි වාසෙට්ඨ, පස්සන්ති තෙවිජ්ජා බ්‍රාහ්මණා චන්දිමසුරියෙ අඤ්ඤෙචාපි බහුජනො, යතො ච චන්දිමසුරියා උග්ගච්ඡන්ති යත්ථ ච ඔගච්ඡන්ති ආයාචන්ති ථොමයන්ති පඤ්ජලිකා නමස්සමානා අනුපරිවත්තන්තීති. එවං භො ගොතම, පස්සන්ති තෙවිජ්ජා බ්‍රාහ්මණා චන්දිමසුරියෙ අඤ්ඤෙචාපි බහුජනො යතො ච චන්දිමසුරියා උග්ගච්ඡන්ති යත්ථ ච ඔගච්ඡන්ති ආයාචන්ති ථොමයන්ති පඤ්ජලිකා නමස්සමානා අනුපරිවත්තන්තීති.

17. තං කිම්මඤ්ඤසි වාසෙට්ඨ යං පස්සන්ති තෙවිජ්ජා බ්‍රාහ්මණා චන්දිමසුරියෙ අඤ්ඤෙචාපි බහුජනො යතො ච චන්දිමසුරියා උග්ගච්ඡන්ති යත්ථ ච ඔගච්ඡන්ති ආයාචන්ති ථොමයන්ති පඤ්ජලිකා නමස්සමානා අනුපරිවත්තන්ති.

පෙරටුව යන තැනැත්තේත් නොදකී. මැද යන තැනැත්තේත් නොදකී. පසුවයන තැනැත්තේත් නොදකී. ඒ ත්‍රිවිද්‍යක බ්‍රාහ්මණයන්ගේ භාෂිතය සිනාසිය යුතුබවටම පැමිණේ. ලාමකබවටම පැමිණේ, නිරර්ථකබවටම පැමිණේ. එහෙයින් සිස්බවටම පැමිණේ.

16. වාසෙට්ඨය, ඒ කුමකැයි හඟනෙහිද. ත්‍රිවිද්‍යකබ්‍රාහ්මණයෝද අන්‍ය බොහෝ ජනයෝද, චන්ද්‍ර සූර්‍ය්‍යයන් දකිත්ද, යම් කලෙක්හි චන්ද්‍ර සූර්‍ය්‍යයෝ උදාවට යෙන්ද යම්කලෙක්හි අස්තයට යෙත්ද, ඔවුන්ට යාච්ඤාකෙරෙත්ද, ඔවුන්ට ස්තුතිකෙරෙත්ද, ඇඳිලිබැඳගෙණ නමස්කාර කරමින් ඔබි මොබ පෙරළෙත්ද එබඳු චන්ද්‍ර සූර්‍ය්‍යයෝයි. භවද් ගෞතමය, එසේයි. ත්‍රිවිද්‍යක බ්‍රාහ්මණයෝද, අන්‍ය බොහෝ දෙනාද, චන්ද්‍ර සූර්‍ය්‍යයන් දකිත්. යම් කලෙක්හි සඳහිරු නැගෙත්ද, යම්කලෙක්හි අස්තයට යෙත්ද, ඔවුන්ට යාච්ඤාකෙරෙත්, ස්තුති කෙරෙත්, ඇඳිලිබැඳගෙණ නමස්කාරකරමින් ඔබිමොබ පෙරළෙත්.

17. වාසෙට්ඨය, ඒ කුමකැයි හඟනෙහිද යම්හෙයකින් ත්‍රිවිද්‍යක බ්‍රාහ්මණයෝද, අන්‍ය බොහෝ ජනයෝද, සඳහිරු මනාකොට දකිත්ද, යම්කලෙක්හි සඳහිරු උදාවට පැමිණෙත්ද. යම් කලෙක්හි අස්තයට යෙන්ද යාච්ඤා කෙරෙත්ද. ස්තුති කෙරෙත්ද, ඇඳිලිබැඳගෙණ නමස්කාර කරමින් ඔබි මොබ පෙරළෙත්ද.

පහොන්ති තෙවිජ්ජා බ්‍රාහමණා චන්දිමසුරියානං සහව්‍යතාය මග්ගං දෙසෙතුං අයමෙව උජුමග්ගො, අයමඤ්ජසායනො නිය්‍යානිකො නිය්‍යාති තක්කරස්ස චන්දිමසුරියානං සහව්‍යතායාති. නොහිදං භො ගොතම.

18. ඉතිකිර වාසෙඨ යං පස්සන්ති තෙවිජ්ජා බ්‍රාහ්මණා චන්දිමසුරියෙ, අඤ්ඤෙපිබහුජනො, යතොච චන්දිමසුරියා උග්ගච්ඡන්ති යත්ථච ඔගච්ඡන්ති ආයාචන්ති ථොමයන්ති පඤ්ජලිකා නමස්සමානා අනුපරිවත්තන්ති, තෙසම්පි නප්පහොන්ති චන්දිමසුරියානං සහව්‍යතාය මග්ගං දෙසෙතුං. අයමෙව උජුමග්ගො, අයමඤ්ජසායනො නිය්‍යානිකො නිය්‍යාති තක්කරස්ස චන්දිමසුරියානං සහව්‍යතායාති කිංපන නකිර තෙවිජ්ජෙහි බ්‍රාහමණෙහි බ්‍රහ්මා සක්ඛිදිඨො, නපි කිර තෙවිජ්ජානං බ්‍රාහමණානං ආචරියෙහි බ්‍රහ්මා සක්ඛිදිඨො, නපිකිර තෙවිජ්ජානං බ්‍රාහමණානං ආචරියපාචරියෙහි බ්‍රහ්මා සක්ඛිදිඨො. නපිකිර තෙවිජ්ජානං බ්‍රාහ්මණානං යාව සත්තමාචරියමහායුගෙහි බ්‍රහ්මා සක්ඛිදිඨො.

මෙයම ඍජුමාර්‍ගයවේ. මේ මාර්‍ගයම නෛර්‍ය්‍යාණිකවූයේ ඒ මාර්‍ගයලෙස පිළිපදින්නහුගේ පැවැත්ම චන්ද්‍රසූර්‍ය්‍යයන්ගේ සහභාවයපිණිස පවතීයයි චන්ද්‍රසූර්‍ය්‍යයන්ගේ සහභාවයපිණිස මාර්‍ගයක් දෙසනාකරන්ට ත්‍රිවිද්‍යකබ්‍රාහ්මණයෝ පොහොසත්වෙත්දැයි විචාළසේක. භවද්ගෞතමයන්වහන්ස, මෙය නොවේමය. හෙවත් නොහැකියයි සැළකළේය.

